# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2012



පර්යේෂණ මගින් නව තාක්ෂණය බිහිකොට,



ගුණාත්මයෙන් යුත් උසස් බීජ වගා පැළ දා ,



ගොවි ජනතාව වෙත තාක්ෂණ ඥානය ලබාදී ,



රට සමෘද්ධිමත් කිරීමට දායක වන වගයි

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය, ශ්‍රී ලංකා**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2012

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2013

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට සංස්කරණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවප උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාලේ පූර්ණ අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්ථාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගී කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# දැක්ම

ජාතියේ සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

# මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශ්වකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම.

**උපදේශකත්වය**

පී. කේ. කේ. ආර්. පෙරේරා

**සම්බන්ධීකරණය**

පී. සී. පිරීස්

**සංස්කරණය**

ආචාර්ය ඊ. එම්. දසනායක

ආචාර්ය ඩබ්. එම්. ඒ. ඩී. බී. වික්‍රමසිංහ

පී. සී. පිරීස්

කේ. එම්. එම්. පී. රත්නායක

**පරිවර්තනය හා සෝදුපත් කියවීම**

ඩබ්. ඒ. ඩී. නිරංජලා

ඊ. එම්. එස්. කේ. ඒකනායක

ඒ. එම්. එන්. විජයතිලක

**යතුරු ලියනය**

කේ. ජේ. මධුභාෂිණී ජයසිංහ

**පිටු සැකසුම**

කේ. ජේ. මධුභාෂිණී ජයසිංහ

# අධ්‍යක්ෂ මණ්ඩලය

කේ.ජී. ශ්‍රියාපාල මයා
(කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්)

පී. කේ. කේ. ආර්. පෙරේරා මයා (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන)

ආචාර්ය ඊ. එම්. දසනායක මිය (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - පර්යේෂණ)

එච්. පී. ඩී. එම්. සරච්චන්ද්‍ර මිය ( අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - පාලන)

ආචාර්ය ඩී. එම්. එන්. දිසානායක මයා

කේ. බී. වහුන්දෙණිය මයා

ඩබ්. ජී. එම්. ජී. දයාවංශ මයා

ආචාර්ය රොහාන් විජේකෝන් මයා

ටි. එච්. සී. එස්. පෙරේරා මයා

ආචාර්ය ඩබ්. එම්. ඒ. ඩි. බි. වික්‍රමසිංහ

ගාමිණී ද සිල්වා මයා

ආචාර්ය ඩබ්. එම්. ඩබ්. වීරකෝන් මයා

ආචාර්ය ජී. එම්. ඩබ්. චිත්‍රාල් මයා

ආචාර්ය එච්. එම්. එස්. හින්කෙන්ද මයා

ඉංජිනේරු එම්. එච්. එම්. ඒ. බණ්ඩාර මයා

කේ. යූ. රණවක මයා

ආර්. පී. ප්‍රේමරත්න මයා

# පටුන


පෙරවදන xi

1.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහ ඉලුප්පල්ලම 1

1.1.1 මාෂ හා රනිල සහ තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස 33

1.1.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල 45

1.1.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය උතුරු පළාත - කිලිනොච්චිය 55

1.2 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය 63

1.2.1. ආහාර පර්යේෂණ ඒකකය - ගන්නෝරුව 95

1.2.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල 99

1.2.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර 107

1.2.4 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතා එළිය 115

1.2.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල 123

1.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ 129

1.3 පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - හොරණ 135

1.3.1. පළතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන ස්ථානය - ගන්නෝරුව 151

1.3.2 පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම 161

1.4. වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - බතලගොඩ 169

1.4.1 කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල 203

1.5. ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය 213

2.1. බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව 227

2.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව 233

2.1.2 පැළෑටි සංරක්ෂණ සේවය 245

2.1.3 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක 255

2.1.4 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය 263

2.1.5 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය 289

2.2 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය 299

2.3 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය 319

3.1 ව්‍යාප්ති හා පුහුණු අංශය 329

3.2 තොරතුරු සහ සංනිවේදන මධ්‍යස්ථානය - පේරාදෙණිය 355

4.1 පාලන අංශය 371

4.2. ඉංජිනේරු අංශය - පේරාදෙණිය 377

4.2.1 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය, මහ ඉලුප්පල්ලම 383

4.3 මුදල් අංශය - පේරාදෙණිය 387

4.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය 393

5. කාලගුණ වාර්තාව 399

6. ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම 415

7. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (2012.12.31 දිනට) 427

8. තාක්ෂණික කාර්ය මණ්ඩල සුදුසුකම් (2012.12.31 දිනට) 447

# පෙරවදන

කෘෂිකාර්මික පදනමක් ඇති රටක් වන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය පිළිබඳ ප්‍රධාන වගකීම දරන, දීප ව්‍යාප්තව විහිදුණු ආයතන 192ක් යටතේ 10,000කට අධික කාර්ය මණ්ඩලයක් සහිත, වසර 100කට අධික අභිමානවත් ඉතිහාසයකින් යුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පෙරවදනක් සැපයීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සලකමි.

මෙම කාර්ය සාධන වාර්තාව මගින් 2012 වසර තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවා අංශ 10 හා ආධාරක සේවා අංශ 03 විසින් ඉටුකරන ලද කාර්යයන් ඉදිරිපත් කර ඇත. මෙම දෙපාර්තමේන්තුව සතු සම්පත්වලට අදාළ වර්තමාන තත්වය පිළිබඳව මෙහි සඳහන් තොරතුරු ඉදිරි කටයුතු සැලසුම් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට, නීති සම්පාදකයින්ට සහ පර්යේෂණ කළමනාකරුවන්ට මහඟු අත්වැලක් වනු ඇත.

විශේෂයෙන්ම 2012 වර්ෂය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන ජයග්‍රහණ රාශියක් ලඟා කරගත් වර්ෂයකි. ඒ අතරින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රගතියේ නියමුවා වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් පූර්ණය 2012 වර්ෂයට යෙදී තිබීමත් එය මහත් අභිමානයෙන් යුතුව අතිගරු ජනාධිපතිතුමන්ගේ සහභාගිත්වයෙන් සැමරීමට ලැබීමත් විශේෂිත කරුණකි.

2012 වසර සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 3507ක් වූ අතර එහි මූල්‍ය ප්‍රගතිය 92% ද ඉක්මවා තිබුණි. ගොවිපළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට පසුගිය වසර කිහිපය තුළ රු. මිලියන 700ක පමණ මුදලක් වැය කරන ලදී. එය හේතු කොට ගෙන මෙම වසරේදී අත්තිකාරම් ගිණුමෙන් පාලනය වන ගොවිපළ 16ක් ලාභ ඉපයීමට සමත් වීමද සුවිශේෂී ජයග්‍රහණයකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුකොට ගෙන බඩඉරිඟු වගාවෙන් ස්වයංපෝෂිත වීමත්, වාර්ෂිකව බඩඉරිඟු මෙ.ටො. 150,000ක් අපනයනය සඳහා වැයවූ විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකිවීමත් අප ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

විශේෂයෙන්ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මහත් බාධාවක්ව පැවති මානව සම්පත් ඌනතාව මගහරවාලමින් ප්‍රාථමික හා ශිල්පීය ශ්‍රේණිවල මෙන්ම තාක්ෂණ හා කෘෂිකර්ම ආදී සේවාවල ද පැවති පුරප්පාඩු පිරවීම තුළින් මෙම දෙපාර්තමේන්තුවේ දශකයකට ආසන්න කාලයක් නොවිසඳී පැවති බරපතල ගැටලුවකට විසඳුම් ලබාදීමට හැකිවීම ද මෙම වසරේදී අත් කරගන්නා ලද ජයග්‍රහණයකි.

මෙවන් ප්‍රගතියක් සහ ජයග්‍රහණ රැසක් අත්කර ගැනීමට ඉවහල් වූ මෙම දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයටම ඔවුන් විසින් දක්වන ලද කැපවීම සහ සහයෝගය වෙනුවෙන් මාගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරමි. එමෙන්ම, විවිධ දුෂ්කරතා මධ්‍යයේ මෙම වාර්තාව සම්පාදනය කර එළිදැක්වීමට දරන ලද ප්‍රයත්නය වෙනුවෙන් ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකයේ කාර්ය මණ්ඩලයටද දමිළ පරිවර්තන කටයුතු ඉටුකල නිලධාරීන්ටද මාගේ ස්තූතිය පළ කරමි.

කේ.ජී. ශ්‍රියාපාල
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

# 1.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහ ඉලුප්පල්ලම

මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ එහි සහායක ආයතන සතු කාර්යයන් වනුයේ කුළු බඩු (මිරිස් සහ ලූණු), ධාන්‍ය රනිල (මුං, කව්පි, උඳු), තෙල් බෝග (රටකජු, සෝයා, තල සහ සූරියකාන්ත) සහ රළු ධාන්‍ය (බඩ ඉරිඟු, කුරක්කන්, ඉදල් ඉරිඟු සහ අනෙකුත් මෙනේරි වර්ග) යන වෙනත් ක්ෂෙත්‍ර බෝගයන්හි ප්‍රභේද සහ අදාළ තාක්ෂණික ක්‍රම බිහි කිරීම සහ ඒවා එහි පාර්ශවකරුවන් වෙත ලබාදීමයි. ඊට අමතරව, මෙම ආයතනයේ අධීක්ෂණය යටතේ සියළුම බෝග වල මූලික බීජ ප්‍රමාණවත් ප්‍රමාණ වලින් නිපදවීමේ වගකීම ද දරන අතර කලාපීයව වැදගත් වී සහ වියළි කලාපීය පලතුරු සහ එළවළු වල ඵලදායිතාව ඉහළ නැංවීමේ කටයුතුද සිදු කරයි. දේශීය සහ අන්තර්ජාතික ප්‍රභව මගින් ලබාගන්නා සියළුම වියළි කලාපීය පලතුරු වල ජනකප්ලාස්ම ස්ථානීයව සංරක්ෂණය කිරීම සහ වගා ප්‍රභේද වැඩිදියුණු කිරීම සඳහා ඒවා යොදා ගැනීමත් හඳුන්වාදීමත් ජනකප්ලාස්ම පරික්ෂා කිරීමත් මෙම ආයතනයේදී සිදු කරනු ලබන අතර මෙම පරමාර්ථ සියල්ල මුදුන්පත් කර ගැනීම උදෙසා ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය හා ජාතික සහ අන්තර්ජාතික පර්යේෂණ හා සංවර්ධන ආයතන, විශ්ව විද්‍යාල සහ පෞද්ගලික අංශයේ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සිදු කරනු ලැබේ. වෙනත් ක්ෂෙත්‍ර බෝග සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය මගින් 2015 වසර රනිල, ධාන්‍ය වර්ග, මෙනේරි වර්ග සහ රටකජු වලින් ස්වයංපෝෂිත කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කටයුත්ත සාක්ෂාත් කර ගැනීම පිණිස වගාවේ ඵලදායිතාවය මෙන්ම වගා ක්ෂේත්‍රයද වැඩිදියුණු කළ යුතු වේ. කෙසේවුවද, ජලය වැනි ස්භාවික සම්පත් දැනටමත් සීමා වෙමින් පවතින බැවින් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම අභිබවා ගිය වෙනත් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කෘෂිකාර්මික බිම් සඳහා පවතින තරඟය හේතුවෙන් වගාව යටතේ පවතින බිම් ප්‍රමාණය ඉහළ නැංවීම සීමා වී ඇත. එබැවින්, පවතින එකම විකල්පය වනුයේ ස්භාවික සම්පත් ප්‍රශස්ත කරන අතරම ගොවිපළ ඵලදායිතාව ඉහළ නැංවීමයි.

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන පද්ධතිය සමන්විත වනුයේ මහ ඉලුප්පල්ලම ප්‍රධාන පර්යේෂණ ස්ථානය, අඟුණකොළපැලැස්ස ධාන්‍ය සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අරලගංවිල සහ කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථාන තිරුනෙල්වෙලි, වවුනියා සහ තෙලිජ්ජවිල පිහිටි කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය යන ආයතනයන්ගෙන් වන අතර හානියට පත්ව තිබෙන කරඩියනාරු කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ මුලතිවු කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය යන ආයතන උපයෝගීතා පර්යේෂණ ස්ථාන බවට පත් කිරීම සඳහා වූ සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.

## අයවැය

වගු අංක 1.1.1: විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම්

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම % |
|---|---|---|---|
| මූලධන | 10296988 | 8713508 | 85 |
| පුනරාවර්තන | 28346293 | 25203363 | 89 |
| ව්‍යාපෘති | | | |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම | | | |
| i. ලූණු | 2200000 | 2058341 | 94 |
| ii. මිරිස් | 2590000 | 2433379 | 94 |
| iii. ජලකළමනාකරණය | 2190000 | 2029301 | 93 |
| iv. එළවළු | 250000 | 185810 | 74 |
| ප්‍රජා පාදක බීජ නිෂ්පාදනය (මිරිස්) | 1000000 | 939026 | 94 |
| ගොවිපළ සංවර්ධන | 8050000 | 7673410 | 95 |
| පලතුරු නිෂ්පාදනය (මිදි) | 1600000 | 1541741 | 96 |
| KOPIA | 426461 | 426461 | 100 |
| දෙමුහුම් බඩඉරිඟු නිපදවීම | 835000 | 822457 | 98 |
| **එකතුව** | **57784742** | **52026798** | **92** |

## ප්‍රගතිය

### බෝග වැඩිදියුණු කිරීම

#### කුළු බඩු

#### මිරිස්

මිරිස් ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන වඩාත් වැදගත් කුළුබඩුවක් වන අතර වත්මන්හි හෙ. 1කට අමු මිරිස් ටොන් 3.33ක සාමාන්‍ය අස්වැන්නක් සහිතව හෙ. 13313ක වගා කෙරේ. 2011 වසරේ අමු මිරිස් නිෂ්පාදනය ටොන් 44 398ක් වූ අතර එම ප්‍රමාණය ජාතික අවශ්‍යතාවයට වඩා අඩු මට්ටමක පැවති බැවින් එම වසරේදී මිරිස් ටොන් 42 782ක් ආනයනය කරන ලදි.

මනාව කළමනාකරණය කරන ලද ජල සම්පාදන තත්ත්වය යටතේ අමුමිරිස් නිෂ්පාදනය කළ හැකි ප්‍රමාණය හෙ.1කට ටොන් 15කි. ගොවි ක්ෂෙත්‍රයන්හි ඵලදායිතාව පහත වැටීමට ප්‍රධාන හේතුව වනුයේ ගුණාත්මක තත්ත්වයෙන් අඩු මෙන්ම අස්වනු ප්‍රමාණය පහත දැමීමට හේතු වන පළිබෝධ සහ රෝග පැතිරී යාමයි. එබැවින්, මනා ගුණාත්මයෙන් යුත් මිරිස් කරල් සහ පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී / ඔරොත්තු දෙන ඉහළ අස්වනු සහිත ප්‍රභේද බිහි කිරීමේ

අරමුණින් යුතුව මිරිස් බෝග වගාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

## කාර්යඵල

**• මුදා හරින ලද නව මිරිස් ප්‍රභේද දෙකක්**

විශාල වශයෙන් වගා කිරීම සඳහා නව මිරිස් ප්‍රභේද දෙකක් නිර්දේශ කර මුදා හරින ලදි.

MICH 3 ප්‍රභේදය අමු මිරිස් නිෂ්පාදනය සඳහා වඩාත් යෝග්‍ය වන අතර මධ්‍යස්ථ ප්‍රමාණයේ විශාලත්වයෙන් යුත් මෙම මිරිස් කරල් තද කොළ පැහැයෙන් යුත් ආකර්ශනීය දිලිසෙන පෙනුමකින් සමන්විත වේ. කොළ කොඩවීමේ සංකීර්ණයට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී මෙම ප්‍රභේදය දීප ව්‍යාප්ත වගාව සඳහා නිර්දේශ කරන ලදි. මෙම ප්‍රභේදයේ අභිනක බීජ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඇතුළත් කිරීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය වෙත මෙහි අභිජනක බීජ කි.ග්‍රෑ. 2.5ක් ලබා දෙන ලදි. මෙම ප්‍රභේදය හෙ. 1කට අමු මිරිස් ටොන් 15කට වැඩි අස්වනු විභවයකින් යුතු වේ.

වැරණියා මිරිස් තෙත් කලාපයේ ගොවීන් අතර ජනප්‍රිය භූමි දර්ශ වන අතර MI වැරණියා I යනු වැරණියා මිරිස් භූමි දර්ශයේ සංශුද්ධ කරන ලද සහ වරණය කර ගන්නා ලද දෙවැනි ප්‍රභේදයයි. දිගින් සෙ.මී. 18කට වැඩි සහ කහ පැහැයෙන් යුත් මෙම ප්‍රභේදය සැර ගතියෙන් යුතු වන අතර මාළුමිරිස් සඳහා අතිරේක ඵලවළුවක් ලෙසද යොදා ගත හැකිය. හෙ. 1කට ටොන් 25කට වැඩි ඵලදාවක් ගෙන දෙන මෙම ප්‍රභේදය ගෙවතු වගාවට සහ බඳුන් වල වගා කිරීම සඳහා වඩාත් යෝග්‍ය වේ.

**• බලාපොරොත්තු තැබිය හැකි මිරිස් ආර**

අමු මිරිස් සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත් හදා බැලීමෙන් පසු බලාපොරොත්තු තැබිය හැකි අභිජනක මිරිස් ආර දෙකක් හඳුනා ගැනිණි. PC 1 වරණය සහ ICPN වරණය නම් වූ තෝරාගත් බලාපොරොත්තු තැබිය හැකි මෙම ආර දෙක අනෙකුත් ප්‍රවේශ වලට වඩා වැඩි අස්වනු ගෙන දෙන අතර අරලගංවිල සහ මහ ඉලුප්පල්ලම පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන, කල්පිටිය, අඟුණකොළපැලැස්ස පිහිටි ධාන්‍ය රනිල හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන, තිරුනෙල්වෙලි කෘෂිකර්ම පර්යේෂණ ආයතනය සහ මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය යනාදී ස්ථාන කීපයකදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කරන ලදි. කෙටි ශුණ්ඩාකාර හැඩයේ කරල් සහිත PC 1 වරණයේ මිරිස් ලා කහ පැහැයෙන් යුතු වන අතර සැර ගතියෙන් යුක්තය. හෙ. 1කට අමු මිරිස් ටොන් 15කට වැඩි අස්වනු විභවයක් සහිත මෙම වරණය අමු මිරිස් මෙන්ම වියළි මිරිස්ද නිෂ්පාදනයට යෝග්‍ය වන අතර ඵලඹෙන කන්න වලදී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමට යොමු කිරීමට නියමිත වන අතර මෙහි බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයෙහි සිදු කරන විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ සිදු කරන පරීක්ෂණය සඳහා යොමු කර ඇත.

බලාපොරොත්තු තැබිය හැකි දෙවන ආර වන ICPN වරණය ආසියානු ඵළවළු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලබාගත් ජනකප්ලාස්මයකින් වරණය කර සංශුද්ධ කරන ලදි. මෙයද හෙ. 1කට ටොන් 18කට වැඩි අස්වැන්නක් ගෙන දෙන අතර දිලිසෙන කහ පැහැ මතුපිටකින් යුත් දිග කරල් සැර ගතියෙන් යුක්තය. ICPN වරණයේ මතු පිට පොත්ත අපගේ අමු මිරිස් ප්‍රභේදවල මතුපිට පොත්තට වඩා ඝනකමින් වැඩි වන අතර ඵලවළුවක් වශයෙන් වඩාත් යෝග්‍ය වන නමුත් සැර ගතියෙන් වැඩිය. මෙහි බීජ සංරක්ෂණය කිරීම සඳහා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය වෙත ලබා දී තිබෙන අතර වැඩිදුර අධ්‍යයන සඳහා මෙම ආර

මාළුමිරිස් ආර සමඟ සංසඳනය කළ යුතුව ඇත.

- **මිරිස් දෙමුහුම් අභිජනනය**

$F_1$මුහුම් 150කට වැඩි ප්‍රමාණයක් ක්ෂේත්‍ර තත්ත්වය යටතේ පරික්ෂා කරන ලදි. ක්‍රියාකාරීත්වය අනුව $F_1$මුහුම් 6ක් විවිධ ස්ථාන වලදී මහා පරිමාණ අත්හදා බැලීම් මගින් ඇගයීම සඳහා හඳුනා ගැනිණි. 2012 යල කන්නයේදී පැවති දැඩි වියළි කාලගුණික තත්ත්වය මුහුම් වල සාර්ථකත්වයට අහිතකර අයුරින් බලපාන ලදි.

- **ලූණු**

ලූණු ශ්‍රී ලංකාවේ වගා කරන අත්‍යවශ්‍ය කුළුබඩු බෝගයකි. 2011 වසරේදී ලොකු ලූණු සහ රතු ලූණු වගා කළ බිම් ප්‍රමාණය පිළිවෙළින් හෙ. 3451ක් සහ 6145ක් වූ අතර සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට මෙ.ටො. 13.24ක් සහ 11.77ක් විය. මෙම වසරේ ලොකු ලූණු නිෂ්පාදන මට්ටම මෙ.ටො. 45682ක් සහ රතු ලූණු නිෂ්පාදන මට්ටම මෙ.ටො. 72339ක් වූ අතර ජාතික අවශ්‍යතාවයන් පිරිමසා ගැනීම සඳහා ලොකු ලූණු මෙ.ටො. 170731ක් සහ රතු ලූණු මෙ.ටො. 6807ක් ආනයනය කෙරිණි. ඉහළ අස්වනු ගෙන දෙන පළිබෝධ වලට ප්‍රතිරෝධී සහ වැඩි දිනක් තබා ගත හැකි ගුණාත්මයෙන් යුත් ප්‍රභේද බිහි කිරීමෙන් ලූණු නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ආනයනය පහත දැමීමට දායක වනු ඇත. මේ අනුව, එවැනි ලූණු ප්‍රභේද බිහි කිරීම සඳහා පර්යේෂණ වැඩසටහනක් සිදු කළ අතර 2012 වසරේදී ප්‍රභේද බිහි කිරීමේ ක්‍රියාවලිය සිදු කරන අතරතුර විවිධ අදියර වලදී අධ්‍යයන කීපයක් සිදු කෙරිණි.

## කාර්යඵල

- ගබඩා කර තැබීමේ හැකියාව සම්බන්ධයෙන් පාලන ප්‍රභේදය ලෙස දඹුල්ල වරණය යොදා ගනිමින් අළුතින් බිහි කළ ලොකු ලූණු ආර 19ක් අගයන ලදි. කුණුවීම, ප්‍රරෝහණය සහ වියළීම හේතුවෙන් සිදු වන හානිය පිළිබඳව සති දෙකේ කාල පරතරයෙන් ගණනය කළ අතර අත්හදා බැලීම සිදු කෙරෙමින් පවතී.
- පාලන ප්‍රභේදය ලෙස දඹුල්ල වරණය යොදා ගනිමින් වැඩිදියුණු කරන ලද ලොකු ලූණු ආර 13ක් අස්වැන්න සහ අනෙකුත් හිතකර ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් ඇගයීමේදී සහ වරණය කිරීමේදී ආර දෙකක කායික පරිණතවීම පාලන ප්‍රභේදයට වඩා දින 10 – 12ක් පමණ අඩු කාලයකින් සිදු වූ අතර ආර 3ක් ඉහළ බල්බ අස්වැන්නක් ගෙන දෙන ලදි.
- දෙමුහුම්කරණ වැඩසටහනේදී, $F_2$ පරම්පාරවේ පෙළපත් 10ක් 2010/11 මහ කන්නයේදී සිදු කරන ලද විවිධ මුහුම් 4කින් වරණය කර ගන්නා ලදි. මෙම පෙළපත් ඒකාත්මික බව සම්බන්ධයෙන් සිදු කරන ඇගයීමට වඩා අනෙකුත් හිතකර ලක්ෂණ සම්බන්ධයෙන් ඇගයීමට ලක් කළ යුතු අතර වඩා හොඳ පෙළපත් ඉදිරි දෙමුහුම්කරණ වැඩසටහන සඳහා මාපියන් ලෙස වරණය කර ගත යුතුවේ.
- පෞද්ගලික අංශය මගින් ශ්‍රී ලංකාවට ලූණු බීජ ආනයනය කරන අතර එම ලූණු බීජ ගොවීන් අතරේ ජනප්‍රිය වෙමින් පවතී. මෙම ප්‍රභේද දේශීය ශෂ්‍ය විද්‍යාත්මක තත්ත්ව වලට අනුවර්තනය වීමේ හැකියාව හෝ දේශීය පළිබෝධ සහ රෝග කෙරෙහි පාත්‍ර වීම සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් නොකර අලෙවි කෙරේ. මේ හේතුවෙන්, පළිබෝධ සහ රෝග පැතිරී යාමේ හැකියාව සම්බන්ධයෙන් නොතකා සිටිය නොහැක. කිසියම් පළිබෝධයකට හෝ රෝගයකට දැඩි ලෙස පාත්‍ර වන විදේශීය ප්‍රභේදයක් විශාල වශයෙන් රට තුළ වගා

කරන්නේ නම් ලූණු වගාව අවදානමට ලක් වේ. එබැවින්, ආනයනික ලූණු ප්‍රභේදවල ක්ෂේත්‍ර ක්‍රියාකාරීත්වය, පළිබෝධ සහ රෝග පැතිරීම පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යයන සිදු කරන ලදි.

- සාමාන්‍ය වගාව සඳහා නිර්දේශ කිරීම පිණිස අගයන ලද විදේශීය ලොකු ලූණු ප්‍රභේද 6කින් ප්‍රභේද 2ක් දඹුල්ල වරණය හා සාපේක්ෂකව මනා ක්‍රියාකාරීත්වයෙන් යුතු විය. අවාරයේ වගා කිරීම සඳහා දඹුල්ල වරණය, ගලේවෙල ලයිට් රෙඩ් සහ ඇග්‍රි ෆවුන්ඩ් ලයිට් රෙඩ් යන පරීක්ෂණ ප්‍රභේද සමඟ "කොහිනූර් 9" නැමැති විදේශීය ප්‍රභේදය අගයන ලදි.

- දඹුල්ල වරණයේ අවසන් බීජ අස්වැන්න කෙරෙහි රෝපණ පරතරය මගින් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 2012 යල කන්නයේදී අත්හදා බැලීමක් සිදු කළ අතර එළඹෙන කන්න වලදීද සිදු කළ යුතුය.

- ජෛව සහ අජෛව අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දීම / ප්‍රතිරෝධී වීම වැනි වැදගත් ලක්ෂණ සම්න්ධයෙන් ලූණු වල ජානමය විචල්‍යතාව වඩාත් පහළ මට්ටමක පවතින බැවින් 2012 යල කන්නයේදී ප්‍රේරිත විකෘකරණය මගින් ජානමය විචල්‍යතාව ඇති කිරීම සඳහා අත්හදා බැලීමක් ආරම්භ කරන ලදි. දඹුල්ල වරණයේ බීජ වලට එතිල් මීතේන් සල්ෆේට් වල විවිධ සාන්ද්‍රණයන්ගෙන් ප්‍රතිකර්ම ලබා දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයට අනුව ක්ෂේත්‍රයේ රෝපණය කළ අතර වැදගත් වර්ධන පරාමිතීන් කෙරෙහි සැලකිල්ල යොමු කෙරිණි. ප්‍රතිඵල අනුව, අත්හදා බලන ප්‍රතිකර්මයන් එළඹෙන කන්නයේදී සහ ප්‍රතිකර්ම ලබාදෙන කාල පරාසය සාන්ද්‍රණ වෙනස් කරමින් නැවත වරක් සිදු කළ යුතුය.

- පොකුරු ලූණු වල අඩුවෙන් බීජ හට ගැනීම හෝ කිසිදු බීජයක් හට නොගැනීම බොහෝ විට සිදුවන බැවින් සාමාන්‍ය වගාව සිදු කරන ගොවීන් විසින් රෝපණ ද්‍රව්‍ය ලෙස බල්බිල භාවිත කළ යුතුය. බල්බ අස්වැන්න සහ අනෙකුත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව සොයා බැලීම සඳහා වැඩිදියුණු කරන ලද බීජ හටගන්නා පොකුරු ලූණු ආර ඇගයීමට අත්හදා බැලීමක් සිදු කළ අතර දේශීය පොකුරු ලූණු ප්‍රභේදයක් වන වේතාලන් වලට වඩා MICLO - 09-01 යන පොකුරු ලූණු ආරෙහි ක්‍රියාකාරීත්වය වඩාත් යහපත් බැව් අනාවරණය විය.

- පරම්පරාව ඉදිරියට ගෙන යාම සඳහා පොකුරු ලූණු පෙළපත් 6ක් වරණය කර ගන්නා ලදි.

## රළු ධාන්‍ය

### බඩ ඉරිඟු

ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු වගාව පසුගිය වසර කීපය තුළදී ව්‍යාප්ත වී ඇති අතර ඉහළ වාණිජමය ආයෝජනයක් බවට පත්ව ඇත. 2011 වසරේදී බඩඉරිඟු වගා කරන ලද වපසරිය හෙ. 50 545ක් විය (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012). මෙය ප්‍රධාන වශයෙන්ම මහ කන්නයේදී වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ ගොඩබිම වගා කරන අතර යල කන්නයේදී අතිරේක ජල සම්පාදනය සහිතව ගොඩබිම මෙන්ම කුඹුරු ඉඩම් වලද වගා කෙරේ. පසුගිය වසර 4 තුළදී බඩ ඉරිඟු වල ඵලදායිතාව හෙ. 1කට ටොන් 1.65 සිට 2.88 දක්වා වැඩි වී ඇති අතර මෙම වගාව ව්‍යාප්ත වීමට සහ අස්වනු ඉහළ යෑමට හේතු වූ එක් සාධකයක් වනුයේ දෙමුහුම් ප්‍රභේද සහ

අදාළ තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීමයි. වත්මන්හි මෙරට බඩ ඉරිඟු නිෂ්පාදනය ස්වයං පෝෂිත මට්ටමට බෙහෙවින්ම ළඟ වී ඇත. කෙසේ වුවද, මුළු දෙමුහුම් බීජ ඉල්ලුමෙන් 95% ක්ම සපුරා ගනුයේ ආනයනික දෙමුහුම් බීජ මගින් වන අතර 2009 වසරේදී එම ප්‍රමාණය ටොන් 707ක් විය. (රේගු වාර්තා, 2009). බීජ ආනයනය කිරීම සඳහා වූ විදේශ විනිමය රු. මිලියන 164.48කි. එබැවින්, දෙමුහුම් බඩ ඉරිඟු සහ ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1කට ටො. 5-7) අහිතකර ජෛව සහ අජෛව තත්ත්වයන්ට ප්‍රතිරෝධී, ස්ව පරාගනය සිදුවන ප්‍රභේද බිහි කිරීම සඳහා බඩ ඉරිඟු වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි.

## කාර්යඵල

- දේශීයව බිහි කළ සහභිජාත ආර සහ CIMMYT සහභිජාත ආර යොදා ගනිමින් සිදු කළ තනි මුහුම් 700කට වැඩි ප්‍රමාණයකින් සාමාන්‍ය බඩ ඉරිඟු දෙමුහුම් 7ක් වරණය කර ගන්නා ලදුව පසුගිය කන්න දෙකේදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමෙන් අගයන ලදි. මෙම දෙමුහුම්වල අස්වැන්නෙහි සාමාන්‍යය හෙ. 1කට ටොන් 4.5 -5.5ක් විය.

- ඉන්දුනීසියාවෙන් ලද විවෘත පරාගනය කරන බඩ ඉරිඟු ප්‍රභේද 3ක් උසස් අස්වනු අත්හදා බැලීම් සහ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම මගින් අගයන ලද අතර ගොවි ක්ෂේත්‍ර වලදී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා එක් ප්‍රභේදයක් (Srikandikuning "MIOPVI") වරණය කර ගන්නා ලදි. වරණය කර ගන්නා ලද විවෘත පරාගනය කරන ඉන්දුනීසායානු බඩ ඉරිඟු ප්‍රභේද වල අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටො. 4-5ක් විය.

- අන්තර් ජාතික බඩ ඉරිඟු සහ තිරිඟු වැඩිදියුණු කිරීමේ මධ්‍යස්ථානයෙන් ලද බඩ ඉරිඟු දෙමුහුම් 14ක් ඇගයීමට ලක් කළ අතර වැඩිදුර ඇගයීම සඳහා දෙමුහුම් 4ක් වරණය කර ගන්නා ලදි. වරණය කර ගන්නා ලද දෙමුහුම් හෙ. 1කට ටො. 6-7ක අස්වනු ගෙන දුණි.

- පොදු පළිබෝධ සහ රෝග වලට අනුවර්තනය වීමේ හැකියාව සහ පාත්‍රවීම පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා විදේශීය දෙමුහුම් බඩ ඉරිඟු 5ක් සහ ස්වීට් කෝන් දෙමුහුම් (පෞද්ගලික සමාගම් මගින් ආනයනය කරන ලද) අගයන ලදි. ෂුගර් 75, සන්ස්වීට්, ගෝල්ඩන් 95 සහ සුපර් බිග් යන ස්වීට් කෝන් දෙමුහුම් වලට අදාළ ඇගයීම් වාර්තා අදාළ සමාගම් වෙත යවන ලද අතර බඩඉරිඟු ප්‍රභේද සඳහා ඇගයීම් කටයුතු සිදු කෙරේ.

## කුරක්කන්

ශ්‍රී ලංකාවේ කුරක්කන් වගා කිරීම පසුගිය වසර කීපය පුරාවට ඇණ හිටි අතර 2011 වසරේදී කුරක්කන් වගා කළ වපසරිය හෙ. 5,251 ක් (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012) විය. මෙම බෝගය ප්‍රධාන වශයෙන්ම මහ කන්නයේදී වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ ගොඩ බිම වගා කරන අතර යල කන්නයේදී අතිරේක ජල සම්පාදනයකින් යුතුව සීමිත වපසරියක ගොඩ බිම මෙන්ම කුඹුරු ඉඩම් වල වගා කෙරේ. හෙ. 1කට මෙ.ටො. 1.0 – 1.1ක් වූ කුරක්කන් නිෂ්පාදන ඵලදායිතාව පසු ගිය වසර 5 තුළදී නොවෙනස්ව පැවති අතර වත්මන් සමස්ත දේශීය නිෂ්පාදනය ටො. 5411ක් වන අතර ආනයනය කළ මුළු ප්‍රමාණය ටො. 3 622ක් (ජාන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012) විය. කුරක්කන් ආනයනය කිරීම සඳහා වැය කළ විදේශ විනිමය රු. මිලියන 105.3කි. එබැවින් ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1කට මෙ.ටො. 2 -2.5ක) සහ අහිතකර ජෛව

සහ අපෙේව තත්ත්වයන්ට ඔරොත්තු දෙන ප්‍රභේද බිහි කිරීම සඳහා කුරක්කන් වැඩිදියුණු කිරීමේ වැඩසටහන අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදි.

## කාර්යඵල

- 2011/12 මහ කන්නයේදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතූන් 4ක් පැවති අතර ගොවි ක්ෂේත්‍ර වලදී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි එකතූන් 3ක් වරණය කර ගන්නා ලදි. එම එකතූන් මගින් 2012 යල කන්නයේදී ගෙන දුන් අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටොන් 3.0 – 3.5ක් වූ අතර ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් මගින් තව දුරටත් අගයනු ඇත.
- පූර්ව මූලික අස්වනු අත්හදා බැලීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතූන් 8ක් යොදා ගත් අතර ඒවායෙහි අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටො. 3.0 - 3.5ක් පමණ විය.
- පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයෙන් ලද කුරක්කන් එකතූන් 43ක් ඇගයීමට ලක් කළ අතර ඉදිරියේදී අභිජනනය කිරීමට යොදා ගැනීම සඳහා ගුණනය කෙරිණි.

## ධාන්‍ය රණිල

### මුං

මුං ශ්‍රී ලංකාවේ වගා කරන වැදගත්ම මාෂ බෝග වලින් එකකි. වත්මන්හි හෙ. 15,722ක පමණ වපසරියක මුං වගා කරන අතර (තුන්වන කන්නයද ඇතුළුව) ගෙන දෙන අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටොන් 1.16ක් පමණ වේ. 2011 වසරේ මුං නිෂ්පාදන මට්ටම ආසන්න වශයෙන් මෙ. ටො. 10 838ක් වූ අතර එම ප්‍රමාණය ජාතික අවශ්‍යතාවට වඩා පහළ මට්ටමක වූ බැවින් ජාතික අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙ.ටො. 10 447ක් ආනයනය කරන ලදි. ගොවි ක්ෂේත්‍ර වල ඵලදායිතාව අඩු වීමට ප්‍රධාන හේතූන් වනුයේ බහුල වශයෙන් රෝග වැළදීම, විශේෂයෙන්ම, මුං කහ විචිත්‍ර වෛරසය සහ පළිබෝධ පැතිරීම මෙන්ම ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නොපැවතීමයි. තොග සහ සිල්ලර මිළ ගණන් පිළිවෙළින් කි.ග්‍රෑ. 1ක් රු. 202ක් සහ කි.ග්‍රෑ. 1ක් රු. 170ක් වූ අතර මෙම ඉහළ මිළ ගණන් වලට ප්‍රධාන වශයෙන්ම ගබඩා පළිබෝධ හානි සහ අස්වනු නෙලීමේ ඉහළ පිරිවැය හේතු විය.

එබැවින්, නිෂ්පාදන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා හිතකර ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සහිත ඉහළ අස්වනු ගෙන දෙන පළිබෝධ සහ රෝග වල ප්‍රතිරෝධී ප්‍රභේද බිහි කිරීම අතිශයින්ම වැදගත් වන අතර එමගින් ශ්‍රී ලංකාව මුං වලින් ස්වයං පෝෂිත තත්ත්වයට ළඟා කර ගත හැකිය.

## කාර්යඵල

- ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1කට ටො. > 2.5), ගබඩා පළිබෝධ වලට, කරල් විදින්නාට සහ පත්‍ර කන දළඹුවාට ප්‍රතිරෝධී, මුං කහ විචිත්‍ර වෛරසය, පිටි පුස් රෝගය සහ සර්කොස්පොරා පත්‍ර පුල්ලි රෝග වලට ප්‍රතිරෝධී, දින 60 ට අඩු හෝ දින 75ට වැඩි වයස් කාණ්ඩ වල, මනා ධාන්‍ය ගුණාත්මයෙන් යුත් (තද බීජ ප්‍රතිශතය 1ට අඩු, ලොකු බීජ (බීජ 1000ක බර ග්‍රෑම් 70ට වැඩි) සහ එකවිට පරිණත වන යන ගුණයන්ගෙන් සමන්විත මුං ලබාගැනීමේ පරමාර්ථයෙන් 2011/12 මහ කන්නයේදී මුහුම් කළ $F_1$මුං ගහන 22ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි.
- 2011/12 මහ කන්නයේදී $F_1$පරම්පරා වලින් $F_2$ ගහන 12ක් වරණය කරගත් අතර පරම්පරාව ඉදිරියට ගෙන යාම

සඳහා බල්ක් ගහන ලෙස ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි.

- හෙ. 1කට ටොන් 2ක අස්වනු විභවයකින් යුත් සහ මුං කහ විචිත්‍ර වෛරසයට ප්‍රතිරෝධී, බලාපොරොත්තු තැබිය හැකි ආර 5ක් MI 6 පරීක්ෂණ ප්‍රභේදය යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමෙන් පරීක්ෂා කර බලන ලදි.

- ඉහළ අස්වනු ගෙන දෙන ආර 4ක් (MICP 11, MICP 113, MICP 114 සහ MICP 539-17) මොණරාගල, හම්බන්තොට, වවුනියාව, අඟුණකොළපැලැස්ස, අරලගංවිල, අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල සහ පුත්තලම යන ප්‍රදේශ වල ගොවි ක්ෂේත්‍ර වලදී අනුවර්තනය වන ආකාරය පිළිබඳව සොයා බැලීම සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් පරීක්ෂාවට ලක් කෙරිණි.

### කව්පි

කව්පි ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපයේ ප්‍රධාන වශයෙන් වර්ෂා පෝෂිත තත්ත්වය යටතේ වගා කරන වැදගත් රනිලයකි. බඩ ඉරිඟු, මුං, උඳු සහ සෝයා වැනි වාණිජ බෝග වගා කිරීම හේතුවෙන් කව්පි වගා කරන වපසරිය ක්‍රමයෙන් හීන වෙමින් පවතී. කව්පි සඳහා වාණිජ වටිනාකමක් නොතිබෙන මුත් තිරසාර වගා ක්‍රමයේදී සහ වර්ෂාපෝෂිත වගාවේදී මෙම බෝගය වඩාත් වැදගත් වන බැවින් දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේද බිහි කිරීම එක් ප්‍රධාන ක්‍රමෝපායකි.

වත්මන් කව්පි වගා වපසරිය හෙ. 9267ක් වන අතර අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටොන් 1.13කි. 2011 වසරේ කව්පි නිෂ්පාදිත ප්‍රමාණය ටොන් 10 453ක් වූ අතර ජාතික අවශ්‍යතාවය සපුරාලීම සඳහා එම වසරේදී මෙ.ටො. 905ක් ආනයනය කරන ලදි.

බෝගයේ සියළුම වර්ධන අවධි වලදී හානි සිදු කරන කෘමි පළිබෝධ රාශියකට කව්පි බෝගය පාත්‍ර වන බැවින් ජාතික අවශ්‍යතාවය සහ ජාතික නිෂ්පාදනය අතර පවතින පරතරය අවම කිරීම සඳහා කෘමි පළිබෝධ මගින් සිදුවන හානි වලට විසඳුම් සෙවීමට තාක්ෂණයන් බිහි කිරීම එක් ප්‍රවේශයකි.

### කාර්යඵල

- දෙමුහුම්කරණය සහ වරණය කිරීමේ වැඩසටහන මගින් අස්වැන්න පිළිබඳව ඇගයීම සඳහා අභිජනක ආර 34ක් නිපදවිය.

### උඳු

ආහාර සැකසුම් කිරීමේ කර්මාන්තය සඳහා වැදගත් අමුද්‍රව්‍යයක් බවට පත් වූ දා සිට උඳු ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වගා කරන මුදල් බෝගයකි. උඳු වගා කෙරෙන වත්මන් වපසරිය හෙ. 8 669ක් වන අතර අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටොන් 0.67කි. 2011 වසරේ උඳු නිෂ්පාදිතය ටොන් 5782ක් වූ අතර ජාතික අවශ්‍යතාවය සපුරාලීම සඳහා ටොන් 7084ක් පමණ ආනයනය කරන ලදී.

ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී කලින් සහ කල් පසුවී පරිණත වන ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේද බිහි කිරීම මෙන්ම පෝෂණය සහ සැකසුම් කිරීමේ ගුණාත්මයන් ඉහළ නැංවීම යනාදිය ඵලදායිතාව ඉහළ නැංවීමේ විකල්පයන් වේ.

### කාර්යඵල

- $F_2$ පරම්පරා බිහි කිරීම සඳහා ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1කට ටොන් 12.5) පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී (ගබඩා පළිබෝධ සහ කහ විචිත්‍ර වෛරසය) කෙටි කාලීන සහ දිගු

කාලීන ( දින 90කට අඩු සහ දින 100කට වැඩි) යනාදී ගුණයන් අපේක්ෂිතව 2011/12 මහ කන්නයේදී මුහුම් කළ $F_1$ගහන 9ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි.

## තෙල් බීජ බෝග

### සෝයා

ශ්‍රී ලංකාවේ කුකුල් කෑම සහ මිනිස් ආහාර නිෂ්පාදනය සඳහා ලාභදායී ප්‍රභවයක් ලෙස සෝයා බෝංචි යොදා ගන්නා අතර කුකුල් කෑම කර්මාන්තය ප්‍රධාන වශයෙන්ම ආනයන කරනු ලබන සෝයා බෝංචි පුන්නක්කු (Soy bean cake) මත පවතී. වත්මන්හි ආනයනය කිරීම් මත යම් යම් සීමාවන් පනවා ඇති බැවින් දේශීය සෝයා බෝංචි නිෂ්පාදනය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. කෙසේවුවද, මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන අතර 2011 වසරේදී සෝයා බෝංචි වගා කළ වපසරිය හෙ. 2 451ක් පමණ වූ අතර අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටොන් 1. 57ක්ද නිෂ්පාදිතය ටොන් 3 847ක්ද වේ. නිෂ්පාදනය අඩු වීමට එක් හේතුවක් වනුයේ ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේදවල හිඟය වන අතර බෙහෙවින් ශ්‍රී ලාංකීය ගොවීන් අතර වගා කළ ප්‍රභේදය වනුයේ Pb 1 යන ප්‍රභේදයයි. එබැවින්, නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ඉහළ අස්වනු ගෙන දෙන සෝයා බෝංචි ප්‍රභේද බිහි කිරීම එක් ප්‍රධාන විසඳුමකි.

## කාර්යඵල

- දින 90කින් පමණ පරිණත වන ක්‍රීම් පැහැති ලොකු බීජ වලින් යුත් (බීජ 100ක් ග්‍රෑම් 12 -13ක්) ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1කට ටොන් 5කට වැඩි) MISB 1 ප්‍රභේදය කොන්දේසි මත මුදා හරින ලදි. මෙය බැක්ටීරියා පස්ටියුල් රෝගයට සහ කැඩීයාමට ඔරොත්තු දෙන ප්‍රභේදයකි.
- දෙමුහුම්කරණය සඳහා වඩා හොඳ මාපියන් හඳුනා ගැනීමට සහ ගොවීන්ට වගා කිරීම සඳහා නිර්දේශ කිරීමට බලාපොරොත්තු තැබිය හැකි ක්‍රීම් පැහැති ලොකු බීජ වලින් සමන්විත ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1කට ටොන් 4කට වැඩි) ප්‍රභේදයක් තෝරා ගැනීමට ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන ජාලය මඟින් ලද සෝයා බෝංචි ජනකප්ලාස්ම 9ක් ඇගයීමට ලක් කෙරිණි.

## වියළි කලාපීය එළවළු

### බණ්ඩක්කා

බණ්ඩාක්කා කන්න දෙකේදීම වගා කළ හැකි බැවින් සහ ඉක්මනින් අදායම් උපයාගත හැකි බැවින් වියළි කලාපයේ ගොවීන් අතර ජනප්‍රිය එළවළු බෝගයක් බවට පත්ව ඇත. දිවයිනේ බණ්ඩක්කා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පළිබෝධ සහ රෝග වලට ඔරොත්තු දෙන ඉහළ අස්වනු ගෙන දෙන දෙමුහුම් බණ්ඩාක්කා ප්‍රභේද බිහි කිරීම වැදගත් වේ.බණ්ඩාක්කා අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂි ළිං ඇසුරින් වගා කරන ගොවීන් අතර වැදගත් බෝගයක් වන අතර ඔවුන් මෙම එළවළු බෝගය ඉක්මනින් ආදායම් ලබා ගත හැකි ප්‍රභවයක් ලෙස මෙන්ම අස්වනු නෙලන සමයේදී දිනක් හැර දිනක් අස්වනු නෙලාගත හැකි බැවින් වගා කෙරේ.

## කාර්යඵල

OKS 1 සහ OKS 3 යන බණ්ඩාක්කා ආර දෙක බෝගයේ මුල් අවධියේදී වෛරස් ආසාදන වලට ලක් වීමේ ප්‍රවණතාව අඩු වීම සහ පර්යේෂණ මට්ටමින් මනා වූ කරල් ලක්ෂණ වලින් සමන්විත වීමත් හේතුවෙන් හොඳම ආර ලෙස වරණය කර ගත් අතර ගොවි ක්ෂේත්‍ර වලදී ඇගයීම සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමට යොමු කෙරිණි.

- බණ්ඩක්කා එකතූන් සහ ආර 25කින් මාපිය ආර ලෙස මනා කරල් ලක්ෂණ වලින් යුත්, අතු බෙදී යාමේ හැකියාවැති සහ ජල අවශෝෂණතාවය අඩු යන ලක්ෂණ පාදකව ආර 3ක් වරණය කර ගත් අතර ඉදිරි අභිජනන වැඩසටහන සඳහා යොදා ගනු ඇත.

## පලතුරු

### මිදි

- මිදි වැල් පුහුණු කිරීම සඳහා “වන ශාක” හඳුනා ගැනීම සඳහා මිදි ප්‍රභේද 4ක් (ඊශ්‍රායල්බ්ලූ, මස්කට් MII, ෆ්‍රෙන්ච් MI සහ කන්දරා) සජීවී වන ශාක (ග්ලිරිසීඩියා, ඉපිල් ඉපිල්, ගන්සූරියා සහ කිලාවෙයි) මත පුහුණු කෙරිණි. ඉපිල් ඉපිල් ශාකය යොදා ගනිමින් පුහුණු කළ මිදි වැල් වල වර්ධනය ඉහළ මට්ටමක පැවති අතර කිලාවෙයි මත පුහුණු කළ මිදි වැල් වල වර්ධනය අඩු මට්ටමක පැවතුණි.

### දිවුල්

- ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙන් එක් රැස් කර ගත් දිවුල් එකතූන් 8ක් ඉහළ අස්වනු ගෙන දෙන සහ ගුණාත්මක ඵල ගෙන දෙන එකතූන් හඳුනා ගැනීම සඳහා ඇගයීමට ලක් කළ අතර පරීක්ෂාවට ලක් කෙරුණු එකතූන් අතරින් ගොවිපළ යාන්ත්‍රිකරණ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් එක් රැස් කරගත් එකතූන් වඩාත් සාර්ථක ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ලදි. ගසක ඵල දැරීමේ සාමාන්‍යය ගෙඩි 474ක් වූ අතර ගෙඩියක් ග්‍රෑම් 200 – 380ක් පමණ විය.

### ශෂ්‍ය විද්‍යාව

- මිරිස් සඳහා වසුන් යෙදීම, ගැඹුරට පස පෙරලීම සහ කාබනික ද්‍රව්‍ය යෙදීමේ ඒකාබද්ධ බලපෑම පිළිබඳ පරීක්ෂා කර බලන ලදි. ඉහත සඳහන් පරිදි පසට සිදු කරන ලද සියළුම වෙනස්කම් මගින් මහ කන්නයේදී මිරිස් වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති විය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා මෙම අත්හදා බැලීම ඉදිරි කන්න තුනකදීද අඛණ්ඩවම සිදු කරනු ඇත.
- කලාපීය අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධයෙන් මාස 3,3 ½ සහ 4 - 4 ½ යන විවිධ වයස් කාණ්ඩ වලට අයත් වී ප්‍රභේද සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කළ අතර අවසන් විශ්ලේෂණ කටයුතු සඳහා එක් රැස් කර ගත් දත්ත බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත යවන ලදි.
- පැරෂූට් බන්දේසි, මධ්‍යම ප්‍රමාණයේ තවාන් බන්දේසි (බඳුනකට වලවල් 128ක්) සහ විශාල තවාන් බන්දේසි (බඳුනකට වලවල් 72) යොදා ගනිමින් මිරිස් සහ කුරක්කන් සඳහා විකල්ප තවාන් තාක්ෂණ ක්‍රමයක් පරීක්ෂා කර බලන ලදි. මධ්‍යම ප්‍රමාණයේ වලවල් සහිත තැටි වල සහ විශාල ප්‍රමාණයේ වලවල් සහිත තැටි වල ජෛව ස්කන්ධයන් උදුරා සිටුවීමේදී ඒවා අතර සැලකිය යුතු වෙනසක් දක්නට නොවීය. සාමාන්‍ය තවාන හා සංසන්දනාත්මකව මිරිස් සහ කුරක්කන් පැළ උදුරා සිටුවීමේදී තවාන් තැටි යොදා ගැනීමෙන් කම්පනය අඩු විය. වඩාත් ලාභදායක විකල්ප තවාන් තාක්ෂණයන් බිහි කිරීම සඳහා මෙම අත්හදා බැලීම තවදුරටත් සිදු කෙරෙන අතර ඉහත බෝග දෙක සඳහා වඩාත් යෝග්‍ය තවාන් තැටි වර්ග පිළිබඳව සොයා බලනු ඇත.
- වායුගෝලීය උෂ්ණත්වය වෙනස්වීම සහ වර්ෂාපතන රටාවේ විචල්‍යතාව මගින් අහිතකර ජෛව සහ අජෛව තත්ත්වයන් පැන නගින අතර මෙම

තත්ත්වයන් හේතුවෙන් ආහාර වල ඵලදායිතාව අඩු වේ. එබැවින් පත්‍ර ප්‍රභාසංස්ලේෂණය, ක්ලෝරොෆිල් අන්තර්ගතය, උත්ස්වේදන අනුපාතය, පත්‍ර වර්ගඵල දර්ශකය, රිකිල්ලේ සිට මුල දක්වා වියළි බර, පුමාංගි මල 50%ක් සහ ධාන්‍ය අස්වැන්න පදනම්ව ජල හිඟ තත්ත්වයන් සහ සාමාන්‍ය ජල සම්පාදන තත්ත්වයන් යටතේ සහභිජාත බඩඉරිඟු ආර 10ක් පරික්ෂා කර බලන ලදි. අහිතකර තත්ත්වයන් වලදී පවා P 31-7-1, නො. 20X, නො. 11 යෙලෝ සහ P 36-4 මනා ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ අතර මෙම සහභිජාත ආර ඉදිරි අභිජනන කටයුතු සඳහා යොදා ගත හැකිය. මෙම අධ්‍යයනට 2012 යල කන්නයේදීද නැවත සිදු කරනු ඇත.

- සම්පත් බඩඉරිඟු මාපිය ආර සඳහා එකවිට මල්හට ගැන්වීම පිළිබඳව අධ්‍යයනය කෙරිණි. සම්පත් දෙමුහුමේ පිරිමි ආර CML 348 වන අතර ජායාංගි ආර CML 20 වේ. මෙම අධ්‍යයනයේ පරමාර්ථව වනුයේ පුමාංගි ආර වල මල් ජායාංගි ආර වල මල් සමඟ අතිපිහිත වීම සඳහා එකවිට මල් හට ගැනීම සම්න්ධයෙන් අධ්‍යයනය කිරීමයි. වර්ධනය වන ප්‍රමාණයේ දින ගණන ගණනය කිරීමෙන් අතිච්ඡාදනය ගණනය කළ හැකිය. මහ කන්නයේදී පුමාංගි මල් සහ ජායංගි මල් අතිපිහිත වීම සඳහා පුමාංගි ආර රෝපණය කර දින 7කට පසුව ජායංගි ආර රෝපණය කළ යතු බව අනාවරණය විය. සහභිජාත ආර 2ක් අතර පවතින පරතරය වෙනස් කරමින් බීජ හට ගැනීමේ අනුපාතය පිළිබඳව සොයා බැලීම සඳහා මෙම අධ්‍යයනය තවදුරටත් සිදු කළ යුතුය.

## බෝග ආරක්ෂණය

### ව්‍යාධිවේදය

- වාණිජ මට්ටමට යාමට පෙර ආනයනික ලූණු බීජ වල රෝග වලට ප්‍රතිරෝධිතාව සහ නව රෝග හඳුනා ගැනීම බෙහෙවින් වැදගත් වේ. විදේශීය ලොකු ලූණු ප්‍රභේද ප්‍රධාන රෝග කෙරෙහි දක්වන ප්‍රතිරෝධිතාව පිළිබඳව සොයා බැලීම සඳහා මෙම අධ්‍යයනය 2012 යල කන්නයේදී සිදු කළ අතර දේශීය දඹුල්ල වරණය සමඟ විදේශීය ලොකු ලූණු ප්‍රභේද 17ක් පරික්ෂාවට ලක් කෙරිණි. පවතින කාලගුණික තත්ත්වයන් කන්නය තුළදී රෝග පැතිරීයාම කෙරෙහි හිතකරව නොපැවතුණි. කෙසේවුවද, ඇතැම් ප්‍රභේද දිලීරයක් හේතුවෙන් සිදුවන බල්බ කුණු වීමට සහ ඇන්ත්‍රැක්නෝස් රෝගයට පාත්‍ර විය. මේ අතරින් එක් ප්‍රභේදයක්වත් දම්පුල්ලි රෝගයට පාත්‍ර නොවීය. MI BO 10-1 ප්‍රභේදය ඇන්ත්‍රැක්නෝස් රෝගයට ඉහළ පාත්‍රී බවක් පෙන්නුම් කළ අතර W 241 ගලුටාන් සහ DR 1 යන ප්‍රභේද දෙක එම රෝගයට පාත්‍ර විය. මෙම ප්‍රභේද වලින් එක් ප්‍රභේදයක්වත් බල්බ කුණුවීමට පාත්‍ර නොවීය. ප්‍රතිඵල තහවුරු කර ගැනීම සඳහා මෙම අත්හදා බැලීම් 2012/13 මහ කන්නයේදී නැවත සිදු කරනු ඇත.
- මිරිස් වගා කරන බොහෝ ගොවීහු රෝග හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම කර ගැනීම සඳහා නයිට්‍රජන් පොහොර ඉහළ ප්‍රමාණයක් සිය වගාවට යොදති. එහෙත් ප්‍රමාණවත් ප්‍රමාණ වලින් බෝගයට පෝෂණය ලබාදීමෙන් පැළ තුළ රෝග වලට ඔරොත්තු දීමේ හෝ ප්‍රතිරෝධී වීමේ හැකියාව වඩාත් ඇති කරයි. එබැවින්, මිරිස් වල ප්‍රධාන රෝග වලට විවිධ නයිට්‍රජන් මට්ටම් මගින් ඇති කරන බලපෑම හඳුනා ගැනීම සඳහා මෙම

අධ්‍යයනය සිදු කරන ලදි. ට්‍රිපල් සුපර් පොස්පේට් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් වල නිර්දේශිත මාත්‍රා සමග යූරියා මට්ටම් පහක් මිරිස් වගාවට යෙදූ අතර හෙ. 1කට නයිට්‍රජන් කි.ග්‍රෑ. 100ක්, 150ක්, 200ක්, 250ක් සහ 300ක් වශයෙන් විවිධ ප්‍රමාණ වලින් නයිට්‍රජන් මට්ටම වැඩි කළ විට රෝග වැළඳීම ඉහළ විය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා මෙම අත්හදා බැලීම 2012/13 මහ කන්නයේදී සිදු කෙරෙනු ඇත.

- මුං සහ උඳු වගාවේ රෝග පාලනය කිරීම සඳහා රසායනික භාවිතා කිරීම නිරන්තරයෙන්ම ප්‍රායෝගික නොවන අතර වඩාත්ම වාසිදායක ක්‍රමය වනුයේ බෝගය සතු ප්‍රතිරෝධිතාවයයි. එබැවින්, මුං සහ උඳු වලට වැළඳෙන ප්‍රධාන රෝග සඳහා ප්‍රතිරෝධී / ඔරොත්තු දෙන ආර සොයා ගැනීම සඳහා පර්යේෂණ සිදු කෙරිණි. ප්‍රභේද බොහොමයකටම (ස්ප්‍රෙඩර් ප්‍රභේදය ඇතුළුව) රෝපණය කර මාසයක් ඉක්ම ගිය පසු පත්‍ර රැලි ගැසීමේ වෛරසය දැඩි ලෙස ආසාදනය වූ අතර බෝගයේ අවසන් අදියරයේදී අනෙකුත් රෝග වැළඳිය හැකි පැළ හඳුනා ගත නොහැකි විය. මුං ආර වලින් පත්‍ර රැලි ගැසීමේ වෛරසයට ආර 6ක් ඉහළ පාත්‍රී බවක්ද ආර 14ක් පාත්‍රී බවද උඳු ආර අතරින් ආර 2ක් ඉහළ පාත්‍රී බවක්ද 11ක් පාත්‍රී බවද පෙන්නුම් කෙරිණි. මෙම අත්හදා බැලීම නැවත සිදු කෙරෙනු ඇත.

## කීට විද්‍යාව

- ගොවීහු මිරිස් වගාවේ අස්වැන්න වර්ධනය කර ගැනීම සඳහා නයිට්‍රජන් ඉහළ ප්‍රමාණයක් භාවිතා කරති. කෙසේවුවද, අස්වැන්න වැඩි කර ගැනීමට නයිට්‍රජන් ඉහළ ප්‍රමාණයක් භාවිතා කිරීමෙන් පළිබෝධ ගහනය ඉහළ යාම මෙන්ම පත්‍ර රැලි ගැසීමේ ගැටළුව උත්සන්න විය හැකිය. එබැවින්, විවිධ නයිට්‍රජන් පොහොර මට්ටම් / ප්‍රභව සහ පත්‍ර රැලි ගැසීමේ හානිය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව සොයා බැලීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදි. අනෙකුත් ප්‍රතිකර්ම හා සංසන්දනාත්මකව කැල්සියම් නයිට්‍රේට් යෙදූ බිම් කට්ටි වල පත්‍ර රැලි ගැසීමේ රෝගයේ තීව්‍රතාව පහළ මට්ටමක පැවති අතර අත්හදා බැලීම නැවත සිදු කෙරෙනු ඇත.

- මිරිස් වල පත්‍ර රැලි ගැසීමේ රෝගයට එරෙහිව කෘමිනාශක නියමු මට්ටමින් පරික්ෂා කර බලන ලදුව මෙම රෝගය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා කෘමිනාශක 2ක් (ඉමිඩැක්ලොප්‍රිඩ් 70% WG සහ ඇබමෙක්ටින් 3.6 EW) නිර්දේශ කළ හැකිය.

- පැළ මැක්කා ලූණු සහ අනෙකුත් බෝග කීපයකට හානිකරන වඩාත් වැදගත් පළිබෝධයක් වන අතර මෙම පළිබෝධය පාලනය කිරීම සඳහා විවිධ ක්‍රියාකාරීත්වයෙන් යුත් විකල්ප කෘමිනාශක පිළිබඳව සොයා බැලීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදි. කෘමිනාශක 7ක් අත්හදා බැලූ අතර ප්‍රතිකර්ම වලින් සැලකිය යුතු වෙනසක් නොවීය. මෙම අත්හදා බැලීම 2012 යල කන්නයේදීද සිදු කරනු ඇත.

- පළිබෝධ හානි සම්බන්ධයෙන් ලූණු ආර 20ක් අගයන ලදි. සියළුම ආර පැළ මැක්කාගෙන් හානි විය. පරීක්ෂාවට ලක් කළ සියළුම ලූණු ආර වලට ලූණු දළඹුවාගේ හානිය ඉතාමත් අඩු විය.

- පළිබෝධ සහ රෝග වලින් බෝග ආරක්ෂා කිරීම සඳහා වඩාත්ම කාර්යක්ෂම ක්‍රමයක් වනුයේ බීජ ප්‍රතිකර්මය ලබා දීමයි. එබැවින්, පාංශු පළිබෝධ, කුඩිත්තන් සහ බඩ ඉරිඟු වල පුරුක් පණුවාගේ පළමු පරම්පරාවේ හානි අඩු කිරීම සඳහා

කෘමිනාශක බීජ ප්‍රතිකර්ම දෙකක කාර්යක්ෂමතාව පිළිබඳව සොයා බැලීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදි. බීජ ප්‍රතිකර්ම දෙකම (තයෝමෙතොක්සම් 70% WS සහ ඉමිඩක්ලොප්‍රිඩ් 70%WS) බෝගයේ මුල් අවදියේදී ඇති වන පළිබෝධ හානි කාර්යක්ෂමව පාලනය කරන ලදි.

- කෘමි පළිබෝධ ධාන්‍ය රනිලවල ගුණාත්මය සහ අස්වැන්න කෙරෙහි දැඩි ලෙස හානි පමුණුවන අතර දැනට තිබෙන කෘමිනාශක යෙදීමෙන් පළිබෝධ හානි වල සැළකිය යුතු පාලනයක් සිදු වී නොමැති බැවින් පළිබෝධ කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා මුං ජනක ප්ලාස්ම /ආර 36ක් සහ උඳු ප්‍රභේද 28ක් අගයන ලදි. මුං ආර 18ක් සහ උඳු ආර 10ක් පළිබෝධ හානි වලට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වූ අතර ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා අත්හදා බැලීම් නැවත සිදු කරනු ඇත.

## වල් පැළෑටි කළමනාකරණය

ක්ෂේත්‍ර බෝග සඳහා නිර්දේශිත පැළෑටි නාශක ඉතාමත් අඩු බැවින් සහ ශ්‍රම පිරිවැය ඉහළ වීම හේතුවෙන් ක්ෂේත්‍ර බෝග අංශයේ වල් පැළෑටි ඉවත් කිරීම ප්‍රධාන ගැටළුවක් බවට පත් වෙමින් තිබේ. මෙම දුෂ්කරතාවය මඟ හරවා ගැනීම සඳහා ආයතනයේ පර්යේෂණ වැඩසටහන යටතේ නව පැළෑටි නාශක ඇගයීම අඛණ්ඩවම සිදු කෙරේ. 2012 වසරේදී පහත සඳහන් පර්යේෂණ සම්පූර්ණ කළ අතර ප්‍රතිඵල පහත පරිදි වේ.

- මිරිස් සහ රටකජු වගාවේ වල් පැළෑටි පාලනයෙහි ක්වින්සලොප් - පී-එතිල් ලීටරයකට ග්‍රෑ. 50 EC වල කාර්යක්ෂමතාවය පිළිබඳව සොයා බලන ලදි. මිරිස් සහ රටකජු වගාවේ හෙ. 1කට ලීටර් 1.0, 1.5ක් සහ 2.0ක් ලෙස අනුපාත තුනක් පරීක්ෂාවට ලක් කෙරිණි. නව පැළෑටිනාශකය තෘණ පාලනයෙහි පමණක් සාර්ථක වූ අතර පරීක්ෂණ වාර්තා නියමු පරිමාණයේ අත්හදා බැලීම් සඳහා පැළෑටි සංරක්ෂණ ඒකකය වෙත ඉදිරිපත් කෙරිණි.
- බඩ ඉරිඟු වගාවේ වල් පාලනයෙහිලා හැලොසල්ෆියුරොන් මෙතිල් 75 WGහි සාර්ථකත්වය පිළිබඳ පරීක්ෂා කර බැලීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදි. හෙ. 1කට ග්‍රෑම් 60ක්, 80ක් සහ 100ක් වශයෙන් නව පැළෑටිනාශකයේ අනුපාත තුනක් පරීක්ෂා කරන ලදුව එම පැළෑටි නාශකය පත්වර්ග පමණක් පාලනය කරන බව අනාවරණය කර ගන්නා ලදි. පරීක්ෂණ වාර්තාව නියමු පරිමාණයේ පරීක්ෂණ සිදු කිරීම සඳහා පැළෑටි සංරක්ෂණ ඒකකය වෙත ඉදිරිපත් කරන ලදි.
- රනිල වගාවේ වල් පැළ පාලනය කිරීමෙහිලා ඉමසැතපීර් වල කාර්යාක්ෂමතාව පිළිබඳව පරීක්ෂා කර බලන ලදි. මුං වගාවේ පූර්ව නිර්ගමන සහ පශ්චාත් නිර්ගමන යෙදීම් ලෙස හෙ. 1කට මි.ලී. 600ක්, 700ක් සහ 800ක් වශයෙන් ඉමසැතපීර් අනුපාත තුනකින් පරීක්ෂා කෙරිණි. පූර්ව නිර්ගමන යෙදීමෙන් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල ලද අතර වැඩිදුරටත් ඇගයීම් සිදු කෙරෙනු ඇත. නියමු පරිමාණයේ පරීක්ෂණ සඳහා පරීක්ෂණ වාර්තා පැළෑටි සංරක්ෂණ ඒකකය වෙත ඉදිරිපත් කරන ලදි.
- බඩ ඉරිඟු වගාවේ වල් පැළ පාලනය කිරීම සඳහා නිකොසල්ෆියුරොන් වල සුදුසු අනුපාත සහ සංයෝග හඳුනා ගැනීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදි. සංයෝග තුනක් (නිකොසල්ෆියුරොන් 25% SL හෙ. 1කට මිලි ලීටර් 150ක්, නිකොසල්ෆියුරොන් 4% SC හෙ.

1කට මිලි ලීටර් 1000ක් සහ නිකොසල්ෆියුරොන් 75% WDG හෙ. 1කට ග්‍රෑ. 40ක්) සහ එක් එක් සංයෝගයකින් අනුපාත තුනක් පරික්ෂා කර බලන ලදි. සංයෝග තුනම බඩ ඉරිඟු වගාවේ වල් පාලනය කිරීමෙහිලා සාර්ථක බැව් නිරීක්ෂණය වූ අතර වැඩිදුර ඇගයීම් සිදු කෙරෙනු ඇත.

- ලූණු වගාවේ වල් පැළෑටි පාලනය කිරීමෙහිලා ඔක්සිෆ්ලූඕෆෙන් 480 g/l SC හි කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යයනය කෙරිණි. දැනට තිබෙන නිර්දේශිත ඔක්සිෆ්ලූඕෆෙන් 240g/lE සංයෝගයට වඩා නව සංයෝගය ලූණු වගාවේ වල් පාලනයෙහි වඩාත් කාර්යක්ෂම වූ බැව් අනාවරණය වූ අතර වැඩිදුර ඇගයීම් සිදු කරනු ඇත.

## පාංශු සාරවත්භාවය

- ග්ලිරිසීඩියා පත්‍ර ඉතා හොඳ නයිට්‍රජන් ප්‍රභවයකි. මිරිස් බෝගයේ රසායනික නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවය අඩු කිරීම සඳහා ග්ලිරිසීඩියා පත්‍ර සමඟ රසායනික පොහොර ඒකාබද්ධ කර යෙදීමෙන් පරීක්ෂා කර බලන ලදි. හෙ. 1කට ග්ලිරිසීඩියා කොළ ටොන් 06ක් යෙදීමෙන් මිරිස් බෝගය සඳහා අවශ්‍ය රසායනික නයිට්‍රජන් පොහොර ප්‍රමාණය 25% කින් අඩු කර ගත හැකි බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය. මෙම ප්‍රමාණයෙන් අඩක් රෝපණය කිරීමට සතියකට පෙර යෙදිය හැකි අතර ඉතිරි ප්‍රමාණය රෝපණය කර සති 4කට පසුව යෙදිය හැකිය.

- බඩ ඉරිඟු සඳහා ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) වෙනුවට ආදේශකයක් ලෙස දේශීයව නිපදවන ලද එප්පාවල සිංගල් සුපර් පොස්පේට්වල (ESSP) යෝග්‍යතාව පිළිබඳව, බඳුන් යොදා ගෙන සිදු කළ අත්හදා බැලීම් මගින් ලද බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා සිදු කරන ලද අත්හදා බැලීම් එම ස්ථානයේදීම නැවත සිදු කිරීමට සැලසුම් කෙරිණි. 2011/12 මහ කන්නයේදී සහ 2012 යල කන්නයේදී සිදු කරන ලද අත්හදා බැලීම් වලින් බඩ ඉරිඟු සඳහා සිදු කරන ලද ප්‍රතිකර්ම තුළින් සැලකිය යුතු වර්ධනයක් සහ අස්වනු ක්‍රියාකාරීත්වයක් ඇති වූ බව නොපෙන්විය. ප්‍රතිඵල නිකුත් කිරීමට සහ නිර්දේශ ලබාදීම සඳහා එළඹෙන කන්න වලදී අත්හදා බැලීම නැවත සිදු කරනු ඇත.

## ජල කළමනාකරණය

- වත්මන් කෘෂිකාර්මික කටයුතු වල ජල භාවිත කාර්යක්ෂමතාව / ජලයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැදගත් සංරචක ලෙස ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති හඳුනා ගැනිණි. පොහොර මිශ්‍රිත ජල සම්පාදන ක්‍රමය යනු ශාකයට අවශ්‍ය පෝෂක ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමය හරහා, විශේෂයෙන්ම වැස්සුම් හා බිංදු ජල සම්පාදන ක්‍රම මගින් ශාක මූල කලාපයට ද්‍රාව්‍ය ආකාරයෙන් සැපයීම සඳහා යොදා ගනු ලබන දියුණු තාක්ෂණ ක්‍රමයකි.

කෙසේවුවද, මිරිස් සඳහා විධිමත්ව සිදු කළ පර්යේෂණ සොයා ගැනීම් පාදකර ගත් පොහොර මිශ්‍රිත ජල සම්පාදන පිළිබඳ වූ නිර්දේශ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව නොපවතින බැවින් රතුවන් දුඹුරු පසේ වගා කරන මිරිස් බෝගය සඳහා පොහොර මිශ්‍රිත ජල සම්පාදනයක් නිර්දේශ කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදි. 2012 යල කන්නයේදී සිදු කළ අධ්‍යයනයට අනුව කාෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද පොහොර එක් කර සිදු කළ පොහොර

මිශ්‍රිත ජල සම්පාදනය මගින් මිරිස් වගාවේ වර්ධනයේ සහ අමුමිරිස් අස්වැන්නෙහි සමාන ක්‍රියාකාරීත්වයක් ගෙන දුන් බව අනාවරණය විය. මෙම අධ්‍යයනය යම් යම් වෙනස්කම් සිදු කර 2013 යල කන්නයේදීද සිදු කරනු ඇත.

- ජලය සම්පාදනය කිරීමේදී ජල අවශ්‍යතාවය නිර්ණය කිරීම පිණිස දේශගුණික විද්‍යාත්මක ක්‍රමය යොදා ගනිමින් රතුවන් දුඹුරු පසෙහි හොඳින් ජලය ගලා යන බිමක වගා කරන මිරිස් බෝගය සඳහා කාල පරතරයකින් යුතුව ජලය සම්පාදනය කිරීමෙන් වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඇති වන බලපෑම අධ්‍යයනය කිරිමට අත්හදා බැලීමක් සිදු කරන ලදි. මිරිස් වගාවේ වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරීත්වය මෙන්ම සම්පාදිත ජල භාවිත කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා සිදු කළ දින 3, 6, 9 සහ දින 12 ජල සම්පාදන කාල පරතරයන් අතරින් දින 06ක කාල පරතරයෙන් සිදු කරන ජල සම්පාදනය වඩාත්ම යෝග්‍ය බැව් අනාවරණය විය. තවද, දින 7ක කාල පරතරයෙන් සිදු කරන ජල සම්පාදනයද යෝග්‍ය බැව් ප්‍රතිඵල මගින් සනාථ විය.

## ආහාර තාක්ෂණය

- දළ ප්‍රෝටීන් සහ දළ මේද අන්තර්ගතය පිළිබඳව සොයා බැලීම සඳහා සෝයා බෝංචි ප්‍රභේද/ ආර තුනක් (Pb 1, 10966 සහ PM 13) පරික්ෂාවට ලක් කෙරිණි. දළ ප්‍රෝටීන් අන්තර්ගතය සහ දළ මේද අන්තර්ගතය අතර සැලකිය යුතු වෙනසක් නොතිබුණු අතර ප්‍රතිඵල මගින් Pb 1හි ප්‍රෝටීන් අන්තර්ගතය PM 13 සහ 10 966 ප්‍රභේද/ ආර වල අන්තර්ගත ප්‍රෝටීන් ප්‍රමාණයට වඩා ඉහළ මට්ටමක (38.33%) පැවති බවද 10 966 ආරහි අඩංගු දළ මේදය PM 13 සහ Pb 1 ප්‍රභේද වල අන්තර්ගත ප්‍රමාණයට වඩා ඉහළ මට්ටමක (18%) පැවති බැව්ද අනාවරණය විය.

- අඹ ප්‍රභේද 26ක් භෞතික ගුණාංගයන් (දිග, බර, වටප්‍රමාණය සහ ඝනත්වය) සහ රසායනික ගුණාංගයන් (බ්‍රික්ස්, PH, අනුමාපනය කළ හැකි ආම්ලිකතාව සහ මාංසලයේ පැහැය ආදිය) සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරිණි. සිල් ප්‍රභේදයේ අනුමාපනය කළ හැකි ආම්ලිකතාව අනෙකුත් ප්‍රභේද වලට (පලතුරු සැකසීමේදී) වඩා වැඩි බවත් "අන්වර් රාතුල්" ප්‍රභේදයේ
බ්‍රික්ස් අගය අනෙකුත් ප්‍රභේද වලට වඩා වැඩි බවත් ප්‍රතිඵල මගින් අනාවරණය විය.

## ජෛව තාක්ෂණය

දිවයිනේ ඉහළ යන ආහාර නිෂ්පාදනය හේතුවෙන් යෙදවුම් වල උපරිම ප්‍රයෝජනය ගෙන දෙන ක්‍රමෝපායන් නිරන්තරයෙන්ම වැඩිදියුණු කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය ඇති කරනු ලබයි. පළිබෝධ පාලනය පිළිබඳ නව ක්‍රමයන් හඳුන්වාදීම සහ ජානමය බෝග වැඩිදියුණු කිරීමේදී නවතම ශිල්ප ක්‍රම යොදා ගැනීම සිදු කෙරුණු අතර මෙම කාර්යඵල බොහොමයක්ම සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම මගින් ඉටු කර ගැනිණි. කෙසේවුවද සාම්ප්‍රදායික අභිජනන තාක්ෂණයන් වැඩි කාලයක් ගන්නා නමුත් නවතම ජෛව තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගැනීමෙන් නව වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය වේගවත් කළ හැකි සේම රෝග විනිශ්චය කිරීම සහ අදාළ ශාක ආරක්ෂණ පර්යේෂණ කටයුතුද අණුක ජෛව විද්‍යාත්මක ශිල්ප ක්‍රම සහ පටක රෝපණ තාක්ෂණික ක්‍රම මගින් වේගවත් කර ගත හැකිය.

## කාර්යඵල

- අණුක සලකුණු කිරීම් මගින් ගුණාත්මක ප්‍රෝටීන් එක් කළ බඩ ඉරිඟු ආර/ප්‍රභේද බිහි කිරීම.
- ගුණාත්මක ප්‍රෝටීන් එක් නොකළ බඩ ඉරිඟු ආර වලට ඔපෙක් 2 - ජානය එක් කිරීම.
- ආර වෙන් කර ගැනීම සඳහා $F_1$ ගහන ස්ව පරාගනය කිරීම.
- DNA නිස්සාරණය කර ගැනීමට සුදුසු තත්ත්වයන් ප්‍රශස්ත කිරීම ආරම්භ කෙරිණි.
- අණුක තාක්ෂණ ක්‍රම යොදා ගනිමින් මිරිස් කොළ කොඩවීමේ වෛරසයට ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන ප්‍රභව හඳුනා ගැනීම සහ සනාථ කර ගැනීම සඳහා අධ්‍යයන ආරම්භ කෙරිණි.

## බීජ නිෂ්පාදනය

### අභිජනක සහ සහතික කළ / වාණිජ බීජ නිෂ්පාදනය

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් අභිජනක සහ සහතික කළ /වාණිජ බීජ වල පහත දැක්වෙන ප්‍රමාණයන් නිපදවා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සහ අනෙකුත් අදාළ සංවිධාන වෙත ලබා දෙන ලදි. (වගු අංක 4.1.2)

**වගු අංක 1.1.2 : 2012 වසරේදී නිපදවන ලද අභිජනක සහ සහතික කළ/ වාණිජ බීජ ප්‍රමාණයන්**

| බෝගය | ප්‍රභේදය | අභිජනක බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) | සහතික කළ/වාණිජ බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|
| බඩ ඉරිඟු | සම්පත් දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේදයේ මාපිය ආර | පිරිමි 262.0 | - |
| | | ස්ත්‍රී 760.0 | - |
| | රුවන් | 20.0 | - |
| | භද්‍රා | 16.0 | - |
| කුරක්කන් | රාවණා | 14.5 | - |
| | ඕෂධ | 20.0 | - |
| මිරිස් | MI ග්‍රීන් | 2.65 | 50.0 |
| | ගල්කිරියාගම වරණය | 2.4 | 23.5 |
| | MI 2 | 2.6 | 34.5 |
| | MI වැරණියා | 10.0 | 1.85 |
| | MI ග්‍රීන් | - | 150.0 |
| | MICH 3 | 3.15 | 10.7 |
| මුං | ආරි | 43.5 | 80.0 |
| | MI 5 | 51.0 | 39.0 |
| | MI 6 | 58.0 | 87.0 |

| බෝගය | ප්‍රභේදය | අභිජනක බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) | සහතික කළ/වාණිජ බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|
| ලොකු ලූණු | දඹුල්ල වරණය | මව් බල්බ 28.0 | 790.0 |
| | | සත්‍ය බීජ 3.34 | 8.5 |
| උඳු | MI 1 | 50.5 | - |
| | අනුරාධ | 68.5 | 791.0 |
| සෝයා බෝංචි | Pb 01 | 75.0 | - |
| කව්පි | ධවල | 75.0 | - |
| | MI 35 | 15.0 | - |
| | වරුණි | 30.5 | - |
| | බොම්බෙ | 10.0 | - |
| බණ්ඩක්කා | හරිත | - | - |
| | MI 7 | 9.75 | - |
| කරවිල | MC 43 | - | - |
| මුරුංගා | කුරු ප්‍රභේදය | 10.0 | - |
| තක්කාලි | KCI | 0.68 | - |
| පතෝල | MI ෂෝට් | 3.6 | - |
| බුෂිටාවෝ | BSI | 26.5 | - |

## තාක්ෂණය පතුරුවාලීම

**පුහුණු වැඩසටහන්, දේශන, වැඩමුළු, ක්ෂේත්‍ර ආදර්ශන, පැළ සායන, ක්ෂේත්‍ර දින, ප්‍රදර්ශන, තාක්ෂණික උපදෙස්**

වසර තුළදී සිදු කරන ලද වැඩසටහන් වල විස්තර පහත දැක්වේ.

- ගොවීන්, පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් සහ තාක්ෂණික විද්‍යාල සිසුන් 2620කට අධික සංඛ්‍යාවක් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය පිළිබඳව පුහුණු වැඩසටහන් 110ක් සිදු කරන ලදි.
- වෙනත් ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විද්‍යාඥයින් සම්පත් පුද්ගලයන් ලෙස විවිධ වැඩසටහන් වලට සහභාගී විය.
  - ක්ෂේත්‍ර ආදර්ශන 30කට වැඩි සංඛ්‍යාවක්
  - පැළ සායන 7ක්
  - ජාතික ප්‍රදර්ශන 2ක් දැයට කිරුළ සහ සියවස් සැමැරුම
  - ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟ ක්ෂේත්‍ර චාරිකා කීපයක් සඳහා සහභාගී විය.
- ආයතනයට පැමිණි සේවා දායකයින් සහ දුරකථනය මගින් 500 දෙනෙකු සඳහා තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදි.
- තාක්ෂණික තොරතුරු පිළිබඳ අත්පත්‍රිකා 1500ක් පමණ බෙදා හැරිණි.

- ගොවීන් සහ අනෙකුත් ආයතන වෙත රෝපණ ද්‍රව්‍ය නොමිලයේ ලබාදුණි.
  - මිදි පැළ 05
  - මුරුංගා පැළ 700
  - බීජ නිෂ්පාදනය සඳහා රාජාංගනය ප්‍රදේශයේ ගොවීන් අතර "ගල්කිරියාගම වරණයේ" මිරිස් පැළ 60,000ක් පමණ (අක්කර 5කට ප්‍රමාණවත්) බෙදා දෙන ලදි.
  - බීජ ද්‍රව්‍ය : කි.ග්‍රෑ. 125ක් (මිරිස්, ලොකු ලූණු, මුං, උඳු, බඩ ඉරිඟු, ඉඳල් ඉරිඟු, කව්පි, සෝයා බෝංචි, කුරක්කන්, රටකජු, සූරියකාන්ත, බණ්ඩක්කා, තක්කාලි, කරවිල, මෙනේරි, තණ හාල්, මුරුංගා)
- මෙම ආයතනයේදී සිසුන් දෙදෙනෙකු සිය සේවාස්ථ පුහුණුව සම්පූර්ණ කළ අතර උපාධි අපේක්ෂක සිසුන් පස් දෙනෙකු සිය අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදි.

#### ගුවන් විදුලි/රූපවාහිනි වැඩසටහන්

- 2012 වසරේදී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විද්‍යාඥයින්ගේ සහභාගීත්වයෙන් ගුවන් විදුලි වැඩසටහන් 4ක් සහ රූපවාහිනි වැඩසටහන් තුනක් විකාශය කරන ලදි.

### සංවර්ධන වැඩසටහන්

"ගොවිපළ සංවර්ධන" ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන කාර්යයන් සම්පූර්ණ කෙරිණි.

- අක්කර 40ක "ක්ෂේත්‍ර ජාන බැංකුව" ස්ථාපිත කිරීමේ මූලික පියවර ගන්නා ලදි.
- අක්කර 2ක තෘණ භූමියක් ස්ථාපිත කරන ලදි.
- මුර කුටි 2ක් ඉදි කිරීම.
- නළ ළිං 2ක් හැරීම.
- අක්කර 4ක් දක්වා දැනට පවතින විසිරුම් ජලසම්පාදන පද්ධතිය ව්‍යාප්ත කිරීම.
- සංයුක්ත බීජ වප්කරය මිළට ගැනීම.
- පශු සම්පත් ඒකකයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම.

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන සඳහා දායකත්වය

- ගුණවර්ධන, කේ. එන්. සී - බඩ ඉරිඟු පිළිබඳ පොත ප්‍රකාශයට පත් කිරීම සඳහා දායක විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය, ශ්‍රී ලංකාව, පිටු අංක 81
- කන්නන්ගර,කේ.එන්.'මිරිස්' අත් පොතේ නව සංස්කරණය සම්පූර්ණ කරන ලදි.
- කන්නන්ගර, කේ. එන් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය සමඟ එක්ව 'මිරිස්' සංයුක්ත තැටියේ නව පිටපත යාවත්කාලීන කරන ලදි.

### පුවත්පත් ලිපි

2012 වසරේදී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විද්‍යාඥයින්ගේ සහභාගීත්වයෙන් ලිපි 7ක් පළ කරන ලදි.

## 2013 වසර සඳහා සැලැස්ම

### පර්යේෂණ

### කුළුබඩු

#### මිරිස්

##### අනාගත සැලැස්ම

වර්ෂාපෝෂිත සහ ජල සම්පාදන තත්ත්ව සඳහා විවෘත පරාගනය වන මිරිස් සහ දෙමුහුම් මිරිස් (පරමාර්ථ දෙකක්) ප්‍රභේද බිහි කිරීම.

**ප්‍රභේද වල අපේක්ෂිත ලක්ෂණ**

- අමු මිරිස් සඳහා ඉලක්ක කරන ලද අස්වැන්න හෙ. 1කට ටොන් 18 – 20ක් සහ වියළි මිරිස් සඳහා හෙ. 1කට ටොන් 3-4 ක් වීම.
- මිරිස් සැර ගතිය ඉහළ වීම.
- මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය, ඇන්ත්‍රැක්නෝස්, සර්කොස්පොරා පත්‍ර පුල්ලි, වෛරස්, පත්‍ර පටුවීමේ රෝගය ආදි ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධිතාව/ඔරොත්තු දීම.
- මිරිස් වගා කරන සියළුම පරිසර පද්ධති වලට උසස් අයුරින් අනුවර්තනය විය හැකි බව.
- ගෙවතු වගාව සඳහා යෝග්‍ය අමු මිරස් ආර.

## වැඩසටහන:

- මිරිස් දෙමුහුම් ප්‍රභේද සඳහා නව මුහුම් නිපදවීම.
- අළුතින් බිහි කළ $F_1$ දෙමුහුම් වල මූලික ඇගයීම සහ බලාපොරොත්තු තැබිය හැකි මිරිස් අභිජනක ආර සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- මාපිය ආර වල සංශුද්ධතාව පවත්වාගෙන යාම සහ බීජ ගුණනය කිරීම.
- විදේශීය මිරිස් දෙමුහුම් වල පරම්පරාව ඉදිරියට ගෙන යාමෙන් සහභිජාත ආර නිපදවීම.
- බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද සහ අභිජනක ආර වලට ජානමය පුං වන්ද්‍යා ලක්ෂණ හුවමාරු කිරීම.
- විවෘතව පරාගනය කරන ලද ප්‍රභේද සඳහා (ද්විත්ව සහ ත්‍රිත්ව) නව මුහුම් නිපදවීම.
- දේශීය භූමි දර්ශ සහ ජනකප්ලාස්ම ඇගයීම, වරණය සහ සංශුද්ධ කිරීම.
- වැරණියා වගා ප්‍රභේද වලින් බලාපොරොත්තු තැබිය හැකි අභිජනක ආර වලට වෛරස් කෙරෙහි ඔරොත්තු දෙන ලක්ෂණ හුවමාරු කිරීම. (ක්ෂෙත්‍රයේ ඔරොත්තු දෙන).
- බලාපොරොත්තු තැබිය හැකි ආර වල ප්‍රභේද සම්බන්ධයෙන් අනුවර්තන අත්හදා බැලීම.
- බලාපොරොත්තු තැබිය හැකි අභිජනක මිරිස් ආර වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- විදේශිය මිරිස් දෙමුහුම් ඇගයීම.
- නිර්දේශිත මිරිස් ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය.

## ලූණු

**අනාගත සැලැස්ම**

- ලොකු ලූණු ප්‍රභේද බිහි කිරීම.

**ප්‍රභේද වල අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරෙන අස්වැන්න (මධ්‍යම කාලීන ප්‍රභේද - මාස තුන)
  - බල්බ අස්වැන්න - හෙ. 1ට ටොන් 35ක්
  - සත්‍ය බීජ අස්වැන්න - හෙ. 10කට කි.ග්‍රෑ. 800ක්
- ඉලක්ක කෙරෙන අස්වැන්න (කෙටි කාලීන ප්‍රභේද - මාස 2 ½ )
  - බල්බ අස්වැන්න - හෙ. 1ට ටොන් 25ක්

– සත්‍ය බීජ අස්වැන්න - හෙ. 1ට කි.ග්‍රෑ. 800ක්

- දිගු කාලයක් ගබඩා කර තැබිය හැකි බව (මාස 4කදී සිදු වන හානිය 25% කට වඩා අඩු වීම)
- ඉහළ සැර ගතිය
- බල්බ විශාලත්වය ග්‍රෑම් 70 – 90
- බල්බ පැහැය - රතු /රෝස (ඉහළ ප්‍රමුඛතාව), කහ /සුදු (අඩු ප්‍රමුඛතාව)
- ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී වීම/ ඔරොත්තු දීම ඇන්ත්‍රැක්නෝස්, දම් පුල්ලි, පැළ මැක්කා සහ ලූණු දළඹුවා.
- අවාරයේ වගා කිරීම සඳහා වූ යෝග්‍යතාව

## වැඩසටහන

- වැඩිදියුණු කරන ලද ලොකු ලූණු ආර වල බල්බ අස්වැන්න ඇගයීම සහ වරණය කිරීම.
- වැඩිදියුණු කරන ලද ලොකු ලූණු ආරවල බීජ අස්වැන්න ඇගයීම සහ වරණය.
- අවාරයේ වගා කිරීම සඳහා ලොකු ලූණු ප්‍රභේද ඇගයීම.
- වරණය කෙරුණු ලොකු ලූණු ආර වල ගබඩා කර තැබිය හැකි කාලය පිළිබඳව අධ්‍යයනය කිරීම.
- මහ කන්නයේදී පවතින අඩු උෂ්ණත්ව තත්ත්වයන් යටතේ සත්‍ය බීජ නිෂ්පාදනය කිරීම සඳහා යෝග්‍ය නව ලොකු ලූණු ආර වැඩිදියුණු කිරීම.
- ලොකු ලූණු වල පරම්පරාව ඉදිරියට ගෙන ඒම.
- බීජ පැළ වලින් බෝ කර ගන්නා ලද වැඩිදියුණු කළ පොකුරු ලූණු ඇගයීම.
- වැඩිදියුණු කරන ලද පොකුරු ලූණු වල බීජ එලදාව පිළිබඳ ඇගයීම.
- බලාපොරොත්තු තැබිය හැකි ආර සහ වරණය කරගත් එකතූන් වල බීජ සහ බල්බ ගුණනය කිරීම.
- දඹුල්ල වරණය නැමැති ලොකු ලූණු ප්‍රභේදයේ මූලික බීජ නිෂ්පාදනය.

## ධාන්‍ය රනිල

### මුං

#### අනාගත සැලැස්ම

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව සඳහා මුං ප්‍රභේද බිහි කිරීම.

#### ප්‍රභේද තුළින් අපේක්ෂිත ලක්ෂණ

- ඉලක්ක කෙරෙන අස්වැන්න - හෙ. 1ට ටොන් 2.2ක්
- කලින් පරිණතවීම - දින 60කට අඩු
- ඒකාකාරී පරිණතවීම.
- මනා වූ බීජ ලක්ෂණ
  – තද බීජ අඩු වීම.
  – ලොකු බීජ 100ක් ග්‍රෑම් 65< කට බීජ 1000ක්
  – දිලිසෙන කොළ පැහැති මතුපිට
- MYMV වෛරසයට සහ කරල් විදින්නාට දක්වන ප්‍රතිරෝධතාව ඉහළ වීම.

## වැඩසටහන

- මුං ජනක ප්ලාස්ම ඇගයීම සහ වරණය
- මුං දෙමුහුම්කරණය සහ වරණය
- බලාපොරොත්තු තැබිය හැකි මුං ආර වල මූලික අස්වනු අත්හදා බැලීම.

- ජල සම්පාදිත සහ වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ බලාපොරොත්තු තැබිය හැකි මුං අභිජනක ආර සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- බලාපොරොත්තු තැබිය හැකි මුං ආර සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම.

**උඳු**

**අනාගත සැලැස්ම**

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව සඳහා උඳු ප්‍රභේද බිහි කිරීම.

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරෙන අස්වැන්න - හෙ. 1ට ටොන් 2.5ක්.
- කලින් පරිණතවීම - දින 60ට අඩු.
- දිගු කාලකින් පරිණතවීම - දින 90
- පළිබෝධ සහ රෝග වලට ඉහළ ප්‍රතිරෝධීතාව.
- විශාල ප්‍රමාණයේ බීජ.
- නියඟයට ඔරොත්තු දීම.
- විවිධ කර්මාන්ත සඳහා යොදා ගත හැකි බව.

## වැඩසටහන :

- උඳු ජනක ප්ලාස්ම ඇගයීම සහ වරණය.
- උඳු දෙමුහුම්කරණය සහ වරණය.

**කව්පි**

**අනාගත සැලැස්ම**

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව සඳහා කව්පි ප්‍රභේද බිහි කිරීම.

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරෙන අස්වැන්න - හෙ. 1ට ටොන් 1.3ක් (වර්ෂාපෝෂිතව)
  - හෙ. 1ට ටොන් 3ක් (ජල සම්පාදිතව)
- කලින් පරිණතවීම - දින 70කට වැඩි
- කල්ගත වී පරිණතවීම - දින 85කට වැඩි
- ඉහළ පාරිභෝගික පිළිගැනීම
- කඳ පාමුල කුණු වීමට, කරල් විදින්නාට ප්‍රතිරෝධී වීම/ඔරොත්තු දීම.

## වැඩසටහන

- කව්පි දෙමුහුම්කරණය සහ වරණය කිරීම.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම - කව්පි
- වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ බලාපොරොත්තු තැබිය හැකි කව්පි ආර ඇගයීම.
- බලාපොරොත්තු තැබිය හැකි නව අභිජනක ආර ලක්ෂණීකරණ කිරීම.
- ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම - කව්පි

**සෝයා බෝංචි**

**අනාගත සැලැස්ම**

- වර්ෂාපෝෂිත සහ ජලසම්පාදිත තත්ත්ව සඳහා සෝයා බෝංචි ප්‍රභේද බිහි කිරීම.

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරෙන අස්වැන්න
  - හෙ. 1ට ටොන් 3.0ක් (වර්ෂාපෝෂිත)

– හෙ.1ට ටොන් 4.0ක් (ජල සම්පාදිතව)

- කලින් පරිණතවීම - දින 75 – 90ට අඩු
- විශාල ප්‍රමාණයේ බීජ 100ක් ග්‍රෑම් 16<
- පරිමිත වර්ධනය
- බීජ වල දිගු කාලීන ජීව්‍යතාව - මාස 3 <
- බිඳී යාමට සහ ඇද වැටීමට ඔරොත්තු දීම.
- ඉහළ පාරිභෝගික පිළිගැනීම.
- දම් පුල්ලි රෝගයට ප්‍රතිරෝධී විම/ ඔරොත්තු දීම.

## වැඩසටහන

- සෝයා බෝංචි දෙමුහුම්කරණය සහ වරණය
- ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් (AVRDC) ලද සෝයා බෝංචි ජනකප්ලාස්ම ඇගයීම.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම - AVRDC මධ්‍යස්ථානයෙන් ලද එළවළු සෝයා බෝංචි ජනක ප්ලාස්ම.
- තිබෙන සෝයා බෝංචි ජනක ප්ලාස්ම නඩත්තු කිරීම.

## තෙල් බෝග

### රටකජු

- බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආරවල බීජ ගුණනය කිරීම.
- ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම - මධ්‍යම කාලීන, බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආර
- රටකජු වල “ බඩ් නෙක්රෝසිස්” සම්බන්ධයෙන් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්.

### අබ

- අබ සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- ගොවි ක්ෂේත්‍ර වල වගා කෙරෙන අබ සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම.

## රළු ධාන්‍ය

### බඩ ඉරිඟු

**අනාගත සැලැස්ම**

- වර්ෂාපෝෂිත සහ ජලසම්පාදිත තත්ත්ව සඳහා බඩ ඉරිඟු දෙමුහුම්, විවෘතව පරාගනය කරන ප්‍රභේද සහ බඩ ඉරිඟු සහභිජාත (මාපිය) ආර බිහි කිරීම.

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරුණු අස්වැන්න
  – දෙමුහුම් - හෙ 1ට ටොන් 7ක්
  – විවෘතව පරාගනය වන ප්‍රභේද - හෙ. 1ට ටොන් 6ක්
- මධ්‍යම කාලීන : දින 105- 110කින් පරිණත වීම.
- ද්විත්ව පරමාර්ථය - අමු කරල් සහ ධාන්‍ය සඳහා.
- බීජ පැහැය - කහ පැහැයේ සිට තැඹිලි පැහැය.
- කඳ විදින්නා, සදර්න් රස්ට් රෝගය, කොපු අංගමාරය සහ හෙල්මින්තොස්පෝරියම් පත්‍ර පුල්ලි රෝගය සඳහා ප්‍රතිරෝධී වීම/ ඔරොත්තු දීම.
- නියඟයට ඔරොත්තු දීම.

## වැඩසටහන

- ප්‍රභේද අනුවර්තන වැඩසටහනින් බලාපොරොත්තු තැබිය හැකි විවෘතව පරාගනය වන ඉන්දුනීසියානු ප්‍රභේද ඇගයීම සහ වරණය කිරීම.
- මෙක්සිකෝවේ අන්තර්ජාතික බඩ ඉරිඟු සහ තිරිඟු වැඩිදියුණු කිරීමේ මධ්‍යස්ථානයෙන් CIMMYT ලද උසස් දෙමුහුම් බඩ ඉරිඟු ඇගයීම.
- ආසියානු බඩ ඉරිඟු වැඩසටහන හරහා ඉන්දියාවෙන් ලද CIMMYT උසස් බඩ ඉරිඟු දෙමුහුම් ඇගයීම.
- දේශීයව බිහි කළ බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ඇගයීම.
- "හයිබ්‍රිඩ් මික්ස්" ගහනයෙන් ලබා ගත් බඩ ඉරිඟු සහභිජාත ආර වැඩිදියුණු කිරීම - පරම්පරාව ඉදිරියට ගෙන යාම.
- විදේශීය ස්වීට් කෝන් සහ බඩ ඉරිඟු දෙමුහුම් ඇගයීම.
- බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් සහ මාපිය ආර වල බීජ නිෂ්පාදනය.

## කුරක්කන්

**අනාගත සැලැස්ම**

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව සඳහා කුරක්කන් ප්‍රභේද බිහි කිරීම.

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරෙන අස්වැන්න - හෙ. 1ට ටොන් 4.0ක්
- මධ්‍යම කාලීන - මාස 3 – 3 ½
- යල සහ මහ කන්න දෙකටම යෝග්‍ය වීම.
- කොළ පාළුවීමේ රෝගයට ප්‍රතිරෝධී වීම/ ඔරොත්තු දීම.

## වැඩසටහන

- වාර්ෂාපෝෂිත සහ ජලසම්පාදිත තත්ත්ව යටතේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් කුරක්කන් එකතුන් ඇගයීම.
- උසස් අස්වනු අත්හදා බැලීමෙන් නව කුරක්කන් එකතුන් ඇගයීම.
- කුරක්කන් ජනක ප්ලාස්ම ඇගයීම.
- මූලික අස්වනු අත්හදා බැලීමෙන් තණහාල් ඇගයීම.
- මූලික අස්වනු අත්හදා බැලීමෙන් ඉදල් ඉරිඟු එකතුන් ඇගයීම.
- නිර්දේශිත කුරක්කන් ප්‍රභේද (රවි) නඩත්තු කිරීම.
- ඉදල් ඉරිඟු ICSV 112 ප්‍රභේදය ගුණනය කිරීම.

**වෙනත් වියළි කලාපීය රළු ධාන්‍ය**

- බලාපොරොත්තු තැබිය හැකි 'මෙනේරි' ජනකප්ලාස්ම නඩත්තු කිරීම.
- බලාපොරොත්තු තැබිය හැකි තණහාල් ජනකප්ලාස්ම නඩත්තු කිරීම.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.

**එළවළු**

**අනාගත සැලැස්ම**

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව සඳහා එළවළු ප්‍රභේද බිහි කිරීම.

**බණ්ඩක්කා**

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරුණු අස්වැන්න - හෙ. 1ට ටොන් 15-20ක්

- කහ විචිත්‍ර වෛරසයට ප්‍රතිරෝධී වීම / ඔරොත්තු දීම.
- ඉහළ පාරිභෝගික පිළිගැන්ම.

## වැඩසටහන

- බණ්ඩක්කා වල ප්‍රභේදීය වැඩිදියුණු කිරීම (දෙමුහුම්කරණය)
- විදේශීය බණ්ඩක්කා ජනකප්ලාස්ම ඇගයීම.
- ඇගයීමට ලක් කළ බණ්ඩක්කා ජනකප්ලාස්ම දෙමුහුම්කරණය කිරීම.
- බලාපොරොත්තු තැබිය හැකි බණ්ඩාක්කා ආර සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලිම්.

**මෑ/එළවළු කව්පි**

**ප්‍රභේද වලින් අපේක්ෂිත ලක්ෂණ**

- ඉලක්ක කෙරුණු අස්වැන්න - හෙ. 1ට ටොන් 15ක්
- කඳ පාමුල කුණුවීමට ප්‍රතිරෝධී වීම / ඔරොත්තු දීම
- කෙටි කාලීන ප්‍රභේද - දින 45 >
- ඉහළ පාරිභෝගික පිළිගැනීම

## වැඩසටහන

- එළවළු කව්පි ජනකප්ලාස්ම ඇගයීම.
- එළවළු කව්පි දෙමුහුම්කරණය සහ වරණය කිරීම.
- මෑ ජනකප්ලාස්ම ඇගයීම.
- මෑ සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- වම්බටු සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.

**පලතුරු**

**වැඩසටහනේ පරමාර්ථ**

- ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේද හඳුනා ගැනීම.
- ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක පිළවෙත් බිහි කිරීම.
- පුහුණු කිරීමේ ව්‍යුහ, කප්පාදු කිරීමේ කාල පරතර, මල් හට ගැනීමේ හෝමෝන වල බලපෑම ආදිය පිළිබඳව අධ්‍යයනය කිරීම.
- ක්ෂෙත්‍ර ජාන බැංකුව ස්ථාපිත කිරීම.
- ජනකප්ලාස්ම / මව් පැළ තවාන් නඩත්තු කිරීම.

## වැඩසටහන

- මිදි සහ අඹ ප්‍රභේද නඩත්තු කිරීම.
- දිවුල් ජනකප්ලාස්ම ඇගයීම.
- මෘදු ඇට සහිත පේර ප්‍රභේද ඇගයීම.
- මිදි ප්‍රභේද තුනක මව් පැළ නඩත්තු කිරීම.
- විදේශීය කොමඩු ප්‍රභේද ඇගයීම.
- මිදිවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ගිබරලික් ඇසිඩ් තැවරීම.
- මිදි වැල් පුහුණු කිරීමේ ක්‍රම ඇගයීම.
- DL1 කලාපයේ ඩ්‍රැගන් ෆෲට් වල දිගු කාලීන ශක්‍යතාව පිළිබඳව අධ්‍යයනය කිරීම.
- මුරුංගා වල බීජ නිෂ්පාදනය කිරීම සඳහා මව් ආර නඩත්තු කිරීම.
- පලතුරු බෝග සඳහා ක්ෂේත්‍ර ජාන බැංකුව ස්ථාපිත කිරීම. (අක්කර 30ක)
- පැපොල් දෙමුහුම් ඇගයීම.

## කීට විද්‍යාව

### අනාගත සැලැස්ම

- පළිබෝධ හේතුවෙන් ක්ෂේත්‍ර බෝග වල ඇති වන බෝග හානිය අවම කිරීම සඳහා ආර්ථික වශයෙන් දැරිය හැකි, පරිසරයට හිතකර කාර්යක්ෂම පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපායන් බිහි කිරීම.

## වැඩසටහනේ පරමාර්ථ

- ක්ෂේත්‍ර බෝග වල පළිබෝධ ගැටළු හඳුනා ගැනීම.
- ප්‍රධාන පළිබෝධ වලට ප්‍රතිරෝධී / ඔරොත්තු දෙන ජනක ප්ලාස්ම, ප්‍රභේද සහ විදේශීය දෙමහුම් හඳුනා ගැනිම.
- පළිබෝධ කෙරෙහි ප්‍රතිරෝධී වීම සඳහා දායක වන ප්‍රභව හඳුනා ගැනීම.
- ප්‍රධාන පළිබෝධ ගැටළු පාලනය කිරීම සඳහා කෘමිනාශක පරික්ෂා කර බැලීම.
- පැරණි පළිබෝධ පාලන ක්‍රම භාවිතා කිරීම.
- සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් බිහි කිරීම.

## වැඩසටහන

- මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය සහ අස්වැන්න කෙරෙහි නයිට්‍රජන් පොහොර වල විවිධ මට්ටම්/ ප්‍රභව මගින් ඇතිවන බලපෑම.
- මිරිස් වගාවේ ප්‍රධාන පළිබෝධ කන්නයේදී සුලභ වීම.
- මිරිස් කොළ කොඩවීමේ රෝගය අවම කිරීම සඳහා විවිධ වසුන් මගින් ඇති වන බලපෑම.
- ලූණු වල පැළ මැක්කා පාලනය කිරීම සඳහා කෘමිනාශක පරික්ෂා කර බැලීම.
- තවාන් මට්ටමේදී ලූණුවල පළිබෝධ පාලනය කිරීම සඳහා බීජ ප්‍රතිකර්ම මගින් ඇති වන බලපෑම.
- ලූණුවල ප්‍රධාන පළිබෝධ වලට ප්‍රතිරෝධීවීම සම්බන්ධයෙන් අභිජනක ආර සහ විදේශීය ප්‍රභේද ඇගයීම.
- පළිබෝධ හානි සම්බන්ධයෙන් විදේශීය බඩ ඉරිඟු දෙමුහුම් ඇගයීම.
- මුං වල ප්‍රධාන පළිබෝධ කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාවය සම්බන්ධයෙන් ජනක ප්ලාස්ම /ප්‍රභේද ඇගයීම.
- උඳුවල ප්‍රධාන පළිබෝධ කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාවය සම්බන්ධයෙන් ජනකප්ලාස්ම / ප්‍රභේද ඇගයීම.
- සෝයා බෝංචිවල ප්‍රධාන පළිබෝධ කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාවය සම්බන්ධයෙන් ජනකප්ලාස්ම / ප්‍රභේද ඇගයීම.

## ව්‍යාධිවේදය

### අනාගත සැලැස්ම

ක්ෂේත්‍ර බෝග වලට වැළඳෙන රෝග හේතුවෙන් සිදු වන බෝග හානි අඩු කර ගැනීම සඳහා ආර්ථික වශයෙන් දැරිය හැකි, පාරිසරික වශයෙන් හිතකර සහ කාර්යක්ෂම රෝග කළමනාකරණ ක්‍රමෝපායන් බිහි කිරීම.

### වැඩසටහනේ පරමාර්ථ :

- ක්ෂේත්‍ර බෝග වලට වැළෙදෙන රෝග හේතුවෙන් සිදුවන බෝග හානිය අවම කිරීම සඳහා ප්‍රතිරෝධී /ඔරොත්තු

දෙන ජනකප්ලාස්ම, ප්‍රභේද සහ විදේශීය දෙමුහුම් හඳුනා ගැනීම.

- ක්ෂේත්‍ර බෝග වලට වැළදෙන රෝග හඳුනා ගැනීම.
- රෝගවලට ප්‍රතිරෝධී වීම සඳහා දායක වන ප්‍රභව හඳුනා ගැනීම.
- ප්‍රධාන රෝග පාලනය කිරීම සඳහා දිලීරනාශක පරික්ෂා කර බැලීම.
- පැරණි පළිබෝධ පාලන ක්‍රම භාවිතා කිරීම.
- සමෝධානික රෝග කළමනාකරණ පිළිවෙත් බිහි කිරීම.

## වැඩසටහන

- මිරිස් වල ප්‍රධාන රෝග කෙරෙහි නයිට්‍රජන් වල විවිධ මට්ටම් මගින් ඇති කරන බලපෑම.
- මිරිස් වල ප්‍රධාන රෝග කෙරෙහි විවිධ නයිට්‍රජන් පොහොර මගින් ඇති කරන බලපෑම.
- මිරිස් වලට වැළදෙන අංගමාර රෝගයක් (Choanephora blight) සඳහා දිලීරනාශක පරික්ෂා කර බැලීම.
- ලූණු වල ඇන්ත්‍රැක්නෝස් සහ දම්පුල්ලි රෝගය සඳහා දිලීරනාශක පරික්ෂා කර බැලීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් විදේශීය ලූණු ප්‍රභේද ඇගයීම.
- ලොකු ලූණු අභිජනක ආර වලට වැළදෙන ප්‍රධාන පළිබෝධ සම්බන්ධයෙන් ඇගයීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් බණ්ඩක්කා ප්‍රභේද / ආර ඇගයීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් කොව්පි එකතූන් ඇගයීම.
- බඩ ඉරිඟු වල කොපු අංගමාරය සඳහා ප්‍රභේද පරික්ෂා කර බැලීමේ තාක්ෂණය බිහි කිරීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් මුං ජනකප්ලාස්ම ඇගයීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් උඳු ජනකප්ලාස්ම ඇගයීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් බලාපොරොත්තු තැබිය හැකි කව්පි ආර පරික්ෂා කර බැලීම.
- ප්‍රධාන රෝග සම්බන්ධයෙන් සෝයා බෝංචි ආර පරික්ෂා කර බැලීම.
- මිදි වල යටි පුස් රෝගය සඳහා දිලීරනාශක පරික්ෂා කර බැලීම.
- මුං කහ විචිත්‍ර වෛරසය (MYMV) සඳහා ප්‍රභේද පරික්ෂා කර බැලීමේ තාක්ෂණයක් බිහි කිරීම.
- උඳුවලට වැළදෙන වෛරස් රෝග සඳහා ප්‍රභේද පරික්ෂා කර බැලීමේ තාක්ෂණයක් බිහි කිරීම.

## ශෂ්‍ය විද්‍යාව

### අනාගත සැලැස්ම

- වියළි කලාපයේ සිදු කරන වගා ක්‍රම සඳහා බෝග කළමනාකරණ පිළිවෙත් සහ බෝග රටාවන් යොදා ගැනීම.

### වැඩසටහනේ පරමාර්ථ :

- ලොකු ලූණු නිෂ්පාදනය කිරීමේ තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම.
- ලොකු ලූණු වල / මිරිස් වල අස්වනු පරතරය අඩු කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමෝපායන් බිහි කිරීම.
- රනිල වල අස්වනු පරතරය අඩු කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමෝපායන්.

- මිරිස්, ලොකු ලූණු සහ කුරක්කන් සඳහා නව තවාන් කළමනාකරණ ශිල්ප ක්‍රම බිහි කිරීම.

- අහිතකර අජෛව තත්ත්වයන් සඳහා (නියඟය සහ උෂ්ණත්වය) හෞතවේදී අධ්‍යයන සිදු කිරීම / ආර හඳුනා ගැනීම.

- විවිධ රනිල ආර වල නයිට්‍රජන් තිර කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරීම.

- ජලය අරපිරිමැස්ම සහ දේශගුණික විපර්යාස කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සහල් පාදක බෝග වගා ක්‍රම සඳහා බෝග ආදර්ශ තහවුරු කිරීම.

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම යටතේ වෙනත් ක්ෂේත්‍ර බෝග ආර පරික්ෂා කර බැලීම.

- ජල සම්පාදිත තත්ත්ව යටතේ වී ආර පරික්ෂා කර බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම / ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම.

- ශුක්කාවේ වන්ද්‍යාතාව කෙරෙහි වියනේ උෂ්ණත්වය මගින් ඇතිවන බලපෑම පිළිබඳව අධයයනය කිරීම.

වැඩසටහන

- මිරිස් වල වර්ධනය සහ අස්වැන්න ඉහළ නැංවීම සඳහා සමෝධානික පාංශු කළමනාකරණ ප්‍රවේශයක් පරික්ෂා කර බැලීම.

- අවාරයේදී මව් බල්බ නිෂ්පාදනය කිරීම සහ අනතුරුව බීජ නිෂ්පාදනය කිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය.

- මිරිස් සඳහා අවශ්‍යතාවය අනුව නයිට්‍රජන් කළමනාකරණය කිරීම.

- ඉහළ උෂ්ණත්වයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් වෙනත් ක්ෂේත්‍ර බෝග පරික්ෂා කර බැලීම.

- හිතකර සහ අහිතකර පරිසර තත්ත්ව යටතේ රනිල වල ගැටිති සෑදීමේ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීම.

- ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයේ යල කන්නයේදී ජල සම්පාදන ක්‍රමවල අහිතකර තත්ත්වයන්ට ලක් වූ මුං ජාන දර්ශ වල (*Vigna radiata* (L.) Wilczek)ක්‍රියාකාරීත්වය.

- ලූණු බීජ නිෂ්පාදනයේදී වර්ධනය සහ අස්වැන්න කෙරෙහි පොටෑසියම් නයිට්‍රේට් යෙදීමෙන් ඇති වන බලපෑම.

- පොටෑසියම් නයිට්‍රේට් යෙදූ ලූණු වගාවේ අස්වැන්න කෙරෙහි බල්බ විශාලත්වය සහ පරතර තැබීම මගින් ඇතිවන බලපෑම.

- ජල සම්පාදිත සහ ජල සම්පාදනය නොකළ තත්ත්වය යටතේ මුං (*Vigna radiata*) සහ මිරස් වල (*Capsicum annum)* වර්ධනය සහ අස්වැන්න කෙරෙහි මීතනෝල් පත්‍ර මතට යෙදීමෙන් ඇති වන බලපෑම.

- පත්‍ර ප්‍රභාසංස්ලේෂණය පාදකව අහිතකර පාරිසරික තත්ත්වයන් සඳහා බඩ ඉරිඟු ආර පරික්ෂා කර බැලීම.

- "APSIM Oryza" ආදර්ශය තහවුරු කිරීම සම්බන්ධයෙන් විවිධ ශෂ්‍ය මාරු කිරීම් ඇගයීම.

- දේශගුණික විපර්යාසය මත බඩ ඉරිඟු, මිරිස් සහ මුං වල ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීම.

- බඩ ඉරිඟු වල එකවිට මල් හට ගැනීමේ රටාව පිළිබඳව අධ්‍යයනය කිරිම.

- සහල් වල ධාන්‍ය වන්ද්‍යතාව කෙරෙහි වියනේ උෂ්ණත්වය මගින් ඇති වන බලපෑම අධ්‍යයනය කිරීම.
- මල් හට ගන්නා අවධියේදී ඇති වන ඉහළ උෂ්ණත්වය මගින් සිදු වන පීඩාකාරී තත්ත්වය සම්බන්ධයෙන් වී ප්‍රභේද පරීක්ෂා කර බැලීම.
- වියළි කලාපයේ ස්වායු පාංශු තත්ත්වය සඳහා යෝග්‍ය වී ප්‍රභේද පරීක්ෂා කර බැලීම.
- බලාපොරොත්තු තැබිය හැකි වී ප්‍රභේද වල බීජ නිෂ්පාදනය කිරීම.
- විවිධ කළමනාකරණ මට්ටම් යටතේ ස්වාභාවිකව පරාගනය වන විදේශීය බඩ ඉරිඟු ප්‍රභේද වල ක්‍රියාකාරීත්වය
- මිරිස්, කුරක්කන් සහ ලූණු සඳහා විකල්ප තවාන් කළමනාකරණ ශිල්ප ක්‍රමයක් හඳුනා ගැනීම.
- විවිධ වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම.
- විවිධ කළමනාකරණ තත්ත්ව යටතේ සහල්වල මීතේන් පිටවීම.
- විවිධ වල් පැළෑටි කළමනාකරණ තත්ත්ව යටතේ පිටාර ජලසම්පාදනය සිදු නොකර ස්වායු පසෙහි වගා කෙරෙන වී ආර පරීක්ෂා කර බැලීම.

## වල් පැළෑටි කළමනාකරණය

### අනාගත සැලැස්ම

- වෙනත් ක්ෂේත්‍ර බෝග වගා වල වල් පැළෑටි හේතුවෙන් සිදුවන බෝග හානිය අවම කිරීම සඳහා ආර්ථික වශයෙන් දැරිය හැකි, පරිසර හිතකාමී සහ කාර්යක්ෂම වල් පැළෑටි කළමනාකරණ ක්‍රමෝපායන් බිහි කිරීම.

### වැඩසටහනේ පරමාර්ථ

- විවිධ වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද වලට අදාළව වල් පැළෑටි වල තරඟකාරීත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම.
- වෙනත් ක්ෂේත්‍ර බෝග වගාවන්හි ප්‍රධාන වල් පැළෑටි පාලනය කිරීම සඳහා වල් නාශක පරීක්ෂා කර බැලීම.

### වැඩසටහන

- බඩ ඉරිඟු වගාවේ වල් පැළෑටි පාලනය කිරීමෙහි නිකොසල්ෆ්‍යුරොන්හි කාර්යක්ෂමතාවය.
- ලූණු වගාවේ වල් පැළෑටි පාලනය කිරීමෙහි ඔක්සිෆ්ලුඅෆෙන් ලීටරයකට ග්‍රෑම් 480හි කාර්යක්ෂමතාවය.
- ලූණු වගාවේ පශ්චාත් නිර්ගමන වල් පැළෑටි පාලනය කිරීම සඳහා පැළෑටි නාශක ඇගයීම.

## පාංශු සාරවත් භාවය, පොහොර සහ පරිසරය

### අනාගත සැලැස්ම

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව වලදී ස්ථායි නිෂ්පාදන තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පෝෂක කළමනාකරණ ක්‍රමෝපායන් බිහි කිරීම.

### වැඩසටහනේ පරමාර්ථයන්

- පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
  - බඩ ඉරිඟු, කුරක්කන් සහ මිරිස් සඳහා අවශ්‍යතාව අනුව නයිට්‍රජන් කළමනාකරණ ක්‍රම බිහි කිරීම.
  - බඩ ඉරිඟු වගාවේ ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රියාවලිය

සඳහා යෝග්‍ය ස්ථානීය කොළ පොහොර බෝග

- වී වගා කරන කුඹුරු වලින් මීතේන් විමෝචනය වීම පිළිබඳව අධ්‍යයනය කිරීම.

වැඩසටහන

- මිරිස් වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඛිදිති යූරියා මගින් ඇතිවන බලපෑම සංසන්දනාත්මකව සොයා බැලීම.
- පත්‍ර වර්ණ සටහන මගින් බඩ ඉරිඟු වගාව සඳහා අවශ්‍ය නයිට්‍රජන් ප්‍රමාණය නිර්ණය කිරීම.
- මිරිස් වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි තඹ, සින්ක් සහ මැංගනීස් පත්‍ර මතට යෙදීමෙන් ඇති වන බලපෑම.
- සහල් සම්බන්ධ ජෛව නිෂ්පාදන පරික්ෂාවට ලක් කිරීම.
- බඩ ඉරිඟු වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ක්ෂුද්‍ර පෝෂකයක් ලෙස සින්ක් වලින් ඇති වන බලපෑම.
- ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) සහ එප්පාවල සිංගල් සුපර් පොස්පේට් (ESSP) යෙදූ විට බඩ ඉරිඟු වගාවේ ප්‍රතිචාර පිළිබඳ අධ්‍යයනය කිරීම.

## ජල කළමනාකරණය

### අනාගත සැලැස්ම

- ප්‍රශස්ත ඵලදාවක් ලබා ගැනීම සඳහා පවත්නා ඉඩම් සහ ජලය කාර්යක්ෂමව යොදා ගැනීම පිණිස යෝග්‍ය ජල කළමනාකරණ ක්‍රමෝපායන් බිහි කිරීම.

### වැඩසටහනේ පරමාර්ථය

- වර්ෂාපෝෂිත කෘෂිකර්මය පිළිබඳ ජල කළමනාකරණ අධ්‍යයනයන්
  - වැසි දිය සංරක්ෂණය සහ / ජල සංරක්ෂණය
- ජල සම්පාදිත කෘෂිකර්මය
  - භූගත ජලය සංරක්ෂණය කිරීම
  - මතුපිට සහ ක්ෂුද්‍ර ජල සම්පාදනය සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ පිළිවෙත් බිහි කිරීම.
- ගැටළු සහිත පස කළමනාකරණය කිරීම (ලවණතාව, තද පස)

### වැඩසටහන

- රතුවන් දුඹුරු පසෙහි වගා කරන දෙමුහුම් බඩ ඉරිඟු වලට (සම්පත්) සම්පාදනය කෙරෙන ජල ප්‍රමාණයේ අවශ්‍යතාව.
- බිංදු ජල සම්පාදනය යටතේ මිරස් වගාව සඳහා පොහොර මිශ්‍රිත ජල සම්පාදනය නිර්දේශ කිරීම සඳහා අධ්‍යයනයක්.
- ලූණු වගාව සඳහා විසිරුම් ජල සම්පාදනය යොදා ගැනීමේ අධ්‍යයනයක්.
- වියළි කලාපයේ වර්ෂා පෝෂිත ගොඩ බිම සඳහා බහු ක්‍රියාකාරීත්වයෙන් යුත් පාංශු සංරක්ෂණ වේලි සකස් කිරීම.

## ආහාර තාක්ෂණය

### අනාගත සැලැස්ම

- වෙනත් ක්ෂේත්‍ර බෝග වල ගුණාත්මක ඇගයීම සහ පශ්චාත් අස්වනු සහ අගය එක් කළ තාක්ෂණ ක්‍රමයන් බිහි කිරීම.

වැඩසටහනේ පරමාර්ථය

- අභිජනක ආරවල රසායනික, භෞතික සහ සංවේදන ගුණයන් සහ ආහාර සැකසුම් කිරීමේ ගුණාත්මක තත්ත්වය පිළිබඳව විශ්ලේෂණය කිරීම.
- යෝග්‍ය පශ්චාත් අස්වනු හැසිරවීමේ පිළිවෙත් බිහි කිරීම.
- වෙනත් ක්ෂේත්‍ර බෝග මගින් නව අගය එක් කළ ආහාර නිෂ්පාදන බිහි කිරීම.
- අඩු පිරිවැයැති ගබඩාකරණ ක්‍රම හඳුන්වාදීම.

වැඩසටහන

- වෙනත් ක්ෂේත්‍ර බෝග / පලතුරු/ එළවළු ප්‍රභේද යන්හි / අභිජනක ආර වල ගුණාත්මය ඇගයීම.
- ධාන්‍ය සහ රනිල මිශ්‍රිත පිටි භාවිතයෙන් අගය එක් කිරීම.
- රළු ධාන්‍ය සහ රනිල වල පශ්චාත් අස්වනු කටයුතු වලදී පශ්චාත් අස්වනු හානි පිළිබඳ නිර්ණය කිරීම.
- රළු ධාන්‍ය සහ රනිල භාවිතයෙන් නිපද වූ බදින ලද කෙටි කෑමවල ගුණාත්මය ඇගයීම.
- මිරිස් ප්‍රභේදයන්හි අමු මිරිස් වල ගුණාත්මය ඇගයීම.
- නිර්දේශිත වෙනත් ක්ෂේත්‍ර බෝග වල ආසන්න සංයුතිය ඇගයීම.

## ජෛව තාක්ෂණය

- අණුක සලකුණු කිරීම් මගින් ගුණාත්මක ප්‍රෝටීන් එක් කළ බඩඉරිඟු ආරක්/ප්‍රභේදයක් බිහි කිරීම.
- අණුක සලකුණු කිරීම මගින් මුං ගුල්ලාට ප්‍රතිරෝධී මුං ආරක්/ ප්‍රභේදයක් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම.
- මිරිස් කොළ කොඩ වීමේ වෛරසයට ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන ප්‍රභව හඳුනා ගැනීම.
- මිරිස් කොළ කොඩ වීමේ රෝගයට ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන මිරිස් ප්‍රභේද ජාන විකරණය කරන ලද තාක්ෂණය මඟින් නිපදවීම.
- මිරිස් වල දුරස්ථ ඥතීත්වයක් ඇති විශේෂ අතර දෙමුහුම් කිරීම සඳහා කලල වෙන් කර ගැනීමේ තාක්ෂණයක් බිහි කිරීම.
- මිදි ආර/ ප්‍රභේදයන්හි බීජ රෝපණය/ රිකිලි අග්‍රස්ථ රෝපණය සිදු කිරීම.
- රසායනික විකෘතිකරණය තුළින් නව ලූණු ආර/ ප්‍රභේද බිහි කිරීම.

## අභිජනක බීජ නිෂ්පාදනය

- නිර්දේශිත මිරිස් (MI - ග්‍රීන් සහ MI 2), බඩඉරිඟු (භද්‍රා, රුවන්, සම්පත් ප්‍රභේදවල මාපිය ආර සහ සම්පත් ප්‍රභේදය), කුරක්කන් (ඕෂධ සහ රාවණා), මුං (MI 5, MI 6 සහ ආරි), උඳු (MI 1 සහ අනුරාධ), කව්පි (ධවල, MI 35, වරුණි සහ බොම්බේ), සෝයා බෝංචි (PB 1), එළවළු කව්පි (BS 1), තක්කාලි (KC 1), බණ්ඩක්කා (හරිත) සහ කරවිල (MC 43) යන ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය කිරීම.
- නිර්දේශිත ලූණු ප්‍රභේදයේ (දඹුල්ල වරණය) අභිජනක මව් බල්බ සහ බීජ නිෂ්පාදනය.
- තාක්ෂණය පතුරුවාලීම
- පර්යේෂණ ලිපි මගින් පර්යේෂණ සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම.
- පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් රැස්වීම් සහ අනෙකුත් කන්නමය

සමාලෝචන රැස්වීම් මගින් තොරතුරු හුවමාරු කර ගැනීම.

- පුහුණු වැඩසටහන්, දේශන, වැඩමුළු, ක්ෂේත්‍ර දින, ප්‍රදර්ශන, තාක්ෂණික උපදෙස් සහ පුවත් පත් ලිපි සහ රූපවාහිනි සහ ගුවන්විදුලි වැඩසටහන් මගින් තාක්ෂණය පතුරුවාලීම.

## තාක්ෂණය පතුරුවාලීම

- පර්යේෂණ ලිපි මගින් පර්යේෂණ සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම.
- පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් රැස්වීම් සහ අනෙකුත් කන්නමය සමාලෝචන රැස්වීම් මගින් තොරතුරු හුවමාරු කර ගැනීම.
- පුහුණු වැඩසටහන්, දේශන වැඩමුළු, ක්ෂේත්‍ර ආදර්ශන, පැළ සායන, ක්ෂේත්‍ර දින, ප්‍රදර්ශන, තාක්ෂණික උපදෙස් සහ ජනමාධ්‍ය හරහා එනම් පුවත්පත් ලිපි සහ රූපවාහිනි සහ ගුවන්විදුලි වැඩසටහන් මගින් තාක්ෂණය පතුරුවාලීම.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| පර්යේෂණ නිළධාරි | 29 |
| කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ | 01 |
| වැඩසටහන් සහකාර | 04 |
| පර්යේෂණ සහකාර | 26 |
| කෘෂිකර්ම උපදේශක | 04 |
| පර්යේෂණ උප සහකාර | 09 |
| රා.කළ. සහකාර සේවය | 15 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| රියදුරු | 05 |
| බඩ්ධකරු | 01 |
| ගබඩාකරු | 02 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 04 |
| මුරකරු | 08 |
| කම්කරු ( ස්ථිර) | 129 |
| කම්කරු(කොන්ත්‍රාත්) | 138 |
| **එකතුව** | **378** |

# 1.1.1 මාෂ හා රනිල සහ තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - අගුණකොළපැලැස්ස

දකුණු වියලි කලාපයේ පිහිටි ප්‍රධාන කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය මාෂ, රනිල බෝග සහ තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වේ. රනිල කුලයේ ධාන්‍ය සහ තෙල් බෝග, කලාපයට වැදගත් එළවළු සහ පළතුරු බෝග පිළිබඳව පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරවිල පිහිටි සැටලයිට් මධ්‍යස්ථානය හා එක්ව කෘෂිකාර්මික ඵලදායීතාවය වැඩි කිරීම උදෙසා තාක්ෂණය ලබා දීම වැනි කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කෙරේ. මෙහි සියලුම පර්යේෂණ වැඩසටහන් බෝග ප්‍රවර්ධනය කෘෂි විද්‍යාව සහ පාංශු සහ ජල කළමනාකරණය අවශ්‍ය ඉතා වැදගත් ප්‍රදේශවල කලාපීය පර්යේෂණ අවශ්‍යතා සහ ජාතික අවශ්‍යතා යන දෙකම පදනම් කොට සැලසුම් කෙරේ. මෙයට අමතරව මධ්‍යස්ථානය මඟින් දැනට නිකුත් කර ඇති ප්‍රභේද වල අභිජනන බීජ සහ මූලික රෝපණ ද්‍රව්‍යය, එක් එක් ස්ථානයන් හට විශේෂිත පොහොර යෙදීම් සම්බන්ධ නිර්දේශ, පිළිබඳව ගොවීන්ට හා වෙනත් උනන්දුවක් දක්වන පුද්ගලයන්ට තාක්ෂණික තොරතුරු ලබා දේ.

## අයවැය

**වගුව 1.1.1.1 : වාර්ෂික අයවැය - 2012 (රුපියල්)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 6,866,527 | 6,621,588 | 96 |
| පුනරාවර්තන ව්‍යාපෘති | 16,817,600 | 13,175,871 | 78 |
| **ජාතික කෘෂිකාර්මක පර්යේෂණ ව්‍යාපෘති** | | | |
| මධ්‍යකාලීන වැඩි අස්වැන්නක් ලබා දෙන විශාල බීජ සහිත රටකජු බීජ ප්‍රභේද වැඩිදියුණු කිරීම | 363,000 | 335,616 | 93 |
| තෝරාගත් අඹ ආරවල අනුවර්තීය පරීක්ෂණ | 647,000 | 632,148 | 98 |
| වැඩි අස්වනු කඳ හා මුල් නරක් වීමේ රෝගයට ප්‍රතිරෝධී සුදු පැහැති බීජ සහිත තල ප්‍රභේද වැඩි දියුණු කිරීම | 435,000 | 410,570 | 94 |
| වියලි කාලගුණ තත්ත්වයන්ට ප්‍රතිරෝධී කව්පි බීජ ප්‍රවර්ධනය | 604,600 | 554,930 | 92 |
| කුඹුරුවල - වගාව සඳහා උචිත වැඩි අස්වනු ලබා දෙන කෙටි කාලීන මුං බිජ වැඩි දියුණු කිරීම | 367,700 | 353,650 | 98 |
| කව්පි සහ මුං වගාවේ වෛරස් රෝග හඳුනා ගැනීම සහ පාලන පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම | 950,000 | 902,156 | 95 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| කව්පි වගාවේ වෛරස් රෝග හඳුනා ගැනීම සහ පාලන පිළිවෙත් මාලාවක් වැඩි දියුණු කිරීම | 431,200 | 423,647 | 98 |
| මුං වල විචිත්‍ර වෛරස් රෝගය මතුවීම පාලනය සඳහා ඵලදායී කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීම | 493,250 | 491,553 | 100 |
| දකුණු සහ ඌව පළාත් වල කජු වගා ප්‍රදේශයේ පසෙහි සල්ෆර් ප්‍රමාණය අධ්‍යනය | 600,000 | 410,570 | 94 |
| රෝපණ ක්‍රම මඟින් අස්වැන්න සඳහා ඇතිවන බලපෑම ඇගයීම - කුරක්කන් | 150,000 | 148,300 | 100 |
| රටකජු වගාව සඳහා බෝගය වල්පැල අතර දැඩි තරඟකාරී බවක් ඇතිවන කාලය තීරණය කිරීම උදෙසා සහ රටකජු අස්වැන්නට වල් පැල බලපෑම අධ්‍යනය | 220,400 | 218,128 | 99 |
| බීජ රහිත මිදි ප්‍රභේද වැඩිදියුණු කිරීම උදෙසා මිදි වල ජනක ප්ලාස්ම එකතු කිරීම සංරක්ෂණය සහ ඇගයීම | 1,031,500 | 1,019,417 | 99 |
| වට්ටක්කා වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 350,000 | 348,200 | 100 |
| වට්ටක්කා බීජ සංවර්ධන වැඩසටහන | 240,000 | 236,300 | 98 |
| එළවළු කව්පි වැඩිදියුණු කිරීම | 75,000 | 74,344 | 100 |
| රත්න පැපොල් ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය | 300,000 | 286,345 | 97 |
| ශ්‍රී ලංකාවේ කෙසෙල් වැවෙන ප්‍රදේශවලින් කෙසෙල් ජනක ප්ලාස්ම එකතු කිරීම, ස්ථාපිත කිරීම සහ ඇගයීම | 130,000 | 125,755 | 98 |
| කෙසෙල් සඳහා *Fusarium* මැලවීමේ රෝගයට ප්‍රතිරෝධී කෙසෙල් විකෘති බිහි කිරීම | 2,165,000 | 2,089,345 | 97 |
| **ගොවිපල් සංවර්ධනය** | | | |
| ශීත කාමර සහ වියලීමේ භූමි සංවර්ධනය (හෙක් :15), භූමි සමතලා කිරීම (හෙක් :8), බීජ නිෂ්පාදනය, වැට සැකසීම සහ ක්ෂුද්‍ර වාරි මාර්ග පද්ධති. (හෙ : 5 ) | 9,700,000 | 6,307,262 | 65 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| වීරවිල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ ගොවිපල සංවර්ධනය | 1,000,000 | 993,200 | 100 |
| ග්‍රාමීය රටකජු බීජ නිෂ්පාදන වැඩසටහන | 5,000,000 | 4,173,494 | 83 |
| "සම්පත්" ඉරිඟු ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය | 260,000 | 243,560 | 94 |
| **එකතුව** | **49,197,777** | **44,653.903** | **91** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### කෘෂි විද්‍යාව

- කව්පි නව ප්‍රභේදයන් සඳහා නිර්දේශිත රෝපණ ඝනත්වය (යම් භූමි ඒකකයක් තුළ වගා කළ යුතු පැල සංඛ්‍යාව) තහවුරු කර ගැනීම උදෙසා වූ අත්හදා බැලීම සාර්ථකව අවසන් කරනු ලැබීය.
- වර්ෂා පෝෂිත කව්පි වල චිරස්ථායි බව උදෙසා ස්ථානීය වැසි ජල සංරක්ෂණයෙහි බලපෑම සොයා බැලීම සඳහා අත්හදා බැලීමක් සිදු කෙරිණි.
- දකුණු වියලි කලාපීය වර්ෂා පෝෂිත කෘෂිකර්මාන්ත පද්ධතියෙහි ස්වභාවය හඳුනා ගැනීම සඳහා සමීක්ෂණය සාර්ථකව අවසන් කරනු ලැබීය ($DL_{1B}$, $DL_{5}$ )
- ශාක වර්ධනය සහ අස්වැන්න සඳහා ප්‍රකාශවර්තතාව සහ උෂ්ණත්වය යන දෙකෙහිම බලපෑම සොයා බැලීම සඳහා අත්හදා බැලීමක් සිදු කරනු ලැබීය.

### ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

#### කව්පි

MICPI, වරුණි, ධවල, M135, සහ බොම්බේ යන සම්මත ප්‍රභේදයන් සමග නව ප්‍රභේද 11ක් අත්හදා බැලීම් 2ක් අගයනු ලැබීය.

#### කොල්ලු

නව ප්‍රභේද 5ක් ඇගයිණි.

#### මුං

M15 සහ M16 යන සම්මත ප්‍රභේදයන් සමග නව ප්‍රභේද 5ක් ඇගයිණි.

#### සෝයා බෝංචි

සම්මත පරීක්ෂණ PB35 යන ප්‍රභේදය සමග නව ප්‍රභේද 5ක් අගයනු ලැබීය.

### ශාක අභිජනනය (බෝග ප්‍රවර්ධනය)

### තෙල් බෝග

#### රටකජු

- මාස 3න් අස්වනු නෙලිය හැකි රතු පැහැති පොත්තක් සහිත අංකුර මියයාමට, මැලවීම සහ මලකඩ රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේදයක් ANKGI නමින් සාමාන්‍ය වගාව සඳහා නිදහස් කරනු ලැබිණි.
- ගොවි ක්ෂේත්‍රවල ස්ථාන 6ක අංකුර මිය යාම රෝගයට ප්‍රතිරෝධී තෝරා ගත් ආර 2ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වනු ලැබීය
- ස්ථාන 5ක මධ්‍යකාලීන රටකජු ප්‍රභේදයන්හි තෝරාගත් ආර 5ක

ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වනු ලැබිණි.

- මූලික අස්වනු අත්හදා බැලීම්හිදී විශාල රටකජු බීජ ආර 7ක් සහ මධ්‍යකාලීන රටකජු බීජ 10ක් අගයනු ලැබීය.

**රටකජු හි පහත අභිජනන බීජ නිෂ්පාදනය කරනු ලැබීය.**

| ප්‍රභේදය | ප්‍රමාණය ( Kg ) |
|---|---|
| ටිකිරි | 115.7 |
| ඉන්දි | 186.3 |
| තිස්ස | 272.6 |

තල

- මූලික අස්වනු අත්හදා බැලීම්හිදී තෝරා ගත් කළු පැහැති බීජ ආර 6ක් අගයනු ලැබිණි.
- මූලික අස්වනු අත්හදාබැලීම්හිදී තෝරා ගත් සුදු පැහැති බීජ ආර 6ක් අගයනු ලැබීය.
- තල අභිජනන බීජ පහත ප්‍රමාණයන්ගෙන් නිෂ්පාදනය කෙරිණි.

| ප්‍රභේදය | ප්‍රමාණය ( Kg ) |
|---|---|
| මාලි | 5 |
| උමා | 3 |

අබ

- ස්ථාන 6කදී තෝරා ගත් අබ ආර 6ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වනු ලැබිණි.

**රනිල කුලයේ ධාන්‍ය**

මුං

- $F_1$ පරම්පරා 16න් $F_2$ පරම්පරාව දක්වා ඉදිරියට ගෙන යනු ලැබීය.
- මූලික ක්ෂේත්‍ර අත්හදා බැලීම්හිදී එකවර වර්ධන අවස්ථාවට පත්වන්නා වූ ආර 5ක් අගයනු ලැබිණි.
- ප්‍රධාන ක්ෂේත්‍ර අත්හදා බැලීම්හිදී තෝරා ගත් මුං බීජ ආර 5ක් අගයනු ලැබිණි.
- නිකුත් කළ ප්‍රභේදයන් සහ බලාපොරොත්තු තැබිය හැකි ආරවල බීජ ගුණනය අඛණ්ඩව සිදු කෙරිණි.

**කව්පි**

- පර්යේෂණ ක්ෂේත්‍රයේදී අස්වනු සහ වෙනත් කෘෂි විද්‍යාත්මක ලක්ෂණ උදෙසා කව්පිවල ජනක ප්ලාස්ම ඇගයීම යටතේ ආර 35ක් අතුරෙන් බලාපොරොත්තු තැබිය හැකි ආර 3ක් හඳුනාගනු ලැබිණි.
- ප්‍රධාන ක්ෂේත්‍ර අත්හදාබැලීම්හිදී මධ්‍ය කාලීන කව්පි ආර 10ක් අගයනු ලැබිණි.
- මූලික අස්වනු අත්හදාබැලීම්හිදී වඩාත් හොඳ භෞතික ගුණාංග පෙන්වන්නාවූ මධ්‍යකාලීන කව්පි ආර 15ක් අගයනු ලැබිණි.
- වඩාත් හොඳ ශාක ව්‍යුහයක් සහිත වැඩි අස්වනු කෙටි/මධ්‍ය කාලීන (දින 60 – 75 ) කව්පි ආර වැඩිදියුණු කිරීම උදෙසා F3 පරම්පරාවේ මුහුම් 9ක් අගයනු ලැබිණි.

**කොල්ලු**

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ දී කොල්ලු ආර 5ක් අගයනු ලැබිණි.

**එළවළු**

**තුඹ**

- සෑම නිර්දේශිත තුඹ ප්‍රභේද සඳහා ජායාංගී මවු තොග ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම සිදු කෙරිණි.

- තුඹ ජනක ප්ලාස්ම 82ක් නඩත්තු සහ සංරක්ෂණය සිදු කරනු ලැබුණි.
- නිර්දේශිත තුඹ ප්‍රභේද වලින් පැල 1500ක් පැල කෙරිණි.

**බණ්ඩක්කා**

- බණ්ඩක්කා දෙමුහුම් වැඩිදියුණු කිරීම උදෙසා F1 පරම්පරා 72ක් අගයනු ලැබිණි.

**වට්ටක්කා**

- වට්ටක්කා දෙමුහුම් ප්‍රභේද සංවර්ධන වැඩසටහනේදී ජනක ප්ලාස්ම 20ක් ලක්ෂණීකරණය කෙරිණි.

**එළවළු කව්පි**

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම්හිදී සම්මත ප්‍රභේද 2ක් සමග (පොළොං මෑ සහ හවරි මෑ) ආර 5ක් අගයනු ලැබිණි.

**බටු**

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම්හිදී සම්මත ප්‍රභේද 2ක් සමග (BW11 සහ අමන්දා ) ආර 3ක් අගයනු ලැබිණි.

## පළතුරු බෝග ප්‍රවර්ධනය

**දිවුල් සහ බෙලි**

- දිවුල් සහ බෙලි ජනක ප්ලාසම එකතු කිරීම සථාපිත කිරීම සහ ඇගයීම ආරම්භ කෙරිණි. දිවුල් එකතුන් 6ක් එකතු කෙරුණු අතර දිවුල් ග්‍රාහක මුල් 2000ක් සකස් කෙරිණි. බෙලි ග්‍රාහක මුල් 500ක් වර්ෂය තුළදී නිෂ්පාදනය කෙරිණි.
- දිවුල් සහ බෙලි ක්ෂේත්‍ර ජාන බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා හෙක්ටයාර 5ක භූමි ප්‍රමාණයක් එළිකෙරිණි.

**කෙසෙල්**

- විවධ කෙසෙල් ප්‍රභේද වලින් එකතුන් 23ක් එකතු කරනු ලැබ ගුණනය අඛණ්ඩව සිදු කෙරිණි.
- ලංකාව පුරාම පටක රෝපිත ශාක ප්‍රචාරණ ඉටු කිරීමේදී ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මවු ශාක නිෂ්පාදනය සඳහා "අග්‍රා" කෝලිකුට්ටු 250ක් සහ "නදී" ඇඹුල් පැල 54ක් සහිතව වෙන් වූ කෙසෙල් මවු ශාක පලතුරු උයන් ස්ථාපිත කෙරිණි. (ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය )

**පැපොල්**

- "රත්න" ප්‍රභේද යෙන් පැපොල් පැල 180ක් සකස් කළ අතර අභිජනන බීජ නිෂ්පාදනය සඳහා නඩත්තු කරනු ලැබිණි.
- පැපොල් මුදු පුල්ලි වෛරස් රෝගයට ප්‍රතිරෝධී වැඩි අස්වනු සහිත ප්‍රභේද වැඩිදියුණු කිරීම උදෙසා අත්හදාබැලීම් පවත්වනු ලැබිණි. ක්ෂේත්‍ර ඇගයීම සඳහා 3වන පරම්පරාවක් ස්ථාපිත කිරීම උදෙසා දෙවන පරම්පරාවෙන් බීජ එකතු කෙරිණි.

**අඹ**

- කච්චිගලාර, කට්ටකඩුව මහකන්ද සහ මහගමවල මහවැලි ගොවිපලහිදී පැල 300ක වැඩි වශයෙන් හා සුළු වශයෙන් කප්පාදු කෙරිණි. වාජීකරණය සහ ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ දත්ත එකතු කිරීම අඛණ්ඩව සිදු කෙරිණි.

**පැඟිරි**

**පැණි දොඩම්**

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම් යටතේ ආර 15ක් අගයනු ලැබිණි.

**මිදි**

- බීජ රහිත මිදි එකතුන් 3ක් එකතු කරනු ලැබූ අතර ඇගයීම උදෙසා ක්ෂේත්‍ර පරීක්ෂා සඳහා ස්ථානගත කෙරිණි.

## පටක රෝපණය සහ ජෛව තාක්ෂණය

- *Fusarium* මැලවීමේ රෝගයට ප්‍රතිරෝධී කෙසෙල් සඳහා නලස්ථ විකෘති සැකසීම උදෙසා පරීක්ෂණ සිදු කෙරිණි. කඳ අග්‍රයේ පටක වර්ධනය ආරම්භයත් කඳෙහි පටක ගුණනයත් සම්පූර්ණ කෙරිණි.
- පටක රෝපණය හරහා තුඹ කරවිල (*Momodika dioica*) හි ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා පරීක්ෂණ සිදු කෙරිණි. කඳ අග්‍ර පටක වර්ධනය ආරම්භය සහ ස්ථාපිත කිරීම සම්පූර්ණ කෙරිණි.

**පාංශු විද්‍යාව**

- දකුණු වියලි කළාපයේ වර්තමාන පාංශු ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය සොයා බැලීම සඳහා පාංශු සමීක්ෂණයක් පවත්වනු ලැබුණි. ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි පස් සාම්පල 1000ක් එකතු කරනු ලැබ සල්ෆර්, සින්ක්, යකඩ සහ වෙනත් ක්ෂුද්‍ර පෝෂකයන් සඳහා විශ්ලේෂණයක් අඛණ්ඩව සිදු කෙරේ.
- රටකජු සඳහා සල්ෆර් නිර්දේශයන් වැඩිදියුණු කිරීම උදෙසා අත්හදා බැලීම් සිදු කෙරිණි. සල්ෆ්ර් 5 -10 ppm යෙදීමේදී ප්‍රතිචාරයන් ලැබිණි.
- දෙමුහුම් බඩඉරිඟු අස්වැන්න සඳහා නයිට්‍රජන් සහ සින්ක් යන දෙකෙහි ඒකාබද්ධ බලපෑමක් ඇති බව සොයා ගැනිණි. (සම්පත් ප්‍රභේදය)

**ජල කළමනාකරණය**

- ශ්‍රී ලංකාවේ D116 සහ DL5 යන කෘෂි පාරිසරික කලාපයන්හි මුං බීජවල බෝග සංගුණකය සහ බෝග සඳහා ජල අවශතාව තීරණය කිරීම උදෙසා නිරීක්ෂණ අත්හදා බැලීම් සිදු කෙරිණි.
- අඟුණකොලපැලැස්ස ගොවිපල ක්ෂේත්‍රය සඳහා ලවණතා සිතියමක් වැඩිදියුණු කිරීම ආරම්භ කරනු ලැබූ අතර තාවකාලික සිතියමක් සකස් කෙරිණි.
- විවිධ ආකාරයේ පසෙහි තත්ත්වය වෙනස් කිරීම උපයෝගී කරගනිමින් පසෙහි ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම උදෙසා වූ අධ්‍යනයක් උදෙසා වූ අත්හදා බැලීමක් සිදුකෙරිණි. මෙම අත්හදාබැලීම අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
- ශ්‍රී ලංකාවේ වියලි කළාපයේ විවිධ පස්වර්ග සඳහා විවිධ පෘෂ්ඨීය වාරි ක්‍රම පැතිකඩක් සඳහා ප්‍රශස්ත ද්‍රෝණි ප්‍රමාණය තීරණය කිරීම උදෙසා අත්හදා බැලීම ආරම්භ කෙරිණි. (ජාතික කෘෂි පයේෂණ ව්‍යාපෘතිය)

**ආහාර විද්‍යාව**

- ඇඹුල් කෙසෙල් ස්‍රාවය නිස්සාරණය සඳහා සාර්ථක ක්‍රමවේදයක් පරීක්ෂා කෙරිණි.
- නිර්දේශිත මුං ප්‍රභේද සහ බලාපොරොත්තු තැබිය හැකි ආර සඳහා පෝෂක තත්ත්වය ඇගයීම් පරීක්ෂා කෙරිණි.

**ව්‍යාධිවේදය**

- *Sclerotium rolfsii* පාලනය උදෙසා *Trichoderma harsiana* යොදා ගනිමින් පාලනය සඳහා හොඳම ක්‍රමයක් හඳුනා ගැනීම පිණිස අත්හදා

බැලීම් සිදු කෙරිණි. (ජාතික කෘෂි පර්යේෂණ ව්‍යාපෘතිය)

- රට කජුවල *Sclerotium rolfsii* පාලනය සඳහා ශාක කොටස් වල හැකියාව අධ්‍යනය කිරීමට අත්හදා බැලීම් පවත්වනු ලැබිණි. වගා කිරීමට පෙර *Mikania cordata* පත්‍ර පසට එකතු කිරීමේ ප්‍රතිකර්මය සිදුකිරීමෙන් අඩුම රෝගී තත්ත්වයන් මතු වූ බව වාර්තා විණි.

**කීට විද්‍යාව**

- මුංවල කහ විචිත්‍ර වෛරසය පාලනය කිරීම උදෙසා අත්හදා බැලීම් සිදු කෙරිණි. බීජවල තයොමෙතොක්සම් (Thiomethaxam) ප්‍රතිකර්මය සමග තයොමෙතොක්සම් ඉසීම සහ දින 10ක කාලපරාසයකින් පසුව බුප්‍රේෆෙසින් (Buprefezin) යෙදීමත් සහ කහ පැහැති ඇලෙන සුළු උගුල් ස්ථාපිත කිරීමත් සහ අන්තර් බෝගයක් ලෙස කුරක්කන් වගා කිරීම යන පිළිවෙත් මාලාව වඩාත් ඵලදායී විය.
- අබ වලට හානි කරන ප්‍රධාන පළිබෝධකයින් හඳුනාගැනීමට සහ හානි කරන්නාවූ මට්ටම හඳුනා ගැනීමට අත්හදා බැලීම් ආරම්භ කෙරිණි.
- පරීක්ෂා කිරීම් මඟින් කඳ සහ මුල් කුණු වීමේ රෝගයට ප්‍රතිරෝධී තල ආර 6ක් හඳුනා ගැනිණි.

**වල් පැළෑටි විද්‍යාව**

- රට කජු ආර සඳහා බෝග වල් පැළෑටි තරඟකාරී කාලය පැල සිටුවා කාලය සති 3-8 අතර බව හඳුනා ගැනිණි.

## තාක්ෂණ හුවමාරුව සහ පුහුණුව

- 2012 ජනවාරි 28 වන දින වඩාත් පුළුල් ලෙස ක්ෂේත්‍ර දිනයක් පවත්වනු ලැබිණි.
- (අ ) අමුමිරිස් වගාවේ දී කෘමිනාශක පළිබෝධ සහ රෝග පාලනය ආරක්ෂක ආකාරයෙන් හැසිර වීම

  (ආ) තෙල් බෝගවල වැදගත් කම සහ අනාගත මාර්ගෝපදේශකත්වය

  (ඉ) රටේ තල සහ රටකජු වගාව පිළිබඳව ගුවන්විදුලි වැඩසටහන් පවත්වනු ලැබුණි
- (අ) තාක්ෂණික කාර්යමණ්ඩලය සඳහා සංඛ්‍යානයික විශ්ලේෂණය

  (ආ) කෘෂිකර්ම ගුරුවරුන් සඳහා තෙල් බෝග සහ රනිල කුලයේ ධාන්‍ය වගාව සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග

  (ඉ) දකුණු පළාතේ තාක්ෂණික නිලධාරීන් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග

  (ඊ) හම්බන්තොට, යාපනය, මුලතිව් සහ වවුනියා වල ගොවීන් සඳහා තල හා රටකජු වගාව පිළිබඳ පුහුණු ලබා දුණි.

## ලබා දුන්නාවූ සේවාවන්

- පාංශු පරීක්ෂණ පදනම් පොහොර නිර්දේශයන් - සාම්පල 350ක් විශ්ලේෂණය කෙරිණි.

  (අ) ගොවි උපදේශක සේවාවන්

  (ආ) බෝග සායන

  (ඉ) බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය යන සේවාවන් ලබා දුණි.

## බීජ නිෂ්පාදනය

වගු 1.1.1.2 : 2012 වර්ෂය තුළදී බීජ නිෂ්පාදනය

| බෝගය | නිෂ්පාදන බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | පරිභෝජනය |
|---|---|---|
| රට කජු | 4431 | - |
| තල | 1849 | 787 |
| කව්පි | 771.5 | - |
| උඳු | 215 | - |
| මුං | 95 | - |
| වී | 34,553 | 16,594 |
| කුරක්කන් | - | 51 |

# 2013 වර්ෂයේ සැලසුම

### ශාක අභිජනනය -තෙල් බෝග

රටකජු

- මුහුම්කරණය සහ රටකජු ප්‍රභේදවරණය
- (අ) රට කජු විශාල බීජ ප්‍රභේද

  (ආ) මධ්‍යම කාලීන රටකජු ප්‍රභේද පිළිබඳ ප්‍රාථමික අස්වනු අත්හදා බැලීම
- (අ) රට කජුවල අංකුර මියගම - රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේදය

  (ආ) මධ්‍ය කාලීන රට කජු ප්‍රභේද

  (ඉ) රෙඩ් ටෙස්ටා රට කජු ප්‍රභේදය වල අනුවර්තන පරීක්ෂණ
- රටකජු අභිජනන බීජ නිෂ්පාදනය (වලව, ඉන්දි, ටිකිරි සහ තිස්ස ප්‍රභේද)
- බලාපොරොත්තු තැබිය හැකි රටකජු එකතුන් 04ක බීජ ගුණනය කිරීම

තල

- ජනක ප්ලාසම ඇගයීම
- මුහුම්කරණය කළ තල ප්‍රභේද වරණය
- කළු පැහැති තල බීජ වල මූලික අස්වනු අත්හදා බැලීම
- තල ප්‍රභේද වල (මාලී සහ උමා) අභිජනන බීජ නිෂ්පාදනය

අබ

- තෝරා ගත් අබ ආර වල බීජ ගුණනය

### ශාක අභිජනනය

මුං

- මුං ප්‍රභේද මුහුම්කරණය සහ වරණය
- තෝරා ගත් එකම අවස්ථාවේ දී වර්ධනයට පැමිණෙන මුං බීජ ආර වල මූලික අස්වනු අත්හදා බැලීම
- තෝරා ගත් මුං බීජ ආර වල ප්‍රධාන අස්වනු අත්හදා බැලීම

- බීජ ගුණනය (මුං බීජ වල නිර්දේශිත ප්‍රභේද)
- තෝරා ගත් මුං බීජ ආර වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- තෝරාගත් මුං බීජ ආරවල ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම

**කව්පි**

- අස්වැන්න සහ විවිධ පලිබෝධ රෝග සඳහා ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් කව්පි ජනක ප්ලාස්ම ඇගයීම
- තෝරා ගත් මධ්‍ය කාලීන කව්පි ආරවල ප්‍රධාන අස්වනු අත්හදා බැලීම
- මධ්‍ය කාලීන කව්පි ආර වල ප්‍රාථමික අස්වනු අත්හදා බැලීම
- වඩාත් හොඳ ශාක ව්‍යුහයක් සහිත වැඩි අස්වනු ලබා දෙන කෙටි/මධ්‍යම කාලීන කව්පි ආර (දින 60 -75) වැඩි දියුණු කිරීම ( F 5 සහ F6 පරම්පරා ඇගයීම )
- වර්ෂා පෝෂිත මහ කන්නයේ මධ්‍ය කාලීන කව්පි ප්‍රභේද සඳහා මුහුම්කරණ වැඩසටහන
- නම් කරන ලද කව්පි ආරවල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්හි බීජ ගුණනය

**කොල්ලු**

- කොල්ලු ජනක ප්ලාසම ඇගයීම
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්හි නම් කරණ ලද කොල්ලු ආර වල බීජ ගුණනය

**කෘෂි තාක්ෂණ විද්‍යාව**

- වැඩි දියුණු කළ කව්පි නව ප්‍රභේද සඳහා ශාක ඝනත්ව ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා ගොවි ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කිරීම
- අබ බෝග ඵලදායීතාවයට ශාක ඝනත්වයෙහි බලපෑ ම ඇගයීම
- කව්පි, මුං, සෝයා බෝංචි සහ කොල්ලු වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- වර්ෂා පෝෂිත කව්පි වල ස්ථානීය වැසි ජල අස්වැන්න නෙලීමේ බලපෑම
- දකුණු වියලි කලාපයේ (DL16, DL5) වර්ෂා පෝෂිත කෘෂිකර්මාන්ත පද්ධතියෙහි මනින ලද දත්ත විශ්ලේෂණය
- තල සඳහා උපරිම රෝපණ කාලය සොයා බැලීම

**වල් පැළෑටි විද්‍යාව**

- රටකජු අස්වැන්න සඳහා වල් පැළෑටිවල බලපෑම අධ්‍යනය සහ රටකජු සඳහා රටකජු බෝගය සහ වල් පැළෑටි අතර තරඟකාරී කාලය තීරණය

**පාංශු විද්‍යාව**

- දෙමුහුම් ඉරිඟු( සම්පත් ප්‍රභේදය) අස්වැන්න සහ වර්ධනය සඳහා නයිට්‍රජන් සහ සින්ක් වල බලපෑම.
- රටකජු සඳහා විවිධ සල්ෆර් ප්‍රභවයන්හි බලපෑම
- නයිට්‍රජන් තිරකිරීම සහ පොස්ෆරස් - ද්‍රාව්‍යතාව සඳහා ජෛවීය පොහොර පරීක්ෂණය
- අලුතෙන් දෙමුහුම් කළ රටකජු (ANKGI ප්‍රභේදය) ප්‍රභේදය. නයිට්‍රජන් සඳහා දක්වන ප්‍රතිචාර අධ්‍යයනය.

**ජල කළමනාකරණය**

- ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ විවිධ පස් වර්ග සඳහා විවිධ පෘෂ්ඨීය

වාරිමාර්ග පැතිකඩ සඳහා උපරිම ද්‍රෝණි ප්‍රමාණය තීරණය (ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතියකි)

- ශ්‍රී ලංකාවේ ($DL_{1b}$, $DL_5$) කෘෂි පාරිසරික කළාපයන්හි මුං බීජ සඳහා බෝග සංගුණකය සහ බෝග ජල අවශ්‍යතාවය තීරණය
- අගුණකොළපැලැස්ස ගොවිපල පරිශ්‍රයෙහි පාංශු ලවණතා සිතියමක් වැඩිදියුණු කිරිම

**ජෛව තාක්ෂණය**

- ෆියුසාරියුම් (*Fusarium*) මැලවීමේ රෝගයට ප්‍රතිරෝධී කාලය සඳහා කෙසෙල් වල නලස්ථ විකෘති බිහිකිරීම
- තුඹ කරවිල *(Momodica dioica)* සඳහා උචිත ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමවේදයක් වැඩි දියුණු කිරිම

**ව්‍යාධි විද්‍යාව**

- *Trichoderma harshiana* මගින් *Sclerotium rolfsii* පාලනය සඳහා උචිත ක්‍රමවේදයක් හඳුනාගැනීම - ගොවි ක්ෂේත්‍ර අත්හදාබැලීමකි.
- රටකජුවල *Sclerctium rolfsii* පාලන ශාක නිස්සාරක වල හැකියාව අධ්‍යයන
- තල වල කඳ සහ මුල් කුණුවීමේ රෝගය සඳහා රේඛීය සමීක්ෂණය සිදු කිරිම

**කීට විද්‍යාව**

- මුංවල විචිත්‍ර වෛරසය ඇතිවීම පාලනය කිරීම සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීම
- මුං වල විචිත්‍ර වෛරස් රෝගය මතුවීම යටපත් කිරිම උදෙසා විවිධ සමෝධානික ක්‍රමවල බලපෑම සන්සන්දනය
- විචිත්‍ර වයිරස් ප්‍රතිරෝධීතාවය සඳහා මුං ජනක ප්ලාස්මය පරීක්ෂා කිරිම
- ශාක විවිධත්වය හඳුනා ගැනීම
- අබ වගාවේ ප්‍රධාන පලිබොධකයින් පාලනය සඳහා ඵලදායී පාලන පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරිම
- ගබඩා තත්ත්වයන් යටතේ *callosobrus maculates* පාලනය සඳහා උපරිම උණුසුම් සහ ශිත කළ යුතු ප්‍රමාණය හඳුනා ගැනීම

**ආහාර විද්‍යාව සහ තාක්ෂණය**

- ශ්‍රී ලංකාවේ වගා කරන මුං බීජ ප්‍රභේදවල පෝෂණීය තත්ත්වය හඳුනා ගැනීම
- ඇඹුල් කෙසෙල් වල ස්‍රාවය නිස්සාරණය සඳහා ක්‍රමවේදය ප්‍රවර්ධනය

**එළවළු විභේදනය**

- නිර්දේශිත තුඹ ප්‍රභේද වල ජායාංගී මව් තොග ස්ථාපිත කිරීම සහ නඩත්තුව
- තුඹ ජනක ප්ලාස්ම නඩත්තුව සහ සංරක්ෂණය
- නිර්දේශිත තුඹ ප්‍රභේදයන්හි රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- වට්ටක්කා ජනක ප්ලාස්ම එකතුකිරීම ඇගයීම සහ වරණය
- දෙමුහුම් බණ්ඩක්කා ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන
- වට්ටක්කා දෙමුහුම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන

- වට්ටක්කා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම
- දකුණු පළාතේ අවාරයට ලොකු ලූනු වගා කිරීම සඳහා ප්‍රභේද ඇගයීම

**පළතුරු විභේදනය**

- දිවුල්, දෙහි, දෙළුම්, කෙසෙල්, පේර, කොමඩු එකතු කිරීම, ස්ථාපිත කිරීම සහ ඇගයීම
- "රත්න" පැපොල් ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය
- දිවයින පුරා පටක රෝපිත ප්‍රචාරණ වැඩසටහන සඳහා රෝගවලින් තොර මවු ශාක නිෂ්පාදනය සඳහා හුදකලාවූ කෙසෙල් වත්තක් ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන කෙසෙල් ජනක ප්ලාස්ම එකතු කිරීම, ස්ථාපිත කිරීම සහ ඇගයීම
- පැපොල් මුදු පුල්ලි රෝගයට ප්‍රතිරෝධී හොඳ ගුණාත්මක තත්ත්වයේ සහ ගුණාත්මක ලක්ෂණ සහිත පැපොල් ප්‍රභේද, ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම

**විදේශීය පුහුණු**

- ඩබ්. එම්. පී. එන්. ඩිලූෂා (පර්යේෂණ නිලධාරි) චීනයේදී සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තෙල් බෝග සම්බන්ධ ඉහල තාක්ෂණයන් පිළිබඳ පුහුණුව
- ගාමිණී අබේවික්‍රම මහතා (පර්සේෂණ නිලධාරි) චීනයේදී සංවර්ධන වෙමින් පවතින රටවල් සඳහා තෙල් බෝග සම්බන්ධ ඉහළ තාක්ෂණයන් පිළිබඳ පුහුණුව

**කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - වීරවිල**

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| ස්ථානභාර පර්යේෂණ නිලධාරී | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| ගොවිපල් ලිපිකරු | 01 |
| රියදුරු | 01 |
| මුරකරු | 02 |
| කම්කරු(ස්ථිර) | 11 |
| කම්කරු(කොන්ත්‍රාත්) | 06 |
| **එකතුව** | **24** |

## කාර්ය මණ්ඩලය

**රනිල සහ තෙල් බෝග පර්යේෂණ සහසංවර්ධන මධ්‍යස්ථානය**

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ සහකාර | 14 |
| ආර්ථික විද්‍යාඥ | 01 |
| ගොවිපල් කළමනාකරු | 01 |
| පර්යේෂණ සහකාර | 16 |
| කෘෂිකර්ම උපදේශක | 07 |
| පර්යේෂණ උපසහකාර | 05 |
| පරිපාලන නිලධාරී | 01 |
| කළමනාකාර සහකාර | 05 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| රියදුරු | 05 |
| වඩුකරු | 01 |
| මුරකරු | 14 |
| කම්කරු (ස්ථිර) | 45 |
| කම්කරු(කොන්ත්‍රාත්) | 120 |
| **එකතුව** | **238** |

# 1.1.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල

මහවැලි 'බී', 'සී', 'ඩී' සහ 'ජී' යන මහවැලි යෝජිත කලාපවලත්, නැගෙනහිර කලාප සහ අන්තර් කලාප ප්‍රදේශවල එම ප්‍රදේශයනට අදාල තාක්ෂණ ශිල්ප ක්‍රම වැඩිදියුණු කිරීම හා එම තාක්ෂණ ශිල්ප ක්‍රම ප්‍රායෝගිකව උපයෝගී කර ගැනීම පිළිබඳ වගකීම කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සතු වේ. මෙම කලාපීය වැඩසටහන්වලට අමතරව මධ්‍යස්ථානය, ජාතික සම්බන්ධීකරණ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා සහයෝගීව කටයුතු කරනු ලබයි. පරිපාලනමය වශයෙන් මධ්‍යස්ථානය වෙනත් ක්ෂේත්‍ර භෝග සම්බන්ධ පර්යේෂණ කටයුතු වලද නියැලේ. කෘෂි විද්‍යාව, කීට විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව යන ශාක අභිජනන, ශාකය ව්‍යාධිවේදය, උද්‍යාන බෝග සහ පාංශු හා ජල කළමනාකරණය විවිධ විෂයන් යටතේ මෙම මධ්‍යස්ථානය පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

## අයවැය

වගුව **1.1.2.1:** වාර්ෂික අයවැය **(2012 -** රු. මිලියන**)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 9,848,439 | 9,153,653 | 93 |
| ප්‍රාග්ධන | 5,138,000 | 2,919,007 | 57 |
| **ව්‍යාපෘති** | | | |
| ගොවිපල සංවර්ධන වැඩසටහන | 7,500,000 | 4,370,000 | 58 |
| පැපොල් අභිජනන බීජ වැඩසටහන | 300,000 | 281,000 | 94 |
| කෙසෙල්- ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහන | 50,000 | 48,000 | 96 |
| ජල කලමනාකරණ - ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහන | 1,140,000 | 1,071,919 | 94 |
| **එකතුව** | **23,976,439** | **17,843,579** | **74** |

# ප්‍රගතිය

## පර්යේෂණ

### කෘෂි විද්‍යාව

#### සහල්

බතලගොඩ වී පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය හා එක්ව සියලුම වසස්වල වී වර්ග (මාස 4 – 4 ½, මාස 3 ½, සහ මාස 3) සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් (NCRVT) සිදු කරනු ලැබිය.

NCB (Non Calcic Brown) චූර්ණමය නොවන දුඹුරු පාට පසෙහි අධික ජල ප්‍රමාණයක් සහ විකල්ප තෙතමන සහ වියලි වාරිමාර්ග පද්ධතීන් යටතේ වී ප්‍රභේද ආර 22ක් අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී පරීක්ෂා කරනු ලැබීය. ඉහත වාරිමාර්ග ප්‍රතිකර්ම සමඟ වල් සහිතව හා වල් ප්‍රතිකර්ම රහිතව පරීක්ෂා කරනු ලැබිණි. විකල්ප තෙතමන සහ වියලන පරිසරයන් යටතේ වැඩිම ධාන්‍ය අස්වැන්නක් Bg 366 යටතේ ලැබුණු අතර එය හෙක්ටයාරයකට ටොන් 5.72 විය. විකල්ප තෙත සහ වියළි වාරි පද්ධතිය සහ වල් රහිතව ප්‍රභේද පරීක්ෂාවෙහිදී Bg 300 සඳහා වැඩිම ධාන්‍ය අස්වැන්නක් ලැබුණු අතර එය හෙක්ටයාරයකට ටොන් 6.5ක් විය. Bg 07-2828, Bg 358, Bg 366, Ld 8-15-30, Bg 10-1399, Bg 10-2907 සහ Ld 6-7-8 යන ප්‍රභේදයන්හි අස්වැන්න ආසන්න වශයෙන් හෙක්ටයාරයකට ටොන් 5ක් පමණ විය. කෙසේ වුවද විකල්ප ජල සහ වියළි වාරිමාර්ග පද්ධතියක් යටතේ වල් හේතුවෙන් ඇතිවන්නා වූ පීඩනයක් සහිතව වගා කල ප්‍රභේදයන්හි Bg 366හි වැඩිම අස්වනු ප්‍රමාණයක් ලැබුණු අතර එය හෙක්ටයාරයකට ටොන් 6.57ක ප්‍රමාණයක් විය. Bg 10-1407, Bg 07-2828, Bg 357 සහ At 08-593 යන ප්‍රභේදයන්හි අස්වැන්න, එම ප්‍රභේදයන්හි දක්නට ලැබෙන සාමාන්‍ය අස්වැන්නට වඩා වැඩි ප්‍රමාණයක් වූ අතර එය පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 5.48, 5.11, 5.00 සහ 4.55 විය. අධික ජල ප්‍රමාණයක් සහිත වාරි පද්ධතියක් යටතේ වල් හේතුවෙන් ඇති වන පීඩනයක් රහිතව Ld 8 – 15 -15 ප්‍රභේදය හැර ඉතිරි පරීක්ෂා කළ සියලුම ප්‍රභේදයන්හි ලැබුණු අස්වැන්න සාමාන්‍ය අස්වැන්නට වඩා වැඩියෙන් හෙක්ටයාරයකට ටොන් 5ක අස්වැන්නක් ලැබිණි. වැඩිම අස්වැන්නක් Bg 300 (හෙක්ටයාරයනට ටොන් 9.85) ප්‍රභේදයෙන් ලැබිණි. අධික ජල ප්‍රමාණයක් සහිතව වාරි ක්‍රමය යටතේ වල් හේතුවෙන් ඇති වන පීඩනයක් සහිත වගා කළ Ld 3-12-50 සහ Ld 8-15-30 යන ප්‍රභේද දෙකෙහි වැඩිම අස්වැන්නක් ලැබු අතර එය හෙක්ටයාරයකට ටොන් 9.22 විය. Bg 250,Bg 357,Bg 2828, Bg 359 හා Bg 358 යන ප්‍රභේදයන්හි වාර්තා වූ බීජ අස්වැන්න පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 7.64, 7.62, 7.58, 7.57 සහ 7.54 විය. මෙම වාරික්‍රම තත්ත්ව 2කම යටතේ වල් හේතුවෙන් ඇතිවන පීඩනයක් සහිතව Bg 357 සහ Bg 2828 යන ප්‍රභේද දෙකෙහිම සාමාන්‍ය අස්වැන්නකට වඩා ටොන් 5ක වැඩි අස්වැන්නක් වාර්තා විය. එමනිසා මෙම සියලුම පරීක්ෂණ තත්ත්වයන් යටතේ Bg 2828 යන ප්‍රභේදය/ආරය හොඳම ප්‍රභේදයයි.

#### බඩඉරිඟු

සම්පත් බඩඉරිඟු ප්‍රභේදය සඳහා විවිධ නයිට්‍රජන් අනුපාත 3ක් (හෙක්ටරායකට කිලෝග්‍රෑම් 150,225,300) සහ පොටෑසියම් අනුපාත 4ක් ($K_2O$ හෙක්ටයාරකට කි.ග්‍රෑ 15,30,45 සහ 60) වාර දෙකකට (ආරම්භක අවස්ථාවේ සහ පළමු අවස්ථාවේ නයිට්‍රජන් ඉස සති 4කට පසු) සහ $K_2O$ - පොටෑසියම් ඔක්සයිඩ් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 45 සහ 60

බැගින් වාර 2කට ඉස පරීක්ෂා කරනු ලැබිණි. හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 225 සහ 300 නයිට්‍රජන් ඉසීම මඟින් වැඩිම අස්වැන්නක් ලැබුණු අතර හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 45 අනුපාතය පොටෑසියම් යෙදීම මඟින් සැලකිය යුතු ප්‍රමාණයකින් අස්වැන්න වැඩි විය. අස්වැන්න සඳහා නයිට්‍රජන් සහ පොටෑසියම් අතර අන්තර්ක්‍රියාවෙහි බලපෑම එතරම් පැහැදිලි නොමැත. කෙසේවුවද හෙක්ටයාරයට නයිට්‍රජන් කිලෝග්‍රෑම් 225ක් පොටෑසියම් ඔක්සයිඩ් 45 කිලෝග්රෑම්ක් යෙදීම මඟින් සහ හෙක්ටයාරයකට නයිට්‍රජන් කිලෝග්‍රෑම් 300ක් සමඟ පොටෑසිටම් ඔක්සයිඩ් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 15ක් යෙදීම තුළින් පිළිවෙලින් බඩඉරිඟු අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 4.45 සහ ටොන් 4.47ක් ලැබිණි.

## ප්‍රවේණිය හා ශාක අභිජනනය

### පොකුරු ලූනු

ව්‍යුහාත්මක ලක්ෂණ වලට අනුකූලව පොකුරු ලූනු ආර 34ක් අගයනු ලැබීය. ප්‍රාථමික අස්වනු අත්හදා බැලීම් සඳහා ආර 6ක් තෝරා ගනු ලැබිණි. තර්කු ආකාර වර්ගයේ ලූනු ලෙස ආර 11ක්ද කෙටි වයස ඇති ලෙස ආර 6ක්ද තෝරාගනු ලැබිණි. ස්ථාන 3 කදී පරීක්ෂණ ප්‍රභේද 2ක් සමඟ ආර 4ක ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කෙරිණි.

### කව්පි

“ධවල” ප්‍රභේදයේ කව්පි අභිජනන බීජ කිලෝග්රෑම් 107ක් ගුණාත්මක තත්ත්වය තහවුරු කරන්නාවූ රෝපණ ද්‍රව්‍ය ලෙස නිෂ්පාදනය කරනු ලැබිණි.

## ඌන උපයෝජිත බෝග

### තිබ්බටු

ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා ක්ෂෙත්‍ර ජාන බැංකුව නඩත්තු කරන අතරම කිලෝග්‍රෑමයක අභිජනන බීජ නිෂ්පාදනය කරනු ලැබිණි.

### තුඹ කරවිල

දැනට පවතින ජාන බැංකුවට නව එකතුන් හඳුන්වා දුන් අතර දැනට පවතින ජනක ප්ලාස්මයන්හි තාපයට ඔරොත්තුදීම සහ ගුණාත්මක ලක්ෂණ සඳහා අගයනු ලැබීය. විදේශීය සහ දේශීය ප්‍රභේදයන් උපයෝගී කරගනිමින් මුහුම්කරණ වැඩසටහන් ආරම්භ කරනු ලැබිණි. දැනට පවතින ප්‍රභේදයන්ගෙන් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය මේ පිළිබඳව උනන්දුවක් දක්වන ගොවීන් අතර බෙදාහරිනු ලැබිණි.

### කරපිංචා

කරපිංචා ජනකප්ලාස්ම එකතු කිරීම ආරම්භ කරනු ලැබූ අතර ගෙවත්තෙහි වගාව සඳහා ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ප්‍රභේද තෝරා ගැනීම උදෙසා එම ජනක ප්ලාස්ම නඩත්තු කරනු ලැබීය.

## උද්‍යාන බෝග

### කෙසෙල්

2011 ජුලි මස සීනි කෙසෙල් වර්ගයට අයත් කෙසෙල් එකතුන් 7ක් ඇගයීම ආරම්භ කරනු ලැබූ අතර තවත් කන්න 6ක් සඳහා මෙය අඛණ්ඩව සිදු කරනු ලබයි.

### පැපොල්

“රත්න” ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය ආරම්භ කරනු ලැබිණි. අභිජනන බීජ 1kgක් නිෂ්පාදනය කරනු ලැබූ අතර තවදුරටත් ගුණනය උදෙසා බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය වෙත බාර දෙනු ලැබිණි.

### අඹ

අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ ක්ෂෙත්‍ර ජාන

බැංකුවෙහි බලාපොරොත්තු තැබිය හැකි අඹ එකතුන් 10ක් නඩත්තු කරනු ලැබූ අතර ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා වර්ධන හා මල්හට ගැනීමේ දත්ත එකතු කරනු ලැබීය.

### බතල

තෝරාගත් නව බතල ආර 4ක් RCBD (Romdomized Complete Block Design) අත්හදා බැලීම් වලදී පරීක්ෂා ප්‍රභේද 2ක් සමඟ ප්‍රතිවලිත 3ක් පරීක්ෂා කරනු ලැබීය.

මෙම ආර 2ක මාස 2.5 හා මාස 3.5 ප්‍රභේද වේ. අස්වැන්න පිළිබඳ දත්ත වලට අනුකූලව මාස 2.5 මලයාසියානු ප්‍රභේදය වැඩිම අස්වැන්නක් එනම් හෙක්ටයාරයකට ටොන් 22.6ක් ලබාදුන් අතර HORD - C - 5 ප්‍රභේදය අඩුම අස්වැන්නක් ලබාදුණි.

## ශාක ව්‍යාධිවේදය

### රතු ලූනු

- පොකුරු ලූනු වල බල්බ කුණුවීමේ දිලීර රෝගය පාලනය කිරීම උදෙසා ඵලදායී දිලීරනාශක සහ බල්බයන් සඳහා ප්‍රතිකර්ම කළ යුතු කාලයෙහි බලපෑම් පරීක්ෂා කරනු ලැබීය. සම්බන්ධීකරණ වැඩසටහනක් ලෙස අරලගංවිල හා තිරුනෙල්වේලි හිදී කන්න දෙකෙදීම සාර්ථක ලෙස පර්යේෂණ සිදු කරනු ලැබීය. රෝගයට එරෙහිව ඵලදායී ප්‍රතිකර්ම හඳුනාගනු ලැබීය.
- කලාපයේ රතුලූනු වලට ඇතිවන රෝගවලට අනුකූලව ප්‍රතිරෝධී වන වඩාත් උචිත රතු ලූනු ප්‍රභේදය තෝරා ගැනීම උදෙසා පරීක්ෂණයක් පවත්වනු ලැබීය. සම්බන්ධීකරණ වැඩසටහනක් ලෙස අරලගංවිල, කිලිනොච්චි සහ කල්පිටිය යන ප්‍රදේශ වලදී කන්න 2කදීම සාර්ථකව පර්යේෂණ සිදු කරනු ලැබීය.
- සත්‍ය බීජ සහ බල්බ මඟින් ඇති වූ පොකුරු ලූනුවල රෝග උදෙසා විවිධ කාබනික පොහොර මට්ටමෙහි බලපෑම ඇගයීම පිණිස අධ්‍යයනයන් පවත්වනු ලැබීය. අරලගංවිල කන්න දෙකෙදීම මෙම පර්යේෂණ පවත්වනු ලැබිණි. වඩාත් උචිතම කාබනික පොහොර මට්ටම හඳුනාගනු ලැබිණි.

## කීට විද්‍යාව

තිබ්බටු (*Solanum violacum*) බෝගය සඳහා අරටු විදින්නා (*Euzofers ferticella*) පාලන පිළිවෙත් අධ්‍යයනය කරනු ලැබූ අතර මාස 2.5 - 3 පමණ වන කුඩා පැළවලින් හානිය ආරම්භ කරනු ලබන අතර කුඩා ශාකයේ මුල් ප්‍රදේශයෙන් හානි කිරීම ආරම්භ කරන බව හෙළිදරවු විය. ශාක සඳහා භෞතික බාධකයක් ලෙස වියලි වල් වලින් ශාකය ආවරණය කළ විට මුල් අවස්ථාවේදී ඇතිවන හානිය අවම කළ හැක. මදුරුදැල් ආවරණ, කළු පැහැති පොලිතීන් සහ පොලිසැක් ද්‍රව්‍ය භෞතික බාධක මෙන් එතරම් සාර්ථක නොවීය. නමුත් කඳෙහි කපුරු බෝල නැවත පරීක්ෂා කළ යුතු වේ.

නැගෙනහිර වියලි කලාපයේ පළතුරු බෝග සහ සාම්ප්‍රදායික නොවන එළවළු සමඟ විලෝපිකයින් පරපෝෂිතයින් හා පරාගකයින් ලෙස ක්‍රියා කරන පලිබෝධකයින් පිළිබඳව පරීක්ෂා කරනු ලැබුණි. පහත පලිබෝධකයින් හඳුනා ගන්නා ලදී.

අරටු විදින්නා(*Euzofera ferticella*), රිකිලි හා ඵල විදින්නා (*Leuncinodes orbonalis*), එපිලැක්නා කුරුමිණියෝ (*Epilachna* spp), පත්‍ර කීඩෑවා (*Amrasca devastans*),ශාක කීඩෑවා, කුඩිත්තා (*Aphis gossypi*), කැප්සිඩ මකුණා (*Helopeletis annotoni*), ලේස්වින් මකුණා (*Urentiuss echinus*), නිසාරා මකුණා (*Nizara viridula*), පිටි මකුණා (*Phenococcus sulenopsis*), සහ

වෙනත් විශේෂ 2ක් මයිටාවන් (*Teteanychus* spp), කොරපොතු විශේෂ 2ක්

## පාංශු හා ජල කළමනාකරණය

### පාංශු විද්‍යාව

**ඉරිඟු සඳහා ජලසම්පාදන / සමුච්චිත තැටි අනුපාතය (IW/CPE) උපයෝගී කරගනිමින් වාරි ජල අවශ්‍යතාව තීරණය කිරීම**

2012 යල කන්නයේදී අරලගංවිල කලාපීය කෘෂි පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේදී වාරි ප්‍රතිකර්ම වර්ග 7ක් ජලසම්පාදන/සමුච්චිත කැටි අනුපාත (IW/ CPE) = 0.25, 0.5, 0.75, 1, 1.25, 1.5 සහ 1.75) පරීක්ෂණ කරනු ලැබීය IW/ CPE අනුපාතය 2.5 වන ප්‍රතිකර්මය මඟින් වැඩිම ශාක වර්ධනයක් හා අස්වැන්නක් ලැබුණු බව හෙළිදරවු විය. කෙසේ වුවද IW/ CPE ප්‍රතිකර්ම අනුපාතය 2.5 හා 3 යන දෙක අතර අස්වැන්නෙහි පැහැදිලි වෙනසක් දක්නට නොවීය.

**චූර්ණමය නොවන දුඹුරු පසෙහි විවිධ කාබනික පෙහොර යෙදීම යටතේ පාංශු පෝෂක ස්වභාවය සහ මුං බීජවල වියලි අස්වැන්න**

චූර්ණමය නොවන දුඹුරු පසෙහි විවිධ කාබනික පොහොර යෙදීම මඟින් පාංශු පෝෂක ස්වභාවය සහ මුං (*Vigna radiata* (L), Wilczek) හි වියලි අස්වැන්න පිළිබඳ අධ්‍යයනය කිරීම උදෙසා අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ක්ෂෙත්‍ර පරීක්ෂණයක් පවත්වනු ලැබිණි. හෙක්ටයාරයකට ටොන් 10 බැගින් ග්ලිරිසීඩියා (*Gliricidia sepium*), ඉපිල්ඉපිල් (*Leucaena leucocephala*), ගිනිතෘණ (*Panicum maximum*), පිදුරු, ගොම පොහොර, කුකුල් පොහොර සහ කොම්පෝස්ට් යන පොහොර ප්‍රතිවලිත 3කින් RCBD ( Randomized Complete Block Design) පරීක්ෂා කරනු ලැබීය.

කාබනික පොහොර දිරාපත් වන සහ පෝෂක නිදහස් වන වේගය තීරණය කිරීම උදෙසා කුණු දමන මලු ක්‍රමවේදය උපයෝගී කරගනිමින් පරීක්ෂණ සිදු කරනු ලැබීය. මෙම අධ්‍යයනය උදෙසා එක් බිම් කැබැල්ලකට කුණු දමන මලු 8 බැගින් උපයෝගී කරනු ලැබීය. සති 8ක කාලයක් පුරා එක් සතියකට එක් බිම් කැබැල්ලකින් එක් බැගය බැගින් නැවත ආපහු ගෙන පරීක්ෂණය සිදු කරනු ලැබීය. ග්ලිරිසීඩියා (දිරාපත්වීමේ වේගය සතියක ග්‍රෑම් 6.745 සහ අර්ධ ජීවකාල කාලය සති 3.74) වැඩිම දිරාපත්වීමේ වේගයක් සහ කෙටිම ජීව කාලයක් වාර්තා විය. කෙසේවුවද ගිණි තෘණ වල සතියකට පසු වැඩිම නයිට්‍රජන් සහ පොටැසියම් අයන නිදහස් වීමක් වාර්තා වු අතර පිදුරු වල වැඩිම පොස්පරස් ප්‍රමාණයක් නිදහස් වීම වාර්තා විය. සති 8ක කාලයකට පසු ග්ලිරිසීඩියා වලින් වැඩිම නයිට්‍රජන් ප්‍රමාණයක් නිදහස් කිරීම (.83%) වාර්තා වනු ලැබු අතර කුකුල් පොහොර වැඩිම පොස්පරස් ප්‍රමාණයක් නිදහස් කිරීම (0.009%) සහ ගිණි තෘණ වැඩිම පොටැසියම් ප්‍රමාණයක් නිදහස් කිරීමද වාර්තා වනු ලැබිණි. වැඩිම ශාක උසක් (29.50 cm), ශාකයකට වැඩිම කොළ ප්‍රමාණයක් (13.167) සහ බීජ අස්වැන්න හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 952.16ක් කුකුල් පොහොර යෙදූ මුං වල පෙන්නුම් කෙරිණි. වෙනත් කාබනික පොහොර වැඩිම දිරාපත් වීමේ වේගයක් සහ වැඩි පෝෂක නිදහස් කිරීමේ වේගයක් වාර්තා වුවද මුං බීජ වල වර්ධන හා අස්වැන්න තුළින් එය පිළිබිඹු නොවීය.

මුල් අවස්ථාවේ තිබූ පස්වල ප්‍රමාණයට වඩා කාබනික ද්‍රව්‍ය යෙදීම මඟින් පසෙහි PH අගය, විද්‍යුත් සන්නායකතාවය, කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය, සම්පූර්ණ නයිට්‍රජන් ප්‍රමාණය, පවතින පොස්පරස් ප්‍රමාණය සහ හුවමාරු කර ගත හැකි පොටැසියම් ප්‍රමාණය වැඩි කරනු ලැබීය.

වැඩිම සම්පූර්ණ නයිට්‍රජන් ප්‍රමාණය, පොස්පරස් ප්‍රමාණය සහ හුවමාරු කරගත හැකි පොටෑසියම් ප්‍රමාණය කුකුල් පොහොර යෙදූ භූමියෙහි දක්නට ලැබිණි. පරීක්ෂණ වල ප්‍රතිඵල අනුව පාංශු සාරවත් බව වැඩිකිරීම හා අස්වැන්න ලබාගැනීම උදෙසා කුකුල් පොහොර යොදාගත හැකි බවට නිගමනය කරනු ලැබීය.

## ජල කළමනාකරණය

අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ චූර්ණමය නොවන දුඹුරු පසෙහි පාංශු ඛාදනය, ජල බැසයාම ඇති කිරීම සහ බෝග අස්වැන්න පිළිබඳ ඇගයීම සිදු කරනු ලැබීය. හෙක්ටයාරයකට ඝනමීටර් 2973 ජලය බැසයාමත් වාර්තා වූ අතර බණ්ඩක්කා හුදෙක් බෝග ප්‍රතිකර්ම සඳහා එය සැලකිය යුතු ඉහළ ප්‍රමාණයකි. සමෝච්ච කාණු පද්ධති ප්‍රතිකර්මයේදී ද හෙක්ටයාරයකට ටොන් 6ක පාංශු ඛාදනයක් ඇතිවීමද සැලකිය යුතු ඉහළ ප්‍රමාණයකි. මෙම පරීක්ෂණයේදී සම්පූර්ණ පාංශු හානිය හා ජලය බැසයාමේ මඟින් පෙන්නුම් කළ ප්‍රතිඵලය වූයේ යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රම වෙදයන්ට වඩා කෘෂිකාර්මික පිළිවෙත් වඩාත් ඵලදායී බවයි.

චූර්ණමට නොවන දුඹුරු පසෙහි වී වගාව සඳහා ජල අවශ්‍යතාව අඩුකිරීමේදී වල්නාශක සමඟ විවිධ ජල කළමනාකරණ පිළිවෙත්හි බලපෑම තීරණය කිරීම උදෙසා වූ පරීක්ෂණ වලින් පහත ප්‍රතිඵල පෙන්නුම් කෙරිණි. සංතෘප්ත තත්ත්වය යටතේ වන තුරු 5 cmක ජල මට්ටමක් පවත්වා ගැනීම, ජලසම්පාදන ක්‍රමය මාරු කිරීම (එක් වාරි ක්‍රමයකදී 5cm ජල මට්ටමක් පවත්වා ගැනීම) යන්න අනුගමනය කල ජල පිළිවෙත වූ අතර වල් නාශක නොමැතිව, වල් නාශක සහිතව (3, 4 - DPA, MCPA), වල් නාශක (පූර්වනිර්ගමන කෘමිනාශක - GOAL) යන්න අනුගමනය කළ වල් නාශක ප්‍රතිකර්මයන්ය. 5 cmක ජල මට්ටමක් තබාගනිමින් 3, 4 DPA/ MCPA සහ 5cmක චක්‍රීය ජල සම්පාදක ක්‍රමයක් සමඟ 3,4 DPA/ MCPA යන ක්‍රම දෙකෙහි එකතුවක් මඟින් වැඩි අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි.

ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහන යටතේ චූර්ණමය නොවන දුඹුරු පස සඳහා විවිධ පෘෂ්ඨීය වාරි ජල ක්‍රමයෙහිදී ප්‍රශස්ථ දෝණි ප්‍රමාණයක් තීරණය කිරීම උදෙසා පරීක්ෂණයක් පවත්වනු ලැබිණි. මෙම ප්‍රතිකර්ම සඳහා වාරි කාර්යක්ෂමතාව, මට්ටම් කිරීමේ ප්‍රමාණය සහ ඒකාකාරී බව ගණනය කරනු ලැබිණි.

## සංවර්ධන ක්‍රියාදාමයන්

### බ්‍රැගන් ෆෘට්

වර්ෂය පුරාම ක්ෂෙත්‍රයේ ස්ථාපිත කිරීම උදෙසා මල් පෝච්චිවල සිටවූ පැල 250ක් බෙදා හරිනු ලැබීය.

### තුඹ කරවිල

මවුවැල් ස්ථාපිත කිරීම උදෙසා පෝච්චිවල සිටවූ වැල් 500ක් බෙදාදෙනු ලැබිණි.

### තිබ්බටු

රටේ සෑම පැත්තකින්ම ලැබූ ඉල්ලීම් මත “බිංදු” ප්‍රභේදයෙන් (200 g) අභිජනන බීජ බොදා හරිනු ලැබීය.

## වැඩමුළු

- වර්ෂ 30ක පර්යේෂණ කාර්යඵලය

  අරලගංවිල කලාපීය කෘෂි පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ සමාලෝචන වැඩමුළුවක් පවත්වනු ලැබිණි.

## ව්‍යාපෘති හා වෙනත් වැඩසටහන්

- **2012 වර්ෂයේ රතුලූනු සම්බන්ධීකරණ වැඩසටහන**

  රතු ලූනු වගාව පිළිබඳ ගොවීන් පුහුණුකිරීමේ වැඩසටහන් පවත්වනු ලැබූ අතර ලංකාව පුරාම රතුලූනු රෝග පාලනය පිළිබඳ ආසන්න වශයෙන් ගොවීන් සහ නිලධාරීන් 750ක් පමණ පුහුණු කරනු ලැබීය.

- **විශ්වවිද්‍යාල සිසුන්ගේ පර්යේෂණ කටයුතුවලදී අධීක්ෂණය**

  රජරට විශ්වවිද්‍යාලයේ අවසන් වසරේ ශිෂ්‍යයින් දෙදෙනෙකුගේ ස්වකීය උපාධිය සම්පූර්ණ කිරීම උදෙසා අවශ්‍යතාවයන්වන තනි පර්යේෂණ ව්‍යාපෘති 2ක් පර්යේෂණ මධ්‍යස්ථානයේ සිදු කරනු ලැබිණි. "බඩ ඉරිගුවල වර්ධනය උදෙසා නයිට්‍රජන් සහ පොටෑසියම් පොහොර අනුපාතයන්ගේ බලපෑම" සහ "ශ්‍රී ලංකාවේ විවිධ වියලි කලාපීය පස් සඳහා විවිධ ඍෂ්ධීය වාරි පැතිකඩ යටතේ ප්‍රශස්ත උපරිම ද්‍රෝණි ප්‍රමාණය තීරණය කිරීම" එම ව්‍යාපෘති 2ක වේ.

## තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම

**පත්‍රිකා**

**ලූනු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක් ලෙස සිංහල හා දෙමළ මාධ්‍යයෙන් රතුලූනුවල රෝග

**ක්ෂේත්‍ර දින හා පුහුණු**

- **පුහුණු වැඩසටහන්**

  විවිධ ක්ෂේත්‍රයන්හි නිලධාරීන්, පරිපාලන නිලධාරීන්, ක්ෂේත්‍ර සහකාර, ගොවීන්, සහ පාසැල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

- **බෝග සායන**

  සම්පත් දායකයින් ලෙස මෙම සායන සඳහා නිලධාරීන් සහභාගී විය.මෙයට අමතරව කීට විද්‍යාත්මක, පර්යේෂණාත්මක පාංශු විද්‍යාව යනාදී ගොවි ක්ෂේත්‍ර ගැටළු උදෙසා තාක්ෂණික විසඳුම් ලබා දුණි.

- **පළාත් සහ මහවැලි තාක්ෂණික කණ්ඩායම් රැස්වීම**

  කන්න 2කම සඳහා මහවැලි "බී", "සී", සහ "ජී" කලාප සඳහා ප්‍රාරම්භක රැස්වීම්හිදී අවශ්‍ය තාක්ෂණික කාර්ය කණ්ඩායම් රැස්වීම් සඳහා ද නිලධාරීන් සහභාගී විය.

- විශේෂයෙන්ම මහවැලි "බී" හා "සී" කලාපවල ගොවීන් සඳහා තාක්ෂණික විසඳුම් ලබාදුණි. ශාක සංරක්ෂණ ගැටළු උදෙසා ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සහ තවත් බොහෝ ගැටළු සඳහා සාම්පල විශ්ලේෂණ මගින් විසඳුම් ලබා දුණි.

## සේවාවන්

**පාංශු පරීක්ෂණ**

පස් සාම්පල් 820ක් විශ්ලේෂණය කරනු ලැබ ඒ අනුව නිර්දේශයන් ලබාදුණි.

# 2013 වර්ෂයේ සැලසුම

## කෘෂි විද්‍යාව

**ලූනු**

- පොකුරු ලූනු වල මල් ඇති වීම උත්තේජනය කිරීම සඳහා අඩු වියදම් ක්‍රමවේදයක් සොයා ගැනීම

## ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනය

**ලූනු**

- ජනක ප්ලාස්ම ලක්ෂණීකරණය

- පළිබෝධ සහ රෝග ප්‍රතිරෝධ සඳහා පොකුරු ලූනු ප්‍රභේද වැඩිදියුණු කිරීම
- තර්කු හා තර්කු නොවන ආකාර පොකුරු ලූනු වැඩිදියුණු කිරීම
- පොකුරු ලූනු වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කිරීම
- පොකුරු ලූනු වල ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්

**තුඹ කරවිල**

- පරීක්ෂා කිරීම සහ මුහුම්කරණ වැඩසටහන
- අභිජනන බීජ නිෂ්පාදනය

**තිබ්බටු**

- අභිජනන බීජ නිෂ්පාදනය

## ඌන උපයෝජිත බෝග

**කරපිංචා**

- ජනකප්ලාස්ම ක්ෂෙත්‍රයේ ස්ථාපිත කිරීම සහ ඇගයුම් ආරම්භය

**මුං**

- ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ සංවර්ධන ආයතනය මඟින් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සම්බන්ධීකරණ

**කව්පි**

- ධවල ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය
- GLORDC (මාෂරනිල බෝග හා තෙල් බෝග සංවර්ධන මධ්‍යස්ථානය) මඟින් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සම්බන්ධීකරණය

**කොල්ලු**

- කලාපය සඳහා ප්‍රභේද වැඩිදියුණු කිරීම් ආරම්භ කිරීම උදෙසා GLORDC (මාෂ රනිල බෝග හා තෙල් බෝග සංවර්ධන මධ්‍යස්ථානය) මඟින් වූ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම්

## උද්‍යාන බෝග

**කෙසෙල්**

- කෙසෙල් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා ලැබීම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම

**පැපොල්**

- “රත්න” ප්‍රභේදය සඳහා අභිජනන බීජ නිෂ්පාදන වැඩසටහන

**බතල**

- ප්‍රභේදයේ ඵලදායීතාවය ඇගයීම උදෙසා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

**දිවුල්**

- පැල සිටුවීමේ විවිධ පරතරයන් සහ විවිධ කප්පාදු කිරීමේ ක්‍රමවේදයන් යටතේ දිවුල් වල ඵලදායීතාවය

**බටු**

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

**පිපිඤ්ඤා**

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

**වට්ටක්කා**

- අනුවර්තන අත්හදාබැලීම

### ශාක ව්‍යාධිවේදය

**පොකුරු ලූනු**

- පොකුරු ලූනු වල දිලීර හේතුවෙන් ඇතිවන බල්බ කුණුවීම පාලනය කිරීමට ඵලදායී දිලීරනාශක සහ විවිධ කාලයන්හිදී බල්බ සඳහා ප්‍රතිකර්ම කිරීමේ බලපෑම
- කලාපයට උචිත ලෙස රෝග වලට ප්‍රතිරෝධී හොඳම රතු ලූනු ප්‍රභේදය තෝරා ගැනීම
- බීජ වගා බල්බ මගින් පැල කළ පොකුරු ලූනු වල රෝගයන්ට අනුකූලව විවිධ කාබනික පොහොර මට්ටම්හි බලපෑම
- පොකුරු ලූනු බීජ වගා කිරීම උදෙසා විවිධ පැල තවාන් ක්‍රමයන් ඇගයීම
- කෘෂි කාර්මික ප්‍රදේශවල කෘෂි රසායන උපයෝගී කර ගැනීමේ තාක්ෂණික හා සමාජ බලපෑම
- වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අනෙකුත් කලාපීය අවශ්‍යතා උදෙසා රෝග හඳුනාගැනීම සහ පාලන ක්‍රම හඳුනාගැනීම

### පාංශු සහ ජල කළමනාකරණය

**පොකුරු ලූනු**

- වියලි කලාප පසෙහි වගා කරන්නා වූ පොකුරු ලූනු වල වර්ධනය හා අස්වැන්න උදෙසා විවිධ ජල සැපයුම් කාලපරාසන්හි බලපෑම (ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහන ව්‍යාපෘතිය)
- පොකුරු ලූනු සඳහා ක්ෂුද්‍ර විසුරුම් වාරි පද්ධතිය ඇගයීම (ජාතික කෘෂි පර්යේෂණ වැඩසටහන ව්‍යාපෘතිය)

**මිරිස්**

- බිංදු වාරි ක්‍රමය සඳහා මිරිස් පිළිබඳ පොහොර මිශ්‍රිත ජලසම්පාදන අධ්‍යයනය

## කාර්ය මණ්ඩලය

| තනතුරු | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| පර්යේෂණ නිලධාරී (ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය) | 8 |
| ගොවිපල් කළමනාකරු | 1 |
| පර්යේෂණ සහකාර | 7 |
| කෘෂිකර්ම උපදේශක | 3 |
| වැඩබලන පරිපාලන නිලධාරී | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 2 |
| ගබඩා භාරකරු (කළමනාකරණ සහකාර) | 1 |
| රියදුරු | 5 |
| විදුලි ශිල්පී | 1 |
| මුරකරු | 12 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 3 |
| වඩු කාර්මික | 2 |
| කම්මල්කරු | 1 |
| පෙදරේරු | 1 |
| සංචාරක බංගලා භාරකරු | 1 |
| බද්ධකරු | 1 |
| කම්කරු | 30 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 50 |
| **එකතුව** | **130** |

# 1.1.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය උතුරු පළාත - කිලිනොච්චිය

දේශීය සහ ජාතික ගොවි ප්‍රජාවේ අවශ්‍යතාවන් සපුරාලීම උදෙසා කෘෂිකර්මය හා සම්බන්ධ සියලු ක්‍රියාවලීන්හි වගකීම කිලිනොච්චි, කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සතුවේ. පසුගිය දශක 2ක කාලය තුළදී මෙම මධ්‍යස්ථානයෙන් එතරම් කාර්යභාරයක් ඉටු නොවූවද සාමය උදාවීමෙන් පසු සැලකිය යුතු පර්යේෂණ ප්‍රමාණයක්හට දායකත්වය ලබාදෙමින් වඩාත් පුළුල් කරමින් නව ජීවයක් ලබා දී ඇත.

කිලිනොච්චි, යාපනය, වවුනියා සහ මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි චන්ද්‍රිකා මධ්‍යස්ථාන 5ක් කිලිනොච්චි කලාපීය, කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සතුවේ. මෙම පර්යේෂණ මධ්‍යස්ථානය මහඉලුප්පල්ලම ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට අනුබද්ධිත වන අතර ප්‍රධාන වශයෙන් කලාපයට ආර්ථික වශයෙන් ඉතා වැදගත්වන වෙනත් ක්ෂෙත්‍ර බෝග හා වී පිළිබඳව පර්යේෂණ හා සංවර්ධන වැඩසටහනක් උදෙසා වැඩි අවධානයක් යොමු කෙරේ. උද්‍යාන බෝග වැඩිදියුණු කිරීම පිළිබඳව සැලකිය යුතු කාර්යභාරයක්ද මෙම මධ්‍යස්ථානය මගින් ඉටු කෙරේ.

මුලතිව් කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය හැරෙන්නට සියලුම පර්යේෂණ මධ්‍යස්ථානයන් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මුලතිව් දිස්ත්‍රික්කය උදෙසා කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රාදේශීය බලධාරීන් විසින් ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ හෙක්ටයාර 5ක භූමි ප්‍රමාණයක් වෙන් කරනු ලැබූ වද භූමිය යෝග්‍ය නොවීමත් මානව සම්පත් හා අනෙකුත් පහසුකම් හිඟවීමත් හේතුවෙන් මෙම මධ්‍යස්ථානය පිහිටුවීමට නොහැකි විය.

කෙසේ වුවද කිලිනොච්චි කලාපීය කෘෂි පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, තිරුනෙල්වේලි, කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, වවුනියා, සහල් පර්යේෂණ ආයතනය, පරන්තරන්, සහල් පර්යේෂණ ආයතනය මුරුක්කන් යන මධ්‍යස්ථානයන්හි පර්යේෂණ සහ සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පවතී.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ විශේෂ ව්‍යාපෘති යටතේ, කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, සහල් පර්යේෂණ ආයතනය පරන්තන්හි ගොඩනැගිලි අභ්‍යන්තර මාර්ග පද්ධති සහ වැටවල් ඉදිකරනු ලැබීය.

## අයවැය

විවිධ වැයශීර්ෂයන් යටතේ අයවැය වෙන්කිරීම් හා වියදම් ඉදිරිපත් කෙරේ.

**වගු අංක 1.1.3.1: වාර්ෂික අයවැය වෙන්කිරීම් හා වියදම් - 2012 රුපියල්**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම් | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 4,984,000 | 4,899,129 | 98 |
| ප්‍රාග්ධන | 2,830,000 | 2,581,025 | 91 |
| ව්‍යාපෘති | | | |
| ගොවි සංවර්ධන ව්‍යාපෘතිය | 1,650,000 | 1,369,714 | 83 |
| එකතුව | 9,464,000 | 8,849,867 | 94 |

## බෝග වැඩිදියුණු කිරීම

### රතු ලූනු

“තිරුනෙල්වේලි රෙඩ්” නැමති ෂැලොට් ආකාරයේ රතුලූනු ප්‍රභේදයෙන් අභිජනන බීජ බල්බ කි.ග්‍රෑ. 320ක් ගොවි ජනතාවට ලබාදීම පිණිස නිෂ්පාදනය කරන ලදී. ඉහළ අස්වැන්න සහ වෙනත් ලක්ෂණ මත තෝරාගත් ගුණන ආකාරයේ දෙමුහුම් 3ක් නඩත්තු කරන ලදී.

එමෙන්ම ගුණන ආකාරයේ ආර 3ක් (TMV -1 , TMV – 2, TMV – 4) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වලට ඇතුළත් කරන ලදී.

### ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම් වැඩසටහන

තිරුනෙල්වේලි කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය සහ අරලගංවිල කලාපීය කෘෂි පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයෙන් තෝරාගත් ආර සමඟ ලූනු ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පවත්වනු ලැබිණි. ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම් වැඩසටහන සඳහා තිරුනෙල්වේලි කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයෙන් තෝරාගත් TMV -1 , TMV – 2 යන ගුණන ආර 2ක ඇතුලත් කෙරිණි. බල්බ මගින් ලූනු දෙමුහුම් ගුණක (OH) ආර 3ක් නඩත්තු කරනු ලැබිය.

### මිරිස්

මිරිස් ආර 6ක් MI – කොළ සහ KA 2 සමග පරීක්ෂා කරනු ලැබිණි. ICPN 18 -7 මිරිස් වර්ගය හෙක්ටයාරයකට ටොන් 27ක වැඩිම අස්වැන්නක් ලබාදුන් අතර එය මාළු මිරිස් වල ලක්ෂණ පෙන්නුම් කළ අතර අමුමිරිස් හෝ වියළි මිරිස් යන දෙයාකාරයටම එය උචිත නොවිය. TVC 4 සහ TVC 5 යන (තිරුනෙල්වේලි කෘෂි පර්යේෂණ මධ්‍යස්ථායේ) ආර 2ක වඩාත් හොඳ සාර්ථකත්වයක් පෙන්නුම් කළ අතර අමුමිරිස් පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 15.3 හා 14 ක අස්වැන්නක් ලබාදුණි.

### උඳු

YMV (කහ විචිත්‍ර වෛරස) ප්‍රතිරෝධී උඳු ප්‍රභේදයක් වැඩිදියුණු කිරීම උදෙසා වූ මුහුම්කරණ වැඩසටහන සඳහා ආර 33ක් පරීක්ෂා කොට ආරවල ඵලදායීතාවය මත ආර 6ක් තෝරා ගනු ලැබීය.

### රටකජු

දේශීය තත්ත්වයන්ට ගැලපෙන, උචිත වැඩි අස්වනු ලබාදෙන රටකජු වැඩිදියුණු කිරීම උදෙසා තවදුරටත් ඇගයීම පිණිස දේශීය ආර 6ක් සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ එකතුන් 20ක් එකතු කරනු ලැබීය.

### බණ්ඩක්කා

10020 x In 17, 10656 x 9895, In 19,2338 x 10014, La 33 x TD, නාගා, La 33 යන ආර පරීක්ෂා කරනු ලැබූ අතර “නාගා” ආරය හෙක්ටයාරයකට ටොන් 33.9 ක වැඩිම අස්වැන්නක් පෙන්නුම් කෙරිණි.

### අර්තාපල්

අර්නෝවා, කාල්වයිට්, රෙඩ්ලැසෝදා, සෆීරා සහ රුඩොල්ෆ් යන අර්තාපල් ප්‍රභේද අත්හදා බැලීම් ඇගයීම සිදු කරනු ලැබූ අතර කාල්වයිට් සහ රෙඩ්ලැසෝදා යන විශේෂ වැඩිම අස්වැන්නක් ලබා දුන් අතර කාල් වයිට් ප්‍රභේදය ශාකයකට 1030gක වැඩිම අස්වැන්නක් පෙන්නුම් කෙරිණි.

### මුං

MIMB 901, MIMB 902, MIMB 903, MIMB 904, MIMB 905, MIMB 906,

MIMB 907, MI 6, MI 5 සහ AR 1 යන ආර පරීක්ෂාවට ලක් කෙරිණි. MIMB 904 යන ආරය වැඩිම අස්වැන්නක් ලබාදුණි. යල කන්නයේදී ආර 14ක් ඇගයීමට ලක් කරනු ලැබූ අතර MIMB 901 ආරය වැඩිම අස්වැන්නක් ලබාදුණි.

## රට කජු

ICGV 01276, ICGV 86590, රෙඩ් ටෙස්ටා, ඉන්දි සහ තිස්ස යන ප්‍රභේද පරීක්ෂා කරනු ලැබීය. තිස්ස ප්‍රභේදයේ වැඩිම අස්වැන්නක් වාර්තා වනු ලැබූ අතර එය හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3120ක් විය.

## අබ

AP 26, C 108, C 189 සහ බුත්තල (පරීක්ෂා) යන ප්‍රභේද පරීක්ෂාවට ලක්කරනු ලැබීය. බුත්තල පරීක්ෂා ප්‍රභේදය වැඩිම අස්වැන්නක් ලබාදුන් අතර එය හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 810ක් විය.

## තක්කාලි

මහේෂි, HF 03, රාජිත , MI 121, MI 127 යන ප්‍රභේද පරීක්ෂා කරනු ලැබූ අතර භාතිය ප්‍රභේදය හෙක්ටයාරයකට ටොන් 18ක වැඩිම අස්වැන්නක් ලබාදුණි.

## බටු

EGH 5, EGH 6, EGH 7, EGH 8, ‘අමන්දා’ ‘අංජලී’, BW11 යන ප්‍රභේද පරීක්ෂා කරනු ලැබිණි. තිරුනෙල්වේලි කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ ‘අංජලී’ ප්‍රභේදය හෙක්ටයාරයකට ටොන් 10.5ක වැඩිම අස්වැන්නක් වාර්තා විය. වවුනියා කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ EGH 5 ප්‍රභේදය සහ කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ EGH 8 ප්‍රභේදය පිළිවෙලින් හෙක්ටයාරයකට ටොන් 54.42 සහ 43ක අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි

## මාළු මිරිස්

HYW, 300 x HYW, CA 8, 1782HYW යන ප්‍රභේද පරීක්ෂා කරනු ලැබිණි. 1782HYW ප්‍රභේදය හෙක්ටයාරයකට ටොන් 10.5 ක වැඩිම අස්වැන්නක් ලබාදුණි.

## කව්පි

මහකන්නයේදී ආර 9ක් සහ පරීක්ෂණ ප්‍රභේද 3ක් පරීක්ෂාවට ලක් කරනු ලැබූ අතර අයහපත් කාලගුණය හේතුවෙන් බලපෑමට ලක් විය. කෙසේවුවද යල කන්නයේදී ආර 6ක් සහ පරීක්ෂණ ආර 3ක් පරීක්ෂා කරනු ලැබූ අතර එයින් ANCH 14 ආරය වැඩිම අස්වැන්නක් පෙන්නුම් කෙරිණි.

## බතල

2011/12 මහ කන්නයේදී ආර 7ක් පරීක්ෂාවට ලක් කරනු ලැබූ අතර 2012 පැවති තත්ත්වයන් යටතේ වවුනියාව කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ මහ කන්නයේදී හෙක්ටයාරයකට ටොන් 30කට හා කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ හෙක්ටයාරයකට ටොන් 28කට වැඩිම අස්වැන්නක් මලයාසියානු ප්‍රභේදය මඟින් ලබාදුණි.

## මෑ

දිගු කරල් සහිත කෙටි කාලීන නව ආර 5ක් පරීක්ෂා ප්‍රභේද 2ක් සමඟ පරීක්ෂා කරනු ලැබීය. T 39 – 2 ප්‍රභේදය හෙක්ටයාරයකට ටොන් 6.2ක අස්වැන්නක් ලබාදුණි. එම අස්වැන්න පොලොං මෑ සහ හවරි මෑ යන පරීක්ෂණ ප්‍රභේද 2ට සාපේක්ෂව පිළිවෙලින් තුන් ගුණයකින් සහ දස ගුණයකින් ප්‍රමාණයකින් අස්වැන්න වැඩි විය.

## වී

**ප්‍රභේද අනුවර්තන අත්හදාබැලී, ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදාබැලීම්, බහු ස්ථානීය සහ තාක්ෂණික අනුවර්තන අත්හදා බැලීම.**

පරන්තන් වී පර්යේෂණ මධ්‍යස්ථානයේදී වවුනියාව කෘෂිකර්ම පර්යේෂණ ආයතනය සහ මුරුක්කන් කෘෂිකර්ම පර්යේෂණ ආයතනය සහ වර්ෂා පෝෂිත හා වාරිමාර්ග යන තත්ත්වයන් 2කම යටතේ මාස 2 ½ , 3 සහ 3 ½ යන වයස් කාණ්ඩයන්හි ප්‍රභේද පරීක්ෂාවට ලක් කෙරිණි.

2011/2012 මහ කන්න යේදී මාස 2 ½ , 2-3 , 3 ¼ , 4 – 4 ½ යන වයස් කාණ්ඩයන්හි ආර පරීක්ෂා කරනු ලැබූ අතර ප්‍රතිඵල, වී පර්යේෂණ සංවර්ධන ආයතනය, ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සම්බන්ධීකාරක වෙත වාර්තා කරනු ලැබීය. 2012 - යල කන්නයේ අත්හදා බැලීම් කාළගුණ හේතුවෙන් දැඩි ලෙස බලපෑමකට ලක් විය. මාස 2 ½ කාණ්ඩයේ පරීක්ෂා ප්‍රභේදය වන Bg 250 අනෙකුත් ප්‍රභේදයන්ට වඩා උසස් තත්ත්වයේ විය. මාස 3 වයස් කාණ්ඩයේ Ld 762 යන ආරය හෙක්ටයාරයකට ටොන් 6.41ක වැඩිම අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි. මාස 3 වයස් කාණ්ඩයේ At 08-593 ප්‍රභේදය වැඩිම අස්වැන්නක් ලබාදුණි. මාස 3 ½ වයස් කාණ්ඩයේ 08 - 1258 ප්‍රභේදය හෙක්ටයාරයකට ටොන් 6.36ක වැඩිම අස්වැන්නක් දුන් අතර මාස 4 – 4 ½ වයස් කාණ්ඩයේ 10- 551, Bg 08 -1009 ප්‍රභේද හෙක්ටයාරයකට ටොන් 7කට වැඩි අස්වැන්නක් ප්‍රතිඵල කෙරිණි.

## ශාක සංරක්ෂණය

**මුං - කරල් විදින්නා කළමනාකරණය**

මුං වල කරල් විදින්නා පාලනය කිරීම උදෙසා මායිම් බෝග 4ක් පරීක්ෂා කරනු ලැබූ අතර එහිදී එඬරු ඵලදායී ලෙස ක්‍රියා කෙරිණි.

**යාපනය දිස්ත්‍රික්කයේ තාපයට ඔරොත්තු දෙන්නා වූ ප්‍රභේදයන්හි රෝග ඇගයීම**

"අර්නෝවා", "ගෝල්ඩන් ස්ටාර්", AIDA, ඇට්ලස් කාල්වයිට්, ''රෙඩ් ලසෝදා'' YP – 03 – 107, "රොසානා" වන අර්තාපල් ප්‍රභේද පරීක්ෂා කරනු ලැබීය.

"කලාවයිට්" සහ "රෙඩ් ලැසෝදා" ප්‍රභේදයන්හි පසු අංගමාරය රෝගය අවම තත්ත්වයේ විය.

**කාබනික පෙහොර යොදාගැනිම මඟින් ලූනු රෝගය කළමනාකරණය**

කුකුල් පොහාර, එළු පොහොර, ගොම පොහොර, ග්ලිරිසීඩියා පත්‍ර සහ ආකබනික දිලීර නාශකයක් හෝමායි පාලන ප්‍රතිකර්ම සමඟ පරීක්ෂා කරනු ලැබිණි. බල්බ වලට රෝගයන්ගෙන් ඇති වූ බලපෑම ඉතා අවම වූ අතර කුකුල් පොහොර යෙදීම මඟින් අලෙවි කර ගත හැකි වැඩිම අස්වැන්නක් ලැබිණි.

**ලූනු වල ඇතිවන රෝගයට එරෙහිව කාබනික කෘමිනාශකයන් ඇගයීම**

කොහොඹ බීජ ජල නිස්සාරකය, සුදුළුනු යුෂ, ග්ලිරිසීඩියා පත්‍ර සහ රසායනික ක්ලොරොතලොනිල්, පාලන ප්‍රතිකර්මක සමඟ පරීක්ෂා කරනු ලැබිණි. බල්බයන් හට රෝග වලsන් සිදු වන බලපෑම අවම තත්ත්වයේ වූ අතර ක්ලොරොතලොනිල් යෙදීම මගින් අලෙවි කරගත හැකි. වැඩිම අස්වැන්නක් ලැබුණු නමුත් ප්‍රතිකර්මයන් අතර පැහැදිලි වෙනස්කම් දක්නට නොවිය.

**බල්බ කුණුවීම කලමනාකරණය සඳහා දිලීරනාශක සහ බල්බයන් සඳහා යොදන ප්‍රතිකර්ම කාලයෙහි බලපෑම**

"කැප්ටන්", "තිරාම්", "ෆ්ලුසිනාම්", "තියොෆ", "නේට්නිමෙතිල්" 50% සහ

“තිරාම්” 30% WP ටිබුකොනාසෝල් 250 ml/l යන දිලීර නාශක සහ මිනිත්තු 30, පැය 1, පැය 3, පැය 6 සහ පැය 24 යන කාලයන්හි බල්බ ප්‍රතිකර්ම කිරීම මඟින් පාලනය සඳහා පරීක්ෂා කරනු ලැබීය. මෙතිල් 50% සහ තිරාම් 30% WP මිනිත්තු 30ක ප්‍රතිකර්ම මගින් අවම බල්බ කුණුවීමක් නිරීක්ෂණය කරනු ලැබීය. පරීක්ෂණ අඛණ්ඩව සිදු වේ.

**කරවිල කහපැහැ ගැන්වීම පාලනය**

කුකුල් පොහොර, කොම්පෝස්ට්, රෙකොම් NPK රෙකොම් PR, N - ඇමෝනියම් සල්ෆේට්, රෙකොම් NPK සහ වැලකට පාදයට $MgSo_4$ 50g, 2 & 4 WAP යෙදීම මඟින් පාලකයන් සමඟ පරීක්ෂා කරනු ලැබිණි.

නිර්දේශිත NPK සහ වැලකට පාදයට 50g $MgSo_4$ සහ 2 & 4 WAP, හෙක්ටයාරයකට ටොන් 13.5ක වැඩිම අස්වැන්නක් ලබාදුන් අතර පත්‍ර කහපැහැ ගැන්වීම පමා කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

## බීජ නිෂ්පාදනය

ඌන උපයෝගිත බෝග වල පහත බීජ ප්‍රමාණයන් නිෂ්පාදනය කෙරිණි.

**වගුව 1.1.3.2: 2012 වර්ෂයේ බීජ නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය |
|---|---|---|
| බඩඉරිඟු | රුවන් | 250 kg |
| කුරක්කන් | ඕෂද | 300 kg |
| මුං | M 16 | 65 kg |
| මිරිස් | Mi Green | 1100 kg (කරල්) |

## අභිජනන බීජ නිෂ්පාදනය

අභිජනනන බීජ පහත ප්‍රමාණයන්ගෙන් නිෂ්පාදනය කරනු ලැබිණි.

**වගුව 1.1.3.3 : 2012 වර්ෂයේ අභිජනන බීජ නිෂ්පාදනය**

| බෝගය | ප්‍රභේදය | ප්‍රමාණය |
|---|---|---|
| කරවිල | තිරුනෙල්වේලි සුදු | 106.6Kg |
| | තිරුනෙල්වේලි දිගු | 6 Kg |
| බටු | තිරුනෙල්වේලි දම් | 2 Kg |

**පාංශු හා ජල කළමනාකරණය**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ලවණතාවට බලපෑ ප්‍රදේශයන්ගෙන් එකතු කර ගත් පස් සාම්පල් දිස්ත්‍රික්කයේ ලවණතා තත්ත්වය හඳුනාගැනීම උදෙසා පරීක්ෂා කරනු ලැබීය.

කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ පාංශු පැතිකඩ තෙතමන අධ්‍යනය සිදුකරනු ලැබීය. යල කන්නයේදී රතු කහ ලැටසෝල් පස සඳහා ජලය ලබාදිය යුතු පරාසය දින 9-10 බව ස්ථිර කරනු ලැබිණි. වව්නියා දිස්ත්‍රික්කයේ දුරස්ථ සංවේදක උපයෝගිකරගෙන පාංශු තෙතමනය අධ්‍යයන සිදු කරනු ලැබූ අතර එමඟින් වවුනියාව දිස්ත්‍රික්කයේ පාංශු තෙතමන ප්‍රමාණය ලබා ගත හැකි බව හඳුනාගනු ලැබිණි.

තෘණභූමි හා බෝග වගා කිරීම පිණිස නිර්දේශයන් යෝජනා කිරීම උදෙසා කිලිනොච්චි අරවියල්නගර්ගි පාංශු සාම්පල විශ්ලේෂණය කරනු ලැබිණි.

පාංශු සාම්පල 555ක් ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය යටතේ සහ ගොවි ක්ෂේත්‍ර සාම්පල පරීක්ෂා කිරීම යටතේ පරීක්ෂා කරනු ලැබිණි.

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ ළිං වලින් සහ කිලිනොච්චි මුලතිව් සහ වවුනියා ගොවි ළිං වලින් ජල සාම්පල 20ක් විශ්ලේෂණය කරනු ලැබූ අතර ගොවීන් හට සිදුකල යුතු පිළියම් සම්බන්ධ උපදෙස් ලබා දුණි.

**වව්නියාව කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය**

කුකුබිට්සේ කුලයේ බෝග සඳහා ජලය අවශ්‍යතාව අවමයෙන් උපයෝගී කරගෙන ජලය ඉතිරිකිරීමේ ක්‍රමයෙහි අවසාන පියවරට පැමිණ තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම මූලික පාංශු සාරවත් බව මිනුම් ගත කිරීමේ වැඩසටහනට සහ ස්වභාවික සම්පත් කළමනාකරන මධ්‍යස්ථානය වවුනියාව කොට්ඨාශයේ භූගත ජල අධ්‍යනයට ද සහභාගී විය.

**මිරිස්වල ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමය**

ග්ලිරිසිඩියා එක පෙළකට වගා කර එම ග්ලිරිසිඩියා වගාවට යටින් අමු මිරිස් වගා කරනු ලැබ ග්ලිරිසීඩියා කොල පොහොර හෙක්ටයාරයකට ටොන් 25, 18.75හා 12.5ක් සහ අකාබනික පොහොර 50% 75%ක් යොදනු ලැබීය. නිර්දේශිත අකාබනික පොහොර 50% සිට 75%ක් කොළ පොහොර 50% සිට 75% දක්වා ප්‍රමාණයකින් යොදා ප්‍රතිකර්ම මගින් උචිත වර්ධන පරාමිතීන් සමග වැඩි කරල් අස්වැන්නක් ලැබිණි.

**කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය**

කොම්පෝස්ට් ටොන් 20ක් නිෂ්පාදනය කර 10Kg බැගින් වූ සෑම බෑගයක්ම ආමුකුලනය කළ කොම්පෝස්ට් බෑග් යාපනය අර්ධද්වීපයේ ගොවීන් අතර නොමිලේ බෙදා දුණි. 30%ක් වූ කොම්පෝසට් ප්‍රමාණයක් පර්යේෂණ කටයුතු සඳහා යොදා ගනු ලැබූ අතර 200 Kgක් “සන්හෙම්ප්” බීජ නිෂ්පාදනය කෙරිණි.

කො ළ පොහොර හා කොම්පෝට් නිෂ්පාදනය උදෙසා ග්ලිරිසිඩියා සහ ඉපිල් ඉපිල් වගාවන් ස්ථාපිත කෙරිණි.

**පස් සහ ජල සාම්පල පරීක්ෂා කිරීම**

ලවණතාවයට බලපෑ ප්‍රදේශවල පාංශු හා ජල සාම්පල එක් රැස් කොට PH අගය විද්‍යුත් සන්නායකතාවය උදෙසා පරීක්ෂා කරනු ලැබිණි. එම ලවණතා මට්ටම්වලට අනුකූලව ගොවින් හට උචිත ප්‍රතිකර්ම ලබාදෙන ලදී. පසෙහි සාරවත් බව ඇගයීම උදෙසා ගොවිජන සේවා මට්ටමෙන් පස් සාම්පල පරීක්ෂා කරනු ලැබීය වඩ්ඩකච්චේරි ගොවීන්ගේ ක්ෂෙත්‍රයන්හි නල ලිං හා කිලිනොච්චි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන වාරික්‍රමය උදෙසා යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට ජල සාම්පල් විශ්ලේෂණය සිදු කරන ලදී.

**පළතුරු ජනකප්ලාස්ම නඩත්තු කිරීම**

අඹ (විලාඩ් 3, කර්තකොලොම්බ 3) කොස් 14 (දේශීය එකතුන්), කෙසෙල් 20 (කතාලි, කප්පාල්, මොන්තාන්, ඇම්බන්(අළු හා කොළ), ඉත්තාරයි , කැවන්ඩිශ් දෙහි ( දේශීය), පැණි දොඩම් (බිබිල), දෙළුම් (මෘදු බීජ ප්‍රභේදය නිමාලි, තායා)

දෙළුම් බීජ පැල 500ක් නිෂ්පාදනය කර කිලිනොච්චි ප්‍රදේශයේ පදිංචි කළ ගොවීන්හට නිකුත් කිරීම උදෙසා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත බාරදෙනු ලැබිණි.

**උපදේශක සේවාව**

යාපනය විශ්ව විද්‍යාලයේ දූරස්ථ සංවේදනය උදෙසා බාහිර කතිකාචර්යවරයෙකු ලෙස කටයුතු කිරීම.

පාංශු සහ ජල කළමනාකරණය පිළිබඳ සම්පත් දායකයෙකු ලෙස සේවාලංකා සහ ඔක්සිෆම් ජීබී (Oxfam GB) ආයතන සඳහා සහභාගී විය.

ඔක්ස්ෆම් ජීබී වැඩසටහන යටතේ ගොවීන් සමඟ අනෙතුක් මාධ්‍ය ස්ථානවල ක්ෂෙත්‍ර චාරිකා සඳහා සහභාගී වීම.

පාංශු සාම්පල සහ පාංශු පරීක්ෂණ වාර්තා නිර්දේශයන් සඳහා අර්ථ නිරූපණය පිළිබඳ පුහුණුව

ගොවි ක්ෂේත්‍ර පාසල්හිදී පාංශු සාම්පල පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

**ප්‍රදර්ශන**

ඔඩ්ඩිකුඩ්ඩාන් මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රදර්ශනයක් පවත්වනු ලැබීය.

## 2013 වසර සැලැස්ම

- බලාපොරොත්තු තැබිය හැකි සෝයා බෝංචි ආර සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- රටකජු ජනකප්ලාස්ම වරණය සහ නුමුහුම්බව පිළිබඳ ඇගයීම
- බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආරවල බීජ ගුණනය
- බලාපොරොත්තු තැබිය හැකි රටකජු අභිජනන ආර සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- මෑ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- බටු ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- මාළු මිරිස් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- තක්කාලි ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- තම්පලා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- බණ්ඩක්කා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- අඹ ප්‍රභේද නඩත්තු කිරීම
- පැපොල් දෙමුහුම් ඇගයීම
- කොළ කොඩවීමේ සංකූලතාවය සහ මිරිස් අස්වැන්න සඳහා ක්ෂුද්‍ර කාලගුණයෙහි බලපෑම
- *Calotrophis* පත්‍ර උපයෝගී කොට වී ශාකයේ කොළ හකුලන දළඹුවා පාලනය
- ගොවි ක්ෂේත්‍ර වල ඒකාබද්ධ පළිබෝධ කලමනාකරණය තුළින් වී පිටි මකුණා පාලනය
- වල්නාශක වල ප්‍රතිරෝධි *Cyperus iria* ඇගයීම
- අඛණ්ඩව ජල සැපයුම සිදු නොකර කඩින්කඩ ජලය සපයන්නා වූ වී ආර ඇගයීම
- ආදර්ශ ක්‍රමෝපායන් උපයෝගී කොට පාංශු තෙතමන පැතිකඩ අධ්‍යයනය
- භූමි මතුපිට උෂ්ණත්වය තාවකාලිකව වෙනස්වීම
- මතුපිට පාංශු තෙතමනය අධ්‍යයනය
- සරුබව සහ ගුණාත්මක බව උදෙසා පාංශු සාම්පල පරීක්ෂා කිරීම
- ජලයේ ගුණාත්මක බව විශ්ලේෂණ
- අවසරලත් බෝගවල අභිජනන බීජ නිෂ්පාදනය
- මිරිස් බෝග ප්‍රවර්ධනය
- රතු ලූනු බෝග ප්‍රවර්ධනය

## කාර්ය මණ්ඩලය

**කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය කිලිනොච්චිය**

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂන නිලධාරි | 03 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 01 |
| පර්යේෂණ උපසහකාර | 01 |
| මුරකරු | 01 |
| කම්කරු (ස්ථිර) | 26 |
| **කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය තිරුනෙල්වේලි** | |
| ස්ථානභාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 03 |
| පර්යේෂණ උපසහකාර | 01 |
| මුරකරු | 01 |
| පොම්ප ක්‍රියාකරු | 01 |
| කම්කරු (ස්ථිර) | 07 |
| **කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය වවුනියාව** | |
| ස්ථානභාර පර්යේෂණ නිලධාරී | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| පර්යේෂණ උපසහකාර | 01 |
| **වී පර්යේෂණ ආයතනය පරන්තන්** | |
| පර්යේෂණ සහකාර | 01 |
| කම්කරු (ස්ථිර) | 01 |
| **කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය මුරුක්කන්** | |
| පර්යේෂණ සහකාර | 01 |
| කම්කරු (ස්ථිර) | 06 |
| **එකතුව** | **67** |

# 1.2 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය

පර්යේෂණ සහ සංවර්ධනය තුළින් ජාතික වශයෙන් උද්‍යාන බෝග නිෂ්පාදනය පුළුල් කිරීමේ වගකීම උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයට පැවරේ. ආයතනය එළවළු බෝග, පළතුරු, බිම්මල්, මුල් හා ආකන්ධ බෝග සහ මල් වගාව පිළිබඳව පර්යේෂණ හා සංවර්ධනයන් සම්බන්ධව කටයුතු කෙරේ. ආයතනය පර්යේෂණ වැඩසටහන්හිදී ස්වකීය අවධානය ප්‍රධාන වශයෙන් උද්‍යාන බෝග ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම, ශාක කළමනාකරණය සහ පළිබෝධ සහ රෝග කළමනාකරණය ඇතුලු වැඩිදියුණුකළ බෝග කළමනාකරණ ක්‍රමොපෝයන් පිළිබඳව යොමු කරයි. මෙයට අමතරව ආයතනය අවධානය යොමු කරන්නා වූ අනෙකුත් කාර්යයන් වන්නේ පසු අස්වනු තාක්ෂණය, ආහාර සැකසුම් ක්‍රමවේදයන්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ගෙවතු වගාවයි.

වඩාත් ඵලදායී, පරිසරීක හිතකාමී, තිරසාර, ආර්ථිකව සහ සමාජමය වශයෙන් වැදගත් ඉල්ලුමක් පවතින උද්‍යාන බෝග පිළිබඳව පර්යේෂණයක් බාරගනිමින් ඒ සම්බන්ධ වගකීම උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය දරනු ලබයි. පර්යේෂණයන් සම්බන්ධ මෙම වගකීම් වලට අමතරව ගොවීන්, විශ්ව විද්‍යාල සිසුන් සහ ඩිප්ලෝමා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පුහුණු කිරීම සම්බන්ධවද කටයුතු කෙරේ. ගොවි ප්‍රජාව සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත නව තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද ආයතනයේ වගකීමකි.

## අයවැය

**වගුව 1.2.1 : වාර්ෂික අයවැය - 2012**

| වැය ශිර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 22,102,908 | 18,377,145 | 83 |
| පුනරාවන්තන | 82,503,697 | 81,636,752 | 92 |
| **ව්‍යාපෘති** | | | |
| පළතුරු හා එළවළු දෙමුහුම් බීජ නිෂ්පාදනය | 5,000,000 | 3,901,305 | 78 |
| ANSOFT | 1,150,000 | 919,451 | 80 |
| ගොවිපල සංවර්ධනය | 25,285,600 | 25,059,194 | 99 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම | 19,153,000 | 14,034,066 | 73 |
| අන්තර් ජාතික කෘෂිකර්මාන්ත පිළිබඳ කොරියානු ව්‍යාපෘති (එළවළු වගාව) | 3,127,500 | 1,153,852 | 37 |
| අන්තර් ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ කොරියානු ව්‍යාපෘති (පොහොර කළමනාකරණය) | 2,510,000 | 904,515 | 36 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| පැළෑටි ජාන සම්පත් සඳහා සමෝධානික කළමනාකරණ පද්ධතිය | 1,698,019 | 597,480 | 35 |
| පටක රෝපණය | 27,500,000 | 27,495,000 | 100 |
| **එකතුව** | **190,030,724** | **146,583,760** | **77** |

# ප්‍රගතිය

## ව්‍යාපෘති

## එළවළු සහ පළතුරු දෙමුහුම් බීජ නිෂ්පාදනය

මෙම වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් ඉහළම ගුණාත්මක තත්ත්වයෙන් යුත් දෙමුහුම් එළවළු හා පළතුරු ප්‍රභේද වැඩිදියුණු කිරීම, නිර්දේශිත ප්‍රභේදයන්හි මවු ආර නඩත්තුව, දෙමුහුම් බීජ නිෂ්පාදනය යන කටයුතු සිදු කෙරේ. තක්කාලි, බටු, වැටකොළු, මාළුමිරිස්, පිපිඤ්ඤා, මෑ, කරවිල සහ පැපොල් යන එළවළු හා පළතුරු සඳහා ඉහත සඳහන් කාර්යයන් සිදු කෙරේ.

## ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම

මෙම ව්‍යාපෘතිය උදෙසා 2012 වසරට සම්පූර්ණ වශයෙන් රුපියල් මිලියන 9 ක ප්‍රතිපාදනයක් කරනු ලැබීය.

මෙම ව්‍යාපෘති මඟින් උද්‍යාන බෝග වල ඵලදායීතාවය ඉහළ දැමීම උදෙසා එළවළු, පළතුරු සහ මල් යන බෝගයන්හි නව ප්‍රභේදයන් වැඩිදියුණු කිරීමටත්, අර්තාපල් වල දැනට පවතින බීජ නිෂ්පාදන තාක්ෂණයන් වැඩිදියුණු කිරීමටත් පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් මාලාවක් සහ උචිත කෘෂි විද්‍යාත්මක සහ පෝෂක කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීමත් මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ.

## කාබනික ගොවිතැන් තාක්ෂණය සඳහා ආසියානු ජාල ව්‍යාපෘතිය

ආසියානු කලාපය තළ සාම්ප්‍රදායික සහ තිරසාර කුඩා කාබනික ගොවිපලවල් ප්‍රවර්ධනය මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ. මෙම කාබනික ගොවිතැන වඩාත් ශක්තිමත් කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය යටතේ කණ්ඩායමක් පිහිටවනු ලැබිණි. ගොවි ප්‍රජාව තුළ දැනටමත් පවතින්නාවූ කාබනික ගොවිතැන තාක්ෂණයන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම හා සම්පාදනය කිරීම එළවළු වල පෝෂක කළමනාකරණය සහ පළිබෝධ සහ රෝග කළමනාකරණය සම්බන්ධ නව තාක්ෂණයන් වැඩ දියුණු කිරීමේ කටයුතු දැනට කෙරෙමින් පවතී.

### ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය

තෝරාගත් පර්යේෂණ ගොවිපල/ ඒකකයන්හි ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම පර්යේෂණ ගොවිපල සහ ඒකකයන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා මෙම ගොවිපල සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරනු ලැබිණි. මෙහි පළමු අදියර යටතේ ගොවිපල / ඒකක 12ක් තෝරාගනු ලැබූ අතර මෙම තෝරාගත් ගොවිපලක වාරිමාර්ග පහසුකම් වැඩිකර ආරක්ෂිත වැටවල් සහ දැල් ගෘහයන් ඉදිකරනු

ලැබිණි. මෙයට අමතරව වගා නොකළ බිම් එළිකර වගා කරනු ලැබීය. එක් එක් ගොවිපලෙහි වැඩි දියුණු කළපහසුකම් සහ නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය සංක්ෂිප්ත විස්තරයක් පහත වගුව තුළ දැක්වේ.

**වගු අංක 1.2.2 : ගොවිපල සංවර්ධන ව්‍යාපෘතියෙහි ප්‍රගතිය**

| පර්යේෂණ ගොවිපල් / ඒකකය නම | සංවර්ධනය කළ යටිතල පහසුකම් | නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය |
|---|---|---|
| කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල | වැට ඉදිරිකිරීම සහ භූමි එළිපෙහෙළි කිරීම | බීජ පැල් පෝච්චි 8365 (පැණි දොඩම් සහ ජමනාරං) |
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, ගිරාදුරුකෝට්ටේ | දැනට පවතින වාරිමාර්ග පද්ධතීන් ප්‍රතිසංස්කරණය | |
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, කල්පිටිය | වාර්මාර්ග පද්ධති වැඩිදියුණු කිරීම, දැල් ගෘහ ඉදිකිරීම | මිදි වැල් 4900 දෙළුම් 13,870 |
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, එළුවන්කුලම | වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම සහ භූමි එළපෙහෙළි කිරීම, දැල් ගෘහ ඉදිකිරීම | අඹ මුල් ග්‍රාහක 35000 දෙහි පැල 100 |
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, රහන්ගල | | ජමනාරං (බද්ධ පැළ 2000) දොඩම් (බද්ධ පැළ 2000) පෙයාර්ස් (බද්ධ පැළ 900) |
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, මුතුකණ්ඩිය | ක්ෂේත්‍ර වාරිමාර්ග පද්ධතිය ඉදිකිරීම | දොඩම් (මුල් ග්‍රාහක 2000) දිවුල් (මුල් ග්‍රාහක 250) තුඹ කරවිල පෝච්චි වල සිටුවන ලද වැල් - 200 |
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, මඳුරුකැටිය | වාරිමාර්ග පද්ධතියක් ඉදිකිරීම | අඹ (බද්ධ පැළ) 375<br>දොඩම් 600<br>දිවුල් 200<br>තුඹ කරවිල 1200<br><u>බීජ පැළ</u><br>දෙහි පැළ 980<br>අඹරැල්ලා 70<br>කටු අනෝදා 100<br>අන්නාසි 400<br>දෙළුම් 75<br>(මුල් ග්‍රාහක) අඹ 1400<br>දොඩම් 1500<br>අඹ 265<br>දෙහි 657<br>දිවුල් 76<br>තුඹ කරවිල වැල් 80<br>වෙනත් 50 |

| පර්යේෂණ ගොවිපල් / ඒකකය නම | සංවර්ධනය කළ යටිතල පහසුකම් | නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය |
|---|---|---|
| කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය බිබිල | ආරක්ෂිත ගෘහ ඉදිකිරීම ක්ෂේත්‍ර වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීම | බද්ධ කළ දෙහි 1002<br>මුල් ග්‍රාහක 2500<br>බද්ධ කළ අඹ 485<br>දොඩම් (බිබිල පැණි දොඩම් 500) ජමනාරං (මධු 220) |
| කෘෂිකර්ම පර්යේෂණ ඒකකය එරමිණිගොල්ල | මල් පෝච්චි ඉදිකිරීම සහ භූමි සංවර්ධනය | බද්ධ රඹුටන් 1004<br>මුල් ග්‍රාහක 3000<br>බද්ධ කළ කොස්පැල 302<br>මුල් ග්‍රාහක 500 |
| උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ, අඹතැන්න | වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය; දැල් ගෘහ ඉදිකිරීම පැල ගෘහ ඉදිකිරීම | <u>බද්ධ පැල</u><br>(කොස් පැල 1000<br>දූරියන් 1000<br>කාමරංගා 750<br>පේර 500)<br><u>බීජ පැල</u><br>(කොස් පැල 1500)<br>දූරියන් 1000<br>කාමරංගා 500<br>පේර 1500<br>රඹුටන් 2000<br>වැල් දොඩම් 250<br>කතුරුමුරුංගා බීජ පැල 1500<br>ටංටින් 500<br>ජම්බු පැල 1000<br>මුල් ග්‍රාහක |
| උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල, උල්පොතගම | දැනට පවතින වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය, දැල් ගෘහ ඉදිකිරීම | බද්ධ අඹ 8962<br>මුල් ග්‍රාහක 6000<br>ලෙමන් 300<br>දොඩම් මුල් ග්‍රාහක 2500<br>අඹරැල්ලා 140 |

| පර්යේෂණ ගොවිපල් / ඒකකය නම | සංවර්ධනය කළ යටිතල පහසුකම් | නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය |
|---|---|---|
| උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල, පස්යාල | ආරක්ෂිත දැල් ගෘහ ඉදිකිරීම, වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම | බද්ධ රඹුටන් 7400<br>මුල් ග්‍රාහක 10,000<br>අඹ බද්ධ 300<br>මුල් ග්‍රාහක 600<br>ලෙමන් 500<br>අන්නාසි 1400<br>ජම්බු 25 |
| උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල, වල්පිට | වාරිමාර්ග පද්ධති ඉදිකිරීම, දැල් ගෘහ ප්‍රතිසංස්කරණය | රඹුටන් - බද්ධ - 10245<br>මුල් ග්‍රාහක 13000<br>අඹ - බද්ධ - 1352<br>මුල් ග්‍රාහක 2300<br>අලිපේර බද්ධ - 1186<br>දූරියන් - බද්ධ - 227)<br>වෙනත් - බද්ධ 190<br>මුල් ග්‍රාහක 500<br>දෙහි - 911 |
| උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල , වීරපාන | දැල් ගෘහ ඉදිකිරීම (30 x 80) මල් පෝච්චි ගෘහ ඉදි කිරීම | රඹුටන් බද්ධ 1445<br>මුල් ග්‍රාහක 3000<br>දූරියන් - බද්ධ 250<br>ගොරකා (මුල් ග්‍රාහක 10000 බද්ධ 2500)<br>මැංගුස් - බද්ධ 1400<br>ජමනාරං - බද්ධ 305<br>මුල් ග්‍රාහක 5000<br>ජම්බු - බද්ධ 250<br>මුල් ග්‍රාහක 1000<br>අඹ - බද්ධ 980<br>මුල් ග්‍රාහක 3000 |

## අන්තර්ජාතික කෘෂිකර්මාන්තය පිළිබඳ කොරියානු ව්‍යාපෘතිය

- **එළවළු වගා තාක්ෂණය**

සාම්ප්‍රදායික ලෙස එළවළු වගා කිරීමේ දිගු ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතු වන අතර වර්තමානයේ දේශීය වශයෙන් ප්‍රවර්ධනය කර දේශීය එළවළු ප්‍රභේද මෙන්ම ආනයනික එළවළු ප්‍රභේද ද වගා කෙරේ. කෙසේ වුවද ලබාගත හැකි අස්වැන්න ප්‍රමාණය සහ ගොවීන් ලබා ගන්නා අස්වැන්න අතර පැහැදිළි වෙනසක් දක්නට ලැබේ. වෙනත් රටවල අනුගමනය කරන වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හේතුවන ඉහළ තාක්ෂණය මෙම වෙනසට හේතුව බවත් දේශීය විද්‍යාඥයින් සහ ගොවීන් හට මෙම තාක්ෂණයන් ලබාදීම මෙම අස්වනු අතර වෙනස අවම කිරීම උදෙසා අනුගමනය කළ හැකි එක් ක්‍රමයකි. මෙම කොරියානු ව්‍යාපාතියෙහි එළවළු ව්‍යාපෘතිය මඟින් වැඩිදියුණු කළ එළවළු නිෂ්පාදන තාක්ෂණයන් සහ දේශීය වගාව උදෙසා කොරියානු එළවළු ප්‍රභේදයන්හි අනුවර්තනය වන එළවළු හඳුනාගැනීම පිළිබඳ නිරීක්ෂණයන් සහ පරීක්ෂණයන් සම්බන්ධයෙන් අවධානය යොමු කෙරේ. මෙයට අමතරව එළවළු නිෂ්පාදනය සහ තාක්ෂණය පිළිබඳව මානව සම්පත් හැකියාවන් ප්‍රවර්ධනය සහ එළවළු නිෂ්පාදනය පර්යේෂණයන් පිළිබඳව ශ්‍රී ලංකාව සහ කොරියාව අතර සහයෝගීතාවය වඩා ශක්තිමත් කිරිම මෙම ව්‍යාපෘතියන්හි අනෙකුත් ඉලක්කයන් වේ.

- **පොහොර කළමනාකරණය**

මෙම ව්‍යාපෘතිය යටතේ ආර්ථිකමය, ආරක්ෂාකාරී සහ පාරිසරික හිතකර පොහොර භාවිතය පිළිබඳව නිරීක්ෂණය කෙරේ. මෙම ව්‍යාපෘතිය මඟින් ක්ෂේත්‍රය තුළ පවතින පෝෂක උපයෝගී කර ගනිමින් අනවශ්‍ය ලෙස පොහොර භාවිතය වළක්වාලීම යන ගැටළුවලට පිළිතුරු සෙවීමට අපේක්ෂිතය. පොහොරවල ප්‍රධාන පෝෂක වර්ග පමණක් නොව ක්ෂුද්‍ර පෝෂක ද්‍රව්‍ය භාවිතය පිළිබඳව ව්‍යාපෘතිය මඟින් අවධානය යොමු කෙරේ. මෙයට අමතරව මානව සම්පත් හැකියාව වඩාත් ශක්තිමත් කරමින් රටවල් දෙක අතර සහයෝගීතාවය වැඩි කිරීම පිළිබඳව අවධානය යොමු කරයි.

- **පටක රෝපණය**

කෙසෙල්, අන්නාසි, ආර්තාපල් බීජ, ස්ට්‍රෝබෙරි සහ මල් බෝග වැනි උද්‍යාන බෝග වල රෝපණ ද්‍රව්‍යයන්හි ඉල්ලුම වැඩිවීම සපුරාලීම උදෙසා 2011 වර්ෂයේදී "පටක රෝපණ තාක්ෂණය තුළින් ආර්ථිකයට වැදගත් බෝගයන්හි ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය" පිළිබඳ වූ ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය යටතේ පටක රෝපණ පරීක්ෂණාගාර සඳහා පහසුකම් සපයනු ලැබූ අතර නිෂ්පාදනය දස ගුණයකින් වැඩි කිරීම උදෙසා පරීක්ෂණාගාරය ප්‍රතිසංස්කරණය කරනු ලැබීය. දැල් ගෘහයන් සහ ආරක්ෂිත ගෘහයන් ඇතුලුව වෙනත් යටිතල පහසුකම් වැඩි දියුණු කරනු ලැබීය.

## එළවළු අංශය

පළිබෝධ සඳහා වූ ප්‍රතිරෝධීබව තහවුරු කරමින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සහ වැඩි අස්වැන්නක් ලබා දෙන අභිජනන එළවළු ප්‍රභේදයන් පිළිබඳව ආයතනයේ එළවළු අංශය ප්‍රධාන වශයෙන් කටයුතු කෙරේ. එළවළු දෙමුහුම් සංවර්ධනයට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදුන්නද විවෘත පරාගන ප්‍රභේදයන් වැඩිදියුණු කිරීමද නොසලකා හැර නොමැත. අවශ්‍ය පරිදි එළවළු වර්ගයන්හි කෘෂි විද්‍යාත්මක අධ්‍යයනයන්ද සිදු කරනු ලබයි. විවිධ ක්‍රම මඟින් තාක්ෂණය ව්‍යාප්ත කිරීමට අමතරව මූලික බීජ වර්ග නිෂ්පාදනයද මෙම සංවර්ධන කටයුතු වලට ඇතුලත් වේ.

### මෑ

- විවිධ වූ පර්යේෂණ පරිසරයන්ට යටත්ව දේශීයව වැඩිදියුණු කළ විවෘත පරාගණ ආර 5ක් භූමියේ ස්ථායීතාවය පිළිබඳව අගයන ලදී. මෙම ආර අතරින් ආර 4ක් වැඩි අස්වැන්නක් (ශාකයකට ග්‍රෑම් 790 - 867) ලබාදෙමින් ක්ෂේත්‍රයේහිදී කඳ පාමුල කුණුවීමට ප්‍රතිරෝධී ඉක්මනින් මල් හට ගන්නා වූ සහ කරල් ඇතිවන ඉතාමත් හොඳ තත්ත්වයේ ආහාරයට ගත හැකි ප්‍රභේදයකි. ඉදිරියේදී එන වගා කන්නවලදී විවිධ කෘෂි පාරිසරික කලාපයන් යටතේ පරීක්ෂණ සහ අනුවර්තනයන් පිළිබඳ පරීක්ෂණ සිදු කෙරේ.

- විවෘත පරාගන මෑ ප්‍රභේද 4ක් ඒවායෙහි අස්වැන්න සහ ගුණාත්මක බව පදනම් කොට වැඩි අස්වැන්නක් සහ කඳ පාමුල කුණු වීම රෝගයට ප්‍රතිරෝධී බවක් පෙන්වන ප්‍රභේද තවදුරටත් ඇගයීම උදෙසා තෝරාගනු ලැබිණි.

### වැටකොළු

බලාපෙරොත්තු තැබිය හැකි දෙමුහුම් ආරයක් සහ විවෘත පරාගන ප්‍රභේදයක් හඳුනාගනු ලැබිණි.

### බෝංචි සහ දඹල

බෝංචි ප්‍රභේදයක් නිකුත් කරනු ලැබිණි. හෙක්ටයාරයට ටොන් 28ක අස්වැන්නක් ලබා ගැනීමේ හැකියාව ඇති "හෝර්ඩි ග්‍රීන්" ප්‍රභේදය ගොවීන් සඳහා වගාවට නිදහස් කරනු ලැබිණි.

### මෑ

"ගන්නොරුව හවරි මෑ" වගාවට නිදහස් කරනු ලැබිණි. හෙක්ටයාරයකට ටොන් 30ක අස්වැන්න ලබාදීමේ හැකියාව සහිත ඉක්මනින් අස්වැන්න නෙලිය හැකි ප්‍රභේදයකි.

### බටු

ඉහළ අස්වැන්නක් ලබා දෙන "ලේන ඉරි" බටු දෙමුහුම් ගොවීන් හට නිදහස් කිරීම සඳහා නම් කර ඇති අතර "ලේන ඉරි I" නම යටතේ දෙමුහුම් නිකුත් කරනු ලැබිණි. අනුවර්තන යෝග්‍යතා අධ්‍යයනය සඳහා දෙමුහුම් 3ක් තෝරා ගැනිණි.

### තක්කාලි

අස්වැන්න පිළිබඳව සොයා ලැබීම උදෙසා විදේශීය තක්කාලි ප්‍රභේද 18ක් පරීක්ෂා කරනු ලැබිණි. තවදුරටත් අධ්‍යයනය උදෙසා ආර 14ක් තෝරා ගැනිණි. මෑතකලදී නිකුත් කළ "ලංකා චෙරි" තක්කාලි ප්‍රභේද බීජ ගුණනය කර ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නා වූ ගොවීන් අතර බෙදා දුණි. මෙයට අමතරව තවදුරටත් ගුණනය සඳහා අභිජනන බීජ ලෙස බීජ නිකුත් කෙරිණි.

- මෑතකදී නිකුත් කළ "ලංකා චෙරි" තක්කාලි ප්‍ර භේදයේ බීජ ගුණනය කර ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නා වූ ගොවීන් අතර බෙදා දුණි. මෙය අමතරව තවදුරටත් ගුණනය සඳහා අභිජනන බීජ ලෙස බීජ නිකුත් කෙරිණි.

- බලාපොරොත්තු තැබිය හැකි HF 3 දෙමුහුම් ප්‍රභේදය සහ බලාපොරොත්තු තැබිය විකෘති ප්‍රභේදය M 127, හි අනුවර්ති බව තහවුරු කර ගැනීම උදෙසා පරීක්ෂණයන් පැවැත්වීමට භාර ගනු ලැබිණි.

- TM 701, $F_1$ 15043, star 9062 සහ star 9064 යන විදේශීය තක්කාලි ප්‍රභේද වාණිජමය හඳුන්වාදීම උදෙසා පිළිගත හැකි බව හඳුනා ගනු ලැබිණි. බලාපොරොත්තු තබාගත් වෙනත් ප්‍රභේද 2ක් ක්ෂේත්‍ර පරීක්ෂණ අනුව වාණිජමය ආනයනය සඳහා යෝග්‍ය නොවන බව සලකනු ලැබිණි.

- ඉහළ අස්වැන්න, පළිබෝධකයින් සඳහා ප්‍රතිරෝධීබව, රෝග සහ පිළිගත හැකි පළතුරු ගුණාංගයන්ගෙන් යුතු උසස් නුමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරිම උදෙසා වෙන්කර තැබූ පරම්පරා හතරක ආර තුළම සහ ආර අතර වරණය සිදු කරනු ලැබිණි.

## මාළුමිරිස්

- නව $F_1$දෙමුහුම් (1782 x HYW) අඛණ්ඩව වැඩි අස්වැන්නක් පෙන්නුම් කෙරිණි.
- අනුවර්තිතාව සත්‍යාක්ෂණය උදෙසා HCAI බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ප්‍රභේදයෙහි තවදුරටත් පරීක්ෂණයන් සඳහා බාර ගැනිණි.
- 21348, HP210, FST403 සහ "ජැලපිනො" වර්ගයේ පර්ෆෙක්ටෝ සහ මැග්ෆෙසියෝ යන විදේශීය මාළුමිරිස් ප්‍රභේදයන්හි ඇගයීම් වලට අනුකූලව වාණිජ්‍යමය හඳුන්වාදීම් උදෙසා පිළිගතහැකි බව හඳුනාගනු ලැබිණි. බලාපොරොත්තු තැබූ වෙනත් ප්‍රභේද 5ක් ක්ෂේත්‍ර පරීක්ෂා සඳහා වාණිජමය වශයෙන් ආනයනයට උචිත නොවන බව සලකනු ලැබීය.

## පිපිඤ්ඤා

- HORDI Green F1 යන දෙමුහුම් පිපිඤ්ඤා ප්‍රභේදය (ක්‍රිස්පි රසැති, පිටපොත්ත කොළ පැහැ සහ ඒකාකාරී හැඩයකින් යුත්) ගොවීන්හට වගාව සඳහා නිකුත් කෙරිණි. සලාද සහ ව්‍යංජන සැකසීම උදෙසා මෙම ප්‍රභේදය යොදා ගනු ලැබිණි.

- වැඩි අස්වැන්නක් සහ හොඳ පෙනුමකින් යුත් $F_1$වෙනත් පිපිඤ්ඤා දෙමුහුම් ප්‍රභේද විශේෂත්වය ඒකාත්මිකතාව සහ ස්ථායීතාව සම්බන්ධ පරීක්ෂණ අවධියේ ඇති අතර වගාව සඳහා නිදහස් කිරීමට නියමිතය.

## කරවිල

- වැඩිදියුණු කළ කරවිල දෙමුහුම් ප්‍රභේදය වර්තමානයේ පරීක්ෂණ වල අවසන් අදියරේ පවතී. දෙමුහුම් ප්‍රභේද 2ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම් මට්ටමේ පවතින අතර තවත් එක් ප්‍රභේදයක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පරීක්ෂණ සඳහා නම් කරනු ලැබ ඇත.

## පළතුරු සහ පටක රෝපණ අංශය

මෙම අංශය මඟින් පළතුරු බෝගයන්හි ඵලදායීතාවය සහ නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා නලස්ථ ප්‍රචාරණයට අවශ්‍ය ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සහ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් බාරව කටයුතු කෙරේ. මෙහිදි පර්යේෂණයන් ප්‍රධාන වශයෙන් උසස් ගුණාත්මක තත්ත්වයෙන් සහ වැඩි අස්වැන්නක් ලබාදෙන පළිබෝධ සහ රෝගයන්හට ප්‍රතිරෝධී පළතුරු බෝග වැඩිදියුණු කිරිම පිළිබඳව අවධානය යොමුකෙරේ. මෙයට අමතරව මෙම අංශය, පළතුරු බෝගයන්හි ඵලදායීතාවය වැඩි කිරීමට ද ස්වකීය අවධානය යොමු කරන අතර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, යටිතල පහසුකම් සංවර්ධනය තුළින් පර්යේෂණ ගොවිපලහි නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම, යන කටයුතු ද මෙම සංවර්ධන කාර්යයන්ට ඇතුලත් වේ. මෙහා සමගාමීව විවිධ ක්‍රම උපයෝගී කොට තාක්ෂණයන් ව්‍යාප්ත කිරීමේ කටයුතු ද ඉටුකරයි.

## කෙසෙල්

ඉහළ අස්වැන්න, වැඩි ගුණාත්මකබව සහ "පැනමා" රෝගයට ප්‍රතිරෝධීබව උදෙසා බලාපොරොත්තු තැබිය හැකි සීනි කෙසෙල් එකතූන් 3ක් සමඟ වෙනත් කෙසෙල් එකතූන් අගයනු ලැබීය. ඇඹුල් කෙසෙල් එකතූන් එකක් සහ සීනි කෙසෙල් එකතූන් එකක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන යටතේ ඇගයීමට ඇතුලත්

කරනු ලැබ ඇත. කඳ අග්‍ර රෝපණ වැඩසටහන සමඟ කෙසෙල් විකෘති අභිජනන වැඩසටහන ආරම්භ කරනු ලැබීය. පැනමා රෝගයට ප්‍රතිරෝධීතාවය පිළිබඳ අධ්‍යයනය සිදු කෙරෙමින් පවතී. මෙයට අමතරව වසර තුළදී ඇඹිබන් එකතූන් 37ක් අගයනු ලැබීය. කෙසෙල් සඳහා සැලසුම් කළ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලැබීය.

### පැපොල්

යෝග්‍ය නුමුහුම් පැපොල් ප්‍රභේද ගහනයක් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව පැපොල් ආර 12 ක ප්‍රවර්ධන කටයුතු සිදු කරනු ලැබීය.

පැපොල් දෙමුහුම් බීජ නිෂ්පාදනය සඳහා වියළි, අතරමැදි සහ තෙත් කලාපයන් හි ස්ථාන 4ක ඇගයීමේ වැඩසටහන් ආරම්භ කරනු ලැබිණි.

### දෙහි

දේශීය සහ විදේශීය ප්‍රභේද 15ක් අගයනු ලැබිණි. විදේශීය ප්‍රභේද 3ක් සහ දේශීය වරණයන් 1ක් තවදුරටත් ඇගයීම උදෙසා තෝරා ගැනිණි. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය අඛණ්ඩව සිදුවේ.

### දූරියන්

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් ව්‍යාපෘතිය යටතේ දූරියන් ප්‍රභේද ඇගයීම අඛණ්ඩව සිදු කෙරිණි. එකතූන් 14ක් අගයනු ලැබිණි. එකතූන් 5ක වර්ධක කොටස් ලක්ෂණීකරණ සිදු කෙරිණි. එකතූන් 6ක මල්හට ගැනුණු අතර වඩාත් හොඳ පළතුරු ලබාගැනීම උදෙසා වඩාත් උචිත මුහුම්කිරීම හඳුනා ගැනීමට විවිධ මුහුම් 7ක් සිදු කෙරිණි. මුහුම් 3ක පළතුරු වල ගුණාත්මක තත්ත්වය පිළිබඳ දත්ත වාර්තා කරනු ලැබූ අතර ඇගයීම් කටයුතු අඛණ්ඩව සිදු වේ.

### උගුරැස්ස

වසර තුළදී එකතූන් ඇගයීම අඛණ්ඩව සිදු කෙරිණි. එකතූන් 1ක් වසර තුළදී ගෙඩි ලබාදුන් අතර අනෙක් එකතූන්හි මල් හට ගැනීම තවමත් ආරම්භ වී නොමැත. ඇගයීම අඛණ්ඩව සිදු වෙමින් පවතී.

### අඹ

විදේශීය සහ දේශීය අඹ වරණයන් අගයනු ලැබීය. වරණයන් 8ක් සාර්ථක වූ අතර ඇගයීම අඛණ්ඩව සිදු වේ.

උල්පතගම පර්යේෂණ ගොවිපලේදී මුල් ග්‍රාහක සහ අන්තර්ග්‍රාහක අඹ ප්‍රභේදයන්හි විවිධ සංයෝජන අගයනු ලබමින් තිබේ. එම ප්‍රභේදයන්හි වර්ධක හැසිරීම් අනුව දත්ත එකතු කරනු ලැබිණි. සමහර ශාක පළමු එල දැරීමේදී ගෙඩි කිහිපයක් සැදුණි. අධ්‍යයනයන් අඛණ්ඩව සිදුවේ.

### ඩ්‍රැගන් ෆෲට්

රතු සහ සුදු මාංශල සහිත ඩ්‍රැගන් ෆෲට් පැල එක් එක් කණුවකදී ඇගයීම් ආරම්භ කරනු ලැබිණි. වසර තුළදී සමහර ශාක වල මල් හට ගැනිණි. වර්ධනය සහ අස්වැන්න පිළිබඳව වාර්තා කළ අතර ඇගයීම අඛණ්ඩව සිදු කෙරිණි.

## පටක රෝපණය

### කෙසෙල්

නලස්ථ ප්‍රචාරණ තාක්ෂණය යටතේ සාර්ථකව කෝලිකුට්ටු කෙසෙල් ගුණනය කළ හැක. පරණ ශාක වල කඳ අග්‍රවලින් 500ක් පමණ වන කුඩා පැළ නිෂ්පාදනය කරනු ලැබිය හැක. විවිධ ජානවර්ග සහිත විවිධ කෝලිකුට්ටු ප්‍රභේද වෙනස් ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීය. දැනට නිර්දේශීත ප්‍රභේදය වන "අග්‍රා"නලස්ථව ගුණනය සඳහා එතරම් හොඳින් ප්‍රතිචාර නොදැක්වීය. "අග්‍රා"ප්‍රභේදයේ ගුණන

වේගය වැඩිකිරීම උදෙසා පරීක්ෂණ අඛණ්ඩව පැවැත්වේ.

## මිදි

"තොම්සන්" නැමති බීජ රහිත මිදි ප්‍රභේදය නලස්ථ ප්‍රචාරණය සඳහා සාර්ථකව හඳුන්වාදිය හැක. කඳ අග්‍රය සහ මෘදු අන්තර් පර්ව කැපුම් මුල් රෝපණ ද්‍රව්‍ය ලෙස යොදා ගනු ලැබිය හැකි අතර සාමාන්‍යයෙන් සති 2ක් වන උපරෝපණ චක්‍රයක් තුළ පැල 4ක් ගුණනය කළ හැක. දෘඩ කිරීමේ ක්‍රියාවලිය සහ ක්ෂේත්‍ර ඇගයීම සඳහා පැළෑටි හඳුන්වා දී තිබේ. "සොනාටා" යන බීජ රහිත අනෙක් ප්‍රභේදය සාර්ථක ලෙස ගුණනය වන අතර මුල් ඇතිවන කලාපය ප්‍රවර්ධනය උදෙසා අඛණ්ඩව පරීක්ෂණ පැවැත්වේ.

## පටක රෝපණ පැළෑටි වල ක්ෂෙත්‍ර ඇගයීම

පටක රෝපිත කෙසෙල් ප්‍රභේදය (නේත්‍රපලම්) ඇගයීම සඳහා ක්ෂෙත්‍රය තුළ සිටුවා ඇත. ආර්ථිකව බලපෑම වෙනස්කම් නිරීක්ෂණය කරනු නොලැබීය. පටක රෝපිත අන්නාසි පැල (මුරිසි ප්‍රභේදය) ක්ෂෙත්‍රය තුළ සිටුවා ඇති අතර ඇගයීම අඛණ්ඩව සිදුවෙමින් පවතී.

## කීට විද්‍යා අංශය

### දෙහි සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරිම

දෙහි සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීමට පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කෙරිණි. බෝග වලට හානි කරන පළිබෝධකයින් හඳුනා ගැනීම උදෙසා පේරාදෙණිය මඩොල්සීම, තෙල්දෙණිය, බණ්ඩාරවෙල යන ප්‍රදේශවල සමීක්ෂණයන් සිදු කෙරිණි. පළිබෝධ සහ රෝග සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද ඇගයීම පිණිස අධ්‍යයනයන් සිදු කෙරිණි. රහන්ගල සහ HORC - 29 යන ප්‍රභේද 2ක පත්‍ර කනින්නාගේ රෝගයට බඳුන්වීමේ ඉඩකඩ අඩු බවත් වෙනත් ප්‍රභේදයන්ට සාපේක්ෂව "ආරෝග්‍ය" සහ තවත් විදේශීය ප්‍රභේද 2ක් මයිටා රෝගයට ලක්වීමේ හැකියාව අඩු බවත් හඳුනාගනු ලැබීය.

### ශාක නිස්සාරකවල පළිබෝධ පාලන හැකියාව අධ්‍යයනය

කාබනික ගොවිතැන සහ ගෙවතු වගාව සඳහා පළිබෝධ පාලන ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම උදෙසා ශාක වර්ග කිහිපයක නිස්සාරණයන් හි පළිබෝධ කළමනාකරණ හැකියාව හඳුනාගැනීමට පරීක්ෂා කෙරිණි. මෙම නිස්සාරක 25ක් අතුරෙන් කොහොඹ ඇට මද නිස්සාරකය, ජාපාල ඇට මද, නිස්සාරණය (*Croton tiglium,* Euphorbiaceae), කොහොඹ පත්‍ර, Sweet, *Acorus calamus,* රයිසෝමය, *Anona muricata,* සහ *Anona senegalensis* සහ *Anona reficuate* බීජ සහ සුදුලූණු බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල ලබාදුණි. ඛනිජ තෙල් සහ ටීපෝල් මිශ්‍රණය කෘමින්ගේ මර්ත්‍යතාවයට, ආහාර ක්‍රමයට සහ වර්ධනයට සැලකිය යුතු බලපෑමක් එල්ල කෙරිණි.

### ඉඟුරු වගාවේ නව පළිබෝධකයින් හඳුනාගැනීම

ඉඟුරු බෝගය සඳහා ඉතාමත් දැඩි බලපෑමක් එල්ල කරන්නා වූ නව පළිබෝධකයා රයිසෝම මැස්සා (*Mimegralla coeruleifrons*) ලෙස හඳුනා ගනු ලැබීය. වැඩිහිටි මැස්සන් නිරාවරණය වී ඇති රයිසෝමයන් සහ පස් මතුපිටට ඉතාමත් ආසන්නයේ පවතින කඳ මත බිත්තර දමන බව සොයා ගැනිණි. පළිබෝධකයා රයිසෝමා මත ඇති කරන්නා වූ මෙම තුවාල පාංශු ක්ෂුද්‍ර ජීවීන්ට සහ වෙනත් පළිබෝධකයන්හට රයිසෝමය ඉතාමත් පහසුවෙන් ආක්‍රමණය කිරීමට ඉඩ සැලසෙන අතර

මෙහි ප්‍රතිඵලයක් ලෙස රයිසෝමය කුණු වීම වේගවත් වේ. පළිබෝධනාශක කිසිවකටත් මෙම පළිබෝධකයා පාලනය කිරීමට නොහැක. මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම උදෙසා අපනයන කෘෂිකර්ම පර්යේෂණ ආයතනයට බාර දී ඇත.

**මැදරට තෙත් කලාපයේ වට්ටක්කා වයිරස් රෝගය සඳහා වැඩි දියුණු කළ සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක අනුර්වතී බව**

ගන්නෝරුවේදී මැදරට තෙත් කලාපයේ වට්ටක්කා වයිරස් රෝගය සඳහා වැඩි දියුණු කළ සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් අනුවර්තී අධ්‍යයනය කෙරිණි. වට්ටක්කා වල මෙම වයිරස් රෝගය " පැපොල් මුදු පුල්ලි රෝග" මඟින් ඇති කරන බවත් කුඩිත්තන් මඟින් මෙම රෝගය පතුරුවාහරින බවත් හෙළි විය. වාරියපොලදී වට්ටක්කාවල රෝග ඇති කරන වයිරසයට වඩා මෙම පැපොල් මුදු පුල්ලි රෝගය ඇති කරන වයිරසය වෙනත් වර්ගයක් බව නැවත නැවතත් සිදු කළ අධ්‍යයනයන් මඟින් හෙළි විය. මෙම පිළිවෙත් මාලාවේ අනුවර්තීබව පරීක්ෂා කිරීමට අත්හදා බැලීම් අඛණ්ඩව සිදු වේ.

**වට්ටක්කාවල පළිබෝධ සහ රෝග පාලනයේදී පරාවර්තන පොලිතීන් වසුන් ඇතිරීමේ ප්‍රමාණයෙහි බලපෑම**

සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත්මාලාවක් වැඩිදියුණු කිරීම පිණිස වට්ටක්කාවල පළිබෝධ සහ රෝග පාලනය සඳහා පරාවර්තන පොලිතීන් ඇතිරීමේ ප්‍රමාණයෙහි බලපෑම පරීක්ෂා කරනු බැලිය. අඩි 4ක් පමණ පළල අළු පැහැති පරාවර්තන වසුන් උපයෝගී කරගැනීමෙන් පළිබෝධකයින් පාලනය කර වැඩි අස්වැන්නක් ලබාගත හැකිබව අධ්‍යයනයන් මඟින් පෙන්නුම් කෙරිණි.

**පළතුරු මැස්සා සහ කොමඩු මැස්සා පාලනය සඳහා ප්‍රාදේශීය සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව**

ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තු ශතසංවත්සර ප්‍රදර්ශනයේදී පළතුරු මැස්සා සහ කොමඩු මැස්සා පාලනය සඳහා ප්‍රාදේශික සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් නිදර්ශනය කෙරිණි. උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතන ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපස ප්‍රධාන ප්‍රදර්ශන ක්ෂෙත්‍රයහිදී මෙම පිළිවෙත් මාලාව ප්‍රදර්ශන කෙරිණි. වැටකොළු, කරවිල, පතෝල, පිපිඤ්ඤා සහ වට්ටක්කා ඇතුළුව කුකුබිට්සේ කුලයේ බෝග ගණනාවක් හෙක්ටයාර 4ක භූමි ප්‍රමාණයක වගා කෙරිණි. මෙම පිළිවෙත් මාලාව ඉතාමත් සාර්ථක වූ අතර වඩාත් ඵලදායී, අඩු පිරිවැයති, ආර්ථිකමය, පාරිසරික හිතකර තාක්ෂණ ක්‍රමවේදයක් ලෙස ද ගොවීන්හට ව්‍යාප්ත කළ හැකි ඉතාමත් උසස් තාක්ෂණ ක්‍රමවේදයක් ලෙස ද මෙම තාක්ෂණය නිර්දේශ කළ හැක. මෙම පිළිවෙත් මාලාවට ක්ෂෙත්‍රය සනීපාරක්ෂණය, ප්‍රෝටීන් උගුල් නිසි කලට යෙදීම,පෙරමෝන් උගුල් භාවිතය සහ පළතුරු පොලිතීන් බෑග් වලින් ආවරණය කිරීම වැනි කරුණු ඇතුලත් වේ.

**විදේශීය වැටකොළු ප්‍රභේද ක්ෂෙත්‍රයේ වගාකිරීමේ හැකියාව සහ පළිබෝධ සහ රෝගවලට ප්‍රතිරෝධීබව ඇගයීම.**

AARTI, LECT -672, NS 474, NS 475, NRGH 22 සහ LA33 x TD යන විදේශීය වැටකොළු ප්‍රභේද ක්ෂෙත්‍රයේ වගාකිරීමේ හැකියාව, පළිබෝධ සහ රෝග සඳහා ප්‍රතිරෝධීබව සඳහා ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේදී අගයනු ලැබීය. LA 33, NAGA, LA33 x TD, AARTI සහ NRGH 22 යන දේශීය ප්‍රභේද හා

සැසඳීමේදී විදේශීය ප්‍රභේද පළිබෝධකයින්ට සහ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිබව පෙන්නුම් කෙරිණි.

**“ තොම්සන් බීජ රහිත” ප්‍රභේදයේ මිදිවල පළිබෝධ සහ රෝග කළමනාකරණය**

පළිබෝධ කළමනාකරණය යටතේ මිදි වගාවේ පළිබෝධකයින් නිරීක්ෂණය කෙරිණි. කල්පිටිය ප්‍රදේශයේ ගොවිපළවල අංකුරවලට දැඩි විනාශයක් සිදු කරන්නා වූ කොලෙප්ටෙරා කුරුමිණියා, අංකුර කා දමන කුරුමිණියා (Coleoptera : Chrysomelidae) ලෙස හඳුනා ගනු ලැබීය. සනය හඳුනාගැනීම, ජෛව විද්‍යාව හානිය හා පාලන ක්‍රමෝපායන් තවදුරටත් අධ්‍යයනය කරනු ලැබේ.

## ශාක ව්‍යාධිවේදය

**ක්ෂුද්‍රජීවී සහ බිම්මල් අංශය**

ශාකරෝග හඳුනාගැනීම, සමෝධානික රෝග කළමනාකරණය පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම, දිලීරනාශක පිළිබඳව සොයා බැලීම, බීජ සහ ශාක ස්වස්ථතාව පරීක්ෂණ, රෝග පාලනය සහ ඔයිස්ටර්, පිදුරු සහ සුකිරි බිම්මල් සඳහා වැඩිදියුණු තාක්ෂණයන් සංවර්ධනය, මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාවලීන් වේ.

පුහුණු පන්ති, ශාක සායන, පත්‍රිකා සහ පර්යේෂණ නිබන්ධන මඟින් නව තාක්ෂණයන් ව්‍යාප්ත කෙරේ.

**බැක්ටීරියා මැලවීමට ප්‍රතිරෝධීබව සඳහා විදේශීය දෙමුහුම් පරීක්ෂා කිරීම**

*Ralstonia solanacearum* මඟින් ඇතිකරන බැක්ටීරියා මැලවීම් රෝගයට ප්‍රතිරෝධීබව සඳහා විදේශයෙන් ආනයනය කළ තක්කාලි දෙමුහුම් 11ක් සහ මාළුමිරිස් දෙමුහුම් 5ක් පරීක්ෂා කෙරිණි. සියලුම ප්‍රභේද බැක්ටීරියා මැලවීමේ රෝගය සඳහා සාමාන්‍ය ප්‍රතිරෝධීබවක් පෙන්නුම් කරන අතර අනුවර්තීබව සහ අස්වැන්න සඳහා තවදුරටත් පරීක්ෂා කෙරේ.

**බීජ අර්තාපල් ආනයන තොග පරීක්ෂා කිරීම සහ රසායනාගාර පරීක්ෂාවන්**

විවිධ රටවලින් ගෙන්වූ බීජ අර්තාපල් තොග 74ක් ව්‍යාධිජනක පරපෝෂිතයින්ගෙන් තොර බවට තහවුරු කිරීම උදෙසා බාහිරයෙන් සහ රසායනාගාර පරීක්ෂාවන් සිදුකරනු ලැබීය. අර්තාපල් සහ බීජ මත සාමාන්‍ය කබොලු *Streptomyces* spp, ජාලාකාර කබොලු, (*Streptomyces reticulisscabids* , රිදී කොරල, (*Helminthosporium solani*), කළු කොරල, (*Rhizoctonisa solani*) නිරීක්ෂණය කෙරිණි. *Geotrichum candidum* මඟින් ඇති කරන rubbery rot බීජ මත කලාතුරකින් දක්නට ලැබිණි. කෙසේ වුවද රෙගුලාසිහි සඳහන්ව ඇති පරිදි මෙම රෝග ඇතිවීම සහ හානිය අවසර ලබාදෙන මට්ටමට වඩා අඩුවෙන් පවතින හෙයින් මෙම බීජ ගොවි ක්ෂේත්‍රවල වගාව සඳහා අවසර ලබාදුණි.

**බෝගවල රෝග කළමනාකරණය සඳහා රෝග හඳුනාගැනීම සහ උපදේශක සේවාව**

පළතුරු බෝග, එළවළු, ආකන්ධ, කුළු බඩු, විසිතුරු මල්, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ රජයේ ගොවි ක්ෂේත්‍රවලින් සහ පෞද්ගලික ගොවිපල වලින් ලැබුණු රෝග ආසාදිත සාම්පල පැල 280කට වැඩි ප්‍රමාණයක් දිලීර, බැක්ටීරියා, වයිරස් රෝග හඳුනාගැනීම උදෙසා සායනිකව පරීක්ෂා කරනු ලැබිණි. මෙම දිලීර රෝග අතර මුල්කුණු වීම, පත්‍ර මත තිත් ඇතිවීම, පිටිපුස් රෝගය සහ ඇන්ත්‍රැක්නෝස් යන රෝග පළතුරු සහ එළවළු වගා කරන බොහෝ ප්‍රදේශවල බහුලව දක්නට ලැබිණි.

*Xanthomona campestris* මඟින් ඇති කරන්නා වු කළු පැහැයෙන් ගෝවා

කුණුවීමේ රෝගය, ගෝවා වගා කරන්නා වූ බොහෝ ප්‍රදේශවල සියළුම ගෝවා ප්‍රභේදයන්හට දැඩි බලපෑමක් ඇති කරන්නා වූ රෝගයක් ලෙස හඳුනා ගනු ලැබිණි. පැනමා රෝගය කෙසෙල් වලට වඩාත් විනාශයක් ඇති කරන්නා වූ රෝගයක් ලෙස හඳුනා ගනු ලැබිණි. හම්බන්තොට ප්‍රදේශයෙන් වැල් දොඩම් කඳ පාමුල කුණු වීමේ / "Canker" රෝගය වාර්තා වූ අතර මෙය *Fusarium solani* මඟින් ඇති කරවන බවත් මෙම රෝගය ලංකාවෙන් වාර්තා වූ පළමු අවස්ථාව මෙය බවත් වාර්තා විය.

**ELISA පරීක්ෂාව මඟින් වයිරස් රෝග හඳුනා ගැනීම.**

ආනයනික දෙමුහුම් බීජ සහ රෝපණ ද්‍රව්‍යවල ශාක වයිරස් නිවැරදිව හඳුනාගැනීම සඳහා ELISA පරීක්ෂණය සිදු කෙරිණි. ELISA පරීක්ෂාව මඟින් වයිරස් රෝග කලින් සහ විශ්වාසදායී ලෙස හඳුනාගැනීමට හැකි වන අතර බෝග වගාවේදී බීජවල ස්වස්තතාව පරීක්ෂා කිරීම සහ වයිරස් පාලන ක්‍රමෝපායන්හි පූර්ව අවශ්‍යතාවයයි. විදේශීය කුකුබිට්සේ බීජ සාම්පල් 68ක් (CGMMV) පිපිඤ්ඤා කොළ පුල්ලි විචිත්‍ර වයිරසය සඳහා පරීක්ෂා කරනු ලැබූ අතර මෙයින් සාම්පල් 3ක් වයිරස් සහිත බව සොයා ගැණුනු අතර තවදුරටත් ඇගයීම ප්‍රතික්ෂේප කරනු ලැබීය. තක්කාලි සාම්පල් 8ක් TSWV සඳහා පරීක්ෂා කෙරිණි. සියලුම සාම්පල වයිරස් රහිත බව සොයා ගැනිණි.

**මාළු මිරිස්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය (*Collettotrichum gleosporiodes*) සහ කුකුබිට්සේ හි යටි පුස් රෝගය සඳහා නව දිලීර නාශකයන්හි ජෛවීය කාර්යක්ෂමතාව**

මාතලේ ගොවි ක්ෂේත්‍රයන්හි ස්වාභාවික රෝග ආක්‍රමණයක් යටතේ මාළු මිරිස් වල ඇන්ත්‍රැක්නෝස් රෝගය සඳහා නව දිලීරනාශක 4ක්ද කුකුබිට්සේ ශාක වර්ගයන්හි යටිපුස් රෝගය සඳහා නව දිලීරනාශක 2ක්ද අගයන ලදී. ඇමිස්ටාර් 25% SC (10ml /10 l ක අනුපාතයෙන්) නැටිවෝ 75 WG (6g /10l ක අනුපාතයෙන්) කැබ්‍රියෝටොප් EC (20g / 10l අනුපාතයෙන්)සහ ෆලුසිනාම් 500g / ISC (10ml / 10l අනුපාතයෙන්) යන දිලීරනාශක 4 මාළු මිරිස්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය සඳහා ඵලදායී ලෙස යොදා ගත හැක.

**කුකුබිට්සේ වර්ගයේ එළවළුවල නව දිලීර නාශකයන්හි ජෛවීය කාර්යක්ෂමතාව**

කැබ්‍රියෝටොප් EC (Metiram 55% pyraclostrobin 5%) සහ ඇමිස්ටාර් 25% SC සහ නව දිලීරනාශක 2ක කුකුබිට්සේ හි යටිපුස් රෝගය ඵලදායී ලෙස පාලනය කළ හැකි බව පෙන්නුම් කෙරිණි.

**කුකුබිට්සේ කහපැහැ ගැන්වීමේ සින්ඩ්‍රෝමය හා ආශ්‍රිත වයිරස් රෝගයන්හි මස්තු සහ අනුක විද්‍යාත්මක හඳුනාගැනීම**

මස්තු විද්‍යාත්මක සහ අනුක විද්‍යාත්මක ක්‍රම උපයෝගී කොට විවිධ කුකුබිට්සේ ශාකයන් හා ආශ්‍රිත වයිරස් 7ක් හඳුනා ගනු ලැබීම. මෙම වයිරස් හට පිපිඤ්ඤා විචිත්‍ර වයිරසය (Cucumber Mosaic Virus), පැපොල් මුදු පුල්ලි වයිරස (Papaya Ring Spot Virus), දුම්කොළ මුදු පුල්ලි වයිරසය (Tobacco Rings Spot Virus (TRSV), තක්කාලි මුදු පුල්ලි වයිරසය (Tomato Mosaic Spot Virus (TORSV), පිපිඤ්ඤා කොළ පුල්ලි විචිත්‍ර වයිරසය (Cucumber Green Mottle Mosaic Virus (CGMMY), සුචිනි කහ විචිත්‍ර වයිරස (Zucchini Yellow Mosaic Virus (ZYMV) සහ begomo viruses මෙයට ඇතුලත් වේ. මෙම කුකුබිට්සේ වයිරස් රෝගය කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කරන ලදී.

**මෑ (*Vigna unguiculata*) ප්‍රභේද කඳපාමුල සහ මුල් කුණුවීමේ රෝගය සඳහා අභිජනන ආර ඇගයීම**

කඳ පාමුල කුණුවීමේ රෝගයට බඳුන් වූ ශාක වලින් දිලීර ව්‍යාධිජනකයින් කිහිපයක්ම හඳුනා ගත හැකි විය. *Fusarium* spp, *Rhizoctonia solani, Sclerotium rolfsii* සහ *Pythium* spp යන විශේෂ මෙම දිලීර අතර විය. ප්‍රචලිත වගා ප්‍රභේද සහ අභිජනන ආර පරීක්ෂණ තත්ත්වයේ පවතින අතර කඳපාමුල කුණුවීමේ රෝගයට එරෙහිව ප්‍රතිරෝධීබව අගයනු ලැබීය. ඉතාමත් දැඩි ආසාදනයට ලක් වූ ක්ෂේත්‍රවල වගා කිරීමේදී සියලුම ප්‍රභේද මෙම රෝගය මඟින් ආසාදනය වේ. කෙසේ වුවද 39 - 11 සහ 39 - 9 යන අභිජනන ආර රෝගයට වැඩි ප්‍රතිරෝධීබවක් පෙන්නුම් කෙරිණි.

**මිදි වගාවේදී ප්‍රධාන ජෛවීය බාධක හඳුනාගැනීම**

කල්පිටිය වැනි ප්‍රධාන වශයෙන් මිදි වගාකරන ප්‍රදේශයන්හිදී මිදි වල ආර්ථික වශයෙන් වැදගත් ප්‍රධාන රෝග හඳුනාගැනීම උදෙසා සමීක්ෂණයක් පවත්වනු ලැබිණි. සමීක්ෂණය තුළදී හඳුනාගත් රෝග අතර යටිපුස් රෝගය (*Plasmopora viticola*), පිටිපුස් රෝගය (*Uncinula necator*), මලකඩ රෝගය (*Physopella ampelopsidis*), කුණුවීම (Glomarella spp) *pestalotia* පත්‍ර තිත් ඇතිවීම සහ *Phomopsis* පත්‍ර පුල්ලි ප්‍රධාන වශයෙන් දක්නට ලැබිණි. මිදි වගාවේ බහුල වශයෙන් මුල්වල දක්නට ලැබූ රෝගය වන්නේ *Fusarium* මුල් කුණුවීමයි. මෙම රෝග පාලනය කිරීම උදෙසා යෝග්‍ය වූ දිලීරනාශක හඳුනා ගැනිණි.

**කාබනික එළවළු නිෂ්පාදනය සඳහා රෝග කළමනාකරණ ක්‍රමෝපායන්**

වැඩිදියුණු කළ පිළිවෙත් මාලාවට හෙක්ටයාරයකට ටොන් 20ක අනුපාතයෙන් හොඳින් දිරාපත් වූ කාබනික ද්‍රව්‍ය පැලසිටුවීමට සති 2කට පෙර සහ පැල සිටුවා මසකට පසුව පසට එකතු කිරීම ඇතුලත් වේ. ලී කුඩු මාධ්‍ය මත වගා කළ *Trichoderma viride* වගා කිරීමේදී පැලකරන අවස්ථාවේදී වගා වලකට 50g බැගින් එකතු කරනු ලබයි. සෑම සතියකට පත්‍ර පොහොර දියරය ඉසිනු ලැබීය. යම් ව්‍යාධිජනකයෙන් ආක්‍රමනය කරන බව නිරීක්ෂණය කරනු ලැබුවේ නම් කොහොඹ ජල නිස්සාරකය ඉසීම සිදු කෙරිණි. අවශ්‍ය සෑම අවස්ථාකදීම ක්ෂේත්‍ර සනීපාරක්ෂණය, වෙනත් රෝපණ සහ කෘෂිවිද්‍යාත්මක පිළිවෙත් රෝග කළමනාකරණය සඳහා අනුගමනය කෙරිණි. මෙම යෝජිත පිළිවෙත් මාලාව අනුගමනය කිරීම මඟින් තක්කාලි, බණ්ඩක්කා සහ ගෝවාවලට ඇතිවන රෝග වලින් ආර්ථික හානිදායක මට්ටමට වඩා අඩුවෙන් පවත්වා ගැනීමට කළමනාකරණය කරනු ලැබීය.

**අස්වැන්න ඉහළ දැමීම සහ රෝග කළමනාකරණය සඳහා පාරිසරික හිතකර ස්වභාවික බහුඅවයවික සංයෝග ඇගයීම**

තක්කාලි, බණ්ඩක්කා සහ රඹුටන්වල අස්වැන්න වැඩිකිරීමට සහ රෝග කළමනාකරණය සඳහා කයිටොසාන් දිලීරනාශකය සහ කයිටොසාන් ඔලිගොමර් උපයෝගී කරගැනීමේ හැකියාව සොයාබැලීම උදෙසා පරීක්ෂණ සිදු කෙරිණි. කයිටොසාන් දිලීරනාශකය සහ කයිටොසාන් ඔලිගොමර් ඉසීම තුළින් බණ්ඩක්කාවල පත්‍ර කහ විචිත්‍ර වයිරස් රෝගය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවිය. කෙසේ වුවද බණ්ඩක්කාවල පිටිපුස් රෝගයට සහ සර්කොස්පොරා පත්‍ර තිත් ඇති වීම යන රෝගයන්ට එම දිලීරනාශක මඟින් සැලකිය යුතු බලපෑමක් එනම් අඩුවීමක් නිරීක්ෂණය කළ නොහැකි විය. තක්කාලිවල අංගමාරය සහ සර්කොස්පොරා පත්‍ර තිත් ඇතිවීම සැලකිය යුතු ප්‍රමාණයකින් පාලනය විය.

තවද කයිටොසාන් යෙදීම මඟින් අස්වැන්න 16 – 25% අතර ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට හැකි විය. කයිටොසාන් යෙදීම මඟින් රඹුටන්වල පිටිපුස් රෝගය සැලකිය යුතු ප්‍රමාණයකින් පාලනය කර ගැනීමට හැකි විය.

**කෙසෙල්වල වද පීදීමේ රෝගය (BBTV) සහ කෙසෙල් ඉරි සැදීමේ (BSV) යන වයිරස රෝග හඳුනාගැනීම සඳහා අනුක ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම.**

BBTV – DNAI සංයෝගය සඳහා දාම විශේෂිත යොදා ගැනීමෙන් කෙසෙල් වද පීදීමේ රෝගය හඳුනාගැනීම සඳහා PCR බහු අවයවීක දාම ප්‍රතික්‍රියා අනුක මෙවලවක් වැඩි දියුණු කෙරිණි. මෙහිදී කෙසෙල් වද පීදීමේ රෝගය ආසාදිත ශාකවලින් රෝගය ඇති කරන වයිරස් මඟින් 1100 bp කොටසෙහි බහුඅවයවීක දාම ප්‍රතික්‍රියා සැකස්ම අඛණ්ඩව වැඩි කෙරිණි.

මේ හා සමානවම කෙසෙල් ඉරි වයිරස් විශේෂිත ප්‍රයිමර්ස් උපයෝගී කරගනිමින් කෙසෙල් ඉරි වයිරස් රෝග හඳුනා ගැනිණි. කෙසෙල් ඉරි වයිරස් ආසාදිත ශාකවලින් reverse transcriptase R Nose H ජානය ආරක්ෂිත කලාපයෙහි 731 bp කොටස අඛණ්ඩව වැඩි කෙරිණි.

එක් පරීක්ෂණයක් තුළදී කෙසෙල් වද පිදීමේ වයිරසය සහ කෙසෙල් ඉරි වයිරස් රෝගය යන දෙකම එකවර හඳුනාගැනීම උදෙසා නව බහුවිධි බහුඅවයවීක දාම ප්‍රතික්‍රියා ක්‍රම වේදයක් දියුණු කරනු ලැබීය. ක්ෂේත්‍රය තුළින් මෙම වයිරස් රෝග 2කට හෝ එකකින් ආසාදිත කෙසෙල් සාම්පල උපයෝගී කොට මෙම පරීක්ෂණය අගයන ලදි.

## තක්කාලි

විදේශීය තක්කාලි ප්‍රභේද 18ක් අස්වනු ලැබීමේ හැකියාව උදෙසා පරීක්ෂා කරනු ලැබීය. තවදුරටත් අධ්‍යයනයන් සඳහා ප්‍රභේද 14ක් තෝරා ගැණිනි.

## බෝංචි කහපැහැ ගැන්වීමේ වයිරස් රෝගය අනුක හඳුනාගැනීම සහ ලක්ෂණීකරණය

ආදර්ශයක් ලෙස 1:25 ලෙස තනුක කරන ලද සම්පූර්ණ DNA සැකසීම අකෘතියක් ලෙස උපයෝගි කරගනාමින් බහුඅවයවීක දාම ප්‍රතික්‍රියාව හරහා බෙගමො වයිරස් හඳුනා ගැනීමට බෙගමො වයිරස් කණ්ඩායමේ විශේෂිත පොදු ප්‍රයිමර්ස් යොදාගනු ලැබිණ. මෙම අධ්‍යනය මඟින් තෝරාගත් ප්‍රයිමස් කාණ්ඩායම උපයෝගී කරගන්නා පොලිමර් දාම ප්‍රතික්‍රියාව, බෝංචිවල බෝංචි කහ පැහැගැන්වීම ඇති කරන බෙගමොවයිරස් හඳුනාගැනීම උදෙසා විශේෂිත බව සහ සංවේදී බව හඳුනාගැනිණි.

**තක්කාලි කහපැහැ පත්‍ර කොඩවීමේ වයිරසයේ අනුක හඳුනාගැනීම සහ ලක්ෂණීකරණය**

බෙගමොවයිරස් කණ්ඩායමේ විශේෂිත පොදු ප්‍රයිමර්ස් කාණ්ඩයක් උපයෝගී කරගනිමින් බෙගමොවයිරස් සඳහා තක්කාලි කහපැහැ පත්‍ර කොඩවීමේ වයිරසය ආසාදිත සාම්පල පරීක්ෂා කරනු ලැබිණි. තක්කාලි කහපැහැ පත්‍ර කොඩවීමේ වයිරසය ආසාදිත ලක්ෂණ පෙන්නුම් කලා වූ සියලුම සාම්පල බෙගමොවයිරස් වයිරසයෙහි කොපුව සාදන්නා වූ ජාන කොටසෙහි 520 base අඛණ්ඩව වැඩි කෙරිණි. තවද අසාදිත ශාකවලින් 1650bp හි බහුඅවයවීක දාම ප්‍රතික්‍රියා ඵල යුගලය අඛණ්ඩව වැඩිකර එය උපයෝගී කරගනිමින් තක්කාලි කහ පැහැ පත්‍ර කොඩවීමේ වයිරසය කඩිනමින් සහ ස්ථිර ලෙසම හඳුනාගැනීම උදෙසා බහුඅවයවීක දාම ප්‍රතික්‍රියා ක්‍රමවේදයක් වැඩිදියුණු කෙරිණි. මෙම ක්‍රමවේදය රෝගය මුල් අවස්ථාවේදීම හඳුනාගැනීමටත්, කෘමීන් ව්‍යාප්තවීම

පිළිබඳ අධ්‍යයනයටත්, රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද ඇගයීමටත් උපයෝගී කර ගත හැක.

## *Trichoderma viride* කුඩක් ලෙස සැකසීම වැඩිදියුණු කිරීම

*Trichoderma* විශේෂ කුඩක් ලෙස සැකසීම වැඩිදියුණු කෙරිණි. මාස 12ක කාලයක් පුරා විවිධ කාලපරාසයන්හිදී ස්ථතික යන්හි *Trichoderma* ජීවන කාලය අනුවර්තනයට අගයනු ලැබීය. මෙම අධ්‍යයනයන්හි ප්‍රතිඵල මඟින් *Trichoderma* විශේෂයන් හට සංවෘත ස්ථර 3කින් යුත් ඇලුමිනියම් බෑග්වල මාස 12ක කාලයක් පවා නොනැසී පැවතිය හැකි බව පෙන්නුම් කෙරිණි.

## දෙහි පළිබෝධකයින් සහ රෝග සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම.

2012 වර්ෂයේදී දෙහි වගා භූමිවල දෙහි බෝගයේ ඇති වූ රෝගී තත්ත්වයක් තීරණය උදෙසා සමීක්ෂණ පවත්වනු ලැබිණි. බිබිල, මඳුරකැටිය, බණ්ඩාරවෙල, මඩොල්සීම සහ ගන්නෝරුව යන ප්‍රදේශයන්හි පිටිපුස් රෝසපැහැ කඳ හා කබොලු යන රෝග බහුල වශයෙන් දක්නට ලැබූ රෝගී තත්ත්වයන් විය. පැවතුනු නියං තත්ත්වය සහ දුර්වල කෘෂි විද්‍යාත්මක පිළිවෙත් අනුගමනය හේතුවෙන් දෙහි ශාක වියළීමත් එයට පසුව *Phytopthora* හේතුවෙන් මුල් කුණුවීමේ රෝගයට බඳුන්වීමත් තෙල්දෙණිය ප්‍රදේශයේ නිරීක්ෂණය කළ හැකි විය.

ස්වභාවික රෝග ආක්‍රමණ තත්ත්වයන් යටතේ ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී පිටිපුස් රෝගය සඳහා ප්‍රභේද 12ක් (විදේශීය ප්‍රභේද 8 + දේශීය ප්‍රභේද 4) පරීක්ෂණයට ලක් කෙරිණි. මෙයින් ප්‍රභේද 5ක් (විදේශීය ප්‍රභේද 3 + දේශීය ප්‍රභේද 2) පිටිපුස් රෝගයට ලක් නොවිණි.

## වට්ටක්කා වයිරස් රෝග නියාමනය සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම

වාරියපොල සහ මාකඳුර ප්‍රදේශ වලින් එකතු කරගත් කහපැහැති කොළ හැකිලුනු පත්‍ර සහිත වට්ටක්කා සම්පල (CGMMV, TORS, CMV, PRSV, TRSV, WMV සහ ZYMV) යන වයිරස් රෝග ආසාදනය වී නොතිබූ නමුත් Begamo virus වයිරසයෙන් ආසාදනය වී ඇතිබව නිරීක්ෂණය කෙරිණි. වාරියපොල සහ ගන්නෝරුව පර්යේෂණ ක්ෂේත්‍රවල සහ මොරගොල්ලාම ගොවි ක්ෂේත්‍රවලදී පත්‍ර වියළීමත් එයට පසු ශාකය වියළීමත් ඇති කරමින් විනාශකාරි රෝගී තත්ත්වයක් නිරීක්ෂණය කළ හැකි විය. මෙම රෝගී තත්ත්වය *Erwinia trachypilla* නම් බැක්ටීරියා රෝගයක් බව හඳුනා ගැණිනි.

## දේශීය බිම්මල් ප්‍රභේද වගාකිරීම උදෙසා තාක්ෂණය වැඩිදියුණු කිරීම.

ගන්නෝරුව පාසලෙහි අඹ ශාක මත වැවෙන දේශීය බිම්මල් ප්‍රභේදයේ බීජානුකරය කැමට ලබාගත හැකි ඔයිස්ටර් බිම්මල් ප්‍රභේදයක්බව හඳුනාගනු ලැබිණි. දින 14කින් අමිශ්‍ර රෝපණ ද්‍රව්‍ය ලබා ගැනිණි. වී උපයෝගී කොට සාර්ථකව විශාල වශයෙන් මෙම බිම්මල් ප්‍රභේදය වාණිජම වගා කෙරිණි. මෙම දේශීය බිම්මල් ප්‍රභේදයෙන් දිලීර ජාල මඟින් එක් බෑගයකින් 145g ක ප්‍රමාණයක අස්වැන්නත් ලබාගත් හැකිවන පරිද්දෙන් සාර්ථකව වගා කෙරිණි. වෙනස් කෘෂි පාරිසරික කලාප වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ මෙම ප්‍රභේදය අගයනු ලබයි.

## මුල් සහ ආකන්ධ බෝග, මල් වගාව සහ ගෙවතු වගා අංශය

### මුල් සහ ආකන්ධ බෝග

- බතල
  - ගුණාත්මකබවෙන් ඉහළ, සිත් ඇදගන්නා සුළු රතු පැහැති පොත්තකින් සුදු මාංශල ගතියකින් සහ කෙටි ආයු කාලයකින් යුත් හෙක්ටයාරයකට ටොන් 35කට වැඩි අස්වැන්නක් මෙම මලයාසියානු ප්‍රභේදය මඟින් ලබා දේ.
  - මෙම ප්‍රභේදය ස්ථාන 5කදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන පැවැත් විණි .
  - ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන දිස්ත්‍රික්ක 4කදී පවත්වනු ලැබිණි.
  - ඉහළ වියළි බර ප්‍රමාණයක් සහිත CIP ආරයන් අගයනු ලැබීය. CIP 440186 ප්‍රභේද සාපේක්ෂව ගුණාත්මකබවෙන් ඉහළ වැඩි අස්වැන්නක් ලබාදුණි.
  - ලවණ තත්ත්වයට ඔරොත්තු දෙන්නා වූ CIP ආර 11ක් අතුරෙන් 199076-1, 199062-1, 440224, 440262-1 සහ 440183 යන ආර 5 වැඩි අස්වැන්නක් ලබා දුණි. ලවණ අධික ප්‍රදේශ සඳහා යෝග්‍ය වන්නා වූ බලාපොරොත්තු තැබිය හැකි ආර තෝරා ගැනීමට විවධ ලවණ තත්ත්වයන් යටතේ මෙම ආර අගයනු ලැබීය.

- මඤ්ඤොක්කා
  - දිගු නටුවක් සහිත හොඳින් වර්ධනය වූ මුල් ආකන්ධය සහ සිත්ගන්නා සුළු පිට පොත්ත (දුඹුරු පැහැති පිට පොත්ත සහ රෝස පැහැති අභ්‍යන්තර පොත්ත) වැනි වැඩි අස්වැන්නක් සහ අලෙවි ගුණාංග වලින් යුත් නව HORDI 6 ප්‍රභේදය නිල වශයෙන් HORDI Mu1 වශයෙන් වගාව සඳහා නිකුත් කරන ලදී.
  - විවිධ සේවාදායකයින් සඳහා සියලුම නිර්දේශිත ප්‍රභේදවල මුල් සහ ආකන්ධ බෝගවල මූලික රෝපණ ද්‍රව්‍ය 50,000කට වැඩි ප්‍රමාණයක් බෙදා හැරිණි. අනාගත භාවිතය උදෙසා සියලුම මුල් සහ ආකන්ධ බෝගවල ජනක ප්ලාස්ම නඩත්තු කරනු ලැබීය.

### මල් වගාව සහ ගෙවතු වගාව

**විසිතුරු මල් ලෙස වටිනාකමක් පවතින වගා කළ හැකි ශ්‍රී ලංකාවට ආවේනික සහ දේශීය මල් වර්ග එකතු කිරීම, නඩත්තුව සහ ප්‍රවර්ධනය.**

මෙම එකතුවට අලුතෙන් වනයේ වැවෙන මල් පැල වර්ග 2ක්, විදේශීය ජර්බෙරා දෙමුහුම් 4ක් අලුතෙන් එකතු විය.

### ගෙවතු වගාව සඳහා අනුවර්ති ඌනඋපයෝජිත බෝග ප්‍රභේද එකතු කිරීම, නඩත්තුව සහ ඇගයීම

ගෙවතු වගාව සඳහා ඉහළ අනුවර්ති ස්වභාවයක් පෙන්නුම් කෙරෙන ඌනඋපයෝජිත බෝග ප්‍රභේද නඩත්තු කරනු ලැබ ගෙවතු වගා තත්ත්වයන් යටතේ පරීක්ෂා කරනු ලැබීය.

නව පරීක්ෂණාගාර බෝංචි ප්‍රභේද 2ක්, දාරදඹල බෝංචි ප්‍රභේද 2ක් සහ අවර විශේෂයක් ලෙස නව බෝග ප්‍රභේද 5ක් ගෙවතු වගා බෝග එකතුවට හඳුන්වා දෙනු ලැබීය.

## කෘෂිකාර්මික රසායන විද්‍යා අංශය

කෘෂිකාර්මික රසායන විද්‍යා අංශයෙහි ප්‍රධාන කාර්යයන් වන්නේ පාංශු සාරවත්බව, පැළෑටි පෝෂක

කළමනාකරණය සහ කාබනික ගොවිතැන පිළිබඳ පර්යේෂණ පැවැත්වීමය. මෙයට අමතරව මෙම අංශය ආහාර බෝග සඳහා පොහොර යෙදීම පදනම් පාංශු පරීක්ෂණ පිළිබඳ උපදෙස් සහ නිර්දේශයන් ලබා දෙයි. තවද මෙයට අමතරව ඉල්ලීම පරිදි පස්, පැළැටි, ජලය, රසායනික පොහොර, කොම්පොස්ට් සහ පොහොර පිළිබඳ විශ්ලේෂණාත්මක සේවාවන්ද මෙම අංශය මඟින් ලබා දේ. මේ හා සමානව පස්, පොහොර සහ පොහොර කළමනාකරණය හා සම්බන්ධව පුහුණු වැඩසටහන්ද ගොවීන්, ව්‍යාප්ති නිලධාරීන්, පෞද්ගලික ආයතන නිලධාරීන්, පාසල් ශිෂ්‍යයින් සහ විශ්ව විද්‍යාල ඩිප්ලෝමා උදෙසා පවත්වයි. පොහොර භාවිතය සහ කළමනාකරණය සහ පාංශු සහ ඛනිජ ලවණ ඌනතාව පිළිබඳ කටයුතු කිරීම සඳහා උපදෙස්ද සේවාදායකයින් සඳහා ලබාදේ.

## කාබනික එළවළු බෝගයන්හි පෝෂක කළමනාකරණය

පරීක්ෂණ බෝග ලෙස මාළුමිරිස් සහ බෝංචි උපයෝගී කරගනිමින් එළවළු අස්වැන්න සඳහා විවිධ කාබනික පෝෂක කළමනාකරණ ක්‍රමයන්හි බලපෑම පරීක්ෂා කරනු ලැබීය.

මහ කන්නයේ මාළු මිරිස් කරල් අස්වැන්න සහ යල කන්නයේ බෝංචි අස්වැන්න සඳහා විවිධ කාබනික පෝෂක කළමනාකරණ පිළිවෙත් මඟින් පැහැදිලි බලපෑමක් ඇති නොවිණි. කෙසේ වුවද කොළ පොහොර, කොම්පෝස් සහ කොම්පෝස් තේ කොළ සමඟ ඉසීමේ ප්‍රතිකර්මය මඟින් ඉහළම මාළු මිරිස් අස්වැන්නක් වාර්තා විණි. යල කන්නයේදී පළමුව කොළ පොහොර සහ හෙක්ටයාරයකට ටොන් 10.7ක් කොම්පෝස්ට් ප්‍රතිකර්මය යොදා පසුව හෙක්ටයාරයකට ටොන් 10.5ක කොළ පොහොර කොම්පෝස්ට් සහ කොම්පෝස් තේ ප්‍රතිකර්මය යෙදීම මඟින් ඉහළම බෝංචි අස්වැන්නක් වාර්තා විය. එළවළු වගාව සඳහා කොළ පොහොර සමඟ කොම්පෝස්ට් යන දෙකෙම යෙදීම මඟින් ධනාත්මක ප්‍රතිඵල ලැබිණි.

## පොහොර සහ කොම්පෝස්ට් දිගු කාලීනව යෙදීම

වසර 10කට වැඩි දිගු කාලීන අධ්‍යයනයන් තුළින් කොම්පෝස්ට් පමණක් හෝ අකාබනික පොහොර පමණක් යෙදීමට වඩා කොම්පෝස් සහ අකාබනික පොහොර යන දෙකෙහිම ඒකාබද්ධ යෙදීම තුළින් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාදෙන බව පෙන්වා දෙනු ලැබිණි. අඛණ්ඩව අකාබනික පොහොර යෙදීම සහ පොහොර නොයෙදීම මඟින් දිගු කාලීනව අඩු අස්වැන්නක් ලබාදෙන බව පෙන්නුම් කෙරිණි. එමනිසා අකාබනික පොහොර සමඟ කාබනික පොහොර යෙදීමේ අගය මෙමඟින් පෙන්වා දුණි. කාබනික පොහොර අකාබනික පොහොර යන දෙකෙහිම ඒකාබද්ධ භාවිතය පෝෂක සැපයුමට පමණක් නොව කාබනික පොහොර මඟින් පාංශු - පැළ පද්ධතිය හොඳින් පවත්වාගෙන යමින් ප්‍රයෝජන රැසක් ලබාදෙයි.

## කාබනික එළවළු අස්වැන්න පිළිබඳ විවිධ පෝෂක ප්‍රභවයන්

මිශ්‍ර බෝග වගාවේදී මහ කන්නයේ ගෝවා, මාළු මිරිස් සහ නෝකෝල්ද යල කන්නයේ ගෝවා කැරට් සහ බීට් දෙහි ද ගොම පොහොර (හෙක්ටයාරයකට ටොන් 20), කුකුල් පොහොර (හෙක්ටයාරයකට ටොන් 10), පණු පොහොර (හෙක්ටයාරයකට ටොන් 40), කොම්පෝස් (හෙක්ටයාරයකට ටොන් 40) වශයෙන් යොදා විවිධ කාබනික පොහොර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශිත NPK (නයිට්‍රජන්, පොසිපරස් පොටැසියම්) පොහොර සමඟ සංසන්දනය කර එම කාබනික පොහොරවල ඵලදායීතාවය අධ්‍යයනය කරනු ලැබීය.

මහ කන්නයේ මාළු මිරිස් සහ ගෝවාවල මෙම විවිධ කාබනික පොහොර ප්‍රභවයන්හි බලපෑමක් පෙන්නුම් කළද නෝකෝල්හි අස්වැන්නට සැලකිය යුතු බලපෑමක් ඇති නොවිණි. මෙම එළවළු බෝග 3හි සාමාන්‍ය අස්වනු ප්‍රමාණය සලකා බලන විට මහ කන්නයේ වැඩිම අස්වැන්නක් කොම්පෝස්ට් (හෙක්ටයාරයකට ටොන් 25.2) බැගින් යෙදූ එළවළුවලට ලැබුණු අතර මීළඟට වැඩි අස්වැන්නක් කුකුල් පොහොර යෙදූ එළවළුවලට ලැබිණි. (හෙක්ටයාරයකට ටොන් 24.4) අඩුම අස්වැන්නක් පණු පොහොර (හෙක්ටයාරයකට ටොන් 16.2) යෙදීම මඟින් ලැබිණි. යල කන්නයේදී එළවළු වර්ග 3හි වැඩිම අස්වැන්නක් (ගෝවා + බීට් + කැරට්) හෙක්ටයාරයකට ටොන් 18.7 බැගින් යෙදූ රසායනික පොහොර මඟින් ලැබිණි. මීළඟට වැඩි අස්වැන්නක් හෙක්ටයාරයකට ටොන් 16.6 මඟින් කුකුල් පොහොර යෙදූ එළවළු මඟින් ලැබිණි.

## බෝග ඵලදායීතාවය වැඩිකිරීම සඳහා වාර්ෂික පැල කිරීම යටතේ කෙසෙල් සඳහා පොටෑසියම් කළමනාකරණය

මැදරට තෙත් කලාපය කෙසෙල් සඳහා යෙදිය යුතු ප්‍රශස්ත පොටෑසියම් අනුපාතය තීරණය කිරීම උදෙසා ශාකය දක්වන ප්‍රතිචාරය අධ්‍යයනය සිදු කෙරිණි. ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම මෙම ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය ලබාදුණි.

## ජලජ ශාකවල ආහාර ගන්නා කොටස්වල බැර ලෝහ ප්‍රමාණය පිළිබඳ අධ්‍යයනය

ජලජ ශාකවල (කොහිල, කංකුං, වෙල්අල කොළ, රම්පේ සහ ඉකිරිය) ආහාරයට ගන්නා කොටස්වල යකඩ, කොපර්, මැග්නිසියම් සහ සින්ක් වැනි බැර ලෝහ ප්‍රමාණය පරීක්ෂා කරනු ලැබීය. එම ජලජ ශාක ලබාගන්නා ප්‍රදේශය සහ විශේෂය මත ජලජ ශාකවල ආහාරයට ගන්නා කොටස්වල අඩංගු බැර ලෝහ ප්‍රමාණය වෙනස් බව ප්‍රතිඵල මඟින් පෙන්නුම් කෙරිණි.

සියලුම සාම්පලවල මැංගනීස් සහ යකඩ ප්‍රමාණය කොපර් සහ සින්ක්වල උපරිම මට්ටමට වඩා ඉහළ බවත් අඩංගු Cu ප්‍රමාණය අහිතකර මට්ටම (1.0 - 64.0 mg/kg) ඉක්මවා නොයන බවත් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද සාම්පලවල වැඩි ප්‍රමාණයක අහිතකර නොවන මට්ටම වඩා මැංගනීස් (35 mg/kg) හා යකඩ (200mg/kg) ඉක්මවා යන බව පෙන්නුම් කෙරිණි. අධ්‍යයනයන් අඛණ්ඩය සිදු වේ.

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ගම්වල බීමට උපයෝගී කරන ජලයේ ගුණාත්මකබව

පානයට ගන්නා ජලයෙහි යෝග්‍යතාව තීරණය කිරීම උදෙසා තෝරාගත් රසායනික පරාමිතීන් සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශ 11ක පානීය ජලයෙහි ගුණාත්මක බව පරීක්ෂා කෙරිණි. අධ්‍යයනය ප්‍රදේශවලින් එකතු කර ගත් ජලයෙහි ආම්ලිකතාව අගය 6.7 - 7.5 අතර පරාසයක වූ පානීය ජල සාම්පල පරීක්ෂා කළ අතර එම ජල සාම්පල ආම්ලිකබව 6.5 - 7.5 අතර වූ පිළිගත් පරාසයක පැවතිණි. ජලයෙහි අධික විද්‍යුත් සන්නායකතාවය ජලයෙහි පවතින ලවණතාවය පිළිබිඹු කෙරෙන අතර මෙය පානීය ජලයෙහි තත්ත්වය පරීක්ෂා කිරීමේදී ඉතා වැදගත් පරාමිතියන් ලෙස සලකනු ලැබේ. පරීක්ෂා කළ ස්ථානයන්හි ජලයෙහි ලවණතාව පිළිබිඹු කරන්නා වූ විද්‍යුත් සන්නායකතාවය සාපේක්ෂව ඉහළ බව පෙන්නුම් කළ අතර 35.8 %ක් වැඩි ලවණතාවයක් පෙන්නුම් කෙරිණි. ජල සාම්පල වලින් 58%ක්ම මධ්‍යම ලවණතාවයෙන් යුතු බවත් පෙන්නුම් කෙරිණි. ජල සාම්පල වලින් 5.4%ක

ප්‍රමාණයක් අඩු ලවණතාවයකින් යුතු විය. අධ්‍යයනය ප්‍රදේශවල ජල සාම්පලවල ක්ලොරයිඩ් ප්‍රමාණය 19 – 1217 mgL $^{-1}$ අතර පරාසයක විය. වර්තමානයේ ජල සාම්පල වලින් 22%ක්ම අනුමත ලවණ මට්ටම ඉක්මවයි. එමනිසා එම ප්‍රදේශවල අධික විද්‍යුත් සන්නායකතාවයෙන් යුත් ජලයෙහි අධික ලවණතාවය ප්‍රධාන ගැටළුවක් බවත් අධ්‍යයනයට බඳුන් කළ ළිං බහුකරයක පානීය ජලයෙහි ෆ්ලෝරයිඩ්, කැල්සියම්, සෝඩියම් සහ ක්ලෝරයිඩ් ප්‍රමාණයද සැලකිය යුතු ලෙස වැඩි බව හෙළි විය. කෙසේ වුවද පානීය ජලයෙහි අඩංගු බැර ලෝහ ප්‍රමාණය ඉතාමත් අවම විය.

## ශ්‍රී ලංකාවේ භාවිත කරන ෆොස්පේට් පොහොරවල බැර ලෝහ මට්ටම අධ්‍යයනය

විවිධ රටවලින් ආනයනය කරන ෆොස්පේට් පොහොරවල බැර ලෝහ ප්‍රමාණය (Fe, Cu, Mn, Zn, Cd, Cr සහ pb) ප්‍රමාණය පරීක්ෂා කෙරිණි. විවිධ රටවලින් ගෙන්වූ පොහොරවල අපද්‍රව්‍ය ලෙස සැලකිය යුතු බැර ලෝහ (Fe, Cu, Mn, Zn, Cd, Cr සහ Pb) ප්‍රමාණයක් අන්තර්ගත විය. Fe, Cu, Mn සහ Zn වැනි ලෝහ ක්ෂුද්‍ර පෝෂක ලෙස සලකනු ලැබේ. එමනිසා ට්‍රිපල් සුපර් ෆොස්පේට් පසට එකතු කිරීම මඟින් පසට ක්ෂුද්‍ර පෝෂක ලබාදිය හැක. අධ්‍යයන අඛණ්ඩව පැවැත්වේ.

## විවිධ බෝග වගා ක්‍රමයන්හි පසෙහි ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය පිළිබඳ අධ්‍යයනය

විවිධ බෝග වගා ක්‍රමයන් ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය අධ්‍යයනය කරනු ලැබීය. ස්ථාන 4ක පස්වල ප්‍රතිඵල මඟින් වැඩිම Fe (21.9 – 205.7 mg/kg), Cu (0.16 – 3.76 mg/kg) සහ Mn (12.5 – 122.1 mg/kg) ප්‍රමාණයක් මාරස්සන ප්‍රදේශයේ පස් වලින් වාර්තා වු අතර වැඩිම Zn ප්‍රමාණයක් (0.42 – 28.4 mg/kg) අනුරාධපුර ප්‍රදේශයේ (වී - වී වගා බෝග වගා පද්ධති) දක්නට ලැබිණි. අඩුම Fe (2.4 – 26.4 mg/kg) හා Cu (0.15 – 1.2 mg/kg) ප්‍රමාණයක් නුවරඑළිය ප්‍රදේශයෙන් වාර්තා විය. අඩුම Mn (0.38 – 6.0 mg/kg) ප්‍රමාණයන් අනුරාධපුර ප්‍රදේශයෙන් වාර්තා විය. ස්ථාන කිහිපයක පස් සාම්පල හැර බහුල පස් සාම්පලවල ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණවලින් හිඟ නොවීය. අධ්‍යයනයන් තවදුරටත් අඛණ්ඩව පැවැත්වේ.

## සත්ව අපද්‍රව්‍යවල බැර ලෝහ තත්ත්වයන් අධ්‍යයනය

රමේ සෑම ප්‍රදේශයකම ගොවිපල්වලින් එකතු කර ගත් විවිධ වර්ගයේ සත්ව අපද්‍රව්‍ය (කුකුල් පොහොර, ගොම පොහොර, ඌරු සහ එළු පොහොර) වල Fe, Cu, Mn, Zn, Cd, Cr සහ Pb බැර ලෝහයන් පරීක්ෂා කෙරිණි. සියලුම වර්ගයේ සත්ව අපද්‍රව්‍යවල Fe ප්‍රමාණය අධික බව පෙන්නුම් කළ අතර මෙම වර්ග හතරෙන් ද එළු පොහොරවල (6.8 g/kg) වැඩිම Fe ප්‍රමාණයක් අන්තර්ගත විය.

කුකුල් පොහොරවල වැඩිම Cu (0.11 g/kg) සහ Mn (0.39 g/kg) අන්තර්ගත වූ අතර වැඩිම Zn (0.63 g/kg) සහ Cd (0.5 mg/kg) ප්‍රමාණයක් ඌරන්ගේ පොහොරවල අඩංගු විය. වැඩිම pb (1039 mg/kg) ප්‍රමාණයක් ගොම පොහොර වල අඩංගු වූ අතර වැඩිම Cr ප්‍රමාණයක් (0.5 mg/kg) එළු පොහොරවලින් හමුවිය.

## ශ්‍රී ලංකාවේ විවිධ බෝග වගා ක්‍රමයන්හි පාංශු සාරවත්බව ඇගයීමේ වැඩසටහන

තෝරාගත් ගොවිජන සේවා කොට්ඨාශයන්හි විවිධ බෝගවගා පද්ධතීන් හි පාංශු සාරවත් පරාමිතීන් ඇගයීම උදෙසා මෙම අධ්‍යයනය සිදු කෙරිණි. සාම්පල් එකතු කිරීම සහ

පරාමිතීන් විශ්ලේෂණය සම්පූර්ණ කරනු ලැබූ අතර ක්ෂුද්‍ර පෝෂක විශ්ලේෂණය අඛණ්ඩව සිදු කෙරිණි.

### විශ්ලේෂණාත්මක සේවය

2012 වර්ෂය තුළදී පාංශු සාම්පල් 280ක්, ජල සාම්පල 19ක්, ශාක සාම්පල 35ක්, කොම්පෝස්ට් සාම්පල 120ක් විශ්ලේෂණය කරනු ලැබූ නිර්දේශයට ඉදිරිපත් කරනු ලැබිණි. පෙර වර්ෂය හා සැසදීමේදී ක්ෂුද්‍ර පෝෂක පිළිබඳ ගැටළු විශ්ලේෂණය සඳහා ලැබූ ශාක සාම්පල් සංඛ්‍යාවෙහි පැහැදිලි වැඩිවීමත් දක්නට ලැබිණි. වර්ෂයේ පාංශු සහ කොම්පෝස්ට් විශ්ලේෂණ සේවා තුළින් ලද ආදායම් රු. 150, 490.00 කි. (රුපියල් එකසිය පනස් දහස් හාරසිය අනුවකි)

### ශිෂ්‍ය ව්‍යාපෘති

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් දෙදෙනෙක් ඔවුන්ගේ අවසන් වසර ව්‍යාපෘතිය සම්පූර්ණ කළහ. මෙයට අමතරව අම්පාර කෘෂිකර්මය පිළිබඳ හාඩි උසස් තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යයෙක් සහ ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ ශිෂ්‍යයෙක් මෙම අංශයේ ස්වකීය පුහුණුව සම්පූර්ණ කළහ.

## ව්‍යාප්ති ආර්ථික හා දත්ත කළමනාකරණ අංශය

දත්ත කළමනාකරණය, ආර්ථික විද්‍යාව ඇතුලත්ව තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ තාක්ෂණය ව්‍යාප්ති කටයුතු සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය හා පැවැත්වීම මෙම ආයතන සතු වගකීම වේ.

උද්‍යාන බෝග සම්බන්ධ තාක්ෂණික ප්‍රකාශන/ පත්‍රිකා 25ක් මුද්‍රණය කිරීමට ආධාර ලබා දුණි. පෝස්ටර් සහ තාක්ෂණික තොරතුරු ලබා දෙමින් විවිධ සංවිධානයන් මඟින් ශ්‍රී ලංකාව පුරා පවත්වනු ලැබූ ප්‍රදර්ශන සඳහා සහයෝගය දැක්වීය. කෘෂිකර්මාන්තය පිළිබඳ උනන්දුවක් දක්වන්නා වූ පුද්ගලයන් සහ සංවිධාන සඳහා පත්‍රිකා 8499ක් අලෙවි කෙරිණි.දුරකථන ඇමතුම් වලට පිළිතුරු ලබා දෙමින් තාක්ෂණය ව්‍යාප්ති කෙරිණි.මෙම ආයතනයේ විද්‍යාඥයින් විසින් පවත්වනු ලැබූ උද්‍යාන බෝග පිළිබඳ පුහුණු වැඩසටහන් 58ක් මෙම අංශය මඟින් සංවිධානය කෙරිණි.

සමාලෝචිත වර්ෂය තුළදී මෙම අංශය, පහත සඳහන් ආයතන / පාසල් සහ ගොවි සංවිධාන සඳහා දැනුවත් වීමේ වැඩසටහන් පවත්වනු ලැබිණි.

**වගුව 1. 2. 3 : 2012 වර්ෂයේ දී පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්**

| කාණ්ඩය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| පාසැල් ශිෂ්‍යයින් | 15,990 |
| පාසැල් ගුරුවරුන් | 503 |
| පාසැල් පුහුණු විද්‍යාල | 445 |
| ගොවීන් /ව්‍යවසායකයින් | 241 |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් | 134 |
| පෞද්ගලික තාක්ෂණ විද්‍යාල | 35 |
| තාක්ෂණික ආයතන | 172 |

### කෘෂිකර්ම කෞතුකාගාරය

සෑම වැඩකර දිනයකම සහ ඉල්ලීම පරිදි රජයේ නිවාඩු දිනවල පෙ. ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා කෘෂිකර්ම කෞතුකාගාරය විවෘතව තැබේ. සාම්ප්‍රදායික කෘෂිකර්මික උපකරණ සහ එම උපකරණ ක්‍රියාත්මක කරන ආකාරය, සාම්ප්‍රදායික ගබඩාවල ආදර්ශ මෙම ප්‍රදර්ශන භාණ්ඩ වලට ඇතුලත්ය. මෙම

භාණ්ඩ ප්‍රදර්ශනයන්ට අමතරව සාම්ප්‍රදායික කෘෂිකර්මය පිළිබඳව තොරතුරු ද ලබා දෙයි. 2011 වර්ෂයේ දී "කමත් භාෂාව" එනම් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ දී යොදා ගත් වචන පිළිබඳ පත්‍රිකා 2013ක් බෙදා හරිනු ලැබීය. විවිධ කරුණු පිළිබඳව උනන්දුවක් දක්වන්නා වූ විවිධ නරඹන්නෝ දිනපතා මෙම කෞතුකාගාරය නැරඹීමට පැමිණෙති.

### මධ්‍යම පුස්තකාලය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පුස්තකාලය සතුව දේශීය සහ විදේශීය සඟරා කිහිපයක පැරණි සහ නව මුද්‍රණයන්, පොත් සහ ඉතිහාසය පිළිබඳ තොරතුරු එකතුවක් මෙන්ම සංයුක්ත තැටි වලට ලබා ගත හැකි පහසුකම සහිතව ඇත.

- නොමිලේ සහ හුවමාරු පදනම මත වසර පුරාම විදේශීය සඟරා 251කට අධික සංඛ්‍යාවක් පුස්තකාලය වෙත ලැබිණි.මෙයට අමතරව පුස්තකාලය ස්ටර්ලින් පවුම් 5750ක් පොදුරාජ්‍ය මණ්ඩලීය අන්තර්ජාතික කෘෂිකර්ම කාර්යාංශය වෙත වාර්ෂික දායක මුදල ලෙස ගෙවීය.

- තොරතුරු ලබා ගැනීම උදෙසා පුස්තකාලය වෙත පුද්ගලයෝ 1000කට වැඩි සංඛ්‍යාවක් පැමිණියහ. පොත් 850ක් පමණ සාමාන්‍ය පොත් කියවීමේ සේවාව සහ අන්තර් පුස්තකාල පොත ලබාගැනීම සේවාව යටතේ සංසරණය වේ.

- පර්යේෂණ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි අතීත තොරතුරු සොයන්නන් 60කට වැඩි සංඛ්‍යාවක් පුස්තකාලය භාවිතා කෙරිණි.තොරතුරු සෙවුම් 42ක් පමණ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කොමිසමේ ආධාර යටතේ සිදු කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරීන් සඳහා පුස්තකාලය භාවිත කරන්නන්ගේ සමුළුවක් පවත්වනු ලැබිණි.

- පර්යේෂණ නිලධාරීන් 200ක් පමණ අන්තර්ජාල පහසුකම් උපයෝගී කර ගැනිණි. කාලීන තොරතුරු ලබා ගැනීමට AGRIS CD- ROM පද්ධතිය ආධාර වූ අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාවේ සහ සර්ම කලාපීය කෘෂිකර්මවේදීන්ගේ සඟරාවේ ලිපි වලට අනුකූලව ඉතාමත් මෑත කෘෂිකාර්මික තොරතුරුවලට අනුකූලව WEBAGRIS දත්ත වගුව යාවත්කාලීන කිරීමේ කටයුතු සාර්ථක විය. මෙයට අමතරව 2012 ජාතික කෘෂිකර්ම ආශ්‍රිත ග්‍රන්ථ ලේඛණය හට කෘෂිකාර්මික දත්ත ලබා දීමට හැකි විය.
- AGRINET පටුන පිටු සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරුණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පටුන පිටු 150කට වැඩි සංඛ්‍යාවක් බෙදා හැරිණි.

- මධ්‍යම පුස්තකාලය 2012 වර්ෂය තුළ දී සර්ම කලාපීය කෘෂිකර්ම වේදීන්ගේ සඟරාව දේශිය හා විදේශිය ආයතන සමග බෙදා හැරිය අතර PURNA දත්ත වගුව සඳහා ලිපි 1000ක් සහ පොත් 3200ක් ලබා දුණි.

### සංවර්ධන සහ තාක්ෂණ ව්‍යාප්ති කාර්යයන්

#### එළවළු

- **පළා එළවළු වර්ග වල බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා දීම**

තම්පලා, නිවිති, සාරණ, පැකෝයි, අසමෝදගම් යන පලාවල වල බීජ 1.72 kgක් නිෂ්පාදනය කෙරිණි.ගොටුකොළ, මුකුණුවැන්න, කන්කුන්, මින්චි,

කොරියන් ගොටුකොළ වල රෝපණ ද්‍රව්‍යය kg 1132.8ක් නිෂ්පාදනය කර ගොවීන් සහ ව්‍යාප්ති නිලධාරීන් අතර බෙදා හැරිණි.

- **පුහුණු වැඩසටහන්**

පුහුණු හා උපදේශක සේවාවන්

| | |
|---|---|
| පශ්චාත් උපාධි අධ්‍යානයන් | 01 |
| විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් | 04 |
| ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ශිෂ්‍යයින් | 02 |
| ගොවීන් | 87 |
| ව්‍යාප්ති නිලධාරීන් | 11 |

- **අභිජනන බීජ නිෂ්පාදනය**

පඳුරු පොලොන් මෑ kg 31.5 ක් සහ සේන මෑ kg 8ක බීජ අංශය වෙත බාර දුණි.

- **පිපිඤ්ඤා ශෂ්‍ය විද්‍යාව**

(ඒක මුහුම්) F1 දෙමුහුම් පිපිඤ්ඤා ප්‍රභේදයෙහි නයිට්‍රජන් හා පොටෑසියම් යෙදීමට දක්වන ප්‍රතිචාරය සහ කරල් පිපිරීම) මූලික අධ්‍යයනයන් මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත පොහොර ප්‍රමාණයන් යෙදීම මඟින් H18 ප්‍රභේදයේ අපේක්ෂිත අස්වැන්න ප්‍රමාණය ලබා ගත හැකි බව හෙළිදරව් විය.

**පළතුරු සහ පටක රෝපණ**

- නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 4ක් ද විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා පුහුණු වැඩසටහන් 7ක් ද පැවැත්විණි.
- ගොවීන් 105ක් සඳහා පුහුණු වැඩසටහන් 4ක් පැවත්විණි.
- කාර්යාලවලට පැමිණි ගොවීන්ගේ ගැටළු විසඳූ අතර අවශ්‍ය උපදෙස් ලබා දුණි.
- පළතුරු වගාව පිළිබඳ දුරකථනය මඟින් ලැබුණු ගැටළු 360කට පමණ විසඳුම් ලබා දුණි. පළතුරු බෝග වගාව සහ ගොවීන්ගේ, ශිෂ්‍යයින්ගේ ගැටළු සම්බන්ධයෙන් ලැබුණු ලිපි 100කට අධික සංඛ්‍යාවකට පිළිතුරු ලිපි යවන ලදි.
- අනුරාධපුර දැයට කිරුළ ප්‍රදර්ශනය යටතේ පිහිටවනු ලැබූ ආදර්ශ ගම්මාන 18ක් සඳහා එක් දින පුහුණු වැඩසටහනක් සංවිධානය කෙරිණි. මෙයට අමතරව ගොවීන් 800ක් සඳහා (එක් එක් ග්‍රාමයේ පළතුරු බෝග වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.
- අනෙකුත් නිලධාරීන්ගේ සහයෝගය ඇතිව පර්යේෂණ නිබන්ධනයක් පලකෙරිණි.


1. කේ. පී. එස්. සෙනෙවිරත්න සහ කේ. ටී. එම්. එස්. පෙරේරා රතු මාංශල ඩ්‍රැගන් ෆෘට් (*Hylocerus* spp) හි වැඩි පළතුරු ප්‍රමාණයක් ලබා ගැනීම උදෙසා දිවා කාලයේදී මල් පොහොට්ටු පරාගනය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව - 2012,
2. කේ.පී.එස්. සෙනෙවිරත්න සහ ඩී.කේ. එන්. ජී. පුෂ්පකුමාර, මාදං (*Syzygium cumini*) 8වන පරිච්ඡේදය, ශ්‍රීලංකාවේ ඌන උපයෝජිත පළතුරු ශාක, වෙළුම 2 ISBN 978 – 955 – 9224 – 34 – 1, 2011, පිටු අංක 148 – 157


- පුවත්පත් ලිපි 8ක් ප්‍රකාශයට පත් කෙරිණි.
- 2012 වර්ෂය සඳහා පළතුරු බෝග වගාව සහ පටක රෝපණය පිළිබඳ පුහුණු වැඩසටහන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුට සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු

අධිකාරියේ ඩිප්ලෝමා ශිෂ්‍යයින් 4දෙනෙකු අධීක්ෂණය කෙරිණි.

- අනුරාධපුර ඔයාමඩුවේදී පැවත් වූ 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශන කුටි සැකසීම සහ ප්‍රදර්ශන කුටි රාජකාරී සඳහා සහභාගී විය.
- ගන්නෝරුවේ දී පැවත්වූ ශත සංවත්සර ප්‍රදර්ශනයට දායකත්වය සැපයීය. උයන් සංවිධානය සහ සැකසීම සිදු කෙරිණි. උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ දී පළතුරු වෙළඳ කුටි සංවිධානය කෙරිණි.
- පර්යේෂණ ගොවිපල පස්යාල, වල්පිට සහ අඹතැන්න සහ උල්පොතගම පර්යේෂණ ස්ථානයන් 4, ද වල්ගොල්ල අනුවර්ති පර්යේෂණයද පළතුරු අංශය විසින් අධීක්ෂණය කරනු ලැබිණි. සියලුම ගොවිපල හා පර්යේෂණ ස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කෙරිණි. පස්යාල සහ වල්පිට පර්යේෂණ ගොවිපල හි හෙක්ටයාර 4ක භූමි ප්‍රදේශයක අන්නාසි වගාව ආරම්භ කරනු ලැබූ අතර වල්පිට සහ උල්පතගම පර්යේෂණ ගොවිපලෙහි අඹ ගස් 1000ක් පමණ නැවත සකස් කෙරිණි. සියලුම ගොවිපලවල් 4හි රෝපණ ද්‍රව්‍යය නිෂ්පාදනය සිදු කෙරිණි.
- ව්‍යාපෘති.

කෘෂිකර්ම දෙපාර්තමේන්තු විශේෂ ව්‍යාපෘති අරමුදල් සැපයීම යටතේ පටක රෝපණ පැළෑටි ද්‍රව්‍යය නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කෙරිණි. පටක රෝපණ 4000ක් පමණ නඩත්තුව උදෙසා පරීක්ෂණාගාර පහසුකම් පුළුල් කෙරිණි. එළඹෙන වසරේ සිට කෙසෙල් පැල 50,000ක් සහ අන්නාසි පැල 100,000ක් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබයි.

**කෙසෙල් සහ අන්නාසි මූලික රෝපණ ද්‍රව්‍යය නිෂ්පාදන**

**වගුව 1.2.4 : පටක රෝපිත ශාඛවල වර්තමාන තත්ත්වය**

| බෝගය | ප්‍රභේදය | ශාක | |
|---|---|---|---|
| | | නලස්ථ | පැළෑටි ගෘහ |
| කෙසෙල් | ඇම්බන් | 15,000 | 1200 |
| | කෝලිකුට්ටු | 10,000 | 800 |
| අන්නාසි | මුරුසි | 25,000 | 1500 |

## මුල් සහ ආකන්ධබෝග සහ මල් වගාව

- දැයට කිරුළ 2013 යටතේ ප්‍රදේශයේ ගොවින් හට රෝපණ ද්‍රව්‍යය සැපයීමට දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ අම්පාර මල්වත්ත ගොවිපලෙහි මුල් සහ ආකන්ද බෝග අක්කර 1.5ක භූමි ප්‍රදේශයක ඉදි කෙරිණි.
- **පැළෑටි ජාන සම්පත් ව්‍යාපෘතියෙහි ඒකාබද්ධ කළමනාකරණ පද්ධති**

  පැළෑටි ජාන සම්පත් ඒකාබද්ධ කළමනාකරණ පද්ධති ව්‍යාපෘතිය යටතේ ඩයස්කොරියා (Dioscorea ) එකතුන් 25ක් (*Dioscorea alata, Dioscorea esculenta, Dioscorean bulbifera* spp ට අයත්) එකතු කරනු ලැබිණි. ගුණනය සහ සංරක්ෂණය සඳහා උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයේ ගොවිපල වල මෙම එකතූන් ස්ථාපිත කෙරිණි. මෙම එකතුන්ගේ ලක්ෂණීකරණය ආරම්භ කෙරිණි.

  පැළෑටි ජාන සම්පත් ඒකාබද්ධ කළමනාකරණ ව්‍යාපෘති යටතේ ප්‍රභේද 17ක් එකතු කෙරිණි. ගුණනය සහ සංරක්ෂණය උදෙසා ගෙවතුවල මෙම එකතුන් ස්ථාපිත කෙරිණි. මෙම එකතුන්ගේ ලක්ෂණීකරණය ආරම්භ කෙරිණි.

- **$Co_2$ ඉහල දැමීමේ ව්‍යාපෘතිය**

  මෙම ව්‍යාපෘතියේදී තක්කාලි දෙමුහුම් ප්‍රභේද පරීක්ෂා කෙරිණි. $Co_2$ වැඩි කළ ශාක වල වැඩි අස්වැන්නක් ලබා දුණි.

- **ප්‍රදර්ශන 2කට සහභාගී විය**

  දැයට කිරුළ - ඔයාමඩුව
  ශත සංවත්සර ප්‍රදර්ශනය - ගන්නෝරුව

- **ගුවන්විදුලි වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් සහ පුහුණු වැඩසටහන්**

  2012.11.09 වන දින මුල් සහ ආකන්ධ බෝග වගාව පිළිබඳව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ජාතික සේවයේ (දෙමළ) එක් ගුවන්විදුලි වැඩසටහනක් පැවැත්විය. මුල් සහ ආකන්ධ බෝග වගාව සහ ගෙවතු වගාව පිළිබඳව (දෙමළ මාධ්‍ය) උද්‍යාන බොග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේදී 2012. 05. 31 දින සහ 2012. 12. 06 වන දින පුහුණු වැඩසටහන් 2ක් පැවැත්විණි. මෙයට පුද්ගලයින් 60ක් සහභාගී විය. (ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවයේ අසන්නන් කණ්ඩායම, අයිෂා සිද්දීක් අධ්‍යාපනික ආයතනයේ ශිෂ්‍යයින්)

  ගෙවත්තක් සැලසුම් කිරීම සහ වැඩිදියුණුකිරීම පිළිබඳ පුහුණු වැඩමුළු 9ක් පවත්වනු ලැබීය. විවිධ සංවිධාන වල සාමාජිකයින් සහ ඉල්ලුම් කළ පුද්ගලයින් 375දෙනෙකු පුහුණු කරනු ලැබූ අතර ගෙවතු වගාව පිළිබඳව තාක්ෂණික සහරා ඔවුන් හට ලබා දුණි. ප්‍රභේද 7ක බීජ පැකට් 1215ක් බෙදා දුණි.

- ගොවි ක්ෂෙත්‍ර පරීක්ෂණයන්, සහ වඩා හොඳ රෝපණ පිළිවෙත් පිළිබඳ උපදෙස් ලබා දීම ඇතුළුව සන්නිවේදන ආශ්‍රිත වෙනත් කාර්යයන් ලිපි මඟින් හෝ දුරකථන මඟින් ගොවීන්ගේ විමසුම් වලට පිළිතුරු ලබා දුන්නේය. මෙම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 200කි.

## කීට විද්‍යාව

- බෝග සායන 6ක් සඳහා සම්පත් දායකයින් ලෙස දායකත්වය සැපයීම.
- කාබනික ගොවිතැන පිළිබඳ පුහුණු වැඩසටහන් 20ක් සඳහා සම්පත් දායකයින් ලෙස දායකත්වය දැක්වීම
- කෘමි පළිබොධ ගැටළු පිළිබඳ ගොවීන් සමග සාකච්ඡා කර විසඳීමට උපදෙස් ලබාදීමේ කටයුතු - 75
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු ශත සංවත්සර ප්‍රදර්ශනය ඇතුළු ප්‍රදර්ශන 2කට දායකත්වය ලබාදීම සහ පළිබෝධ ගැටළු විසඳීම උදෙසා ගොවීන් 1500දෙනෙකුට උපදෙස් ලබා දීම

- විශේෂ බීජ වගාව පිළිබඳව ඇගයීම - 07
- කෘෂි තාක්ෂණ උද්‍යානයේ කෘමි සත්ව උද්‍යානය නඩත්තුව සහ මෙම කෘමි සත්ව උද්‍යානය නැරඹීමට පැමිණි පුද්ගයින් 40,000කට පමණ ඒ පිළිබඳව තොරතුරු ලබාදීම
- මී මැසි උද්‍යානය සහ මී මැසි කොලනි නිදර්ශන සඳහා වසර පුරාම විවිධ මල් පැල එකතුවක් නඩත්තු කරමින් මී මැස්සන් හට පරාග සහ මී පැණි ලබා ගත හැකි බව ඉහළ දැමීය. මෙම මී පැණි කොලනි පුද්ගලයින් 500කට පමණ නිදර්ශනය කෙරිණි. මී මැසි කොලනි මඟින් මී පැණි 11Kgක් පමණ එකතු කර ගැනීමට හැකිවිය.

## ව්‍යාධිවේදය සහ බිම්මල්

- ඔයිස්ටර් බිම්මල් වගාව පිළිබඳ පුද්ගලයින් 1082ක් පුහුණු කෙරිණි. කුඩා පරිමාණ බිම්මල් වගා කරුවන් ලෙස ලියාපදිංචි වූ පුද්ගලයින් හට සහතික නිකුත් කෙරිණි.
- පිදුරු බිම්මල් වගාව පිළිබඳව පුද්ගලයින් 10ක් පුහුණු කරනු ලැබිණි. වාණිජමය වශයෙන් මහා පරිමාණ බිම්මල් වගාව පි ළිබඳ පුද්ගලයින් 88 දෙනෙකු පුහුණු කෙරිණි.
- තැපැල් මඟින් ගොවීන් 09 දෙනෙකු හට හා දුරකථන මඟින් 730 දෙනෙකුට උපදෙස් ලබා දුණි. ගොවීන් 507 දෙනෙක් උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය නැරඹීමට පැමිණියහ.
- උසස් පෙළ ශිෂ්‍යයින් 26 දෙනෙකු හට ඔවුන්ගේ කේවල ව්‍යාපෘතිය සඳහා බිම්මල් වගා තාක්ෂණය ලබා දුණි.
- බිම්මල් වගාව සහ මහා පරිමාණ ලෙස බිම්මල් නිෂ්පාදනය පිළිබඳ යාපනය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් 40 දෙනෙක් පුහුණු කරනු ලැබීය.
- අම්පාර කෘෂිකර්ම ඩිප්ලෝමා ශිෂ්‍යයින් සඳහා ස්වකීය ව්‍යාපෘතියහට ආධාර කිරීම.
- ප්‍රදර්ශන 2ක් පැවැත්විණි.
    1. දැයට කිරුළ - අනුරාධපුර
    2. ගොවිසතිය - ගන්නෝරුව (කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශත සංවත්සර උත්සවය) මෙයට අමතරව මන්නාරම සහ ගම්පහ දිස්ත්‍රික් අධ්‍යක්ෂ කාර්යාල සහ කුලියාපිටිය උසස් අධ්‍යාපන ආයතනය මඟින් පැවැත් වූ ප්‍රදර්ශන 3ක් සඳහා පෝස්ටර්, ප්‍රදර්ශන ද්‍රව්‍ය සහ උපදෙස් ලබා දුන්නේය.
- විවිධ රාජ්‍ය නොවන සහ රාජ්‍ය සංවිධාන හා එක්ව බිම්මල් වගාව සහ ව්‍යාපාරයක් වශයෙන් විශාල ප්‍රමාණයන්ගෙන් බිම්මල් වගාව පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළු පවත්වන ලදී. (මේ යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යවසායික සංවර්ධන තොරතුරු සේවයේ පුද්ගලයින් 23 දෙනෙකු මහඉලුප්පලම සේවා සංස්කරණ පුහුණු ආයතනය 30 දෙනෙකු, කැගල්ල සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ කෘෂිකර්ම උපදේශකවරුන් 30, IRAD ගම්පොළ සහ අම්බලන්ගොඩ 142 දෙනෙකු, හොරණ සහ රත්නපුර විද්‍යතා මධ්‍යස්ථානවල පිළිවෙලින් 56 දෙනෙකු සහ 58 දෙනෙකු මොරගහකන්ද මහවැලි අධිකාරියේ 24 දෙනෙකු මධ්‍යම පරිසර අධිකාරියේ 54 දෙනෙකු පුහුණු කෙරිණි.
- ඉලෙක්ට්‍රොනික මාධ්‍යය හරහා සහභාගිත්ව තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාවලීන් ගුවන් විදුලි වැඩසටහන් 4, වගා මාධ්‍යයක් ලෙස පිදුරු උපයෝගී කරගනිමින් බිම්මල් වගාව, වියළි බිම්මල්හි අගය වැඩි නිෂ්පාදන (රන්ගිර දඹුලු ගුවන් විදුලි සේවාව), විශාල වශයෙන් බිම්මල් නිෂ්පාදනය (කළුතර ගුවන් විදුලි සේවාව) සහ ස්වාධීන රූපවාහිනිය සහ ජාතික රූපවාහිනිය ඔස්සේ රූපවාහිනී වැඩසටහන් 2ක් පවත්වනු ලැබිණි. ආහාරයට ගත හැකි බිම්මල් ප්‍රභේද සහ අඩු පිරිවැයකින් බිම්මල් නිෂ්පාදනය (ගොවිබිමට අරුණලු), පිදුරුවල ඔයිස්ටර් බිම්මල් වගාව පිළිබඳ පුවත්පත් ලිපියක් රිවිර පුවත්පත් පළ විය.
- මාපනා මඩුල්ල - ලහිරු බිම්මල් සහ ගිනිගත් හේන සඳුනි බිම්මල් හි - විශාල

වශයෙන් නිෂ්පාදන කෙරෙන ඒකක 2ක් ස්ථාපිත කෙරිණි.

- ගොවීන් අතර පිදුරු බිම්මල් සහ ඔයිසටර් බිම්මල් වගාව ප්‍රචලිත කිරීම උදෙසා පිදුරු බිම්මල් පැකට් 217ක් සහ ඔයිස්ටර් බිම්මල් පැකට් 7ක් බෙදා දෙන ලදී.
- කල්තොට බලංගොඩ ප්‍රදේශයේ ගොවීන් 45 දෙනෙකු අක්කර 30ක් වගා කොට වැල් දොඩම් නිෂ්පාදනය පුළුල් කරන ලදී.

## රසායන විද්‍යාව

- **ශ්‍රී ලංකාවේ විවිධ බෝග වගා කිරීම් ක්‍රම යටතේ පාංශු සාරවත්බව ඇගයීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරා ගත ගොවිජන සේවා මධ්‍යස්ථාන කොට්ඨාශයන්හි විවිධ බෝග වගාකිරීම් ක්‍රම යටතේ පාංශු සාරවත්බව ආශ්‍රිත පරාමිතීන් ඇගයීම උදෙසා අධ්‍යයනයක් පවත්වනු ලැබීය. සාම්පල එකතු කිරීම දැනටමත් සම්පූර්ණ කර ඇති අතර විශ්ලේෂණයන් සිදු කිරීමට නියමිතය. මෙම අධ්‍යයනයන් උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පාංශු රසායන විද්‍යා අංශය සම්බන්ධීකරණය කරනු ලබන අතර සාම්පල් ගත කිරීම සහ විශ්ලේෂණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම ආයතන මඟින් සිදු කෙරේ.

- විශ්ලේෂණ සේවාවන්
2011 වර්ෂය තුළදී පස් සාම්පල් 2000ක් ජල සාම්පල් 200ක්, පැළෑටි සාම්පල් 27ක්, කොම්පෝස්ට් සාම්පල් 100ක් විශ්ලේෂණය කරනු ලැබ වාර්තා ඉදිරිපත් කර තිබේ. 2011 වර්ෂය තුළදී පෙර වර්ෂය හා සාපේක්ෂව විශ්ලේෂණය සඳහා ලැබුණු පස් සාම්පල් සංඛ්‍යාවෙහි වැඩිවීමත් දක්නට ලැබිණි. වර්ෂය තුළදී විශ්ලේෂණ සේවාවන් මඟින් ලැබුණු ආදායම රු. 168, 830.00 කි. (රුපියල් එකසිය හැටඅටදහස් අටසිය තිහකි)

## වෙනත් කාර්යයන්

### ව්‍යාධිවේදය සහ බිම්මල්

**ප්‍රදාන**

- ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමරාච්චි

"පටක රෝපිත ශාක වල කෙසෙල් වඳපීදීම ඇති කරන්නා වූ වයිරසය ශාක විශාල ප්‍රමාණයක එකවර හඳුනා ගැනීම උදෙසා නව අණුක ක්‍රමෝපාය පිළිබඳව හොඳම පෝස්ටරය ඉදිරිපත් කිරීම උදෙසා වූ ප්‍රදානය සැප්තැම්බර් 20 -21 දින පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය.

- ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමරච්චි

ආචාර්ය උපාධිය (ශාක ව්‍යාධිවේදය) හි සමස්ම ඉහළම පන්තියේ ලකුණු සාමාන්‍ය ලබාගැනීමට සමත්වීම වෙනුවෙන් සමස්ත කුසලතාව සඳහා කෘෂිකර්ම විද්‍යා විශ්ව විද්‍යාලයේ රන් පදක්කම ඉන්දියාවේ, බැංගලෝරයේ 2012 අප්‍රේල් 13 වන දින පැවැත් වූ 46 වන වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රදානය කෙරිණි.

## 2012 වර්ෂයේදී සහභාගි වූ පුහුණු / වැඩමුළු

- ආර්. ජී. ඒ. එස්. රාජපක්ෂ

කෘෂිකාර්මික, පාරිසරික සහ කර්මාන්ත උපයෝගීතාවයන් සඳහා කොළ පැහැති විකිරණ සැකසීම පිළිබඳ ප්‍රතිපත්ති සකස්කරන්නන් සහ අවසාන භාවිතකරන්නන් සඳහා වූ කලාපීය විධායක කළමනාකරණ රැස්වීම. වියට්නාමය 2012 අගෝස්තු 27 -31

- ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමරාච්චි

අන්තර්ජාතික කෙසෙල් සම්මේලනය සහ පුහුණු වැඩමුළුව. තායිවානය 2012 නොවැම්බර් 19 – 24 දක්වා

- ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමාරච්චි

  කේ. රාමක්‍රිෂ්නන් (හිටපු පීඨාධිපති), කෘෂිකර්ම විද්‍යා විශ්ව විද්‍යාල, ආචාර්ය උපාධිය (ශාක ව්‍යාධිවේදය) සමස්ත හොඳම කාර්යසාධන උදෙසා පිරිනමන්නාවූ අනුස්මරණ රන් පදක්කම - කෘෂිකර්ම විද්‍යාව, විශ්වවිද්‍යාලය බැංගලෝර් ඉන්දියාව 2012 අප්‍රේල් 13වන දින 46 වන උපාධි ප්‍රදානෝත්සවේදී ප්‍රදානය කෙරිණි.

### ශිෂ්‍ය ව්‍යාපෘති

පේරාදෙණිය විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු සහ සබරගමුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු ස්වකීය අවසන් වසර ව්‍යාපෘති සම්පූර්ණ කරනු ලැබිණි. මෙයට අමතරව අම්පාර හාඩි කෘෂිකර්ම උසස් තාක්ෂණ විද්‍යාලයේ ශිෂ්‍යයින් තුන් දෙනෙකු සහ ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ ශිෂ්‍යයින් හතර දෙනෙකු ශාක පිළිබඳ පුහුණුව සම්පූර්ණ කෙරිණි.

## 2013 සැලැස්ම

### එළවළු අංශය

**බටු, තක්කාලි, මාළු මිරිස්, කරවිල සහ වැටකොළු දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම**

- බෝංචි, මෑ, දඹල විවෘත පරාගණ ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- සාම්ප්‍රදායික එළවළු බීජ නිෂ්පාදනය.
- තක්කාලි, බටු, මෑ, වැටකොළු, කරවිල සහ දඹල අභිජනන බීජ නිෂ්පාදනය. දඹල මෙවර පමණක් බීජ නිෂ්පාදනයට ඇතුලත් කෙරිණි.
- දැනටමත් නිකුත් කර ඇති $F_1$ දෙමුහුම් ප්‍රභේදවල මව් ආරවල බීජ නිෂ්පාදනය. ඉදිරි වර්ෂයේදී පමණක්
- දෙමුහුම් බීජ නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිකිරීම සහ උචිත කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම උදෙසා ක්‍රමෝපායන් සහ මූලික පර්යේෂණ

**පළතුරු සහ පටක රෝපණ**

- ශ්‍රී ලංකාවේ උගුරැස්ස වගාව පිළිබඳ ගවේෂණ, සංරක්ෂණ සහ ප්‍රචාරණ අධ්‍යයන.
- වැඩි අස්වැන්නක් සහ ගුණාත්මකබවක් සඳහා හොඳම මවු ආරවල එකතුන් හඳුනාගැනීම උදෙසා දූරියන් ප්‍රභේද දෙමුහුම්කරණය හෝ දූරියන් දෙමුහුම් නිෂ්පාදනය කිරීම සඳහා හොඳම මවු එකතුන් හඳුනාගැනීම.
- ඉහළ තත්ත්වයෙන් යුත් සහ වැඩි අස්වැන්නක් ලබාදෙන ප්‍රභේද වැඩිදියුණු කිරීමට ඩ්‍රැගන් ෆෘට් දෙමුහුම්කරණය සහ වරණය.
- අඹ බද්ධකිරීම පිළිබඳ අන්තර් ග්‍රාහක සහ මුල් ග්‍රාහක ප්‍රභේදයන්හි බලපෑම.
- වැඩි අස්වැන්නක් සහ ගුණාත්මක ඉහළ ප්‍රභේද හඳුනාගැනීම උදෙසා ඇඹන් කෙසෙල් එකතුන් ගවේෂණය, සංරක්ෂණය සහ ඇගයීම.
- අස්වැන්න සහ වෙනත් ගුණාංග උදෙසා දෙමුහුම් දැන් පවතින නුමුහුම් ආර සහ දෙමුහුම් ඇගයීම උපයෝගී කොට පැපොල් දෙමුහුම් වැඩිදියුණු කිරීම.
- ප්‍රේරිත විකෘති තුළින් වැඩි අස්වැන්නක්, හොඳ ගුණාත්මක තත්ත්වයක් සහ රෝගයන්ට ප්‍රතිරෝධී කෙසෙල් ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- වැඩි අස්වැන්නක්, හොඳ ගුණාත්මක තත්ත්වයන් සහ රෝගයන්ට ප්‍රතිරෝධී කෙසෙල් ජනකප්ලාස්ම වරණය.
- ප්‍රේරිත විකෘති මඟින් වැඩි අස්වැන්නක්, හොඳ ගුණාත්මක තත්ත්වයක් සහිත රඹුටන් ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- වැඩි අස්වනු ලබාදෙන හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුත් පැපොල් ප්‍රභේද / දෙමුහුම් වැඩිදියුණු කිරීම.
- වැඩි අස්වැන්න, ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් රඹුටන් වගාව

ප්‍රවර්ධනය උදෙසා පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම.

- "ෆාදර් ලෝන්" කොස් ප්‍රභේදයේ මුල්ග්‍රාහක සහ රිකිලි බද්ධ ශාකවල බීජ ප්‍රමාණය සහ වර්ධක මාධ්‍යහි බලපෑම අධ්‍යයනය.
- ආදර්ශ ගම්මාන 4ක් පිහිටුවීම.
- පර්යේෂණ ගොවිපල 4ක් සහ රෝපණ මාධ්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම.

**මුල් සහ ආකන්ධ බෝග සහ මල්වගාව**

- බතල සහ මඤ්ඤොක්කා ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන
  - තෝරාගත් මඤ්ඤොක්කා ප්‍රභේදයන්හි ප්‍රභේද ඇගයීම.
- ස්ථාන 5කින් තෝරාගත් බතල ප්‍රභේදයන්හි ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන
  - ස්ථාන 4කින් තෝරාගත් බතල ප්‍රභේදයන්හි ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම.
  - අධික වියළි සහ ලවණතාවයට ප්‍රතිරෝධී ජාත්‍යන්තර අර්තාපල් මධ්‍යස්ථාන බතල ආරවල ප්‍රභේද ඇගයීම
  - තෝරාගත් ප්‍රභේදයන්හි අස්වනු නෙලීමේ කාලය තීරණය.
  - නිර්දේශිත ප්‍රභේදයන්හි මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.
- සියලුම මුල් සහ ආකන්ධ බෝගවල ජනක ප්ලාස්ම නඩත්තුව
- මුල් සහ ආකන්ධ බෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී ආදර්ශ ගෙවතු වගා නඩත්තුව
- ගෙවතු වගා සඳහා අනුවර්ති ඌන උපයෝජිත බෝග ප්‍රභේදයන් එකතුව, නඩත්තුව සහ ඇගයීම
- ගෙවතු සැලසුම්කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව.
- නවතම නිෂ්පාදන ලෙස වටිනාකමක් සහිත විසිතුරු භාණ්ඩ සෑදිය හැකි ආවේනික සහ දේශීය ශාක ප්‍රවර්ධනය
- තක්කාලි දෙමුහුම් ප්‍රභේද සමඟ $CO_2$ ඉහළ දැමීමේ ව්‍යාපෘතිය.
- "ශාක ජාන සම්පත් ඒකාබද්ධ කළමනාකරණ පද්ධතිය" ව්‍යාපෘතිය යටතේ ගෙවතු වගාව සඳහා අනුවර්ති ඌන උපයෝජිත බෝග ප්‍රභේදයන් එකතුව, සංරක්ෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම
- බෝග නිෂ්පාදනය සහ මඤ්ඤොක්කා පසු අස්වනු සැකසීම සඳහා කෘෂිකාර්මික යාන්ත්‍රිකරණ තාක්ෂණයන් පුළුල් කිරීම.

**ව්‍යාධිවේදය**

- මැලවීම සහ කඳ පාමුල කුණුවීම සඳහා බටු, තක්කාලි සහ මාළු මිරිස් ජනකප්ලාස්ම පරීක්ෂා කිරීම.
- රෝග හඳුනාගැනීම උදෙසා ආනයනික බීජ සහ වෙනත් රෝපණ ද්‍රව්‍ය පරීක්ෂණාගාර හා හරිතාගාර පරීක්ෂණ
- නලස්ථ බැක්ට්‍රීයා රෝග කළමනාකරණය සඳහා ස්වභාවික බහුඅවයවක සංයෝගයන්හි (කයිටොසාන්) ඵලදායීතාවය.
- රඹුටන්, කරවිල, මිරිස් සහ පළා ඵලවළුහි පළිබෝධ පාලනය සම්බන්ධ නියමු මට්ටමේ කයිටොසාන් පරීක්ෂාව
- පළතුරු බෝග පැල තවාන්හි සහ පළා ඵලවළු වර්ග වල වර්ධනය වැඩිකිරීම සහ පළිබෝධ පාලනය සඳහා ස්වභාවික බහුඅවයවික සංයෝග (හයිඩ්‍රොජෙල) පරීක්ෂාව (හරිතාගර අධ්‍යයනයකි)
- *Tricoderma* ආමුකුලන වාණිජමය වශයෙන් ඇගයීමේ හැකියාව පරීක්ෂාව
- මිදිවල පළිබෝධ සහ රෝග කළමනාකරණය සහ "බීජ රහිත තොම්සන්" ප්‍රභේදයේ ඵලයේ ප්‍රමාණය වැඩි කිරීම.
- වැල් දොඩම් හි කඳ ඉදිමීමේ රෝගය පිළිබඳ අධ්‍යයනය

- මෑ කඳ පාමුල කුණුවීම උදෙසා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත්මාලාව සැකසීම
- වට්ටක්කා වයිරස් රෝග සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් සැකසීම.
- දෙහි ශාකයේ රෝග සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් සැකසීම.
- මාළුමිරිස් සහ බෝංචිවල ඇන්ත්‍රැක්නෝස් රෝගයේදී බීජ සැකසීමේ ස්වභාවය අධ්‍යයනය.
- තක්කාලි, කුකුබිට්සේ ශාක සහ මාළුමිරිස් වල ප්‍රධාන වයිරස් රෝගවලින් අනුක හඳුනාගැනීම සහ ලක්ෂණීකරණය.
- කුකුබිට්සේ ශාකවල යටිපුස් සහ පිටිපුස් රෝගයට ප්‍රතිරෝධී නව දිලීරනාහකයක් සැකසීම පිළිබඳ ඇගයීම.
- පෙර සහ පසු අංගමාරයට ප්‍රතිරෝධී දිලීරනාශක සැකසීම උදෙසා වූ ඇගයීම
- ඇන්ත්‍රැක්නෝස් රෝගයට ප්‍රතිරෝධී දිලීරනාශකයක් සැකසීම පිළිබඳ ඇගයීම
- බණ්ඩක්කා පිටිපුස් රෝගයට ප්‍රතිරෝධී දිලීරනාශකයක් සැකසීම පිළිබඳ ඇගයිම
- රෝග හඳුනාගැනීම සහ උපදේශක සේවාව
- ඔයිස්ටර් බිම්මල් බෝතල්වල වගාකිරීමේ ක්‍රම පරීක්ෂා කිරීම
- සූකිරි බිම්මල් වගා ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම
- *Pleurotus Sujor* කපු සහ *Pleurotus flabellatus* සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදාබැලීම
- දේශීය බිම්මල් ප්‍රභේදවල වගා ක්‍රමයක් හඳුනාගැනීම.
- DNA තාක්ෂණය උපයෝගී කොට බිම්මල් ප්‍රභේද හඳුනාගැනීම.
- විදේශීය බිම්මල් ප්‍රභේද සඳහා වගා ක්‍රමයක් හඳුනාගැනීම.

## කීට විද්‍යාව

- පර්යේෂණ ක්ෂේත්‍ර සහ ගොවි ක්ෂේත්‍රවල වට්ටක්කා සඳහා වැඩිදියුණු කළ සමෝධානික පළිබෝධ කළමාකරණ පිළවෙත් මාලාවක් පරීක්ෂා කිරීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය)
- වට්ටක්කා වයිරස් රෝග කළමනාකරණ සඳහා නිර්දේශිත රසායනික සංයෝග මාලාව සමාලෝචනය
- කොළ කනින්නා, කළු මැස්සා සහ කුඩිත්තා වැනි දෙහි පළිබෝධකයින්ට එරෙහිව කෘමිනාෂක පරීක්ෂාව (ජාතික කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය)
- දෙහි මයිටාවන්ට එරෙහිව මැට්‍රිසයිඩ්ස් පරීක්ෂාව (ජාතික කෘෂි පර්යේෂණ ව්‍යාපෘතිය)
- කාබනික ගොවි ක්ෂේත්‍රවල ගෝවා පළිබෝධකයන්ට එරෙහිව ශාක ක්ෂේත්‍ර ඇගයීම
- කෙසෙල් ගුල්ලාට එරෙහිව කෘමිනාශක පරීක්ෂාව
- පැපොල් පිටි මකුණා පාලනය කිරීමේදී විදේශීය පරපෝෂිකයින්ගේ "*Acerophagus papaye*" ක්ෂේත්‍ර කාර්යක්ෂමතාව පිළිබඳ පසු සමීක්ෂණය.
- හේතුවක් සොයාගෙන නොමැති මාරාන්තික වකුගඩු රෝග සඳහා පළිබෝධනාශක, පොහොර සහ පානීය ජලයේ තත්ත්වය සමඟ ඇති සම්බන්ධතාව පිළිබඳ පරීක්ෂාව.
- වැල් දොඩම් කඳ ඉදිමීම කළමනාකරණය සහ හේතු සාධක හඳුනාගැනීම.
- මිදි පළිබෝධකයින් සහ රෝග කළමනාකරණය සහ "බීජ රහිත තොම්සන් ප්‍රභේදයේ" ගෙඩියේ ප්‍රමාණය වැඩිකිරීම.
- වම්බටු ශාකය සඳහා මී මැසි පරාගනයෙහි කෘමිනාශක බලපෑම.
- කෘමිනාශකයන්ට අවධානය යොමු කරමින් කුකුබිට්සේ වයිරස් රෝග කළමනාකරණය නිර්දේශිත සමෝධානික

පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව සමාලෝචනය.

- බතල ගුල්ලා (*Cylas formicarius*) පාලනය සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීම.

## රසායන විද්‍යාව

- කාබනික ගොවිතැන යටතේ විවිධ කාබනික පොහොර ප්‍රභවයන් එළවළු අස්වැන්න කෙරෙහි බලපාන ආකාරය.
- කාබනික එළවළු වගාවේ පෝෂක කළමනාකරණය
- පසට කොම්පෝස්ට් පොහොර යෙදීම මඟින් එළවළු අස්වැන්න සහ පසෙහි ගුණාත්මකභාවයට දිගු කාලීන බලපෑම.
- කෙසෙල්වල පොටැසියම් කළමනාකරණය
- අන්නාසිවල පොහොර කළමනා කරණය
- ශ්‍රී ලංකාවේ විවිධ ගොවිජන සේවා මධ්‍යස්ථාන කලාපයන්හි පාංශු සාරවත්බව ඇගයීමේ අධ්‍යයනය
- එළවළු අස්වැන්න කෙරෙහි නැනෝ පොහොර බලපෑම.
- විවිධ බෝගවල ක්‍රම යටතේ පසෙහි ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය අධ්‍යයනය.
- එළවළු බෝග මඟින් පෝෂක ඉවත්වීම.
- එළවළු බෝග සඳහා ක්ෂුද්‍ර පෝෂක ප්‍රතිචාර ඇගයීම.
- උඩරට විවිධ බෝග වගා ක්‍රම යටතේ පෝෂක තත්ත්වය.
- පාංශු පරීක්ෂණ පදනම් පොහොර නිර්දේශයන් නිදර්ශනය.
- මහනුවර දිස්ත්‍රික්කයේ එළවළු වෙළඳපලහි එළවළුවල බැර ලෝහ අන්තර්ගතය පිළිබඳ අධ්‍යයනය.
- තක්කාලි සඳහා PGPR හඳුනාගැනීම (ශාක වර්ධනය ප්‍රවර්ධන රයිසො බැක්ටීරියා) සහ වෙන් කිරීම.
- විවිධ පොහොර ද්‍රව්‍යයන්හි බැර ලෝහ අන්තර්ගතය අධ්‍යයනය.

## මධ්‍යම පුස්තකාලය

- පුස්තකාලයේ දුර්ලභ පොත් එකතුව ඩිජිටල් ආකෘතියට අනුව සකස් කර සංරක්ෂණ සැලසුම්
- වෙබ් පිටුව මත මධ්‍යම පුස්තකාලය සතු පොත් ලැයිස්තුව ප්‍රකාශයට පත්කිරීමේ තීරණය.
- අලුතෙන් පුස්තකාලයට පැමිණි පොත් සඳහා පොත් විස්තර නාමාවලි කාඩ්පත මුද්‍රණය කිරීමට සැලසුම.
- නිවර්තන කෘෂි විද්‍යාඥවරුන්ගේ සඟරාව පරිගණක ගත කිරීම.
- නිවර්තන කෘෂි විද්‍යාඥවරුන්ගේ සඟරාව ඩිජිටල් ගත කිරීම සහ පසුව සඟරාවට පරිගණක හරහා ඇතුල්වීමට පහසුකම් සැපයීම.
- පුස්තකාලයේ සියලුම පොත් ඩිජිටල්ගත කිරීම.

# කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ (වැඩ බලන) | 01 |
| අතිරේක අධ්‍යක්ෂ (වැඩ බලන) | 02 |
| පර්යේෂණ නිලධාරී | 18 |
| පරිපාලන නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 09 |
| රාජ්‍ය කළමනාකාර සහකාර | 15 |
| ගොවිපල් ලිපිකරු | 4 |
| කෘෂිකර්ම උපදේශක | 19 |
| පර්යේෂණ සහකාර | 15 |
| පර්යේෂණ උප සහකාර | 13 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 08 |
| ගබඩාකරු | 02 |
| යාන්ත්‍රික ශිල්පී | 02 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 |

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| වඩුකරු | 02 |
| වෑල්ඩින්කරු | 01 |
| විදුලි ශිල්පී | 01 |
| තණකොළ කපන්නා | 02 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| ජල පොම්ප ක්‍රියාකරු | 01 |
| මී මැසි නිදර්ශක | 01 |
| සංචාරක බංගලා භාරකරු | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| නුපුහුණු කම්කරු | 81 |
| මුරකරු | 08 |
| **එකතුව** | **214** |

# 1.2.1. ආහාර පර්යේෂණ ඒකකය - ගන්නෝරුව

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පාලනය යටතේ ක්‍රියාත්මක වන ආහාර පර්යේෂණ ඒකකයට අයත් ප්‍රධාන කාර්යයන් අතරට පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පර්යේෂණ, නිෂ්පාදන දියුණු කිරීම සහ බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන් මගින් ලැබෙන නියැදි වල ගුණාත්මක තත්ත්වය ඇගයීම සහ තාක්ෂණය පතුරුවාලීමේ කටයුතු සිදු කිරිම ඇතුළත් වේ. මෙම ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් බෝග පර්යේෂණ ආයතන, පළාත් කෘෂිකාර්මික ක්‍රමය, අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය සමග එක්ව තාක්ෂණය ජනනය කර බෙදා හැරීම සහ ආහාර නිෂ්පාදනය සඳහා වූ යන්ත්‍ර සූත්‍ර භාවිතය සම්බන්ධයෙන් සහයෝගිතා වැඩ සටහන් සිදු කරයි. මීට අමතරව, උපාධි අපේක්ෂකයන්ට පසු අස්වනු හා සැකසුම් තාක්ෂණයේ විවිධ අංශ පිළිබඳ සිය පර්යේෂණ කටයුතු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා මග පෙන්වීම ලබා දේ.

## අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ වූ වාර්ෂික ප්‍රතිපාදන සහ වියදම් පිළිබඳව වගු අංක 1.2.1.1 හි දැක්වේ.

**වගු අංක 1.2.1.1 : වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 1,900,000 | 446, 558 | 24 |
| පුනරාවර්තන | 1,970,500 | 1, 632, 990 | 83 |
| ව්‍යාපෘතිය 1<br>285-2-2-5-2502(11)<br>(අගය එක් කළ -පලතුරු එළවළු සහ ධාන්‍ය) | 2,000,000 | 1, 079, 552 | 54 |
| ව්‍යාපෘතිය 2<br>( ආහාර සැකසුම් කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමෙන් ග්‍රාමීය ගොවියාගේ ආදායම ඉහළ නැංවීම)<br>285-2-24-2502-8(13) | 11219560 | 1759744 | 16 |
| **එකතුව** | **17,090,060** | **4,918,844** | **29** |

**ව්‍යාපෘති 1**

වී, ධාන්‍ය, පලතුරු සහ එළවළු වලට අගය එක් කිරීම සහ නිෂ්පාදන දියුණු කිරීම.
(ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම)

**ව්‍යාපෘතිය 2**

ආහාර සැකසුම් කිරීමේ කම්හලක් ස්ථාපිත කිරීම මගින් ග්‍රාමීය ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම.

**සොයා ගැනීම් සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම.**

වට්ටක්කා මදය යොදා ගනිමින් කෙටි කෑමක් හඳුන්වා දුණි.

කොළවන් කහ පැහැ ගැන්වුණු අවධියේදී යෝග්‍ය පරිසර තත්ත්වයන් යටතේ අස්වනු නෙලා ගත් විට කාමරංගා (*Averrhoa carambola* L. CV. "FWANG TUNG") අවම සැකසුම් කිරීම සාර්ථකව සිදු කෙරිණි.

වැලි යට ගබඩා කර බතල ප්‍රභේද ගබඩා කර තබා ගන්නා කාලය වැඩි කර ගැනීම සඳහා වූ හොඳම ප්‍රතිකර්මය සොයා ගැනිණි.

කිරි අල (*Xanthomonas saggilifolium*), රාජා අල(*Dioscoreaalata*), කටු අල, කුකුළල සහ බුත්සරණ යොදා ගනිමින් බුත්සරණ කේක්, බුත්සරණ මෆින්, කිරි අල චිප්ස්, කිරි අල අච්චාරු, කිරි අල ක්ෂණික අච්චාරු, කිරි අල කෙටි කෑම, කුකුළල චිප්ස් සහ අච්චාරු, රාජ අල චිප්ස් සහ අච්චාරු) යනාදි සැකසුම් කළ නිෂ්පාදන බිහි කෙරිණි.

කැසිපිත්තන් (*Cyclea burmanni*) පලතුරු සමඟ එක්කර ජෙලි නිපදවීම සඳහා සාර්ථකව යොදා ගන්නා ලදි.

ඩ්‍රැගන්ෆෘට් පාදක නිෂ්පාදන : ජෑම්, ජෙලි , යෝගට්, ක්ෂණික බීම සහ සහල් මිශ්‍රිත ඩ්‍රැගන්ෆෘට් පුඩිං නිපදවිය.

නිෂ්පාදන බිහිකිරීම සඳහා සහල් පිටි යොදා ගන්නා ලදි.

තම්පලා බීජ සමඟ 100%ක් සහල් පිටි බිස්කට්, 100%ක් සහල් පිටි වලින් සැකසූ චොක්ලට් කේක්, 100% සහල් මෆින් සහ 100%ක් සහල් පිටි වලින් සැකසූ පලතුරු මිශ්‍රිත වන්ඩු.

වට්ටක්කා වලින් ක්ෂණික බීම සහ වට්ටක්කා පිටි නිෂ්පාදන සකස් කරන ලදී.

## සංවර්ධන කටයුතු

කොරියානු රජයෙන් අරමුදල් සම්පාදිත "සැකසුම් කිරීමේ කම්හලක් ස්ථාපිත කිරීම මගින් ගොවියාගේ ආදායම ඉහළ නැංවීම" පාදක කර ගත් ව්‍යාපෘතිය අඛණ්ඩවම සිදු කරන ලදි. සුළු පරිමාණයේ නිෂ්පාදකයන් පුහුණු කිරීම සඳහා ආහාර පර්යේෂණ ඒකකයෙහි සුළු පරිමාණයේ සැකසුම් කිරීමේ පිරියතක් ස්ථාපිත කළ අතර සුළු පරිමාණයේ සැලසුම් කරුවන් පුහුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් මෙහෙය විය. කොරියානු ජනරජය විසින් නව ව්‍යාපෘතියක් සඳහා ඇමරිකානු ඩොලර් 10,000ක් ප්‍රතිපාදනය කරන අතර තක්කාලි පසු අස්වනු පාලනය පිළිබඳ පසු අස්වනු අත්පොත සකස් කිරීමට අනුමැතිය ලබාදී ඇත.

ආහාර සැකසුම් කිරීම සහ පසු අස්වනු තාක්ෂණ අංශය පිළිබඳව හඳුන්වා දීම සඳහා මල්ටි මීඩියා ඉදිරිපත් කිරීම් සහ ප්‍රායෝගික සැසි මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කළ අතර පෝස්ටර් සහ අත්පත්‍රිකා සකස් කර බෙදා හරින ලදි.

ආහාර පර්යේෂණ ඒකකයේ ගොඩනැගිලි වල තීන්ත ආලේප කළ අතර අලුත්වැඩියා කිරීම් සිදු කෙරෙණි.

## විශ්වවිද්‍යාල සිසුන් පුහුණු කිරීම

ඌවවෙල්ලස්ස, පේරාදෙණිය, ශ්‍රී ජය වර්ධනපුර සහ රුහුණු සරසවි සිසුන් 5 දෙනෙකු ආහාර පර්යේෂණ ඒකකයේදී සිය මාස 3-4 පැවරුම් සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

ඩිප්ලෝමා සිසුන් පුහුණු කිරීම - හාඩි තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ සිසුන් තිදෙනෙකු ආහාර පර්යේෂණ ඒකකයේ මාස 04ක් අධ්‍යයන කටයුතු සිදු කරන ලදුව සිය පැවරුම අධ්‍යාපන ආයතනය වෙත ඉදිරිපත් කරන ලදි.

"දැයට කිරුළ" සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුම් ප්‍රදර්ශනයේදී සාර්ථකව ප්‍රදර්ශන කටයුතු සිදු කළ අතර අත්පත්‍රිකා බෙදා දෙමින් ජනතාව පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීමේ අංශය පිළිබඳව

දැනුවත් කරන ලදි. (ආහාර සැලසුම් කිරීම හා පලතුරු, එළවළු, මුල් සහ ආකන්ද බෝග, වී සහ සෝයා ආශ්‍රිත පසු අස්වනු තාක්ෂණය පිළිබඳ නව අත් පත්‍රිකා සකස් කෙරිණි)

### තාක්ෂණය පතුරුවාලීම

ආහාර පර්යේෂණ ඒකකය විසින් රසායනාගාර විශ්ලේෂණ පහසුකම් සැපයීම අඛණ්ඩවම සිදු කරන ලදි. මෙම වසර තුළදී දේශීය වෙළඳපළ සඳහා නිෂ්පාදන වල ගුණාත්මය තහවුරු කිරීමට පෞද්ගලික අංශයෙන් ලද ක්ෂණික බීම, චට්නි, කෝඩියල්, ජෑම්, වියළන ලද පලතුරු සහ එළවළු, පේස්ට්, බයිට්, ෆ්‍රෙන්ච් ෆ්‍රයි මෙන්ම මධ්‍යම පරිමාණයේ සකසනයන් පිළිබඳ විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අභිජනන කරුවන් වෙත එළවළු සඳහා වාර්තා 115ක්, පලතුරු සඳහා වාර්තා 34ක්, අල සඳහා වාර්තා 26ක් සහ බිම්මල් සඳහා වාර්තා 5ක් නිකුත් කෙරිණි.

### කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය අනුග්‍රහය දැක්වූ පුහුණු

පලතුරු සහ එළවළු සැලසුම් කිරීම සහ සහල් පාදක නිෂ්පාදන සම්බන්ධයෙන් පෞද්ගලික අංශය සමඟ එක්ව පුහුණු වැඩසටහන් 02ක් මෙහෙය විය.

පෞද්ගලික අංශයේ සංවිධාන, දිස්ත්‍රික්ක පුහුණු මධ්‍යස්ථාන - කෘෂිකර්ම, විදාත මධ්‍යස්ථාන, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාණිජ මණ්ඩලය, කර්මාන්ත දෙපාර්තමේන්තුව, ගුරු පුහුණු ආයතන, පාසැල්, කෘෂිකර්ම උපදේශකවරුන්, ඩිප්ලෝමා සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සඳහා පලතුරු සහ එළවළු පිළිබඳ පසු අස්වනු තාක්ෂණය සහ සැකසුම් කිරීම පිළිබඳව පුහුණු වැඩසටහන් සිදු කරන ලදි. සහල් පාදක නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් 4ක් (පුද්ගලයින් 225ක්), පලතුරු සහ එළවළු සැකසුම් කිරීම පිළිබඳ වැඩසටහන් 45ක් (පුද්ගලයින් 1250ක්), කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ වැඩසටහන් 11ක්, පැණි රස කෑම පිළිබඳ වැඩසටහන් 15ක් කෙරිණි. සෝයා පාදක ආහාර නිෂ්පාදන, අලවර්ග, ඉරිඟු සහ බිම්මල් නිෂ්පාදන සහ ඇසුරුම් කිරීම පිළිබඳ වැඩසටහන් 49ක් ආහාර පර්යේෂණ ඒකකය සහ වෙනත් ආයතන වලදී සිදු කෙරිණි.

කෘෂිකර්ම විද්‍යාල 9ක සිසුන් තුන්සිය පනස් දෙනෙකු පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීම් සම්බන්ධයෙන් පුහුණු කෙරිණි. විශ්වවිද්‍යාල සිසු කණ්ඩායම් 3ක් (110ක්) පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීමේ ක්‍රම පිළිබඳව පුහුණු කිරීමද තාක්ෂණික විද්‍යාල සිසු කාණ්ඩායම් 7ක් (සිසුන්250ක්) සඳහා වැඩසටහන්ද සිදු කෙරිණි. ආහාර සැකසුම් කිරීම පිළිබඳව විදාතා වැඩසටහන් 15ක් මෙන්ම පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීම් පිළිබඳව පාසැල් ගුරුවරුන් සහ ගුරු උපදේශකයින් (කෘෂිකර්ම සහ ගෘහ විද්‍යා අංශ) පුහුණු කිරීම් සිදු කරන ලදි.

## 2013 වසර සැලැස්ම

- කල් තබා ගත හැකි වට්ටක්කා නිෂ්පාදන සකස් කිරීම.
- ආරක්ෂණ යාන්ත්‍රණය ඉහළ නැංවීමෙන් අඹ, කෙසෙල් සහ පැපොල්වල පසු අස්වනු රෝග අවම කිරීම.
- පොටෑසියම් යෙදීම ඉහළ නැංවීමෙන් අන්නාසි වල අභ්‍යන්තරය දුඹුරු පැහැ ගැනීම අවම කිරීම.

- පොටෑසියම් යොදන ප්‍රමාණය ඉහළ නැංවීමෙන් වැල් දොඩම්වල යුෂ ගුණාත්මය ඉහළ නැංවීම
- ටොම් EJC ප්‍රභේදය යොදා ගනිමින් කල් තබා ගන්නා අඹ නිෂ්පාදන බිහි කිරීම.
- ඩ්‍රැගන් ෆෘට් නිෂ්පාදන සකස් කිරීම.
- අමු මිරිස් නිෂ්පාදන සැකසීම.
- දේශීය මිරිස් ප්‍රභේද යොදා ගනිමින් මිරිස් කුඩු නිපදවීම.
- දේශීය ආහාර සකස් කිරීම සඳහා බඩ ඉරිඟු, කුරක්කන් සහ සෝයා පිටි මිශ්‍රණයක් සකස් කිරීම.
- පෝෂණ ගුණයෙන් යුත් ක්ෂණික රොටී සහ පිට්ටු මිශ්‍රණ සකස් කිරීම.

## ප්‍රකාශන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයන් වන අන්නාසි වගාව සහ අඹ වගාව (2012) යන ප්‍රකාශන වල දෙවන සංස්කරණ කටයුතු වල විෂයානුබද්ධ සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ආහාර පර්යේෂණ ඒකකය සහභාගී විය.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| පර්යේෂණ නිළධාරි | 03 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 02 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 01 |
| කළමනාකරණ සහකාර | 02 |
| රසායනාගාර උප සහකාර | 02 |
| රියදුරු | 02 |
| විදුලි ශිල්පී | 01 |
| කම්කරු | 05 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 07 |
| මුරකරු | 02 |
| **එකතුව** | **31** |

# 1.2.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල

බණ්ඩාරවෙල කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, රහංගල හා මදුරුකැටිය පිහිටි චන්ද්‍රිකා මධ්‍යස්ථානයත් බිබිල හා මුතුකණ්ඩිය පිහිටි පර්යේෂණ ගොවිපල හා එක්ව ඌව කළාපයේ සහ සබරගමුව පළාතේ බලංගොඩ කොට්ඨාශයේ උචිත කෘෂිකාර්මික තාක්ෂණයන් වැඩිදියුණු කිරීම උදෙසා වූ ප්‍රධාන ආයතනයක් ලෙස කටයුතු කෙරේ. ආයතනයේ ප්‍රධාන කාර්ය පර්යේෂණ වැඩසටහන් ඉටු කිරීම වුවද ස්වකීය වගකීම පැවරී ඇති ප්‍රදේශයන්හි ගොවි ප්‍රජාවෙහි කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණ ඇතිව අල, පළතුරු සහ මල් බෝගවල ගුණාත්මක බවින් ඉහළ පැළ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ කාර්යයෙහිද නිරතවනු ලැබේ. බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම හා පර්යේෂණ මධ්‍යසථානයේ 2012 වර්ෂයේ දී විවිධ වැය ශීර්ෂයන් යටතේ වාර්ෂික වෙන් කිරීම් සහ වියදම්.

වගුව **1.2.2.1:** වාර්ෂික අයවැය **- 2012** (රුපියල්)

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 14,044,500 | 13,131,124 | 94 |
| ප්‍රාග්ධන | 4,966,686 | 1,434,520 | 29 |
| **ව්‍යාපෘති** | | | |
| KOPIA (එළවළු) | 200,000 | 61,484 | 31 |
| KOPIA (පාංශු) | 254,000 | 100,220 | 39 |
| ශ්‍රී ලංකාවේ දෙහි කර්තමාන්තයේ වැඩි දියුණු කිරීම | 592,000 | 537,985 | 91 |
| ANSOFT | 75,000 | 71,421 | 95 |
| පටක රොපණය | 2,800,000 | 2,261,066 | 81 |
| දෙමුහුම් බීජ නිෂ්පාදනය (තක්කාලි) | 200,000 | 189,809 | 95 |
| ගොවිපල සංවර්ධනය | 1,400,000 | 1,285,505 | 92 |
| බීජ අර්තාපල් නිෂ්පාදනය | 10,500,000 | 8,587,600 | 82 |
| **ජා.කෘ.පර්.ව්‍යා** | | | |
| දෙහි ප්‍රභේද ජනක ප්ලාස්ම ඇගයීම | 150,000 | 144,506 | 96 |
| බීජ අර්තාපල් සඳහා තාක්ෂණ සංවර්ධනය | 600,000.00 | 588,8434 | 98 |
| බෝංචි නිෂ්පාදනය සහ ප්‍රභේද ප්‍රවර්ධනය | 500,000.00 | 405,936 | 82 |
| කෙසෙල්වල අස්වැන්න සහ ගුණාත්මක බව ප්‍රවර්ධනය | 50,000 | 49,963 | 99 |
| **එකතුව** | **36,332,186** | **28,849,983** | **79** |

## ප්‍රගතිය

සමාලෝචනයට භාජනය කරන වර්ෂය තුළ දි එළවළු, අර්තාපල්, උපනිවර්තන සහ සමශීතෝෂ්ණ පළතුරු බෝග සහ මල් බෝග පිළිබඳව අවධානය යොමුකර පර්යේෂණ සංවර්ධන කාර්යයන් ඉටු කෙරිණි.

## පර්යේෂණ

- අස්වැන්න සහ වෙනත් ඵලදායීතාවයන් උදෙසා මෑ ප්‍රභේද 7ක් අගයනු ලැබීය. KWG පරීක්ෂණ ප්‍රභේදය හා සසඳන විට BN10 සහ ACC6116 ප්‍රභේද වැඩි අස්වැන්නක් ලබා දුණි.

- අස්වැන්න සහ වෙනත් ඵලදායීතාවයන් උදෙසා පඳුරු බෝංචි ප්‍රභේද 6ක් අගයනු ලැබීය "වඬේ" පරීක්ෂණ ප්‍රභේදය හා සැසඳීමේ දී BB2904 ප්‍රභේදය වැඩි අස්වැන්නක් ලබා දුණි.

- බෝංචි ජනක ප්ලාස්ම 143ක් එකතු කරනු ලැබූ අතර බලාපොරොත්තු තැබූ ආර 28ක් තෝරා ගෙන අගයනු ලැබීය. මෙයින් ආර 15ක් තවදුරටත් ඇගයීම උදෙසා තෝරාගනු ලැබිණි.

- දේශීය වශයෙන් වැඩි දියුණු කළ අර්තාපල් ආර 123ක් තව දුරටත් ඇගයීම උදෙසා ගුණනය කෙරිණි.

- "භාතිය" තක්කාලි ප්‍රභේදයේ මව් ආරයෙහි බීජ නිෂ්පාදනය කරනු ලැබූ අතර ජායාංගි (P3) න් ග්‍රෑම් 1236ක්ද පුමාංගි (P4) න් ග්‍රෑම් 1346ක් ද ආර නිෂ්පාදනය කෙරිණි.

## ශෂ්‍ය විද්‍යාව

### අර්තාපල්

- වඩාත් හොඳ ගුණාත්මක තත්ත්වයෙන් යුත් අර්තාපල් බීජ නිෂ්පාදනය සඳහා නලස්ථව වර්ධක මාධ්‍යය තුළදී ඇගයීමේ අධ්‍යනයන් සිදු කෙරිණි. එම අධ්‍යයනය තුළදී මූලික රෝපණ මාධ්‍ය ලෙස දහයියා අගුරු සහ පස් (1:1) අනුපාතයන්ගෙන් සහ පිරවීමේ මාධ්‍ය ලෙස දහයියා අගුරු සහ පස් (2:1) අනුපාතයෙන් වඩාත් උචිත බව හඳුනා ගැනිණි.

### ශාක සංරක්ෂණය

- නලස්තව වගා කරනු ලැබූ තක්කාලිවල පිටිපුස් රෝගයට (*Leveilllula taurica*) පාරිසරික හිතකර කාලග්‍රීන් (පොටැසියම් බයි කාබනේට්) අගයනු ලැබිණි. පරපෝෂිතයාට එරෙහිව හොඳ පාලනයක් ලබා දුන් අතර පෙර ප්‍රතිඵලයම තහවුරු කරමින් දෙවන කන්නයේද එම ප්‍රතිඵලය මඟින් පරපෝෂිතයට එරෙහිර ක්‍රියාත්මක වන බව තහවුරු කෙරිණි. එමනිසා හරිතාගාරයන් වගාකළ තක්කාලි වල පිටිපුස් රෝගය කළමනාකරණය සඳහා වඩාත් සුරක්ෂිත දිලීර නාශකයක් ලෙස කාලි ග්‍රීන් නිෂ්පාදනය නිර්දේශ කළ හැකිය.

- රෝස වල කළු පැහැති තිත් ඇති කරන කාරක ජීවියා, *Diplocarliepon rosae*, නලස්ථව වර්ධනය කළ ශාක වර්ග 9ක සහ කෘතිම රසායනික, පයිර ක්ලොස්ට්‍රොබින් (Pyraclostrobin) වල ප්‍රති දිලීර නාශක බලපෑම අගයනු ලැබීය. එම ප්‍රතිඵල මඟින් කුරුඳු පත්‍ර (*Cinnamomum verum*), "පිලිපීන රෙඩ් ලයිම්" පොත්ත (*Citrus auranfilolia*) පාවට්ටා පත්‍ර(*Adathoda vasica*), දෙහි පත්‍ර (*Cirus limonia*) සහ සුදු ළූනු බල්බ (*Allium sativum*) පරීක්ෂා කළ ද්‍රව්‍යය අතර වඩාත් උසස් ප්‍රථිඵල ලබා දුණි.

- බෝංචි කරල් විදින්නා (*Maruca vitrata*) පාලනය කිරීමට නව

කෘමිනාශක ඇගයීමේ හැකියාව පරීක්ෂා කිරීමේ දී නව අනුවක් වන ෆ්ලුබෙන්ඩියාමයිඩ් 20 WG 11.25 g/10L අනුපාතයෙන් මිශ්‍ර කිරීම පළිබෝධකය පාලනය කිරීමේ දී ඵලදායී බව හෙළිදරව් විය. නිර්දේශිත රසායනික නොවැලුරෝන් (Novaluron) 100g/LEC මෙන් නව නිෂ්පාදනය සමාන ප්‍රතිඵල ලබා දුණි.

- ශ්‍රී ලංකාවේ දෙහි වගාව සඳහා මතුවෙමින් පවතින තර්ජනයක් ලෙස දෙහි මලකඩ මයිටා *(Phyllocoptrula aleivora)* හැඳින්විය හැකිය. මෙම පළිබෝධ ගහනය අවම කිරී ම උදෙසා යෝග්‍ය කෘමි නාශකයක් සොයා ගැනීමට මධ්‍යස්ථානයේ පරීක්ෂණ පවත්වනු ලැබිණි. මෙම ප්‍රථිඵල මඟින් සල්ෆර් 80%, WP 80g/10L මිශ්‍රණය හෝ ඇබමෙක්ටින් (Abamectin) 18g/ L EC 6ml/10L පළිබෝධකයාට එරෙහිව වඩාත් ඵලදායී බව සොයා ගැනිණි.

- ගෝවා පළිබෝධකයින් අවම කිරීම උදෙසා වඩාත් උචිත බෝග සංයෝජනය හඳුනා ගැනීමට ගෝවා සමග එක් එක් පේළි වල වෙනත් බෝග මාරුව සිදු කරනු ලැබීය. ගෝවා මෙම පරීක්ෂණ භූමියන්හීදී ලීක්ස් (*Allium ampeloprasum* ප්‍රභේදය *Porrum*) හෝ මින්ට් (*Mentha Spicata*) සංයෝජනය දළඹු ආක්‍රමනයේ අවම හානියක් පෙන්නුම් කෙරිණි. පරීක්ෂණ අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙම ප්‍රතිඵල මඟින් කාබනික ගොවීන් උදෙසා වැදගත් තොරතුරු ලබා ගත හැකි වනු ඇත.

- නලස්ථව තක්කාලි වගාවේදී පොල් කොහු වලට විකල්පයක් ලෙස ෆයිනස් වල (*Pinus caribaea)* කෙදිවල යෝග්‍යතාව සොයා බැලීම උදෙසා අධ්‍යනයක් සිදු කෙරිණි. වඩාත් බහුල වර්ධන මාධ්‍යයක් වන තනිකර පොල් කොහු භාවිතයට හා සමාන ලෙසම පොල් කොහු සහ කැබලි වලට කැඩූ ෆයිනස් කෙඳි යොදා ගත හැකි බව අවසාන නිගමනයකට එළඹිය හැක.

- උඩරට අතරමැදි කලාපයේ වගා කරණ ජනප්‍රිය රෝස ප්‍රභේදයන්හි (*Rosa hybrida) gray mold (Botrytis cinerea)* ට එරෙහිව ප්‍රතිරෝධීතාවය පරීක්ෂා කිරීමේදී “Grand gola”නම් ප්‍රභේදය රෝගයට එරෙහිව හොඳ ප්‍රතිරෝධීබවක් පෙන්නුම් කෙරිණි.

- ඌව පළාතේ පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් PTWG රැස්වීමේ දී සිදු කළ ඉල්ලීම පරිදි, ලුණුගල ප්‍රදේශයේ ගොවි ක්ෂේත්‍රවල පවතින වී මූල ගැටිති නෙමටොඩාවන් *(RRKN: maloydogyne graminicola*) පිළිබඳ සොයා බැලීමට මූලික පරීක්ෂණයක් සිදු කෙරිණි. මෙහි ප්‍රතිඵල මඟින් උඩකීරුව ප්‍රදේශයේ ගන්තිලයාය හා ලෙව්ගල පිහිටි කුඹුරු 2ක් මෙම වී මූල ගැටිති නෙමටෝඩාවන් ආක්‍රමණය වී ඇති බවයි. කෙසේ වුවද අස්වනු හානියක් සිදු කිරීමට තරම් මෙම නෙමටෝඩාවන් ආක්‍රමණය වී ඇති බවයි. කෙසේ වුවද අස්වනු හානියක් සිදුකිරීමට තරම් මෙම නෙමටෝඩා ගහන ඝනත්වය ප්‍රබල නොවිණි. (± 45 %)

- මෙයට අමතරව රෝග සහ පළිබෝධ පිළිබඳව ක්ෂේත්‍ර ගැටළු විසඳීම උදෙසා ගොවීන් හට උපදේශක සේවාවන්ද මෙම අංශය මඟින් ලබා දුණි. සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළදී මෙම අංශයට ගොවීන් 120ක් පමණ සාම්පල බාර දුන් අතර එම ගැටළු විසඳනු ලැබුණි. මෙම ගැටළු බොහෝමයක්ම බෝංචි සහ මල් පැල හා සම්බන්ධයෙන් විය.

උද්‍යාන බෝග

- පෙයාර්ස්වල අර්ධ දඬු කැපුම් මුල් ඇදීම උදෙසා හොඳම මාධ්‍යය යටි පසය යටි පස වර්ධක මාධ්‍යක් ලෙස යෙදූ විට මුල් ඇදීමේ සාර්ථක බව 47%කි.

- දෙහි වල ඵලයේ ගුණාත්මක බවට මුල් ග්‍රාහක බලපෑම අධ්‍යනය කිරීමට පරීක්ෂණ ආරම්භ කෙරිණි. සමාලෝචනයට භාජනය කෙරෙන කාලය තුළදී අවශ්‍ය මුල් ග්‍රාහක ප්‍රමාණය සකස් කෙරිණි.

පටක රෝපණය

- පටක රෝපණය සන කිරීමේ මාධ්‍යක් ලෙස ඒගාර් වලට විකල්පයක් ලෙස කිතුල් පිටි (7%) උපයෝගී කරගනිමින් පටක රෝපිත අර්තාපල් පැළ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට හැකිවිය.

- පත්‍ර ජීවි පටක උපයෝගී කරගනිමින් පටක රෝපිතව වර්ධනය කළ ස්ට්‍රෝබෙරි ශාක ඇන්ත්‍රැක්ස්නොස් රෝගයට (*Colletotrichum gleosporiodae*) තරමක් ප්‍රතිරෝධයක් දක්වන බව පෙන්නුම් කෙරිණි. පත්‍ර පුනර්වර්ධන ශාක වල වැල් සාමාන්‍ය වැල් මගින් පුනර්වර්ධන ශාකවලට වඩා රෝග ඇතිවීමේ හැකියාව අඩු බව සොයා ගැනිණි.

- 6-10 ppm බෙන්සිලේමින්පුරයින් (*benzyleaminpurine)* යෙදීම මගින් ක්ෂේත්‍රයේ වගා කෙරෙන ජර්බෙරා ශාක වල මෙරෙයියන් නිෂ්පාදනය වැඩිකළ හැක.

මල් වගාව

- රෝසවල (*Rosa hybrida*) කැපූ මල් නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා වර්ගමීටරයට පැළ 22ක ඝනත්වයක් අවශ්‍ය වනු ලැබේ. මෙම ඝනත්වය පවත්වා ගැනීම උදෙසා පැළ අතර පරතරය 30 x 15cm පවත්වා ගත යුතුය.

- ජර්බෙරා (*Gerbera Jamesonii*) මල් නිෂ්පාදනයේ දී පත්‍ර ඉවත් කිරීමේ බලපෑම අධ්‍යනය කිරීම උදෙසා හරිතාගාරයක අත්හදා බැලීමක් සිදු කෙරිණි.

පාංශු විද්‍යාව

- පොස්පරස් හෙ/50kg සහ පොටෑසියම් හෙ/75 kg යෙදීම මගින් අර්තාපල්වල බීජ ප්‍රමාණයේ ආකන්ද නිෂ්පාදනය වැඩිකරගත හැකිය.
- කාබනික පොහොර අතිරේකව යෙදීම මගින් තක්කාලි හා බෝංචිවලට අවශ්‍ය නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයෙන් 75% දක්වා අඩු කළ හැක. තක්කාලි කන්න 3කදී සහ බෝංචි කන්න 4කදී අස්වැන්න අඩුවීමටක් නිරීක්ෂණය කළ නොහැකි විය.

විශේෂ ව්‍යාපෘති

- සමාලෝචිත වර්ෂය තුළ දී මධ්‍යස්ථානයේ දී පර්යේෂණ කටයුතු කිරීමට අමතරව නව තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම උදෙසා මධ්‍යස්ථාන නිලධාරීන් විසින් සමහරක් විශේෂ ව්‍යාපෘති ඉටු කරනු ලැබිණි. මෙම ව්‍යාපෘති සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අරමුදල් සපයනු ලැබූ අතර මෙම ව්‍යාපෘතියෙහි අවසාන අරමුණ ඌව පළාතේ ගොවි ප්‍රජාවෙහි ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි.

සේවාවන්

අභිජනන බීජ නිෂ්පාදනය

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කරන සේවය මගින් සහතික

කරණ ලද ''කැප්පෙටිපොල නිල්'' (208 kg), "බලංගොඩ නිල්" (26kg), "බණ්ඩාරවෙල ග්‍රීන්" (43kg), යන මැ සහ "වඩේ" ප්‍රභේදයේ පඳුරු බෝංචි (3kg), නිෂ්පාදනය කරනු ලැබිණි.

- කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය යටතේ කොම්පෝස්ට් ආමුකූලන 5kg පැකට් 1500ක් නිෂ්පාදනය කරනු ලැබූ අතර කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ගොවීන් අතර ඒවා බෙදා හරිනු ලැබිණි.

**පාංශු සංරක්ෂණ පදනම් පොහොර නිර්දේශ**

- පස් සාම්පල 330ක් පරීක්ෂා කර ඒ අනුව පොහොර නිර්දේශයන් ලබා දුණි.

## තාක්ෂණික හුවමාරු කාර්යයන්

- ඌව සහ සබරගමු පළාතේ පවත්වනු ලැබූ පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් (PTWG) රැස්වීම් හතර සඳහා කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් සහභාගි වූ අතර පූර්ව - කන්න පුහුණු වැඩසටහන් හිදී ව්‍යාප්ති නිලධාරීන් හට තාක්ෂණික පුහුණුව ලබා දුණි.

- මල් බෝග, අර්තාපල්, පෙයාර්ස්, අලිපේර යන වගාවන් පිළිබදව පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වනු ලැබිණි. සමහර පුහුණු ගොවි ක්ෂේත්‍රයන් තුළදී පවත්වනු ලැබිණි.

- එළවළු, පළතුරු, මල් බෝග සහ අර්තාපල් වගා කරන්නාවූ ගොවීන් හට පලිබෝධකයින්ගේ සහ රෝග පිළිබඳ උපදෙස් ලබා දුණි.

- පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1500, සහ ගොවීන් 175 දෙනෙකුට වැඩි සංඛ්‍යාවකට පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

## 2013 වසරේ සැලැස්ම

**එළවළු**

- පඳුරු බෝංචි සහ මැ වල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

- මැ වල උසස් අස්වනු අත්හදා බැලීම

- බටු ජනක ප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම

- අර්තාපල් ජනක ප්ලාස්ම ඇගයීම

- මැ වල අභිජනන බීජ නිෂ්පාදනය

- ''භාතිය'' තක්කාලි ප්‍රභේදයේ මවු බීජ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- කොරියන් ප්‍රභේද සහ තාක්ෂණය ඇගයීම (සලාද, චීන ගෝවා, රාබු, රෙඩ් පෙපර්, පිපිඤ්ඤා, ස්වීට් පම්කින්)

- නලස්ථව වගා කරන බෝග වල නිෂ්පාදන වල ගුණාත්මක බව සහ ප්‍රමාණාත්මක බව වැඩිකිරීම උදෙසා තාක්ෂණය වැඩි දියුණු කිරීමට

**අර්තාපල්**

- මුල් ඇදුණු කඳ කැපුම් තුළින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ නිෂ්පාදනය

- සීතා එළිය කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය හා සහයෝගීව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

- ජලරෝපිත සහ වායුරෝපිත බීජ නිෂ්පාදනය උදෙසා ස්ථාපිත කිරීම් සහ තාක්ෂණික වැඩිදියුණුව

- අර්තාපල් කුඩා ආකන්ද සහ මුල් ග්‍රාහක කඳ කැබලි අස්වැන්න

වැඩිකිරීම උදෙසා තාක්ෂණ සංවර්ධනය

උද්‍යාන බෝග

- මොණරාගල සහ රහන්ගල කෘෂිකර්ම පර්යේෂණ සහ බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ දොඩම් සහ ජමනාරං දේශීය සහ ජපන් ප්‍රභේද ඇගයීම
- ඇපල්, පීච්, පොයාර්ස්, චීන පේර, නෙක්ටාරීන්, අලිපේර, කැරම්බෝලා වැනි සමශීතෝෂ්ණ පළතුරු බෝග වල මවු ශාක නඩත්තුව
- දොඩම් සඳහා මුල්ග්‍රාහක ප්‍රභේද සහ රෝපණ ද්‍රව්‍ය ඇගයීම
- පෙයාර්ස් සහ පීච්වල පසු අස්වනු ගබඩා කාලය වැඩි කිරීම
- පැඟිරි කුලයේ මල් ඇතිකිරීමේ උත්ප්‍රේරක පිළිබඳ අධ්‍යනය

ශාක සංරක්ෂණය

- එළවළු පළතුරු, අර්තාපල් සහ මල් බෝග වල රෝග සහ පළිබෝධකයින් සඳහා දිලීරනාශක සහ කෘමිනාශක පරීක්ෂා කිරීම
- රෝස වල කළු පැහැති තිත් රෝගය අවම කිරීමට ශාක නිස්සාරක වල ඇගයීම
- පැඟිරි සඳහා සමෝධානික පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- ගෝවා වල පත්‍ර රෝග අවම කිරීම උදෙසා ශාක නිස්සාරක භාවිතය
- මැ වල "සුදුමැසි" ගහණයේ උච්චාවචනය වන ආකාරය අධ්‍යයනය
- ගෝවා වල "දියමන්ති කළු සලබයා" පාලනයට *Tithonia diversifolia* ශාක නිස්සාරණයේ යෝග්‍යතාව සොයා බැලීම
- දෙහි මලකඩ මයිටාවන් සඳහා දෙහි ප්‍රභේද ජීව රසායනික ද්‍රව්‍යය පරීක්ෂාව
- දේශීය මයිටා ගහණය පාලනයට කීඩෑ නාශකහි ඵලදායිතාව ඇගයීම
- කුඩිත්තන්ගේ ගහනයට සහ තක්කාලි පුල්ලි මැලවීමේ වෛරස් රෝගය හට වසුන් වල බලපෑම අධ්‍යනය

මල් වගාව

- ජර්බෙරා වර්ධක ප්‍රචාරණ ද්‍රව්‍යය ඇගයීම
- කපුරු මල් වල ගුණාත්මකබව වැඩි කිරීම
- මල් නිෂ්පාදනය හා ජර්බෙරාහි ගුණාත්මක බවට පත්‍ර ඉවත් කිරීමෙහි බලපෑම
- කපුරු මල් නිෂ්පාදනයට සහ කපුරු මල්වල ගුණාත්මක බවට ශාක වර්ධක නියාමනයන්හි බලපෑම
- කපුරු වර්ධනයට සහ මල් නිෂ්පාදනයට රෝපණ ද්‍රව්‍යවල වයසෙහි බලපෑම

පටක රෝපණය

- වර්ධක හෝමෝන තුළින් ජර්බෙරා හි මොරෙයියන් නිෂ්පාදනය වැඩි කිරීම
- විවිධ ශාක තුළින් ජර්බෙරා නලස්ථ ප්‍රචාරණය සඳහා උචිත ක්‍රමවේදයන් හඳුන්වා දීම
- අර්තාපල් ක්ෂුද්‍ර ආකන්ධයන්හි නිෂ්පාදනයන් පුළුල් කිරීම
- පෙයාර්ස් නලස්ථ මුල් වර්ධනය කිරීම

**පාංශු විද්‍යාව**

- බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා නයිට්‍රජන් ෆොස්ෆරස් සහ පොටෑසියම් පොහොර මට්ටම් හඳුනාගැනීම
- ආරක්ෂිත නිවෙස්වල අර්තාපල් නිෂ්පාදනය සඳහා පොහොර කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- ජලරෝපිතාව සහ වායුරෝපිතාව සඳහා සම්පූර්ණ පෝෂක විසඳුම් වැඩිදියුණු කිරීම
- ගෝවා සඳහා විවිධ පොහොර කළමනාකරණ පිළිවෙත් පරීක්ෂා කිරීම
- තක්කාලි සඳහා ක්ෂුද්‍ර පෝෂක බලපෑම

## කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 1 |
| පර්යේෂණ නිලධාරීන් | 12 |
| මෙහෙයුම් නිලධාරීන් | 01 |
| ආරථික සහකාර | 01 |
| වැඩසහන් සහකාර | 05 |
| පර්යේෂණ සහකාර | 07 |
| කෘෂිකරම උපදේශක | 05 |
| පරීක්ෂණාගාර උප සහකාර | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමනාකාර සේවය | 09 |
| කාර්යාල කාර්ය සහයක | 02 |
| රියදුරු | 02 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| බද්ධකරු | 01 |
| පෙදරේරුකරු | 01 |
| වඩුකරු | 01 |
| මුරකරු | 07 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| ස්ථිර කම්කරු | 41 |
| කොන්ත්‍රාත් කම්කරු | 49 |
| **එකතුව** | **149** |

# 1.2.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලට අදාළව කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ඉටු කරනු ලබයි. කල්පිටිය සහ වනාතවිල්ලුව යන ප්‍රදේශවල කෘෂිකර්ම පර්යේෂණ ස්ථාන දෙකක් සහ තබ්බෝව, ඉඟිනිමිටිය සහ වාරියපොල යන ප්‍රදේශවල උපයෝගිතා පර්යේෂණ ඒකක තුනක් පිහිටුවා ඇති අතර මෙම පර්යේෂණ ස්ථාන / ඒකක මඟින් ස්ථානීය විශේෂිත පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් සිදු කරමින් පර්යේෂණ සහ සංවර්ධන ජාලය ශක්තිමත් කරනු ලබයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථාන ජාලයේ ජාතික ප්‍රමුඛතාවයන් පාදකව පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් ඉටු කරන අතරම පලාත් සභාවල විශේෂිත අවශ්‍යතා අනුව පර්යේෂණ කටයුතුද සිදු කරනු ලැබේ. ද්‍රව්‍ය හා සාධක පර්යේෂණ මෙන්ම ව්‍යාප්ති හා සංනිවේදන කටයුතු සිදු කිරීම පිණිස ද මෙම මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ආයතන සහ මධ්‍යස්ථාන සහ මාකඳුර වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි පීඨය, ලංකා ෆොසේෆේට් සමාගම සහ කර්මාන්ත තාක්ෂණ ආයතන (ITI) වැනි ආයතන සමඟද සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ.

පොල් ඉඩම් වල ඵලදායීතාව තිරසාර කර ගැනීම පිණිස පොල් වගාව පදනම් කරගත් වගා ක්‍රමයක් සඳහා තාක්ෂණයන් ජනිත කිරීම සහ ඒකාබද්ධ කිරීම කෙරෙහි මෙම මධ්‍යස්ථානයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු තුළින් ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කෙරේ. වගකීම පැවරී ඇති පලතුරු, එළවළු, මුල් හා ආකන්ද බෝග බිම්මල්, මල් බෝග සහ කුළු බඩු බෝග සඳහාද තාක්ෂණයන් ජනනය කෙරේ. කොම්පෝස්ට් නිෂ්පාදනය, පලතුරු බෝග රෝපණ ද්‍රව්‍යය නිෂ්පාදනය, ගොවි ක්ෂේත්‍රවල බෝග ඵලදායීතා ආදර්ශන පැවැත්වීම, ගොවිපළ අත්හදා බැලීම්, පාංශු පරීක්ෂණ පාදක පොහොර නිර්දේශ ලබා දීමේ වැඩසටහන් යන අංශ කෙරෙහිද මෙම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු මඟින් අවධානය යොමු කෙරේ. පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් ( PTWG ) ගොවි ගැටළු පාදක පර්යේෂණ සහ ස්ථානීය විශේෂිත පර්යේෂණ කටයුතු ද සිදු කෙරේ.

## අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද අයවැය ප්‍රතිපාදන සහ වියදම් වගු අංක 1. 2. 3. 1 හි දැක්වේ.

**වගු අංක 1. 2. 3. 1 : වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 7,184,989 | 2,274,260 | 32 |
| පුනාරාවර්තන | 6,997,220 | 6,497,217 | 93 |
| **ව්‍යාපෘති** | | | |
| 1. කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම. | 4,588,000 | 3,755,000 | 82 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| 2. ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම -වට්ටක්කා | 10,000,000 | 992,000 | 10 |
| 3. ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - ඇන්තූරියම් | 1,275,000 | 1,221,350 | 96 |
| 4. පටක රෝපණ ව්‍යාපෘතිය | 2,800,000 | 2,670,000 | 95 |
| 5. දෙළුම් | 900,000 | 890,000 | 99 |
| **එකතුව** | **33,745,209** | **18,299,826** | **54** |

ස්ථිර කාර්ය මණ්ඩල වැටුප අන්තර්ගත කර නොමැත

## ප්‍රගතිය

### පලතුරු අභිජනනය සහ පටක රෝපණය

- අන්නාසි දෙමුහුම්කරණ වැඩසටහන
- කඳ කැබලි කිරීමේ තාක්ෂණය යොදා ගනිමින් H1, H2, H3 සහ H4 හි රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ආරම්භ කෙරිණි.
- මුරුසි අන්නාසි සමඟ දෙමුහුම්වල පිලිමුහුම් කිරීමේ වැඩසටහන ආරම්භ කෙරිණි.
- අන්නාසි ජනක ප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම.
- ජනක ප්ලාස්ම එකතුව ක්ෂේත්‍රයේ නැවත ස්ථාපිත කරන ලදි
- පටක රෝපණ තාක්ෂණය මගින් අන්නාසි සහ කෙසෙල් රෝපණ ද්‍රව්‍ය නිපදවීම
- අන්නාසි රෝපිත ගුණනය කෙරෙමින් පවතී.
- කෙසෙල් රෝපිත ලබාගැනීම ආරම්භ කෙරිණි.

### පලතුරු ශෂ්‍ය විද්‍යාව

- දෙළුම් දෙමුහුම් කිරීමේ වැඩසටහන $F_1$ පරම්පරාවේ පළමු අස්වැන්න සහ ගුණාත්මය පිළිබඳ පරාමිතීන් ලබා ගන්නා ලදි.
- කෙසෙල් ජනකප්ලාස්ම එක් රැස් කිරීම, ඇගයීම සහ ලක්ෂණීකරණය.
- දෙළුම් දෙමුහුම් කිරීමේ වැඩසටහන.
- කෙසෙල් (සීනි කෙසෙල්) පිළිබඳ ප්‍රභේදීය ඇගයීම.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම - කෙසෙල්
- අර්ධ වශයෙන් දැඩි දෙළුම් දඬු කැබලි කෙරෙහි පැළ වර්ධන නියාමක බලපෑම.

### මල් වගාව

- ඇන්තූරියම් (*Anthurium andraeanum* ) වගා කිරීම සඳහා අඩු පිරිවැයැති සෙවන ගෘහයක් සකස් කිරීම.
- ඇන්තූරියම් වල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි සමස්ථ නයිට්‍රජන් සැපයුමෙහි විභාජන බලපෑම.
- ඇන්තූරියම් (*Anthurium andraeanum)* බලාපොරොත්තු තැබිය හැකි රතු ආර 4ක් ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ ප්‍රභේද නිකුත් කිරීමේ කමිටු සභාවට ඉදිරිපත් කරන ලදි.

## පාංශු විද්‍යාව සහ කොම්පෝස්ට්

- කොම්පෝස්ට් නියැදි 66ක් ඒවයෙහි ගුණාත්මක ප්‍රමිතිය ඇගයීම සඳහා විශ්ලේෂණයට ලක් කෙරිණි.

- පාංශු පරීක්ෂණ පාදක පොහොර නිර්දේශ ලබා දීමේ වැඩසටහන යටතේ ලද පාංශු නියැදි 44ක් විශ්ලේෂණයට ලක් කර ඒ අනුව පොහොර නිර්දේශ ලබා දෙන ලදි.

- සමෝධානික පැළ පෝෂක ක්‍රමය සම්බන්ධයෙන් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් එවන ලද පාංශු නියැදි 384ක් විශ්ලේෂණය කර වී වගාව සඳහා පොහොර නිර්දේශ ලබා දෙන ලදි.

- පර්යේෂණ කටයුතු සඳහා පැළ නියැදි 34ක් විශ්ලේෂණය කරන ලදි.

- තබ්බෝව සහ ආරච්චිකට්ටුව ගොවිජන සේවා මධ්‍යස්ථාන කලාප වලින් පාංශු නියැදි 79ක් එක්රැස් කර ගන්නා ලදි.

## කීට විද්‍යාව

- කෙසෙල් වගාව සම්බන්ධයෙන් කාබනික සහ සාම්ප්‍රදායික වගා ක්‍රම සැසඳීම.
- අන්නාසි වගාව සම්බන්ධයෙන් කාබනික සහ සාම්ප්‍රදායික වගා ක්‍රම සැසඳීම.

## ව්‍යාධිවේදය

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම මගින් බිම්මල් ප්‍රභේද 5ක් ඇගයීම.
- කාබනික සහ සාම්ප්‍රදායික වගා ක්‍රම වලදී කෙසෙල් වලට වැළදෙන සිගටෝකා රෝගය පැතිරීමේ ප්‍රමාණය අගයන ලදි. මේ සඳහා ඇම්බම්, සීනි කෙසෙල්, කෝලි කුට්ටු සහ ඇඹුල් කෙසෙල් යොදා ගැනිණි.

## එළවළු

- අභිජනක බීජ නිෂ්පාදනය -TA2 (පතෝල) -ක්‍රි.ග්‍රෑ. 5.420
- අභිජනක බීජ නිෂ්පාදනය - තින්නවෙලි (කරවිල) ක්‍රි.ග්‍රෑ. 1.650

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා දේශීය වට්ටක්කා ප්‍රභේද දෙකක් වරණය කර ගැනීම.

## මුල් සහ ආකන්ද බෝග

- පහතරට අතරමැදි කලාපයේ සිදු කරන බතල වගාවේ බෝග අස්වැන්න කෙරෙහි නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් වල විවිධ මට්ටම් මඟින් ඇතිවන බලපෑම පරීක්ෂා කිරීම. 2012 සැප්තැම්බර් මාසයේ දී අත්හදා බැලීම සඳහා බතල වගාවක් ස්ථාපිත කළ අතර මේ වන විට අස්වැන්න නෙලමින් පවතී. මෙහි කන්නමය ප්‍රගතිය පිළිබඳව කන්නමය වාර්තාවෙහි ඇතුළත් කෙරේ.

- නව වියන් කළමනාකරණ තාක්ෂණ ක්‍රමයක් මඟින් මඤ්ඤොක්කා වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම.

- මඤ්ඤොක්කා අලයෙහි ගුණාත්මක භාවයෙහි ඵලදායීතාවය ඉහළ නැංවීම. (හෝමෝන පරීක්ෂා කිරීම)

## තාක්ෂණය පතුරුවා ලීම

### වගු අංක 1.2.3.2. 2012 වසරේ තාක්ෂණ පතුරුවාලීම

| වැඩසටහන් මාතෘකාව | පත්‍රිකා සංඛ්‍යාව | ක්ෂේත්‍ර දින ගණන | පාංශු පරීක්ෂණ සංඛ්‍යාව | ප්‍රදර්ශන |
|---|---|---|---|---|
| කොම්පෝස්ට් | 364650 | - | 66 | 03 |
| පස් | - | - | 441 | - |
| බිම්මල් | 400 | - | - | - |
| ව්‍යාධිවේදය | - | 01 | - | - |
| අන්නාසි | 2500 | - | - | - |
| දෙළුම් | 5000 | - | - | - |
| මල් වගාව | 3800 | 02 | - | - |

## රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - 2012

### වගු අංක 1. 2. 3. 3 : 2012 වසරේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

| ආයතනය | පැළයේ නම | අළෙවි කළ පැළ සංඛ්‍යාව |
|---|---|---|
| කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර | ඩ්‍රැගන් ෆෘට් | 365 |
| | ඇන්තූරියම් | 500 |
| | අන්නාසි | - |
| | කෙසෙල් | 500 |
| කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - කල්පිටිය | දෙළුම් | 5278 |
| | මිදි | 614 |
| | පේර | 1781 |
| | ඩ්‍රැගන් ෆෘට් | 50 |

### පුහුණු වැඩසටහන් වගු අංක 1. 2. 3. 4 : 2012 වසරේදී සිදු කරන ලද පුහුණු වැඩසටහන්

| වැඩසටහන් මාතෘකාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| කොම්පෝස්ට් | 50 | 3600 |
| බිම්මල් | 07 | 200 |
| අන්නාසි | 06 | 300 |

| වැඩසටහන් මාතෘකාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| මල් වගාව | 07 | 508 |
| ගෙවතු වගාව | 40 | 1800 |
| මුල් හා ආකන්ද | 06 | 175 |
| කෙසෙල් | 20 | 400 |
| ඩ්‍රැගන් ෆෘට් | 10 | 300 |
| එළවළු | 08 | විශ්වවිද්‍යාල සිසුන්- 15<br>ඩිප්ලෝමාධාරීන් - 20<br>පාසැල් සිසුන් - 150 |
| කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - කල්පිටිය | | |
| දෙළුම්, පේර, මිදි, ඩ්‍රැගන් ෆෘට් | 10 | 284 |

## උපදේශක සේවාවන්

**වගු අංක 1.2.3.5 : 2012 වසරේදී සිදු කරන ලද උපදේශක සේවාවන්**

| ක්ෂේත්‍රය | 2012 වසරේ දී ලබා දුන් උපදේශක සේවා සංඛ්‍යාව |
|---|---|
| කොම්පෝස්ට් | 500 |
| බිම්මල් | 210 |
| අන්නාසි | 150 |
| මල් වගාව | 18 |
| ගෙවතු වගාව | 10 |
| මුල් හා ආකන්ද | 150 |
| ඩ්‍රැගන් ෆෘට් | 250 |
| කෙසෙල් | 350 |
| ව්‍යාධිවේදය | 200 |
| කීට විද්‍යාව | 05 |
| එළවළු | 35 |

## 2013 වසර සඳහා සැලැස්ම

### පලතුරු අභිජනනය සහ පටක රෝපණය

- අන්නාසි දෙමුහුම්කරණ වැඩසටහන.
- අන්නාසි ජනක ප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම.
- පටක රෝපණ තාක්ෂණය මගින් අන්නාසි සහ කෙසෙල් රෝපණ ද්‍රව්‍ය නිපදවීම.
- නව ඇන්තූරියම් ප්‍රභේද (MK30, MK36) ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රශස්ත තත්ත්වයන් බිහි කිරීම.
- දෙමුහුම් අන්නාසි ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රශස්ත තත්ත්වයන් බිහි කිරීම.
- අන්නාසි සඳහා ආදර්ශන ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම.

## පලතුරු ශෂ්‍ය විද්‍යාව

- කෙසෙල් ජනක ප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම සහ ලක්ෂණීකරණය.
- දෙළුම් දෙමුහුම්කරණ වැඩසටහන
- කෙසෙල් ප්‍රභේදීය ඇගයීම. (සීනි කෙසෙල්)
- ජාතික සම්බන්ධීකරණ ප්‍ර භේද අත්හදා බැලීම - කෙසෙල්
- අර්ධ වශයෙන් දැඩි දෙළුම් දඬු කැබලි කෙරෙහි පැළ වර්ධන නියාමක වලින් ඇති වන බලපෑම.

## කීට විද්‍යාව

- පේර, දෙළුම් සහ අනෝදා බෝගවල පළිබෝධ කළමනාකරණය.
- අඹවල කොරපොතු කෘමීන්ගේ අවකාශමය සහ කාලීන ව්‍යාප්තිය නිරීක්ෂණය කිරීම.
- අඹ කොරපොතු කෘමියා පාලනය කිරීම සඳහා ආරක්ෂිත රසායන භාවිතා කිරීම.

## පාංශු විද්‍යාව සහ කොම්පෝස්ට්

- කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේදී විවධ මට්ටම් වලින් එප්පාවල රොක් ෆොස්ෆේට් එකතු කිරීම මඟින් ෆොස්ෆරස් සුලභ කිරීම.

## එළවළු

- වට්ටක්කා - පරාවර්තන වසුන් (reflect mulch) යෙදීමෙන් සහ වල් පැළෑටි පාලනය කිරීම මඟින් පළිබෝධ (වෛරස් සඳහා වාහකයන් ) පාලනය කිරීම.
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ අභිජනක බීජ නිෂ්පාදනය (කරවිල, තින්නවේලි සහ පතෝල - TA2 )

## ජල කළමනාකරණය

- අන්නාසි වගාව සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමය ඇගයීම.

## ව්‍යාධිවේදය

- තක්කාලි බැක්ටීරියා මැලවීමේ රෝගය පාලනය කිරීම සඳහා පසෙහි විවිධ වෙනස්කම් ඇති කිරීම.
- ඉදිරි අධ්‍යයන කටයුතු සඳහා දේශියව ලබා ගත හැකි බිම් මල් ප්‍රභේද එක් රැස් කිරීම.
- බිම්මල් වගා කිරීම සහ බිම්මල් බීජ නිෂ්පාදනය කිරීම. (පුහුණු වැඩසටහන්)
- බඩඉරිඟු අත්හදා බැලීම - Zea maize (කාබනික / අකාබනික නොවන පොහොර අත්හදා බැලීම).

## මල් වගාව

- ඇන්තූරියම් ජාන සම්පත් ස්ථානීයව සංරක්ෂණය කිරීම සහ උපයෝජනය
- අභිජනනය
- ඇගයීම
- රෝපණ ද්‍රව්‍යය නිෂ්පාදනය
- නාමාවලිය සකස් කිරීම

## මුල් හා ආකන්ද බෝග

- පහත රට අතරමැදි කලාපයේ බතල වගාවේ අස්වැන්න කෙරෙහි නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම්වල විවිධ මට්ටම් මඟින් ඇතිකරවන බලපෑම පරීක්ෂා කර බැලීම.

- නව වියන් කළමනාකරණ ශිල්ප ක්‍රමය මඟින් මඤ්ඤොක්කාවල ඵලදායීතාවය ඉහළ නැංවීම.

- මඤ්ඤොක්කා අලයෙහි ගුණාත්මකභාවයෙහි ඵලදායීතාව ඉහළ නැංවීම (හෝමෝන පරීක්ෂණය)

## කාර්ය මණ්ඩල ලයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂක | 1 |
| පර්යේෂණ නිලධාරි | 11 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 04 |
| කෘෂිකර්ම උපදේශක | 22 |
| පර්යේෂණ සහකාර | 08 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| ගොවිපළ කළමනාකරු | 01 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| රියදුරු | 03 |
| කාර්යාල කාර්ය සහකාර | 01 |
| පෙදරේරු | 01 |
| මුරකරු | 06 |
| කාර්මික ශිල්පී | 01 |
| තවාන්කරු | 01 |
| විදුලි ශිල්පී | 01 |
| සංචාරක බංගලා භාරකරු | 02 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 04 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| ජලනල ක්‍රියාකරු | 01 |
| තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| කම්කරු | 56 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 60 |
| **එකතුව** | **190** |

# 1.2.4 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතා එළිය

මෙම පර්යේෂණ ස්ථානය ප්‍රධාන වශයෙන් අර්තාපල් බෝගය සම්බන්ධයෙන් කටයුතු සිදු කරන අතර ඊට අමතරව එළවළු, පලතුරු සහ ඇතැම් මල් බෝග සම්බන්ධයෙන් ද සිය අවධානය යොමු කරයි. ප්‍රභේදීය වැඩි දියුණු කිරීම සහ ඉහළ අස්වනු ගෙන දෙන යෝග්‍ය ප්‍රභේද හඳුන්වා දීම මෙන්ම වරණය කිරීම බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන් වලට ඇතුළත් වේ. වැඩිදියුණු කරන ලද ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් බිහි කිරීම, පළිබෝධ, රෝග සහ පෝෂක කළමනාකරණය සඳහා යෝග්‍ය කෘෂිකාර්මික ක්‍රියාමාර්ග හරහා බෝග ඵලදායීතාව ඉහළ නැංවීම මෙන්ම බීජ අර්තාපල්, ස්ට්‍රෝබෙරි සහ ඇතැම් විසිතුරු පැළ රෝපණ ද්‍රව්‍යන්හි ගුණාත්මක තත්ත්වය සහ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද බීජ අර්තාපල් නිෂ්පාදනය සහ ඇතැම් විදේශීය එළවළු සම්බන්ධයෙන් දේශීයව බිහි කළ තාක්ෂණය තව දුරටත් වැඩිදියුණු කිරීම සඳහා වූ පර්යේෂණ කටයුතු මෙම ආයතනය මගින් සිදු කරනු ලබයි.

## අයවැය

**වගු අංක 1.2.4.1: වාර්ෂික අයවැය - 2012**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| මූලධන | 1 ,860,000 | 740,275 | 40 |
| පුනරාවර්තන | 4,332,914 | 4,448,243 | 103 |
| **ව්‍යාපෘති** | | | |
| බීජ අර්තාපල් නිෂ්පාදනය පුළුල් කිරීම. | 5,000,000 | 4,489,265 | 90 |
| බීජ අර්තාපල් නිෂ්පාදන තාක්ෂණය වැඩි දියුණු කිරීම. | 1,063,000 | 847,304 | 80 |
| දේශීය තත්ත්වයන් සඳහා නව අර්තාපල් ප්‍රභේද බිහි කිරීම. | 800,000 | 793,842 | 99 |
| පැඟිරි ප්‍රභේද ඇගයීම | 100,000 | 67,773 | 68 |
| පටක රෝපණය මගින් වැදගත් භෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම. | 2,710,000 | 2,440,010 | 90 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 500,000 | 331,280 | 66 |
| **එකතුව** | **16,365,914** | **14,157,991** | **87** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### ශෂ්‍ය විද්‍යාව

- අනුවර්ත්‍යතාව සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලද වාණිජ අර්තාපල් ප්‍රභේද 15 අතරින් මොන්ඩියෝ , සිෆ්රා සහ yp 04-108 ඉහළ අස්වනු (හෙ.ට ටොන් 30-35ක්) ගෙන දෙන

බවත් උඩරට තෙත් කලාපයේ වගා කිරීම සඳහා යෝග්‍ය බවත් අනාවරණය විය.

- පූර්ව මූලික බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම සහ ඵලදායී ප්‍රචාරක හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද අත්හදා බැලීම් වලදී ජල රෝපිත ක්‍රමය යටතේ Go පූර්ව මූලික කුඩා ආකන්ද නිෂ්පාදනය කිරීම සඳහා Go ආකන්ද හා සමානවම ක්ෂුද්‍ර ආකන්ද යෝග්‍ය බැව් අනාවරණය විය.

- උඩරට තෙත් කලාපීය ප්‍රදේශ වලදී සම්පූර්ණ බීජ අර්තාපල් ආකන්දය හා සමානවම වැඩිදියුණු කරන ලද කැපූ අර්තාපල් ආකන්ද යොදා ගත හැකි බැව් අනාවරණය විය.මෙම තාක්ෂණය මගින් බීජ අර්තාපල් අවශ්‍ය වන ප්‍රමාණය අවම කර ගැනීමට හැකි වේ.

### ශාක අභිජනනය

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම් යටතේ දේශීයව බිහිකළ අර්තාපල් ආර 4ක් (M-18,19, 01-12-10 සහ 01-09-05) ඇගයීමට ලක් කෙරිණි.

- 2013 වසරේදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම සඳහා දේශීයව බිහිකළ අර්තාපල් ආර 5ක් (01-11-01,99-25,01-08-15-සහ A-17)වරණය කෙරිණි.

- සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ සඳහා තාපයට ඔරොත්තු දෙන ප්‍රභේද බිහි කිරීමට අස්වැන්න සහ ආකන්ද ලක්ෂණ පදනම්ව තෝරා ගත් බීජ පැළ සංඛ්‍යාව 107ක් විය.

- ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේද බිහි කිරීම සඳහා දේශීයව බිහි කරන ලද ආර 107කින් 24ක් වරණය කර ගන්නා ලදි.

- වැඩි දියුණු කළ ප්‍රධාන අස්වනු අත්හදා බැලීමක් (AMYT) යටතේ දේශීයව බිහි කළ ආර 5ක් අගයන ලදි.

- දේශීයව බිහි කළ අර්තාපල් ආර 12ක ( X- 2, 01-05-03, 01-05-04(R), 01-07-06, 01-12-03, 01-12-11, 01-12-18, 01-13-01, 01-13-08, 01-16-07, 99-99 සහ 01-04-06) බීජ ගුණනය ආරම්භ කෙරිණි.

- තාපයට ඔරොත්තු දෙන ප්‍රභේද හඳුනා ගැනීම සඳහා බණ්ඩාරවෙල, කල්පිටිය සහ තිරුනෙල්වෙලි පර්යේෂණ ස්ථාන වල දේශීයව බිහි කළ අර්තාපල් ආර 107ක් ස්ථාපිත කරන ලදි.

### පටක රෝපණය

- අර්තාපල් ක්ෂුද්‍ර ආකන්ද වල විශාලත්වය සහ සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා සුදුසු ප්‍රශස්ත තත්ත්වයක් බිහි කෙරිණි.

- නව ප්‍රභේද බිහි කිරීමට අර්තාපල් වගා ප්‍රභේද නලස්ථව කිණක ප්‍රේරණය සිදු කිරීම සහ පැළ පුනර්වර්ධනය කිරීම සඳහා සුදුසු ප්‍රශස්ත තත්ත්වයක් බිහි කරන ලදි.

## කීට විද්‍යාව

- බැසිලස් තුරින්ජීන්සිස් (*Bacillus thuringiensis*) ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සඳහා සිදු කරන පර්යේෂණයේදී යොදා ගැනීම සඳහා කළු කියත් පණුවා (*Agrotis ipsilon*) සමූහ වශයෙන් බෝ කිරීම සඳහා අඩු පිරිවැයැති සහ කාර්යක්ෂම රසායනාගාර ක්‍රමවේදයක් බිහි කෙරිණි.

- ගොවීන් විසින් දැනට අනුගමනය කරනු ලබන කළමනාකරණ ක්‍රියාමාර්ග හා සංසඳනාත්මකව අවම පාරිසරික බලපෑම් ලබ්ධියකින් (EIQ) යුතුව අර්තාපල් පළිබෝධ (කියත් පණුවන්, ආකන්ද සලඹයින්, කුඩිත්තන්, වේයන් ඇතුළුව) කාර්යක්ෂමව සහ ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා පිළිවෙත් මාලාවක් (විශේෂයෙන් බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා) බිහි කරන ලදි. වර්ටකෝ 40% WG (තයෝමෙතොක්සම් 20% + ක්ලෝරන්ත්‍රැනිප්‍රෝල් 20% w/w - නියෝනිකොටිනොයිඩ් සහ ඩයමයිඩ් සම්මිශ්‍රණයකි) කියත් පණුවන් පාලනය කිරීම සඳහා පාංශු ප්‍රතිකර්මයක් ලෙස සහ කුඩිත්තන් සහ ආකන්ද සලඹයා පාලනය කිරීම සඳහා පත්‍ර වලට ඉසිනයක් ලෙස කාර්යක්ෂම බැව් අනාවරණය විය.

- ක්ෂේත්‍රයේ ගබඩා වල සිටින අර්තාපල් ආකන්ද සලඹයා පාලනය කිරීම සඳහා පිරිමි සලඹයින් සමූහ වශයෙන් උගුලට හසු කර ගත හැකි කාර්යක්ෂම පෙරමෝනයක් හඳුනා ගැනිණි.

## ව්‍යාධිවේදය

- ගොවි ක්ෂේත්‍ර තත්ත්ව යටතේ අර්තාපල් පසු අංගමාරය පාලනය කිරීමෙහිලා පහත දැක්වෙන දිලීරනාශක කාර්යක්ෂම බැව් අනාවරණය විය. ඇමිස්ටාර් (ලී. 4කට මි.ලී. 1.0 බැගින්); මැන්කොසෙබ්හි නව මුලාශ්‍රය 80% WP ලී. 1කට ග්‍රෑ. 2.5 බැගින් සහ ප්‍රොපිනෙබ් 70% WP ලී.1ට ග්‍රෑ. 2.5 බැගින් යෙදීම.

- සුකිනි වල පිටිපුස් පාලනයෙහි ෆ්ලුට්‍රිෆොල් (ලී. 5කට මි.ලී. 1ක් සහ ලී.5කට මි.ලී. 1.5ක් කාර්යක්ෂම බැව් අනාවරණය විය.

- නව අර්තාපල් අභිජනන ආර 19 සහ 01-16-15 පසු අංගමාරයට ඔරොත්තු දෙන බැව් අනාවරණය වූ අතර රෝග පාලන තත්ත්ව යටතේ ඉහළ අස්වනු ගෙන දුණි. මෙම ආර වැඩිදුර ඇගයීම සඳහා වරණය කර ගන්නා ලදි.

- නව අර්තාපල් ආර විවිධ රෝග සම්බන්ධයෙන් එනම්; අ) පසු අංගමාරය සම්බන්ධයෙන් ආර 34ක් ආ) පිටි කබොළු සම්බන්ධයෙන් ආර 14ක් සහ ප්‍රභේද 4ක් පරීක්ෂා කර බලන ලදි.

## පාංශු විද්‍යාව

- ජල රෝපිතව බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීම සඳහා නව පොහොර සංයෝගයක් බිහි කරන අතර තවදුරටත් වෙනස් කිරීම් සිදුකෙරේ.

- කොරියා ප්‍රකාශවෝල්ටීය සමාගම් ව්‍යාපෘතිය (KOPIA) යටතේ පරිභෝජනයට ගන්නා අර්තාපල් නිෂ්පාදනය කෙරෙහි ක්ෂුද්‍ර පෝෂක මගින් ඇති වන බලපෑම සොයා බැලීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදි.

## එළවළු

- උඩරට තෙත් කලාප තත්ත්වයන් යටතේ හොඳින් අස්වනු ගෙන දෙන සහ පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී බීට් ප්‍රභේද (ඩෙට්‍රොයිට් ඩාක්

රෙඩ් 2 "ක්‍රිස්ටල්", රෙඩ් ස්ටාර් සහ AX RB 462f 1) හඳුනා ගැනිණි.

- අස්වැන්න, ගෙඩියේ ලක්ෂණ සහ පොදු රෝග වලට ඔරොත්තු දීම අනුව උඩරට තෙත් කලාප තත්ත්වයන් සඳහා යෝග්‍ය ගෝවා ප්‍රභේද ( CBS 153, සුපර් ග්‍රීන් සහ සුදු ගෝවා - බලාෂි සහ සුදු ගෝවා- බැන්ඩුන්) හඳුනා ගැනිණි.

- දේශීය තත්ත්වයන් යටතේ අස්වැන්න, කැදලි ලක්ෂණ අනුව සාර්ථක මල් ගෝවා ප්‍රභේද(රොකී, බල්වානි, වයිට් ෆ්ලෑෂ්, මිල්කි වේ සහ කැන්ඩිඩ් චාම්) හඳුනා ගැනිණි.

## සංවර්ධන කටයුතු

### ශෂ්‍ය විද්‍යාව

- අර්තාපල් රෝපණ ද්‍රව්‍ය - ජල රෝපිත, වායු රෝපිත සහ භූ රෝපිත ආකාරයට පූර්ව මූලික බීජ (Go) මිලියනයක් නිපදවීම.

- විවෘත ක්ෂේත්‍රයේ ගුණනය කිරීම සඳහා ගොවීන් වෙත පූර්ව මූලික බීජ (Go) 664,210ක් නිකුත් කෙරිණි.

- සීතා එළිය ගොවිපලේ නව වායුරෝපණ ඒකකයක් ස්ථාපිත කෙරිණි.

- කිකිලියමාන ගොවීන් 26දෙනෙකුට භූරෝපිතව Go බීජ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය හඳුන්වා දීමත් ගල්පාලම ප්‍රාදේශීය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අර්තාපල් ගොවිපළ සඳහා භූරෝපණ සහ වායුරෝපණ තාක්ෂණ ක්‍රම හඳුන්වා දීමත් සිදු කරන ලදි.

- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල් ව්‍යාපෘති යටතේ ජලරෝපිතව Go බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීම සඳහා එක් ගොවියෙකු සම්බන්ධ විය. ඒ අනුව මුළු ගොවීන් සංඛ්‍යාව 8ක් දක්වා වැඩි විය.

- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ ගොවීන් විසින් නිපදවූ Go බීජ යොදාගෙන $G_1$, $G_2$ සහ $G_3$ බීජ නිපදවීම සඳහා ගොවි සමාජයක් සංවිධානය කරන ලදි.

### ශාක අභිජනනය

- අළුතින් මුදා හරින ලද ගෝල්ඩන් ස්ටාර් ප්‍රභේදයේ $G_1$ බීජ කි.ග්‍රෑ. 100ක් නිපදවිය.

## පටක රෝපණය

### 01.අර්තාපල්

- විධිමත් බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා ග්‍රැනෝලා ප්‍රභේදයේ කුඩා නලස්ථ පැළ 12,253ක් නිකුත් කළ අතර විධිමත් නොවන බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා ග්‍රැනෝලා 2,283ක්, ගොල්ඩන් ස්ටාර් 123ක් සහ ඩිසයිරි 45ක් නිකුත් කරන ලදි.
- අත්හදා බැලීම් සඳහා නලස්ථව රෝපණය කෙරුණු රාජා පැළ 135ක්, ඩිසයිරි පැළ 36ක්, අනෝවා පැළ 50ක් CIP පැළ 100ක් නිකුත් කෙරිණි.

### ස්ට්‍රෝබෙරි

- පෞද්ගලික ගොවීන් සඳහා නලස්ථ පැළ 1079ක් සහ රෝපණ ද්‍රව්‍ය 3639ක් නිකුත් කෙරිණි.
- පර්යේෂණ ස්ථානයේදී ධාවක නිෂ්පාදනය කිරීම සඳහා නලස්ථ පැළ 20ක් යොදා ගැනිණි.

### මල් බෝග

- බෙබීස් බ්‍රෙත් 3036ක්, මැඩෝනා ලිලී 1021ක්, ජර්බෙරා 396ක් සහ

ලීමෝනියම් 506ක් පැළ නිපදවා පෞද්ගලික වගාකරුවන් අතර බෙදා දෙන ලදි.

## කීට විද්‍යාව

- රජයේ බීජ අර්තාපල් ගොවිපලවල් මගින් ලැබුණු පාංශු නියැදි 893ක් අර්තාපල් කෝෂ්ඨ වටපණුවා සම්බන්ධයෙන් (PCN) විශ්ලේෂණයට ලක් කෙරිණි.

- පත්‍ර කනින්නන්ගේ (*Liriomysa huidrobrensis*) ස්වාභාවික ජෛව පාලන කාරකයින් 8250 දෙනෙකු 2012 වසරේදී ක්ෂෙත්‍ර වලට සහ වීදුරු ගෘහ වලට මුදා හරින ලදි.

## ව්‍යාධිවේදය

- බැක්ටීරියා මැලවීම සම්බන්ධයෙන් පාංශු නියැදි 1091ක් පරික්ෂා කරන ලදි.
- රෝග විනිශ්චය කිරීමට සහ පාලන නිර්දේශ ලබා ගැනීම සඳහා පැළ නියැදි 25ක් ලැබුණි.
- ඔයිස්ටර් බිම්මල් බීජ කි.ග්‍රෑ. 10ක් සහ බොත්තම් බිම්මල් බීජ කි.ග්‍රෑ. 14ක් ගොවීන් අතර බෙදා දෙන ලදි.
- බීජ අර්තාපල් නිෂ්පාදනයේ විවිධ අදියර වලින් එනම් නලස්ථ, මුල් ඇඳුණු කඳ කැබලි, පූර්ව මූලික, මූලික, බීජ අර්තාපල් සහ ගොවි ක්ෂෙත්‍ර ගහන මගින් එක්රැස් කර ගත් පැළ නියැදි 73ක් PLRV, PVY, PVX, PVS, PVM සහ PVA වෛරස් හඳුනා ගැනීම සඳහා පරික්ෂාවට ලක් කෙරිණි.

## පාංශු විද්‍යාව

- පාංශු නියැදි 1502ක් පොහොර නිර්දේශ ලබාදීම සඳහා පරික්ෂාවට ලක් කෙරිණි.

| | | |
|---|---|---|
| PH | - | 514 |
| EC | - | 514 |
| ෆොස්ෆරස් | - | 237 |
| පොටෑෂ් (K) | - | 237 |

## වැඩමුළු / ඉදිරිපත් කිරීම්

- බීජ අර්තාපල් නිෂ්පාදනය, සහතික කිරීම සහ නෙදර්ලන්තයේ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ පුහුණුවක් සඳහා එක් නිලධාරියෙක් සහභාගී විය.

- නිලධාරීන් තිදෙනෙකු ගන්නොරුව සේවා සංස්කරණ මධ්‍යස්ථානයේ පැවති පරිගණක පුහුණු වැඩසටහනට සහභාගි විය.

- එක් නිලධාරියකුට ව්‍යාධිවේදය පිළිබඳ පුහුණුවක් ලබන ලදි.

- අළුතින් බඳවා ගන්නා ලද පර්යේෂණ සහකරුවන් 7 දෙනෙකුට ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථානයේදී සේවාස්ථ පුහුණුව ලබාදුණි.

- රජයේ බීජ අර්තාපල් ගොවිපළේ කාර්ය මණ්ඩලය සඳහා පළිබෝධ සහ රෝග කළමනාකරණය පිළිබඳ පුහුණුව.

- බෙබීස් බ්‍රෙත් පිළිබඳව වාර්ෂික කෘෂිකර්ම සමුළුව කළ ඉදිරිපත් කිරීම.

## පුහුණු

- 2012 වසරේදී විද්‍යාවේදී උපාධි අපේක්ෂක සිසුන් පස් දෙනෙකු සිය අවසන් වසර විශේෂ ව්‍යාපෘති අවසන් කරන ලදි.

- විශ්වවිද්‍යාල සිසුන් 154ක්, කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් 312ක්, පාසැල් සිසුන් 190ක්, කෘෂිකර්මාන්තයට සම්බන්ධ නිළධාරින් 49ක්, පාසැල් ගුරුවරුන් 30ක් සහ ගොවීන් 347ක් අර්තාපල් වගා

කිරීම සහ කළමනාකරණය, බීජ අර්තාපල් නිපදවීම, මල් වගාව, ස්ට්‍රෝබෙරි වගාව සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳව පුහුණු කරන ලදි.

## 2013 වසර සඳහා සැලැස්ම

### ශෂ්‍ය විද්‍යාව

- අනුවර්තනය වීම සහ අස්වැන්න සඳහා වාණිජ අර්තාපල් ප්‍රභේද අගයන ලදි.
- පූර්ව මූලික සහ මූලික බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා නව ශිල්ප ක්‍රම බිහි කිරීම.
- කුඩා ආකන්ද සහ විවිධ පරම්පරාවල බීජ ආකන්ද සඳහා ගබඩාකරණ අධ්‍යයන.
- ගොවි කළමනාකරණ තත්ත්ව යටතේ පේළිය තුළ වූ පරතරය මගින් අස්වැන්න කෙරෙහි ඇති වන බලපෑම ඇගයීම.

### ශාක අභිජනනය

- නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක වලදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 4ක් අගයන ලදි.
- නුවරඑළිය සහ බණ්ඩාරවෙල පර්යේෂණ ස්ථාන වලදි ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 5ක් ඇගයීමට ලක් කෙරිණි.
- තාපයට ඔරොත්තු දෙන ප්‍රභේද හඳුනා ගැනීම සඳහා බණ්ඩාරවෙල, කල්පිටිය සහ තිරුනෙල්වෙලි පර්යේෂණ ස්ථාන වලදී දේශීයව බිහි කළ අර්තාපල් ආර 107ක් අගයන ලදී.
- මහා පරිමාණ අස්වනු අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 12ක් අගයන ලදි.
- ප්‍රධාන අස්වනු අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 7ක් අගනය ලදි.
- හිතකර ලක්ෂණ වරණය කිරීමට මෙන්ම මාපිය ආර වරණය කර ගැනීම සඳහා CIP ජනක ප්ලාස්ම අගයන ලදි.
- මූලික අස්වනු අත්හදා බැලීම යටතේ දේශීයව බිහි කළ අර්තාපල් ආර 24ක් අගයන ලදි.
- සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ තිබෙන ජනප්ලාස්ම ලක්ෂණීකරණය කිරීම.
- ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික තත්ත්වයන් කෙරෙහි වූ යෝග්‍යතාව සොයා බැලීම සඳහා ආනයනික ප්‍රභේද 15ක් අගයන ලදි.

### පටක රෝපණය

- පෙයාර්ස්, ඇපල් සහ පැඟිරි වල නිරෝගී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනය.
- ශ්‍රී ලංකාවේ ග්‍රැනෝලා රූප විද්‍යාත්මකව සහ අණුක විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම.
- කපුරු සඳහා ප්‍රශස්ත තත්ත්වයන් බිහි කිරීම
- විවිධ ස්ට්‍රෝබෙරි ප්‍රභේද ඇගයීම සහ වැඩිදියුණු කිරීම.

### කීට විද්‍යාව

- බීජ අර්තාපල් රෝපණය කිරීමට පෙර තෝරා ගත් ඉඩම්වල අර්තාපල් කෝෂ්ඨ වටපණුවා ආසාදනය වීමේ තත්ත්වය නිර්ණය කිරීම පිණිස අර්තාපල් කොෂ්ඨ නෙමටෝඩා ගහනය නිරන්තරයෙන්ම අධීක්ෂණය

කිරීම මගින් නුවරඑළියේ රජයේ බීජ අර්තාපල් ගොවිපළ වල සිදුකෙරෙන අර්තාපල් කොෂ්ඨ නෙමටෝඩාවන් පාලනය කිරීමේ වැඩසටහන අඛණ්ඩවම සිදු කෙරිණි.

- කියත් පණුවන් ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සඳහා Bt සංයෝග වල සාර්ථකත්වය අධ්‍යයනය කිරීම : නුවරඑළිය ප්‍රදේශයේ ප්‍රධාන පළිබෝධ ගැටළුවකි.

- කළු කියත් පණුවා පාලනය කිරීම සඳහා ආරක්ෂිත නව කෘමිනාශක කිහිපයක සාර්ථකත්වය ඇගයීමට ලක් කෙරිණි.

- ආර්තාපල් ආකන්ද සලඹයා ඇතුළු අර්තාපල් පළිබෝධ කළමනාකරණය කිරීම සඳහා, විශේෂයෙන්ම බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා පරිසරයට හිතකර ක්‍රම බිහිකිරීම සහ නිර්දේශ කර තිබෙන විෂ සහිත කෘමිනාශක වෙනුවට විවිධ ක්‍රියාකාරීත්වයෙන් යුත් කෘමිනාශක හඳුනා ගැනීම.

- ගබඩාවල අර්තාපල් ආකන්ද සලඹයා කළමනාකරණය කිරීම සඳහා රසායනික සහ රසායනික නොවන ක්‍රමවල සාර්ථකත්වය සහ කාර්යක්ෂමතාව ඇගයීම.

- ස්ට්‍රෝබෙරි සහ එළවළු වල සිටින සුදු ඉහඳ පණුවා ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සහ Bt මාදිලිවල සාර්ථකත්වය සහ කාර්යක්ෂමතාවය නිර්ණය කිරීම.

## ව්‍යාධිවේදය

- අර්තාපල් පසු අංගමාරයට එරෙහිව දිලීරනාශක ඇගයීම.

- පසු අංගමාරයට එරෙහිව වාණිජ අර්තාපල් ප්‍රභේද සහ නව අර්තාපල් අභිජනන ආර පරීක්ෂා කර බැලීම.

- ගෝවා බීජ වලින් හට ගත් කළු කුණුවීමේ (*xanthomonas campestris pv. campestris/xcc*) ආමුකුලණ සඳහා උණු වතුර ප්‍රතිකාරයේ බලපෑම අධ්‍යයනය කිරීම.

- අර්තාපල් පිටි කබොළු රෝගය (*spongospora subterranea*) පිළිබඳ වසංගත විද්‍යා අධ්‍යයන.

- අර්තාපල් පිටි කබොළු රෝගයට එරෙහිව අර්තාපල් ප්‍රභේද ඇගයීම.

- අර්තාපල් වගා කරන විවිධ ප්‍රදේශ වලින් හුදකලාව ලබා ගත් පයිටොප්තොරා (*phytopthora infestans)* එක්රැස් කර නඩත්තු කිරීම.
- ඔයිස්ටර් බිම්වල් බීජ නිෂ්පාදනය කිරීම සඳහා නව තාක්ෂණයක් බිහි කිරීම.

## පාංශු විද්‍යාව

- ජල රෝපිත සහ වායු රෝපිත ක්‍රම සඳහා විවිධ පෝෂක සංයෝග පරීක්ෂා කිරීම.

- බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීම සඳහා නව පොහොර සංයෝග පරීක්ෂා කිරීම.

- කොරියානු ප්‍රකාශ වෝලිටීය සමාගම් ව්‍යාපෘතිය යටතේ අර්තාපල් අස්වැන්න සහ ගුණාත්මය සම්බන්ධයෙන් ද්විතීය සහ ක්ෂුද්‍ර පෝෂක වල බලපෑම පිළිබඳව පරීක්ෂා කිරීම.

- බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සමඟ එක්ව බීජ අර්තාපල් නිෂ්පාදනයේදී නයිට්‍රජන්, පොටෑෂ් සහ පොටෑසියම් කලමනාකරණය කිරීම.

- භූමිය වැඩිදියුණු කිරීම සහ පස සංරක්ෂණ කිරීම සඳහා ක්‍රම බිහි කිරීම.

**එළවළු**

- කැරට් සහ බීට්රූට් සඳහා කාර්යක්ෂම බීජ නිෂ්පාදන තාක්ෂණයක් බිහි කිරීම.
- කැරට්, ගෝවා, ලීක්ස් සහ මල් ගෝවා වැනි හඳුන්වා දෙන ලද විදේශීය එළවළු ප්‍රභේද වල අනුවර්තනය වීමේ හැකියාව ඇගයීම.
- එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා හඳුනා ගන්නා ලද නව තාක්ෂණික ක්‍රම ඇගයීම.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| **තනතුර** | **නිළධාරී සංඛ්‍යාව** |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිළධාරි | 01 |
| පර්යේෂණ නිළධාරි | 04 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 03 |
| පර්යේෂණ නිළධාරි | 07 |
| කෘෂිකර්ම උපදේශක | 04 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| පරිපාලන නිළධාරි | 05 |
| රා.කළ.සහකාර | 01 |
| රියදුරු | 02 |
| ගබඩා භාරකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| තවාන්කරු | 01 |
| මුරකරු | 01 |
| කම්කරු | 16 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 43 |
| **එකතුව** | **93** |

# 1.2.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල

ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය ප්‍රධාන වශයෙන්ම පලතුරු, එළවළු, මුල් සහ ආකන්ද බෝග සහ බිම්මල් වල ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස තාක්ෂණය ජනනය කිරීම සහ පතුරුවා හැරීම සම්බන්ධයෙන් කටයුතු කරයි. ඊට අමතරව, රෝපණ ද්‍රව්‍ය නිපදවීම සහ බෙදා හැරීම සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දකුණු කලාපයේ බෝග නිෂ්පාදනයෙහි තිරසාර බව සහතික කිරීම පිණිස ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ ගොවීන් පුහුණු කිරීමත් දැනුම ලබාදීමත් කෙරෙහිද සිය අවධානය යොමු කරයි.

## අයවැය

**වගු අංක 1.2.5.1 : 2012 වසරේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 4,746,020 | 4,666,664 | 98 |
| මූලධන | 2,250,000 | 1,385,222 | 61 |
| **ව්‍යාපෘති** | | | |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම (NARP) ෆ්‍යුසාරියම් මැලවීමට ප්‍රතිරෝධිතාවය ඇති කිරීම සඳහා කෙසෙල් නලස්ථ විකෘති ජනනය කිරීම | 519,000 | 501,056 | 96 |
| NARP - (බිම්මල්) වැඩසටහන | 1,119,000 | 1,097,091 | 98 |
| කෙසෙල් ඵලදායිතාවය ඉහළ නැංවීම (බෝග සම්බන්ධීකාරක) | 1,200,000 | 1,190,865 | 99 |
| පටක රෝපණ තාක්ෂණය හරහා වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම | 1,190,000 | 1,187,206 | 99 |
| **එකතුව** | **11,024,020** | **10,028,106** | **90** |

## ප්‍රගතිය

### පර්යේෂණ

### ප්‍රවේණිය සහ පැළෑටි අභිජනනය

මෑ

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා ලැබීම යටතේ නිර්දේශිත මෑ ප්‍රභේද දෙකක් (*Vigna sesquipedalis*) සමඟ මෑ ආර 5ක් ඇගයීමට ලක් කෙරිණි.

හඳුන්වා දෙන ලද මෑ ප්‍රවේශයක් සඳහා මූලික අස්වනු අත්හදා බැලීම සිදු කෙරිණි.

මෑ/ ඵලවළු කව්පි සුදුසු ආර හඳුනා ගැනීම සඳහා ජනක ප්ලාස්ම පරීක්ෂාවට ලක් කළ අතර වැඩිදුර ඇගයීම සඳහා ප්‍රවේශ 6ක් (මෑ/ ඵලවළු කව්පි) වරණය කර ගන්නා ලදි.

**වම්බටු**

විවෘත පරාගනය වන ප්‍රභේදය සමඟ වම්බටු ආර තුනක් සහ එක් දෙමුහුමක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ අගයන ලදි.

## උද්‍යාන බෝග

**කෙසෙල්**

බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වාර්ෂික රෝපණ ක්‍රමය යටතේ කෙසෙල් වගාව සඳහා පවතින පොටෑසියම් සහ එහි කළමනාකරණය පිළිබඳව තක්සේරු කෙරිණි.

**අන්නාසි**

අන්නාසි බෝගයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා කාර්යක්ෂම පෝෂක කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම සහ පත්‍ර කප්පාදු කිරීම.

**අඹ**

අඹ වගාවේ පොහොර භාවිතය සඳහා වැඩිදියුණු කළ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මාලාවක් සහ කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම.

## ව්‍යාධිවේදය සහ සූක්ෂමජීවී ජෛව තාක්ෂණය

**බිම්මල්**

දෙවනුව සිදු කරන වගාවක් සඳහා විභව වර්ධන උපස්තරයක් (SMS)ලෙස ඔයිස්ටර් (*Pleurotus*) බිම්මල් වල භාවිත කළ බිම්මල් උපස්තරයේ යෝග්‍යතාව සහ කොළ ඵලවළුවල පත්‍රවලට වැළඳෙන රෝගය කළමනාකරණය කිරීම සඳහා ජෛව පළිබෝධනාශකයක් පිළිබඳ විමර්ශනය කර තහවුරු කර ගැනිණි.

රනිල බීජ මඟින් ලබාගන්නා පිටි වලට ආදේශකයක් ලෙස වර්ධන උපස්තරයට භාවිත කළ (*Pleurotus*) බිම්මල් උපස්තරය එක් කිරීමෙන් අත්වන පිරිවැය සඵලත්වය පිළිබඳ අධ්‍යයනය කර සනාථ කර ගන්නා ලදි.

ඔයිස්ටර් (*Pleurotus*) බිම්මල් වල අස්වැන්න ඉහළ නැංවීම සඳහා ප්‍රශස්ථ PH මට්ටම පිළිබඳව විමර්ශනය කෙරිණි.

දේශීය බිම්මල් වර්ගයක් කෘත්‍රිමව වගා කිරීම සඳහා පවතින හැකියාව පිළිබඳව ගවේෂණය කිරීම සඳහා මූලික විමර්ශන සිදු කෙරිණි.

**ව්‍යාපෘති**

**ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම**

වරණය කර ගන්නා ලද බිම්මල් වර්ග කීපයක පෝෂණීය පැතිකඩ මෙන්ම ප්‍රතිඔක්සිකාරක සහ ප්‍රතික්ෂුද්‍ර ජීවී ලක්ෂණ පිළිබඳ ඇගයීම.

උපකරණ සහ රසායනික මිළදී ගත් අතර (ලැමිනා ෆ්ලෝ කැබිනට් සහ ඔටෝක්ලේව්) රසායනාගාර පහසුකම් වැඩිදියුණු කරන ලදි.

**ෆියුසාරියම් මැලවීමට ප්‍රතිරෝධීතාව /ඔරොත්තු දීම සඳහා නලස්ථව කෙසෙල් විකෘතිජනනය කිරීම**

අග්‍රා වගා ප්‍රභේදයේ රෝපිත ගුණනය කෙරිණි. පර්යේෂණ කටයුතු පහසු කිරීම සඳහා තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ රසායනාගාර පහසුකම් වැඩිදියුණු කරන ලදි.

## පටක රෝපණය

**පටක රෝපණ තාක්ෂණය හරහා වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම.**

සුළු පරිමාණයෙන් පටක රෝපණය කිරීමේ රසායනාගාරයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදි කළ අතර අවශ්‍ය ආම්පන්න සහ වෙනත් යෙදවුම් මිළදී ගන්නා ලදි.

## කෙසෙල් ඵලදායීතාව ඉහළ නැංවීම

උඩවලව සහ මහවැලි ප්‍රදේශයේ හෙ. 300ක බිම් කට්ටි 06ක් සම්පූර්ණ කෙරිණි.

පුහුණු පන්ති 18ක් සිදු කෙරිණි.

තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී ක්ෂේත්‍ර වැඩසටහනක් සංවිධානය කරන ලදි.

මාතර දිස්ත්‍රික්කයේ වාණිජ ආයෝජකයෙකු සමඟ කෙසෙල් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම ආරම්භ කළ අතර මොරෙයියන් 50000ක් ඉලක්ක කර ගනිමින් මාතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල මව් පැළ 7800ක් පමණ ස්ථාපිත කෙරිණි.

## වෙනත් කාර්යයන්

ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා 30A තෙකලා විදුලි සම්බන්ධතාවය ලබා ගන්නා ලදි.

## ඉදිරිපත් කිරීම් සහ ප්‍රකාශන

2012 වාර්ෂික කෘෂිකර්ම සමුළුවේදී "බේබීස් බ්‍රෙත් (*Gypsophila Paniculata L.*) සමූහ ප්‍රචාරණය සඳහා සරල ක්‍රියා මාර්ගයක්" නම් වූ පර්යේෂණ ප්‍රකාශනය ඉදිරිපත් කෙරිණි.

"ශාක පටක රෝපණය" පිළිබඳ පොතක් සාමූහිකව සකස් කරන ලදි.

කෙසෙල් කර්මාන්තය සඳහා සකස් කෙරුණු හරිත තාක්ෂණයන් පිළිබඳ පණිවිඩය ප්‍රදර්ශනය කිරීමේ පොස්ටරයක් තායිවානයේ අන්තර්ජාතික සමුළුවකට ඉදිරිපත් කරන ලදි.

ඔයිස්ටර් (*Pleurotus spp*) බිම්මල් වගාව සඳහා විකල්ප පෝෂක මාධ්‍යයක් ලෙස පශ්චාත් බිම්මල් උපස්තරය යොදා ගැනීමේ හැකියාව 2012 කෘෂිකර්මය සහ පරිසර පිළිබඳව අන්තර්ජාතික සමුළුවේදී ඉදිරිපත් කළ පෝස්ටරය.

නාගරික කෘෂිකර්මය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔයිස්ටර් (*Pleurotus*) භාවිත කළ බිම්මල් උපස්තරයේ කාර්යක්ෂම උපයෝජනය - 2012 තිරසාර සංවර්ධනය සඳහා කෘෂි ජෛව තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ඉන්දියා සමුළුවේදී ඉදිරිපත් කළ පත්‍රිකාව

## වෙනත්

රෝපණ ද්‍රව්‍ය සහ කොම්පෝස්ට් නිපදවීම

| | | |
|---|---|---|
| අන්නාසි | - | 50000 |
| කිරිඅල | - | 75 |
| කෙසෙල් | - | 6885 |
| මඤ්ඤොක්කා | - | 495 m |
| කොළ එළවළු | - | කි.ග්‍රෑ. 220 |
| කොම්පෝස්ට් | - | ටොන් 26 |

1. ගරාජය ඉදිකිරීමේ වැඩ කටයුතු සම්පූර්ණ කෙරිණි.
2. නව ගෙවත්තක් සකස් කෙරිණි.
3. බිම්මල් නිෂ්පාදන ඒකකය සඳහා ගබඩා කාමරයක් ඉදි කරන ලදි.
4. පටක රෝපණ රසායනාගාරය ඉදි කිරීම සම්පූර්ණ කරන ලදී.

## සහභාගී වූ සමුළු/ සම්මන්ත්‍රණ

ABSD 2012: තිරසාර සංවර්ධනය සඳහා ජෛව තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ඉන්දියා සමුළුව.

ISAE 2012: රුහුණු සරසවිය මගින් සංවිධානය කරන ලද කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ අන්තර්ජාතික සමුළුව.

## 2013 වසර සඳහා සැලැස්ම

### ශාක අභිජනනය

- වරණය කෙරුණු කව්පි ප්‍රවේශ වල බීජ නිෂ්පාදනය සහ අස්වැන්න සහ අනෙකුත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් ඇගයීම.
- වසර පුරාම නිෂ්පාදනය කිරීම සඳහා එළවළු කව්පි සහ මෑ ජනක ප්ලාස්ම පරීක්ෂා කර බැලීම.
- විකෘති ප්‍රේරණය මගින් ගුණාත්මක බවින් ඉහළ ඵල සහිත ඉහළ අස්වනු ගෙන දෙන පළිබෝධ සහ රෝග වලට ඔරොත්තු දෙන අන්නාසි ප්‍රභේද බිහි කිරීම.
- කෙසෙල් ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ලක්ෂණීකරණය කිරීම, කළමනාකරණය, ඇගයීම සහ වරණය කිරීම.
- පහත රට ප්‍රදේශයේ තිබෙන දේශීය සාම්ප්‍රදායික එළවළුවල ජනක ප්ලාස්ම එක්රැස් කිරීම, ලක්ෂණීකරණය, ඇගයීම සහ වරණය කිරීම.
- මාතර දිස්ත්‍රික්කයේ ආර්ථික වශයෙන් වැදගත් පලතුරු බෝග වල ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ විවිධ බෝග පාලන කළමනාකරණ පිළිවෙත් මාලා හරහා කළමනාකරණය කිරීම.

### උද්‍යාන බෝග වගාව

- පහතරට ඌන භාවිත පලතුරු බෝග එකරැස් කිරීම සහ කළමනාකරණය කිරීම මෙන්ම නව ප්‍රචාරණ ක්‍රම බිහි කිරීම.
- මාතර දිස්ත්‍රික්කයේ ආර්ථික වශයෙන් වැදගත් පලතුරු බෝගවල ප්‍රධාන පළිබෝධ, රෝග සහ ශෂ්‍ය විද්‍යාත්මක ගැටළු හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම.
- අන්නාසි පිටි මකුණා පිළිබඳ සමෝධානික කළමනාකරණය.
- පහතරට එළවළු සහ ආකන්ද බෝග වල අනුවර්තානාව පිළිබඳ පරීක්ෂා කිරීම.

### ව්‍යාධිවේදය / ක්ෂුද්‍රජීවී ජෛව තාක්ෂණය

- ඔයිස්ටර් බිම්මල් සඳහා ආරක්ෂිත සහ පාරිභෝගික හිතකර පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපායන් සකස් කිරීම.
- ඖෂධීය ගුණයෙන් යුත් බිම්මල් වගා කිරීමේ හැකියාව පිළිබඳ ගවේෂණය කිරීම.

### ජෛව තාක්ෂණය

#### ව්‍යාපෘති

- ෆ්‍යුසාරියම් මැලවීමට ප්‍රතිරෝධීවීම / ඔරොත්තු දීම සඳහා කෙසෙල් නලස්ථව විකෘතිජනනය කිරීම.

  තවදුරටත් ප්‍රරෝහ අග්‍රස්ථ ගුණනය කිරීම.

  ප්‍රරෝහ අග්‍රස්ථ සඳහා විකිරණ සංවේදිතාව/ EMS මාත්‍රාව පරීක්ෂා කර බැලීම.

  රෝපිත ස්ථාපිත කිරීම (Scalp cultures).

  කලලජනක සෛල අවලම්බන රෝපිත (ECS ) ස්ථාපිත කිරීම.

  ප්‍රරෝහ අග්‍රස්ථ රෝපිත ප්‍රවිකරණය කිරීම.

  ප්‍රවිකිරණය කරන ලද ප්‍රරෝහ අග්‍රස්ථ නලස්ථව ගුණනය කිරීම.

**පටක රෝපණ තාක්ෂණය මගින් වැදගත් බෝගවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම.**

කෙසෙල්, අන්නාසි සහ වරණය කරගත් මල් බෝග කීපයක අඩු පිරිවැයැති ක්ෂුද්‍ර

ප්‍රචාරණය සඳහා සුදුසු තත්ත්ව හඳුනා ගැනීම.

### වෙනත් කාර්යයන්

ක්ෂුද්‍ර ප්‍රචාරණය පිළිබඳව පුහුණු කිරීම (අඩු පිරිවැයති විකල්ප සමඟ)

පටක රෝපිත පැළ පරිසරයට හුරු කිරීම සඳහා අඩු පිරිවැයැති විකල්පයක් ලෙස ප්‍රචාරකයක් සකස් කිරීම.

පටක රෝපිත පැළ නඩත්තු කිරීම සඳහා ආරක්ෂිත ගෘහයක් ඉදි කිරීම.

## කාර්ය මණ්ඩල ලයිස්තුව

| **තනතුර** | **සංඛ්‍යාව** |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ | |
| නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| වැඩසටහන් නිලධාරි | 03 |
| පර්යේෂණ සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 05 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| රාජ්‍ය කළමණාකාර සහකාර | 02 |
| කාර්යාල සහකාර | 01 |
| ගබඩාකරු | 01 |
| රියදුරු | 02 |
| මුරකරු | 05 |
| කම්කරු | 04 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| කොන්ත්‍රාත් කම්කරු | 30 |
| **එකතුව** | **60** |

# 1.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් 1980 දී ස්ථාපිත කරන ලද ගිරාඳුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය කෘෂිකර්මාන්තය සම්බන්ධ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සම්බන්ධවද මහවැලි සී කලාපයේ ගොවි ප්‍රජාව බෝග නිෂ්පාදනයේදී මුහුණු පාන ක්ෂේත්‍ර ගැටළු සඳහා විසඳුම් ලබාදීම සම්බන්ධයෙන්ද වගකීම දරයි. 1984 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පැවරුණු මෙම ආයතනය ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අනුබද්ධ කරන තෙක් 2000 වසර දක්වා ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක විය.

මෙම ආයතනය එළවළු, පලතුරු සහ මුල් සහ ආකන්ද බෝගවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වූ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කෙරෙහි සිය අවධානය යොමු කරනු ලබයි.

පර්යේෂණ සහ නිෂ්පාදන වැඩසටහන් වලට අමතරව මෙම ආයතනය නිලධාරීන්, ගොවීන්, පාසැල් සිසුන් සහ වෙනත් සංවිධානවල පුද්ගලයින් සඳහා නිරන්තරයෙන්ම පුහුණු වැඩසටහන් සිදු කරමින් මහවැලි සී කලාපයේ ගොවි ප්‍රජාව වෙත සිය සේවය ලබා දේ.

## අයවැය

2012 වසරේදී විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් පිළිබඳව වගු අංක 1.2.6.1හි දැක්වේ.

**වගු අංක 1.2.6.1 : වාර්ෂික අයවැය 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 1, 278,143 | 415,325 | 32 |
| පුනරාවර්තන | 3,714,750 | 3,384,862 | 91 |
| **ව්‍යාපෘති** | | | |
| • බඩ ඉරිඟු (සම්පත්) දෙමුහුම් බීජ නිෂ්පාදන වැඩසටහන | 125,000 | 124,849 | 100 |
| • කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම | 50,000 | 50,000 | 100 |
| • පැඟිරි ව්‍යාපෘතිය - ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම | 100,000 | 98,165 | 98 |
| • Bg 366 බිත්තර වී නිෂ්පාදනය | 77,810 | 75,260 | 97 |
| • පැපොල් බීජ නිෂ්පාදන වැඩසටහන (රත්න) | 1,300,000 | 1,094,722 | 84 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| • දෙමුහුම් වම්බටු බීජ නිෂ්පාදන වැඩසටහන | 280,000 | 279,097 | 100 |
| • ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය (ජල සම්පාදන ඇල මාර්ග අළුත් වැඩියා කිරීම, බිත්තර වී නිෂ්පාදනය, අඹ ශාකය පුනරුත්තාපනය කිරීම) | 3,400,000 | 3,252,611 | 96 |
| • ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සෝයා බෝංචි නිෂ්පාදන - වැඩසටහන | 700,000 | 673,217 | 96 |
| • ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වී නිෂ්පාදන වැඩසටහන | 400,000 | 347,855 | 87 |
| **එකතුව** | **11,425,703** | **9,795,962** | **76** |

## ප්‍රගතිය

### බීජ නිෂ්පාදන වැඩසටහන

1. දෙමුහුම් වම්බටු (අමන්දා) බීජ නිෂ්පාදනය

   2012 වසරේදී හෙ. 0.1ක දෙමුහුම් වම්බටු බීජ නිෂ්පාදන වැඩසටහන ස්ථාපිත කළ අතර F1 බීජ කි.ග්‍රෑ. 14ක් නිපදවිය.

2. අභිජනක බීජ නිෂ්පාදනය

   2012 වසරේදී MI – 5 බණ්ඩක්කා අභිජනක බීජ නිෂ්පාදන වැඩසටහන හෙ. 0.1ක සිදු කළ අතර බීජ කි. ග්‍රෑ. 29ක් නිපදවිය.

3. බිත්තර වී නිෂ්පාදන වැඩසටහන

   2011/12 මහ සහ 2012 යල කන්න වලදී Bg 366 ප්‍රභේදයේ බිත්තර වී මෙ.ටො. 41.2ක් නිපද වූ අතර නිෂ්පාදන තොග වශයෙන් At 308 හි මෙ.ටො. 26.8ක්, Bg 379/2 හි මෙ.ටො.8.8ක් සහ Bg 366 හි මෙ.ටො. 10.4ක් නිපදවිය.

4. උඳු ලියාපදිංචි කළ බීජ නිෂ්පාදන වැඩසටහන (MI – 1)

   2012 වසරේදී උඳු ලියාපදිංචි බීජ නිෂ්පාදන වැඩසටහන අක්කර 1.5ක සිදු කළ අතර MI – 1 උඳු බීජ කි.ග්‍රෑ. 250ක් නිපදවිය.

5. ස්භාවිකව පරාගන වන බඩ ඉරිඟු ප්‍රභේද වල බීජ නිෂ්පාදන වැඩසටහන.

   2012 වසරේදී ස්භාවිකව පරාගනය වන බඩ ඉරිඟු බීජ නිෂ්පාදන වැඩසටහන $100m^2$ ක සිදු කළ අතර පහත දැක්වෙන බීජ නිෂ්පාදනය කරන ලදි.

| ප්‍රභේදය | අස්වැන්න (කරල් කි.ග්‍රෑ) |
|---|---|
| අ) ලමුරු | 47 |
| ආ) ගුමරං | 14 |

6. පැපොල් බීජ නිෂ්පාදන වැඩසටහන (රත්න)

   සහතික කළ බීජ කි.ග්‍රෑ. 5.3ක් නිපදවිය.

## රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

| බෝගය | ප්‍රභේදය | 2012 වසරේ නිෂ්පාදනය |
|---|---|---|
| කෙසෙල් | සීනි කෙසෙල්<br>ඇඹුල් කෙසෙල්<br>කෝලිකුට්ටු<br>අළු කෙසෙල්<br>කණ්ඩුල සහ වෙනත් ප්‍රභේද | මොරෙයියන් 108ක් |
| පැපොල් | රත්න | බඳුන් පැළ 63ක් |
| කිරිඅල | ඉසුරු | පැළ 220 |
| මඤ්ඤොක්කා | කිරිකවඩි සහ යාපනය වරණය | කැබලි මීටර් 858ක් |
| බතල | ගන්නොරුව සුදු<br>රණබිම<br>අමා සහ ධවල | දඬු කැබලි කි.ග්‍රෑ. 31ක් |
| වැල් දොඩම් | - | බඳුන් පැළ 73ක් |

### පර්යේෂණ

#### අ) පලතුරු

- දේශීය සහ හඳුන්වා දෙන ලද පැඟිරි ප්‍රභේද වල ප්‍රභේදීය ඇගයීම අඛණ්ඩව සිදු කිරීම.

| | | |
|---|---|---|
| ප්‍රභේද - | දේශීය - | ප්‍රභේද 07ක් (ආරෝග්‍යා, බිබිල ස්වීට්, MKD, රහංගල වරණය, HOCR 23, HOCR 25 සහ HOCR 29) |
| | හඳුන්වා දෙන ලද - | ජපානයෙන් හඳුන්වා දෙන ලද ප්‍රභේද 08ක් (NCN, MYG, OTA, NAN, OUT, YSD, SRD, KYM) |

#### ආ) එළවළු

පහත දැක්වෙන එළවළු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කෙරිණි.

| | බෝගය | 2011/12 මහ | 2012 යල |
|---|---|---|---|
| 1. | වම්බටු | ප්‍රභේද 06ක් | ප්‍රභේද 05ක් |
| 2. | මෑ | ප්‍රභේද 07ක් | ප්‍රභේද 07ක් |
| 3. | මාළුමිරිස් | ප්‍රභේද 05ක් | ප්‍රභේද 05ක් |

#### ඇ) වී (ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

2011/12 මහ සහ 2012 යල කන්න වලදී මාස 2 ½, 3, 3 ½, 4 සහ 4 ½ යන වයස් කාණ්ඩ වලට අදාළව ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සිදු කෙරිණි.

#### ඇ) වෙනත් ක්ෂේත්‍ර බෝග/මුල් සහ ආකන්ද බෝග

- පහත දැක්වෙන වෙනත් ක්ෂේත්‍ර බෝග, මුල් හා ආකන්ද බෝග සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කෙරිණි.

| බෝගය | 2011/12 මහ | 2012 යල |
|---|---|---|
| 1. බතල | ප්‍රභේද 06ක් | ප්‍රභේද 06ක් |
| 2. අඹ | ප්‍රභේද 06ක් | ප්‍රභේද 05ක් |
| 3. කව්පි | - | ප්‍රභේද 08ක් |

2011/2012 මහ කන්නයේදී ගොවි ක්ෂේත්‍ර සහ පර්යේෂණ ස්ථානය යටතේ පහත දැක්වෙන බෝග සම්බන්ධයෙන් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සිදු කරන ලදි.

| | බෝගය | ගොවි ක්ෂේත්‍රය | පර්යේෂණ ස්ථානය |
|---|---|---|---|
| අ) | අඹ | ප්‍රභේද 04ක් | - |
| ආ) | රටකජු | ප්‍රභේද 05ක් | ප්‍රභේද 05ක් |

### තාක්ෂණය පතුරුවාලීම

2012 වසරේදී ගිරාදුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක් සිදු කළ අතර මෙම වසරේදී තොරතුරු සහ වෙනත් සේවාවන් ලබා ගැනීම සඳහා මෙම ආයතනයට පාසැල් සිසුන්, ගොවීන් සහ රජයේ නිලධාරීන් ඇතුළුව පුද්ගලයින් 328ක් පැමිණෙන ලදි.

### පුහුණු කිරීම්

පාංශු සංරක්ෂණය සහ ඉඩම් සංවර්ධනය පිළිබඳව ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය මගින් 2012 මැයි 14 – 18 දක්වා සහ සැප්තැම්බර් 03 – 07 දක්වා සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන සඳහා P.G.S ශාන්ත මහතා (පර්යේෂණ නිළධාරි) සහ එච්. එම්. එල්. නිරාන් මහතා ( පර්යේෂණ නිළධාරි) සහභාගි වූහ.

## 2013 වසර සඳහා සැලැස්ම

- වරණය කරගත් එළවළු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් (NCVT).
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් (NCRVT).
- වරණය කර ගත් ආකන්ද බෝග සහ වෙනත් ක්ෂේත්‍ර බෝග පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්.
- ‘රත්න’ පැපොල් ප්‍රභේදයේ මූලික සහ සම්මත බීජ නිෂ්පාදනය.
- මුල් සහ ආකන්ද බෝග, පලතුරු, එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වල බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිපදවීම.
- කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- මහවැලි සී කලාපයේ ජල සම්පාදිතව වගා කරන ඉහළ වටිනාකමකින් යුත් බෝග (එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග) සඳහා වසර පුරා සිදු කරන යෝග්‍ය වගා රටාවක් හඳුනා ගැනීම.
- මහවැලි සී කලාපයට යෝග්‍ය බීට්රූට් ප්‍රභේද වල අනුවර්තීයතා අත්හදා බැලීම.
- ගෝලීය ස්ථානීය ක්‍රමය මගින් ලබා ගත් තොරතරු අනුව සාම්ප්‍රදායික එළවළු ප්‍රභේද එක්රැස් කිරීම.
- හිතකර ලක්ෂණ සම්බන්ධයෙන් විදේශීය සහ දේශීය පැඟිරි එකතූන් ඇගයීම.
- හිතකර ලක්ෂණ සම්බන්ධයෙන් විදේශීය අඹ ප්‍රභේද ඇගයීම.

- පලතුරු බෝග පුනරුත්තාපන සහ ඵලදායීතාව වර්ධනය කිරීමේ වැඩසටහන.
- පාසැල් සිසුන් සහ ගොවීන් සඳහා ව්‍යාප්ති සහ පුහුණු වැඩසටහන්.

## කාර්ය මණ්ඩල ලැයිස්තුව

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිළධාරි | 01 |
| පර්යේෂණ නිළධාරි | 02 |
| කෘෂිකර්ම උපදේශක | 05 |
| පර්යේෂණ සහකාර | 03 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| රාජ්‍ය කළමනාරණ සහකාර (III) | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| ගබඩාකරු | 01 |
| වඩු බාස් | 01 |
| මුරකරු | 04 |
| නුපුහුණු කම්කරු (III ශ්‍රේණිය) | 24 |
| කම්කරු (කොන්ත්‍රාත් පදනම මත) | 36 |
| **එකතුව** | **81** |

# 1.3 පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - හොරණ

ශ්‍රී ලංකාවේ පළතුරු බෝග නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩිකිරීම උදෙසා උචිත වූ තාක්ෂණයන් වැඩිදියුණු කිරීම පළතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සතු වගකීම වේ. පහතරට තෙත් කලාපයට යෝග්‍ය වන්නා වූ බෝග සම්බන්ධයෙන් පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වැඩි අවධානයක් යොමු කරයි. වර්තමාන පර්යේෂණ වැඩසටහන් මෙයට අදාලව වැඩි අවධානයක් යොමුකරනු ලබන අතරම වැඩි අස්වැන්නක් ලබාදෙන ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ පළතුරු බෝග ලබා ගැනීම උදෙසා වැඩිදියුණු කළ බෝග කළමනාකරණ පිළිවෙත්, බෝග සංරක්ෂණය, පැළෑටි පෝෂණය, කාබනික පළතුරු රෝපණය සහ පැළෑටි රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය යන කරුණු පිළිබඳවද අවධානය යොමු කෙරේ. පහතරට තෙත් කලාපයේ ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලමින් එම දේශගුණික තත්වයන්ට යෝග්‍ය වූ එළවළු මුල් හා ආකන්ධ බෝග පිළිබඳවද මධ්‍යස්ථානය වැඩිදුරටත් කරුණු අධ්‍යයනය කෙරේ.

## අයවැය

**වගු අංක 1.3.1: වාර්ෂික අයවැය - 2012 (රු)**

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම | 2,105,000 | 1,364,086 | 65 |
| පුනරාවර්තන වියදම | 3,895,803 | 3,379,397 | 87 |
| වගාව සඳහා දැනට පවතින ජනකප්ලාස්මයන්ගෙන් ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් වැඩි අස්වැන්නක් ලබාදෙන අඹ වගා ප්‍රභේද වැඩි දියුණු කිරීම | 1,000,000 | 780,930 | 78 |
| චිරස්තායී කාබනික ගොවි තාක්ෂණය පිළිබඳ ආසියානු ජාලය - 2012 (ANSOFT) | 75,000 | 70,267 | 94 |
| විවිධ කෘෂි පාරිසරික කලාපයන්හි බලාපොරොත්තු තැබිය හැකි කෙසෙල් එකතුන් ඇගයීම (NARP) | 100,000 | 94,779 | 95 |
| හොරණ ජෛව විවිධත්වයෙන් යුත් පළතුරු වත්තක් ඉදිකිරීම | 7,000,000 | 5,973,044 | 85 |
| ඉහළ අස්වැන්නක් ලබාදෙන ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ F1 - දූරියන් සහ ජමනාරං දෙමුහුම් වැඩිදියුණු කිරීම | 200,000 | 190,769 | 95 |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| දෙමුහුම් බීජ වැඩිදියුණු කිරීම 2012 වසර - බණ්ඩක්කා | 340,000 | 315,551 | 93 |
| දෙමුහුම් බීජ වැඩිදියුණු කිරීම පැපොල්,වැල්දොඩම් සහ අඹ | 200,000 | 190,047 | 95 |
| වැඩි අස්වැන්නක් ලබාදෙන ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ පැඟිරි ප්‍රභේද (දොඩම් හා ජමනාරං වැඩිදියුණු කිරීම) (NARP) | 1,675,000 | 1,404,478 | 84 |
| ඉහළ අස්වැන්නක් ලබාදෙන හොඳ ගුණාත්මක තත්වයකින් යුතු පැපොල් ප්‍රභේද වැඩිදියුණු කිරීම | 388,000 | 343,238 | 88 |
| වාණිජමය වගාව උදෙසා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද වැඩිදියුණු කිරීම (NARP) | 300,000 | 202,872 | 68 |
| පටක රෝපණ තාක්ෂණය මඟින් වැදගත් බෝගයන්හි ගුණාත්මක තත්වයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය | 3,650,000 | 2,407,583 | 66 |
| ගොවිපල සංවර්ධනය | 1,520,000 | 1,311,910 | 86 |
| ජාතික අඹ සංවර්ධන වැඩසටහන | 3,000,000 | 2,642,803 | 88 |
| **එකතුව** | **29,856,800** | **20,636,230** | **69** |

# ප්‍රගතිය

## බෝග වැඩිදියුණු කිරීම

**බලාපොරොත්තු තැබිය හැකි අනෝදා එකතුන් අස්වැන්න සහ ගුණාත්මක ලක්ෂණ උදෙසා ඇගයීම (A. *muricata*)**

අනෝදා යනු පෝෂණීය අගයෙන් අනූන වූ පළතුරු වර්ග වලින් එකකි. නමුත් එය ගෙවතු වල පිටුපස ප්‍රදේශයන්හි වගාවට බොහෝවිට සීමා වේ. අනෝදා වගාවේ ඵලදායීතාවය සහ ගුණාත්මකතාවය වැඩිදියුණු කිරීම උදෙසා වැඩි අවධානයක් අවශ්‍ය වන අතර අනෝදාවල රසවත්භාවය සහ ඵලදායීතාවයෙහි පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. මේවා අතර බලාපොරොත්තු තැබිය හැකි ලක්ෂණ අඩංගු වගා ප්‍රභේදයක් හඳුනා ගනු ලැබිය හැක. එමනිසා වඩාත් ඉහළ වගා ප්‍රභේදයක් තෝරා ගැනීමේ අරමුණ ඇතිව 2004 වර්ෂයේදී අධ්‍යයනයක් ආරම්භ කරනු ලැබිණි.

2007- 2012 අතර කාලය තුළදී අනෝදා එකතුන් 10ක් ඇගයීමෙන් බලාපොරොත්තු තැබිය හැකි වගා ප්‍රභේද 4ක් හඳුනා ගනු ලැබීය. මේවා අතරින් මෘදු වයනය, රසවත් මාංශල යුෂ සහිත ඉහළ බ්‍රික්ස් අගයක් සහිත වගා ප්‍රභේදයක් තෝරා ගනු ලැබිණි. මෙම තෝරාගත් වගා ප්‍රභේදය පැළෑටි සිටුවා වසර 5කට පසු

ශාකයකට ගෙඩි 29 (35.7 kg) ක සාමාන්‍ය අස්වැන්නක් ලබාදීමට හැකි විය. රෝපණ ද්‍රව්‍ය සකස් කරමින් පවතී.

**අනෝදා ඵලයෙහි බර, බීජ බර සහ බීජ සංඛ්‍යාව අතර සම්බන්ධතාවය**

ඵලයේ බර සමඟ ඵලයක අඩංගු බීජ සංඛ්‍යාව අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීමේදී ධන සහසම්බන්ධතා සංගුණකයක් පෙන්නුම් කෙරිණි. මෙමඟින් ඵලයේ බර වැඩිවීමත් සමඟ බීජ සංඛ්‍යාව මෙන්ම බීජ බරද වැඩිවන බව පෙන්නුම් කරයි. එමනිසා සාමාන්‍ය බරක් සහිත ගෙඩි විශාල ප්‍රමාණයේ ගෙඩි වලට වඩා වඩාත් ඵලදායී වේ. (උචිත)

## පැපොල් දෙමුහුම් ඇගයීම

ඉක්මනින් පරිණතභාවයට පත්වීමත් ඉහළ අස්වැන්නත් ලැබීමත් මත ආයෝජනයේ ප්‍රතිඵල කඩිනමින් ලැබීමත් හේතුවෙන් වාණිජමය වගාව සඳහා වඩාත් වැදගත් ශාකයක් බවට පැපොල් වගාව පත්වෙමින් පවතී. වර්තමානයේ වාණිජමය පැපොල් වගාවේ බොහෝමයක්ම විදේශීය වගා ප්‍රභේදයන්ගෙන් සමන්විත වන අතර මේවාගේ බීජ සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරමින් විදේශයෙන් ආනයනය කරනු ලැබූ බීජ වේ. වැඩිදියුණු කළ දේශීය පැපොල් ප්‍රභේද හෝ දෙමුහුම් ඵල ලබාදීමට වසර කිහිපයක් ගත වුවද අපගේම ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම වැදගත් වේ. එමනිසා පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අභිජනන වැඩසටහන මෙම ඉලක්කය සපුරා ගැනීම උදෙසා අවධානය යොමු කෙරේ. මෙම වැඩසටහන ආරම්භ කර වසර 6කට පසුව නුමුහුම් පරම්පරා 2ක් වැඩිදියුණු කරනු ලැබූ අතර පසුව මෙම පැපොල් දෙමුහුම් 2ක වැඩිදියුණු කිරීම උදෙසා භාවිත කරනු ලැබිණි. පර්යේෂණ ස්ථානයෙහිදී මෙම දෙමුහුම් 2කින් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල ලබාගත් අතර ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාපයන්හිදී මෙම දෙමුහුම් ඇගයීම උදෙසා තෝරා ගනු ලැබිණි. වර්තමානයේ මේ සඳහා බීජ පැළ ලබා ගැනීමට බීජ නිෂ්පාදන කරමින් පවතී.

**පැපොල් ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම (ජාතික කෘෂි පර්යේෂණ ව්‍යාපෘතිහි පැපොල් ව්‍යාපෘතිය මඟින් අරමුදල් ප්‍රතිපාදිත)**

පරණ වගා ප්‍රභේදයක් වෙනුවට නව වගා ප්‍රභේදයක් ආදේශ කිරීම උදෙසා වන ප්‍රභේදයක් අඛණ්ඩව වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. එමනිසා මීළඟ පරම්පරාව වැඩිදියුණු කිරීමට ඒකකයක් තෝරාගැනීම උදෙසා දෙවන පරම්පරාව ගහනය ඇගයීමද මෙම පැපොල් වැඩිදියුණු කිරීමේ වැඩසටහන සමන්විත වේ.

**වැල් දොඩම් ප්‍රභේද වැඩිදියුණු කිරීම (ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ දෙමුහුම් බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය මඟින් අරමුදල් ප්‍රතිපාදිත)**

කෘත්‍රිම සංස්ලේෂිත වැල්දොඩම් ප්‍රභේදයන්හි බීජ, එම වැල්දොඩම් ප්‍රභේදය ව්‍යාප්ත කිරීමේ එක් ක්‍රමයකි.

වාණිජමය ප්‍රභේදයන් සඳහා වඩාත් යෝග්‍ය වූ ලක්ෂණයන් සංයෝජනය කිරීමට මෙය ආධාර වන අතරම දඬු මඟින් ව්‍යාප්ත වන්නාවූ වෛරස් චක්‍රය බිඳ දැමීමටද ආධාර වේ. එමනිසා පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වැල් දොඩම් සංවර්ධන වැඩසටහනකින් වැල් දොඩම් වල කෘත්‍රිමව සංස්ලේෂි ප්‍රභේදය නිෂ්පාදනය කිරීමට වැඩි අවධානයක් යොමු කෙරේ. කෘත්‍රිමව සංස්ලේෂි වැල්දොඩම් ප්‍රභේදයේ දෙවන පරම්පරාවේ බීජ නිෂ්පාදනය 2012 වසරේදී සම්පූර්ණ කරනු ලැබූ අතර එය තවදුරටත් වැඩිදියුණු කිරීම සහ ගුණනය උදෙසා තුන්වන පරම්පරාවක් පිහිටවනු ලබයි.

**අඹ දෙමුහුම් ඇගයීම (ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ දෙමුහුම් බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත)**

වර්තමානයේ වගාකරන ප්‍රභේදයන්හට වාණිජමය ප්‍රභේදයන් සඳහා වඩාත් යෝග්‍ය වූ ලක්ෂණයක් සංයෝජනය කිරීමේ මූලික පරමාර්ථය ඇතුව 2007 වසරේදී අඹ දෙමුහුම් වැඩිදියුණු කිරීම ආරම්භ කරනු ලැබීය. කර්තකොලොම්බාන්, වෙල්ලකොලොම්බාන්, විලාඩ් සහ නුම්ඩොක්මායි යන ප්‍රභේදයන් මගින් නිෂ්පාදනය කරන දෙමුහුම් 7ක් ක්ෂෙත්‍රයේ අගයනු ලබමින් සිටී. ක්ෂෙත්‍රයෙහි මෙම බීජ පැළ වසර කිහිපයක් පුරා නඩත්තු කිරීමට සිදු වන බැවින් මෙම බීජ පැළහි දෙමුහුම් බව අනුකූලතා කරනු ලැබීමට සිදු වේ. එමනිසා දෙමුහුම් අනුකූලතාවය උදෙසා DNA විශ්ලේෂණය පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය හා එක්ව ආරම්භ කරනු ලැබූ අතර DNA නිස්සාරක ක්‍රියාපටිපාටිය සාර්ථක වනු ලැබිණි.

**ශාක පරපෝෂිත නෙමටෝඩාවන් හට ප්‍රතිරෝධී පේර ප්‍රභේද වැඩිදියුණු කිරීම**

භූමි හයකදී පරම්පරාවන් වැඩිදියුණු කිරීම මගින් ලබාගත් පේර පැළ 119ක් අගයනු ලැබීය. බාහිර නිරීක්ෂණයන් පදනම්ව පේර පැළ 10ක් තෝරා ගනු ලැබිණි. අතු බැඳීම මගින් එම පේර පැළ ප්‍රචාරණය කරනු ලැබූ අතර ප්‍රතිඵල තහවුරු කිරීම උදෙසා කීට විද්‍යා අංශයට භාර දෙනු ලැබිණි.

**බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද වරණය**

දූරියන් එකතූන් 24, නව හඳුනා ගැනීම් 3, උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයේ බලාපොරොත්තු තැබිය හැකි HORDI ආර 3ක් සහ බීජ පැළ 36ක් ඇතුළු එකතූන් 68ක් නිර්දේශිත ප්‍රභේදයන් සමඟ අගයනු ලැබීය. මේවා අතරින් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 12ක් තෝරා ගනු ලැබූ අතර මෙයින් ප්‍රභේද 4ක් ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත යෝජනා කරනු ලැබිණි. මෙයින් ප්‍රභේද 2ක් වගාව සඳහා නිදහස් කරනු ලැබූ අතර තවත් ප්‍රභේද 2ක් කොන්දේසි සහිතව වගාව සඳහා නිදහස් කරනු ලැබීය.

**දූරියන් F1 දෙමුහුම් වැඩිදියුණු කිරීම**

ක්ෂෙත්‍ර තත්වයන් යටතේ දූරියන් දෙමුහුම් ඒකක 700ක් අගයමින් තිබේ. තවත් F1 ඒකක 100ක් ඇගයීම සඳහා සිටවනු ලැබීමට නියමිතය. බලාපොරොත්තු තැබිය හැකිආරයන් සමඟ මුහුම් කිරීමේ වැඩසටහන අඛණ්ඩව සිදුවෙමින් පවතී.

**පැඟිරි විශේෂයන්හි ප්‍රභේද වැඩිදියුණු කිරීම**

එකතු කිරීමේ හා වරණීය වැඩසටහන යටතේ හීන් නාරං (*Citrus crenatifolia*) 14ක්, ජමනාරං (*Citrus reticulata)* 32ක්, දොඩම් (*Citrus cinensis)* 8ක්, ජම්බෝල (*Citrus grandis)* වර්ග 16ක් සහ දෙහි (*Citrus aurantifolia)* 7ක් අගයමින් සිටිනු ලැබේ. බලාපොරොත්තු තැබිය හැකි ජමනාරං ප්‍රභේද 3ක් තෝරාගෙන විවිධ පාරිසරික කලාප 8ක අගයනු ලැබීය. බලාපොරොත්තු තැබිය හැකි ජම්බෝල එකතූන් එකක් තෝරාගනු ලැබීය.
විවිධ කෘෂි පාරිසරික කලාප 8ක හඳුන්වා දෙනු ලැබූ ජපානයට ආවේණික දොඩම් සහ ජමනාරං විශේෂ 8ක් අගයමින් පවතිනු ලැබේ. මේවා අතර බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 3ක් හඳුනා ගනු ලැබිණි.

2007 වසරේදී විකෘති අභිජනන වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය.

වර්තමානයේ පළතුරු සම්බන්ධ ගුණාත්මක දත්ත සහ විකෘති වර්ධන පරාමිතින් (නස්නාරං සහ HOCR 24) එකතු කරමින් තිබේ.

මුහුම්කරණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. F1 පරම්පරාවේ වැඩිදියුණු කළ ශාක 50ක් බද්ධ කරනු ලැබ අගයමින් පවතී.

## වගාව සඳහා දැනට පවතින ජනකප්ලාස්ම වලින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ වැඩි අස්වනු ලබාදෙන අඹ වගා ප්‍රභේද වැඩිදියුණු කිරීම (NARP මඟින් අරමුදල් සපයන අඹ ව්‍යාපෘතිය)

හොරණ පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, 2011 වසරේදී බලාපොරොත්තු තැබිය හැති අඹ එකතුන් රුස්කිරීම හා වරණය ආරම්භ කරනු ලැබීය. 2012 වසරේදී ගොවි ක්ෂෙත්‍රවලින් සහ අනෙකුත් රජයේ ගොවිපළ වලින් නව ප්‍රභේද 51ක් එක්රුස් කරනු ලැබ ජාන බැංකුවෙහි ස්ථාපිත කරනු ලැබීය. මුල් එකතුන්ගෙන් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 1ක් හඳුනා ගනු ලැබීය. හඳුනාගනු ලැබූ මෙම ප්‍රභේදය ගෙඩියක 325 g්‍ක සාමාන්‍ය බරක් සහිත ඉහළ අස්වැන්නක් ලබාදීමට හැකියාවක් ඇති අතර මාංශල කොටස සහ පොත්ත අතර අනුපාතය 4.7 රවුම් හැඩති ඵලයක් සහිත මෙහි Tss - සම්පූර්ණ ද්‍රාව්‍ය සහ ද්‍රව්‍ය අන්තර්ගතය $14^{0}$ කි. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කෙරෙමින් පවතී.

### කෙසෙල් ජනකප්ලාස්ම ඇගයීම

“සීනි කෙසෙල්” (1 වන කණ්ඩායම), “පූවාළු”, “සුවදැල්”, “කෝලිකුට්ටු” (2 වන කණ්ඩායම) සහ “ඇම්බන්”, “බිං කෙසෙල්” (3 වන කණ්ඩායම) හි ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කෙරෙමින් පවතී. පළමු බෝගය ලෙස පැළ වලින් 38% කට කැන් සෑදුනු අතර ඇගයීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

### අස්වැන්න සහ ගුණාත්මකබව උදෙසා අලිපේර එකතුන් ඇගයීම

හොරණ පළතුරු බෝග පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ අලිපේර එකතුන් 24ක් ස්ථාපිත කරනු ලැබීය.මෙහිදී එකතුන් 4ක් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් ලෙස හඳුනා ගනු ලැබීය. මෙයින් එක් එකතුවක් ගුණාත්මක තත්වයෙන් ඉහළ (මේදය 9%, ක්‍රීම් සහිත, තන්තු සහිත) පැළ සිටුවා වසර 9කින් පසු ගසකට ගෙඩි 190ක් පමණ (බර 58Kg) ලබාදුණි. ඇගයීම අඛණ්ඩව සිදුකෙරෙමින් පවතී.

## ඌන උපයෝජිත පලතුරු බෝග ජනකප්ලාස්ම එක්රුස් කිරීම, සංරක්ෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම

2002 අවසාන භාගයේදී මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබූ අතර 2008 වර්ෂය අවසාන වන විට හෙක්ටයාර 3.7ක වපසරියක ක්ෂෙත්‍ර ජාන බැංකුවෙහි විවිධ පළතුරු එකතුන් 203ක් ස්ථාපිත කරනු ලැබ තිබේ.

### 1.3.2: වගුව ක්ෂේත්‍ර ජාන බැංකුව තුළ ජනක ප්ලාස්ම එකතුව

| පළතුරු | එකතුන් සංඛ්‍යාව |
|---|---|
| බෙලි | 24 |
| පැඟිරි | 41 |
| ලාවුළු | 05 |
| ලොවි | 04 |
| කොස් | 32 |
| වෙරළු | 17 |
| උගුරැස්ස | 22 |
| ගොරක | 33 |

| පළතුරු | එකතුන් සංඛ්‍යාව |
|---|---|
| ගඩුගුඩා | 13 |
| දූරියන් | 35 |
| සැපදිල්ලා | 17 |
| අනෝදා | 14 |
| ජම්බු | 26 |
| ජැම් පේර | 07 |
| ඇඹුල් පේර | 07 |

නිර්දේශය උදෙසා බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද හඳුනාගැනීමට ලක්ෂණීකරණය යන ඇගයීම අඛණ්ඩව සිදු කරමින් පවතී. මෙයට අමතරව 2012 වසරේදී පිළිවෙළින් කොස් එකතුන් 13ක් සහ ගඩුගුඩා එකතුන් 8ක් මෙම ජාන බැංකුවට එකතු කරනු ලැබිණි.

**සැපදිල්ලා (*Manilkara zapota*)**

2007 වසරේදී එකතුන් 17ක් සමන්විත වන පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ගොවිපල් වලින් එකතු කළ රෝපණ ද්‍රව්‍ය උපයෝගී කොට පරීක්ෂණ ආරම්භ කරනු ලැබිණි. මෙම සියලුම එකතුන්ගේ වර්ධන හැකියාව, අස්වැන්න, පළතුරු ගුණාත්මකබව, ඵලයෙහි ප්‍රමාණය සහ හැඩය අගයනු ලැබිණි. HOS 2, HOS 12, HOS 13 යන බලාපොරොත්තු තැබිය හැකි එකතුන් නිල වශයෙන් නිදහස් කිරීම සඳහා නම් කරනු ලැබූ අතර ගොවි වගාව උදෙසා HOS 12 සහ HOS 13 යන එකතුන් කමිටුවක් මඟින් නිදහස් කරනු ලැබීය.

**වෙරළු (*Elaeocarpus serratus*)**

ගොවි ක්ෂේත්‍ර වලින් එක්රැස් කරගත් සහ කුස්ඤ රිකිලි බද්ධ ක්‍රමය මඟින් ප්‍රචාරණය කරනු ලැබූ එකතුන් 14ක් ක්ෂේත්‍ර ජාන බැංකුව තුළ දක්නට ලැබේ. 2003 වසරේ සිට 2010 වසර දක්වා ඒවායෙහි වර්ධන හැකියාව, අස්වැන්න, පළතුරෙහි ගුණාත්මකබව සහ පළතුරෙහි ප්‍රමාණය අගයනු ලැබීය HOW 5, 5, 9 හා 13 යන වඩාත් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් නිල වශයෙන් නිදහස් කරනු ලැබීම උදෙසා නම් කරනු ලැබූ අතර නම් කරන ලද මෙම සියලු එකතුන් කමිටුවක් මඟින් ගොවි වගාව උදෙසා නිදහස් කරනු ලැබීය.

**ගොරකා**

ගොරකා එකතුන් 32ක් ක්ෂෙත්‍ර ජාන බැංකුව තුළ ස්ථාපිත කරනු ලැබීය. මෙයින් බලාපොරොත්තු තැබිය හැකි එකතුන් 3ක් (HoG -3, HoG -8, HoG -11) වගාව සඳහා ගොවීන්හට ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව මඟින් නිල වශයෙන් නිදහස් කරනු ලැබීය.

**උගුරැස්ස**

උගුරැස්ස එකතුන් 22ක් එකතු කරනු ලැබ පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ක්ෂෙත්‍ර ජාන බැංකුව තුළ ස්ථාපිත කර ඇත. ඉහළ අස්වැන්නක් ලබාදෙන උසස් ගුණාත්මක තත්වයෙන් යුතු එකතුන් නිර්දේශ කිරීම උදෙසා හඳුනාගැනීමට සහ තෝරා ගැනීම පිණිස ලක්ෂණීකරණය හා ඇගයීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

**ලාවුළු**

ලාවුළු එකතුන් 5ක් රැස් කරනු ලැබ හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ස්ථාපිත කරනු ලැබීය. බලාපොරොත්තු තැබීය හැකි එකතුන් 3ක් හඳුනාගනු ලැබීය. HoLav 3, HoLav 4 සහ HoLav 5 ලෙස හඳුනාගනු ලැබූ එකතුන් 3ක් පැල සිටුවා වසර 7කට පසු පිළිවෙළින් ගසකට ගෙඩි 75ක් (18kg බර), ගසකට ගෙඩි 100ක් (25kg) සහ ගසකට ගෙඩි 90ක් (18.5 kg) ලබාදුණි. ඇගයීම අඛණ්ඩව සිදුවෙමින් පවතී.

**ලොවි**

හොරණ පළතුරු බෝග හා සංවර්ධන මධ්‍යස්ථානයේ ලොවි එකතුන් 4ක්

ස්ථාපිත කරනු ලැබීය. මෙම එකතු කරන ලද එකතූන් අතර පැහැදිලි වෙනස්කම් දක්නට නොලැබීය.

## පහතරට තෙත් කලාපයට යෝග්‍ය උචිත ලක්ෂණ වලින් සමන්විත බණ්ඩක්කා දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම (දෙමුහුම් බීජ සංවර්ධන (බණ්ඩක්කා) ව්‍යාපෘති මඟින් අරමුදල් ප්‍රතිපාදිත)

නුමුහුම් ආර 14ක් සහ ඒවායෙහි මුහුම් සංයෝජන 91ක් උපයෝගී කරමින් පවත්වනු ලැබූ අධ්‍යයන වලින් දෙමුහුම් ප්‍රභේද 4ක් තෝරාගනු ලැබීය. මෙම මුහුම් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්හි අගයනු ලැබීය. HB 100, HB 95 සහ HB 93 යන ප්‍රභේද 3ක තෙත් සහ අතරමැදි කලාපයන්හී අනුවර්තිතාවය සඳහා පරීක්ෂා කරනු ලැබීය. මෙහිදී අස්වැන්න හා ගුණාත්මක බව සහ පත්‍ර නාරටි විචිත්‍ර වයිරසයට ප්‍රතිරෝධී බව පදනම්ව ගුණාත්මක තත්වයෙන් ඉහළ HB 100 තෝරා ගෙන. ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවට ඉදිරිපත් කර වගාව සඳහා ගොවීන් හට නිදහස් කරනු ලැබීය.

### අමුමිරිස් ප්‍රභේද නුමුහුම් බව ඒ ආකාරයට පවත්වාගෙන යමින් වැඩිදියුණු කිරීම

"වැරනියා" අමුමිරිස් ගොවි තේරීම් 10ක් පරීක්ෂා කරනු ලැබූ අතර එයින් වැරනියා වර්ග 4ක් එහි සැර හා බාහිර ලක්ෂණයන්ට අනුකූලව තෝරා ගනු ලැබිණි. මෙම වර්ග 4 නුමුහුම් කර අස්වැන්න සඳහා අගයනු ලැබිණි. " වැරනියා කොළ" වර්ග තෝරා ගෙන බීජ නිෂ්පාදනය සිදු කරනු ලැබූ අතර 2011/2012 මහ කන්නයේ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළට ඇතුළත් කළේය. බීජ නිෂ්පාදන වැඩසටහන අඛණ්ඩව සිදුකරමින් පවතී.

## බෝග සංරක්ෂණය

### කොස්, පැඟිරි සහ අනෝදා වල ශීඝ්‍ර පසුමැරීම රෝගය ඇති කරන කාරක ජීවියා හඳුනාගැනීම

පසු මැරීමේ රෝගය යනු ශාකයේ කඳ, අතු සහ මුල් ක්‍රමයෙන් මැරීයාමේ රෝගය වන අතර සාමාන්‍යයෙන් මෙය අග්‍රස්ථයෙන් ආරම්භ වේ. ඉතාමත් වේගයෙන් රෝගය ශාකය පුරා පැතිර යයි. පරපෝෂිත ආසාදනය වී සති 4 සිට 6 ඇතුළතදී ශාකය මිය යන අතර ශාකයේ ඉහළ කොටසේ අතු මැරුණු පසු රෝගය නිරීක්ෂණය කළ හැකි වේ.

මියගිය අතු සහ කොස් ශාකයේ මුල් (*Artocorpus heterophyllus*) පැඟිරි (*Citrus reticulate*) සහ අනෝදා (*Annona muricata*) යන ශාක කොටස් තෙත් කලාපයෙන් (කළුතර, ගම්පහ සහ ගාල්ල දිස්ත්‍රික්ක) එක් රැස් ගනු ලැබූ අතර කාරක ජීවියා හඳුනා ගැනීම පිණිස පරීක්ෂණාගාර රසායනාගාර පරීක්ෂණ පවත්වනු ලැබීය.

මෙම රෝගය ඇති කරන රෝග කාරක ජීවියා ලෙස *Lasiodiplodia theobromae* හඳුනා ගනු ලැබූ අතර රෝග ආසාදිත කොටස් වෙන් කරනු ලැබූ අතර නැවත ආමුකුලන පරීක්ෂණ මඟින් පරපෝෂිකතාවය ස්ථිර කරගනු ලැබීය.

### කොස්, පැඟිරි සහ අනෝදා වල පසු මැරීම ඇති කරන පරපෝෂිකයාට ප්‍රතිරෝධී දිලීරනාශක වල ප්‍රතිචාරය

පසු මැරීමේ රෝගය පාලනය කිරීම උදෙසා ස්පර්ශ සහ සංස්ථානික දිලීරනාශක වල හැකියාව නලස්ථව සහ ක්ෂෙත්‍ර තත්වයන් යටතේ පරීක්ෂා කෙරිණි. මෙම ප්‍රතිකර්ම රෝග පාලනය සඳහා වූ අතර ඒ සඳහා කොපර් (කියුප්‍රික් හයිඩ්‍රොක්සයිඩ් ලෙස), ක්ලෝරොතැලොනිල්, මැන්කොසෙබ්, සල්ෆර්, කාර්බෙන්ඩසිම් 500g $L^{-1}$ Sc,

කාර්බෙන්ඩසිම් 50% WP, ටෙබුකොනැසොල් 250g $L^{-1}$ EW සහ හෙසාකෙනසොල් 50g $L^{-1}$ EC යන දිලීරනාශක මේ සඳහා උපයෝගී කරගනු ලැබිණි. *Lasiodiplodia theobromae* හි මයිසීලි (දිලීර ජාලය) වර්ධනයට දිලීරනාශක වල බලපෑම අධ්‍යයනයේදී කාබෙන්ඩසිම් 500g $L^{-1}$ SC සහ ටෙබූකොනසොල් 250g $L^{-1}$ EW යන දිලීරනාශක 2 ml L $L^{-1}$ සාන්ද්‍රණයේදී සහ කාබෙන්ඩසිම් 50% WP 2g $L^{-1}$ සාන්ද්‍රණයේදී වඩාත් ඵලදායි වූ බව හෙළිදරවු විය. පැඟිරි ශාකවලින් වෙන් කර ගත් *Lasiodiplodi theobromae* දිලීරයට හෙසාකොනසොල් දිලීර නාශකයේ ප්‍රතිරෝධී බව තරමක් අඩුවිය.

### ශාක පරපෝෂිත නෙමටෝඩාවනට ප්‍රතිරෝධි යෝග්‍ය පේර මූල ග්‍රාහක පිළිබඳව අධ්‍යයනය

මුලගැටිති නෙමටෝඩාවන් පේර වගාවේ ප්‍රධාන ගැටළු වලින් එකකි. මෙම නෙමටෝඩාවන් (*Meloidogyne* Spp) නෙමටෝඩාවන් ආසාදිත පසෙහි සහ රෝපණ ද්‍රව්‍ය සමග ඉතා මත් වේගයෙන් ව්‍යාප්ත වේ. එමනිසා මූලගැටිති නෙමටෝඩාවන්ට ප්‍රතිරෝධි පේර මූල ග්‍රාහක සොයා ගැනීම උදෙසා පරීක්ෂණ 2ක් සිදු කෙරිණි.

බීජ පැළ 530ක් මෙලොයිඩගයිනී Meloidogyne විශේෂයෙන් ආමුකූලනය කරනු ලැබු අතර ආමුකූලනයෙන් සති 8-12 අතර කාලය තුළදී පැළ 460ක් මූල ගඩු සඳහා අගයනු ලැබීය. ජැම් පේර පැල හැරෙන්නට අනෙකුත් සියළුම පැළ වල මූල ගඩු අධික විය. කෙසේ වුවද ජැම් පේර අනූජයත් සමඟ අනුරූප නොවේ.

මුලගැටිති නොමටෝඩාවන් එරෙහිව ක්ෂෙත්‍රයේ අගයනු ලැබූ පේර පැළ 115 අතුරෙන් මූලගැටිති නෙමටෝඩාවන්ගේ බාහිර ලක්ෂණ පදනම්ව ප්‍රතිරෝධි වන පැළ 115ක් තෝරා ගනු ලැබීය. තෝරාගත් මෙම පැළ වලින් ඇතිකරගනු ලැබූ පැළ නෙමටෝඩාවන්හට ප්‍රතිරෝධීවන බව තවදුරටත් ස්ථිර කර ගැනීම උදෙසා මෙලොයිඩගයිනී විශේෂය (*Meloidogyne* Spp) ආමුකූලනය කරනු ලැබීමය. පරීක්ෂණ අඛණ්ඩව සිදු කරනු ලැබිණි.

### පසෙහි සංයුතිය යටතේ වෙනස් කිරීම තුළින් පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් හට ශාක ප්‍රතිරෝධි බව ඇගයීම

කුකුල් පොහොර විවිධ ප්‍රතිශතයන්ගෙන් (1%, 2%, 3%, 4%) පසට මිශ්‍රකර එම පස් පෝච්චි වලට පුරවා රෝගයට ලක්වූ පේර බීජ පැළ සිටුවා මෙලොයිඩගයිනී (*Meloidogyne* Spp) විශේෂ එම පැළ වලට ආමුකූලන කිරීම තුළින් මූල ගැටිති නෙමටෝඩාවන් අවම කිරීම උදෙසා කුකුල් පොහොර වල බලපෑම අධ්‍යයනය කරන ලදී. පරීක්ෂණ අඛණ්ඩව සිදුකරමින් පවතී.

## පාංශු පෝෂක කළමනාකරණය

### මැංගුස්වල මැලියම් වැස්සීමේ හා Translucent රෝගය

පහතරට තෙත් කලාපයේ බොහෝ ප්‍රදේශවල මැංගුස් වල මැලියම් වැස්සීමේ සහ බීජ වල විනිවිද බව දක්නට ලැබේ. ඇතුලත මාංශල ප්‍රදේශයේ කහ පැහැති තින්ත ගම් වැනි ද්‍රව්‍ය තැන්පත් වීම මැලියම් වැස්සීමේ රෝගයෙහිදී සිදුවන අතර රෝගයෙහි ජලය වැනි මාංශල මැංගුස් කැබලි translucent රෝගයේදී ඇතිවන අතර එමගින් මැංගුස් වල ගුණාත්මක තත්වය විශාල වශයෙන් අඩු වේ. මෙම ගැටලුව සඳහා ප්‍රතිකර්මයක් ලෙස පසට සහ පත්‍ර සඳහා බොරෝන් සමඟ කැල්සියම් පෝෂක යොදා පරීක්ෂා කරනු ලැබීය. මෙම රෝගී තත්වයන් දෙකෙහි තීව්‍රතාවය අවම කිරීම උදෙසා පත්‍රමතට ඉහත පෝෂක යෙදීම ඵලදායී බවක් පෙන්නුම් කෙරිණි.

පසට කැල්සියම් යෙදීම මගින් (PH අගය 5.5 - 6.5 අතර ප්‍රමාණයකට ගෙන එන අතර) සහ පත්‍ර වල කැල්සියම් නයිට්‍රේට් ඉසීම මගින් ඵලයෙහි මෙම රෝගී තත්ත්වයේ තීව්‍රතාවය අඩු කෙරිණි. මේ පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීම උදෙසා පැළ නියැදි විශ්ලේෂණය කෙරෙමින් පවතී.

### පනු පොහොර සඳහා විවිධ කාබනික ද්‍රව්‍යයන්හි බලපෑම

ටැංකි ක්‍රමය උපයෝගී කරගනිමින් සැකසූ පත්‍ර පොහොර විවිධ කාබනික ද්‍රව්‍ය ගොම පොහොරත් සමඟ පරීක්ෂා කරනු ලැබිය. පනු ගහනය සහ පනු පොහොර වල බරත් සමඟ සලකනු ලැබූ විට පිදුරු:ගොමපොහොර 1:1 අනුපාතයට යෙදීම වඩාත් සුදුසු වේ.

### ඩ්‍රැගන්ෆෲට් සඳහා කාබනික පොහොර යෙදීමේ බලපෑම

ඩ්‍රැගන්ෆෲට් සඳහා වඩාත් යෝග්‍ය කාබනික පොහොර පිළිවෙත් මාලාවක් සොයා ගැනීම උදෙසා පරීක්ෂණ සිදු කරනු ලැබීය. වර්ෂයකට හෙක්ටයාරයකට ටොන් 20ක් කුකුල් පොහොර (20 t/ha/yr) යෙදීම මගින් එම ප්‍රමාණයෙන්ම ගොමපොහොර හෝ පනු පොහොර යෙදීමට වඩා අස්වැන්නක් ලැබිණි. මෙම පොහොර වලට අමතරව පනු පොහොර යෙදීමේ ඵලදායීතාවය වැඩිකිරීම උදෙසා පරීක්ෂණ තවදුරටත් සිදු කෙරෙමින් පවති.

## බෝග කළමනාකරණය

### මැංගුස්වල වර්ධනය සහ අස්වැන්න වැඩිකරගැනීම උදෙසා ද්විත්ව ග්‍රාහක බද්ධය ඇගයීම

මැංගුස් (*Garcinia mangostana*) යනු දේශීය හා විදේශීය වෙළඳපොල දෙකෙහිම ඉහළ ඉල්ලුමක් පවතින පළතුරු බෝග වලින් එකකි. මෙම බෝගය අඩුවෙන් ව්‍යාප්ත වීමට මූලික හේතුව වන්නේ එහි වර්ධන වේගය අඩුවීමත් වසර 8- 10 වැනි ආර්ථික වශයෙන් අවාසි සහගත වන දිගු වර්ධන කාලයක් පැවතීමයි. කුඤ්ඤ රිකිලි බද්ධය වැනි සාම්ප්‍රදායික ක්‍රම මගින් පිළිගත හැකි මට්ටමේ වර්ධන වේගයක් ඵල හට ගැනීමක් සහිතව නොමේරු කාලය වසර 3 - 4 කින් සාර්ථකව අඩුකරගත හැකි වේ.

රිකිලි බද්ධය මගින් අමතරව මූල පද්ධතියක් ලබාදීමෙන් මැංගුස්වල ඵලදායීතාවය වැඩිකිරීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය 2004 වර්ෂයේදී මෙම පර්යේෂණ ආරම්භ කෙරිණි. වර්ධනය සහ ඵලහට ගැනීමේ හැකියාව ඇගයීමේදී ද්විත්ව කාර්යය පැළ ඉතාමත් හොඳින් වර්ධනය වී සනත්වයෙන් යුත් වියනක්, තනි මූල පද්ධති රිකිලි බද්ධ ශාක වලට වඩා ලබාදුණි. පැළ සිටුවා වසර 8කට පසු මෙම රිකිලි බද්ධ ශාක ගසකට ඵල 106ක පමණ අස්වැන්නක් ලබාදුණි. එමනිසා වියන වර්ධනය වැඩිකිරීම තුළින් මෙම ද්විත්ව රිකිලි බද්ධ ශාක ඉහළ ඵලදායීතාවයක් ලබාගැනීමට හැකි වේ.

### අමතර මූල පද්ධතියක් ලබාදීම තුළින් මැංගුස් වල බීජ පැළ වල ඵලදායීතාවය ඉහළ නැංවීම

රෝපණ මාධ්‍ය සහ මහා පරිමාණ වගාවන් සඳහා උපකාරී වන මැංගුස් බීජ පැළ උදෙසා ද්විත්ව මූල පද්ධති ක්‍රමෝපායක් යොදාගැනීම උචිතබව අධ්‍යයනය කිරීමේ උත්සහයක නිරත විණි. එමනිසා 2006 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට 2012 මැයි මාසය දක්වා හොරණ පළතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ශාකයේ ඵලදැරීමේ කාලය අවමකිරීම තුළින් මැංගුස් බීජපැල වල ඵලදායීතාවය ඉහළ නැංවීම උදෙසා අධ්‍යයනය ආරම්භ කෙරිණි.

මැංගුස් බීජ පැළ සඳහා අමතර මූල පද්ධතියක් ලබාදීම උදෙසා අනුගමනය කළ ක්‍රමවේදය වන්නේ ආරුක්කු බද්ධයයි. මෙම ආරුක්කු බද්ධ කළ පැළ දින 45ක් 100%ක්ම සෙවනෙහි තැබීම මඟින් 98%ක සාර්ථකත්වයක් ලබාගත හැකිය.

මෙසේ ද්විත්ව මූල පද්ධතියක් ලබාදුන් මැංගුස් ක්ෂේත්‍රයේ පැළය සිටුවා වසර 5, 4ක් පමණ කාලයකදී ගෙඩි හටගැනීම ආරම්භ කෙරිණි.

ද්විත්ව මූල පද්ධතියක් ලබාදීමේ ක්‍රමය මඟින් ශාකය සාමාන්‍ය ගෙඩි 12ක් පමණ ලබාදුණි. බීජ පැළ සිටුවා ඵල හටගැනීමට වසර 7-20 අතර කාලයක් ගතවෙමින් මුල් අවස්ථාවේදී අස්වැන්න ශාකයකට ගෙඩි 4ක් පමණ ලබා දෙන ක්‍රමයට වඩා මෙම ද්විත්ව මූල පද්ධති බීජ පැළ වඩාත් ඉක්මනින් ඵල හටගැනීම හේතුවෙන් එය වඩාත් ඵලදායී තාක්ෂණික ප්‍රවර්ධනයක් ලෙසට පෙන්වා දිය හැක.

### හොරණ පළතුරු බෝග පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ ඩ්‍රැගන් ෆෘට් පිළිබඳ කාර්යසාධනය

වසර 3, 4, 5, 6, 7 වයසැති වගාව පිළිවෙළින් හෙක්/කි.ග්‍රෑ 2269, 9195, 11895, 2317 සහ 7338ක අස්වැන්නක් ලබා ගත හැක.

### ඩ්‍රැගන් ෆෘට් වැල් එක් පුහුණුවක් සිදුකිරීමේදී කැපුමෙහි ප්‍රමාණය, රිකිලි සංඛ්‍යාව, වැලෙහි ප්‍රමාණය, අස්වැන්න සහ ඵලයෙහි ගුණාත්මක බව කෙරෙහි බලපාන ආකාරය

එක් පුහුණු වාරයකදී කැපුම් සංඛ්‍යාව වැඩිකිරීමත් කන්නයේදී මෙම සියලුම ප්‍රතිකර්ම කිසිවකදීවත් සැලකිය යුතු අස්වැන්නක් වාර්තා නොවීය. පරීක්ෂණ අඛණ්ඩව සිදුකරනු ලැබීය.

**රඹුටන් ශාකයේ වර්ධනය සහ ඵලදාව කෙරෙහි ශාකයේ ඝනත්වය සහ කප්පාදු කිරීමේ උස බලපාන ආකාරය.**

පහතරට තෙත් කලාපයේ රඹුටන් වගාව සඳහා වඩාත් ලාභදායී ශාක කළමනාකරණ පද්ධතියක් නිර්දේශ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. එකිනෙකින් වෙනස් ශාක ඝනත්ව 3ක් යටතේ { 10m x 10m (නිර්දේශිත) , 10m x 7.5m, 10m x 5.0m} සහ වෙනස් අතු උස 2ක් යටතේ {90 cm (නිර්දේශිත) සහ 30cm } “ මල්වාන ස්පෙෂල්” ශාක පැළ 36ක් වගා කරනු ලැබීය. වර්ධක ලක්ෂණ, පත්‍රවල ලක්ෂණ සහ මල්වල ලක්ෂණ යන සමහර ඵලයන්හි ලක්ෂණ වාර්තාගත කෙරිණි. ශාකයේ උස, වියන පැතිරීම යන අස්වැන්න අතර පැහැදිළි වෙනස්කම් දක්නට නොලැබිණි. තවදුරටත් විශ්ලේෂණය සඳහා අදාළ තොරතුරු එකතු කරගනු ලබමින් සිටියි.

## පළතුරු සංවර්ධන ක්‍රියාවලිය

### පළතුරු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ වෙනත් ක්‍රියාදාමන් මඟින් ඉපයූ ආදායම

2012 වර්ෂය තුළදී රඹුටන්, අඹ, දූරියන්, කොස්, අලිපේර, කාමරංගා, සැපදිල්ලා, ගොරක, දෙහි, මැංගුස්, ජම්බු, ලොවි, අනෝදා, පේර, දොඩම්, බෙලි, වෙරළු, ජමනාරං, වැල්දොඩම්, ජැම්පේර සහ සැපදිල්ලා පළතුරු විශේෂයන්හි අංකුර බද්ධ පැළ 23,560, රිකිලි බද්ධ ශාක 1808, පැළ 3181ක් විකුණන ලදී. එමඟින් රු. 4,270,202ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර අනෙකුත් ක්‍රියාවලීන් තුළින් රු.2,507,180.90ක අදායමක් උපයනු ලැබීය.

**පටක රෝපණය තුළින් වැදගත් බෝගවල ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධන ව්‍යාපෘතිය මඟින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන**

**කෙසෙල් ක්ෂුද්‍ර ප්‍රචාරණය**

කෙසෙල් අඹ වැනි බෝගයන්හී ගුණාත්මක තත්ත්වයන්ගෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය සඳහා පටක රෝපණ ක්‍රමය ලෝකය පුරා පිළිගත් තාක්ෂණික ක්‍රමවේදයකි. එමනිසා පළතුරු බෝග ක්ෂුද්‍ර ප්‍රචාරණය සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිළිබඳ පර්යේෂණ උදෙසා මධ්‍යස්ථානයේ පටක රෝපණ පර්යේෂණාගාරයක් ස්ථාපිත කෙරිණි. මෙහි "තෝරාගත් බෝගයන්හි පටක රෝපණ ක්‍රමවේදය මඟින් ගුණාත්මක තත්වයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය" ව්‍යාපෘතිය මඟින් පරීක්ෂාගාර පහසුකම් වැඩි කරනු ලැබූ අතර රෝපණ කාමරයෙහි ධාරිතාව රෝපණ 1500 සිට 4500 දක්වා වැඩි දියුණු කරනු ලැබීය.

විවිධ ප්‍රභේදයේ කෙසෙල් පැළ1500කට අධික ප්‍රමාණයක් පර්යේෂණ සහ ඇගයීම උදෙසා ගොවි ක්ෂෙත්‍රයන්හි ස්ථාපිත කරනු ලැබූ අතර සමක්ලෝන වෙනස්කම් නිරීක්ෂණය කිරීමට නොහැකි විය. එමනිසා ක්ෂුද්‍ර ප්‍රචාරණය උපරිම කිරීම උදෙසා වූ ක්‍රියාපරිපාටිය ඇඹුල්, සීනි, නේත්‍රපලම් වැනි කෙසෙල් ප්‍රභේද ගුණනය කිරීම උදෙසා සාර්ථකව උපයෝගී කරගනු ලැබිය හැක.

## අඹ නොමේරු කලල ආරක්ෂණය

ගෙඩි වැටීම අඹ වගාවේ බහුලව දක්නට ලැබෙන ගැටළුවකි. එමඟින් අඹ අභිජනනයේදී බොහෝ සීමාකාරී තත්ත්වයන් ඇති කරනු ලබයි. කලල ආරක්ෂණය යනු පෝෂික මාධ්‍යන්හි ජීවාණුහරිත සහ පාලිත පාරිසරික තත්ත්වයන් යටතේ නොමේරු කලල නලස්ථව රෝපණය කරන්නාවූ ක්‍රමවේදයකි. දෙමුහුම් කලල ආරක්ෂණ ක්‍රමවේදය වැටුණු හෝ අස්වනු නෙලන ලද නොමේරු පළතුරු සංරක්ෂණය කර ගැනීම උදෙසා සාර්ථකව උපයෝගී කරගනු ලැබිණි. එමනිසා දේශිය අඹ ප්‍රභේදයන්හී කලල සංරක්ෂණය පිණිස. ක්‍රියාපරිපාටිය වැඩිදියුණු කිරිම උදෙසා පර්යේෂණ වැඩසටහන් ආරම්භ කරනු ලැබිණි.

**නිවර්තන පළතුරු උදෙසා ජෛව විවිධත්වයෙන් යුතු පළතුරු උද්‍යානයක් ඉදිකිරීම**

රඹුටන් (26), අඹ (127), පේර (100), කාමරංගා (38), වෙරළු (5) සහ ගඩුගුඩා (29)ක් හි රිකිලි බද්ධ ශාක වගා කෙරිණි. නමිනං (26), දිවුල් (8), දෙල් (36), දඹ (5), කරඹ (15), දං (9), සියඹලා (2), ජම්බු (22), පේර (14), ආනෝදා (46), ලොවි (12), ලාවුළු (16), ගඩුගුඩා (17) සහ අඹ (70) පැළ ද සිටවනු ලැබීය.

රඹුටන්, කොස්, කාමරංගා, ජම්බු අඹ සහ වෙරළු මව් ශාක කප්පාදු කරනු ලැබීය.

පස සංරක්ෂණ ක්‍රමවේදයන් ලෙස සේර වැටි වල වගාකරනු ලැබීය. වැඩිපුර ජලය බැසයාම පිණිස පොකුණු කපා. ක්‍රමවත් ලෙස වල් පැළ පාලනය කරනු ලැබූ අතර සියලුම වගාවන් සඳහා පොහොර ද එකතු කරන ලදි.

**ගෙවතු සංවර්ධනය සහ නඩත්තුව සහ ගොවීන් පුහුණු කිරීම සහ ගෙවතු වගාව පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම**

ගෙවතු වගාවේ ප්‍රයෝජනවත් බව ආදර්ශනය කිරීමට සහ පාසල් දරුවන් දැනුවත් කිරීම උදෙසා 2005 වසරේදී හොරණ පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ගෙවත්තක් ස්ථාපිත කෙරිණි. 2012 වර්ෂය තුළදී පාසල් ළමුන් 2790 ගුරුවරුන් 234 සහ වෙනත් පුද්ගලයින් 206 දෙනෙකු ගෙවත්ත නැරඹීමට පැමිණි අතර ගෙවතු

වගාව පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කෙරිණි.

## පුහුණු වැඩසටහන්

2012 වර්ෂයේදී පහත පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

- පාසල් 21කින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2460 සහ ගුරුවරුන් 172ක් මධ්‍යස්ථානය නරඹනු ලැබිණි.
- විශ්ව විද්‍යාල සිසුන් 288කට සහ කතිකාචාර්යවරුන් සඳහා පුහුණු වැඩසටහන් 8ක් පවත්වනු ලැබිණි.
- අභ්‍යාසලාභී පුහුණුවන්නන් 213 සඳහා පළතුරු වගාව, ගෙවතු වගාව සහ පටක රෝපණය සහ පැළ තවාන් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 9ක් පවත්වනු ලැබිණි.
- ජෛව විවිධත්ව පළතුරු ගෙවතු ව්‍යාපෘතිය යටතේ පළතුරු නිෂ්පාදන සහ ක්ෂුද්‍ර ජීවීන් සපිරි කොම්පෝස්ට් පැකට් පිළිබඳ පුහුණු වැඩසටහන් 31ක් පවත්වනු ලැබිණි. (හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 1443 දෙනෙකු අතර කොම්පෝස්ට් පැකට් 1443ක් බෙදා දෙනු ලැබිණි.

## ගොවි උපදේශක වැඩසටහන

- ගොවීන්ගෙන් රෝග සහිත සාම්පල් 75ක් ලැබුණු අතර ව්‍යාපෘති නිලධාරින් එම සාම්පල අධ්‍යයනය කරනු ලැබ පරපෝෂිතයින් හඳුනාගැනීම උදෙසා පරපෝෂිකයින් වගා කර රෝගය පාලනය උදෙසා නිර්දේශයන් ලබාදුණි.
- වර්ෂය තුළදී පළිබෝධකයින් සහ ඩුගන් ෆෘට්, එළවළු සහ වෙනත් (නා, බෝ) වැනි වගාවන් සම්බන්ධයෙන් ගොවීන් ඉදිරිපත් කළ ගැටළු 97ක් සඳහා අවධානය යොමු කරනු ලැබ පාලන පිළිවෙත් පිළිබඳව උපදෙස් ලබාදුණි.

## ජනමාධ්‍ය

පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් (පළතුරු බෝග වගාව, පළිබෝධකයින් රෝග පාලනය සහ ගෙවතු වගා පිළිබඳ) රූපවාහිනී වැඩසටහන් 04ක් සහ ගුවන් විදුලි වැඩසටහන් 05කට සහභාගී විය.

# 2013 - සැලසුම

### 1.බෝග වැඩිදියුණු කිරීම

- වරණය තුළින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සහ වැඩි අස්වනු ලබාදෙන දූරියන්, දොඩම්, ජමනාරං, ජම්බෝල දෙහි සහ බෙලි ප්‍රභේද වැඩිදියුණු කිරීම
- මුහුම්කරණය තුළින් ගුණාත්මක තත්වයෙන් ඉහළ වැඩි අස්වැන්නක් ලබාදෙන දූරියන්, දොඩම් සහ ජමනාරං ප්‍රභේද වැඩිදියුණු කිරීම සහ හඳුන්වාදීම
- විකෘති තුළින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ වැඩි අස්වනු ලබදෙන දොඩම් සහ ජමනාරං ප්‍රභේද වැඩිදියුණු කිරීම
- බෙලි වල පුෂ්ප පිළිබඳව ජෛව විද්‍යාව අධ්‍යයනය
- දැනට පවතින බීජ ගහනයෙන් ගොවි ක්ෂෙත්‍රවල වගාව සඳහා රඹුටන් ප්‍රභේද තෝරා ගැනීම
- පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වඩාත් ඉහළ තත්වයේ එකතුන් සඳහා විවිධත්වයෙන් යුත් රඹුටන් ගහනය එක්රැස් කිරීම
- අලුතෙන් නිර්දේශ කළ ගොරක ප්‍රභේද වල (*Garcinia quaesita*) අනුවර්තිතතාව පරීක්ෂාව
- බලාපොරොත්තු තැබිය හැකි උගුරැස්ස (*Flacourtia indica*) වරණය

- ඉහළ ගුණාත්මක ලක්ෂණ සහ අස්වැන්නක් සඳහා අනෝදා එකතුන් ඇගයීම
- ගුණාත්මක තත්වයෙන් ඉහළ අස්වැන්නත් සඳහා අලිපේර එකතුන් ඇගයීම
- පැපොල් මුදු පුල්ලි වයිරසයට ප්‍රතිරෝධී පැපොල් නුමුහුන්/දෙමුහුන් ගුණාත්මක තත්ත්වයෙන් ඉහල වැඩි අස්වැන්නක් ලබාදෙන පැපොල් වැඩිදියුණු කිරීම
- ගුණාත්මක තත්ත්වයෙන් ඉහල වැඩි අස්වැන්නක් ලබා දෙන පැපොල් නුමුහුම්/ දෙමුහුම් වැඩිදියුණු කිරීම
- අඹ දෙමුහුම් වැඩිදියුණු කිරීම
- ලොවි, ලාවුළු, ගඩුගුඩා සහ බෙලි ජනක ප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම සහ වරණය
- තෙත කලාපය සඳහා අඹ එකතුන් ඇගයීම
- මධ්‍යස්ථානය තුළ වෙරළු එකතුන් ඇගයීම
- හොරණ පළතුරු බෝග පර්යේෂණ මධ්‍යස්ථානයේ ජෛව විවිධත්වයෙන් යුත් පළතුරු උද්‍යානයක් සැකසීම උදෙසා ඌන උපයෝජිත පළතුරුවල ජනක ප්ලාස්ම ගවේෂණය සහ එක් රැස් කිරීම
- ඉහල අස්වැන්නක් ලබා දෙන හොඳ තත්ත්වයේ වැල් දොඩම් ප්‍රභේද වැඩි දියුණු කිරීම
- කෙසෙල් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්විම
- අනාගත පර්යේෂණ වැඩසටහන් සඳහා අන්නාසි ජනකප්ලාස්ම එක්රැස්කිරීම සහ සංරක්ෂණය
- බලාපොරොත්තු තැබිය හැකි "වැරනියා" අමුමිරිස් ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය සහ නුමුහුම් බව පවත්වාගෙන යාම
- මුල් සහ ආකන්ධ බෝග වල ජනකප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම
- බතල සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම් පැවැත්වීම
- වට්ටක්කා සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම
- බණ්ඩක්කාවල මවු දෙමුහුම් ආර නඩත්තු කිරීම

**බෝග කළමනාකරණය**

- බද්ධ දූරියන් සඳහා ශාක කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- අවාරයට දූරියන් වල කෘත්‍රිමව මල් ප්‍රේරණය කිරීම
- රඹුටන් සඳහා ලාභදායී බෝග කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම
- අනාගත භාවිතය උදෙසා ගොරක සහ උගුරැස්ස එකතුන් නඩත්තු කිරීම
- අලුතෙන් නිර්දේශ කළ ගොරක ප්‍රභේදයන්හි (*Garcinia quaesita*) අනුවර්තන පරීක්ෂාව
- ඩ්‍රැගන්ෆෲට්වල අස්වැන්න සහ ගුණාත්මක බව උදෙසා වැලෙහි වර්ධනයට වැලෙහි කැපුම් ප්‍රමාණය සහ කැපුම් සංඛ්‍යාවෙහි බලපෑම.
- වර්ධන සහ අස්වැන්න උදෙසා ද්විත්ව ග්‍රාහක බද්ධ ඇගයීම
- වැල් දොඩම්වල විවිධ ආකාරයෙන් මැස්ස සකස් කරන ක්‍රමය අනුව ඇගයීම.
- කලාපය සඳහා නිර්දේශිත අඹ ප්‍රභේදයන්හි මල් සෑදීම උත්ප්‍රේරණය උදෙසා "පැක්ලොබියුමසෝල" භාවිතය
- වෙරළු සඳහා බීජ ප්‍රරෝහණ අධ්‍යයනය

**පාංශු විද්‍යාව සහ ශාක පෝෂණය**

- අන්නාසිවල ඵලදායීතාවය ඉහළ නැංවීම උදෙසා කාර්යක්ෂම පෝෂණ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම
- වාර්ෂික පැල රෝපණ ක්‍රමවේදය තුළ කෙසෙල් වර්ධන පසෙහි නිදහස්ව ඇති පොටෑසියම් ප්‍රමාණය සහ පොටෑසියම් කළමණාකරණය ඇගයීම
- කෙසෙල් වල ගෙඩිපැලීම කළමනාකරණය
- වැල් දොඩම්වල කද ඉදිමීම කළමනාකරණය
- ඩ්‍රැගන්ෆෲට් සඳහා කාබනික පොහොර පිළිවෙත් මාලාවක් වැඩි දියුණු කිරීම
- මදය රහිත රඹුටන් සහ රඹුටන් මදය බාගෙට පිරීම සම්බන්ධ අධ්‍යයනය

**පැලෑටි ව්‍යාධිවේදය**

- ආරක්ෂිත සංයෝග උපයෝගී කරගනිමින් පේරවල ගෙඩි නරක් වීමේ රෝග පාලනය. (රෝග 4)
- ආරක්ෂිත සංයෝග උපයෝගී කර ගනිමින් අඹවල ඇන්ත්‍රැක්ස්නෝස් සහ කඳ අග්‍රය නරක් වීමේ රෝග පාලනය
- ශාක නිස්සාරක උපයෝගී කර ගනිමින් කෙසෙල්වල සිගා කෝටා රෝග පාලනය
- ආරක්ෂිත සංයෝග උපයෝගී කර ගනිමින් පැපොල්වල ගෙඩි නරක්වීමේ රෝග 6ක් පාලනය
- ඩ්‍රැගන් ෆෲට්වල පසු මැරීමේ රෝග පාලනය

**කීට විද්‍යාව**

- නෙමටෝඩාවන්ට ප්‍රතිරෝධී පේර මුල් ග්‍රාහක වැඩිදියුණු කිරීම
- ඩෙංගු මදුරුවන් අභිජනනය උදෙසා අන්නාසි කිරල සහ කෙසෙල් පැලවල ජලය රැඳීමේ බලපෑම අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ මූල ගැටිති නෙමටෝඩාවන් ගේ ජීව විද්‍යාව සහ කළමනාකරණය
- කෙසෙල් ගුල්ලා පාලනය සඳහා කෘමි නාශක කැට යෙදීම ඇගයීම

**පටක රෝපණය**

- අඹවල කලලය ආරක්ෂාව
- පටක රෝපිත කෙසෙල්වල ක්ෂේත්‍ර ඇගයීම
- පටක රෝපිත අන්නාසිවල ක්ෂේත්‍ර ඇගයීම
- ආරක්ෂිත වශයෙන් වැදගත් මිදි ප්‍රභේදයන්වල ක්ෂුද්‍ර ප්‍රචාරණය
- වඩාත් ඉහළ ගුණාත්මක බවක් උදෙසා කෙසෙල් විකෘති වැඩිදියුණු කිරීම

**සමාජ ආර්ථික**

- පළතුරු බොග පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ 2013 වර්ෂය සඳහා INFORM වාර්තාව සැකසීම
- පළතුරු බෝගවල සමාජ ආරක්ෂිත තොරතුරු පිළිබඳ දත්ත වගුවක් වැඩි දියුණු කිරීම

**සංවර්ධන වැඩසටහන්**

- ආදර්ශ ගෙවත්ත වැඩිදියුණු කිරීම සහ නඩත්තුව
- හොරණ නිවර්තන පළතුරු සඳහා ජෛව විද්‍යාත්මක ගෙවත්ත පිහිටුවීම

# කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 11 |
| ආර්ථික විද්‍යා සහකාර | 01 |
| වැඩසටහන් සහකාර | 06 |
| සහකාර අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ සහකාර | 10 |
| කෘෂිකර්ම උපදේශක | 11 |
| රාජ්‍ය කළමනාකාර | 05 |
| සහකාර සේවය | |
| රියදුරු | 03 |
| ගබඩාකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| මුරකරු | 01 |
| බද්ධකරු | 03 |
| ස්ථිර කම්කරු | 30 |
| කම්කරු(කොන්ත්‍රාත්) | 109 |
| **එකතුව** | **196** |

# 1.3.1. පළතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන ස්ථානය - ගන්නෝරුව

ගන්නෝරුව, පළතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය යනු ප්‍රධාන හා ඌන භාවිත පළතුරු බෝග සඳහා හොරණ පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලනය යටතේ පවතින්නා වූ පර්යේෂණ ආයතනයකි. මෙය පේරාදෙණියේ සිට කිලෝමීටර් 2ක දුරකින් ගන්නෝරුව කටුගස්තොට මාර්ගයේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ආසන්නයේ පිහිටා තිබේ.

ඓතිහාසික සෙංකඩගල රජුගේ විනෝද උයන මෙන්ම උද්‍යාන බෝග උයන් පරිශ්‍රය තුළ මෙම පර්යේෂණ ස්ථානය පිහිටා තිබේ. මුළු දිවයිනම බ්‍රිතාන්‍ය පාලනයට නතුවීමෙන් පසු ලංකාවේ ආණ්ඩුකාරවරයා වූ ශ්‍රීමත් එඩ්වඩ් බාන්ස් විසින් (1824 -1831) මෙහි පෞද්ගලික උයනක් සහ අශ්වයින් ඇති කරන ස්ථානයක් ස්ථාපිත කරනු ලැබීය. ඔහු විසින් සිදුකළ තේ, රබර්,කුළුබඩු බෝග, පළතුරු බෝග සහ තෘණ වගාවන් 1916 දක්වාම පැවතිණි. ඉන්පසු ප්‍රථම කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වූ ආර්. එල්. ලින් මෙම ගොවිපළ පවරාගෙන 1912 වර්ෂයේදී අලුතින් පිහිටුවන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බෝග පර්යේෂණ ගොවිපළ බවට පත්කළේය. ඉන්පසු ගත වූ සිය වසර තුළ සිදු වූ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් වලින් පසු මෙම ගොවිපළ උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයේ පර්යේෂණ ඒකකය බවට පත් වූ අතර පසුව මෙම පර්යේෂණ ඒකකයෙහි නම පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ලෙස වෙනස් විය. 2012 ජූලි මස සිට මෙම ආයතනය හොරණ පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි කළමනාකාරිත්වය යටතට පත් විය.

පළතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සතුව හෙක්ටයාර 12ක පමණ භූමි ප්‍රමාණයක් පර්යේෂණ හා සංවර්ධන කටයුතු උදෙසා පවතී. මෙම 1වන වගුව මඟින් වර්තමානයේ මෙම ඒකකයෙහි භූමි උපයෝජනය පෙන්වා ඇත.

**වගුව 1.3.1.1: පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ භූමි උපයෝජනය**

| බෝග | සම්පූර්ණ භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | තත්ත්වය |
|---|---|---|
| 1. අලිපේර ජනකප්ලාස්මය (නැවත සකස් කළ ) | 1.0 | ඉතා උසස් ප්‍රභේදයන්හි අංකුර සහ සංරක්ෂණය උදෙසා උපයෝගී කරගනී |
| 2. කෙසෙල් වගාව | 1.0 | දේශීය ප්‍රභේදයන්හි අලුතෙන්ම ස්ථාපිත කළ ජනකප්ලාස්ම එකතුව |
| 3. දූරියන් වගාව | 1.0 | ප්‍රභේද ඇගයීම සහ සංරක්ෂණය |
| 4. අඹ ජනකප්ලාස්ම (නැවත සකස්කළ) | 1.5 | ජනකප්ලාස්ම සංරක්ෂණ |

| බෝග | සම්පූර්ණ භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | තත්ත්වය |
|---|---|---|
| 5. පැල තවාන් | 1.0 | දූරියන්, රඹුටන්, අලිපේර, අඹ, කාමරංගා, ජම්බු, කොස් යන ශාකයන්හි රිකිලි සහ අතු සකස් කිරීම |
| 6. ඌන උපයෝජිත පළතුරු බෝග උද්‍යානය/ක්ෂෙත්‍ර ජාන බැංකුව | 2.5 | පළතුරු විශේෂ 35ක් සහ එකතුන් 190ක් ස්ථාපිත කරනු ලැබ නඩත්තු කරනු ලැබීය |
| 7. මිශ්‍ර බෝග උද්‍යාන (රඹුටන්, අඹ, මැංගුස්, අන්නාසි සහ ස්ට්‍රෝබෙරි ඇතුලත්ය) | 4.0 | මව් ශාක සඳහා බෝග ඇගයීම සහ සංරක්ෂණය |

මෙම ආයතනය දූරියන්, අලිපේර, අඹ වැනි ප්‍රධාන පළතුරු බෝගද බෙලි, මසං, ජම්බු, වෙරළු, මාදං සහ මොර වැනි ඌන උපයෝජිත පළතුරු බෝග පිළිබඳවද පර්යේෂණ හා සංවර්ධන කටයුතු වල නියැලේ. ප්‍රභේද සංවර්ධනය, දේශීය සහ විදේශීය ප්‍රභේද වරණය හා ඇගයීම, ප්‍රචාරණ ක්‍රමෝපායන්, පැලතවාන් කළමනාකරණය, පළතුරු උයන් ස්ථාපිත කිරීම, නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ දැමීම මෙම පර්යේෂණ ස්ථානය මගින් ඉටුකරන ප්‍රධාන පර්යේෂණ ක්ෂෙත්‍රයන් වේ.

රටේ කෘෂිකර්මාන්ත සංවර්ධනය අත්පත් කරගැනීම උදෙසා පළතුරු බෝග පිළිබඳව ව්‍යාප්ති සහ පුහුණු වැඩසටහන් ඇතුලත්ව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ඉටුකිරීම පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සතු වගකීම වේ.

## අයවැය

**වගුව 1.3.1.2:** වාර්ෂික අයවැය **2012** (රුපියල්)

| වැය ශිර්ෂය/ ව්‍යාපෘති | ප්‍රතිපාදන | වියදම | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,896,814 | 2,701,092 | 93 |
| ප්‍රාග්ධන | 5,471,000 | 4,413,778 | 80 |
| **ව්‍යාපෘති** | | | |
| අඹ දූරියන් මල් උත්ප්‍රේරණ ව්‍යාපෘති | 1116,000 | 106,372 | 99 |
| අලිපේර සංවර්ධන ව්‍යාපෘති | 1,000,000 | 981,195 | 98 |

| වැය ශීර්ෂය/ ව්‍යාපෘති | ප්‍රතිපාදන | වියදම | වියදම % |
|---|---|---|---|
| පළතුරු ශාක නිෂ්පාදන ව්‍යාපෘතිය | 922,500 | 732,874 | 79 |
| ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය | 1,050,000 | 869,818 | 82 |
| පටක රෝපණ ව්‍යාපෘතිය | 250,000 | 249,900 | 83 |
| සියවස සැමරීම | | 961,561 | 100 |
| **එකතුව** | **12,706,314** | **12,016,590** | **95** |

## ප්‍රගතිය

### පර්යේෂණ

#### ඌන උපයෝජිත පළතුරු බෝගවල උසස් ජනකප්ලාස්ම හඳුනාගැනීම

බෙලි ***(Aegle marmelos)*** **(L)**

අනාගත බෝග සංවර්ධනය උදෙසා උසස් එකතුන් 6ක් හඳුනාගනු ලැබීය. මෙහිදී සමහර එකතුන් යළි සැකසීමට හෝ අගය එකතු කිරීම් කටයුතු සඳහා යෝග්‍ය එකතුන් වන අතර සමහර එකතුන් නැවුම් පළතුරු සඳහා යෝග්‍ය වේ.

**මසං (*Ziziphus mauritiana* සහ *Ziziphus jujuba*)**

එකතුන් 4ක් ක්ෂෙත්‍රයේ වගා කිරීමට හෝ බඳුන්වල සිටුවීමට යෝග්‍ය බව හඳුනාගනු ලැබීය. බලාපොරොත්තු තැබිය හැකි එක් ආරයක් කොළ පැහැති ඇපල්වලට බොහෝ සෙයින් සමාන වේ. බලාපොරොත්තු තැබිය හැකි අනෙකුත් එකතුන් 3 බඳුන්වල වගාකිරීම උදෙසා යෝග්‍ය වේ.

**මාදං/එළදං (*Syzygium cumini* (L), Skeels)**

I. දම්පැහැති එකතුන් දෙකක් හඳුනා ගනු ලැබීය. එකක් විදේශීය වරණයක් වන අතර අනෙක ක්ෂේත්‍රයේ මෙන්ම බඳුන්වල වගා කිරීම උදෙසා වූ යෝග්‍ය දේශීය ප්‍රභේදයකි.

Jamun (*Syzygium cumini*) (L), Skeels) ලා කොළ පැහැති එකතුවක් හඳුනාගනු ලැබූ අතර බෝගයේ කාර්යසාධනය පිළිබඳ අධ්‍යයන අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

**උගුරැස්ස (*Flacourtia inermis*)**

තවදුරටත් ඇගයීම සඳහා ප්‍රභේදයක් ලෙස නිකුත් කිරීම උදෙසා එකතුන් එකක් හඳුනාගනු ලැබීය.

**මොර (*Euphoria longana*)**

කුරුණෑගල සහ මහනුවර ප්‍රදේශ වලින් ඵලයේ ඉතාමත් උසස් ගුණාත්මක ලක්ෂණ සහිත එකතුන් 2ක් හඳුනා ගනු ලැබීය.

**ජමනාරං (*Citrce reticulate,* Blanco)**

රටේ විවිධ ප්‍රදේශ වලින් ඵලයේ පිළිගතහැකි මට්ටමේ ගුණාත්මක ලක්ෂණවලින් සමන්විත ජමනාරං එකතුන් 3ක් හඳුනාගනු ලැබූ අතර බෝග කාර්යසාධනය පිළිබඳ අධ්‍යයනයන් අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

**ජම්බු (*Syzygium Samarangense*, Merr සහ perry)**

ඉතාම උසස් ජම්බු විශේෂයක් ලෙසට ගෙඩියෙහි ඉතාමත් සිත් ගන්නා සුළු ගුණාත්මක ලක්ෂණ සහිත ප්‍රභේද 2ක් හඳුනා ගනු ලැබේ.

**ගල් සියඹලා (*Dialium ovoldeum*)**

පඬුවස්නුවර ප්‍රදේශයෙන් ගල් සියඹලා එකතුන් එකක් හඳුනා ගනු ලැබීය.

**නෙල්ලි (*Phyllganthus emblica*)**

මහනුවර ප්‍රදේශයෙන් දේශිය ප්‍රභේද හා සැසඳීමේදී රසවත් සහ ගෙඩි විශාල වන තවත් දේශීය ප්‍රභේදයක්, දේශීය වගා ප්‍රභේදයක් ලෙස හඳුනා ගනු ලැබිය.

**කරවල කැබිල්ල (*Antidesm bunius* (L) Spreng)**

ක්ෂේත්‍රයේ මෙන්ම බඳුන්වල වගා කිරීම උදෙසා ඉතාමත් හොඳ ගුණාත්මක ලක්ෂණ සහිත රසවත් එකතුන් එකක් හඳුනා ගනු ලැබූ අතර ක්ෂෙත්‍රයේ වගාකිරීම සඳහා බෝග කාර්ය සාධන අධ්‍යයනය කිරීමට නියමිතය.

**ගඩුගුඩා (*Baccaurea motleyanc)***

කිරිදිවැල ප්‍රදේශයෙන් රසවත් එකතුන් එකක් හඳුනාගනු ලැබූ අතර ක්ෂෙත්‍රයේ වගාකිරීම සඳහා බෝග කාර්යසාධන අධ්‍යයනය කිරීමට නියමිතය.

- දේශීය පළතුරු බෝග විය හැකි එම බෝගයන්හි ස්වභාවික වර්ධන ප්‍රදේශයන්හිදී හඳුනා ගනු ලැබූ අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ සියවස් සැමරුම් ප්‍රදර්ශනයේදී පැවැත් වූ පළතුරු බෝග තරඟයේදී මෙම ප්‍රභේද එකතු කරගනු ලැබිණි.
    - පට බඹර
    - හිඹුටු
    - කිරිකෝන්
    - බීජ රහිත අඹ
    - වරකා

- නාගරික කෘෂිකර්මාන්තයේහිදී සීමිත ඉඩ ප්‍රමාණයක් සහිත ගෙවතු සඳහා උචිත දේශීය පළතුරු බොහෝමයක් බඳුන්වල වගා කිරීමේ හැකියාව හඳුනාගනු ලැබිණි.

## තාක්ෂණික නිර්දේශයන්

මුල් පොදි ගැසීමේ තාක්ෂණය හඳුනාගනු ලැබූ අතර හොඳින් වර්ධනය වූ පළතුරු ශාක සංරක්ෂණය වගාව සහ භූමි සැකස්ම යන කටයුතු උදෙසා හෝ වැඩුණු ශාක වෙනත් ස්ථානයකට ගෙන යාමට හෝ වෙනස් කිරීම වැනි කටයුතු සඳහා දේශීය පළතුරු වගාවට හඳුන්වා දෙනු ලැබිණි.දේශීය පළතුරු බෝග විශාල බඳුන්වල වගා කිරීම ඉතාමත් ඉහලින් බලාපොරොත්තු තැබිය හැක. දේශපාලනික අධිකාරිත්වයෙන්, රජයේ නිලධාරීන්ගේ සහ පොදු මහජනතාවගෙන් මෙම විශාල බඳුන්වල වගා කල පළතුරු බෝග සඳහා ඉහල පිළිගැනීමක් ලබාගැනීමට හැකි වී ඇත.

## සංවර්ධනය

### ඌන උපයෝජිත පළතුරු ගෙවතු/ ක්ෂේත්‍ර ජාන බැංකු පිහිටුවීම

**වගුව 1.3.1.3 : 2012 වර්ෂයේදී ස්ථාපිත කළ ඌන උපයෝජිත පළතුරු ගෙවතු / ක්ෂේත්‍ර ජාන බැංකු**

| පළතුරු ගෙවතු / ක්ෂෙත්‍ර ජාන බැංකු | පළතුරු සංඛ්‍යාව | එකතුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - ප්‍රධාන කාර්යාලය | 12 | 12 |
| 2. නො: 36, මහවැලිවත්ත, පල්ලේකැලේ, කුණ්ඩසාලය | 10 | 10 |
| 3. ග්‍රාමසේවක කාර්යාලය, උඩුනුවර | 14 | 14 |
| 4. වාරියපොල ශ්‍රී සුමංගල විද්‍යාලය - මහනුවර | 08 | 23 |
| 5. යටිහලගල මහනුවර | 18 | 18 |
| 6. මහතැන්න පන්සල, යටිහලගල | 10 | 12 |
| 7. නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම), පොළොන්නරුව | 24 | 89 |
| 8. නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම), ගාල්ල | 19 | 108 |
| 9. අධ්‍යක්ෂ, පළතුරු බෝග පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය, හොරණ | 26 | 55 |
| 10. නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම) කැගල්ල | 13 | 123 |
| 11. නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම) වවුනියාව | 10 | 28 |
| 12. ත්‍රිත්ව විද්‍යාලය, මහනුවර | 16 | 16 |
| 13. පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 20 | 400 |
| 14. කාටුල් ඔය වතුයාය | 09 | 09 |

## රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

**වගුව 1.3.1.4 : රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

| බෝගය | නිෂ්පාදනය කළ රෝපණ ද්‍රව්‍ය | අලෙවි කළ රෝපණ ද්‍රව්‍ය සංඛ්‍යාව | නිකුත් කිරීමේ ඇණවුම් මත නිකුත් කළ පැළැටි සංඛ්‍යාව |
|---|---|---|---|
| **බද්ධ කළ ශාක** | | | |
| අලිපේර | 2196 | 1047 | 110 |
| බෙලි | 600 | - | 300 |
| දූරියන් | 278 | - | - |
| පේර | 03 | 03 | - |
| කොස් | 1244 | 168 | 58 |

| බෝගය | නිෂ්පාදනය කළ රෝපණ ද්‍රව්‍ය | අලෙවි කළ රෝපණ ද්‍රව්‍ය සංඛ්‍යාව | නිකුත් කිරීමේ ඇණවුම් මත නිකුත් කළ පැළැටි සංඛ්‍යාව |
|---|---|---|---|
| ජම්බු | 50 | - | 25 |
| අඹ (ගිරා) | 21 | 03 | - |
| ජමනාරං | 99 | 25 | 17 |
| පැණි දොඩම් | 96 | 20 | 22 |
| රඹුටන් | 1223 | 122 | 307 |
| සැපදිල්ලා | 36 | 10 | 12 |
| කාමරංගා | 400 | 140 | 35 |
| උගුරුස්ස | 30 | - | 15 |
| ගොරක | 47 | 07 | 10 |
| අඹ (Tom ETC) | 242 | 162 | 50 |
| ජම්බෝල | 350 | 11 | 30 |
| අඹරැල්ලා | 100 | 14 | 30 |
| කැලමන්සි | 32 | 16 | - |
| අඹ (උසස් ප්‍රභේද) | 02 | 02 | - |
| මසං | 50 | - | 20 |
| මාදං/එලදං | 80 | - | 35 |
| කරවලකැබිල්ල | 175 | - | 40 |
| මොර | 30 | - | 10 |
| අනෝදා | 30 | - | 15 |
| ගඩුගුඩා | 100 | - | 25 |
| වෙරළු | 30 | - | 15 |
| **දඬු** | | | |
| දෙහි | 11 | 05 | - |
| මිදි | 02 | 02 | - |
| ජම්බු | 1500 | 42 | 375 |
| ලෙමන් | 19 | 14 | 04 |
| පේර | 01 | 01 | - |
| වෙරළු | 20 | - | 10 |
| **බීජ පැල** | | | |
| අලිපේර | 1284 | 20 | - |
| ඇඹුල් දොඩම් | 125 | - | - |

| බෝගය | නිෂ්පාදනය කළ රෝපණ ද්‍රව්‍ය | අලෙවි කළ රෝපණ ද්‍රව්‍ය සංඛ්‍යාව | නිකුත් කිරීමේ ඇණවුම් මත නිකුත් කළ පැළැටි සංඛ්‍යාව |
|---|---|---|---|
| දෙහි | 15 | 05 | - |
| රඹුටන් | 3025 | - | - |
| මැංගුස් | 107 | 04 | 25 |
| ජම්බෝල | 618 | - | - |
| චීන පේර | 02 | 02 | - |
| දෙළුම් | 06 | 06 | - |
| වැල්දොඩම් | 01 | 01 | - |
| මැලේ ජම්බු | 42 | 11 | - |
| දූරියන් | 169 | - | - |
| කාමරංගා | 1600 | - | - |
| මාදං/එලදං | 23 | - | - |
| අඹ | 30 | 30 | - |
| වරකා | 66 | 20 | - |
| ගල්සියඹලා | 50 | - | 10 |
| අනෝදා | 100 | - | 20 |
| හිඹුටු | 40 | - | 15 |
| නමිනං | 50 | - | 20 |

රජයේ නිෂ්පාදන පිරිවැය රු. 732, 873.57 වූ අතර අලෙවි ආදායම 383, 880.00 විය.

## ව්‍යාපෘතිය

### 01. මල්හට ගැනීම සහ ශාකය පාලනය තුළින් අඹ සහ දූරියන්වල ඵලදායීතාවය වැඩිකිරීම

ශාක 2600ක් හඳුනාගනු ලැබීය. දැනුවත් කිරීමේ වැඩසටහන 10ක් පවත්වනු ලැබීය, ඇණවුම් හේතුවෙන් පත්‍රිකා දෙවර්ගයක් නැවත මුද්‍රණය කරනු ලැබීය. (එක් පත්‍රිකාවකින් පිටපත් 5000 බැගින්) රූපවාහිනී වැඩසටහන් 3ක් ප්‍රචාරය කරන ලදී. පුවත්පත් නිවේදන 4ක් හා ගුවන් විදුලි නිවේදන 5ක් නිකුත් කරනු ලැබීය. අඹ සහ දූරියන් පැල 2600කට ප්‍රතිකර්ම කරනු ලැබීය. අපේක්ෂිත පරිදි ශාක 1100ක පමණ මල්හට ගැනීම ආරම්භ විය. මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි කෘෂිකර්ම උපදේශකවරුන් හට ශාකයන් හට,

ප්‍රතිකර්ම සැකසීම හා සිදුකරන ආකාරය පිළිබඳ දැනුම ලබාදෙන ලදී. ප්‍රතිලාභීන්ව ස්වකීය ක්‍රියාවලින් සහ වගකීම දැනුවත් කරනු ලැබීය. ලේඛනගත කරනු ලැබූ ශාක 2400කට වැඩි ප්‍රමාණයකට මෙම ප්‍රතිකර්ම අඛණ්ඩව සිදු කරනු ලැබීය.

**02.** අලිපේර සංවර්ධන වැඩසටහන පත්‍රිකා 5000ක් නැවත මුද්‍රණය කරනු ලැබූ අතර දැනුවත් කිරීමේ වැඩසටහන් 8ක් පවත්වනු ලැබීය. ගම්පොළ, දෙල්පිටිය, තෙල්දෙණිය ප්‍රදේශ වලදී “Hass” සහ “Fuerte” ප්‍රභේදහට ශාක 800කට ශාකයේ ඉහළ කොටසට ප්‍රතිකර්ම කරනු ලැබීය. උඩුනුවර, කුණ්ඩසාලේ, අලවතුගොඩ, යටිනුවර යන ප්‍රදේශ වල ශාක 1542කට ඉහළ ප්‍රදේශය කපා රිකිලි බද්ධය සිදු කිරීම අඛණ්ඩ සිදු කරනු ලැබීය.

පළතුරු මැස්සා පාලනය කිරීමේ වැඩසටහන් වැඩිදියුණු කර ප්‍රතිලාභීන් අතර මෙම පළතුරු මැසි උගුල් බෙදා හැරීම අඛණ්ඩව සිදු කරනු ලැබීය.

තත්ත්වයෙන් ඉහළ අලිපේර නිෂ්පාදනය හා උපයෝගී කර ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි පවත්වනු ලැබීය. මහනුවර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 5ක්ද මාතලේ දිස්ත්‍රික්කයේ වැඩසටහන් 2ක්ද පවත්වන ලදී.

### ව්‍යාප්ති සහ පුහුණු

- පෞද්ගලික අංශයේ පැල තවාන්කරුවන් සහ විශ්වවිද්‍යාල සිසුන් හට පළතුරු ශාක තවාන් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි
- වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධව මාස 06ක පැළ තවාන් කළමනාකරණය සහ පළතුරු වගාව පිළිබඳව නාවික හමුදා භටයින් සඳහා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිය.
- පැලතවාන්කරුවන් සඳහා මුල් පොදි ගැසීමේ තාක්ෂණය හඳුන්වා දෙනු ලැබිණි
- 2012 කෘෂිකර්ම දෙපාර්තමේන්තු සියවස් ප්‍රදර්ශනය සහභාගීවීම සහ ගන්නෝරුව පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානයේදී ඌන උපයෝජිත පළතුරු බෝග සහ බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද ප්‍රදර්ශනය පවත්වනු ලැබිණි
- මොරගහකන්ද මහවැලි අධිකාරියේ මහවැලි ආදර්ශ ගොවිපලේදී ශාක කප්පාදු කිරීම, ජමනාරං, පැණි දොඩම් සහ බෙලි ශාක සංරක්ෂණය අරමුණු ඇතිව බෝග කළමනාකරණය පිළිබඳ පුහුණුව පැවැත්විණි
- සියවස් සැමරු උත්සව කාලය තුළදී ඌන උපයෝජිත පළතුරු බෝග පිළිබඳ ගුවන් විදුලි සහ රූපවාහිනි වැඩසටහන් පවත්වනු ලැබීය.

## 2013 - සැලැස්ම

### ඌන උපයෝජිත පළතුරු විශේෂ ස්ථානයෙන් පරිබාහිරව ඇගයීම

වගාකළ තත්ත්වයන් යටතේ විවිධත්වය හා ඵලදායීතාවය ඇගයීම

### උසස් තත්ත්වයේ බෙලි විශේෂ ඇගයීම

කුඩා හා ඉහළ පරිමාණයේ වගා සහ බෝග ප්‍රවර්ධනය උදෙසා විශේෂයෙන් වගා ප්‍රභේද ඵලදායීතාවය අධ්‍යයනය

### උසස් තත්ත්වයේ මසං විශේෂ ඇගයීම

කුඩා සහ ඉහළ පරිමාණයේ වගා සහ බෝග ප්‍රවර්ධනය උදෙසා විශේෂ වගා ප්‍රභේද ඵලදායීතාවය අධ්‍යයනය

### උසස් තත්ත්වයෙන් මොර විශේෂ ඇගයීම

කුඩා සහ ඉහළ පරිමාණයේ වගා සහ බෝග ප්‍රවර්ධනය උදෙසා විශේෂ හා වගා ප්‍රභේද ඵලදායීතාවය අධ්‍යයනය

### උසස් තත්ත්වයේ මාදං/ ඵලදං විශේෂ ඇගයීම

කුඩා සහ ඉහළ පරිමාණයේ වගා සහ බෝග ප්‍රවර්ධනය උදෙසා විශේෂ හා වගා ප්‍රභේද ඵලදායීතාවය අධ්‍යයනය

**ජම්බු වල වර්ධක ප්‍රචාරණ ක්‍රමයන් ඇගයීම**

ප්‍රචාරණ උදෙසා ඉතාමත් උචිත රෝපණ ද්‍රව්‍ය කුමක්ද යන්න හඳුනාගැනීම

**ගඩුගුඩා සඳහා වර්ධක ප්‍රචාරණ ක්‍රමය ඇගයීම**

ප්‍රචාරණය උදෙසා ඉතාමත් උචිත රෝපණ ද්‍රව්‍ය කුමක්ද යන්න හඳුනාගැනීම

**වෙරළු සඳහා ප්‍රවර්ධන ප්‍රචාරණ ක්‍රමය ඇගයීම**

ප්‍රචාරණය උදෙසා වඩාත් උචිත රෝපණ ද්‍රව්‍ය කුමක්ද යන්න හඳුනා ගැනීම

**වෙරළු බීජ පැළවීම උදෙසා වර්ධක මාධ්‍යය ඇගයීම**

වෙරළු බීජ පැලවීම ප්‍රවර්ධනය උදෙසා වඩාත් සුදුසු වර්ධක මාධ්‍ය සොයා බැලීම

**දේශීය පළතුරු වගාව විශාල බඳුන්වල සිදුකිරීම ඇගයීම**

විශාල බඳුන්වල දේශීය පළතුරු වගාකිරීමේ හැකියාව සොයා බැලිම

**හඳුනා නොගත් දේශීය පළතුරු විය හැකි විශේෂ එකතු කිරීම සහ ඇගයීම**

නගරාශ්‍රිතව වගාකිරීම උදෙසා නව දේශීය පළතුරු ප්‍රභේද හඳුනාගැනීම

**ඌන උපයෝජිත පළතුරු විශේෂවල පළිබෝධ සහ රෝග තත්ත්වයන්**

ඇතිවිය හැකි ශාක සංරක්ෂණ ගැටළු සහ ඒවායේ පාලන පිළිවෙත් හඳුනාගැනීම

**දේශීය පළතුරු ප්‍රභේද වල මුල් පොදි ගැසීමේ බලපෑම අධ්‍යයනය**

දේශීය පළතුරු ප්‍ර භේද ඉදිකිරීම් සහ භූමි සැකැස්ම උදෙසා මුල් පොදි ගැසීමේ තාක්ෂණය උපයෝගී කර ගැනීමේ තාක්ෂණය හඳුනා ගැනීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ආයතන ප්‍රධානී කාර්යභාර | |
| පර්යේෂණ නිලධාරී | 1 |
| පර්යේෂණ නිලධාරී | 1 |
| ගොවිපළ කළමනාකරු | 1 |
| කෘෂිකර්ම උපදේශක | 5 |
| වැඩසටහන් සහකාර | 1 |
| උපාධිධාරී අභ්‍යාසලාභී | 1 |
| ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ | |
| සහකාර | 1 |
| ගොවිපළ කළමනාකාර | 2 |
| මුරකරු | 05 |
| වැද්දුම්කරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| බද්ධකරු | 02 |
| කම්කරු (ස්ථිර) | 16 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 25 |
| **එකතුව** | **63** |

# 1.3.2 පැළෑටි වෛරස් හඳුනා ගැනිමේ මධ්‍යස්ථානය - හෝමාගම

හෝමාගම පිහිටි පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයේ පරිපාලනය, අධ්‍යක්ෂ - පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන යටතේ ක්‍රියාත්මක වන අතර මෙම අධ්‍යක්ෂ කාර්යාලය 2012 මාර්තු - ඔක්තෝම්බර් යන කාලය තුළදී හෝමාගම පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි ස්ථාපිත කරන ලදි. මෙම මධ්‍යස්ථානයට පැවරී තිබෙන වගකීම වනුයේ පැළෑටි වෛරස් සහ වෛරස් වැනි ජීවීන් හඳුනා ගැනීම සඳහා දැනට භාවිතයේ පවතින උසස් තාක්ෂණයන් යොදා ගැනීම, වෛරස් සහ වෙනත් ජීවීන් විද්‍යාගාරයේදී සහ ක්ෂේත්‍රයේ දී හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ කට්ටල නිෂ්පාදනය, නිරෝධායන කටයුතු, වසංගත විද්‍යාත්මක විමර්ශන, යොදා ගත හැකි පාලන ක්‍රම ඇගයීම, වෛරස්වලින් තොර මූලික රෝපණ ද්‍රව්‍ය හා අත්තිවාරම් තොග නිෂ්පාදනය, වෛරසයේ ප්‍රෝටීනය සඳහා ප්‍රතිරෝධී වීම පිළිබඳ විමර්ශන සිදු කිරීම සහ අනෙකුත් ව්‍යාධිජනක ජීවීන් (දිලීර, බැක්ටීරියා, නෙමටෝඩාවන්, වෛයිරොයිඩ සහ පයිටෝ ප්ලාස්මාවන්) හඳුනා ගැනීමයි.

## අයවැය

**වගු අංක 1.3.2.1 : වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 3,244,055 | 2,704,624 | 83 |
| මූලධන | 2,208,405 | 2,153,063 | 98 |
| **ව්‍යාපෘති** | | | |
| ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති සැලැස්ම - පැපොල් ව්‍යාපෘතිය | 1,400,000 | 1,439,652 | 103 |
| පටක රෝපණ ව්‍යාපෘතිය | 4,500,000 | 2,267,143 | 58 |
| මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය | 25,000,000 | 15,288,001 | 61 |
| **එකතුව** | **36,352,460** | **24,212,483** | **67** |

## ප්‍රගතිය

### සාමාන්‍ය පරිදි සිදු කෙරෙන පැළෑටි වෛරස් කටයුතු

- වෛරස් සහ වෛරස් වැනි රෝග හඳුනා ගැනීම සඳහා දේශීයව නිපදවන ලද ප්‍රතිමස්තු වල වලංගුභාවය පිළිබඳව සොයා බැලීම සඳහා සිදු කරන ලද අධ්‍යයනයේ දී කල් තබා ගැනීමේ ක්‍රමයක් යොදා ගනිමින් ප්‍රතිමස්තු නිසි පරිදි ගබඩා කර ගත් විට ඒවා වෛරස් සහ වෛරස් වැනි රෝග හඳුනා ගැනීම

සඳහා වසර 5ක් ගතවන තුරු භාවිතයට ගත හැකි බව අනාවරණය විය.

- පැපොල් ෆයිටොප්ලාස්මා රෝගය හඳුනා ගැනීම සඳහා බහු ක්ලෝනීය ප්‍රතිමස්තු නිපදවීම. දේශීයව නිපදවන ලද පරීක්ෂණ කට්ටලයක් මඟින් ෆයිටෝප්පලාස්මා ආසාදන තත්ත්වයන් කාර්යක්ෂමව හඳුනා ගැනීම සිදු වේ.

- කෙසෙල් වද පීදීමේ රෝගය හඳුනා ගැනීම සඳහා (BBTV) බහුක්ලෝනීය ප්‍රතිමස්තු නිපදවීම. අදාළ කටයුතු ප්‍රශස්ත කිරීම සිදු කළ යුතුව ඇත.

- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය හඳුනා ගැනීම සඳහා දේශීයව නිපදවන ලද ප්‍රතිමස්තු භාවිතයෙන් වෙනත් කෘෂිකාර්මික බෝගවල ෆයිටොප්ලාස්මා රෝගය හඳුනා ගැනීම සිදු කරන ලදි.

- එලිසා තාක්ෂණය මඟින් ආනයනය කරන ලද පිපිඤ්ඤා කුලයේ දෙමුහුම් බීජ වල ඇති බීජ මඟින් පැතිරෙන වෛරස් රෝග හඳුනා ගැනීම.
  පරීක්ෂා කර බලන ලද වට්ටක්කා ප්‍රභේද වල බීජ නියැදි බිග් ගෝඩ් 329 සහ PK 451, කරවිල ප්‍රභේද - පාලි සහ තිස්ස යනාදිය ක්‍යුකම්බර් ග්‍රීන් මොට්ල් මොසායික් වෛරසයේ සහ ක්‍යුකම්බර් මොසායික් වෛරසයේ ආසාදනයට ලක් වී නොමැත. මෙම අධ්‍යයනය අඛණ්ඩවම සිදු කෙරේ.

- මස්තු විද්‍යාත්මක ක්‍රම මඟින් නිතිපතා සිදු කෙරෙන වෛරස් හඳුනා ගැනීමේ වැඩසටහන.

  නියැදි 1000ක වෛරස් හඳුනාගැනීමේ කටයුතු සිදු කෙරිණි.

භාවිතය : රෝග වලින් තොර රෝපණ ද්‍රව්‍යය නිෂ්පාදනය සහ රෝග තවදුරටත් පැතිරී යාම පාලනය කිරීම සඳහා ව්‍යාධිජනක නිවැරදිව හඳුනා ගැනීම.

### අණුක වෛරස් විද්‍යාව

- RT – PCR ක්‍රමවේදය මඟින් අර්තාපල් වල PVX සහ කොළ රෝල් වීමේ වෛරසය (PLRV) හඳුනා ගැනීම.

භාවිතය : නිතිපතා සිදු කෙරෙන වෛරස් හඳුනා ගැනීමේ කටයුතු සඳහා තාක්ෂණය යොදා ගැනීම, විශේෂයෙන්ම, පෞද්ගලික අංශයේ ආයතන වල වෛරස් වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ නිරෝධායන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

- RT – PCR ක්‍රමවේදය මඟින් සිට්‍රස් ප්‍රභේද වල වෛරස් සහ වෛරොයිඩ රෝග හඳුනා ගැනීම ඩ්‍යුප්ලෙක්ස් සහ මල්ටිප්ලෙක්ස් RT - PCR ක්‍රමවේද දියුණු කිරීම

  වෛයිරොයිඩ 2ක් හඳුනා ගැණුනු අතර තවදුරටත් අධ්‍යයන කටයුතු සිදු කළ යුතුය.

- PCR තාක්ෂණය පදනම් කරගත් ක්‍රමවේදය මඟින් පොල් කොළ මැලවීමේ ෆයිටෝප්ලාස්මා රෝගය පතුරුවන ව්‍යාධිජනකයන්ගේ ධාරකයන් පිළිබඳ අධ්‍යයනය.

  විශේෂිත ප්‍රයිමර් යොදා ගනිමින් වැලිගම පොල්කොළ මැලවීමේ ෆයිටෝප්ලාස්මා රෝගය සම්බන්ධයෙන් මෙම අධ්‍යනය අඛණ්ඩව සිදු කෙරේ. මෙය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා ජාන පිහිටා ඇති ආකාරය පිළිබඳව සොයා බලනු ඇත.

භාවිතය : මෙම රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා රෝගයට ලක්වූ පොල් ගස් හැරුණු විට විකල්ප ධාරක රෝගය ආසාදනය නොවූ ප්‍රදේශවලට පිවිසීම සීමා කිරීම.
පොල්කොළ මැලවීමේ ෆයිටෝප්ලාස්මා රෝගයේ ජාන පිහිටි ආකාරය උපයෝගී කරගෙන PCR තාක්ෂණය මඟින් දැනටමත් හඳුනාගෙන ඇති වෛරස් පිළිබඳ තොරතුරු තහවුරු කරගැනීම.

මේ පිළිබඳ අධ්‍යයන අඛණ්ඩවම සිදු කෙරේ

- DNA පදනම් කරගත් තාක්ෂණය මඟින් නිතිපතා සිදු කරන වෛරස් හඳුනා ගැනීමේ වැඩසටහන. මෙම ක්‍රමය මඟින් වෛරස් හඳුනා ගත් නියැදි සංඛ්‍යාව 500කි.

- භාවිතය : දෛනිකව සිදු කෙරෙන වෛරස් හඳුනා ගැනීමේ කටයුතු සඳහා මෙම තාක්ෂණය භාවිතා කිරීම සහ විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවල වෛරස්වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ නිරෝධායන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

  කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් අරමුදල් ප්‍රතිපාදිත විශේෂ ව්‍යාපෘති (NARP).

- පැපොල් වගාවේ ව්‍යාධිජනකමය රෝග හඳුනා ගැනීම සහ ඒවා හඳුනා ගැනීම සඳහා සංවේදී පරීක්ෂණ ක්‍රම බිහි කිරීම.

### වෛරස් වසංගත විද්‍යා අංශය

- රසායනික නොවන ක්‍රම භාවිතයෙන් කුකර්බිට් කුලයේ බෝගවල (පිපිඤ්ඤා) වෛරස් රෝග පාලනය කිරීම. මෙම පරීක්ෂණය ඉදිරියට කරගෙන යනු ලැබේ.
- පාංශු වසුන් සහ ශාක සාර භාවිතයෙන් බණ්ඩක්කා කහ නාරටි විචිත්‍ර වෛරස් රෝගය පාලනය කිරීම. කහ පොලිතීන් මගින් පාංශු වසුන් යෙදූ විට රෝග ආසාදනය අඩු වූ නමුත් අස්වනු දත්ත වල සැළකිය යුතු වෙනසක් නොවීය.
- ශාක සාර සහ කෘත්‍රිම බාධක භාවිතයෙන් කුකර්බිට් කුලයේ බෝග(කොමඩු) වල වෛරස් රෝග පාලනය කිරීම පිළිබඳව අධ්‍යනය කිරීම.
- සුදු ලූණු යුෂ මඟින් වෛරස් රෝග හොඳින් පාලනය කළ හැකි වූ මුත් සියලුම ප්‍රතිකර්ම මඟින් අස්වැන්නෙහි විශේෂ වෙනසක් සිදු නොවිණි.
- ක්ෂේත්‍ර වල වෛරස් ආසාදනය වීම පමා කිරීම /කළමනාකරණය කිරීම සඳහා සුළු සහ මධ්‍යම පරිමාණයේ වකරුවන් වෙත උපදෙස් සේවාව ලබා දීම.
- වෛරස් රෝග කළමනාකරණය කිරීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා 10ක් සිදු කරන ලදි.

### අනෙකුත් ව්‍යාධිජනකයින් හඳුනා ගැනීමේ අංශය

- මාළු මිරිස් වගාවට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් (Colletotrichum spp.) දිලීර රෝග මර්දනය කිරීම සඳහා ශාක සාර භාවිතා කිරීම. (කොහොඹ, සුදුලූණු, ඉඟුරු සහ කහ)

  5% සාන්ද්‍රණයෙන් යුතු ඉඟුරු සාරය, මෙම දිලීරය මර්දනය කිරීම සඳහා යොදා ගත් අනෙක් සාරයන්ට වඩා සුදුසු බව තහවුරු කර ගන්නා ලදි. පරීක්ෂා කර බලන ලද අනෙකුත් ප්‍රතිකර්ම වලට වඩා කොලෙටොට්‍රිකම් දිලීරයේ මයිසීලියම් වර්ධනය

නිශේධනය කිරීමේ හැකියාව මෙම සාරය සතු වේ.

භාවිතය : කොපර් අඩංගු දිලීර නාශක භාවිතය අඩු කිරීමට ගොවීන් උනන්දු කිරීම.

- කෘෂිකාර්මික බෝග වලට වැළදෙන රෝග හා පළිබෝධ හානි මර්දනය කිරීමට ශාක එන්නත් (Tree injectors) භාවිතා කළ හැකි අන්දම පරීක්ෂා කිරීම.
  දිලීර ජාල වර්ධනය කෙරෙහි දිලීරනාශක වලින් ඇති වන බලපෑම පිළිබඳව සොයා බැලීමට සිදු කරන ලද විද්‍යාගාර පරීක්ෂණ මගින් පිළිවෙළින් තයෝෆනේට් මෙතිල් සහ ප්‍රොපිකොනොසෝල් දිලීරනාශක වල සම්මත සාන්ද්‍රණය මගින් ෆෝමිස් ලිග්නෝසස් (Fomes lignosus) සහ ෆියුසාරියම් විශේෂ (*Fusarium* spp.) කාර්යක්ෂමව පාලනය වන බව අනාවරණය විය.

  යෙදීම : වඩාත් උචිත පරිසර හිතකාමී ක්‍රම මගින් රෝග හා පළිබෝධ මර්දනය ප්‍රචලිත කිරීම.

- දෛනික රෝග නිශ්චය කිරීමේ වැඩසටහන.
  2012 වර්ෂය සඳහා රෝගී නියදි 200ක් පමණ නිශ්චය කරන ලද අතර සමෝධානික පළිබෝධ කළමනාකරණය පාදකව කාර්යක්ෂම විසඳුම් ලබා දෙන ලදී.

  යෙදීම: රෝග හඳුනා ගැනීම හා පාලන ක්‍රම යොදා ගැනීම.

**පටක රෝපණ අංශය**

- වැඩිදියුණු කරණ ලද ඇන්තූරියම් වගා ප්‍රභේද කීපයක් සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමය උපයෝගී කර ගනිමින් රෝපණ ද්‍රව්‍ය නිපදවීමට සුදුසු ක්‍රම වේදයක් සොයා ගැනීම.
  ලේඩි ජේන්, කිරිමැටිය වරණය සහ ස්ප්‍රිට් ප්‍රභේද වල පටක රෝපිත පැළ නලස්ථව බෝතල් 246ක සාර්ථකව වැඩෙමින් පවතී. මෙම අත්හදා බැලීම අඛණ්ඩවම සිදු කෙරේ.

- ක්ෂුද්‍ර ප්‍රචාරණය උපයෝගී කර ගනිමින් පැපොල් වල රෝපණ ද්‍රව්‍ය නිපදවීමට සුදුසු ක්‍රම වේදයක් බිහි කිරීම.
  පැපොල් කිනක (callus) නලස්ථව බෝතල් 10ක පමණ සාර්ථකව වැඩෙමින් පවතී.

  මෙම අත්හදා බැලීම අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- "ඉන්දු" ජමනාරං ප්‍රභේදය සඳහා අර්ධ ක්ෂුද්‍ර බද්ධ ක්‍රමය(semi micro grafting)භාවිතා කිරිම මගින් වෛරස් රෝග වලින් තොර පැළ 194 ක් පමණ ලබා ගෙන ඇත. වෛරස් වලින් තොර පැළ ලබා ගැනීම සඳහා මි.මී.1ක් පමණ වූ අනුජ යොදා ගැනීම සාර්ථක විය.
  මෙම අත්හදා බැලිම අඛණ්ඩවම සිදු කෙරේ.

- MG 3 අන්නාසි ප්‍රභේදයේ විවිධ පටක (පත්‍ර හා මොරෙයියන්)භාවිතා කර පටක රෝපිත පැළ නිෂ්පාදනය හා එම පැළ ක්ෂේත්‍රයේ සිටුවා අධ්‍යානයනය කිරිම තුළින් පටක රෝපණය සඳහා වඩාත් සුදුසු පූර්වකය තෝරා ගැනීම.
  කිසිදු ප්‍රතිකර්මයකින් තොරව සතුටුදායක වර්ධක වර්ධනයක් සහ මල් හට ගැනීමක් සිදු වූ අතර කිසිදු අසාමාන්‍යතාවයක් නොපෙන්විය. තවදුරටත් පරික්ෂණය කෙරෙමින් පවතී.

- පටක රෝපිත කෙසෙල් සහ අන්නාසි පැළ සිටුවන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණය හා දත්ත රැස් කිරිම.

පැළ මනාව වර්ධනය වූ අතර ගුණාත්මක බවින් ඉහළ මෙන්ම ඉහළ අස්වනු ගෙන දුන් අතර වෛරස් වලින් තොර විය.

මෙම අත්හදා බැලීම තව දුරටත් සිදු කරනු ඇත.

- පටක රෝපිත කෙසෙල් පැළ (ඇම්බම්,කෝලිකුට්ටු,සීනි,නේත්‍රපල ම්,අගවියරු සහ ඇඹුල්)22,378 ක් හා අන්නාසි පැළ 68,760 ක්(MG 3 සහ මුරුසි) නිෂ්පාදනය කරන ලදී.

### තාක්ෂණ ප්‍රචාරණ අංශය

- තාක්ෂණය පතුරුවාලීම සඳහා ගොවීන්, ගොවි සංවිධාන, ගුරුවරුන්, සිසුන් සහ උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණු පන්ති 16ක් පැවැත්විය.
- මෙම වසරේදී ගුවන් විදුලි වැඩසටහනක් ප්‍රචාරය කිරීම, පුවත්පත් ලිපි 02ක්, අත්පත්‍රිකාවක් පළකිරීම, පටක රෝපණ වගා ක්ෂේත්‍ර 05ක් නිරීක්ෂණය කිරීම, වැඩමුළුවක් පැවැත්වීම, ක්ෂේත්‍ර චාරිකා 44ක් සහ බෝග සායන 14ක් පැවැත්වීම සිදු කරන ලදි.
- මීට අමතරව, සිය වගාවන් සම්බන්ධයෙන් විවිධ ගැටළු රැගෙන මෙම මධ්‍යස්ථානයට පැමිණි ගොවීන්/ වගාකරුවන් 86 දෙනෙකු සඳහා උපදේශක සේවා ලබාදීම.
- එක් පශ්චාත් උපාධි ව්‍යාපෘතියක් සහ උපාධි අපේක්ෂක ව්‍යාපෘති 04ක් මෙහෙයවීම.
- අභ්‍යාසලාභීන් 10 දෙනෙකු සඳහා සේවාස්ථ පුහුණුව ලබාදීම.
- නාගරික කෘෂිකාර්මික ආදර්ශනයක් සහ ආදර්ශ ගම්මානයක් මෙම මධ්‍යස්ථානයේ නඩත්තු කිරීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම.
- දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී පරිසර හිතකාමී කෘෂිකර්මික වැඩසටහනක් පැවැත්වීම.
- ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම මගින් උද්‍යාන බෝග පිළිබඳ ඉන්දියානු ආයතනයේ ප්‍රවීණ වෛරස් විද්‍යා ආචාර්ය ක්‍රිෂ්ණ රෙඩි විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාධිවේදී විද්‍යාඥයින් සඳහා රෝග නිශ්චය කිරීමේ නව තාක්ෂණය පිළිබඳව වැඩමුළුවක් සිදු කරන ලදි.

## 2013 වසර සඳහා සැලැස්ම

### සාම්ප්‍රදායික පැළෑටි වෛරස් විද්‍යා අංශය

- පැපොල් මුදු පුල්ලි වෛරස් රෝගය පාලනය කිරීමට විභවයක් ඇති ශාක වර්ධනය යාමනය කරන බැක්ටීරියා වෙන් කර හඳුනා ගැනීම.
- පැපොල් මුදු පුල්ලි රෝග RIPA තාක්ෂණය මගින් එම ස්ථානයේදීම පරික්ෂා කර බැලීම.
- පැපොල් මුදු පුල්ලි වෛරසය සහ අන්නාසි පිටි මකුණු මැලවීම හඳුනා ගැනීම සඳහා බහුක්ලෝනීය ප්‍රතිමස්තු නිපදවීම.
- වෛරස් ආසාදනය වූ සහ වෛරස් ආසාදනය නොවූ පත්‍ර පටක කල් තබා ගැනීම සඳහා අධිශිතකරණ තාක්ෂණය යොදා ගැනීම.
- කෙසෙල් වඳ පිදීම සහ පැපොල් ෆයිටොප්ලාස්මා රෝගය හඳුනා ගැනීම සඳහා නිපදවන ලද දේශීය ප්‍රතිමස්තු සඳහා වූ ක්‍රමවේදය දියුණු කිරීම.
- පොල් කොළ මැලවීමේ රෝගය හඳුනා ගැනීමට දේශීයව නිපදවන ලද ප්‍රතිමස්තු භාවිතයෙන් අනෙකුත් කෘෂිකාර්මික බෝගවල

ෆයිටොප්ලාස්මා රෝග හඳුනා ගැනීම.

- ක්ෂුද්‍ර ප්‍රචාරණයෙන් නිපදවන ලද ජම්නාරංවල සිට්‍රස් ට්‍රිස්ටෙසා වෛරසය සහ සිට්‍රස් ග්‍රීනින් බැක්ටීරියාව මස්තු තාක්ෂණ ක්‍රම මගින් හඳුනා ගැනීම.
- දිනපතා සිදු කරන වෛරස් හඳුනා ගැනීමේ වැඩසටහන.

## අණුක වෛරස් විද්‍යාව

- සමීක්ෂණයක් මගින් අර්තාපල් වගා කරන ප්‍රදේශවල අර්තාපල් වෛරසය (PVY) පාලනය කිරීම උදෙසා වැඩි දියුණු කළ RT-PCR ක්‍රමවේදය උපයෝගී කර ගැනීම.
- RT-PCR මගින් විශේෂිත ප්‍රයිමර්ස් උපයෝගී කර ගනිමින් අර්තාපල් වගාවේ අර්තාපල් කොළ හකුළුවන වෛරසය (PLRV) සහ PVX හඳුනා ගැනීම.
- පැපොල් වල පරපෝෂිත රෝග හඳුනා ගැනීම සහ හඳුනා ගැනීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම.
- PCR මගින් දැනටමත් හඳුනාගත් වෛරස පරීක්ෂා කිරීම සහ ජාන අනුපිළිවෙළ තහවුරු කිරීම.
- ද්වියංගී (duplex) ක්‍රමවේදය මගින් කෙසෙල් වෛරසය හඳුනා ගැනීම.
- ද්වියංගී ක්‍රමවේදය මගින් අර්තාපල් වෛරසය හඳුනා ගැනීම.
- PRC ක්‍රමවේදය මගින් වෛරස් දර්ශක අනුපිළිවෙල හඳුනා ගැනීම සහ පරීක්ෂණ වාර්තා එකතු කිරීම.

## වෛරස් වසංගත විද්‍යා අංශය

- විවිධ ක්ෂුද්‍ර පෝෂක කොළ මතට යෙදීම තුළින් පැපොල් මුදු පුල්ලි වෛරසයෙහි රෝග ලක්ෂණ යටපත් කිරීම උදෙසා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම.
- MS 100 පැපොල් ප්‍රභේදයෙහි වෛරස් ප්‍රතිරෝධීතාවය ඇගයීම.
- මුං බෝගයට වැළඳෙන වෛරස් රෝගය වැළඳිය හැකි වෙනත් ධාරක ශාක හඳුනා ගැනීම.
- මඤ්ඤොක්කා වගාවට වැළඳෙන වෛරස් රෝග පිළිබඳව පරීක්ෂා කිරීම හා වෛරස් රෝග වලින් තොර මූලික වගාවන් පවත්වාගන යාම.
- කුඩා හා මධ්‍යම පරිමාණ වගාකරුවන් හට ස්වකීය ක්ෂෙත්‍රයන්හි වෛරස් ආක්‍රමණය පාලනය උදෙසා උපදේශක සේවාවන් පවත්වාගෙන යාම.
- මඤ්ඤොක්කා විචිත්‍ර වෛරසය කළමනාකරණය කිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමින් කළ පරීක්ෂා කිරීම තුළින් පිළිවෙත් මාලාවන් වැඩිදියුණු කිරීම.
- වෛරස් රෝග පතුරවන්නා වූ කුඩිත්තන්,සුදු මැසසන් පැතිරීම සහ රෝග ව්‍යාප්තිය උදෙසා ඔවුන්ගේ බලපෑම ඇගයීම.
- වෛරස් වාහක කෘමි සතුන්ගේ ගහණය අධ්‍යනය කිරීම.
- වෛරස් වාහක ධාරක ශාක පිළිබඳව ගවේශණය සහ එකතු කිරීම.
- නළ තුලට රසායන ද්‍රව්‍ය විදීම මගින් කෘමි පළිබෝධ පාලනය කිරීම පිළිබඳව පරීක්ෂාවට ලක් කිරීම.
- අන්නාසි වගාව මගින් මදුරුවන් ව්‍යාප්ත වීම පිළිබඳ අධ්‍යනය කිරීම සහ සුදුසු පාලන ක්‍රම නිර්දේශ කිරීම.

## වෙනත් ව්‍යාධිජනක අංශය

- යෝග්‍ය රසායන ද්‍රව්‍ය ශාකයට විදීම මගින් බහුවාර්ෂික ශාකවල රෝග පාලනය පරීක්ෂා කිරීම.
- කෙසෙල් කොළ සහ පසෙහි දක්නට ලැබෙන රෝග පාලනය උදෙසා පිළිවෙත් මාලාවන් වැඩිදියුණු කිරීම.

- ව්‍යාධිජනක පරපෝෂිතයන් හඳුනා ගැනීම සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම.

## පටක රෝපණ අංශය

- පටක රෝපණය තුළින් පැපොල් පැළ සැකසීම උදෙසා ක්‍රමවේදයන් සැකසීම.
- පත්‍රවල පටක රෝපණය කිරීම තුළින් MG-3 අන්නාසි සඳහා කඩිනම් ප්‍රචාරණ ක්‍රමවේදය.
- දොඩම් හා ජමනාරං වල නිර්දේශිත ප්‍රභේදයන් සඳහා නව ක්‍රමවේදයන් වන අර්ධ බද්ධ ක්‍රමයන් තුළින් පැළ නිෂ්පාදනය කිරීම.
- තෝරා ගන්නා ලද ඇන්තූරියම් ප්‍රභේද කීපයක් පත්‍ර රෝපණය හා ක්ෂුද්‍ර ප්‍රචාරණය තුළින් ගුණනය කිරීම.
- රෝග වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා ක්ෂේත්‍ර ඇගයීම. (නිෂ්පාදන ඉලක්ක - කෙසෙල් 60,000 හා අන්නාසි 110,000)

## ශාක අභිජනනය

- ක්ෂේත්‍ර මට්ටමින් හා පරීක්ෂණාගාර තත්වයන් යටතේ මිරිස් (capsicum annuum L) සහ අනෙකුත් මාළු මිරිස් (Capsicum spp.) විශේෂවල වෛරස් සහ වෛරස් වැනි අනෙකුත් රෝග හඳුනා ගැනීම.
- දැනට පවතින මාළු මිරිස් විශේෂ වල (Cupsicum spp.) ජනකප්ලාස්ම/ වගා ප්‍රභේද වෛරස් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ වෛරස් වලට ප්‍රතිරෝධී හෝ ඔරොත්තු දෙන ආර වරණය කිරීම.
- මාළු මිරිස් විශේෂ (C. annuum, C. chinense සහ C. frutescens) අතර අන්තරාභිජනන හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම සහ එමගින් වෛරස් වලට ඔරොත්තු දෙන / ප්‍රතිරෝධී ලක්ෂණ වගා ප්‍රභේද වලට සහ වගා දර්ශ වලට එක් කිරීම.
- මහඉලුප්පල්ලම, ක්ෂේත්‍ර පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සමඟ එක්ව මිරිස් පත්‍ර සිහින් වීමේ රෝගය පිළිබඳව පරීක්ෂා කිරීම.

## තාක්ෂණ හුවමාරු අංශය

- ශාක වෛරස් රෝග පිළිබඳව දැනුවත් කිරීම සඳහා ගොවීන්, ගොවි සංවිධාන, කෘෂිකාර්මික ව්‍යාප්ති නිළධරීන්, පාසල්සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් හා වෙනත් සංවිධාන සඳහා පහත සඳහන් ආකාරයට දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් 36ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.
- ගොවි සායන 10 ක් පැවැත් වීම.
- වගා සහ ගෙවතු පරීක්ෂා කිරීම උදෙසා ක්ෂේත්‍ර චාරිකා 150 ක් පැවැත් වීම.
- මධ්‍යස්ථානයට පැමිණි ගොවීන්ට පළිබෝධ සහ රෝග පිළිබඳ ගැටළු 250ක් පමණ නිරාකරණය කරදීම.
- පටක රෝපිත කෙසෙල් වගා 5ක් නිරීක්ෂණය කිරීම.
- පුවත් පත් ලිපි 12 ක් මුද්‍රණය.
- නාගරික කෘෂි කර්මාන්තය පිළිබඳ ආදර්ශයක් සහ ගෙවතු වගා ආදර්ශයන් සැකසීම.
- සිසුන් උදෙසා (සංරක්ෂිත ගෘහ ආදර්ශ නිදර්ශනය) විශේෂිත වැඩසටහන.
- පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයෙහි කෙරෙන එළවළු වගාව ප්‍රවර්ධනය (අක්කර 1.5 )
- ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් 2 ක් සිදු කිරීම.
- ප්‍රදර්ශන ඒකකය නඩත්තු කිරීම.
- දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයෙහි කෘෂි කාර්මික වැඩසටහන.

- ගොවින්ට සහ වගාකරුවන්ට ස්වකීය ගොවි ගැටළු පිළිබඳව දුරකථනය මගින් උපදේශාත්මක සේවාවන් ලබාදීම.

## කාර්ය මණ්ඩල

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 05 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 07 |
| පර්යේෂණ සහකාර | 04 |
| කෘෂිකර්ම උපදේශක | 09 |
| රාජ්‍ය කළමනාකරණ සේවය | 04 |
| ගබඩාකරු | 01 |
| රියදුරු | 02 |
| කම්කරු (ස්ථිර) | 03 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 12 |
| කම්කරු (ව්‍යාපෘති) | 02 |
| මුරකරු | 02 |
| **එකතුව** | **53** |

# 1.4. වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - බතලගොඩ

වත්මන්හි සහල් නිෂ්පාදනය ස්වයං පෝෂිත තත්ත්වයට පත්ව ඇති අතර ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස වාර්ෂික ඵලදායිතා ස්ථායිතාව පවත්වා ගෙන යාම අනිවාර්යයෙන්ම වැදගත් වේ. පවතින අහිතකර කාලගුණික තත්ත්වයන් සහ ගෝලීය උණුසුම්වීම හේතුවෙන් වර්ෂාපතන රටාවේ සිදුවන නිරන්තර විපර්යාසයන් සහල් ඵලදායිතා ස්ථායිතාව පවත්වා ගෙන යාමට එරෙහිව පවත්නා ප්‍රධාන බාධාවන් වේ. එබැවින්, ඉහළ අස්වනු ගෙන දෙන සහ වී වගා කෙරෙන විවිධ පරිසර පද්ධතිවලට අනුවර්තනය විය හැකි වී ප්‍රභේද බිහි කිරීමට වී අභිජනන වැඩසටහන ඉලක්ක කර ඇත.

**වගු අංක 1.4.1 : වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම % |
|---|---|---|---|
| මූලධන | 10,505,691 | 7,452,582 | 71 |
| පුනරාවර්තන | 32,604,152 | 29,348,028 | 90 |
| විශේෂ ව්‍යාපෘති | 22,181,558 | 5,043,606 | 23 |
| <u>විදේශ ව්‍යාපෘති</u> | | | |
| වල් පැළෑටි විද්‍යාව (IRRI) | 3,943,513 | 705,247 | 18 |
| ග්‍රීන් සුපර් රයිස් | 1,983,671 | 1,817,956 | 92 |
| MET වැඩසටහන | 1,023,670 | 436,027 | 43 |
| <u>දේශීය ව්‍යාපෘති</u> | | | |
| පහතරට තෙත් කලාප ව්‍යාපෘතිය | 5,000,000 | 1,948,376 | 39 |
| ගොවිපළ සංවර්ධනය | 9,640,000 | 8,498,469 | 88 |
| දෙමුහුම් බීජ නිෂ්පාදනය | 2,000,000 | 1,555,036 | 78 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (අජෛව බලපෑම) | 2,475,000 | 1,668,061 | 67 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (පොහොර භාවිතය) | 2,675,000 | 2,201,146 | 82 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (වල් වී) | 1,874,650 | 1,672,454 | 89 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (ජල භාවිතය) | 1,975,000 | 878,451 | 44 |
| **එකතුව** | **97,881,905** | **63,225,444** | **65** |

## වී ප්‍රභේදීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන

වී ප්‍රභේදීය වැඩි දියුණු කිරීමේ වැඩසටහනේ අවසන් ඉලක්කය වනුයේ පාරිභෝගිකයින්ට දැරිය හැකි මිළක් සහිතක කරමින් වී ගොවියාගේ ආදායම ඉහළ නැංවීමයි. වී වගා කෙරෙන ප්‍රභේද වල ජානමය අස්වනු විභවය ඉහළ නැංවීම මගින් ජාතික සාමාන්‍ය වී අස්වැන්න ඉහළ නැංවීම එක් ක්‍රමයකි. තවද, අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව වී ප්‍රභේද තුළ ඉහළ නැංවීම මගින් ගොවි අස්වැන්න සහ ආන්තික කුඹුරු ඉඩම් වලින් සාක්ෂාත් කර ගත හැකි අස්වැන්න අතර පවතින පරතරය ඉවත් කළ හැකිය. ජානමය අස්වනු විභවය ඉහළ නැංවීමෙන් පරිසර දූෂණය පහත දමන අතරම සම්පත් භාවිත කාර්යක්ෂමතාවයද ඉහළ නංවනු ඇත.

වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ අභිජනන වැඩසටහන, නිෂ්පාදන යෙදවුම් සහ පරිසර දූෂණය අවම කිරීම සඳහා පළිබෝධ සහ රෝග කෙරෙහි ජානමය ප්‍රතිරෝධිතාව ඉහළ නැංවීම කෙරෙහි කේන්ද්‍රගත කර ඇත. ලවණතාවය, යකඩ විෂවීම සහ ජලයෙන් යටවීමට එරෙහිව ඔරොත්තු දීමේ ලක්ෂණ බිහි කිරීම කෙරෙහි සියළුම වී අභිජනන වැඩසටහන් වලින් අවධානය යොමු කෙරේ. 2012 වසරේදී, බොහෝ ජෛව සාධක වලට ප්‍රතිරෝධී පුළුල් ජානමය පදනමකින් යුත් වී ප්‍රභේද සහ උසස් ආර බිහි කිරීමෙන් ප්‍රමාණවත් ජයග්‍රහණයක් අත්පත් කර ගෙන ඇති අතර මෙම පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මෙන්ම එහි සහායක මධ්‍යස්ථාන මගින් සාම්ප්‍රදායික සහ දෙමුහුම් දිරිය අභිජනනය හරහා වී ප්‍රභේද වැඩි දියුණු කිරීමේ කාර්යයන් අඛණ්ඩවම සිදු කරන ලදි.

## නව නිර්දේශිත වී ප්‍රභේද

Bw 367, Ld 368 සහ Bg 369 යන නව වී ප්‍රභේද තුන 2012 වසරේදී ප්‍රභේද මුදා හැරීමේ කමිටුව මගින් නිර්දේශ කළ අතර ඉදිරියේදී සියළුම අවශ්‍යතාවයන් සපුරන ලද ප්‍රභේදයක් ලෙස නිර්දේශ කිරීමට පවතින යෝග්‍යතාවය සනාථ කරමින් Bg 3R නැමැත් උසස් අභිජනන ආර කොන්දේසි මත මුදා හරින ලදි.

Bw 367, මාස 3 ½ වයස් කාණ්ඩයට අයත්, හෙ.ට ටොන් 7.9ක වාර්තාගත අස්වැන්නක් ලබා දෙන සුදු සම්බා ප්‍රභේදයකි. කෙටි රවුම් ධාන්‍ය සහිත මෙම ප්‍රභේදය තෙත් කලාපයේදී දින 107ක් තුළදී පරිණත වන අතර දීප ව්‍යාප්තව සාමාන්‍ය වගාවට යොදා ගැනීමට යෝග්‍ය වේ. මෙම ප්‍රභේදය යකඩ වීෂවීමට මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාවක් දක්වන අතර දැනට වගා කෙරෙන ප්‍රධාන සම්බා ප්‍රභේදයක් වන Bg358ට වඩා ඇද වැටීමට සහ ගෙල පාළුවට වඩාත් ප්‍රතිරෝධී වේ.

තෙත් කලාපයේදී දින 105ක් තුළදී පරිණත වන රතු, කෙටි රවුම් ධාන්‍ය සහිත Ld 368 නැමැති වී ප්‍රභේදය දීප ව්‍යාප්ත වගා කිරීම සඳහා මුදා හරින ලදි. හෙ.ට ටොන් 7ක් සාක්ෂාත් කර ගත හැකි අස්වැන්නකින් යුත් මෙම ප්‍රභේදය කොළ පාළුව සහ ගෙල පාළුවට ප්‍රතිරෝධී වන අතර බැක්ටීරියා පත්‍ර අංගමාරය, ගොක් මැස්සා සහ දුඹුරු පැළ කීඩැවාට මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවයෙන් යුතුය. ඇද වැටීම බෙහෙවින් අඩු මෙම ප්‍රභේදයේ ධාන්‍ය අවපැහැවීමක්ද සිදු නොවේ.

Bg 369,මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් සුදු එලාවරණයක් සහිත ප්‍රභේදයකි. මෙම ප්‍රභේදයේ ධාන්‍ය දිගු හැඩයක් ගන්නා අතර වියළි කලාපයේදී දින 104ක් තුළදී පරිණත වේ. ලවණතා තත්ත්වයන් යටතේ හෙ.1කට ටොන් 7.0ක වාර්තාගත අස්වැන්නකින් යුත් මෙම ප්‍රභේදය

ලවණතාව සහිත ප්‍රදේශවල වගා කිරීම සඳහා නිර්දේශිතය.

මාස 3 ½ වයස් කාණ්ඩයට අයත් කෙටි රවුම් ධාන්‍ය සහිත ප්‍රභේදයක් වන Bg 3R වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් දෙමුහුම්කරණය සහ වරණය හරහා දේශීයව බිහි කරන ලද ප්‍රභේදයකි. දින 95කින් පරිණත වන මෙම ප්‍රභේදයේ සාක්ෂාත් කර ගත හැකි අස්වැන්න හෙ.ට ටොන් 07ක් වන අතර ප්‍රධාන පළිබෝධ සහ රෝග වලට මෙන්ම (වී ගොක් මැස්සා - ප්‍රතිරෝධී/මධ්‍යස්ථ ප්‍රතිරෝධී, දුඹුරු පැළ කිඩැවා, ප්‍රතිරෝධී/මධ්‍යස්ථ වශයෙන් පාත්‍රී, වී කොළ පාළුව - මධ්‍යස්ථ ප්‍රතිරෝධී) ඇද වැටීමට ප්‍රතිරෝධී වේ.

## වී අභිජනන වැඩසටහන

### මාස 4 – 4 ½ වයස් පන්තිය

ශ්‍රී ලංකාවේ සමස්ත වාර්ෂික වී වගා වපසරියෙන් 8%ක වගා කරනුයේ මෙම වයස් පන්තියට අයත් වී ප්‍රභේදයන්ය. මෙම අභිජනන වැඩසටහන වැඩිදියුණු කරන ලද ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ සහ (අනුභව කිරීමේදී සහ පිසීමේදී) පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී ලක්ෂණ එක් කරමින් අස්වැන්න ඉහළ නැංවීම කෙරෙහි කේන්ද්‍රගත වී ඇත.

2011/12 මහ සහ 2012 යල කන්න වලදී ධාන්‍ය ගුණාත්මය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව මුහුම් 16ක් සිදු කරන ලදි. ඉන් මුහුම් 08ක් නියඟයට ඔරොත්තු දීම සඳහාද, මුහුම් 15ක් අස්වැන්න ඉහළ නැංවීම සඳහාද, මුහුම් 02ක් ගොක් මැස්සාට ප්‍රතිරෝධී වීම සඳහාද එක් මුහුමක් බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධී වීම සඳහාද සිදු කෙරිණි. කන්න දෙකේදීම $F_1$ගහන 42ක් ස්ථාපිත කළ අතර ඉන් ගහන 23ක් වරණය කර ගන්නා ලදුව සෙසු ගහන සියල්ල ප්‍රධාන පරමාර්ථයන්ගෙන් වෙනස් වූ බැවින් ඉවත් කෙරිණි. $F_2$ පරම්පරාවේ $F_4$ පරම්පරාව දක්වා බල්ක් ගහන 51ක් ස්ථාපිත කිරීමත් ඉන් ගහන 31ක් වරණය කිරීමත් සිදු කෙරුණු අතර $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට වැඩි දියුණු කරන ලද ගහන 44ක් කන්න දෙක තුළදී ක්ෂේත්‍රයේ ස්ථාපිත කර මුහුම් 40ක් වරණය කර ගැනිණි. කන්න දෙකේදී Bg 379-2 සම්මත ප්‍රභේදය සමඟ උසස් ආර 18ක් ප්‍රධාන පළිබෝධ සහ රෝග, ධාන්‍ය අස්වැන්න සහ ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් අස්වනු අත්හදා බැලීම් වලදී ඇගයීමත් 2012 වසරේදී සිදු කරන ලද ප්‍රධාන අස්වනු අත්හදා බැලීමෙන් Bg 09 – 606 සහ Bg 08- 301 යන ආර දෙක ඊළඟ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහනට නම් කිරීම සඳහා වරණය කර ගැනීමත් සිදු කෙරිණි. Bg 08 – 1909 සහ Bg 10 – 551 යන ආර ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහනින් පරීක්ෂාවට ලක් කෙරුණු අතර දෙවන කන්නය සඳහා 2013 වසරේදී පරීක්ෂා කරනු ඇත. ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනින් වරණය කර ගන්නා ලද උසස් අස්වනු සහිත Bg 06 – 1350 සහ Bg 06 – 997 නැමැති වැඩිදියුණු කරන ලද ආර දෙක පරීක්ෂාවට ලක් කර මහා පරිමාණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදි.

## වී අභිජනන වැඩසටහන

### මාස 3 ½ වයස් පන්තිය

ශ්‍රී ලංකාවේ සමස්ත වී වගා වපසරියෙන් 63% කම වගා කරනුයේ මාස 3 ½ වයස් පන්තියේ වී ප්‍රභේදයන් වන අතර එම වී ප්‍රභේද වල අස්වනු ගෙන දීමේ හැකියාව මාස 4 වයස් පන්තියේ වී ප්‍රභේද ගෙන දෙන අස්වැන්නට සමාන හෝ වැඩි වේ. ශ්‍රී ලංකාවේ වී වගා කෙරෙන බොහෝ පරිසර පද්ධති වලට අනුවර්තනය කර ගත හැකි බැවින් මෙම වයස් පංතිය ගොවීන් අතර ජනප්‍රියව පවතී. වී ප්‍රභේදීය වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ පරමාර්ථයන්

වනුයේ ඉහළ අස්වනු ගෙන දෙන, පිළිගත හැකි ගුණාත්මයෙන් යුත් ධාන්‍ය සහිත, ප්‍රධාන අහිතකර ජෛව තත්ත්වයන්ට ප්‍රතිරෝධී සහ අහිතකර අජෛව තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාවැති මාස 3 ½වී ප්‍රභේද බිහි කිරීමයි.

2012 වසරේදී මුහුම් 25ක් සිදු කළ අතර $F_1$පරම්පාරාවෙන් මුහුම් 7ක් ස්ථාපිත කෙරිණි. IR 07A127, BW - 04 - 992, BW - 09 - 983, At - 08 - 593, සීරන්ග සම්බා, ජස්මින් රයිස්, Bg 360 සහ H 4 යන මාපියන් යොදා ගැනිණි. පූර්ව කන්න වලින් ගෙනන ලද කලින් වියුක්ත වන ගහන මගින් $F_2$ පරම්පරා 18ක්, $F_3$ පරම්පරා 11ක්, $F_4$ පරම්පරා 8ක් හඳුනා ගැනිණි. මුහුම් 21කින් වැඩිදියුණු කළ පරම්පරාව සඳහා 382ක ප්‍රජනිත වරණය කර ගන්නා ලදි. පවතින වී ප්‍රභේද වලින් බොහොමයක් මුහුම් සිදු කරන ලද්දේ රෝග වලට ප්‍රතිරෝධී වීම සඳහා නව වී පැළැටි නිර්මිතයක් ඉලක්ක කර ගනිමිනි.

මූලික අස්වනු අත්හදා බැලීම් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් වලින් උසස් ආර 16ක් තෝරා ගන්නා ලදුව සම්මත ප්‍රභේද ලෙස ගත්Bg 357 සහ Bg 358 සමඟ අස්වනු විභවය, පළිබෝධ සහ රෝග වලට දක්වන ප්‍රතිරෝධීතාව සහ ධාන්‍ය ගුණාත්මය සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරිණි. Bg 10 - 1399 (Ld 12 - 38 - 1/Bg 358), Bg 08 - 1258 (At 307/IR 64) සහ Bg 10 - 1407 (Bg 1420/ IR 64) ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහනට තෝරා ගත් ආර වේ. ඉහළ අනුවර්තන හැකියාවකින් යුත් බලාපොරොත්තු තැබිය හැකි Bg - 08 - 2398 (Ld 12 - 38 - 1/ Bg 360) ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනින් මහා පරිමාණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනට නම් කරන ලදි. අත්හදා බැලීමේ කටයුතු සඳහා ජානමය වශයෙන් පාරිශුද්ධ ගුණාත්මක බීජ සහතික කිරීම සඳහාBg-2398, Bg - 3171, Bg 10 - 1407, Bg 10 - 1399, Bg - 10 - 1258 සහ Bg - 2236හි බීජ ගුණනය කිරීම අඛණ්ඩවම සිදු කෙරිණි.

2012 යල කන්නයේදී වී පිළිබඳ ජානමය ඇගයීම සඳහා අන්තර්ජාතික ජාලය - පහත රට නිරීක්ෂණ තවාන් මොඩියුලය - II (මැද වයස් කණ්ඩායම) වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ස්ථාපිත කෙරිණි. සම්මත ප්‍රභේදය ලෙස Bg 90 - 2 පරීක්ෂණ ප්‍රභේදය සමඟ ප්‍රවේශ 64ක් පරීක්ෂාවට ලක් කෙරිණි. බලාපොරොත්තු තැබිය හැකි ආර හඳුනා ගැනුණු අතර මාපියන් ලෙස යොදා ගැනීම සඳහා මාස 04 අභිජනන වැඩසටහනට යොමු කෙරිණි. බලාපොරොත්තු තැබිය හැකි ආරක් වන Bg3R (IR 555178/9 - 3r/ IR 65515 - 47 - 2 - 1 - 98/ IR 6551 - 47- 2 - 1 - 91): මහා පරිමාණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනින් පරීක්ෂා කරන ලදුව නිර්දේශ කිරීම සඳහා ප්‍රභේද මුදා හැරීමේ කමිටුවට නම් කෙරිණි.

## වී අභිජනන වැඩසටහන

### මාස 3 වයස් පංතිය

වර්ෂාපෝෂිත සහ සුළු ජලසම්පාදන ක්‍රම ක්‍රියාත්මක වන ප්‍රදේශ වල වී වගාව ජල හිඟයට ලක්වන බැවින් ඉන් ජය ගැනීම සඳහා කෙටි කලකින් පරිණත වන වී ප්‍රභේද (මාස 03) බිහි කිරීම අතිශයින්ම වැදගත් වේ. වත්මන්හි මාස 03 වී ප්‍රභේද වගා කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ සමස්ත වාර්ෂික වී වගා වපසරියෙන් ආසන්න වශයෙන් 25% කි.

සාමාන්‍ය අස්වැන්න ඉහළ නැංවීම (හෙ.ට ටොන් 6.5 – 7) , ප්‍රධාන පළිබෝධ වලට (දුඹුරු පැළ කීඩෑවා සහ වී ගොක් මැස්සා) දක්වන ප්‍රතිරෝධිතාව ඉහළ නැංවීම, අහිතකර පාරිසරික තත්ත්වයන්ට (නියඟය, ලවණතාව) පුළුල් ලෙස අනුවර්තන වීමේ හැකියාව සහ ධාන්‍ය ගුණාත්මය ඉහළ නැංවීමේ අරමුණින් 2011/12 මහ සහ 2012 යල කන්න වලදී මුහුම් 44ක් සිදු කෙරිණි. IR 07A266, IR

07A262, IR 07A252, OM 2717, Bg 04 - 2236, Bg 94 - 1, Bg 300, Bg 304 සහ Bg 305 ඉහළ අස්වනු විභවය සඳහාද, දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී විම සඳහා Ptb 33ද; MR 1523 සහ Ob 2552 ගොක් මැස්සාට ප්‍රතිරෝධීතාව ඇති කිරීම සඳහාද, IRBB 60, IRBB 59 සහ IRBB 56 බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධිතාව ඇති කිරීම සඳහාද, ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් ජස්මින් රයිස්, සීරන්ග් සම්බා සහ සුවඳැල් ද දෙමුහුම්කරණ මාපියන් ලෙස යොදා ගැනිණි.

2011/12 මහ සහ 2012 යල කන්න වලදී $F_1$ ගහන 26ක් ස්ථාපිත කරන ලදුව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ගහන 15ක් වරණය කර ගන්නා ලදි. අස්වනු වර්ධනය විම පමාවීම සහ දින 90 වයස් පංතියෙන් වෙනස්වීම හේතුවෙන් $F_1$ ගහන 9ක් ඉවත් කෙරිණි. 2012 වසරේදී $F_2$ සිට $F_4$ දක්වා බල්ක් ගහන ස්ථාපිත කර ගහන 24ක් වැඩිදියුණු කළ අතර සෙසු සියල්ල පරමාර්ථ සහ වයස් පංතියෙන් විශාල වෙනස්කම් පෙන්වූ බැවින් ඉවත් කෙරිණි. 2012 වසරේදී $F_5$ පරම්පරාවේ සිට ඉදිරියට වැඩිදියුණු කරන ලද ගහන 22කින් ප්‍රජනිත 663ක් ස්ථාපිත කර ඇගයීමට ලක් කෙරිණි.

සම්මත පරීක්ෂණ ප්‍රභේදය ලෙස Bg 300 යොදා ගනිමින් උසස් ආර වල විභව අස්වැන්න ඇගයීම සඳහා සිදු කරන ලද මූලික අස්වනු අත්හදා බැලීම් වලින්, එකිනෙකට වෙනස් මුහුම් දෙකකින් (Bg 300/IR 841/ At 307 සහ දහනල (03924) /Bg 360 Bc4) උසස් ආර 4ක් (Bg 11-1051, Bg 11- 1043 සහ Bg 11 – 1119) ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් වලින්Bg 300 සම්මත පරීක්ෂණ ප්‍රභේදය හා සංසඳනාත්මකව එකිනෙකට වෙනස් මුහුම් 4කින් (IR 74052 - 72 - 1 - 3/ Bg 352/ IR 74052 - 72 - 1 - 3/Bg 2780, Bg 300/Dmuja, IR 74052 - 72 - 1 -3/ Bg 3993/Ld 12 - 38 - 1//Bw 262///Bw 262/Bg 357, IR 54751 - 2 - 34 - 10 - 6 - 2/Bg 357//IR 65482 - 4 - 136 - 2 - 2/ Bg 357) උසස් ආර දෙකක් (Bg 10 - 1166, Bg 10 - 1083, Bg 10 - 3375 සහ Bg 09 - 1871) බලාපොරොත්තු තැබිය හැකි බැව් හඳුනා ගත් අතර ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහනට යොමු කිරීම සඳහා තවදුරටත් සංශුද්ධකරණය සහ ගුණනය කිරීමට වරණය කෙරිණි. ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහනේ පරීක්ෂාවට ලක් කෙරුණු බලාපොරොත්තු තැබිය හැකි ආර 3ක් (Bg 06 – 2270, Bg 07 – 2828 සහ Bg 06 – 2112) අනුවර්තනය වීමේ හැකියාව අඩු වීම හේතුවෙන් ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනට වරණය කර නොගැනිණි.

## වී අභිජනන වැඩසටහන

### මාස 2 ½ වයස් පංතිය

පසුගිය දශක ගණනාවක සිට වර්ෂාපතනයේ වෙනස්කම් මෙන්ම නිරන්තරයෙන්ම වියළි කාලගුණික තත්ත්වයන් පැවතීම හේතුවෙන් බෝග ගණනාවක්ම අසාර්ථක විය. විශේෂයෙන්ම, ජල හිඟය නිසා යල කන්නයේදී මාස තුනේ ප්‍රභේද වගා කළ නොහැකි පරිසර පද්ධති වලට දින 80කින් පමණ පරිණත වන ඉතා කෙටි කාලීන වී ප්‍රභේද යෝග්‍ය වන බැවින් එම ප්‍රභේද ඉතා වැදගත් බවට පත්වෙමින් පවතී. එසේ නැතහොත් අවම ජල සම්පාදනයකින් වියළි කලාපයේ යල කන්නය වගා කිරීම සඳහා ඉතා කෙටි වයස් ප්‍රභේද යොදා ගත හැකිය.

එබැවින්, ධාන්‍ය අස්වනු ඉහළ නැංවීම සමඟම ප්‍රධාන පළිබෝධ වලට දුඹුරු පැළ කීඩෑවා, ගොක් මැස්සා, පැළ මැක්කා) සහ රෝග (බැක්ටීරියා පත්‍ර අංගමාරය කොළ පාළුව සඳහා ප්‍රතිරෝධී මෙන්ම වියළි තත්ත්වයන්ට ඔරොත්තු දෙන ඉතා කෙටි

වයස් ප්‍රභේද බිහි කිරීමේ පරමාර්ථයෙන් මාස 2 ½ අභිජනන වැඩසටහන වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී අඛණ්ඩවම සිදු කෙරේ. යෝග්‍ය ධාන්‍ය ගුණාත්මයෙන් යුත් කෙටි වයස් සහ නියඟයට ඔරොත්තු දෙන ලක්ෂණ වලින් සමන්විත සාම්ප්‍රදායික වී වගා ප්‍රභේද (සුදුරු සම්බා, හැටදා වී, ගොඩ හීනටි, ගොඩ වී, නියං වී) ඇතුළු එකතූන් 25ක් මාපියන් ලෙස යොදා ගැනිණි. 2012 වසරේදී මුහුම් 30ක් සිදු කළ අතර එම මුහුම් වලින් $F_1$ ගහන 17ක් ස්ථාපිත කෙරිණි. ඉන් $F_2$ ගහන 9ක් $F_3$ ගහන 3ක් ඇතුළු බල්ක් ගහන 12ක් ස්ථාපිත කරන ලදි. අස්වනු විභවය, ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ, පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී වීම පදනම්ව ප්‍රජනිත 215ක් වැඩි දියුණු කළ අතර 70ක් වරණය කර ගැණිනි. Bg250 සම්මත ප්‍රභේදය ලෙස යොදා ගනිමින් කෙටි රවුම් ධාන්‍ය සහිත (සුදු එලාවරණය සහිත ආර 3ක් රතු එලාවරණය සහිත ආර 2ක්) වරණය කරගත් වැඩිදියුණු කළ ආර ( Bg 11 - 2531, Bg 11- 2537, Bg 11 - 2519, Bg 11 – 2556, Bg 11 - 2508) පහක අස්වනු විභවය ඇගයීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීම සිදු කරන ලදි. 2011 වසරේදී සිදු කෙරුණු මූලික අස්වනු අත්හදා බැලීමෙන් වරණය කරගත් වැඩිදියුණු කළ ආර 5ක් (Bg 10 - 2891, Bg 10 - 2902, Bg 10 - 2881, Bg 10 - 2884, Bg 10 - 2913) යොදා ගනිමින් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම සිදු කෙරුණු අතර ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම, ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම සහ මහා පරිමාණ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන් සිදු කිරීමට සංශුද්ධ බීජ සැපයීම සඳහා Bg 10 – 2907 (රතු එලාවරණයක් සහ කෙටි රවුම් ධාන්‍ය සහිත) ගුණනය කිරීම අඛණ්ඩවම සිදු කෙරිණි.

## සාම්ප්‍රදායික වී ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන

2012 වසරේදී සාම්ප්‍රදායික වගා ප්‍රභේද හඳුන්වාදීම සහ වැඩිදියුණු කරන ලද ආර ඇතුළු වී එකතූන් 950ක් ස්ථාපිත කිරීම සහ වියළි බීජ නියැදි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කෙටි කාලීන ජනකප්ලාස්ම සංරක්ෂණ ඒකකයේ සංරක්ෂණය කිරීම සිදු කරන ලදි. ගොවීන්, පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන්, රජයේ නොවන ආයතන සහ උනන්දුවක් දක්වන අනෙකුත් කණ්ඩායම්හි ඉල්ලීම මත බීජ නියැදි බෙදා දෙන ලදි.

ඇද වැටීමට ප්‍රතිරෝධී සහ පිළිගත හැකි ධාන්‍ය ගුණාත්මයෙන් යුත් සාම්ප්‍රදායික වී ප්‍රභේද බිහි කිරීමේ අරමුණින් ගැමා විකිරණය යොදා ගනිමින් සාම්ප්‍රදායික වගා ප්‍රභේද වන සුදුරු සම්බා සහ සුවඳ සම්බා වෙනස් කිරීමට ලක් කෙරිණි. විකරණය කළ බල්ක් ක්‍රම තුනක් යොදා ගනිමින් තවදුරටත් වරණය කිරීම සිදු කළ අතර ආර 3ක් (SW 25 සුවඳ සම්බා, SSR 8 - සුදුරු සම්බා රතු, SSR 26 - සුදුරු සම්බා රතු) වරණය කෙරිණි. මෙම ආර 3 සඳහා 2012 වසරේදී බීජ ගුණනය කිරීම සිදු කර මාස 3 ½ වයස් පන්තියේ මූලික අස්වනු අත්හදා බැලීමෙන් SW 25 ස්ථාපිත කිරීම සඳහා වරණය කර ගන්නා ලදි.

ඔරයිසා සැටයිවා වලට (Bg 380) වන වී විශේෂයකින් (Oryza nivara) දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී ජාන හුවමාරු කිරීමේ අරමුණින් දුරස්ථ ඥාත්තීත්වයක් ඇති විශේෂ දෙමුහුම් කිරීම සිදු කරන ලදි. ඉන් ඉහළ අස්වනු විභවයක් සහ දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී ආර දෙකක් (WH 20, WH 48) වරණය කර ගන්නා ලදුව බීජ ගුණනය සඳහා ස්ථාපිත කෙරිණි.

## වරණය කෙරුණු සාම්ප්‍රදායික වී වගා ප්‍රභේද සංශුද්ධ කිරීම සහ ගුණනය කිරීම

රසය, පෝෂණීය අගය සහ ගුණාත්මය හේතුවෙන් සාම්ප්‍රදායික වගා ප්‍රභේද සඳහා වූ ඉල්ලුම ඉහළ යමින් පවතින අතර වගා කිරීමට යොදා ගැනිම සඳහා ගුණාත්මක බීජ ද්‍රව්‍ය නොමැති වීමෙන් ඒවායේ සුලභතාවට අහිතකර ලෙස බලපාන බැවින් ඉහළ ඉල්ලුමකින් යුත් සාම්ප්‍රදායික වී වගා ප්‍රභේද සංශුද්ධ කිරීම සහ ගුණනය කිරීම අවශ්‍ය විය. ඒ අනුව, 2012 වසරේදී සුදු හීනටි, කළු හීනටි, දෝස්තර හීනටි, හේරත් බණ්ඩා සහ සුවඳැල් ඇතුළු සාම්ප්‍රදායික වගා ප්‍රභේද 11ක් ගුණනය කිරීම සහ සාංශුද්ධ කිරීම සිදු කෙරිණි.

## වියළි කාලගුණයට ඔරොත්තු දීම සඳහා විවිධ වී වගා ප්‍රභේද පරීක්ෂා කර බැලීම

ඇතැම් සාම්ප්‍රදායික වී වගා ප්‍රභේද වල වියළි කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ලක්ෂණ පවතින අතර කාලගුණික විපර්යාස සම්බන්ධයෙන් ගත්විට අහිතකර කාලගුණික තත්ත්වයන් ජය ගැනීමට මෙම ලක්ෂණ ඉවහල් වන බැවින් නියඟයට ඔරොත්තු දීම සඳහා විවිධ වී වගා ප්‍රභේද සතු හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම අධ්‍යයනය සිදු කෙරිණි. කොළ හැකිලීමේ ප්‍රමාණය ඇසුරින් නියං වී, රත් ඇල්, සුවඳැල්, ගොඩ ඇල් වී, කොළ නැති වී, පොඩි නියං වී, මඩ ඇල්, මාගොඩ ඇල් සහ පච්චපෙරුමාල් ඇතුළු එකතුන් 31ක් පරීක්ෂා කර බලන ලදි.

### සුගන්ධවත් වී පිළිබඳ නිරීක්ෂණාත්මක පරීක්ෂණ (INGER)

හිතකර ධාන්‍ය ලක්ෂණ සහිත සුගන්ධවත් අභිජනන ආර හඳුනා ගැනීම සඳහා නිරීක්ෂණාත්මක පරීක්ෂණයක් සිදු කරන ලදි. At 306 සමඟ පරීක්ෂණ ප්‍රවේශ 43ක් පරීක්ෂා කළ අතර පුද්ගලයන් පස් දෙනෙකුගෙන් සමන්විත පරීක්ෂක මණ්ඩලයකින් KOH පරීක්ෂණය සිදු කර සුගන්ධවත් අභිජනන ආර 13ක් වරණය කෙරිණි.

### ජෛව තාක්ෂණය

අභිජනන ගහන ලබා ගැනීම සඳහා ජනප්‍රිය ප්‍රභේද වලට ජලයෙන් යටවීමේ තත්ත්වයට සහ ලවණතාවයට ඔරොත්තු දීමේ ලක්ෂණ එක් කිරීම සඳහා පිළි මුහුම් අභිජනන වැඩසටහන අඛණ්ඩවම සිදු කෙරිණි. රූපවිද්‍යාත්මකව සහ අණුක විද්‍යාත්මකව ඉහත ස්භාවයන් දෙකටම ඔරොත්තු දෙන පැළ හඳුනා ගන්නා ලදුව පිළි මුහුම් කිරීම සහ ස්ව පරාගනය මගින් වැඩි දියුණු කරන ලදි. ෆොස්ෆරස් ඌණතාවය කෙරෙහි වී වල පවතින ඔරොත්තු දීමේ හැකියාව සම්බන්ධයෙන් සිදු කරන අධ්‍යයනයේ මූලික පියවර ලෙස මුහුම් සංයෝග කීපයක් මගින් $F_2$ ගහන බිහි කෙරිණි. සලකුණු සහායක වරණය මගින් Bg 352 සහ Bg 359හි බැක්ටීරියා පත්‍ර අංගමාරය කෙරෙහි ප්‍රතිරෝධීතාව එක් කිරීම සඳහා මුහුම් සිදු කළ අතර අදාළ පිළි මුහුම් කටයුතු සිදු කෙරෙමින් පවතී. සුවඳැල්, ඉහිනිමිටිය, දූලාර් සහ සුදුරු සම්බා වැනි සාම්ප්‍රදායික ප්‍රභේද තුළ කුරු බව ජනිත කිරීම සඳහා සහ බීජ රෝපණ තාක්ෂණය මගින් Bg 90 - 2, Bg 94 - 1, H4, Bg 357 සහ Bg 358 වැනි ජනප්‍රිය ප්‍රභේද තුළ ලවණතාවයට සහ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ජනිත කිරීම සඳහා විකෘතිකරණය ප්‍රේරණය කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදුව එකී විකෘතිකරණය කරන ලද පැළ පුනර්වර්ධනය කෙරිණි - වඩාත් හොඳ පැළ ව්‍යුහයකින් යුත් Bg250 ප්‍රභේදයේ බීජ රෝපණය කිරීමෙන් ලබා ගත් පැළවල හිතකර විකෘති වරණය කර ගත් අතර සාම්ප්‍රදායික අභිජනන වැඩසටහන කඩිනම් කිරීමෙන් ඉන්ඩිකා වී ප්‍රභේද සඳහා පරාගධානි රෝපණයට ප්‍රශස්ත තත්ත්වයන් බිහි කරන ලදි. වන වී විශේෂ වල හිතකර ලක්ෂණ ජනප්‍රිය වී ප්‍රභේද

වලට හුවමාරු කිරීම සඳහා දුරස්ථ ඥාතිත්වයක් ඇති විශේෂ දෙමුහුම් කිරීම අඛණ්ඩවම සිදු කෙරිණි.

## දෙමුහුම් වී නිෂ්පාදන වැඩසටහන

සාම්ප්‍රදායික අභිජනන වැඩසටහනට අමතරව අස්වනු පරතරය ඉවත් කිරීම සහ අස්වනු විභවය ඉහළ නැංවීම සඳහා වී වල දෙමුහුම් දිරිය යොදා ගැනීමේ තාක්ෂණය ඉතා වැදගත් තාක්ෂණයකි. වී වල ප්‍රවේණි ලක්ෂණ සහ අභිජනනය, වී පිළිබඳ සාමාන්‍ය කළමනාකරණය සහ විශේෂිත සහභිජාත මාපියන් සහ දෙමුහුම් සංයෝග සහ නිෂ්පාදන ක්‍රියාමාර්ග සකස් කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම දෙමුහුම් පර්යේෂණ කටයුතු වලට අන්තර්ගත වේ. බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් වී ප්‍රභේද බිහි කිරීම සඳහා සහ දෙමුහුම් දිරිය පිළිබඳව පර්යේෂණ වැඩසටහන් කීපයක් වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් සිදු කෙරේ.

මෙම වැඩසටහනට සමගාමීව 2012 වසරේදී දෙමුහුම් පරික්ෂා කිරීමේ තවානේදී නව $F_1$ සංයෝග 353ක් පරීක්ෂා කරන ලදුව ඉන් 139ක් නව සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍යා ආර සහ නඩත්තු පේලි බිහි කිරීම සඳහා පිළි මුහුම් වැඩසටහනට වරණය කෙරිණි. ඊට අමතරව, මුහුම් පරික්ෂා කිරීමේ තවානේදී වැඩිදුර පරික්ෂා කිරීම සඳහා නව මාපිය ආර ලෙස සංයෝග 40ක් වරණය කර ගත් අතර මූලික අස්වනු අත්හදා බැලීමෙන් පරික්ෂා කර බැලීම සඳහා සුළු පරිමාණයෙන් $F_1$ බීජ නිෂ්පාදනය කිරීමේ අරමුණින් සශ්‍රිකත්වයෙන් ඉහළ සංයෝග යොදා ගැනිණි.

සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍යා ආර වල (ආර 50ක්) ජනක ප්ලාස්ම සහ ප්‍රතිස්ථාපිත (ආර 186ක්) ආර අඛණ්ඩවම නඩත්තු කළ අතර වරණය කෙරුණු ආර වලින් නව මුහුම් බිහි කරන ලදි. ඉහළ අස්වනු ගෙන දෙන දෙමුහුම් ප්‍රභේද වරණය කර ගැනීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීමේදී දෙමුහුම් සංයෝග 27ක් පරික්ෂාවට ලක් කෙරිණි. Bg 407H, IR 68897 A/R 160 සහ IR 78354A/R147 පිළිවෙළින් 2011/2012 මහ කන්නයේදී හෙ.ට ටොන් 6.3ක්, 5.7ක් සහ 5.9ක්ද 2012 යල කන්නයේදී හෙ.ට ටොන් 5.49ක් සහ 6.78ක් වූ ඉහළ අස්වනු ගෙන දෙන ලදි. තවද Bg CMS4A/R147 කන්න දෙකේදී ගෙන දුන් අස්වැන්න පිළිවෙළින් හෙ.ට ටොන් 5.5ක් සහ 6.6ක් විය. එබැවින්, දත්ත තහවුරු කර ගැනීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර තව දුරටත් පරික්ෂාවට ලක් කෙරිණි. බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් වල මූලික බීජ නිෂ්පාදනය කිරීම 2012 වසරේදී අඛණ්ඩවම සිදු කෙරුණු අතර ඒ අනුව Bg CMS 1A/B, Bg CMS 4A/B සහ Bg CMS 4A/SN 50 යන සංයෝග කීපය වැඩසටහනට ඇතුළත් කෙරිණි.

Bg 407 H ප්‍රභේදය ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා $F_1$ බීජ සීමිත ප්‍රමාණයක් නිපදවූ අතර පසුව ප්‍රගතිශීලී ගොවීන් අතර බීජ නිෂ්පාදන තාක්ෂණය (Bg 407 H $F_1$ බීජ - කි.ග්‍රෑ. 120ක්, මාපිය ආර HRSP 668 - කි.ග්‍රෑ. 168 සහ Bg CMS1A - කි.ග්‍රෑ. 175ක්) ව්‍යාප්ත කෙරෙනු ඇත. මෙම වැඩසටහන යටතේ මුලතිවු (කි.ග්‍රෑ.20ක්), මන්නාරම (කි.ග්‍රෑ.20ක්), වවුනියාව (කි.ග්‍රෑ.12ක්) සහ යාපනය (කි.ග්‍රෑ.2) යන ප්‍රදේශ වලට $F_1$ බීජ බෙදා දෙන ලදි.

වඩාත් ප්‍රතිස්ථාපිත ආර ලෙස යොදා ගැනීමට සුදුසු ප්‍රතිස්ථාපිත ආර වල රූප විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සඳහා ලක්ෂණීකරණය සිදු කෙරිණි. යොදා ගන්නා ශ්‍රමය අඩු කිරීමට සහ කාර්යක්ෂම ක්‍රමය හඳුනා ගැනීම සඳහා දෙමුහුම් වී සම්බන්ධයෙන් විවිධ පරාගන ක්‍රම පරික්ෂා කර බලන ලදි. මෙම අත්හදා බැලීම යටතේ අනෙකුත් පරාගන ක්‍රම වලට වඩා සාර්ථක ක්‍රමය බැව් පෙන්නුම් කරමින් දින තුනේ පරාගන ක්‍රමය මගින් සෛල

ජ්ලාස්මීය පුං වන්ද්‍යා ආර වල ඉහළ බීජ ප්‍රමාණයක් ගෙන දෙන ලදි. බිත්තර වී අවශ්‍යතාවය අවම කිරීමට (හෙ.ට කි.ග්‍රෑ. 8ක්) දෙමුහුම් වී සඳහා නව ස්ථාපිත ක්‍රමයක් ලෙස පැරෂුට් ක්‍රමය හඳුන්වා දුන් අතර සහභිජාත ලෙස හෙ.ට කි.ග්‍රෑ. 100ක් සෘජුවම වැපිරීම හා සංසඳනාත්මකව දෙමුහුම් වී වගාවේදී අඩු බීජ ප්‍රමාණයක් (හෙ.ට කි.ග්‍රෑ. 75ක්) සෘජුවම වැපිරිය හැකි බැව් අනාවරණය විය. මීට අමතරව, CMS, නඩත්තු ආර සහ ප්‍රතිස්ථාපිත ආර බිහි කෙරිණි. මෙම ආර යොදා ගනිමින් Bg 407H, Bg HR8, Bg HR10 සහ මාස 3 – 3 ½ වයස් කාණ්ඩ යටතේ නව දෙමුහුම් සංයෝග බිහි කරන ලදි.

## ධාන්‍ය ගුණාත්මක තත්ත්වය

ධාන්‍ය ගුණාත්මක අංශය මගින් සිදු කරන ලද පර්යේෂණ කටයුතු මගින් ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන ලද්දේ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනට යොමු කළ ප්‍රවේශ වල ගුණාත්මය පිළිබඳව සහ වැඩිදියුණු කරන ලද අභිජනක ද්‍රව්‍ය ඇගයීම, සාම්ප්‍රදායික සහ වැඩිදියුණු කරන ලද වී ප්‍රභේද වල පෝෂක ගුණය ඇගයීම, පසු අස්වැන්න කළමනාකරණය සහ වී ගබඩා කිරීම මෙන්ම සහල් පාදක අගය එක් කළ ආහාර නිෂ්පාදන බිහි කිරීම කෙරෙහිය.

මූලික අස්වනු අත්හදා බැලීම, ප්‍රධාන අස්වනු අත්හදා බැලීම සහ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම යටතේ වූ සියළුම ආර වල ධාන්‍ය ගුණාත්මය කැකුළු සහල් සහ තැම්බූ සහල් මගින් ඇගයූ අතර මුදා හැරීමට පෙර හිතකර ධාන්‍ය ගුණාත්මක තත්ත්වයන් පිළිබඳවද පරික්ෂා කර බලන ලදි. 2011/2012 මහ කන්නයේදී, මූලික අස්වනු අත්හදා බැලීමේ අභිජනක ආර 36ක්, ප්‍රධාන අස්වනු අත්හදා බැලීමේ අභිජනක ආර 36ක් සහ සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ අභිජනක ආර 39ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා නිර්දේශ කිරීමට පෙර ධාන්‍ය ගුණාත්මය සම්බන්ධයෙන් පරික්ෂාවට ලක් කෙරිණි.

සහල් නිවුඩ්ඩ යොදා ගනිමින් පෝෂණ අගයෙන් ඉහළ ක්ෂණික ආහාර වට්ටෝරු සකස් කිරීමේ සහ ක්ෂණික ආහාර සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා කලින් ජෙලටීනකෘත කරන ලද සහල් යොදා ගෙන ආහාර නිෂ්පාදන බිහි කිරීමේ අධ්‍යයන සිදු කෙරෙමින් පවතී.

වෙළඳපළ ප්‍රවර්ධනයේදී ඉස්මතු කර දක්වන පෝෂණ අගයන් පිළිබඳව තහවුරු කර ගැනීම පිණිස වෙළඳපළින් ලබා ගත් සාම්ප්‍රදායික වී ප්‍රභේද වල නියැදි වල ප්‍රෝටීන්, මේදය සහ ලවණ අන්තර්ගතය වැනි පෝෂණ අගයන් සම්බන්ධයෙන් විශ්ලේෂණය කරන ලදි. එම ප්‍රභේද වල පෝෂණ අගයන් පිළිබඳ කලින් කරන ලද ඇගයීම් වල දත්ත හා සමඟ සිදු කරන ලද සංසන්දනයේදී යම් යම් වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස්කම් කෙරෙහි වෙළඳපළ නියැදි දැඩි ලෙස පොලිෂ් කිරීම සහ ඒවාට විවිධ අපද්‍රව්‍ය එක් වී තිබීම ප්‍රධාන හේතු විය.

පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවට ආනයනය කෙරෙන බාස්මති සහල් සත්‍ය බාස්මතීද යන්න තහවුරු කර ගැනීම පිණිස ඒවායෙහි ගුණාත්මක ලක්ෂණ විශ්ලේෂණ කෙරිණි. මෙම වැඩසටහන යටතේ කාණ්ඩ 24කට අයත් නියැදි 82ක් පරික්ෂාවට ලක් කෙරුණු අතර එම ප්‍රතිඵල වලට අනුව සත්‍ය බාස්මතී සහල් වලට විවිධ අනුපාත වලින් සිහින් දිගු ධාන්‍ය සහිත සහල් මිශ්‍ර වී තිබුණු අතර එක් නියැදියක් හෝ සත්‍ය බාස්මතී බවට තහවුරු නොවීය.

## රෝග කළමනාකරණය

### බැක්ටීරියා පත්‍ර අංගමාරය සඳහා පරික්ෂා කර බැලීම

බැක්ටීරියා පත්‍ර අංගමාරය ශ්‍රී ලංකාවේ වී වගාවට බහුල වශයෙන් වැළදෙන බැක්ටීරියා රෝගයකි. සියළුම අස්වනු අත්හදා බැලීම් වලට සහ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමට යොදා ගත් ආර මෙම රෝගයට එරෙහිව පරික්ෂා කර බලන ලදි. 2011/2012 මහ කන්නයේදී ආර 152ක් සහ 2012 යල කනන්යේදී ආර 181ක් මේ සම්බන්ධයෙන් පරික්ෂා කෙරිණි. ඉන් 2011/2012 මහ කන්නයේදී ආර 25ක් සහ 2012 යල කන්නයේදී ආර 07ක් (Bg 11 - 2380, At 07 - 695, Bg 10 - 9028, Bg 08 - 1258, Bg 08 - 1909, Bg 7RBS 15 - 1 - 2 ) බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි.

### වී කොළ පාළුව සඳහා පරික්ෂා කර බැලීම

වී වගාවේ වී කොළ පාළුව දිලීරයක් (Magnarporthegrisea) හේතුවෙන් ඇති වන රෝගයකි. මෙම දිලීරය සැලකිය යුතු අස්වනු හානියක් සිදු කරමින් වගාවේ සෑම අදියරයකදීම සියළුම වායව කොටස් වලට හානි සිදු කරයි. මෙම රෝගයට එරෙහිව 2011/2012 මහ කන්නයේදී වැඩිදියුණු කරන ලද ප්‍රජනිත, සියළුම අස්වනු අත්හදා බැලීම්, ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමට අයත් ප්‍රවේශ 1997ක් සහ 2012 යල කන්නයේදී ප්‍රවේශ 2187ක් පරික්ෂා කර බලන ලදි.

2011/2012 මහ කන්යේදී පරික්ෂාවට ලක් කෙරුණු ප්‍රවේශ අතරින් ප්‍රවේශ 1549ක් සහ 2012 යල කන්නයේදී ප්‍රවේශ 1622ක් වී කොළ පාළුව කෙරෙහි ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි. මුහුම් කිරීම සඳහා යොදා ගන්නා ලද මාපියන් බොහොමයක්ම මෙම රෝගයට ප්‍රතිරෝධී ලක්ෂණ වලින් සමන්විත වන බැවින් ප්‍රතිරෝධී ආර සැලකිය යුතු ප්‍රමාණයක් වාර්තා විය.

### ශ්‍රී ලංකාවේ වෙළඳපළෙහි තිබෙන කැකුළු සහල්වල ඇස්පර්ජිලස් ෆ්ලේවිස් (Aspergillus Flaves) තිබෙන්නේ දැයි පරික්ෂා කර බැලීම.

ඇෆ්ලටොක්සින් යනු ඇස්පර්ජිලස් ෆ්ලේවිස් (Aspergillus flaves) සහ ඇස්පර්ජිලස් පැරසිටිකස් (Asdergillus Parasiticus) දිලීර වර්ග දෙක මගින් නිපදවනු ලබන විෂ සහිත රසායනික සංයෝගයකි. මෙම රසායනික සංයෝගය ප්‍රධාන වශයෙන්ම වී වල ගුණාත්මක තත්ත්වය කෙරෙහි බලපෑම් ඇති කරන අතර මේ හේතුවෙන් අපනයන වෙළඳපලේදී අපනයනය කෙරෙන සහල් වල ගුණාත්මක සුරක්ෂිතතාව සහ ආර්ථික හේතු මත ඇස්පර්ජිලස් ෆ්ලේවිස් (AspergillusFlaves) වර්ධනය වීම සහ ඇෆ්ලටොක්සින් නිපදවීම පාලනය කිරීම අවශ්‍යය. දේශීය වෙළඳපළේ විවිධ ප්‍රදේශ වලින් සහල් නියැදි 20ක් එක්රැස් කර ගන්න ලදුව ඇස්පර්ජිලස් විශේෂය (Aspergillus Sp.) සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයේ නියැදි 17ක් මෙම ආසාදනයට ලක් වී ඇති මුත් එම ආසාදිත නියැදි විෂ සහිත බවට සාක්ෂි නොමැති බැව් අනාවරණය කර ගන්නා ලදි. එබැවින්, නියමිත විෂ මට්ටම් ප්‍රමාණනය කිරීම පිණිස වැඩි දුර අධ්‍යයන සිදු කිරීමට අපේක්ෂිතය.

## පළිබෝධ කළමනාකරණය

### පළිබෝධ කෙරෙහි දක්වන ප්‍රතිරෝධිතාව පිළිබඳ සොයා බැලීම

2011/2012 මහ කන්නයේදී ගොක් මැස්සා සහ දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී ප්‍රභේද බිහි කිරීම පිණිස හරිතාගාර සහ ක්ෂේත්‍ර

පරීක්ෂණ සිදු කෙරුණු අතර පරීක්ෂණයට ලක් කළ ආර 1988 අතරින් පිළිවෙළින් ගොක් මැස්සාට සහ දුඹුරු පැළ කීඩෑවාට ප්‍රවේශ 1808ක් සහ 940ක් ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි. 2012 යල කන්නයේදී එම පළිබෝධ දෙක සම්බන්ධයෙන් ප්‍රවේශ 1861ක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර ඉන් ගොක් මැස්සාට සහ දුඹුරු පැළ කීඩෑවාට පිළිවෙළින් ප්‍රවේශ 806ක් සහ 1540ක් ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි.

## ජෛව විද්‍යාත්මක නිෂ්පාදන යොදා ගනිමින් පැළ මැක්කා සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම

බයෝ ඉලිසිටරයක් වන ඔලිගොචිටොසන් පැළ මැක්කා පාලනයෙහි දක්වන සාර්ථකත්වය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර තත්ත්ව වලදී පරීක්ෂා කෙරිණි. පැළ මැක්කා පාලනයෙහි විවිධ ක්‍රියාකාරීත්වයන්ගෙන් යුත් කෘමිනාශකයක් ලෙස ඔලිගොචිටොසන් යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. බීජ ප්‍රතිකර්මයක් ලෙස ඔලිගොචිටොසන් මිලියනයකට කොටස් 300ක අනුපාතයෙන් සහ එමිඩොක්ලොපිඩ් 70% WG (නිර්දේශිත අනුපාතය) යොදන ලදි. එමිඩොක්ලොපිඩ් හා සංසන්දනාත්මකව පැළ මැක්කා පාලනයෙහි ඔලිගොචිටොසන් කාර්යක්ෂම නොවන බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය.

## IL$_{1a}$ කෘෂි පාරිසරික කලාපයේ කුඹුරු වල පරපෝෂිත ගහනය

2012 යල කන්නයේදී IL$_{1a}$කෘෂි පාරිසරික කලාපයේ ස්ථාන 6කදී වී පළිබෝධකයන්ගේ පරපෝෂිතයින් හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කරන ලදුව හයිමෙනොප්ටෙරා සහ ඩිප්ටෙරා ගෝත්‍ර වලට අයත් පරපෝෂිත විශේෂ 9ක් හඳුනා ගැනිණි. ඉන් විශේෂ තුනක් (Stenobracon nicevillei, Amauromorpha accepta schoenobiiසහ charops bicolour) කහ පුරුක් පණුවා (Schirpopha gincertulas) කීට පරපෝෂිතයන් බැව් වාර්තා විය. තවදුරටත් පරපෝෂිතයින් හඳුනා ගැනීම එළඹෙන කන්නයේදීද සිදු කෙරෙනු ඇත.

## එළිය විහිදුවන උගුලට ආකර්ශනය වන ගොයම් පළිබෝධ වල ගහන ගතිකත්වය

එළිය විහිදුවන උගුල් එකතුවක් ඇසුරින් වී කෘමි පළිබෝධ වල කාලික විචල්‍යතාව පිළිබඳ අධ්‍යයනයක් බතලගොඩදී සිදු කෙරිණි. මෙම උගුල වෙත ආකර්ෂණය වන කෘමීන් පිළිබඳව දිනපතාම නිරීක්ෂණය කෙරුණු අතර දේශගුණික සාධක (උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාව සහ වාර්ෂාපතනය) සමඟ ඔවුන්ගේ ගහනයේ ඇති වන වෙනස්කම් පිළිබඳව වාර්තා සටහන් කර ගැනිණි. උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාව ඉහළ ගිය විට දුඹුරු පැළ කීඩෑවා සහ තණකොළ පෙත්තාගේ ගහන වල ඉහළ යෑමක් ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරුණු අතර වැසි වර්ධනය වීමත් සමඟ ගහන වල අඩු වීමක්ද දක්නට ලැබුණි. මීට අමතරව, උෂ්ණත්වය ඉහළ යාමත් සමඟම කඳ විදින්නා, කළු මකුණා සහ ගොයම් මකුණාගේ ගහනය පහත වැටුණි.

## ගොයමේ කෘෂි පාරිසරික පද්ධතිවල වෙසෙන ආත්‍රෝපෝඩාවන්ගේ විවිධත්වය

කාබනික සහ සාම්ප්‍රදායික වී වගාව සිදු කෙරෙන පාරිසරික පද්ධති වල වෙසෙන කෘමි සතුන් පිළිබඳව සංසන්දනාත්මකව සොයා බැලීම සඳහා 2011 - 2012 මහ කන්නයේදී වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පර්යේෂණ ක්ෂේත්‍රයේදී මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ගෝත්‍ර 19කට අයත් කෘමි විශේෂ 78ක් සහ කුල 60ක්

හඳුනා ගැනිණි. සාම්ප්‍රදායිකව වී වගාව සිදු කරන ක්ෂේත්‍ර වලට වඩා කාබනික වී වගාව සිදු කෙරෙන ක්ෂේත්‍ර වල විශේෂයන්හි ඉහළ විවිධත්වයක් පැවතුණි. ආත්‍රොපෝඩාවන්ගේ අවකාශමය ව්‍යාප්තිය අනුව ගත් කළ කාබනික ක්ෂේත්‍රයන්හි ජලජ ජීවීන් ප්‍රමාණය (81%) ඉහළ මට්ටමක පැවති අතර සාම්ප්‍රදයික ක්ෂේත්‍රයන්හි ගොඩබිම් ජීවීන් (54%) ඉහළ මට්ටමකද පැවතුණි.

## වල් පැළෑටි කළමනාකරණය

### වී වගාව කෙරෙහි වල් වී තරඟකාරීත්වය මගින් ඇතිවන බලපෑම

පොටෑසියම් පොහොරවල විවිධ මට්ටම් වලදී වල් වීවල තරඟකාරීත්වය මගින් ගොයමට ඇති කරන බලපෑම පිළිබඳ සොයා බැලීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදි. වගා කළ වී ප්‍රභේදය (Bg - 352) සහ ‘කුරුණෑගල’ වල් වී ජෛව දර්ශය පොටෑසියම් විවිධ මට්ටම් 4ක් (KO - පොටෑසියම් රහිත, K1 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත ප්‍රමාණය, K2 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ප්‍රමාණය මෙන් දෙගුණයක්, K3 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ප්‍රමාණය මෙන් තුන් ගුණයක්) යොදා ගනිමින් වර්ධනය සහ අස්වනු ගෙන දීම සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරිණි. පොටෑසියම් පොහොර යෙදූ මුත් වල් වී වල තරඟකාරීත්වය හේතුවෙන් වගා කළ ගොයමේ ප්‍රරෝහ සංඛ්‍යාව, පත්‍ර හරිතප්‍රද අන්තර්ගතය, ධජ පත්‍ර ප්‍රදේශය සහ ජෛව ස්කන්ධය සැලකිය යුතු අන්දමින් අඩු වී ඇති බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය. තවද, පැලයක වී කරල් සංඛ්‍යාව, පිරුණු ධාන්‍ය ප්‍රතිශතය අඩු වූ අතර මෙම අඩු වීම කෙරෙහි පොටෑසියම්වල විවිධ මට්ටම් මගින් සුවිශේෂී බලපෑමක් ඇති නොවිණි. තනි වගාවක් ලෙස Bg – 352 වගා කළ විට පොටෑසියම් භාවිත කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක පැවති නමුත් වල වී ආක්‍රමණ තත්ත්වය යටතේ එම භාවිත කාර්යක්ෂමතාව පහළ මට්ටමක විය.

### විවිධ නයිට්‍රජන් මට්ටම් යටතේ වගා කළ ගොයම් සහ ප්‍රධාන තෘණ විශේෂ අතර පවතින අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය

තෘණ විශේෂ නයිට්‍රජන් පොහොර කෙරෙහි ඉහළ ප්‍රතිචාර දක්වන බැවින් විවිධ නයිට්‍රජන් පොහොර මට්ටම් යටතේ (යූරියා පොහොර නොමැතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ප්‍රමාණය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ප්‍රමාණය, යූරියා 25%කින් වැඩි කර ඒ සමඟ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත ප්‍රමාණය) වගා කළ ගොයම සහ ප්‍රධාන තෘණ විශේෂ අතර පවතින අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කෙරිණි. බජිරි, ගොජරවාලු සහ අශ්ව වලිග යන තෘණ විශේෂ තුන සහ ඔරයිසා සැටයිවා (වල් වී) නයිට්‍රජන් පොහොර මට්ටම් තුනක් යටතේ නිරීක්ෂණය කෙරුණු අතර එම සියළුම මට්ටම් වලදී බජිරි වල තරඟකාරීත්වය හේතුවෙන් වී වල වියළි ද්‍රව්‍ය ජෛව ස්කන්ධය අඩු විය.

### පාංශු සාරවත් භාවය කළමනාකරණය කිරීම

ශ්‍රී ලංකාවේ වී වගා කෙරෙන වපසරියේ ව්‍යාප්තිය සීමා කිරීම සහ ඵලදායිතාවය හීන කිරීමට හේතුවන එක් ප්‍රධාන සාධකයක් වනුයේ ලවණතාවයයි. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රධාන ජල සම්පාදිත ප්‍රදේශ වල සහ වෙරළබඩ ප්‍රදේශ වල බොහෝ විට පසෙහි ලවණතාවය පවතින අතර වියළි කලාපයේ ප්‍රදේශ වල ලවණතාවය ඇති වීමට ප්‍රධාන හේතුව වනුයේ ජලාපවහනය ප්‍රමාණවත්

අයුරින් සිදු නොවීමයි. වර්ෂාපතනය ඉක්මවන වාෂ්පීකරණයක් පවතින ප්‍රදේශ වල ලවණතාව ඉතාමත් ඉහළ මට්ටමක පවතින අතර මහ වඩදිය ඇතිවන විට සෙ.මී. 45ක් - 60ක් දක්වා වූ උදම් තරංගයටද සුළු වඩදිය ඇති වන විට සෙ. මී. 10ක් - 25ක් දක්වා වූ උදම් තරංගයටද වෙරළ බඩ ප්‍රදේශ වල වී වගා කරන කුඹුරු ඉඩම් හසු වේ. වියළි කාලයේදි ලවණ ජලය මධ්‍යනය මුහුදු මට්ටම ඉක්මවා සෙ. මී 50ක් දක්වා ගොඩබිමට ගැලීම සිදු වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරයේ වී වගා කරන පස සෑම වසරකදීම ලවණීකරණය වන අතර වී වගා කිරීම දුෂ්කර කටයුත්තක් බවට පත් වේ. ලවණතාවයට ලක් වූ වෙරළබඩ ප්‍රදේශය හෙ. මිලියන 0.112ක් පමණ වන බැව් ගණන් බලා ඇත. සංතෘප්ත පසෙහි 4 ds $m^{-1}$ඉක්මවන විද්‍යුත් සන්නායකතා අගයන් මෙම ප්‍රදේශවලට දුර්ලභ දෙයක් නොවේ. මීට අමතරව, 2004 වසරේදී ඇති වූ සුනාමියෙන් හෙ. 4000ක පමණ ශ්‍රී ලංකාවේ වෙරළබඩ වී වගා කරන පස වී වගා කිරීමට නුසුදුසු ඉඩම් බවට පත් කරමින් ලවණ ජලයෙන් යටවිය. දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ඇති වන ආන්තික පාරසරික තත්ත්වයන් සහ මුහුදු ජල මට්ටම ඉහළ යෑම මගින් අනාගතයේදී වී වගා කරන තව තවත් ඉඩම් ලවණතාවයට පත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ලවණ සහිත පස ඒවායේ රසායනික සහ භෞතික ගුණයන්ගෙන් සහ ජලය අනුව පුළුල් වෙනස්කම් වලින් යුක්ත වේ. ලවණතා අන්තර්ගතය සහ ස්වභාවය, මතු පිට ස්තරයෙහි ලවණතාව පැතිර පැවතිම, පාංශු PH අගය, පසෙහි ස්වභාවය සහ අන්තර්ගතය, ජල පාලන භූ විෂමතාව සහ උෂ්ණත්වය යනාදිය මෙම වෙනස්කම් වලට අයත් වේ. එබැවින්, යම් කිසි ප්‍රදේශයක ලවණතාවය සහිත කුඹුරු ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා හඳුනා ගන්නා ප්‍රතිකර්ම තවත් ප්‍රදේශයක කුඹුරු ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොදා ගැනීම දුෂ්කර කටයුත්තකි.

ලවණතාවය සහිත පසෙහි වගා කරන වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වඩාත් හොඳම විකල්පය වනුයේ ලවණතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීම වන බැවින් මේ සම්බන්ධයෙන් අත්හදා බැලීම් 2003 වසරේදී ආරම්භ කළ අතර වී ආර 17ක් හඳුනා ගන්නා ලදි. පුත්තලම සහ පොළොන්නරුව ගොවි ක්ෂේත්‍ර වල ලවණ තත්ත්වයන් යටතේ ඉහළ අස්වනු ගෙන දුන් ( හෙ. 1කට ටොන් 7ක්) Bg 11 – 139 සහ Bg 5 -110 විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ දීප ව්‍යාප්තව පරීක්ෂාවට ලක් කිරීම සඳහා 2011 වසරේදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනට හඳුන්වා දෙන ලදි.

කන්න තුනකදි පරීක්ෂාවට ලක් කිරීමෙන් පසු, ඉහත සඳහන් කළ වී ආර ලවණතාව සහිත ප්‍රදේශවලදී ගොවි කළමනාකරණ තත්ත්ව යටතේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කළ අතර ලවණතාව සහිත ප්‍රදේශ සඳහා යෝග්‍ය Bg 11 – 139 වාණිජ බීජ නිෂ්පාදනය කිරීම සඳහා Bg 369 ලෙස 2012 වසරේදී මුදා හැරීමට නිර්දේශ කරන ලදි.

වී වගාවේදී පොස්පරස් පොහොර භාවිතය අඩු කිරීම සඳහා පොස්පරස් අඩු තත්ත්වය යටතේ වගා කළ හැකි වී ප්‍රභේද බිහි කිරීම එක් විකල්පයකි. පොස්පරස් අඩු තත්ත්වයන් යටතේ සාම්ප්‍රදායික, වැඩිදියුණු කළ සහ නව වී ප්‍රභේද ඇතුළු වී ප්‍රභේද 20ක් පරීක්ෂා කර බැලීම සඳහා 2012 වසරේදී සිදු කළ අත්හදා බැලීමේදී මුරුංගකායන්, සුදු හීනටි මාස් යන සාම්ප්‍රදායික වී ප්‍රභේද සහ වැඩිදියුණු කළ H4, H7 සහ H10 ප්‍රභේද සහ වැඩිදියුණු කළ Bg 358 නව වී ප්‍රභේදය පොස්පරස් අඩු තත්ත්වයන් සඳහා යෝග්‍ය බැව් හඳුනා ගැනිණි. ඉහත වී ප්‍රභේද පිරිමි මාපිය ප්‍රභේද ලෙස යොදා ගනිමින් මුහුම් 65ක්

සිදු කරන ලදි. 2012/13 මහ කන්නයේදී වගා කිරීම සඳහා $F_2$ බීජ ලබා ගැනීමට $F_1$ බීජ මෙම පර්යේෂණ ස්ථානයෙහි රෝපණය කරන ලදි.

ගොවි ක්ෂේත්‍ර තත්ත්ව වලදි පොටැසියම් පොහොර යෙදූ වී වගාවේ ප්‍රතිචාර විද්‍යාමාන නොවිය. වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී සිදු කළ දිගු කාලීන අත්හදා බැලීමෙන් 2012 වසරේදී තුන්වන සහ හතරවන කන්න වලදී ලද ප්‍රතිඵල මගින් කුඹුරු වලට පිදුරු යෙදීමෙන් සහ කරල් හට ගන්නා අවධියේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද පොටැසියම් ප්‍රමාණයෙන් අඩක් යෙදීමෙන් ලද ධාන්‍ය අස්වැන්න, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද පොටැසියම් සම්පූර්ණ ප්‍රමාණය මූලික අවස්ථාවේදී සහ කරල් හට ගන්නා අවස්ථාවේදී යෙදූ වගාවෙන් ලැබෙන අස්වැන්න හා සමාන අස්වැන්නක් බැව් අනාවරණය විය. හුවමාරු කළ නොහැකි පාංශු පොටැසියම් මට්ටම් පැළැටි වල අන්තර්ගත වන පොටැසියම් ප්‍රමාණය සමඟ ඉහළ සම්බන්ධතාවයක් දක්වන අතර පැළැටි වලට අවශ්‍ය පොටැසියම් ප්‍රමාණය පවත්වා ගෙන යාම සඳහා රෝපණය කර සති 5 - 6ක් ඉක්ම ගිය විට පසෙහි හුවමාරු කළ නොහැකි පොටැසියම් අන්තර්ගතය නඩත්තු කිරීම අවශ්‍ය වේ. දිගු කාලීන බලපෑම් නිර්ණය කිරීම පිණිස අධ්‍යයන සිදු කෙරිමින් පවතී.

විවිධ ක්‍රම වලට පොස්පරස් පොහොර යෙදීමෙන් ඇති වන දිගු කාලීන බලපෑම් පිළිබඳ නිරීක්ෂණය කිරීම පිණිස වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දිගු කාලීන ක්ෂේත්‍ර අත්හදා බැලිමක් සිදු කෙරේ. 2012 වසරේදී එක් රැස් කර ගත් පස්වන සහ හයවන කන්න වල නියැදි මගින් පොස්පරස් නොයෙදූ වගා වලින් සහ පොස්පරස් යෙදූ වගාවෙන් ලද අස්වැන්න අතර සැලකිය යුතු වෙනසක් දැක ගත හැකි බව අනාවරණය විය. හයවන කන්නයෙන් පසුවද කන්නයක් හැර කන්නයකදී පොස්පර යෙදීමෙන් සහ සෑම කන්නයකදීම පොස්පරස් යෙදීමෙන් ලද අස්වැන්න අතර සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය නොවීය.

වී වගාවේදී සිදු වන පොහොර නාස්තිය අවම කිරීම සඳහා සෙමෙන් මුදා හරින පොහොර හඳුන්වා දීම එක් විකල්පයකි. 2012 වසරේදී වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී, ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ නයිට්‍රජන් සහ පොටැසියම් පොහොර වල විවිධ නැනෝ සම්මිශ්‍රණ පරික්ෂා කර බලන ලදි. නයිට්‍රජන් සහ පොටැසියම් පොහොර වල නැනෝ සම්මිශ්‍රණ එක් කළ විට නයිට්‍රජන් සහ පොටැසියම් යොදන ප්‍රමාණය අඩු කර ගැනීමේ හැකියාවක් පෙන්නුම් කළ බැවින් වී නිෂ්පාදනයේදී නයිට්‍රජන් සහ පොටැසියම් ප්‍රභව ලෙස එම නැනෝ සම්මිශ්‍රණ වල යෝග්‍යතාවය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා අත්හදා බැලීම් සිදු කෙරේ.

## සමෝධානික පැළැටි පෝෂණ ක්‍රමය පිළිබඳ වැඩසටහන

වී වගාවේ පාංශු සාරවත්භාවය සහ පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සහ කාබනික නොවන පොහොර භාවිතය මෙන්ම පරිසර දූෂණය අවම කිරීමට හොඳම විකල්පය වනුයේ කාබනික සහ කාබනික නොවන පොහොර සංයෝග භාවිතා කිරීමයි. ධාන්‍ය අස්වැන්නට බලපෑමක් ඇති නොවන අයුරින් 25%කින් නයිට්‍රජන්, පොස්පරස්, පොටැසියම් යන අකාබනික පොහොර අඩු කිරීමට පවතින හැකියාව ඇගයීම සඳහා නයිට්‍රජන්, පොස්පරස් සහ පොටැසියම් පොහොර වල වත්මන් නිර්දේශිත ප්‍රමාණ වලින් 100%ක් සහ 75%ක් සමඟ 2010/11 මහ කන්නයේ සිට කන්න 4කදී හෙ. 1කට පිදුරු ටොන් 4ක් සහ කොම්පෝස්ට් ටොන් 1ක් සහ 2ක් යොදා සහ නොයොදා අත්හදා බැලීමක් සිදු කරන ලදි. කිසිදු කාබනික පොහොරක් එක්

නොකර අකාබනික පොහොර වල වත්මන් නිර්දේශිත ප්‍රමාණය 25%කින් අඩු කළ විට (හෙ. 1කට යූරියා කි.ග්‍රෑ. 265ක්, TSP කි.ග්‍රෑ. 87.5ක් සහ MOP කි.ග්‍රෑ 75ක්) ධාන්‍ය අස්වැන්න සැලකිය යුතු අන්දමින් අඩු වූ බව කන්න හතරෙන්ම ලද ප්‍රතිඵල මගින් අනාවරණය විය. හෙ. 1කට පිදුරු ටොන් 4ක් පමණක් යෙදීමෙන් අකාබනික පොහොර 25%කින් අඩු කළ නොහැකි බැව් කන්න තුනකදී ලද ප්‍රතිඵල මගින් අනාවරණය විය. කෙසේවුවද, හෙ. 1කට පිදුරු ටොන් 04ක් සහ කොම්පෝස්ට් ටොන් 1.0ක් එක් කිරීමෙන් ධාන්‍ය අස්වැන්නට බලපෑමක් ඇති නොවන අයුරින් කාබනික පොහොර නිර්දේශිත ප්‍රමාණය 25%කින් අඩු කළ හැකිය. හෙ. 1කට පිදුරු ටොන් 4.0ක් සහ කාබනික පොහොර 75%ක් යොදා සිදු කරන ප්‍රතිකර්මයට කොම්පෝස්ට් ටොන් 2ක් එක් කිරීමෙන් ධාන්‍ය අස්වැන්න වැඩි වූ නමුත් හෙ. 1 කට ටොන් 1.0ක් යෙදූ වගාවෙන් ලැබෙන ධාන්‍ය අස්වැන්නට වඩා සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කෙරිණි. හෙ. 1කට පිදුරු ටොන් 4ක් සහ කෙම්පෝස්ට් ටොන් 2ක්ද අකාබනික පොහොර 100%ක් යෙදූ වගාවෙන් ඉහළ ධාන්‍ය අස්වැන්නක් (හෙ. 1කට ටොන් 6.1ක්) වාර්තා වූ නමුත් මෙම අස්වැන්න ඉහත සඳහන් කළ කාබනික පොහොර මට්ටම් සහ 75%ක් අකාබනික පොහොර යෙදූ වගාවෙන් ලද ධාන්‍ය අස්වැන්නට වඩා සැලකිය යුතු වෙනසක් නොපෙන් විය. එබැවින්, අකාබනික පොහොර සමඟ කාබනික පොහොර (හෙ. 1කට පිදුරු ටොන් 4ක් සහ කොම්පෝස් ටොන් 1.0 – 2.0ක්) එක් කර යොදන විට අකාබනික පොහොර 25%කින් අඩු කළ හැකිය. ක්‍රමයෙන් අකාබනික පොහොර 5% සිට 25% දක්වා අඩු කරමින් අකාබනික සහ කාබනික පොහොර යොදා ගනිමින් කන්න 5කදී මහා පරිමාණයේ ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කර මෙම ප්‍රතිඵල සනාථ කර ගන්නා ලදි.

වී වගාවේ පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ අකාබනික පොහොර භාවිතය අඩු කිරීම සඳහා දේශීය මූලමණ්ඩල ක්ෂුද්‍රජීවීන් ආශ්‍රයෙන් සකස් කර ගන්නා ලද ජෛව පොහොර භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා බඳුන් වල සිදු කරන අත්හදා බැලීමක් සිදු කෙරිණි. නිර්දේශිත නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් වල (NPK) වත්මන් නිර්දේශිත ප්‍රමාණයෙන් ¾ක් හෝ 2/3 ක් සමඟ පිදුරු සහ ජෛව පොහොර හෙ.1කට ටොන් 4ක් යෙදූ විට ගෙන දුන් අස්වැන්න, අස්වනු සංරචකය සහ අනෙකුත් වර්ධන පරාමිතීන් යනාදිය NPK වල වත්මන් නිර්දේශිත මට්ටම් යෙදූ වී වගාවෙන් ලැබෙන අස්වැන්න, අස්වනු සංරචකය සහ අනෙකුත් වර්ධන පරාමිතීන් හා සමාන බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය. කාබනික පොහොර සමඟ ස්වාභාවික ජෛව පොහොර වී වගාවට යෙදීමෙන් අකාබනික පොහොර භාවිතය අඩු කර ගත හැකි බැව් මෙයින් පෙන්නුම් කෙරේ. වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ජෛව - පොහොර වලින් ඇති වන බලපෑම තක්සේරු කිරිම සඳහා එම පොහොර යොදා ගනිමින් දිගු කාලීන ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කෙරෙනු ඇත.

හෙ. 1ක කාබනික වී වගාවක් පවත්වාගෙන යන අතර පාංශු පොහොර තත්ත්වය පිළිබඳව නිර්ණය කිරීම සඳහා පස් නියැදි විශ්ලේෂණය කෙරිණි. ක්ෂේත්‍රයේ පාංශු සාරවත් භාවයේ වර්ධනයක් විද්‍යාමාන කරමින් පසෙහි PH අගය, විද්‍යුත් සන්නායකතාව, කාබනික ද්‍රව්‍ය අන්තර්ගතය, ප්‍රයෝජ්‍ය පොස්පරස් සහ හුවමාරු කළ හැකි පොටෑසියම් ප්‍රමාණයන් පිළිවෙළින් 5.0, 0.27 ds/m, 2.56%, 16mg/kg සහ ~70 mg/kg වූ අතර මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ පිදුරු, කොම්පෝස්ට්, ග්ලිරිසිඩියා, සෙස්බේනියා, වල් සූරියකාන්ත යනාදිය යෙදීමයි.

ඉදිරියේදී කාබනික වී ගොවිතැනට යොදා ගැනීම සඳහා සාම්ප්‍රදායික වී ප්‍රභේද 11ක් (සුදු හීනටි, කළු හීනටි, පච්චපෙරුමාල්, රත්ඇල්, සුවඳැල්, දොස්තර හීනටි, සුලායි, කුරුළු තුඩ) ජානමය වශයෙන් සංශුද්ධ කෙරිණි. වැඩිදියුණු කළ වී ප්‍රභේද (At 362, Bg 300) සහ සාම්ප්‍රදායික වී ප්‍රභේද (බාස්මතී, සුදු හීනටි සහ සුවඳැල්) සතු අනුවර්තනය වීමේ හැකියාව කාබනික ගොවිතැන් තත්ත්වය යටතේ පරික්ෂා කෙරිණි. ලද අස්වැන්න හෙ. 1කට ටොන් 2.9 - 4.5ක පරාසයේ පැවති අතර සාම්ප්‍රදායික වී ප්‍රභේද සහ වැඩිදියුණු කළ වී ප්‍රභේද අතර අස්වනු වෙනස හෙ. 1කට ටොන් 1.0 - 1.5ක් පමණ විය. කාබනික ගොවිතැන කෙරෙහි උනන්දුවක් දක්වන ගොවීන් අතර සාම්ප්‍රදායික වී ප්‍රභේද වල බිත්තර වී කි.ග්‍රෑ. 2 බැගින් බෙදා දුණි.

කාබනික ගොවිතැන් ක්‍රමයට වගා කරන At 362 වී ප්‍රභේදයේ ධාන්‍ය අස්වැන්න කෙරෙහි කොම්පෝස්ට් වල විවිධ මට්ටම් (හෙ. 1කට ටොන් 0.0, 2.0, 4.0, 6.0, 8.0 සහ 10.0ක්) මගින් ඇති කරන බලපෑම පිළිබඳව කන්න 2කදී පරික්ෂා කර බලන ලදි. කොම්පෝස්ට් ඉහළ මට්ටම් වලින් යෙදූ විට ධාන්‍ය අස්වැන්නද ඉහළ ගිය අතර කොටස් දෙකකින්, එනම්, මූලික අවධියේදී සහ වගාවට සති 4ක් ඉක්ම ගිය පසු කොම්පෝස්ට් යෙදීම වඩාත් ප්‍රතිඵලදායක විය. සමාන කොටස් දෙකකින් කොම්පෝස්ට් හෙ. 1කට ටොන් 10 බැගින් යෙදූ විට හෙ. 1කට ටොන් 4.4ක ඉහළ අස්වැන්නක් ගෙන දුන් අතර එම කොටස් දෙකම හෙ. 1කට ටොන් 8 බැගින් සහ කොම්පෝස්ට් කොටස් වශයෙන් නොයෙදූ වගා වලින් ලද අස්වැන්නට වඩා සැලකිය යුතු අයුරින් ඉහළ මට්ටමක විය.

2011/12 මහ කන්නයේදී සහ 2012 යල කන්නයේදී කොම්පෝස්ට් (ටොන් 30ක්) සහ කොම්පෝස්ට් ආමුකුලණ (ටොන් 2.5ක්) නිපදවා ගොවීන් අතර බෙදා දෙන ලදි. ගුණනය කිරීම සඳහා කොළ පොහොර බීජ ; සෙස්බේනියා (කි.ග්‍රෑ. 50ක්) සහ සන්හෙම්ප් (කි.ග්‍රෑ. 10ක්) නිපද වූ අතර ගොවීන්ට කොළ පොහොර හඳුන්වාදීමේ මූලික පියවරක් ලෙස සෙස්බනියා බීජ ග්‍රෑම් 50 නියැදි බෙදා දෙන ලදි. 2011/12 මහ කන්නයේදී සහ 2012 යල ක්න්නයේදී කොම්පෝස්ට් නිෂ්පාදනය, කොළ පොහොර භාවිතය සහ වී වගාවේ අනෙකුත් කාබනික ද්‍රව්‍ය පිළිබඳව 520 දෙනෙකු (ගොවීන්, සිසුන් සහ නිලධාරින්) පුහුණු කරන ලදි.

## ජල කළමනාකරණය සහ ගෝලීය තොරතුරු ක්‍රමය වරින් වර තෙත් කිරීමේ සහ වියළීමේ ක්‍රමෝපායේදී ජල සම්පාදන කාල පරතරය පිළිබඳව නිර්ණය කිරීම

පිටාර ජල තත්ත්වය යටතේ වී වගා කිරීමේදී ජලය බෙහෙවින් අපතේ යාම සිදු වන බැවින් ජලය වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා වරින් වර ජල සම්පාදනය කිරීම සහ වියළීමට තැබීමේ තාක්ෂණ ක්‍රමය හඳුන්වා දෙන ලදි. ජල සම්පාදනය කිරීමේ කාල පරතරය පාංශු වර්ගය අනුව වෙනස් වන බැවින් මෙම තාක්ෂණ ක්‍රමයෙහි සාර්ථකත්වය රඳා පවතිනුයේ තෙත් කිරීම සහ වියළෙන්නට තබන හොඳම කාල පරතරය හඳුනා ගැනීම මතය. මෙම අධ්‍යයනය කුරුණෑගල පස් ශ්‍රේණියේ සිදු කරන වී වගාවට යෝග්‍ය ජල සම්පාදන කාල පරතරය නිර්ණය කිරීම සඳහා සිදු කරන ලදි. 2012 යල කන්නයේදී Bg 359 වී ප්‍රභේදය යොදා ගනිමින් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී ක්ෂේත්‍ර අත්හදා බැලීම් ස්ථාපිත කෙරිණි. මෙම අධ්‍යයනයේදී ජල සම්පාදනය කිරීම හය ආකාරයකට, එනම්: $T_1$(සංතෘප්ත තත්ත්වයන්), $T_2$ (දින තුනක කාල පරතරය),$T_3$ (දින හතක කාලපරතරය) $T_4$ (දින 10ක කාල පරතරය), $T_5$ (දින 14ක කාල පරතරය) සහ $T_6$ (දිවා කාලයේදී වියළීමට තැබීම) මගින් සිදු කෙරිණි. පොළව මට්ටමේ සිට

සෙ.මී. 5ක් දක්වා ජලය සම්පාදනය කළ අතර සියළුම ප්‍රතිකර්ම වලදී ජලයේ අහිතකර තත්ත්වයන් මඟ හරවා ගැනීම පිණිස ජලය අත්‍යවශ්‍ය අවධියේදී සෙ.මී. 5ක් රඳවා තබා ගන්නා ලදි. (මල් හට ගැනීමට පෙර සහ උපරිම වශයෙන් මල් හට ගැනීමෙන් පසු) ජල සම්පාදනය දින දහයේ කාල පරතරයකින් යුතුව සිදු කරන විට මතු පිට පොළොව සෙ. මී. 8ක් දක්වා ගැඹුරට ජලය බසී. එබැවින්, මෙම අධ්‍යයනයට අනුව කුරුණෑගල පාංශු ශ්‍රේණිය සඳහා දින 10ක කාල පරතරයකින් යුතුව සිදු කෙරෙන ජල සම්පාදනය යෝග්‍ය වන අතර ලද අස්වනු මට්ටම හෙ. 1කට ටොන් 5.0කි.

## වර්ෂාපෝෂිත තත්ත්ව සහ අවම ජල සම්පාදන තත්ත්ව යටතේ වී ප්‍රභේද ඇගයීම

ශ්‍රී ලංකාවේ අතරමැදි කලාපය සඳහා වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ වගා කිරීමට යෝග්‍ය වී ප්‍රභේද හඳුනා ගැනීම සඳහා මෙම අත්හදා බැලීම සිදු කෙරිණි. වී ප්‍රභේද 27ක් එනම්; Bg 94 - 1, Bg 352, Bg 357, Bg 358, Bg 359, Bg 360, Bg 366, Bg 369, Bg 5 - 110, Bw 351, Bw 361, Bw 364, Bw 363, Ld 365, Ld 356, At 353, At 354, At 362 (මාස 3 ½), Bg 300, Bg 304, Bg 305, Bg 306, At 303, At 307, At 308 (මාස 3) Bg 250, CNR 24 (මාස 2 ½) ඇගයීමට ලක් කෙරිණි.

වර්ෂාපෝෂිත තත්ත්වය යටතේ වගා කළ සියළුම වී ප්‍රභේද 2012 යල කන්නයේදී පැවති දැඩි නියඟය හේතුවෙන් වියළී ගිය නමුත් හෙ. 1කට ටොන් 1.0කට අඩු අස්වැන්නක් ගෙන දෙමින් අඩු වර්ෂාපතනය යටතේ Bg 250, Bg 300, Bg 94 - 1 , Bg 369 සහ At 307 විනාශ නොවී පැවතුණි. අවම ජල සම්පාදනය යටතේ (වගා කන්නය තුළදී මාස 3 ½ප්‍රභේද සඳහා වාර 4ක් සහ මාස 3 – 2 ½ප්‍රභේද සඳහා තුන්වරක්) හෙ. 1කට ටොන් 4.4ක ඉහළම අස්වැන්නක් Bg 369 ප්‍රභේදයෙන්ද අනතුරුව Bg 94 – 1 ප්‍රභේදයෙන් (හෙ. 1කට ටොන් 3.7ක්) සහ Bg 359 (හෙ. 1කට ටොන් 3.6ක්) ප්‍රභේදයෙන් අස්වනු වාර්තා විය.Bg 306, Bg 305,Bg 300 සහ At 307 (මාස 3) හෙ. 1කට ටොන් 2.0 – 2.5ක අස්වනු ගෙන දුන් අතර Bg 250 හෙ. 1කට ටොන් 1.8ක අස්වැන්නක් වාර්තා කරන ලදි.

## ශෂ්‍ය විද්‍යාව

## ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂා කර බැලීම (NCRVT)

2011/12 මහ කන්නයේදී මාස 2 ½, 3, 3 ½ සහ මාස 4 ½න් පරිණත වන වී ආර යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන සිදු කරන ලදි. අංග සම්පූර්ණ පර්යේෂණ කළමනාකරණ ප්‍රභේද සමඟ නව වී ආර 26ක් පරීක්ෂාවට ලක් කෙරිණි.

ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන යටතේ ගොවි ක්ෂේත්‍ර වලදී තවදුරටත් පරීක්ෂා කර බැලීම සඳහා එක් එක් සුවිශේෂ ලක්ෂණ පදනම්ව පහත සඳහන් ආර වරණය කර ගැනිණි.

At 08- 593 - මාස තුනේ බාස්මති ආකාරයේ ආර - රතු ඵලාවරණයක් සහිත At 306 ට වඩා ඉහළ අස්වනු ගෙන දේ.

At 08 - 617 - මාස 3 ½ සුදු නාඩු ආර - ඉහළ අස්වනු ගෙන දේ.

At 08 - 1078 - මාස 3 ½ සුදු නාඩු ආර - At 362 ට වඩා ඉහළ අස්වනු ගෙන දේ.

Ld 8 - 6 – 7 - මාස 3 ½ රතු සම්බා ආර - Bg 358 ට වඩා ඉහළ අස්වනු ගෙන දෙන අතර රතු ඵලාවරණයකින් යුතුය.

2012 යල කන්නයේදී මාස 2 ½, 3 ½ සහ 4 ½ න් පරිණත වන පන්ති වල නව ආර 13ක් පරික්ෂාවට ලක් කෙරිණි. මාස 2 ½න් පරිණත වන පන්තියේ කිසිදු ආරක් Bg 250 සම්මත ප්‍රභේදයට වඩා වැඩි අස්වනු ගෙන නොදුණි. මාස 3 ½ න් පරිණත වන කාණ්ඩය යටතේ පරික්ෂාවට ලක් කළ Bg- 08 - 1258 ගෙන දුන් අස්වැන්න Bg 358ට සහ Bg 366ට වඩා ඉහළ අස්වැන්නකි. එමෙන්ම මාස 4 ½ න් පරිණත වන පන්තිය යටතේ වූ Bg 10 - 551 ගෙන දුන් අස්වැන්න Bg 403 සහ Bg 379 - 2 ට වඩා වැඩි අස්වැන්න ගෙන දුණි.

## ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (VAT)

At 7 - 800, At 6 -631, At 07 - 695, Bg 08 - 2398, Bg 05 - 110,Bg 11 - 139, Bw5 - 1621, Bg 7 - 997 සහ Bg 6 - 1350 යන උසස් ආර 9හි අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධයෙන් 2011/12 මහ කන්නයේදී පරික්ෂා කර බලන ලදි. පරික්ෂාවට ලක් කෙරුණු ආර අතරින් At 7 - 800 (මාස 03), Bg 07 - 997 (මාස 4 ½) සහ Bg 07 - 1350 (මාස 4 ½) ආර සතු අනුවර්තනය වීමේ හැකියාව සම්මත පරික්ෂණ ප්‍රභේදයට වඩා වැඩි අතර ඉහළ අස්වනු ගෙන දුණි. මෙම ආර මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා ඉදිරිපත් කෙරිණි. At 06 - 631 (මාස 3 ½ ආර) Bg 360ට වඩා ඉහළ අස්වනු ගෙන නොදුන් නමුත් එහි ධාන්‍ය ගුණාත්මය ඉහළ බැවින් මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමට යොමු කෙරිණි. තෙත් කලාපයේ ප්‍රචලිත නොවන Bw 364 වෙනුවට යොදා ගැනීම සඳහා එම කලාපයේදී මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා Bw 05 - 1621 (මාස 3½ ආර) යොමු කෙරිණි.

## මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (LSVAT)

At 4 - 486 (මාස 03 සුදු නාඩු), At 05 - 1382 ( මාස 03 සුදු බාස්මති ආකාර), At 6 - 650 (මාස 3 ½ රතු සම්බා), Bg 3 R (මාස 3 ½ සුදු සම්බා), Ld 3 - 6 - 12 (මාස 3 ½ සුදු සම්බා) යන නව උසස් ආර වල අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධයෙන් 2011/12 මහ කන්නයේදී ගොවි ක්ෂේත්‍ර වලදී ඇගයීමට ලක් කරන ලදි. එක් එක් ආරවල විවිධ ලක්ෂණ පිළිබඳව ගොවීන් විසින් දක්වන ලද ප්‍රතිචාර පදනම්ව ආර පහම අනුවර්තනය වීමේ හැකියාවෙන් යුත් ඒවා බවට සනාථ කෙරිණි.

## ජල සම්පාදිත පහත රට පරිසර පද්ධති සඳහා වී ආර ඇගයීම

කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ චීන අධ්‍යයන ආයතනය (CAAS) සහ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය (IRRI) මගින් වැඩි දියුණු කළ පරීක්ෂණ ප්‍රවේශ 32ක් ඇතුළු 2012 වසරේදී ලද වී ආර 32ක් (GSR - ජල සම්පාදිත පහතරට වී අස්වනු අත්හදා බැලීම ; GSR - IRLL - 2012) දේශීය පරික්ෂණ ප්‍රභේද 4ක් (Bg 300, Bg 352, Bg 366 සහ Bg 94 - 1)සමඟ පහතරට ජලසම්පාදිත තත්ත්ව සඳහා පරික්ෂාවට ලක් කෙරිණි. PSB RC18, ZHONGHUA 1 සහ IR 84678 - 25 - 5 B යන ආර ගෙන දුන් අස්වැන්න ඉහළ අස්වනු ගෙන දෙන Bg 94 - 1 දේශීය ප්‍රභේදය හා සංසන්දනය කළ හැකි අස්වනු ගෙන දුන් බැවින් වැඩිදුර පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.

## වී වගාවේ වර්ධනය, පළිබෝධ සහ රෝග කෙරෙහි ප්‍රතිරෝධිතාව සහ ධාන්‍ය අස්වැන්න සම්බන්ධයෙන් ඔලිගොවිටොසන් ඇගයීම

වි වගාවට ඔලිගොවිටොසන් යෙදීමෙන් ඇතිවන බලපෑම සහ යෙදිය යුතු යෝග්‍ය

ප්‍රමාණයන් පිළිබඳව හඳුනා ගැනීම සඳහා 2011/12 මහ කන්නයේදී සහ 2012 යල කන්නයේදී බක්මීවැව, කුරුණෑගල ($IL_3$) ප්‍රදේශ වල ගොවි ක්ෂේත්‍ර වලදී අත්හදා බැලීම් 2ක් සිදු කෙරිණි. ඔලිගොව්ටොසන් බීජ ප්‍රතිකර්මයක් ලෙස (මිලියනයකට කොටස් 150) සහ පත්‍ර මතට ඉසීමෙන් (50 600ppm) ගොවි කළමනාකරණ ක්ෂේත්‍ර තත්ත්වයේදී වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකළ බැව් 2011/12 යල කන්නයේදී ලද ප්‍රතිඵල මගින් අනාවරණය විය. 2012 යල කන්නයේදී ඔලිගොව්ටොසන් වල සාන්ද්‍රණයක් වැඩි කර බීජ ප්‍රතිකර්මයක් ලෙස (මිලියනයකට කොටස් 300ක්) සහ පත්‍ර මතට ඉසිනයක් ලෙස (මිලියනයකට කොටස් 600ක්) වී වගාවට යොදන ලදි. මෙසේ සාන්ද්‍රණය වැඩි කර එම ගොවි ක්ෂේත්‍රයේම වී වගාවට යෙදූ මුත් වගාවේ වර්ධනය, අස්වැන්න සහ පැළ මැක්කා පාලනයෙහි සැලකිය යුතු වෙනසක් ඇති නොවූ බව ප්‍රතිඵල මගින් අනාවරණය විය. එක් කන්නයකදී ප්‍රදේශ ඒකකයකට පඳුරු සහ කරල් ප්‍රමාණය ඇතැම් සාන්ද්‍රණ මගින් ඉහළ නැංවූවද වර්ධන පරාමිතීන් කෙරෙහි ඔලිගොව්ටොසන් මගින් ධනාත්මක බලපෑමක් ඇති නොකළ බව පූර්ව කන්න වලදී සිදු කළ අධ්‍යයන වල ප්‍රතිඵල මගින් අනාවරණය විය.

## පැරෂූට් තවාන්වල බීජ පැළ වර්ධනයට සහ වී වගාවේ අස්වැන්න කෙරෙහි ඔලිගොව්ටොසන් වල බලපෑම

පැරෂූට් තවාන්වල වී බීජ පැළ වල දිරිය කෙරෙහි සහ බෝග අස්වැන්න කෙරෙහි ඔලිගොව්ටෝසන් මගින් ඇති වන බලපෑම හඳුනා ගැනීම සඳහා 2012 යල කන්නයේදී බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී ක්ෂේත්‍ර අත්හදා බැලීමක් සිදු කරන ලදි. පැරෂූට් තවාන්වල බීජ ප්‍රතිකර්මයක් ලෙස (මිලියනයකට කොටස් 300ක්) සහ බඳුන් මිශ්‍රණයක් ලෙස (මිලියනයකට කොටස් 600ක්) ඔලිගොව්ටොසන් යොදන ලදි. ස්ථාපිත කිරීමෙන් පසු සති දෙකේ සිට අට දක්වා ගොඩැල්ලකට පත්‍ර සංඛ්‍යාව, පඳුරු සංඛ්‍යාව සහ බීජ පැළ උස සතිපතා මැන බලන ලදී. පැරෂූට් තවාන්වල වර්ධක අවස්ථාවේදී පත්‍ර සංඛ්‍යාව, පඳුරු සංඛ්‍යාව සහ බීජ පැළ උස සාමාන්‍ය පැරෂූට් තවානක පත්‍ර සංඛ්‍යාව, පඳුරු සංඛ්‍යාව සහ බීජ පැළ උස යනාදියට වඩා සැලකිය යුතු වෙනසක් ($P = 0.05$) නොවූ බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය. පැරෂූට් තවාන්වල බීජ පැළ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඔලිගොව්ටොසන් මගින් බලපෑමක් ඇති නොකරන බැව් විද්‍යාමාන වේ.

## වී වගාවේ රෝපණය කිරීමේදී යොදා ගන්නා සුභ මොහොත සහ කෙම් ක්‍රම පිළිබඳ නිරීක්ෂණමය අත්හදා බැලීම

නවීන වී වගාවේදී කෙම් ක්‍රම යොදා ගැනීමට තිබෙන හැකියාව හඳුනා ගැනීම සඳහා 2012 යල කන්නයේදී බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී නිරීක්ෂණ අත්හදා බැලීමක් සිදු කරන ලදි. ජ්‍යොතිෂ්‍ය විද්‍යාව අනුව සුභ වේලාවකදී වර්ධන අවධියේදී අළු, තලාගත් දුම්කොළ සහ සබන් වතුර ඉසීම සහ පරිණත වන අවධියේදී කොඩි සිටුවීම මගින් පැළවල වියළි ද්‍රව්‍ය අන්තර්ගතය 6%කින් සහ බෝග අස්වැන්න 8%කින් වර්ධනය වූ බව නිරීක්ෂණ මගින් අනාවරණය විය. එබැවින්, මෙම තාක්ෂණික ක්‍රම වල සාර්ථකත්වය සහ විද්‍යාත්මක පසුබිම පිළිබඳව හඳුනා ගැනීම සඳහා වැඩිදුර නිරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය වේ.

## අභිජනක බීජ නිෂ්පාදනය

**වගු අංක 1.4.2: 2012 වසරේදී නිපදවන ලද අභිජනක බීජ ප්‍රමාණය**

| | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | |
|---|---|---|---|
| | **2011/12** මහ | **2012** යල | එකතුව |
| <u>දින 150 – 180</u> | | | |
| Bg 3 – 5 | 41 | | 41 |
| Bg 745 | 41 | | 41 |
| Bg 38 | 41 | | 41 |
| Bg 407 | 41 | | 41 |
| <u>මාස 04</u> | | | |
| Bg 379 – 2 | 164 | 184.5 | 348.5 |
| Bg 450 | 82 | 102.5 | 184.5 |
| Bg 403 | 41 | 123 | 164 |
| Bg 454 | 41 | 20.5 | 61.5 |
| Bg 406 | 164 | 102.5 | 266.5 |
| <u>මාස 3½</u> | | | |
| Bg 94 – 1 | 164 | 164 | 328 |
| Bg 352 | 143.5 | 184.5 | 328 |
| Bg 357 | 61.5 | 82 | 143.5 |
| Bg 358 | 184.5 | 222.5 | 410 |
| Bg 359 | 164 | 225.2 | 389.5 |
| Bg 360 | 184.5 | 123 | 307.5 |
| Bg 366 | 246 | 328 | 574 |
| Bg 369 | | 100 | 100 |
| <u>මාස 3</u> | | | |
| Bg 300 | 143.5 | 164 | 307.5 |
| <u>දින 80</u> | | | |
| Bg 250 | 61.5 | 61.5 | 123 |
| එකතුව | **2009** | **2191** | **4200** |

## විශේෂ ව්‍යාපෘති විස්තර :

## විදේශ ව්‍යාපෘති

### බහු පාරිසරික පරීක්ෂණ ව්‍යාපෘතිය (MET)

බහු පාරිසරික පරීක්ෂණ ව්‍යාපෘතිය සඳහා ගෝලීය වී විද්‍යාල හවුල යටතේ අන්තර් ජාතික වී පර්යේෂණ ආයතනය මගින් අරමුදල් සපයනු ලබන අතර මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ අභිජනක ආර නම් කිරීම, වැඩි දියුණු කිරීම සහ ඉවත් කිරීම සඳහා සුසංගත ක්‍රියා පටිපාටියක් බිහි කිරීම මෙන්ම හවුල් රටවල් අතර ජනකප්ලාස්ම හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීමයි. පිලිපීනයේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය සමඟ එක්ව දේශීය තත්ත්ව සඳහා අනුවර්තනය වන වඩාත් හොඳම ප්‍රභේද හඳුනා ගැනීම පිණිස උසස් සහ දේශීය ප්‍රභේද ඇගයීම සඳහා පහතරට ජල සම්පාදිත වී වගාව සඳහා පළමු බහු පාරිසරික පරීක්ෂණ අත්හදා බැලීම ආරම්භ කෙරිණි. මෙම වැඩසටහන යටතේ, දේශීය තත්ත්වයන් සඳහා නව වී ආර 180ක් ඇගයීමට ලක් කළ අතර මෙම අත්හදා බැලීම සඳහා අන්තර් ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද උසස් ආර ඇතුළත් වේ. විශේෂිත වී වගා පරිසර පද්ධතියකට හෝ කීපයකට මනාව අනුවර්තනය වන වඩාත් සුදුසුම අභිජනන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා මෙම බහු පාරිසරික පරීක්ෂණ වැඩසටහන උපකාරී වේ.

### වියළි තත්ත්වයන් යටතේ සිදු කෙරෙන වී වගාව සඳහා තාක්ෂණ පිළිවෙත් මාලාව ප්‍රශස්ත කිරීම. (කෘෂිකර්ම දෙපාර්තමේන්තු - අන්තර් ජාතික වී පර්යේෂණ ආයතන වල් පැළෑටි විද්‍යා ව්‍යාපෘතිය)

මෙම ව්‍යාපෘතිය පිලිපීනයේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය සමඟ එක්ව සිදු කරන ලදි. මෙම අධ්‍යයන මාලාවේ පරමාර්ථය වනුයේ වියළි බිමට බිත්තර වී ඉසීමෙන් පසු ජලය සම්පාදනය කිරීම (IDDS) සඳහා යෝග්‍ය තාක්ෂණික මාලාවක් බිහි කිරීමයි. බීජ ඉසීමෙන් පසු ප්‍රරෝහණය වීම සඳහා පසුදින ජලය සම්පාදනය කෙරෙන අතර මේ සඳහා වූ තාක්ෂණික ක්‍රමයක් පහතින් සඳහන් වේ.

#### අ) වියළි තත්ත්වය යටතේ බීජ ඉසීමේදී පැළෑටිනාශක වලින් ඇති වන බලපෑම

Bg 357 හෙ. 1කට කි.ග්‍රෑ. 100ක අනුපාතයෙන් වියළි තත්ත්වය යටතේ (IDDS) පේළියට වැපිරීමෙන් පසු විවිධ වල්නාශක මගින් වල් පැළෑටි වල වර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව අගයන ලදි. මෙම අත්හදා බැලීමේදී පළිබෝධ සහ රෝග කළමනාකරණය කිරීම සහ පොහොර යෙදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද වගා කළමනාකරණ පිළිවෙත් යොදා ගැනිණි. ප්‍රෙටිලැක්ලෝර් ලීටරයකට ග්‍රෑම් 300 + පයිරිබෙනොක්සිම් ලීටරයකට ග්‍රෑම් 20ක් (වී වපුරා දින 8කට පසු) යෙදීමෙන් පසු MCPA ලීටරයකට ග්‍රෑම් 400ක්ද (වී වපුරා දින 20කට පසු), සයිහැලෆොප් - බ්‍යුටිල් ලීටරයකට ග්‍රෑම් 100ක් (වී වපුරා දින 8කට පසු) යෙදූ පසු MCPA ලීටරයකට ග්‍රෑම් 400ක්ද (වී වපුරා දින 20කට පසු), තයෝබෙන්කාබ් ලීටරයකට ග්‍රෑම් 400ක් + ප්‍රොපනිල් ලීටරයකට ග්‍රෑම් 200ක් (වී වපුරා දින 8කට පසු) යෙදූ පසු MCPA ලීටරයකට ග්‍රෑම් 400ක්ද (වී වපුරා දින 20කට පසු), ප්‍රොපනිල් (වී වපුරා දින 8කට පසු) යෙදූ පසු MCPA ලීටරයකට ග්‍රෑම් 400ක්ද (වී වපුරා දින 20කට පසු), බිස්පයිරිබැක් සෝඩියම් + මෙටාමිෆොප් (වී වපුරා දින 20කට පසු) යෙදීම යනාදි වශයෙන් පැළෑටි නාශක ප්‍රතිකර්ම ක්‍රම 5ක් සිදු කළ අතර පාලන ක්ෂේත්‍රයේ වල් පැළෑටි ඉවත් නොකෙරිණි. ප්‍රෙටිලැක්ලෝර් ලීටරයකට ග්‍රෑම් 300ක් + පයිරිබෙනොක්සිම් ලීටරයකට ග්‍රෑම් 20ක් (වී වපුරා දින 8කට

පසු) යෙදීමෙන් පසු MCPA ලීටරයකට ග්‍රෑම් 400ක් ( වී වපුරා දින 20කට පසු) යෙදූ විට ඉහළම අස්වැන්නක් (හෙ. 1කට ටොන් 7.04ක්) ලද නමුත් සියළුම පැළෑටි නාශකවල වල් පැළෑටි පාලන කාර්යක්ෂමතාව 80%කට වඩා වැඩි විය. එබැවින්, වියළි බිමට වී වපුරා (IDDS) සිදු කරන වී වගාව සඳහා ඉහත සඳහන් සියළුම පැළෑටිනාශක නිර්දේශ කළ හැකිය.

**ආ) ජලය රහිත එනම් වියළි ක්ෂේත්‍රයට වී වැපිරීම යටතේ වල් පැළෑටිවල තරඟකාරි හැකියාව සහ වී ප්‍රභේදවල යෝග්‍යතාව**

වියළි ක්ෂේත්‍රයට (IDDS) වී වැපිරීමේ ක්‍රමයේදී විවිධ වී ප්‍රභේද වල වර්ධනය සහ අස්වැන්න මෙන්ම වල් පැළෑටි වර්ධනය පිළිබඳව ඇගයීම සඳහා මෙම අත්හදා බැලීම සිදු කෙරිණි. හෙ. 1කට කි.ග්‍රෑ. 100ක අනුපාතයෙන් At 362, Bg 352, Ld 365, Bg 357, Bg 366 යන වී ප්‍රභේද වල බීජ පේළියට වපුරන ලදි. මෙම අත්හදා බැලීමේදී වල්පැළ ඉවත් කළ සහ ඉවත් නොකළ තත්ත්වයන් යටතේ වගා කළමනාකරණ පිළිවෙත්, පළිබෝධ සහ රෝග කළමනාකරණය සහ පොහොර භාවිතය යනාදිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව සිදු කෙරිණි. 2011/12 යල කන්නයේදී වල් පැළ රහිත තත්ත්වයේදී හෙ. 1කට ටොන් 6.38ක ඉහළම අස්වැන්න At 362 ප්‍රභේදය මගින් ගෙන දුන් අතර වල් පැළෑටි සහිත තත්ත්වයේදී හෙ. 1කට ටොන් 1.77ක ඉහළම අස්වැන්න Bg 357 මගින් ගෙන දුණි.

**ඇ) වියළි ක්ෂේත්‍රයට වී වපුරා සිදු කරන වගාවේ ප්‍රශස්ත නයිට්‍රජන් පොහොර මට්ටම් සහ කොටස්**

වියළි ක්ෂේත්‍රයට වී වපුරා සිදු කරන වී වගාවේ (IDDS) ප්‍රශස්ත නයිට්‍රජන් අනුපාතය සහ කාල පරතරය මගින් වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව අගයන ලදි.

විවිධ නයිට්‍රජන් අනුපාත පහක්, එනම්; හෙ. 1කට කි.ග්‍රෑ 0ක්, 60ක්, 90ක්, 120ක්, 150ක් යොදා Bg 357 (හෙ. 1කට බීජ අනුපාතය කි.ග්‍රෑ. 100) පේළියට වපුරන ලදී. පොහොර කළමනාකරණය හැරුණු විට වගා කළමනාකරණ පිළිවෙත්, පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනුව සිදු කෙරිණි. නයිට්‍රජන් කොටස් තුනකින් යෙදීම, එනම්; වී වපුරා දින 10කදී 33%ක්, වී වපුරා දින 28ක් ගත වූ පසු පදුරු දැමීම සක්‍රිය අවධියේදී 33%ක් සහ වී වපුරා දින 50ක් ගත් වූ විට කරල් හටගන්නා අවධියේදී 33%ක් යෙදීමේ ප්‍රතිකර්මය කොටස් 4කින් සිදු කරන ප්‍රතිකර්මයට වඩා, එනම්; වී වපුරා දින 10කදී 25%ක්, වී වපුරා දින 28කදී පදුරු දැමීම සක්‍රිය අවධියේදී 25%ක්, වී වපුරා දින 50කදී කරල් හට ගැනීමේදී 25%ක් සහ වී වපුරා දින 85කදී සහ දින 85 - 90ක් ගත වූ විට මල් පිපෙන සමයේදී 25%ක් නයිට්‍රජන් යෙදීමේ ප්‍රතිකර්මයට වඩා සාර්ථක විය. නයිට්‍රජන් කොටස් අනුපාතය වැඩි කළ විට අස්වැන්න වැඩි වූ අතර නයිට්‍රජන් නොයෙදූ විට ධාන්‍ය අස්වැන්න අඩු විය. කොටස් තුනකින් හෙ. 1කට කි.ග්‍රෑ. 150ක් යෙදූ විට ඉහළම අස්වැන්නක් (හෙ.1කට ටොන් 6.62ක්) ගෙන දුන් අතර හෙ. 1කට කි.ග්‍රෑ. 120ක්, 90ක්, 60ක් සහ 0ක් වූ විට ගෙන දුන් අස්වැන්න පිළිවෙළින් හෙ. 1කට ටොන් 6.27, 5.81ක්, 5.98ක් සහ 5.74ක් විය. ප්‍රතිඵල අනුව වියළි ක්ෂේත්‍රයට වී වපුරා සිදු කරන වගාවේදි (IDDS) හෙ. 1කට නයිට්‍රජන් පොහොර කි.ග්‍රෑ. 150ක් සහ 120ක් නිර්දේශ කළ හැකිය.

**ඇ) වියළි ක්ෂේත්‍රයට බීජ වැපිරීමේ වගා ක්‍රමය යටතේ විවිධ බීජ අනුපාත වලින් ඇති වන බලපෑම.**

වියළි ක්ෂේත්‍රයට බීජ වැපිරීමේ වගා ක්‍රමය යටතේ විවිධ බීජ අනුපාත මගින් වල් පැළෑටි සහ බෝග වර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව ඇගයීමට ලක් කෙරිණි.Bg 357 එකිනෙකට වෙනස් බීජ අනුපාත 5කින්, එනම් හෙ. 1කට කි.ග්‍රෑ. 20ක්, 40ක්, 60ක්, 40ක්, 60ක්, 80ක් සහ 100ක් ලෙස අතින් ජේලියට වපුරන ලදි. මීටර් 4 X 3.06 විශාලත්වයෙන් යුත් බිම් කොටස් වලින් භූමිය සැලසුම් කළ අතර වල් පැළෑටි රහිත සහ සහිත තත්ත්ව යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයට අනුව වගාව කළමනාකරණය කිරීමෙන් සහ පොහොර යොදා මෙම අත්හදා බැලීම සිදු කෙරිණි. හෙ. 1කට කි.ග්‍රෑ. 80ක බීජ අනුපාතය මගින් ඉහළ අස්වැන්නක් (හෙ. 1කට ටොන් 7.06ක්) ගෙන දුන් අතර හෙ. 1කට කි.ග්‍රෑ. 100, 60, 40, 20 යන අනුපාත මගින් ගෙන දුන් අස්වැන්න පිළිවෙළින් හෙ.ට ටොන් 6.84ක්, 6.84ක්, 6.55ක් සහ 5.88ක් විය. බීජ අනුපාතය අනුව වල් පැළෑටි වල තරඟකාරීත්වක් පැවති බැවින් මෙම ක්‍රමය සඳහා නිර්දේශිත බීජ අනුපාතය හෙ. 1කට කි.ග්‍රෑ. 40 - 60 වේ.

**ඉ) වියළි ක්ෂේත්‍රයට බීජ වැපිරීමේ වගාවේදී පැළෑටි නාශක පරික්ෂා කර බැලීම**

මෙම වගා ක්‍රමය යටතේ වල් පැළෑටි ඉවත් නොකළ සහ අතින් වල් ඉවත් කළ තත්ත්ව වලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් දැනට නිර්දේශ කර තිබෙන පැළෑටි නාශක යොදා ගනිමින් වල් පැළෑටි පාලනයෙහි සාර්ථකත්වය, ශාක විෂවීම, වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව නැවත අගයන ලදි. ප්‍රොපනිල් යොදා අනතුරුවMCPA, පෙන්ඩිමෙතලින් හෙ. 1කට ලීටර් 3ක් යෙදීම ( වී වපුරා දින 1 - 2 කට පසුව, ජලය නොබැඳ), ඔක්සිඩයසෝන් හෙ. 1ට ලී. 1.8ක් යෙදීම (වී වපුරා දින 1 - 2කට පසු, ජලය නොබැඳ), ඔක්සිෆ්ලුඕෆෙන් (වී වපුරා දින 1 - 2කට පසු, ජලය නොබැඳ) යෙදීම, පෙන්ඩිමෙතලින් හෙ. 1ට ලීටර් 3ක් යෙදු පසු (වී වපුරා දින 1 - 2කට පසු, ජලය නොබැඳ), ෆෙනොක්සප්‍රොප් + එතොක්සිසල්ෆ්‍යුරොන් (වී වපුරා දින 20කට පසු), යෙදීම, ඔක්සිඩයසෝන් හෙ.ට ලීටර් 1.8ක් යෙදු පසු (වී වපුරා දින 1 - 2 කට පසු, ජලය නෙබැඳ) ෆෙනොක්සප්‍රොප් + එතොක්සිසල්ෆ්‍යුරොන් යෙදීම (වී වපුරා දින 20කට පසු) පෙන්ඩිමෙතලින් හෙ. 1ට ලී. 3ක් යොදා (වී වපුරා දින 1 - 2කට පසු, ජලය නොබැඳ), පෙනොක්සුලම් යෙදීම (වී වපුරා දින 20කට පසු, ජලය නොබැඳ) ඔක්සිඩයසෝන් හෙ. 1ට ලී.1.8ක් යොදා (වී වපුරා දින 1 - 2කට පසු ජලය නොබැඳ) පෙනොක්සුලම් යෙදීම) (වී වපුරා දින 20කට පසු), ඔක්සිෆ්ලුඕෆෙන් යොදා ( වී වපුරා දින 1-2 කට පසු, ජලය නොබැඳ) පෙනෙක්සුලම් (වි වපුරා දින 20කට පසු) යෙදීම යනාදී වශයෙන් පැළෑටිනාශක පරික්ෂාවට ලක් කෙරිණි. Bg 300 හෙ. 1ට කි.ග්‍රෑ. 100ක අනුපාතයෙන් අහඹු ලෙස වපුරන ලදි. මෙම අත්හදා බැලීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරන ලද වගා කළමනාකරණ පිළිවෙත්, පළිබෝධ හා රෝග කළමනාකරණ පිළිවෙත් සහ පොහොර යෙදීම් අනුගමනය කෙරුණු අතර ඔක්සිඩයසෝන් හෙ. 1ට ලීටර් 1.8ක් යොදා (වී වපුරා දින 1 -2කට පසු, ජලය නොබැඳ) පෙනොක්සියුලම් (වී වපුරා දින 20ට පසු) යෙදු ප්‍රතිකර්මය මගින් ඉහළම අස්වැන්න (හෙ. 1ට ටොන් 4.52ක්) සහ මනා වූ වල් පැළෑටි පාලන සාර්ථකත්වයක් (80%ක්) අත්කර ගන්නා ලදි. නමුත් මෙය අතින් වල් ඉවත් කළ බිම් වලට වඩා විශේෂිත වෙනසක් නොවිණි. ඔක්සිෆ්ලුඕෆෙන් හැරුණු විට අනෙකුත්

පැළෑටිනාශක මගින් වී පැළෑටිය කෙරෙහි විෂවීමක් නොපෙන්විය.

**ජල සම්පාදිත පහතරට පරිසර පද්ධති සඳහා වී ආර ඇගයීම (ග්‍රීන් සුපර් රයිස් ව්‍යාපෘතිය)**

ඉහළ පෝෂණ ගුණයෙන් යුත් සහ අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දෙන වී ප්‍රභේද වගා කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව අන්තර් ජාතික වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් අරමුදල් සම්පාදිත ග්‍රීන් සුපර් රයිස් ව්‍යාපෘතිය යටතේ වී ආර 32ක් පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදි. කෘෂිකර්ම විද්‍යා පිළිබඳ චීන ඇකඩමිය සහ අන්තර්ජාතික වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් වැඩිදියුණු කරන ලද පරීක්ෂණ ප්‍රවේශ 32ක් ඇතුළුව 2012 වසරේදී ලද ආර දේශීය පරීක්ෂණ ප්‍රභේද 4ක් සමඟ (Bg 300,Bg 352, Bg 366 සහ Bg 94 - 1) පහතරට ජල සම්පාදිත තත්ත්වය සඳහා පරීක්ෂාවට ලක් කෙරිණි. PSB RC18, ZHONGHUA 1 සහ IR 84678 - 25 - 5 - B යන ආර මගින් දේශීය ප්‍රභේදයක් වන Bg 94 - 1 හා සංසන්දනාත්මකව ඉහළ අස්වනු ගෙන දුන් බැවින් තවදුරටත් පරීක්ෂා කර බැලීම අවශ්‍ය වේ.

**කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රම සමාකෘතිය / ඔරයිසා බෝග ආදර්ශය (APSIM/ORYZA) ඇසුරින් බෝග සමාකරණය කිරීම සහ ආදර්ශනය කිරීමේ ප්‍රවේශය**

දකුණු ආසියාවේ ආහාර සුරක්ෂිතභාවය සහ ජල සම්පත් තිරසාර අයුරින් භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ආදර්ශනය කිරීම මගින් බෝග වගා ක්‍රමයන්හි ශක්‍යතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතියට සාක් ඕස්ට්‍රේලියාව මගින් අරමුදල් සපයන ලදි. ශ්‍රී ලංකාවේ සිදු කරන ලද මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ $IL_{1a}$කෘෂි පාරිසරික කලාපයේ වාර්ෂාපෝෂිත වී වගාව සඳහා ප්‍රශස්ත වී වැපිරීමේ කාලය පිළිබඳව නිර්ණය කිරීමයි. වර්ෂාපෝෂිත පාරිසරික පද්ධතිවල වී වගාව සඳහා ජලය තීරණාත්මක සාධකයක් වන බැවින් ජල සම්පාදිත ප්‍රදේශ හා සංසදනාත්මකව (හෙ. 1ට ටොන් 5ක්) වර්ෂාපෝෂිත ප්‍රදේශ වල වී අස්වැන්න (හෙ. 1ට ටොන් 3කට වඩා අඩුය) බෙහෙවින් වෙනස් වේ.වී වපුරන කාලය අනුව අස්වැන්න තීරණය වේ. මක් නිසාද යත් පොහොර යෙදීම, වල් පැළෑටි කළමනාකරණය සහ අනෙකුත් ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් කෙරෙහි වර්ෂපතන ප්‍රමාණය සහ ව්‍යාප්තිය සමඟ සම්බන්ධතාවයක් පවතින බැවිනි. එබැවින්, APSIM / ORYZA ආදර්ශන මගින් මහ කන්නයේදී වර්ෂාපෝෂිත ක්‍රමයන් යටතේ Bg 366 (මාස 3 ½), Bg 300 (මාස 3) සහ Bg 250 (මාස 2½) වී ප්‍රභේද තුන වැපිරීම සඳහා සුදුසුම දිනයන් නිර්ණය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කළ ($IL_{1a}$කලාපයේ) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී බෝග, (කන්න 2ක), පාංශු සහ දේශගුණික දත්ත එක්රැස් කෙරිණි. එක්රැස් කරගත් දත්ත මගින් ආදර්ශය ක්‍රමාංකනය කර වලංගු බවට පත් කළ අතර දින 7ක කාල පරතරයකින් යුතුව සැප්තැම්බර් 15 වැනි දින සිට ජනවාරි 07 වැනිදා දක්වා වරින්වර දින 18කදී වී වපුරා එම ප්‍රතිඵල අනුව වී වැපිරීම සඳහා ප්‍රශස්ත දිනයන් නිර්ණය කිරීම සඳහා ආදර්ශය යොදා ගන්නා ලදි. අස්වනු පාදකව ලද සමාකරණ ප්‍රතිඵල මගින් ලංකවේ $IL_{1a}$කලාපයේ මහ කන්නයේදී Bg 366 වැපිරීම සඳහා සුදුසුම කාලය ඔක්තෝම්බර් මාසයේ පළමු සතිය බවත් (හෙ. 1කට අස්වනු සාමාන්‍යය ටොන් 2.8ක් සහ උපරිමය ටොන් 4.5ක්) Bg 300 සඳහා ඔක්තෝම්බර් දෙවන සතිය බවත් (අස්වනු සාමාන්‍යය හෙ. 1කට ටොන් 1.6ක් සහ උපරිමය ටොන් 2.4ක්) Bg 250 සඳහා ඔක්තෝම්බර් තුන්වන සතිය බවත් (අස්වනු සාමාන්‍යය හෙ. 1කට

ටොන් 0.8ක් සහ උපරිමය ටොන් 1.3ක්) තහවුරු විය.

**ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය ස්වයං පෝෂිතභාවයෙන් ඉහළ නැංවීම සඳහා වී නිෂ්පාදන තාක්ෂණික ක්‍රම බිහි කිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ වැඩසටහනක් ලෙස ලවණතාව සහිත ප්‍රදේශවල වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වී නිෂ්පාදන තාක්ෂණික ක්‍රම බිහි කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනිණි. මෙම ව්‍යාපෘතිය සඳහා කොරියානු ජනරජය මගින් අරමුදල් සැපයේ. 2012 සැප්තැම්බර් මාසයේදී මූලික විමර්ශන රැස්වීම පැවැත් වූ අතර එහිදී තාක්ෂණික සැලැස්ම ඉදිරිපත් කිරීමත් අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමත් සිදු කෙරිණි. ක්ෂේත්‍ර වැඩකටයුතු සිදු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රදේශ හඳුනා ගැනුණු අතර ඔක්තෝම්බර් මාසයේදී මූලික රැස්වීම් පැවැත්වීමත් ක්ෂේත්‍ර කටයුතු පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමත් සිදු කෙරිණි. ලවණතාවය සහිත ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා පාංශු නියැදි එක්රැස් කිරීම ආරම්භ කරන ලදි.

## විශේෂ ව්‍යාපෘති විස්තර :

### දේශීය ව්‍යාපෘති

**පහතරට තෙත් කලාපයේ වී වල ඵලදායිතාවය ඉහළ නැංවීම (පහතරට තෙත් කලාපීය ව්‍යාපෘතිය)**

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ වගා කෙරෙන වී වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘති සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අරමුදල් සපයනු ලැබේ. පහත රට කලාපයේ පවතින ලවණතාවය, යකඩ විෂවීම, ජලයෙන් යටවීම, මඩ වගුරු සහිත පස, වල් පැළෑටි උවදුර වැනි අහිතකර ජෛව තත්ත්වයන් හේතුවෙන් දශක ගණනාවක් මුළුල්ලේ සිටම එම ප්‍රදේශයේ වගා කෙරෙන වී වල ඵලදායිතාවය පහළ මට්ටමක (හෙ. 1කට ටොන් 2 - 2.5ක්) පවතී. තවද, මෙම ප්‍රදේශය සඳහා නිර්දේශිත ප්‍රභේද වල පවතින බිත්තර වී ප්‍රමාණයන් අවම මට්ටමක පවතින බැවින් ගොවීන් විසින් භාවිතා කරනුයේද අඩු විභවයක් සහිත ප්‍රභේදයන්ය. එබැවින්, මෙම ප්‍රදේශයේ වී වගාව අතිරික්ත ප්‍රමාණයන්ගෙන් සිදු නොවන බැවින් ගොවියාට ලැබෙනුයේ සුළු ආදායමකි. මේ හේතුවෙන්, මෙම ප්‍රදේශයේ ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පහත රට තෙත් කලාපයේ වී වගාවන්හි ඵලදායිතාවය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ.

මෙම ව්‍යාපෘතිය පහත රට තෙත් කලාපයේ දිස්ත්‍රික්ක හතක (මාතර, ගාල්ල, කළුතර, ගම්පහ, කොළඹ, රත්නපුර සහ කෑගල්ල) දියත් කෙරිණි. ගැටළු සහිත බිම් හඳුනා ගැනීම සඳහා මූලික සමීක්ෂණයක් සිදු කළ අතර ඉඩම් ලක්ෂණීකරණය කිරීමේ සහ වර්ගීකරණය කිරීමේ අධ්‍යයනයක්ද සිදු කෙරිණි. මෙම කලාපයේ වී වගාව යැපුම් මට්ටමින් සිදු කෙරෙන බවත් ගොවීන්ගෙන් 50%කට වැඩි පිරිසක් අර්ධ කාලීන ගොවීන් බවත් මෙම ප්‍රතිඵල මගින් අනාවරණය විය. ප්‍රදේශයේ වී වගාවන්හි ඵලදායිතාව හෙ. 1ට ටොන් 2.5 - 3.0 දක්වා වෙනස් වේ. ගොවීන් විසින් මුහුණපාන ගැටළු විසඳීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් කාර්යක්ෂම සහ සංයුක්ත තාක්ෂණික පිළිවෙත් මාලාවක් හඳුන්වා දෙන ලදි. වී ප්‍රභේද 15ක්, පැරෂුට් බඳුන් 10,500ක්, පත්‍ර වර්ණ සටහන් 700ක්, කුඩා අන්වීක්ෂ 35ක් (කොපු මයිටාවන් නිරීක්ෂණය කිරීම සඳහා) සහ වැඩිදියුණු කළ කළමනාකරණ පිළිවෙත් මීට ඇතුළත් වේ. ආදර්ශනය සිදු කරන ලද ක්ෂේත්‍ර ඵලදායිතා මට්ටම හෙ. 1කට ටොන් 3ක් වූ අතර මෙම ක්ෂේත්‍ර වැඩසටහන 2012/13 මහ කන්නයේදීද ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙන්ම වී නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා අඛණ්ඩවම සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය පළාත් කෘෂිකර්ම

දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රේඛීය ආයතන සමඟ එක්ව සිදු කරන ලදි.

**පර්යේෂණ ගොවිපළ සංවර්ධන වැඩසටහන (RFD ව්‍යාපෘතිය)**

යටිතල පහසුකම් සීමා සහිත වීම, සීමිත මානව සම්පත් සහ ගොවිපළ යන්ත්‍ර සූත්‍ර හිඟය වැනි විවිධ ගැටළු හේතුවෙන් පර්යේෂණ ගොවිපළවල ඵලදායිතාවය සහ ආදායම් එකම මට්ටමක රැඳී පවතී.මෙම ගොවිපළ වලින් ගුණාත්මක බීජ නිෂ්පාදනය කිරීමද සීමා සහිත බැවින් පර්යේෂණ ගොවිපළවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරුණු අතර වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සංවර්ධන කාර්යයන් සහ නිෂ්පාදන වැඩසටහන් සඳහා රු . මිලියන 9.46ක් වෙන් කෙරිණි. යටිතල පහසුකම් සංවර්ධනයට සහ බිත්තර වී නිෂ්පාදන වැඩසටහන සඳහා බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බෝඹුවල කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ලබුදූව වී පර්යේෂණ ස්ථානය, අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානය, සමන්තුරේ වී පර්යේෂණ ස්ථානය, පරන්තන් වී පර්යේෂණ ස්ථානය සහ මුරුන්කන් වී පර්යේෂණ ස්ථානය යන ආයතන වෙත පිළිවෙළින් රු. මිලියන 2.46ක්, 2.0ක්, 0.25ක්, 0.31ක්, 0.25ක්, 1.37ක්, 2.0ක් සහ 1.0ක් ලැබුණි. බීජ නිෂ්පාදනය සඳහා ජල සම්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම (රු. මිලියන 2.67) ඉඩම් සංවර්ධනය (රු. මිලියන 0.65) යටිතල පහසුකම් සංවර්ධනය ( රු. මිලියන 1.40), බීජ නිෂ්පාදනය (රු. මිලියන 4.34), උපකරණ සහ යන්ත්‍රසූත්‍ර මිළදී ගැනීම (රු. මිලියන 0.43) සහ පරිපාලනය (රු. මිලියන 0.25) යෝජිත ප්‍රධාන කාර්යයන් විය. පළමු කාර්ය යටතේ මී. 325ක ජල සම්පාදන ඇල මාර්ග ඉදි කිරීම සහ ජල පොම්ප ස්ථාපිත කිරීම සඳහා පොම්පාගාර දෙකක් ස්ථාපිත කිරීමත් ඩීසල් පොම්ප 3ක් මිළදී ගැනීමත් යෝජනා කෙරුණු අතර එම ඉලක්ක සපුරා ගැනීමට හැකි විය. ඉඩම් සංවර්ධනය යටතේ අක්කර 17ක් මට්ටම් කිරීම, මීටර් 60ක් දිග කොන්ක්‍රීට් වේලි සහ මීටර් 350ක් දිග වැටවල් ඉදිකිරීම යෝජනා වී තිබූ නමුත් තාක්ෂණික ගැටළු හේතුවෙන් ඇතැම් කාර්යයන් ප්‍රමාද විය.

මූලික බීජ නිෂ්පාදනය යටතේ, අක්කර 29.5ක් වගා කිරීමට නියමිත වූවත් කන්නය තුළදී පැවති වියළි කාලගුණික තත්ත්වය සහ ජල හිඟය හේතුවෙන් වගා කළ හැකි වූයේ අක්කර 21ක් පමණි. 2012 යල කන්නයේදී අත්තිවාරම් සහ වාණිජ බිත්තර වී ටොන් 33.6ක් නිපදවිය. බීජ නිෂ්පාදනය කිරීම සඳහා ගොවීන් අතර බෙදා දීමට නිපදවන ලද බිත්තර වී වලින් යම් කිසි ප්‍රතිශතයක් ගොවිපළ අංශය වෙත ලබාදුන් අතර ඉතිරි ප්‍රමාණය පර්යේෂණ ස්ථානයේ අලෙවි සැල හරහා බිත්තර වී නිපදවන ගොවීන් වෙත අලෙවි කෙරිණි.

**අහිතකර අජෛව තත්ත්වයන්, ජලයෙන් යටවීම, ලවණතාව, නියඟයට ඔරොත්තු දීම සහ යකඩ විෂවීම සඳහා වී ප්‍රභේද බිහි කිරීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම)**

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ මෙරට වගා කෙරෙන ජනප්‍රිය වී ප්‍රභේද වලට අහිතකර අජෛව තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව එක් කිරීමයි. ජලයෙන් යටවීම, ලවණතාවය සහ නියඟය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය සිදු කරගෙන යන අතර බෝඹුවල කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යකඩ විෂවීම සම්බන්ධයෙන් සහ අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානය ලවණතාවය සම්බන්ධයෙන් ද අවශ්‍ය කටයුතු සිදු කෙරේ. 2012 වසරේදී ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම මගින් ලද මුල්‍යමය ආධාර වලින් බතලගොඩ

පර්යේෂණ ආයතනයේ (ජලයෙන් යටවීමට අදාළව) සහ බෝඹුවල (යකඩ විෂවීමට අදාළව) සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණ සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමද අවශ්‍ය උපකරණ මිළදී ගැනීමද සිදු කෙරිණි. ඊට අමතරව, ජලයෙන් යටවීම, ලවණතාව, නියඟය, යකඩ විෂවීම පිළිබඳව පරීක්ෂා කර බැලීමට සුදුසු තත්ත්වයන් ප්‍රමිත කෙරිණි. ජලයෙන් යටවීම, ලවණතාව, නියඟය සහ යකඩ විෂවීම සඳහා දායක මාපිය ආර හඳුනා ගත් අතර $F_1$ගහන සහ පිළි මුහුම් ගහන ලබා ගැනීම සඳහා Bg 358, Bg 360, Bg 379/2, Bg 96 - 741, Bg 250, BW 363 යන ජනප්‍රිය ප්‍රභේද සමඟ මුහුම් කීපයක් සිදු කරන ලදි. පිළිමුහුම් අභිජනන වැඩසටහනේ කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාව ඉහළ නැංවීම සඳහා DNA නිස්සාරණය කිරීම, පොලිමරේස දාම ප්‍රතික්‍රියාවේ නිපැයුම් වේගය වැඩිකිරීමට සහ කලිල විද්‍යුතා ගමනය සිදු කිරීම (gel electrophoresis) යන කටයුතු සඳහා අණුක ජීව විද්‍යා රසායනාගාර වැඩිදියුණු කරන ලදි. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය ඉතිහාසයේ ප්‍රථම වතාවට අණුක සලකුණු කිරීමේ තාක්ෂණය මගින් රූපීය විද්‍යාත්මකව SSR සලකුණු යොදා ගනිමින් ජලයෙන් යටවන තත්ත්වයන් යටතේ සහ අණුක විද්‍යාත්මකව ජලයෙන් යටවීමට ඔරොත්තු දෙන පැළ හඳුනා ගැනීමට සමත් විය. ශ්‍රී ලංකාවේ අහිතකර අජෛව තත්ත්වයන්ට ලක්වන ප්‍රදේශ වල ව්‍යාප්ත කිරීම සඳහා අහිතකර අජෛව තත්ත්වයන්ට ඔරොත්තු දෙන ප්‍රභේද ලබා ගැනීම පිණිස මෙම වැඩසටහන අඛණ්ඩවම සිදු කෙරේ.

**ගොවි ක්ෂේත්‍ර වල පොහොර භාවිත කාර්යක්ෂමතා තාක්ෂණයන්හි අනුවර්තනතාව පිළිබඳ පරීක්ෂා කිරීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - පොහොර)**

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් පොහොර වල භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් බිහි කළ තාක්ෂණයන්ගේ අනුවර්තනතාව පිළිබඳව පරීක්ෂා කර බැලීමයි. ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ ලද මූල්‍යාධාර මගින් 2011 යල කන්නයේදී ආදර්ශන ආරම්භ කර දිස්ත්‍රික්ක 4ක (කළුතර, පොළොන්නරුව, කුරුණෑගල සහ හම්බන්තොට) ස්ථාන 21කදී පිට පිට කන්න තුනකදී සිදු කෙරිණි. නයිට්‍රජන් පොහොර වලට අදාළව සිදු කළ ආදර්ශන මගින් පත්‍ර වර්ණ සටහන පාදකව නයිට්‍රජන් පොහොර යෙදීමෙන් පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නංවන බවත් ඒ අනුව නයිට්‍රජන් 30%ක් අඩුවෙන් යොදා වත්මන්හි ලබා ගන්නා අස්වනු ප්‍රමාණය ලබා ගත හැකි බවත් අනාවරණය විය. ඊට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් වත්මන් නිර්දේශිතය හා සංසන්දනාත්මකව ගත් විට පත්‍ර වර්ණ සටහන පාදකව නයිට්‍රජන් යෙදීමෙන් 5%ක අමතර අස්වනු වර්ධනයක් ලබා ගත හැකි බව පොළොන්නරුව දිස්ත්‍රික්කයේදී නිරීක්ෂණය විය. එබැවින්, තෙත් සහ වියළි කලාප තත්ත්වයන්ට යෝග්‍ය පත්‍ර වර්ණ සටහන් සකස් කර ව්‍යාප්ති නිලධාරීන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඔවුන් අතරේ බෙදා දෙන ලදි. ගොවීන් විසින් වගා කරන වී ප්‍රභේද යොදා ගනිමින් ස්ථාන 21කදී සිදු කරන ලද ආදර්ශ මගින් කන්නයක් හැර කන්නයකදී පොස්පරස් පොහොර යොදා පොළොන්නරුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලින් වත්මන්හි ලබා ගන්නා හෙ. 1කට ටොන් 5 – 6 ක් වූ අස්වැන්නත් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ලබා ගන්නා හෙ. 1කට ටොන් 4 – 5ක් වූ අස්වැන්නත් කළුතර දිස්ත්‍රික්කයෙන් ලබාගන්නා හෙ.1කට ටොන් 3 – 4ක් වූ අස්වැන්නත් එලෙසින්ම ලබා ගත හැකි බැව් අනාවරණය විය. එබැවින්, ගොවි ක්ෂේත්‍ර

වලදී යොදා ගන්නා පොස්පරස් පොහොර ප්‍රමාණය ඉතිරි කර ගැනීම සඳහා කන්නයක් හැර කන්නයකදී යෙදිය හැකිය. ඉහත සඳහන් දිස්ත්‍රික්ක 4හි ස්ථාන 21කදී සිදු කරන ලද ආදර්ශන මගින් වී වගාවේ මුල් අදියරයේදී සහ කරල් හට ගන්නා අවදියේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පරිදි පොටෑසියම් පොහොර සම්පූර්ණ ප්‍රමාණයම යෙදූ විට ලැබෙන අස්වැන්න හා සමාන අස්වැන්නක් කරල් හට ගන්නා අවදියේදී පමණක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශිත පොටෑසියම් ප්‍රමාණයෙන් අඩක් සහ පිදුරු යෙදීමෙන් ලබා ගත හැකි බැව් අනාවරණය විය. මෙමගින් පොටෑසියම් පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ ගොවි ක්ෂේත්‍ර වලදී පොටෑසියම් පොහොර භාවිතය 50%කින් අඩු කර ගැනීමට හැකි වේ. 12/13 මහ කන්නයේදී සියළුම ස්ථාන වලදී දිගු කාලීන බලපෑම් තහවුරු කර ගැනීම සඳහා මෙම අධ්‍යයනයන් සිදු කරනු ලැබේ.

**ශ්‍රී ලංකාවේ මඩට වපුරන වී වගාවේ වල් පැළෑටි කළමනාකරණය (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - වල් වී)**

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ ගොවි ක්ෂේත්‍ර වල පවතින වල් වී පාලනය කිරීම සඳහා සමෝධානික තාක්ෂණික පිළිවෙත් මාලාවක් බිහි කිරීමයි. කාර්යක්ෂම බීජ ස්ථාපිත කිරීමේ ක්‍රම වරණය කර ගැනීම; සුදුසු පරිදි බිම් සැකසීමෙන් ඒ ඒ පරිසර සඳහා බීජ පැළ සිටුවීම, පේළියට බීජ වැපිරීම, ඍජුවම මඩට බීජ වැපිරීම, පැළ උදුරා සිටුවීම, යෝග්‍ය වගා කළමනාකරණ පිළිවෙත්, පිරිසිදු බිත්තර වී භාවිතය සහ වල් වී පැළෑටි අතින් / යාන්ත්‍රිකව ඉවත් කිරීම මෙයට ඇතුළත් වේ. 2011/2012 මහ සහ 2012 යල කන්න වලදී අළුත්වැව, ගිරිතලේ, මාතර, අම්බලන්තොට, මාවතගම, රත්නපුර සහ ගාල්ල යන ප්‍රදේශ වල බෙහෙවින් වල් වී ආසාදනයට ලක් වූ කුඹුරු වලදී ක්ෂේත්‍ර අත්හදා බැලීම් 21ක් සිදු කරන ලදි. ක්ෂේත්‍ර අත්හදා බැලීම් 12ක් සාර්ථකව නිම කළ අතර අනෙකුත් අත්හදා බැලීම් නියඟය හේතුවෙන් අසාර්ථක විය. පිරිසිදු බිත්තර වී පේළියට වැපිරීමෙන් වල් වී බිහි වීම බෙහෙවින්ම අඩු වූ බවත් වල් වී හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම වූ බවත් ප්‍රතිඵල මගින් අනාවරණය වූ අතර ගොවීන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ප්‍රගතිශීලී ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ උතුරු පලාතේ, ප්‍රධාන වශයෙන්ම, පරන්තන් සහ වවුනියාව යන ප්‍රදේශ වලද සිදු කෙරිණි. කුඹුරු වල වල් වී බෝ වීම හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම කිරීමෙහිලා සමෝධානික තාක්ෂණික පිළිවෙත් මාලාව වඩාත් කාර්යක්ෂම බැව් සියළුම ගොවි ආදර්ශන අත්හදා බැලීම් වලින් අනාවරණය විය.

**වී වගාවේදී ජලය ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂාපෝෂිතව වී වගාව සිදු කෙරෙන කුඹුරු වල ජලයේ සුලභතාව පිළිබඳව ඇගයීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම - වර්ෂාපෝෂිත ජල සුලභතාවය)**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂාපෝෂිතව සිදු කරන වී වගාවේදී අස්වනු වෙනස්වීම අවම කිරීමට මෙන්ම වී නිෂ්පාදනය ප්‍රශස්ත කිරීම සඳහා යෝග්‍ය වී ප්‍රභේද සහ බෝග දින දර්ශන හඳුන්වා දීමේදී ජලයේ සුලභතාවය බෙහෙවින් වැදගත් වේ. එබැවින්, මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂාපෝෂිතව වී වගා කෙරෙන කුඹුරු වල ජල සුලභතාවය පිළිබඳව තක්සේරු කිරීමයි. මෙම පරමාර්ථය මුදුන්පත් කර ගැනීම පිණිස වර්ෂාපෝෂිතව සහ ජල සම්පාදිතව වී වගා කරන කුඹුරුවල මායිම් සලකුණු කිරීමේ කටයුතු සාර්ථකව සිදු කරන ලදි. වඩාත් නිවැරදි දත්ත ලබා ගැනීමේ අරමුණින් සතිපතා දත්ත ලබා ගැනීමට සැලසුම් කර තිබූ මුත් වර්ෂාපතන දත්ත සහ විභව වාෂ්පීකරණ උත්ස්වේදන

දත්ත ඇසුරින් දේශගුණික ජල සුලභතාවය පිළිබඳව මාසිකව ගණනය කෙරිණි. පාංශු ජල සුලභතාවය ඇගයීම පිණිස යල සහ මහ කන්නවලදී වියළි, අතරමැදි සහ තෙත් යන කලාප නියෝජනය වන පරිදි තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන තුනකින් (මහානාන්නේරිය, ඉබ්බාගමුව සහ අලව්ව) පාංශු නියැදි ලබා ගන්නා ලදි. ඉහත නියැදිවල පාංශු වයනය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. වී ප්‍රභේද යොදා ගැනීම, අස්වැන්න සහ බෝග කළමනාකරණ පිළවෙත් පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ 2012 - 13 මහ සහ 2013 යල කන්නවලදී නිම කරනු ඇත.

## තාක්ෂණය පතුරුවාලීම

වී නිෂ්පාදන තාක්ෂණික පුහුණු කිරීමේ මධ්‍යස්ථානය පිහිටුවීමේ පරමාර්ථය වූයේ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් ජනනය කරන ලද නව තාක්ෂණයන් පිළිබඳව ව්‍යාප්ති නිලධාරීන්, බීජ නිපදවන්නන්, ගොවීන් සහ විශ්ව විද්‍යාල, කෘෂිකර්ම විද්‍යාල වැනි විවිධ ආයතනවල සිසුන් සතු තාක්ෂණික දැනුම නංවාලීම පිණිස සහ ශ්‍රී ලංකාවේ වී වල ඵලදායිතාව සහ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් තාක්ෂණය පතුරුවාලීමේ කටයුතු වේගවත් කිරීමයි. නේවාසික පුහුණු පහසුකම් ශක්තිමත් කිරීම පිණිස අංග සම්පූර්ණ පහසුකම් සහිත නව නේවාසිකාගාර සංකීර්ණයක් ඉදි කෙරිණි. ඊට අමතරව, වී නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ විවිධ විෂයන් සම්බන්ධයෙන් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී සිදු කළ සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සැලසීම සිදු කෙරිණි.

නියමිත පුහුණු කිරීම් වලට අමතරව, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අළුතින් බඳවා ගන්නා ලද වැඩමුළුවක්ද නිලධාරීන් සඳහා දින තුනක පුහුණු වැඩමුළුවක්ද පැවැත්විය.

**වගු අංක 1.4.3 : 2012 වසරේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| එක් දින ගොවි පුහුණුව | 27 | 1494 |
| නේවාසික ගොවි පුහුණුව (දින 2ක් හෝ 3ක්) | 02 | 54 |
| එක් දින නිළධාරි පුහුණුව | 11 | 376 |
| නේවාසික නිළධාරි පුහුණුව (දින 2 හෝ 3) | 10 | 324 |
| පෞද්ගලික අංශය පුහුණු කිරීම | 03 | 92 |
| කන්නය පුරා පුහුණු කිරීම | 02 | 60 |
| පාසැල් සිසුන්, ඩිප්ලෝමා සිසුන් සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ පැමිණීම් | 13 | 567 |
| සේවාස්ථ පුහුණුව (මාස 1 -4) | 05 | 14 |
| වෙනත් වැඩමුළු | 08 | 210 |

ප්‍රකාශන අලෙවි කිරීමෙන් (ප්‍රකාශන 2148) ලැබූ ආදායම රු : 122,030කි

## වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට

මෙම පර්යේෂණ ස්ථානයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ වැඩිදියුණු කළ ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ වලින් යුතුව රතු ළලාවරණයක් සහිත, ලවණතාවයට ඔරොත්තු දෙන, කෙටි කාලයකින් පරිණත වන සහ ඉහළ අස්වනු ගෙන දෙන වී ප්‍රභේද බිහි කිරිමයි. නිර්දේශිත ‘At’ ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය හැරුණු විට මෙම ආයතනය ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ ,පළිබෝධ සහ රෝග පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම, පාංශු සාරවත් භාවය කළමනාකරණය කිරීම සහ වී වගාවේ ශෂ්‍ය විද්‍යාත්මක අංශ යනාදිය පිළිබඳව පර්යේෂණ කටයුතු සිදු කරන ලදි.

## ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන

### දෙමුහුම්කරණය කිරීමේ සහ වරණය කිරීමේ වැඩසටහන

2012 යල කන්නයේදී පැතිරි පැවතුණු නියඟ තත්ත්වය හේතුවෙන් මෙම පර්යේෂණ ස්ථාන මගින් සිදු කෙරෙන අභිජනන වැඩසටහන නිසි පරිදි සිදු කිරීමට නොහැකි විය.කෙසේ වුවද, ප්‍රභේද අනුවර්තන වැඩසටහන සහ බිජ නිෂ්පාදන වැඩසටහන ගොවි ක්ෂේත්‍ර වලදී සහ ‘බටඅත’ කෘෂි උද්‍යානයේදි සිදු කෙරිණි. මුහුම් 80ක් සිදු කළ අතර බල්ක් ගහන 62ක් ඇගයීමට ලක් කර වැඩිදුර ඇගයීම් කටයුතු සඳහා 46ක් වරණය කර ගන්නා ලදි. අස්වනු අත්හදා බැලීම් වලදී වැඩිදියුණු කළ ප්‍රජනිත වශයෙන් ප්‍රජනිත 1510කින් තවදුරටත් ඇගයීම සඳහා ප්‍රජනිත 275ක් වරණය කර ගැනිණි.

### අස්වනු ඇගයීම

අස්වනු ගෙන දිම සම්බන්ධයෙන් පරික්ෂා කර බැලීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීම් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් මගින් ආර 26ක් ඇගයිමට ලක් කෙරිණි.

### අනුවර්තන අත්හදා බැලීම්

අළුතින් බිහි කළ ආර 6ක්; At 08 – 593, At 08 – 617, At 08 – 648, At 09 – 854, At 09 – 861 සහ At 09 – 1078 ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමෙන් වැඩිදුරටත් පරික්ෂාවට ලක් කෙරිණි. ඊට අමතරව, යල සහ මහ කන්න දෙකේදී මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල විවිධ ස්ථාන 13කදී ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම් සිදු කෙරිණි. අනුවර්ත්‍යතාව සම්බන්ධයෙන් At 07 - 800, At 07 -695 සහ At 06 - 631 ප්‍රභේද අනුවර්තන වැඩසටහනින් තවදුරටත් ඇගයීමට ලක් කරන ලදි. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහනින් වරණය කර ගන්නා ලද At 05 - 1382, At 06 - 650 සහAt 06 - 486 යන ආර තුන මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් වැඩිදුරටත් අගයන ලදි.

### ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ

පිසීමේ ගුණාත්මක තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ප්‍රභේද නවයකින් යුතුව ජෙලටීන කිරීමේ උෂ්ණත්ව තුනක්; එනම් ඉහළ (At 307, At 303 සහ At 306), අතරමැදි (Bg 379 - 2, Bg 94 - 1 සහ At 306) සහ අඩු (Bg403, At 362 සහ At 405) යන කාණ්ඩ තුන පිළිබඳව අධ්‍යයන කටයුතු සිදු කෙරිණි. එකී කාණ්ඩ තුනට පිළිවෙළින් අතරමැදි ගෝලාකාර (IB), තරමක් දිගු (LM) සහ සිහින් දිගටි (LS) ධාන්‍ය අයත් විය. සහල් ඇට දාහක ප්‍රමාණයක් පිසූ විට එහි බර සහ ප්‍රමාණයෙහි වෙනසක් සිදු නොවූවද ජෙලටීන කිරීමේ උෂ්ණත්වයට ලක් කළ සහල් වල පිසූ බර, පරිමාව සහ ජලය එක්

කර සහල් පිසින කාලය කෙරෙහි බලපෑමක් ඇති කරන ලදි. කෙසේවුවද, මනා වූ ඇසුරුම් කිරීමේ හැකියාවකින් යුත් ධාන්‍ය වර්ගය ඉහළ කැකුළු සහල් බරකින් යුතු වූ අතර එකී ජෙලටීන කිරීමේ උෂ්ණත්ව කාණ්ඩයට අදාළව පිසූ සහල් බරද ඉහළ විය. ධාන්‍ය වල විශාලත්වය දිගුවීමේදී එකී කාණ්ඩයට අදාළව කිසියම් රටාවක් නොතිබූ අතර එක් එක් කාණ්ඩය සහ ධාන්‍ය වර්ගය නියෝජනය කරමින් ප්‍රභේද ගණනාවක් ඇසුරින් තව දුරටත් අධ්‍යයනය සිදු කිරීමට යෝජිතය. පොලිෂ් නොකළ සහල් වල එසේ නැතහොත් දුඹුරු සහල් වල පිටත නිවුඩු ආවරණය හේතුවෙන් තන්තු, යකඩ, විටමින් සහ ඛණිජ වලින් පොහොසත් නමුත් වී කෙටු සහල් සමඟ සසඳා බලන කළ රසයෙන් අඩු වේ. රතු වී ප්‍රභේද දෙකක (At 362/ At 353) සහ සුදු වී ප්‍රභේද දෙකක (At 354/ At 307) දුඹුරු සහල්, වී කෙටු සහල් හා සසඳමින්, ප්‍රරෝහණය කරන ලද සහල් වල සංවේදක ගුණාත්මයන් ඇගයීමට අත්හදා බැලීම් සිදු කෙරිණි. වී වල දහයියා ඉවත් කර දුඹුරු සහල් ලබා ගන්නා ලද අතර පළමු කොටස දුඹුරු සහල් ලෙස ගත් අතර දෙවන කොටස වී කෙටු සහල් ලබා ගැනීම සඳහා තත්ත්පර 75ක් පොලිෂ් කරන ලදි. තුන්වන කොටස පුරා රැයක් පෙගෙන්න තබා ජලය පෙරා ඉවත් කර ප්‍රරෝහණය වීමට පැය 21ක් තබන ලදි. මෙම නියැදි තුනේ සංවේදක ලක්ෂණ (පෙනුම සහ රසය) සම්බන්ධයෙන් වර්ග කිරීමේ පරීක්ෂණය පාදකව පිසීම සහ ඇගයීම සිදු කෙරිණි. වී කෙටු සහල් වලට වඩා රතු සහල් ප්‍රභේද වල ප්‍රරෝහණය වූ දුඹුරු සහල් වල පෙනුම ඉහළ වර්ගීකරණයන්ට අයත් විය. කෙසේවුවද, දුඹුරු සහල් වලට වඩා ප්‍රභේද හතරේම ප්‍රරෝහණය වූ දුඹුරු සහල් රසයෙන් ඉහළ විය. එබැවින්, දුඹුරු සහල් වලට වඩා ප්‍රරෝහණය වූ දුඹුරු සහල් කෙරෙහි පාරිභෝගික රුචිකත්වයන් ඉහළ වූ බැවින් එම සහල් අගය එක් කළ පෝෂණීය ආහාරයක් ලෙස නිර්දේශ කළ හැකිය.

## තාක්ෂණය පතුරුවාලීම

- උපාධි අපේක්ෂක සිසුන්ගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ අධීක්ෂණය (සිසුන් දෙදෙනෙකු)
- කෘෂිකර්ම විද්‍යාලීය සිසුන්ගේ ඩිප්ලෝමා පාඨමාලාවේ එක් කොටසක් සම්පූර්ණ කිරීමක් ලෙස පුහුණුව ලබාදීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය මගින් ගත් පියවරකට අනුව සම්පත් පුද්ගලයන් ලෙස මාසිකව බෝග සායන වලට සහභාගී වූ අතර විශ්ව විද්‍යාල සිසුන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලය, පාසැල් සිසුන් සහ ආයතනය වෙත පැමිණි ගොවීන් වෙත තාක්ෂණික තොරතුරු ලබා දෙන ලදි.
- සීමාසහිත සිලෝන් බිස්කට් නිෂ්පාදන ආයතනයෙන් බිස්කට් නිෂ්පාදනය කිරීමට යොදා ගැනීම සඳහා වඩාත්ම හොඳම ප්‍රභේදය ලෙස At 05 – 1382 හඳුනා ගත් අතර බිස්කට් නිෂ්පාදන ආයතනයේ ඉල්ලුම මත ඔවුන් වෙත ප්‍රභේදයේ බිත්තර වී ලබා දෙන ලදි.

## අභිජනක බීජ නිෂ්පාදන වැඩසටහන

ජාතික බිත්තර වී නිෂ්පාදන වැඩසටහන සඳහා නිර්දේශිත වී ප්‍රභේද වල අභිජනක බීජ වල ඉල්ලුම් කරන ලද ප්‍රමාණයන් නිපදවිය.

| ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) 2011/12 මහ | 2012 යල | එකතුව |
|---|---|---|---|
| **මාස 03** | | | |
| At 307 | 100 | 160 | 260 |
| At 308 | 40 | 100 | 140 |

| ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | එකතුව |
|---|---|---|---|
| | 2011/12 මහ | 2012 යල | |
| **මාස 3 ½** | | | |
| At353 | 20 | 40 | 60 |
| At 362 | 180 | 320 | 500 |
| **එකතුව** | **340** | **620** | **960** |

## වී පර්යේෂණආයතනය - සමන්තුරේ

මෙම ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් සතුව වී වගාව පිළිබඳව පවත්නා දැනුම් පරතරය හඳුනා ගැනීම සහ වී වගාවේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණික ශිල්ප ක්‍රම ඔවුන් වෙත හඳුන්වා දීමයි. නිර්දේශිත වී ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය, ජාතික සම්බන්ධීකරණ අත්හදා බැලීම් සිදු කිරීම සහ මෙම කළාපයේ වී ගොවියාට ඇතිවන ක්ෂේත්‍ර ගැටළු සඳහා විසඳුම් සෙවීම වැනි වගකීම් ද මෙම ආයතනයේ කාර්යය භාරයන් වේ.

## වී ප්‍රභේද වැඩි දියුණු කිරීමේ වැඩසටහන

### මාස 3 1/2 කාණ්ඩයේ වී අභිජනන වැඩසටහන

විශේෂයෙන්ම කෙටිකාලයකින් පරිනත වන සහ ලවණතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද වැඩි දියුණු කිරීම සහ බිහි කිරීම කෙරෙහි අඛණ්ඩව පර්යේෂණ සිදු කරන අතර ධාන්‍ය ගුණාත්මය, ධාන්‍ය අස්වැන්න සහ රෝග වලට දක්වන ප්‍රතිරෝධීතාව කෙරෙහි ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කෙරේ. මෙම වැඩසටහන සඳහා මාපිය ආර 14ක් යොදා ගත් අතර ක්‍රියාකාරීත්වය අනුව ඒවයේ ප්‍රජනිත නඩත්තු කෙරිණි.

### දෙමුහුම් වී නිෂ්පාදන වැඩසටහන

ස්ථාන දෙකකදී අළුතෙන් බිහිකළ දෙමුහුම් වී වර්ගයක් (Bg 407 H) පරීක්ෂාවට ලක් කෙරිණි. මෙම වී වර්ගය සාමාන්‍යයෙන් ඉහළම අස්වනු ගෙන දෙන වී ප්‍රභේදයට වඩා 28%කට වැඩි අස්වැන්නක් එනම් හෙ. 1ට ටොන් 8.5ක සාමාන්‍ය අස්වැන්නක් ගෙන දුණි.

### වල් පැළෑටි කළමනාකරණය

වල්නාශක වල කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ස්ථාන හතරක ගොවි ක්ෂේත්‍ර වලදී විවිධ වල් නාශක ප්‍රතිකර්ම 8ක් සිදු කරන ලදි. එනම් : T1- බිස්පයිරිබැක් - සෝඩියම් ලීටරයකට ග්‍රෑම් 100Sc, T2 3,4-DPA (ප්‍රොපනිල් ලීටරයකට ග්‍රෑම් 360 EC) සහ MCPA අක්කරයකට මි.ලී. 60-300 + 800ml/ac, T3 - ප්‍රෙටිලැක්ලෝර් - ලීටරයකට ග්‍රෑම් 300 EC,T4-ෆෙනොක්සප්‍රොප්-පී-එතිල් ලීටරයකට ග්‍රෑම් 69 OD,T5-සයිහැලෆොප් -බියුටිල් ලීටරයකට ග්‍රෑම් 100, T6- අතින් වල් ඉවත් කිරීම , T7- පාලන පරීක්ෂණය. ඉහළම අස්වැන්න (හෙ.1ට ටොන් 5.8ක්) අතින් වල් ඉවත් කළ (T3) සහ ලීටරයකට ග්‍රෑම් 300ක් ප්‍රෙටිලැක්ලෝර් EC යෙදූ වගාවෙන් ගෙන දුණි.

### ශෂ්‍ය විද්‍යාව

පර්යේෂණ ස්ථානයේදි සහ ගොවි ක්ෂේත්‍රවලදී ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම (NCRVT) ප්‍රභේදඅනුවර්තන අත්හදා බැලීම ( VAT) සහ මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම ( LSVAT) සිදු කළ අතර ස්ථාන 10කදී මහා පරිමාණයෙන් දෙමුහුම් වී අනුවර්තන අත්හදා බැලීමේ අධ්‍යයන සිදු කෙරිණි.

### ජාතික සම්බන්ධිකරණ වී ප්‍රභේද අත්හදා බැලීම (NCRVT)

2012 යල කන්නයේ දී මාස 2 ½, 3 ½ සහ 4 ½ වයස් ඛාණ්ඩවලට අයත් වී ප්‍රභේද

යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදි.පර්යේෂණ කළමනාකරණ තත්ත්ව යටතේ සම්මත පරීක්ෂණ ප්‍රභේද යොදා ගනිමින් මාස 2 ½ නව වී ආර 7ක් මාස 3 ½ නව ආර 4ක් සහ මාස 4 - 4 ½ නව ආර 3ක් පරීක්ෂාවට ලක්කෙරිණි.

**ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන ( VAT)**

2012 යල කන්නයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාන 8කදී ප්‍රභේද අනුවර්තන අත්හදාබැලීම් සිදු කෙරිණි. එසේම මාස 3 සහ 3 ½ වයස් පංති සඳහාද අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාන 6කදී අත්හදා බැලීම් සිදු කෙරිණි.

**මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන ( LSVAT )**

2011 /2012 මහ කන්නයේදී අම්පාර දිස්ත්‍රික්කයේ සථාන 2කදී Bg 300 **පරීක්ෂණ ප්‍රභේදය සමඟ බලාපොරොත්තු තැබිය හැකි එක් උසස් ආරක්** ( At 07 - 800) පරීක්ෂාවට ලක් කෙරිණි.

**තාක්ෂණය පතුරුවාලීම**

වී වගාව සම්බන්ධයෙන් වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රම ගොවීන් අතර පතුරුවාලීමේ අරමුණින් යුතුව ප්‍රශස්ත බීජ අනුපාතය, කොපු සහ පත්‍ර මයිටා පාලනය, පාංශු සාරවත්භාවය කළමනාකරණය සහ පසු අස්වනු හැසිරවීම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන් 4ක් සිදු කරන ලදි.

**මූලික බීජ නිෂ්පාදනය**

අඩු ප්‍රමාණවලින් සපයනු ලබන නිර්දේශිත වී ප්‍රභේද වල වාණිජ බීජ නිෂ්පාදන වැඩසටහන අඛණ්ඩවම සිදු කළ අතර අපනයන විභවයක් සහිත ඉතා කෙටි වයස් වී ප්‍රභේදයක් වන Bg 250 හි සහ ඉහළ අස්වනු ගෙන දෙන Bg357 හි බීජ නිෂ්පාදනය කිරීම සඳහා නව වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරිණි. Bg357ප්‍රභේදයේ ගුණාත්මක බීජ ආසන්න වශයෙන් බුසල් 500ක් පමණ නිපදවිය. 2012 යල කන්නයේදී පර්යේෂණ ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතියට අදාළව අක්කර 09ක මූලික බීජ නිෂ්පාදන වැඩසටහන සිදු කෙරිණි.

**දේශීය ව්‍යාපෘති - අම්පාර දිස්ත්‍රික්කයේ**

වෙරළ බඩ ප්‍රදේශයේ වල් වී කළමනාකරණය (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම් ව්‍යාපෘතිය)

අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශයේ වල් වී තුරන් කිරීම බලවත් ගැටළුවක් බවට පත්ව ඇති බැවින් මෙම ප්‍රෙද්ශයේ තිරසාර සහ ලාබදායක වී වගාවක් ඉලක්ක කර ගනිමින් වල් වී කළමනාකරණය කිරීම සඳහා සමෝධානික ප්‍රවේශයක් බිහි කෙරිණි. එබැවින්, ගොවීන් 140 දෙනෙකුගේ සහභාගීත්වයෙන් අම්පාර වෙරළබඩ ප්‍රදේශයේ ස්ථාන 6කදී විශේෂ ආදර්ශන, පුහුණු සහ ක්ෂේත්‍ර කටයුතු සිදු කෙරිණි.

## කාර්ය මණ්ඩල

**වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 20 |
| කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරී | 01 |
| වැඩසටහන් සහකාර | 07 |
| කෘෂිකර්ම උපදේශක | 19 |
| පර්යේෂණ සහකාර | 19 |
| පර්යේෂණ උප සහකාර | 06 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 |

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| කාර්යාල සහායක | 01 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 03 |
| වඩුබාස් | 01 |
| ලොරි පවිත්‍රකරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| රියදුරු | 08 |
| මුරකරු | 07 |
| ස්ථිර කම්කරු | 47 |
| කොන්ත්‍රාත් කම්කරු | 90 |
| **එකතුව** | **248** |

**වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 04 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| පර්යේෂණ සහකාර | 05 |
| රසායනාගාර උප සහකාර | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| රියදුරු | 01 |
| මුරකරු | 02 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| ස්ථිර කම්කරු | 16 |
| කොන්ත්‍රාත් කම්කරු | 21 |
| **එකතුව** | **54** |

**වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර පර්යේෂණ නිලධාරී | 01 |
| පර්යේෂණ නිලධාරී | 01 |
| කෘෂිකර්ම නිලධාරී | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| මුරකරු | 02 |
| ස්ථිර කම්කරු | 03 |
| කොන්ත්‍රාත් කම්කරු | 22 |
| **එකතුව** | 33 |

# 1.4.1 කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල

බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයත් ලබුදූවේ සහ බොන්තොට සහායක පර්යේෂණ මධ්‍යස්ථාන දෙකත් පහතරට තෙත් කලාපයේ පිහිටුවා තිබෙන අතර මෙම ආයතන එම කලාපයේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත පැවරී තිබෙන වගකීම වනුයේ විශේෂයෙන්ම යකඩ විෂමතාවයට ඔරොත්තු දෙන ඉහළ අස්වනු ලබා දෙන රතු සහ සුදු වී ප්‍රභේද බිහි කිරීමයි.

වගු අංක **1.4.1.1 :** වාර්ෂික අයවැය - **2012** (රු.)

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම % |
|---|---|---|---|
| මූලධන | 1,175,816 | 1,175,816 | 100 |
| පුනරාවර්තන | 11,569,228 | 10,528,288 | 91 |
| <u>විදේශ ව්‍යාපෘති</u> | | | |
| කාබනික ගොවිතැන් තාක්ෂණය සඳහා ආසියානු ජාලය | 75,000 | 75,000 | 100 |
| **එකතුව** | **12,820,043** | **11,779,104** | **92** |

## වී ප්‍රභේද වැඩි දියුණු කිරීමේ වැඩසටහන

### අළුතින් නිර්දේශ කරන ලද වී ප්‍රභේද

- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වගාව සඳහා මාස 3 ½ න් පරිණත වන සුදු සම්බා ප්‍රභේදයක් BW 367 නමින් 2012 වසරේදී මුදා හරින ලදි. මෙහි සාමාන්‍ය අස්වැන්න හෙ. 1කට ටොන් 5ක් බැව් තක්සේරු කෙරිණි.
- BW 03-1198 නැමති බලාපොරොත්තු තැබිය හැකි නව ආරක් 2012/13 මහ කන්නයේදී ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන (NCRVT) සඳහා නම් කෙරිණි. මෙය මාස 3 ½ අතරමැදි ගෝලාකාර ධාන්‍ය වලින් යුත් ආරකි.
- බලාපොරොත්තු තැබිය හැකි තවත් ආරක් වන BW 05 - 1621 ගොවීන් විසින් පිළිගැනීමට ලක්වීමේ හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම සඳහා 2012/13 මහ කන්නයේ මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම (LSVAT) සඳහා නම් කෙරිණි. ඉහළ ගොවි ඉල්ලුමක් සහිත මෙම වී ආර රතු ඵලාවරණයක් සහිත අතරමැදි ගෝලාකාර ධාන්‍ය වලින් සමන්විත වේ.

## අභිජනන වැඩසටහන

මාස 4 - 4 ½ න් පරිණත වන කාණ්ඩයෙන් වී ආර තුනක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම (MYT) සඳහා තෝරා ගත් අතර මූලික අස්වනු අත්හදා බැලීම සඳහා මාස 3 ½ න් පරිණත වන කාණ්ඩයෙන් වී ආර 18ක් තෝරා ගන්නා ලදි. මාස 03න් සහ දින 85න් පරිණත වන කාණ්ඩ වලින් පිළිවෙළින් වී ආර තුනක් හා පහක් තෝරා ගැණිනි.

තෙත් කලාපීය ප්‍රදේශ සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ (NCRVT) සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ (VAT) වැඩසටහන් අඛණ්ඩවම ක්‍රියාත්මක කළ අතර වී ආර 30ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ අගයන ලදි. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන යටතේ BW 05 -1621 ඇතුළු බලාපොරොත්තු තැබිය හැකි වී ආර 5ක් කළුතර, කොළඹ සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වලදී ඇගයීමට ලක් කෙරිණි.

## රෝග කළමනාකරණය

බෝඹුවල, අම්බලන්තොට සහ ලබුදූව ප්‍රදේශ වලින් එක් රැස් කර ගන්නා ලදුව, වී වැඩිදියුණු කිරීමේ වැඩසටහන් යටතේ වැඩි දියුණු කළ වී ආර 106ක් බෝඹුවලදී පරීක්ෂා කර බැලූ අතර ඉන් වී ආර 28ක් කොළ පාළුවට ප්‍රතිරෝධී බැව් හඳුනා ගන්නා ලදි.

## පළිබෝධ කළමනාකරණය

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සඳහා නම් කෙරුණු වී ආර 69ක් දුඹුරු පැළ කීඩැවා (*Nilaparvata lugens*) සහ වී ගොක් මැස්සා (*Oreseolia oryzae*) කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් සොයා බැලීමට බෝඹුවලදී සිදු කරන ලද පරීක්ෂණයෙන් වී ආර දෙකක් දුඹුරු පැළ කීඩැවාට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි. බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී සිදු කළ පර්යේෂණයකින් දුඹුරු පැළ කීඩැවාගේ නව ජීවදර්ශයක් බිහිවීම පෙන්නුම් කළ අතර මෙම තත්ත්වය තහවුරු කර ගැනීම පිණිස වැඩිදුර අධ්‍යයන සිදු කෙරේ.

බෝඹුවලින් ලබා ගත් අභිජනක ආර 30ක් දුඹුරු පැළ කීඩැවා සහ වී ගොක් මැස්සා කෙරෙහි දක්වන ප්‍රතිරෝධිතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා හරිතාගාර තත්ත්ව යටතේ පරීක්ෂාවට ලක් කෙරිණි. ඉන් ආර අටක් මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවෙන් යුතු විය.

බෝඹුවල පසුගිය කන්න දෙකේදී වී ගොක් මැස්සා ආසාදනය වීම ඉතාමත් අඩු මට්ටමක පැවති බැව් නිරීක්ෂණය වූ අතර මෙම පළිබෝධ සම්බන්ධයෙන් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණ අත්හදා බැලීම මඟින් නිගමනයන්ට එළඹිය නොහැකිය.

වී කොපු මයිටාවා (*Steneotarsonemus Spinkii* Smiley) (RSM) මෑතදී හඳුනා ගත් වී පළිබෝධයක් වන අතර ඉන් වී වගාවේ අස්වැන්න 90%කට පමණ හානියක් සිදු කළ හැකිය. මෙම පළිබෝධයට එරෙහිව විවිධ කීඩැ නාශක පරීක්ෂා කර බැලූ අතර ප්‍රොෆෙනෆොස් 50 EC පමණක් වී කොපු මයිටා පාලනයෙහි සාර්ථක බලපෑමක් පෙන්නුම් කළ මුත් පරිසරය සහ ඉලක්ක නොවන ජීවීන් කෙරෙහි මෙම කීඩැ නාශකය මගින් ඇති කරන අනතුරුදායක තත්ත්වය සැලකිල්ලට ගනිමින් වී කොපු මයිටාවන් පාලනය කිරීම සඳහා තාවකාලිකව නිර්දේශ කෙරේ. එබැවින්, මෙම පළිබෝධයට එරෙහිව ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ විවිධ පරිසර හිතකාමී කීඩැ නාශක විවිධ මාත්‍රාවලින් ඇගයීමට ලක් කෙරිණි. ඉන් බලාපොරොත්තු තැබිය හැකි එක් දිලීර ව්‍යුත්පන්න කීඩැ නාශකයක් හඳුනා ගත් අතර ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා වැඩිදුරටත් ඇගයීම අවශ්‍ය වේ.

## වල් පැළෑටි කළමනාකරණය

ජේලියට බීජ වපුරන වල් පාලනය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා අතින් වල් පැළටි ඉවත් කළ, රසායනිකව පාලනය කළ සහ වල් ඉවත් නොකළ යන අවස්ථා වලදී වසුන් ද්‍රව්‍ය තුනක් පරීක්ෂාවට ලක් කෙරිණි. වී වගාවේ මුල් අදියරයේදී බීජ වලින් හට ගන්නා සියළුම වර්ග වල වල් පැළෑටි මර්දනය කිරීම සඳහා පිදුරු සහ ලී යතු වඩාත් කාර්යක්ෂම වසුන් බැව් හඳුනා ගැනිණි.

නිර්දේශිත පැළෑටි නාශක නැවත ඇගයීමට ලක් කෙරුණු අතර බෙන්සොසල්ෆියුරොන් - මෙතිල් + මෙට්සල්ෆියුරොන් - මෙතිල්, කාෆෙන්ට්‍රසෝන් - එතිල් සහ MCPA පුළුල් පත්‍ර සහ පන් වර්ග පාලනයෙහි තවමත් කාර්යක්ෂම බව අනාවරණය විය. එසේම ඒසිම්සල්ෆියුරොන් සහ බිස්පයිරිබැක් - සෝඩියම් WP අශ්ව වලිගය (*Leptochloa chinensis*) සහ වෙල්හිරියා (*Cyperus difformis*) යන වල් විශේෂ දෙක පාලනයෙහි වඩාත් කාර්යක්ෂම විය.

## පාංශු සාරවත් භාවය කළමනාකරණය කිරීම

පහතරට තෙත් කලාපයේ වී වගා බිම් වල ෆොස්ෆරස් ද්‍රාව්‍යතාව ඉහළ නැංවීමෙහිලා එප්පාවල රොක් ෆොස්ෆේට් සහ ග්ලිරිසීඩියා වල විවිධ සංයෝග මගින් ඇති කරන බලපෑම නිර්ණය කිරීම පිණිස බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේදී පාංශු සාරවත් භාවය කළමනාකරණය කිරීමේ වැඩසටහන යටතේ පරීක්ෂණ සිදු කෙරිණි. ප්‍රතිඵල සාර්ථක බැවින් වැඩිදුර තොරතුරු ලබා ගැනීම පිණිස අත්හදා බැලීම් අඛණ්ඩවම සිදු කරනු ලැබේ.

ස්භාවික පරිසරයේ සමතුලිතතාව රැක ගන්නා අතරම පොහොර සඳහා දරන පිරිවැය අඩු කිරීම සඳහා පොහොර භාවිතය අඩු කිරීමේ පරමාර්ථයෙන් යුතුව බෝඹුවල කලාපීය වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේදී පාංශු පරීක්ෂණ වැඩසටහන සිදු කරන ලදි. පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය සඳහා පාංශු නියැදි 774ක් ලැබුණි. එනම් පහත රට තෙත් කලාප ව්‍යාපෘති යටතේ දිස්ත්‍රික්ක පහකින් (ගාල්ල, මාතර, කළුතර, රත්නපුරය සහ කොළඹ) පාංශු නියැදි 114ක්, පාංශු සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ විවිධ ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් පාංශු නියැදි 240ක්, සේවා ස්ථානයේ විවිධ අංශ වලින් පාංශු නියැදි 392ක්, පොහොර නිර්දේශ පාදක පරීක්ෂණ සඳහා වූ පාංශු නියැදි 28ක් ලෙසිනි. ඉන් නියැදි 557ක් PH අගය, විද්‍යුත් සන්නායකතාව, ෆොස්ෆරස්, පොටෑසියම්, කාබනික ද්‍රව්‍ය සහ වයනය යනාදිය සම්බන්ධයෙන් විශ්ලේෂණය කරන ලදි.

විවිධ ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් පාංශු සාරවත් භාවය පිළිබඳ අවකාශමය විචල්‍යතාවට අදාළ දත්ත මූලයක් සකස් කිරීමට මෙම පාංශු විශ්ලේෂණයේ ප්‍රතිඵල යොදා ගනු ඇත.

## ශෂ්‍ය විද්‍යාව

වී වගාව සඳහා සමෝධානික පැළෑටි පෝෂණ කළමනාකරණ පිළිවෙත් මාලාව පිළිබඳ අධ්‍යයනය මගින් තහවුරු වූ පරිදි හෙ.1කට පිදුරු ටොන් 4ක් සමඟ කොම්පෝස්ට් ටොන් 2ක් යෙදීමෙන් රසායනික පොහොර භාවිතය 25%කින් අඩු කළ හැකිය.

හෙ. 1කට කොම්පෝස්ට් ටොන් 8ක් සහ පත්‍ර වර්ණ සටහන පාදකව නයිට්‍රජන් යෙදීමෙන් නයිට්‍රජන් පොහොර භාවිතය 25% කින් අඩු කිරීමට හැකි වන බැව් 'පත්‍ර වර්ණ සටහන භාවිතා කරමින් වී වගාවේ

අවශ්‍යතා පාදක නයිට්‍රජන් කළමනාකරණ' වැඩසටහනේ ප්‍රතිඵල මගින් අනාවරණය විය.

කාබනික පොහොර නිෂ්පාදන සහ ප්‍රවර්ධන වැඩසටහන යටතේ කොම්පෝස්ට් කි.ග්‍රෑ.6000ක් සහ කොම්පොස්ට් ආමුකුලණ කි.ග්‍රෑ. 840ක් සකස් කරන ලදි.

### තාක්ෂණය පතුරුවාලීම

- ගොවි ක්ෂෙත්‍ර වලින් ලබා ගත් පාංශු නියැදි 600ක් පාංශු සාරවත්භාවය පිළිබඳ කලමනාකරණ අංශය මගින් විශ්ලේෂණය කරන ලදි.
- වී වගාවේ විවිධ අංශ පිළිබඳව රූපවාහිනී වැඩසටහන් දෙකක්, ගුවන් විදුලි වැඩසටහන් පහක් සහ ක්ෂෙත්‍ර දින දෙකක් සිදු කෙරිණි.
- වී වගාවේ විවිධ අංශ සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් 565 දෙනෙකු සහ සිසුන් 07 දෙනෙකු තෘතීය මට්ටමින් පුහුණු කෙරිණි.
- මධ්‍යස්ථානයේ පැවැත්වෙන මාසික සම්මන්ත්‍රණ වැඩසටහන යටතේ කාර්ය මණ්ඩලය විසින් විවිධ විෂයන් ඔස්සේ ඉදිරිපත් කිරීම් 52ක් කෙරිණි.

## අභිජනක බීජ නිෂ්පාදනය

වගු අංක **1.4.1.2 : 2012** වසරේදී අභිජනක බීජ නිෂ්පාදනය කළ ප්‍රමාණය

| ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | |
|---|---|---|---|
| | **2011/12** මහ | **2012** යල | එකතුව |
| <u>මාස 3 ½</u> | | | |
| BW 364 | 41 | 41 | 82 |
| BW 361 | 20.5 | 20.5 | 41 |
| BW 367 | 61.5 | 82 | 143.5 |
| BW 363 | - | 20.5 | 20.5 |
| BW 267/3 | - | 20.5 | 20.5 |
| <u>මාස 3 ½</u> | | | |
| BW 272 - 6b | - | 20.5 | 20.5 |
| එකතුව | **123** | **205** | **328** |

### විශේෂ ව්‍යාපෘති විස්තර - දේශීය

1. ජලයෙන් යටවීමට සහ යකඩ විෂමතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීම පිළිබඳ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති සැලසුම් ව්‍යාපෘති.

ප්‍රගතිය : මුහුම් හයක් බිහි කළ අතර ප්‍රජනිත තවදුරටත් යකඩ විෂමතාවයට

සහ ජලයෙන් යටවීමට ඔරොත්තු දීම සම්බන්ධයෙන් පරික්ෂා කර බලනු ඇත.

2. සාම්ප්‍රදායික වී ප්‍රභේද තිස් දෙකක ලක්ෂණීකරණය සහ සංශුද්ධකරණය පිළිබඳව වූ "කාබනික ගොවිතැන් තාක්ෂණය සඳහා ආසියානු ජාලය" ව්‍යාපෘතිය

   ප්‍රගතිය : දේශිය ප්‍රභේද තිස් දෙකක ලක්ෂණීකරණය සහ සංශුද්ධ කිරීම සිදු කළ අතර එම ප්‍රභේද ගුණනය කිරීම එළඹෙන කන්නයේදී සිදු කරනු ඇත.

3. පර්යේෂණ ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය

   ප්‍රගතිය : පුද්ගලයන් 248 දෙනෙකුගේ සහාභාගීත්වයෙන් ක්ෂෙත්‍ර දින දෙකක් සිදු කෙරිණි.

4. පහත රට තෙත් කලාපයේ ඵලදායිතාවය ඉහළ නැංවීම.

   ප්‍රගතිය : බිත්තර වී අවශ්‍යතාවය සපුරාලීම සඳහා බීජ කි.ග්‍රෑ. 4520 ක් (අත්තිවාරම්, ලියාපදිංචි, සහතික කළ සහ වාණිජ බීජ) නිපද වූ අතර ගුණනය කිරීම සඳහා පහත රට තෙත් කලාපයේ රජයේ බීජ ගොවිපළවල් සහ පාර්ශවකරුවන් වෙත ලබා දෙන ලදි.

5. ගොවි ක්ෂෙත්‍ර යටතේ පොහොර භාවිතය කාර්යක්ෂම කිරීමේ තාක්ෂණයෙහි අනුවර්තායතාව පිළිබඳ පරීක්ෂණය පිළිබඳ ජාතික කෘෂිකර්මික ප්‍රතිපත්ති සැලසුම් ව්‍යාපෘතිය. නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් මට්ටම් පිළිබඳව කළුතර දිස්ත්‍රික්කයේ ස්ථාන 9කදී පරීක්ෂා කෙරිණි.

   ප්‍රගතිය : රසායනික ද්‍රව්‍ය පිළිබඳ අවශ්‍යතා පාදක කළමනාකරණය මගින් සහ නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම මගින් එම පොහොර යෙදීමේ මට්ටම අඩු කළ හැකිය. මෙම ව්‍යාපෘතිය යටතේ පහතරට තෙත් කලාප තත්ත්වයට ගැලපෙන පත්‍ර වර්ණ සටහන සකස් කෙරිණි.

## 2013 වසර සඳහා පර්යේෂණ සහ සංවර්ධන සැලැස්ම

### වී අභිජනනය

සාම්ප්‍රදායික වී අභිජනය සහ අභිජනක බීජ නිෂ්පාදන වැඩසටහන අඛණ්ඩවම ක්‍රියාත්මක කරනු ඇත. මීට අමතරව, සාම්ප්‍රදායික වී ප්‍රභේද පිළිබඳ සමීක්ෂණයක් සිදු කෙරේ. ද්විත්ව ඒකගුණ වී නිෂ්පාදනය කිරීම සඳහා දේශිය ඔරයිසා සැටයිවා උප විශේෂයක් වන ඉන්ඩිකා(වී) ජනකප්ලාස්ම සමඟ පරාගධානි රෝපණය පිළිබඳ අධ්‍යයන කරනු ඇත. ජාතික කෘෂිකර්මික පර්යේෂණ ප්‍රතිපත්ති ව්‍යාපෘතිය යටතේ ජලයෙන් යටවන තත්ත්වයට සහ යකඩ විෂවීමට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීම තවත් කන්නයකදී සිදු කරනු ඇත.

### ශෂ්‍ය විද්‍යාව

පූර්ව වර්ෂ වලදී මෙන්ම වී සඳහා පැළැටි පෝෂක කළමනාකරණ පිළිවෙත්, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සහ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත. වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා පත්‍ර වර්ණ සටහන සහ බිම සකස් නොකිරීමේ තත්ත්වය සම්බන්ධයෙන් අධ්‍යයන සිදු කෙරේ. පහත රට තෙත් කලාප තත්ත්ව යටතේ ක්‍රියාකාරීත්වය සොයා බැලීම සඳහා දෙමුහුම් වී සංයෝග අගයනු ඇත.

## ව්‍යාධිවේදය

වී කොළ පාළුවට එරෙහිව නිර්දේශිත දිලීරනාශක ඇගයීම සහ බැක්ටීරියා පත්‍ර අංගමාරය සහ කොළ පාළුව සඳහා වී ප්‍රභේද පරීක්ෂා කර බැලීම අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.

## කීට විද්‍යාව

වී කොපු මයිටාවාට එරෙහිව විවිධ කීඩෑ නාශක ඇගයීම සහ ගොක් මැස්සා (*Orseolia orygae*) සහ දුඹුරු පැළ කීඩෑවාට (*Nilaparvata lugens*) ප්‍රතිරෝධී වී ප්‍රභේද පරීක්ෂා කර බැලීම අඛණ්ඩවම සිදු කෙරෙනු ඇති අතර පහත රට තෙත් කලාපයේ වී කොපු මයිටාවා පිළිබඳ පුරෝකථන ක්‍රමයක්ද ආරම්භ කරනු ඇත.

## වල් පැළෑටි විද්‍යාව

වී සඳහා නිර්දේශිත පැළෑටි නාශක නැවත ඇගයීමට ලක් කරනු ඇත.

### පාංශු සාරවත් භාවය කළමනාකරණය

පහත රට තෙත් කලාපයේ වී වගා බිම් වලට කොටස් වශයෙන් පොහොර යෙදීමෙන් ඇති වන බලපෑම පිළිබඳව එළඹෙන වසරේදී අධ්‍යයන සිදු කරනු ලැබේ. විවිධ වී ප්‍රභේද වල අන්තර්ගත බැර ලෝහ හඳුනා ගැනීමේ අධ්‍යයනද MOP, යූරියා සහ TSP වෙනුවට පිදුරු යෙදීම සම්බන්ධයෙන්ද අධ්‍යයන ආරම්භ කරනු ඇත. නයිට්‍රජන් සහ ෆොස්ෆරස් ක්ෂුද්‍ර ජීවී ආමුකුලණ යොදා ගනිමින් වී වගාවේ ක්ෂුද්‍ර ජීවීන් පිළිබඳ අධ්‍යයනද රසායනිකව යකඩ විෂමතාවය පාලනය කිරීම, වී වගාව සඳහා එප්පාවල රොක් ෆොසේෆේට්ස් x ග්ලිරිසීඩියා වල ප්‍රශස්ත අනුපාතය සහ ධාන්‍ය අස්වැන්න සහ පාංශු සාරවත් භාවය කෙරෙහි නයිට්‍රජන්, ෆොස්ෆරස්, පොටෑසියම් දිගු කාලීනව නොයෙදීමෙන් ඇති වන බලපෑම සම්බන්ධයෙන්ද අධ්‍යයන සිදු කරනු ඇත.

## වී පර්යේෂණ ස්ථානය - ලබුදූව

ලබුදූවේ වී පර්යේෂණ ස්ථානය රතු එලාවරණයක් සහිත වී ප්‍රභේද බිහි කිරීම සහ ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපයේ ඉහළ විභවයක් සහිත කුඹුරු ඉඩම් වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අදාළ තාක්ෂණයන්ද බිහි කිරීමේ වගකීම දරයි.

## ප්‍රභේදීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන

### නව නිර්දේශිත වී ප්‍රභේද

2012 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් දීප ව්‍යාප්තව වගා කිරීම සඳහා දින 105කින් පරිණත වන කෙටි රවුම් ධාන්‍ය සහ රතු එලාවරණයක් සහිත වී ප්‍රභේදයක් වන Ld 368 මුදා හරින ලදි. මෙය හෙ. 1කට ටො. 07කට වැඩි අස්වනු විභවයක් සහිත ප්‍රභේදයක් වන අතර කොළ පාළුවට සහ ගෙල පාළුවට ප්‍රතිරෝධී මෙන්ම බැක්ටීරියා පත්‍ර අංගමාරය, ගොක් මැස්සා සහ දුඹුරු පැළ කීඩෑවාට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වේ. තවද, මෙම ප්‍රභේදය ඇද නොවැටෙන අතර ධාන්‍ය අවපැහැවීමද සිදු නොවේ.

## ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන

පසුගිය වසර හය තුළදී ඉහළ අස්වනු ගෙන දෙන නව වී ආර පහක් බිහි කරන ලදි. මාස 2 ½ න් පරිණත වන Ld 8 -15-6, Ld 8-15-15 සහ Ld 8-15-30 ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන මගින් පරීක්ෂා කෙරිණි. මාස 3 ½ රතු සම්බා ආරක් වන Ld 8-6-7 ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන සඳහා නම් කළ අතර මාස 3 ½ සුදු සම්බා ආර (Ld 3-6-12) මහා

පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් පරික්ෂාවට ලක් කෙරිණි. 2012 යල කන්නයේදී ලබුදුවේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී මාස 3 ½ නව වී ආර හතක් සහ මාස 4 ½ නව ආර පහක් පර්යේෂක කළමනාකරණ තත්ත්ව යටතේ සම්මත පරික්ෂණ ප්‍රභේද සමඟ පරික්ෂා කරන ලදි.

## වල් පැළෑටි කළමනාකරණය

### වල් වී කළමනාකරණය

වල් වී ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ කුඹුරු වලට අළුතින් පැන නැඟුණු ගැටළුවකි. එබැවින්, මෙම උවදුර වී වගා බිම් වලින් සහමුලින්ම තුරන් කිරීම සඳහා වඩා හොඳ කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීමේ අධ්‍යයනයක් සිදු කරන ලද අතර ඒ සඳහා ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්මෙන් අරමුදල් සපයන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ස්ථාන දෙකකදී ව්‍යාප්ති නිළධාරීන්ගේ සහ ගොවීන්ගේ සහභාගීත්වයෙන් යුතුව තාක්ෂණික පිළිවෙත් පරික්ෂවට ලක් කෙරුණි. 2011/12 මහ සහ 2012 යල කන්න වලදී ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවි ක්ෂෙත්‍ර දෙකකදී අත්හදා බැලීම් දෙකක් සිදු කෙරුණු අතර පහත රට තෙත් කලාපයේ වල් වී පාලනය කිරීම සඳහා ගොවීන් යොදා ගන්නා පිළිවෙත් (පාලන ක්‍රම) වලට වඩා පහත දැක්වෙන පිළිවෙත් වඩාත් කාර්යක්ෂම බැව් අනාවරණය විය.

1. පැළ උදුරා සිටුවීම + පිරිසිදු බීජ + පූර්ව නිර්ගමන පැළෑටි නාශක
2. බීජ පැළ වැපිරීම + පිරිසිදු බීජ + පූර්ව නිර්ගමන පැළෑටි නාශක
3. පෙළට වැපිරීම + පිරිසිදු බීජ + පූර්ව නිර්ගමන පැළෑටි නාශක
4. අහඹු ලෙස වී වැපිරීම + පිරිසිදු බීජ + පූර්ව නිර්ගමන පැළෑටි නාශක

වී වගාවේ බිම් වල වල් වී බිහිවීමේ අවාසි පිළිබඳ දැනුවත් කිරීම සඳහා මෙම වසරේදී ගොවීන් සහ ව්‍යාප්ති නිළධාරීන් 200 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ක්ෂෙත්‍ර දින දෙකක් සිදු කරන ලදි.

## රෝග කළමනාකරණය

### බැක්ටීරියා පත්‍ර අංගමාරයට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් පරික්ෂා කර බැලීම

වී පිළිබඳ ජාන ඇගයීම සඳහා වන අන්තර්ජාතික ජාල වැඩසටහන (INGER) යටතේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය මගින් 2012 වසරේදී ලද නව වී ආර ලබුදුවේ වී පර්යේෂණ ආයතනයේදී පරික්ෂා කර බලන ලදි. ආර 10ක් බැක්ටීරියා පත්‍ර අංගමාරයට ඉහළ ප්‍රතිරෝධිතාවෙන් යුතු විය.

2011 IRBB පැළ තවාන යටතේ ලද වී ආර ගුණනය කර අභිජනන වැඩසටහන් වලට යොදා ගැනීම සඳහා අභිජනනකරුවන් වෙත සහ සංරක්ෂණය සඳහා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය වෙත ලබා දෙන ලදි.

## පළිබෝධ කළමනාකරණය

ගාල්ල දිස්ත්‍රික්කයේ වී වගාවේ ධාන්‍ය අවපැහැ ගන්වන නව කරල් සලබයෙක් හඳුනා ගැණිනි. මෙම සලබයා ඇන්ගොමොයිස් ධාන්‍ය සලබයාට [*Sitotroga cerealell*a (olivier)] සමානය.

පිලා කෝෂය අවට ධාන්‍ය වලට හානියක් ඇති කිරීම සහ ධාන්‍ය අවපැහැ ගැන්වීම දක්නට ලැබුණු අතර වැඩිදුරටත් හඳුනා ගැනීම සඳහා මෙම කෘමි සත්ත්වයා එක්සත් රාජධානියට යවන ලදි.

පැළ මැක්කා කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහනින් ප්‍රවේශ 39ක් පරීක්ෂා කර බලන ලදි. ඉන් ප්‍රවේශ 20ක් පැළ මැක්කාට පාත්‍රවීම ඉහළ මට්ටමක පවතින බවද 14ක් පාත්‍ර බැව් සහ 5ක් මධ්‍යස්ථ වශයෙන් පාත්‍ර බවද 2012 වසරේදී ලබුදුව වී පර්යේෂණ ආයතනයේදී අනාවරණය කර ගන්නා ලදි.

## අභිජනක බීජ නිෂ්පාදන වැඩසටහන

2012 වසරේදී ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා අත්තිවාරම් බීජ නිපදවීමට Ld 365 සහ Ld 408 අභිජනක බීජ කි.ග්‍රෑ. 200ක් රජයේ ගොවිපළ වලට නිකුත් කරන ලදි. මීට අමතරව, කලාපීය බීජ නිෂ්පාදන වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා ගාල්ලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත ලියාපදිංචි බීජ සහ සහතික කළ බීජ ලබාදුණි.

**වගු අංක 1.4.1.3 : 2012 වසරේදී නිෂ්පාදිත අභිජනක බීජ ප්‍රමාණය**

| ප්‍රභේදය | අභිජනක බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | | |
|---|---|---|---|
| | **2011 – 12 මහ** | **2012 යල** | **එකතුව** |
| මාස 3 ½ Ld 365 | 60 | 60 | 120 |
| මාස 04 Ld 408 | 40 | 40 | 80 |
| **එකතුව** | **100** | **100** | **200** |

## වී පර්යේෂණ ආයතනය - බෙන්තොට

බෙන්තොට වී පර්යේෂණ ආයතනයේ ප්‍රධාන වගකීම වනුයේ වතුරෙන් යටවන සහ ලවණතාවය සහිත ප්‍රදේශ සඳහා වී ප්‍රභේද බිහි කිරීමයි.

## ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ජල ගැල්මට ඔරොත්තු දීම සම්බන්ධයෙන් 2012 වසරේදී ප්‍රභේදීය පරීක්ෂා කිරීම් සිදු කළ අතර Bg 96 – 741 ජල ගැල්මට ඔරොත්තු දෙන වී ආරක් බැව් අනාවරණය විය. මෙම ආර ගුණනය කිරීම පර්යේෂණ ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කෙරිණි.

## ශෂ්‍ය විද්‍යාව

ජලයෙන් යටවන තත්ත්වයන් යටතේ වී බෝගය ස්ථාපිත කිරීමේ යෝග්‍ය ක්‍රමය හඳුනා ගැනීම සඳහා පර්යේෂණ අඛණ්ඩවම සිදු කරන ලදි.

## ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන (NCRVT)

මාස 3 ½ සහ මාස 4 ½ වයස් කාණ්ඩ යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන අඛණ්ඩවම සිදු කෙරිණි. මාස 3 ½ කාණ්ඩයට අයත් නව ආර 10ක් සහ මාස 4 ½ කාණ්ඩයට අයත් නව ආර 5ක් වසර තුළදී පරීක්ෂා කරන ලදි.

## ප්‍රභේද අනුවර්තන පරීක්ෂණ වැඩසටහන (VAT)

2011/12 මහ කන්නයේදී මාස 3 ½ සහ මාස 03 වසස් කාණ්ඩ වල ආර යොදා ගනිමින් ස්ථාන දෙකකදී ප්‍රභේද අනුවර්තන පරීක්ෂණ වැඩසටහන සිදු කෙරිණි. මාස 3 ½ වී ආර 2012 යල කන්නයේදී ගොවි කළමනාකරණ තත්ත්වය යටතේ පරීක්ෂා කරන ලදි.

# 2013 සඳහා පර්යේෂණ සහ සංවර්ධන සැලැස්ම

1. ජලයෙන් යටවන තත්ත්වය සඳහා වී ආර පරීක්ෂා කර බැලීම.

2. ජලයෙන් යටවන තත්ත්වය යටතේ වී බෝගය ස්ථාපිත කිරීමේ යෝග්‍ය ක්‍රමයක් හඳුනා ගැනීම.

3.අර්ධ වශයෙන් මඩ සහිත පසේ වී පැළෑටිය මගින් පෝෂණය උරා ගැනීම කෙරෙහි බිම සකස් නොකළ තත්ත්වය යටතේ ඇති කරන බලපෑම පිළිබඳ පරික්ෂා කිරීම.

4.අර්ධ වශයෙන් මඩ සහිත පස සඳහා සාම්ප්‍රදායික වී ප්‍රභේද ඇගයීම.

5.ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන් අඛණ්ඩවම සිදු කිරීම

## කාර්ය මණ්ඩල

**කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| පර්යේෂණ නිලධාරි | 08 |
| ගොවිපල කළමනාකරු (වැඩබලන) | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 06 |
| සංවර්ධන සහකාර | 01 |
| පර්යේෂණ සහකාර | 12 |
| කෘෂිකර්ම උපදේශක | 07 |
| පරිපාලන නිලධාරි | 01 |
| වතු කළමනාකරණ සහකාර | 06 |
| ගබඩා භාරකරු | 01 |
| රියදුරු | 02 |
| මුරකරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| කම්කරු | 16 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 33 |
| කොන්ත්‍රාත් (ව්‍යාපෘති) | 11 |
| **එකතුව** | **111** |

**කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ලබුදූව**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථානභාර පර්යේෂණ නිලධාරි | 01 |
| පර්යේෂණ නිලධාරි | 02 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 05 |
| වතු කළමනාකරණ සහකාර | 02 |
| රියදුරු | 01 |
| මුරකරු | 02 |
| ට්‍රැක්ටර් යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| කම්කරු | 10 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 12 |
| **එකතුව** | **39** |

**කලාපීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බොන්තොට**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ස්ථානභාර පර්යේෂණ නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| මුරකරු | 01 |
| ගබඩා භාරකරු | 01 |
| කම්කරු | 08 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 06 |
| කම්කරු (ව්‍යාපෘති) | 02 |
| **එකතුව** | **22** |

# 1.5. ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

පරිසරයට සිදුවන හානිය අවම කරමින් තිරසාර ලෙස ජාතික ඵලදායීතාවය වැඩිදියුණු කිරීමෙහිලා විද්‍යාත්මක පදනමකින් යුතුව, ඉඩම් සහ ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිත කිරීම ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රයත්නයයි. පාංශු සංරක්ෂණය හා ජලාධාර කළමනාකරණය පිළිබඳ පර්යේෂණ, ඉඩම් යෝග්‍යතාවය පිළිබඳ ඇගයීම, බෝග සමීක්ෂණය සහ පුරෝකථනය, කෘෂිකාලගුණික සහ දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයනය, ඵලදායීතාවය නංවාලීම, ගොවිපළ වාරිමාර්ග කළමනාකරණය පිළිබඳ පාංශු සහ ජලයේ තත්ත්වය අධ්‍යයනය මෙම මධ්‍යස්ථානය සතු කාර්යයන්ය. රට තුළ කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාලයක් නඩත්තු කිරීම පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම, තාක්ෂණ ව්‍යාප්තිය, අදාළ විෂයයන් පිළිබඳ සේවාදායකයින්ට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමට අවශ්‍ය විධි විධාන සැලසීම. විවිධ සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ පාරිසරික බලපෑම අධ්‍යයනය, මෙම මධ්‍යස්ථානයට පැවරී ඇති අනෙකුත් වගකීමය.

## අයවැය

**වගු අංක 1.5.1: වාර්ෂික අයවැය 2013 (රු)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 1,772,148 | 167,071 | 94 |
| පුනරාවර්තන | 2,959,000 | 2,628,005 | 89 |
| <u>ව්‍යාපෘති</u> | | | |
| NARP ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩසටහන | 10,000,000 | 6,642,657 | 66 |
| පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | 2,500,000 | 1,770,556 | 71 |
| පහතරට තෙත් කලාපයේ කුඹුරුවල ඵලදායීතාවය ඉහල නැංවීම පිළිබඳ වැඩසටහන | 300,000 | 139,872 | 47 |
| කලාපීය බෝග තිරසාර බව ඇගයීමට සහ මිනුම්ගත කිරීම (ඌව පළාත) | 1,700,000 | 475,000 | 28 |
| **එකතුව** | **19,231,148** | **13,326,802** | **69** |

# ප්‍රගතිය

## පර්යේෂණ

### දේශගුණික විපර්සාසයන්ට ශ්‍රී ලංකාව ලක්වීමේ අවදානම

මෙම අධ්‍යයනය තුළදී ශ්‍රී ලංකාව දේශගුණික වෙනස්වීම් වලට සහ දේශගුණික පරිවර්තනයන්ට ලක්වීමේ හැකියාව පරිපාලන දිස්ත්‍රික්ක 25 කදී අධ්‍යයනයට ලක්කරන ලදී. දේශගුණික විපර්යාසයන්හි පාත්‍රතා දර්ශකය ගණනය කරනු ලැබීමත්, දේශගුණික විපර්යාසයන්ට නිරාවරණය, සංවේදීතාව සහ අනුවර්තන හැකියාව නිර්වචනය කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණ විය. දේශගුණික විපර්යාසයන්ට නිරාවරණය සහ භූවිෂමතාවය මෙම වෙසන්වීම්වලට සෘජු වශයෙන් බලපෑමක් ඇති කරන අතර සමාජ - ආර්ථික තත්ත්වය, පාරිසරික සාධක සහ දිස්ත්‍රික්කයන්හි පිහිටවනු ලැබූ ආයතනයන්හි වැඩිදියුණුව අන්‍ය ආකාරයෙන් මෙම දේශගුණික විපර්යාසයන්ට ගොදුරුවීමේ ප්‍රමාණයන් වෙනස් වන බව මෙම විශ්ලේෂණයෙන් හෙළිදරවු විය. පහතරට තෙත් කලාපයේ (රත්නපුර හැර) නාගරික හා අර්ධ නාගරික දිස්ත්‍රික්කයන්හි වැඩි සශ්‍රීකත්වයත්, යටිතල පහසුකම් ප්‍රවර්ධනයත්, සම්පත්වලට ප්‍රවේශය වැඩිවීමත් හේතුවෙන් අවදානමට ගොදුරුවීමේ හැකියාව අඩුබව මෙම විශ්ලේෂණයේ ප්‍රතිඵල මඟින් අනාවරණය විය. දේශගුණය හේතුවෙන් හටගන්නාවූ ගංවතුර, වරින්වර ඇතිවන නියඟ තත්ත්වය, නායයාම්වලට එම දිස්ත්‍රික්ක නිරාවරණය වුවද ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයෙහි බටහිර සහ නැගෙනහිර බෑවුම්වල, මහනුවර, මාතලේ, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයන් සහ නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය හා අම්පාර යන දිස්ත්‍රික්කයන් දේශගුණික විපර්යාසයන්ට පාත්‍රවීමේ සාමාන්‍ය ප්‍රමාණයෙන් පෙන්නුම් කෙරිණි. මේ අතර ත්‍රිකුණාමලය හා අම්පාර යන දිස්ත්‍රික්ක හැරෙන්නට වියළි සහ අතරමැදි කලාපයන්හි අනුරාධපුර, පොළොන්නරුව, මඩකලපුව, හම්බන්තොට, මොණරාගල සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක දේශගුණික විපර්යාසයන්ට ගොදුරු වීමේ වැඩි ප්‍රවනතාවයක් පවතී. උතුරු පළාතේ ප්‍රජාව (යාපනය හැර) පුත්තලම හා රත්නපුර යන දිස්ත්‍රික්ක වෙනස්වීම්වලට වැඩි වශයෙන් නිරාවරණය වීමත්, ජීවනෝපායන්හි වැඩි සංවේදීතාවයක් සහ අඩු සමාජ - ආර්ථික සංවර්ධනයත් හේතුවෙන් අවදානමට පාත්‍රවීමේ ඉහළ ප්‍රවනතාවන් දක්නට ලැබේ. එකම කෘෂි පාරිසරික හෝ භූලක්ෂණ සහිත කලාප වුවද ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතර දේශගුණික වෙනස්වීම් වලට ගොදුරුවීමේ සැලකිය යුතු වෙනස්කම් දක්නට ලැබෙන අතර මේ හේතුවෙන් ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කරන්නන් විසින් දේශගුණික තත්ත්වයන්ගෙන් එකිනෙකට වෙනස් වන්නාවූ ප්‍රාදේශයන්හි අවදානම නියාමනය උදෙසා එම ප්‍රදේශ වෙත විශේෂිත වන්නාවූ ප්‍රතිපත්ති හා වැඩසටහන් වැඩිදියුණු කළ යුතු වන්නේය. එක් එක් දිස්ත්‍රික්කයන්හි සංවර්ධන වැඩසටහනට මෙම දේශගුණික විපර්යාස හා අදාළ තොරතුරු ඇතුලත් කරමින් ප්‍රදේශ, ප්‍රාදේශීය මට්ටමින් මෙම දේශගුණික විපර්යාසවල බලෑමට අදාළ ප්‍රතිකර්ම සිදු කිරීම නිර්දේශ කරනු ලැබේ. වඩාත් අර්ථාන්විත ලෙස දේශගුණික අවදානයට ලක්වීම අවම කිරීම සහ වැඩි අවදානමට ගොදුරු වෙමින් පවතින කොට්ඨාශ ඉලක්ක කර ගැනීම උදෙසා ඒ හා සමානම ගොදුරු වීමේ සහ අවදානම් වලට ලක්වීමේ හැකියාව ඇගයීමේ ක්‍රමවේදයක් නිර්දේශ කරනු ලබයි.

## ශ්‍රී ලංකාවේ නියඟ අවදානම් පැතිකඩක් වැඩිදියුණු කිරීම

කාලපරිච්ඡේදයක් තුළ දෛනික සහ මාසික වර්ෂාපතන සහ වාෂ්පීකරණ දත්ත මගින් ව්‍යුත්පන්න කළ දර්ශක 14ක් උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ නියඟ අවදානම් දර්ශකයක් සකස්කිරීමට සහ ඉදිරිපත් කිරීමට මෙම අධ්‍යයන මගින් උත්සහයක නිරත වනු ලැබුණි. මෙම ප්‍රත්ඵල මගින් ශ්‍රී ලංකාවේ වියලි කලාපීය කෘෂි පාරිසරික කලාප 11ම ඉතාමත් ඉහළ අවදානම් ප්‍රමාණයක් පවතින බවත් අතරමැදි කලාපයේ කෘෂි පාරිසරික කලාප 20ම සාමාන්‍ය හෝ ඉතාමත් ඉහළ නියං අවදානමක් පවතින බවත් පෙන්නුම් කෙරිණි.

ජනගහන වර්ධනයත්, ආර්ථික වර්ධනයත් හේතුවෙන් ජල සම්පත් සඳහා පවතින ඉල්ලුම වැඩි අතර කාළගුණික විද්‍යාව පදනම් වූ නියඟයන්හී ප්‍රමාණය සහ තීව්‍රතාවය වැඩිවීමක් හෝ වැඩිවීමක් ඇති නොවී අනාගත නියඟ තුළින් විශාල බලපෑමක් ඇතිවේ යැයි අපේක්ෂා කරනු ලැබිය හැක. මෙම අධ්‍යයනය තුළින් එළඹිය හැකි ප්‍රතිපත්තිමය නිර්දේශයන් පහත පරිදි දැක්විය හැක.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප තුනෙහි නියං අවදානමෙහි දැනට පවතින ක්‍රමානුකූල අවකාශමය වෙනස්කම් පුළුල් කිරීමෙන් නියං කළමනාකරණ ක්‍රමෝපායන් සකස්කිරීමටත් ග්‍රාමීය මට්ටමෙන් අදාළ ග්‍රාමීය ප්‍රදේශයන්හි ඉඩම් හා ජලසම්පත් ක්ෂයවීම අවමවන පරිදි තිරසාර ලෙස භාවිතය තහවුරු වන ආකාරයෙන් උප ක්‍රියාකාරීත්වයන් සැකසීමටත් ප්‍රතිපත්ති සැලසුම්කරුවන්හට හැකිවේ.
- දෙවනුව ශ්‍රී ලංකාවේ සම්පූර්ණ වියළි කලාපයම ඉතාමත් ඉහළ නියං අවදානමට ලක්වීමට වැඩි නැඹුරුතාවක් පවතින හෙයින් වඩාත් පුළුල් සංවර්ධන සන්දර්භය තුළ ඉහළ පුමුඛත්වයක් ලබාදෙන ප්‍රදේශයක් ලෙස හෝ ජාතික සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය තුළට එය ඇතුලත් කළ යුතුය. තිරසාර සංවර්ධන ක්‍රමෝපායන් තුළට යෝග්‍ය පියවර ඒකාබද්ධ කිරීම එම ඉලක්ක සපුරාගැනීමේදී වඩාත් ඵලදායී වන අතර එමඟින් ස්වභාවික සම්පත් මතට ඇතිවන පීඩනය අවම කරමින්. පාරිසරික අවදානම් කළමනාකරණය ප්‍රවර්ධනය, දුගී ජනතාවගේ සමාජ සුබසාධනය ඉහළ නැංවීමටද හැකියාව ලැබේ.
- අවසානයේ ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ විද්‍යාඥයන් වඩාත් නිවැරදි නියං අනතුරු ඇඟයීම පද්ධතියක් මෙන්ම උචිත සහන වැඩසටහන් සහ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයන් සැකසීම උදෙසා එකට එක්විය යුතුය.

## ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ සහල් නිෂ්පාදන වැඩි කිරීම උදෙසා භූමි විශේෂිත නිර්දේශ වැඩිදියුණු කිරීම

තෙත් කලාපයේ වී වගාකරන්නා වූ ඉඩම්, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වියළි කාලයන්හිදී ජාතික සහල් නිෂ්පාදනය අතිරික්තයක් ලෙස තබා ගැනීම ඉතාවැදගත් වන අතර සහල් නිෂ්පාදනය ඉහළ දැමීම උදෙසා පසෙහි සාරවත්බව වැදගත් පරාමිතියකි. මෙම කලාපයේ සැලකිය යුතු භූමි ප්‍රමාණයක වී වගාව සඳහා ගැටළුකාරී වන පස පැතිරී ඇති හෙයින් පහතරට තෙත් කලාපයේ පසෙහි සාරවත් බව ප්‍රවර්ධනය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. භූමි වර්ගයට හා සම්බන්ධව පසෙහි සාරවත්බව ලක්ෂණීකරණය උදෙසා පරීක්ෂණයක් සිදු කරනු ලැබීය. පළමු පෙළ නිම්න, ඉහළ පෙළ නිම්න, පහත් බිම් සහ පිරුණු කලාප යන භූමි වර්ග 4න් බීජ වගා පසෙහි (0-20

cm) ක අතර වූ මතුපිටෙන් පස් සාම්පල එකතු කරනු ලැබීය. මෙම පාංශු සාම්පලහි PH අගය විද්‍යුත් සන්නායකතාවය ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස්, හුවමාරු කරගත හැකි පොටෑසියම් සහ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය විශ්ලේෂණය කෙරිණි. මෙම සියලුම භූමිවර්ගයන්හි PH අගය 3.9 -4.3 අතර ප්‍රමාණයක විය. ඒ අනුව පහතරට තෙත් කලාපයේ ආම්ලික පසක් ඇති බව දක්නට ලැබිණි. එමනිසා මෙම කලාපයට භාෂ්මික ද්‍රව්‍ය යෙදීම ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවීය. එමනිසා මෙම තත්ත්වයට ඔරොත්තු දෙන, යෝග්‍ය වූ සහල් ප්‍රභේද අභිජනනය අත්‍යාවශ්‍ය වේ. විද්‍යුත් සන්නායකතාව පිළිවෙළින් පළමු පෙල නිම්න, ඉහළ පෙළ නිම්න, පහත් බිම්, පිරුණු කළපු හි 0.07, 0.06, 0.10m 0.85 m විය. එමඟින් පහත් භූමිවල සාමාන්‍ය ලවණතාවයක් සහ පිරුණු කළපු වල ඉහළ ලවණතාවයක් පෙන්නුම් කෙරිණි. ප්‍රයෝජ්‍ය පොස්පරස් ප්‍රමාණය සියලුම වර්ගවල පසෙහි 7.8 – 9.7 අගයක් පෙන්නුම් කළ අතර එමඟින් සියලුම පස්වර්ගයන්ගේ. ප්‍රයෝජ්‍ය පොස්පරස් අඩු අගයක විය. එමඟින් මෙම කලාපයේ ෆොස්ෆරස් නිවැරදි ආකාරයට උපයෝගී කර ගැනීම දිරිමත් කෙරිණි. හුවමාරු කළ හැකි පොටෑසියම්, පළමු පෙල නිම්න, ඉහළ පෙළ නිම්න, පහත් බිම් සහ පිරුණු කළපු හි පිළිවෙලින් 69,80.94 හා 119 විය. එමගින් පළමු පෙළ නිම්න හී අවම K මට්ටමක් ඇතිබව පෙන්නුම් කෙරිණි. එම භූමි වර්ගයට K අඩංගු පොහොර යෙදීමට අවශ්‍ය වේ. පාංශු කාබනික ප්‍රමාණය සියලුම පස්වර්ගයන්හි 5 – 11.1% අතර ප්‍රමාණයක වූ අතර එමඟින් මෙම කලාපයේ පසෙහි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණවත් ලෙස පවතින බව පෙන්නුම් කෙරිණි. එමනිසා මෙම කලාපයේ වී වගාව සඳහා කාබනික ද්‍රව්‍ය නඩත්තුව උදෙසා කාබනික පොහොර අවශ්‍ය නොවේ.

## ශ්‍රී ලංකාවේ මැදරට තෙත් කලාපයේ වී වගා පසෙහි පාංශු සාරවත්බව පාරමිතීන්හි අවකාශමය ලක්ෂණ

ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම වියලි කාලයන්හිදී ජාතික සහල් නිෂ්පාදන අතිරික්තයක් තබා ගැනීමට තෙත් කලාපයේ වී වගා භූමි ප්‍රදේශ ඉතා වැදගත් වන අතර මෙම බෝගයේ නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා පාංශු සාරවත්බව ඉතා වැදගත් පාරමිතියකි. මැදරට තෙත් කලාපය මේ සම්බන්ධව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පාංශු සාරවත් බව සහ එහි අවකාශමය විචල්‍යතාවය හඳුනාගැනීම උදෙසා අධ්‍යයනයක් සිදු කරනු ලැබීය. මේ කාර්ය සඳහා 2012 ජුලි මාසයේදී මහනුවර දිස්ත්‍රික්කයේ වට්ටපොල ග්‍රාමයේ හෙක්ටයාර 3.5ක් ආදර්ශන කුඹුරු ඉඩමක පාංශු සමීක්ෂණයක් සිදුකරනු ලැබීය. මෙම භූමියේ අඩු දිය සිලු පසක් ප්‍රධාන වශයෙන් දක්නට ලැබිණි. මතුපිට (0 – 20cm) ගැඹුරුක 50cm ජාල පරතරය තුළ පස් සාම්පල් 52ක් එකතු කරගනු ලැබ එම පස්වල PH අගය විද්‍යුත් සන්නායනතාවය, කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය, Sulphate “S”, හුවමාරු කළ හැකි k, mg සහ Ca ප්‍රමාණය, පසෙහි Zn, Cu සහ Fe ප්‍රමාණය. ජල සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණාගාරය, කෘෂිකර්ම පීඨයේ, අනුරාධපුර රජරට විශ්ව විද්‍යාලයේ විශ්ලේෂණය කරනු ලැබීය. මෙම පරීක්ෂණය මගින් පස් සාම්පල් PH අගය 5 -6.6 අතර ප්‍රමාණයක් පැවතුණු අතර එමගින් එම පස් සාම්පල් ආම්ලික ස්වාභාවයක් ගන්නා බව හෙළිදරවු විය. විද්‍යුත් සන්නායනතාවය ඉතා අඩු අගයක් (0.01 සිට 0.04 ds/m) වූ නමුත් පසෙහි අඩංගු Fe ප්‍රමාණය විෂ තත්ත්වයක් ඇති කරන මට්ටමකට ඉතාමත් ඉහළ අගයක් පෙන්නුම් කෙරිණි. භූමියේ වැඩි ප්‍රමාණයක උපරිම P මට්ටමක් (81%)

දක්නට ලැබූ අතර Mg ප්‍රමාණවත් මට්ටමක්ද (69%) Cu ඉහළ මට්ටම (85%) ක්ද දක්නට ලැබිණි. සම්පූර්ණ පස තුළ සල්ෆේට - S, Zn සහ Ca ප්‍රමාණවත් නොවන මට්ටමෙන් දක්නට ලැබූ අතර කාබනික ද්‍රව්‍ය සහ K ඉහළ මට්ටමවලින් දක්නට ලැබිණි. මෙම අධ්‍යයනය මගින් පාංශු සාරවත්බවෙහි සැලකිය යුතු අවකාශමය විචල්‍යතාවයක් පෙන්නුම් කරන බව හෙළිදරවු විය. සල්ෆෙට -S, Zn හා Ca මගින් විෂ සහිත බවක් ඇති කරන හෙයින් සීමා කළ යුතු බවත් පෙනී ගියේය. ඉහත ලවණතාවයන් නිවැරදිව අවම මට්ටමක තබා ගැනීම උචිත පිළියම් යෙදීම තුළින් සහල් නිෂ්පාදනය වැඩිකිරීම තහවුරු කෙරේ.

## අධි විභේදන චන්ද්‍රිකා ඡායාරූප පදනම් කොට කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ අස්වැන්න පිළිබඳ අනාවැකි පළකිරීම

යම් කන්නයකදී කුඹුරු ප්‍රමාණය, වී නිෂ්පාදනය සහ අවකාශමය ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යානයන් අස්වැන්න නෙළීමට පෙර ව්‍යුත්පන්න කරගැනීමේ හැකියාවක් ඇත්නම් ගබඩා පහසුකම් ලබාදෙමින් එම අවස්ථාවේදී නිෂ්පාදයත් සමඟ උචිත අවස්ථාවලදී අපනයනයන් වැනි කාර්යයන් උදෙසා කාලානුරූපීව මැදිහත් වී අඛණ්ඩ සහල් සැපයුමක් පවත්වා ගැනීම පිළිබඳ වැදගත් තීරණ ලබා ගැනීම උදෙසා ඉඩකඩ සපයයි. ශ්‍රී ලංකාවේ වී වගා භූමි ප්‍රමාණය සහ නිෂ්පාදනය උදෙසා සත්‍ය කාලීන ජාතික අනාවැකි පද්ධතියක් ඉලක්කගත කරමින් ජාතික කෘෂිකර්ම පර්යේෂණ අරමුදල් ප්‍රතිපාදිත පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබිණි. නියමු අධ්‍යයන ප්‍රදේශය ලෙස අම්පාර දිස්ත්‍රික්කය තෝරා ගනිමින් මෙම කාර්ය සඳහා භූ දර්ශන තොරතුරු පද්ධතියෙහිදී අධි හා සාමානය විභේදන චන්ද්‍රිකා ඡායාරූප පරීක්ෂා කෙරිණි. මිනුම්දෝරු දෙපාර්තමේන්තුව උපයෝගී කරගන්නා වූ භූමි සිතියම් මගින් ලබාගත් කුඹුරු ඉඩම් ව්‍යාප්ති සිතියම යාවත්කාලීන කිරීම උදෙසා දෘෂ්‍ය අර්ථනිරූපණය උපයෝගී කරගනිමින් කුඹුරු ඉඩම් සිතියම්ගත කිරීමට තිර සංඛ්‍යාංකනය ආධාර කොට (IKONOS සහ GEOEYEC – 2m විභේදක) චන්ද්‍රිකා ඡායාරූප මේ සඳහා උපයෝගී කරගනු ලැබිණි. පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹුරු වගාකළ ඉඩම් සිතියම, අමතර 15Km$^2$ සමඟ යාවත්කාලීන කරනු ලැබිණි. අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කුඹුරු ඉඩම් සිතියම් ගත කිරීම අවසන් කරනු ලැබීමට නියමිතය.

කුඹුරු වගා ඉඩම් කඩිනමින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ලෙස සාමාන්‍ය විභේදනය IRS LISS 111 (23.5 m) සහ අධි විභේදකය GEO EYE (4 m) සඳහා කොළ රතු අධෝරක්ත කලාපය සමඟ ස්වයංක්‍රීය සහ අධීක්ෂණ වර්ගීකරණ ප්‍රවේශය අගයනු ලැබීය.

වී වගා ඉඩම් හඳුනා ගැනීමේ කඩිනම් ක්‍රමවේදයක් ලෙස ස්වංයක්‍රීය සහ අධීක්ෂණ වර්ගීකරණ ප්‍රවේශය, IRS LISS 111 (23.5 M ) සාමාන්‍ය විභේදකය සහ GEO EYE (4M) අධි විභේදනය සඳහා කොළ රතු අධෝරත්න (1-2-3) කලාපය සමඟ අගයනු ලැබීය. (1) ප්‍රමිතකෘත විෂමතා ශාක ගහණ දර්ශකය (Normalized Differenced Vegetation Index) කොටස්වලට බෙදීම (2) අධීක්ෂණ වර්ගීකරණය යටතේ උපරිම ජීවනෝපා ඇල්ගොරිතමය (maximum Livelihood algorithm : සහ (3) අවම දුර ඇල්ගොරිත්මය (Minimum Distance algorithm) යන වර්ගීකරණ ප්‍රවේශයන් යටතේ වී වගා භූමි අගයනු ලැබීය. පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙම වර්ගීකරණ ප්‍රවේශයන් මඟින් ඇස්තමේන්තුගත වී වගා ප්‍රදේශ පිළිවෙලින් වර්ග කිලෝමීටර් 30.7,17.9 සහ 24.5 වූ අතර තිරය

ඩිජිටල්ගතකරණය කිරීම තුළින් ඇස්තමේන්තුගතව සකස් කළ වී වගා ප්‍රදේශය වර්ගකිලෝමීටර් 19.8 විය. මෙම ක්‍රමවේදයම උපයෝගී කරගනිමින් මෙම වර්ගීකරණ ප්‍රවේශය වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාවල් හි අගයනු ලබයි.

## දියබෙත්ම පදනම් සංරක්ෂණ සැලසුම් සඳහා භූදර්ශන තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සංවේදක උපයෝගීතාව

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ පවතින නිරතුරුව ඇතිවන වැසි කුණාටු තත්වයත් සමඟ පස සංරක්ෂණය උදෙසා වඩාත් ඵලදායී සංරක්ෂණ ක්‍රමෝපායක් සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ. කෙසේවුවද සම්පත්වල පවතින සීමිතබව හේතුවෙන් සංරක්ෂණය උදෙසා විශාල ජලාශයන්හි සම්පූර්ණ දියබෙත්ම එක් ඒකකයක් ලෙස ප්‍රතිකර්ම කිරීම ප්‍රායෝගික නොවන තත්ත්වයක් බවට පත්වේ. ඉතාමත් කඩිනමින් ප්‍රතිකර්ම කළ යුතු ප්‍රදේශ ඉලක්කගත කරමින් සීමිත සම්පත් අවශ්‍ය පරිදි වෙන් කිරීමට ඉඩසැලසේ. (පස සෝදායාම පදනම් කොට දිය බෙත්ම උප දිය බෙත්ම ලෙස ප්‍රමුඛගත කිරීම තුළින්) වික්ටෝරියා ජල පෝෂක ප්‍රදේශය සඳහා ලැන්ඩ් සැට් (30m විභේදන) චන්ද්‍රිකා ඡායරූප සහ දැනට පවතින විෂයට අදාළ අනෙකුත් තේමාගත තොරතුරු උපයෝගී කරගනිමින් භූදර්ශන තොරතුරු පද්ධතියෙහි සහ දුරස්ථ සංවේදක ප්‍රවේශයේ හැකියාව අගයනු ලැබීය. චන්ද්‍රිකාගත දත්තයන්හි අධීක්ෂණ වර්ගිකරණය මගින් ව්‍යුත්පන්න කළ භූමි වැස්ම සිතියම් උපයෝගී කරගනිමින් බාදනය සඳහා භූමි වැස්මේ බලපෑම අගයනු ලැබීය. මුහුදු මට්ටමේ සිට උස දක්වන රේඛා (උන්නතාංශ රේඛා) 1:50,000 භූවිෂමතා සිතියම මඟින් ව්‍යුත්පන්න කළ ඩිජිටල් උන්තාංශ ආදර්ශ සමඟ අවකාශමය ආදර්ශ ක්‍රමෝපාය උපයෝගි කරගනිමින් බෑවුම්, ජලප්‍රවාහන රේඛාව, උප දියබෙත්ම සහ ජල පෝෂක මායිම් ඇතුලත්ව බිම් ප්‍රදේශ පරාමිතීන් උද්ධෘත කරගනු ලැබීය. පස සෝදායාම, පස සෝදායාමට හේතුකාරක වන්නාවූ සාධක (භූමිවැස්ම, පස බාදනය වන ස්වභාවය, වර්ෂාවට සේදීයාම, බෑම්) උපයෝගී කරගනිමින් පාංශු බාදනය අගයනු ලැබීය. බාදනයට හේතුකාරකවන්නා වූ සාධක අගයමින් එම සාධකයන්ට අගයක් ලබාදීමෙන් ගණනය කළ සමුච්චිත බාදක දර්ශකය උපයෝගී කොට බාදනයට ලක්වූ ප්‍රදේශ හඳුනාගනු ලැබීය. ඉතාමත් ඉහළ බාදන මට්ටමකට ලක් වන්නා වූ භූමි ප්‍රදේශ සලකා බලමින් උපදියබෙත්ම ප්‍රමුඛකරණ සිතියම ව්‍යුත්පන්න කරනු ලැබීය. විභව පාංශු බාදනයට ලක්වීමේ හැකියාව පදනම් කොට බාදන අවදානම සහ උපදියබෙත් ප්‍රමුඛගත කරණය පිළිබඳ තොරතුරු උත්පාදනය කිරීමේ කඩිනම් ක්‍රමවේදයක් මෙම අධ්‍යයනයෙන් නිදර්ශනය කළේය.

## තිරසාර භූමි කළමනාකරණයක් උදෙසා භූමි භාවිත ඇගයීම

අවකාශමය සහ තාවකාලික ශ්‍රේණි කිහිපයකම වියලි භූමි පාරිසරික පද්ධති, දියබෙත්ම සහ ගංගා ද්‍රෝණි, කාබන් තැන්පත් වීම, අවකාශමය සහ කාලික මානයන් පරාසයක ජෛවීය විවිධත්වය කෙරෙහි භූමි භාවිතයෙහි බලපෑම, ස්වභාවය, ප්‍රමාණය, තීව්‍රතාව ඇගයීම සහ ගණනය කිරීම පිණිස උපකරණ සහ ක්‍රමවේද වැඩිදියුණුකිරීම උදෙසා 2012 වර්ෂයේදී "දකුණු ආසියාවේ තිරසාර භූමි කළමනාකරණ සහ කාලගුණික වෙනස්වීම් අනුවර්තනය සඳහා භූමිභායන ඇගයීම් සහ සමීක්ෂණය" පිළිබඳ කලාපීය ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. මෙමගින් භූමිභායනය අඩු කරමින් තිරසාර භූමි භාවිත සහ කළමනාකරණ පිළිවෙත් ගොඩනැගීමට ජාතික, කලාපීය සහ ජාත්‍යාන්තර හැකියාව විශ්ලේෂණය, නිර්මාණය, සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම

උදෙසා මැදිහත්වීමට ඉඩකඩ සැලසේ. මෙම ව්‍යාපෘතිය සඳහා ආහාර හා කෘෂිකාර්මික සංවිධානය අරමුදල් ප්‍රතිපාදනය කරනු ලබන අතර බංගලාදේශය, භූතානය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන ව්‍යාපෘති රටවල් හතරෙහි තාක්ෂණික කණ්ඩායම්වලින් සමන්විත වේ. ව්‍යාපෘති කාල වසර 3කි. දත්ත ලේඛන ලබාගත හැකි බව සහ භූමිහායන ඇගයීම සහ කාලගුණික වෙනස්වීම් වලට එම දත්තයන්හි අදාළ බව පරීක්ෂා කරනු ලැබූ අතර දත්ත අතර පවතින අන්තරයන් හඳුනාගනු ලැබීය. 2013 වසරේදී ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

## බෝග යෝග්‍යතාවය ඇගයීම සහ සිතියම්ගත කිරීමේ කලාපීය පරිමාණ - ඌව පළාත

අධිකභාවිතය, අනිසිභාවිතය සහ අඛණ්ඩව ආර්ථික, සමාජ සහ පාරිසරික බලපෑම් භූමි සම්පත් හායනය මෙන්ම රටේ භූමි සම්පත කෙරෙහි ඇති වන පීඩනයද ඉහළ යාමට හේතු වී තිබේ. ප්‍රධාන ඉහළ දියබෙත්ම ප්‍රදේශයන්හි යෝග්‍ය නොවන භූමි ප්‍රදේශයන්හි වගාව සහ නිවෙස් සෑදීම උග්‍ර ගැටළුකාරී තත්ත්වයකි මේ හේතුවෙන් භූමියේ ඵලදායීබවට සැලකිය යුතු තර්ජනයක් ඇති කරවන බවට හඳුනා ගෙන ඇති අතර මෙයට අමතරව ජලවිදුලිය සහ වාරිමාර්ග කටයුතු සඳහා පහලට ගලා එන ජලාශ සෑදීමද මෙයට තවත් හේතුවක් ලෙස හඳුවාගෙන ඇත. ශ්‍රී ලංකාවේ විශාලම පළාත වන ඌව පළාතෙහිද සතුටුදායක තත්ත්වයක් නොමැත. සැලකිය යුතු ජලාශ ප්‍රමාණයක් ආරම්භවී පහලට ගලා එන මධ්‍යම කඳුකරයේ විශාල භූමි ප්‍රමාණයක් මෙම පළාත මඟින් ආවරණය වේ. එමනිසා මධ්‍යම කඳුකරයේ භූමි හා ජල සම්පත නිසා පමණක් නොව පහත්බිම් භාවිත කරන්නන්ගේ ජලය ලබාගත හැකි බව තහවුරු කිරීමටද මෙම ප්‍රදේශයේ භූමි සහ ජල සම්පත් තිරසාර කළමනාකරණය ඉතා වැදගත් වේ.

එමනිසා දිගු කාලීන තිරසාර බව තහවුරු කිරීම උදෙසා පළාතේ දැනට පවතින වර්තමාන තත්ත්වය හඳුනා ගනිමින් ප්‍රදේශය සඳහා උචිත භූමිවල සම්පත් කළමනාකරණ ප්‍රවේශයක් පළාත් සහ ප්‍රාදේශිය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. එමනිසා භූමිහායන තත්ත්වය පෙන්නුම් කරන්නාවූ දිස්ත්‍රික්ක මට්ටමේ සිතියම් ප්‍රමුඛගත කිරීම, පාංශු හා ජල සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ බෝග යෝග්‍යතා සිතියම සැකසීම හා භූමි භාවිතයේ සැලකිය යුතු වෙනස්කම් අවශ්‍ය වනු ලබන ප්‍රදේශ හඳුනාගැනීමට සහ සිතියම්ගත කිරීම මෙම අධ්‍යයනයේ අපේක්ෂිත ප්‍රතිඵලයන් වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුදල් ප්‍රතිපාදන ඇතිව මෙම අධ්‍යයනය සිදු කෙරේ.

## ග්‍රාම නිලධාරි කොට්ඨාශ පදනම් බෝග නිර්දේශ පිළිබඳ ඩිජිටල් සම්පාදන

කෘෂි - පාරිසරික ප්‍රදේශ පිළිබඳ බෝග නිර්දේශ මඟින් රටේ විවිධ ප්‍රදේශයන් සඳහා යෝග්‍ය බෝග තෝරා ගනු ලබයි. කෘෂි - පාරිසරක වෙනස්කම් තත්ත්වයන් හේතුකොට ගෙන බෝග අස්වැන්න තැනින් තැනට වෙනස් වේ. වඩාත් හොඳ බෝග වගාව සහ වැඩි අස්වැන්න ලබාගැනීම් උදෙසා උපරිම තත්ත්වයට අවශ්‍ය වනු ලැබේ. මෙම අවශ්‍යතාවය සපුරාගැනීම උදෙසා 1990දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ග්‍රාම නිලධාරි මට්ටමෙන් බෝග නිර්දේශ සඳහා අත්පොතක් සකස් කරනු ලැබිණි. මූලිකවම මුදල් බෝග සඳහා භාවිතා අත්පොතක් ලෙස මෙය සකස් කළ අතර වාණිජමය මට්ටමේ ගොවීන්, පර්යේෂකයින්, ව්‍යාප්ත නිලධාරීන් සහ ප්‍රතිපත්ති සකස් කරන්නන් උදෙසා මෙය

වඩාත් ප්‍රයෝජනවත් වේ. කෙසේ වුවද මෙම අත්පොත් දිගු කාලයකදී යාවත්කාලීන කරනු නොලැබූ අතර කඩිනමින් තොරතුරු බලාගැනීම උදෙසා පහසු ලෙස භාවිත කල හැකි ආකාරයට මෙහි තොරතුරු අඩංගු නොවේ. එමනිසා මෙම ව්‍යාපෘතිය මඟින් භාවිත කිරීමට පහසු ඩිජිටල් කළමනාකාර තොරතුරු පද්ධතියන් (MIS) සහ බෝග නිර්දේශ පිළිබඳ යාවත්කාලීන තොරතුරු, බෝග අස්වැන්න නෙලන කැලැන්ඩරය, ඉහත ගැටලුව සඳහා විසඳුම් ලෙස කෘෂි - පාරිසරික තොරතුරු ඩිජිටල් සම්පාදනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මෙම ඩිජිටල් කළමනාකරණ තොරතුරු පද්ධතිය සියලුම භාවිතා කරන්නන්ට විශ්වාසදායී තොරතුරු වෙත ප්‍රවේශ වීමටද මෙම ගැටලුව වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී ආකාරයට විසඳීමටද ආධාර වේ.

## වියළි කලාපයේ වර්ෂාපෝෂිත කඳුකරයේ බහුකාර්යය පාංශු සංරක්ෂණ වේලි පද්ධතිය

පාංශු ඛාදනය, වියළි කලාපයේ වාර්ෂාපෝෂිත කඳුකරයේ ප්‍රධාන ගැටළුවකි. මෙම ගැටලුව අවම කිරීම උදෙසා පාංශු වැටි ඉදිකිරීමත් සහ බඩවැටි ඉදිකිරීම හා වෙටිවර් තණකොළ පේළි වගාකිරිමත් නිර්දේශ කරනු ලැබුවද විවිධ හේතුන් මත බොහෝ ගොවිහු මෙම පිළියම් අනුගමනය කරනු නොලබයි. මෙවැනි ක්‍රම උපයෝගී කර ගැනීම මඟින් ආර්ථික ප්‍රතිලාභ නොලැබීම මෙයට ප්‍රධාන හේතුව වන අතර එමනිසා ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන ප්‍රතිකර්ම ගොවි බිම් වල යෙදීමට ඔවුහු අකමැති වෙති. එකිනෙකින් බැඳුණු සංරක්ෂිත ප්‍රතිකර්මයන්හිදී භූමි සකස් කිරීමට යන්ත්‍රෝපකරණ යොදාගැනීමේ අපහසුතාවද ගොවි ක්ෂේත්‍ර වලදී අවම වශයෙන් මෙම ප්‍රතිකර්ම උපයෝගී කර ගැනීමට තවත් හේතුවකි. එමනිසා සාම්ප්‍රදායික සංරක්ෂණ ප්‍රතිකර්ම වෙනුවට බහුකාර්යය පාංශු සංරක්ෂණ වේලි වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණයේ ඉලක්කයයි. මෙම යෝජිත සංරක්ෂණ වේලි. පාංශු සංරක්ෂණය, පිටාර ජල කළමනාකරණය, වැසි දිය සංරක්ෂණය කන්න සහ ස්ථාවර බෝගයන්හි ආර්ථික ප්‍රතිලාභ, මෙම යෝජිත පාංශු සංරක්ෂණ වේලි වැඩිදියුණු කිරීම මඟින් ලබා දේ. මෙම යොජිත පාංශු සංරක්ෂිත වේලි 90 cm ගැඹුරු, 60 cm ක උසකින්ද සමන්විත වේ. මෙම වැටිවල වගාව සඳහා කතුරුමුරුංගා, මිටි මුරුංගා, තිබ්බටු, දෙළුම්, සේර සහ කුරුඳු පරීක්ෂා කෙරෙමින් පවතී. 2012/2013 දී මහඉලුප්පල්ලමේදී මෙම පර්යේෂණය ආරම්භ කරනු ලැබූ අතර මෙම ප්‍රතිකර්මයෙහි දිගු කාලීන බලපෑම් අධ්‍යයනය කිරීම උදෙසා අඛණ්ඩව කන්න පහකදී මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි.

## තාක්ෂණ හුවමාරුව

### පාංශු සහ ජල සංරක්ෂණ, භූමි සංවර්ධන සහ අදාල විෂය ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු

- ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ අලුතෙන් බඳවාගත් නිලධාරීන් (පර්යේෂණ නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන් සහ කතිකාචාර්ය) සඳහා පාංශු සංරක්ෂණය සහ භූමි සංවර්ධනය පිළිබඳ දින 5 පුහුණු වැඩසටහන් 2ක් පවත්වනු ලැබිණි. නිලධාරිහු 60දෙනෙක් පුහුණු කරනු ලැබීය.
- වාණිජ මට්ටමේ ගොවීන් හට භූමි සංවර්ධනය පිළිබඳ දින 3 පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය. මේ යටතේ වාණිජ මට්ටමේ ගොවීන් 19 දෙනෙකු පුහුණු කරනු ලැබීය.
- හදබිම අධිකාරියේ කාර්මික නිලධාරීන් 35දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය සහ ජලධාර කළමනාකරණය පිළිබඳ දින 2ක වැඩසටහනක් පවත්වනු ලැබීය.

- විශ්වවිද්‍යාල සිසුන් (ජයවර්ධනපුර, රජරට,කැළණිය), කරපිංචා, කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමාධාරීන්, නවයාලතැන්න දිස්ත්‍රික්ක පුහුණු මධ්‍යස්ථානය සහ විවිධ පාසැල් සිසුන් සහ ගුරුවරුන් සඳහා පාංශු සහ ජල සංරක්ෂණෂය පිළිබඳ දින 1ක පුහුණු වැඩසටහන් 12ක් පවත්වනු ලැබීය. මෙහිදී 240දෙනෙකු පුහුණු කරනු ලැබීය.

**පාංශු සහ ජල සංරක්ෂණ නිදර්ශන**

- නිල්ලඹේ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ අවශ්‍ය පාංශු සහ ජල සංරක්ෂණ ඒකකයෙන් අක්කර 5ක භූමි ප්‍රදේශයක් නියමු නිදර්ශනයක් ලෙස සකසනු ලැබීය. ගොවි බිම් සහ වගා නොකල බිම් වල පාංශු සංරක්ෂණය සහ ජල සංරක්ෂණ ප්‍රතිකර්ම පිහිටුවීම පිළිබඳව තාක්ෂණික මාර්ගෝපදේශනයන්හිදී වැඩි අවධානයක් යොමු කරනු ලැබීය.
- බිඳුණුවැව සේවා සංස්කරණ පුහුණු ආයතනයේ දැනට පවතින නියමු නිදර්ශනය සඳහා අක්කරයක භූමි ප්‍රමාණයක් එකතු කිරීම උදෙසා තනි තනි තෘණ භූමි, SALT සහ සමෝච්ච කාණු සහ වෙනත් වර්ගයේ පාංශු සහ ජල සංරක්ෂණ පිළිවෙත් නිදර්ශනය කිරීම පිණිස සලකුණු කරනු ලැබීය.
- සීතාඑළිය පර්යේෂණ මධ්‍යස්ථානයේ නිදර්ශන ප්‍රදේශයේ සංරක්ෂණ ව්‍යුහය වැඩිදියුණු කිරීම හා නඩත්තුව.
- පේරාදෙණිය උද්‍යාන බෝග පර්යේෂණ සංවර්ධන ආයතනයේ නිදර්ශන භූමියේ පාංශු සහ ජල සංරක්ෂණ ව්‍යුහයන් වැඩිදියුණු කිරීම සහ නඩත්තුව.

## ගුවන් විදුලි වැඩසටහන

- පාංශු හා ජල සංරක්ෂණය, දියබෙත්ම කළමනාකරණය, කෘෂි කාලගුණික විද්‍යාව සහ කාලගුණ වෙනස්වීම්, ජල කළමනාකරණය සහ පාංශු සංරක්ෂණ පනත පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 6ක් (කඳුරට සහ වයඹ සේවය) පැවැත්විණි.

## රූපවාහිනි වැඩසටහන්

- පාංශු සහ ජල සංරක්ෂණය, කෘෂි කාළගුණ විද්‍යාව සහ කාළගුණික වෙනස් වීම් සහ පාංශු සංරක්ෂණ පනත පිළිබඳව රූපවාහිනි වැඩසටහන් 6කට ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීහු සහභාගි වූහ.

## වැඩමුළු

- " ජල සහ ආහාර සුරක්ෂිතබව" යන මාතෘකාව යටතේ 2012 ලෝක ජල දිනය සඳහා කලාපීය වැඩමුළුවක් පැවැත්විණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් 83ක්ද මධ්‍යම පළාතේ ගුරුවරුන්ද මෙයට සහභාගී විය.

## ප්‍රදර්ශන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වසර 100ක් පිරීම නිමිත්තෙන් " සියවස් සැමරුම්" ප්‍රදර්ශනය සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණය මධ්‍යස්ථානයේ නිලධාරීහූ විවිධ කාර්යයන්හි නිරත වූහ.

- ශ්‍රී ලංකාවේ සත්‍ය වශයෙන් දක්වන ලැබෙන පස් වර්ග නියෝජනය කරමින් ගන්නෝරුව ප්‍රදර්ශනය භූමියෙහි ස්ථිර ආදර්ශ පාංශු සිතියමක් සැකසීම.
- අධ්‍යාපනික කටයුතුවලදී උපයෝගී කර ගැනීම උදෙසා ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පස් වර්ග 14 නියෝජනය කරමින් පස් සාම්පල පැකට් 21000ක් පාසල් සහ කෘෂිකාර්මික මධ්‍යස්ථාන වෙත බෙදා දෙනු ලැබීය.
- ගන්නෝරුව ප්‍රදර්ශනය භූමියෙහි පාංශු සංරක්ෂණ ප්‍රදර්ශන ස්ථානයේ වර්ෂා ජල සංරක්ෂණ ටැංකියක් ස්ථාපිත කිරීම.

- අගල් සංරක්ෂණ ව්‍යුහයන් ඇතුලත්ව උචිත යාන්ත්‍රික සහ කෘෂි සංරක්ෂණ පිළිවෙත් ක්‍රමෝපායන් ස්ථාපික කරමින් සහ යාවත්කාලීන කරමින් සංරක්ෂණ ස්ථානයේ දැනට පවතින පාංශු සංරක්ෂණ පිළිවෙත් ප්‍රවර්ධනය හා නිදර්ශනය.

**තාක්ෂණික සහාය**

- මධ්‍යස්ථානය සතු කාර්යයන් අතරින් එක් ප්‍රධාන කාර්යයක් වන්නේ තාක්ෂණික සහය සහ විශේෂඥ දැනුම ලබාදීමයි. 2012 වර්ෂය තුළදී පහත තාක්ෂණික සහයෝගයන් දෙනු ලැබීය.
- අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ "වී වගාවේ ක්ෂේත්‍රය සිතියම් ගතකිරීම උදෙසා දුරස්ථ සංවේදන පින්තූර වර්ගීකරණය ප්‍රවේශය" තේමාව යටතේ විද්‍යාවේදී ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරිමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම කෘෂි විද්‍යා පීඨය. රුහුණු විශ්ව විද්‍යාලය
- " වික්ටෝරියා ජල පෝෂක ප්‍රදේශයේ භූදර්ශන තොරතුරු පද්ධති සහ දූරස්ථ සංවේදන උපයෝගී කරගනිමින් පාංශු සංරක්ෂණය සඳහා උපදියබෙත්ම පුමුඛකරණය" යන තේමාව යටතේ විද්‍යාවේදි ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරිමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම, කෘෂි විද්‍යා පීඨය. රජරට විශ්වවිද්‍යාලය
- හොරණ කෘෂිකර්ම පර්යේෂණ ගොවිපළ සඳහා බෝග යෝග්‍යතා සිතියම් සැකසීම
- දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය සඳහා පාංශු සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුම සැකසීම
- මහඉලුප්පල්ලම ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ජාන බැංකුව වැඩිදියුණු කිරීම උදෙසා භූමි සිතියම්,රේඛා සිතියම්, පාංශු සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුම් සැකසීම
- අඹේපුස්ස ගොවිපලෙහි හෙක්ටහාර 10ක් සඳහා (තලගොල්ල කොට්ඨාශය) ජලප්‍රවාහන පැතිකඩ සැලසුමක් සැකසීම.
- අඹේපුස්ස ගොවිපලෙහි කුඩා ටැංකියක් ඉදිකිරීම සඳහා මූලික සිතියම් සැකසීම සහ ටැංකිය ඉදිකිරීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම.
- පහත සඳහන් අන්තර් පළාත් සඳහා අන්තර්පළාත් ප්‍රදේශ සිතියම් සැකසීම
    1. අනුරාධපුර
    2. මොණරාගල
    3. මහනුවර
    4. පොළොන්නරුව
- විධිමත් වාරිමාර්ග පද්ධතියක් ඉදිකිරීම උදෙසා පල්ලෙකැලේ, බලගොල්ල විවෘත බන්ධගාරය සඳහා රේඛා සිතියම් සැකසීම
- මධ්‍යම පරිසර අධිකාරිය සඳහා ජල සංරක්ෂණ සහ පිටාර ජල කළමනාකරණ සැලසුම් සැකසීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කෘෂිකර්ම ආයතන හා මධ්‍යස්ථාන ඇතුලත් කරමින් ශ්‍රී ලංකා සිතියම් සැකසීම
- පාංශු සහ ජල සංරක්ෂණ පිරිවිතර යාවත්කාලීන අත්පොත් සැකසීම සහ පාංශු සංරක්ෂණ ව්‍යුහ සඳහා ගෙවීම් කිරීම
- මහඉලුප්පල්ලම ගොවිපළ සඳහා පාංශු සංරක්ෂණය සහ භූමි වැඩිදියුණු කිරීමේ සැලසුමක් සැකසීම.
- "දැයට කිරුළ" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන භූමිය පාංශු සංරක්ෂණ සහ භූමි සංවර්ධන සැලසුම් සැකසීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුම් ප්‍රදර්ශණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම

- බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ ගොවිපළෙහි අක්කර 5ක භූමියෙහි පාංශු සහ ජල සංරක්ෂණ පිළියම් සඳහා මායිම් ලකුණු කිරීම
- බදුල්ල රිදීපාන වැඩිහිටි නිවාසයේ අක්කර 4.5ක භූමියක පාංශු සංරක්ෂණ සහ භූමි සංවර්ධන කාර්යයන් ඉටුකිරීම
- මඩවල, උල්පොත අක්කර 12, දෙල්තොට අක්කර 2ක් සහ කිතුලැල්ල අක්කර 3ක භූමි ප්‍රදේශයක් පාංශු සංරක්ෂණ සහ භූමි සංවර්ධන කාර්යයන් ඉටුකිරීම
- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය සඳහා භූමි සංවර්ධන සැලැස්මක් සැකසීම
- පේරාදෙණිය නායයාම් සිදුවන ප්‍රදේශයේ පාංශු සංරක්ෂණ ක්‍රියාදාම උදෙසා කාර්මික සහයෝගීතාවය ලබාදීම

### තාක්ෂණික කමිටු නියෝජනය

- විවිධ ජාතික සහ කලාපීය සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා පාරිසරික අනුමැති කමිටුව. ඉඩම් වෙන් කිරීම සහ හෝටල් ව්‍යාපෘති (20), ගල්වලවල් (50), කුඩා ජල විදුලි ව්‍යාපෘති (42), ගස් බිම හෙලීමේ ව්‍යාපෘති (40)
- යෝජිත "උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය" සඳහා තාක්ෂණික ඇගයීම කමිටුව
- බදුල්ල දිස්ත්‍රික්කයේ යෝජිත "මොරණ ජලාශ ව්‍යාපෘතිය" සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව

### මුද්‍රිත ප්‍රකාශන

- ශ්‍රී ලංකාවේ පිළිගත් පාංශු සහ ජල සංරක්ෂණ ප්‍රතිකර්ම පිළිබඳව දැනුවත් කිරීමේ පෝස්ටර් මුද්‍රණය කිරීම. පොස්ටර් 12,000ක් මුද්‍රණය කරනු ලැබූ අතර එයින් 8850ක් පාසැල්, ගොවිජන සේවා මධ්‍යස්තාන, කෘෂිකර්ම විද්‍යාල සහ පළාත් කෘෂිකර්ම ආයතනයන් අතර බෙදා හරිනු ලැබිණි.
- පාංශු සංරක්ෂණ පනත පිළිබඳව දැනුවත් කිරීමේ පත්‍රිකා මුද්‍රණය කිරීම. පත්‍රිකා 10,000ක් මුද්‍රණය කර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූවන් අතර බෙදා හරිනු ලැබීය.
- පාංශු සහ ජල සංරක්ෂණ තාක්ෂණ පොත මුද්‍රණය (තාක්ෂණ සංග්‍රහය) ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික නිලධාරීන්ගේ ලිපි එකතුවක් මෙම පොතෙහි අඩංගු වේ.

### පාංශු සංරක්ෂණ පනත

- වතු අංශයේ වගාකරුවන් (තේ,රබර්) පළාත් පාලන ක්ෂෙත්‍රයේ කෘෂි නිලධාරීන්, පාසල් ගුරුවරුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ නිලධාරීන් සඳහා පාංශු සංරක්ෂණ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 34ක් පවත්වනු ලැබිණි.
- පාංශු සංරක්ෂණ පනත පිළිබඳ පොදු මහජනතාව දැනුවත් කිරීම උදෙසා විශාල දැන්වීම් පුවරු 4ක් රම්බොඩ, කන්ද හන්දිය, කීර්ති බණ්ඩාරපුර සහ වැලිමඩ ස්ථාපිත කරනු ලැබුණි.
- මුලින් ස්ථාපිත කරනු ලැබූ පාංශු සංරක්ෂණ පනත පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු නඩත්තු කිරීම (දැන්වීම් පුවරු 6ක්)
- දුම්රිය ස්ථානයන්හි ප්‍රදර්ශණය කිරීම උදෙසා පාංශු සංරක්ෂණ පනත පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු (6 අඩි x 4 අඩි) 15ක් මුද්‍රණය

## නිලධාරීන් විසින් භාරගනු ලැබූ අනෙකුත් කටයුතු

### ජාතික මට්ටමේ අනෙකුත් ක්‍රියාවන්

- ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ

දේශගුණික වෙනස්වීම් උදෙසා ප්‍රජා මූලික අනුවර්තන වල ව්‍යාපෘතියට තාක්ෂණික උපදේශක ලෙස ක්‍රියාකිරීම

- ශ්‍රී ලංකාවේ, පරිසර අමාත්‍යාංශයේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ ජාතික විශේෂඥ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියාකිරීම
- ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපතිතුමාගේ මඟපෙන්වීම යටතේ මධ්‍යම කඳුකරයේ භූමි උපයෝගීතා ක්‍රමයන්හි බලපෑම් ඇගයීම පිළිබඳ විශේෂඥ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියාකිරීම
- මොන්ට්‍රියෙල් ගිවිසුම යටතේ ආනයන, අපනයන සහ නිෂ්පාදනයන්හි "හයිඩ්‍රො ක්ලොරොෆ්ලොරො කාබන්" නියාමනය පිළිබඳ ශ්‍රී ලංකා රජයේ අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ලබාදීම උදෙසා කමිටු සාමාජිකයෙකු ලෙස ක්‍රියාකිරීම
- ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් සංවිධානය කරනු ලැබූ 2012 සැප්තැම්බර් 5 – 6 දින වල වියට්නාමයේ දලාස් නුවර පැවැත්වූ හරිතාගාර විමෝචනය පිළිබඳ වැඩමුළුවේ ආරම්භක වැඩමුළුව
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ලෝක බැංකුව 2012 මාර්තු 21 -23 දින නේපාලයේ කත්මණ්ඩු නුවර "හින්දු - කාශ්මීර, හිමාල කලාපයේ ජල - කාලගුණික උපද්‍රවයන්" එළදායී ලෙස අවදානම් කළමනාකරණය සඳහා දැනුම හුවමාරු පිළිබඳ ව්‍යාපෘති
- ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කරනු ලැබූ කොරියානු ජනරජයේ සියෝල් නුවර 2011 - දෙසැම්බර් 13- 16 දිනවල "දේශගුණික වෙනස්වීම් සහ එහි කෘෂිකාර්මික බලපෑම" පිළිබඳ ව්‍යාපෘති
- චීන මහජන ජනරජයේ විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ චීනයේ බීජිං නුවර 2011 ඔක්තෝබර් 18-20 දිනයන්හි "දේශගුණික විපර්යාසයන්ට විසඳුම් සෙවීමේ විද්‍යා හා තාක්ෂණය පිළිබඳ දකුණු - දකුණු සහයෝගිතාවය පිළිබඳ වැඩමුළුව

### කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාල නඩත්තුව

වර්ෂාමය තත්ත්වයන් සහිත ස්ථාන 70ක් ඇතුළු කෘෂි - කාලගුණික නිරීක්ෂණ ස්ථාන 28කින් සමන්විත වන කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාලය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූලව නඩත්තු කරනු ලැබීය

### දත්ත වගු නඩත්තු කිරීම

විවිධ සේවාදායකයින්ට තොරතුරු ලබාදීම උදෙසා කෘෂි - කාලගුණික සහ ජල සම්පත් පිළිබඳ දත්ත වගු තොරතුරු එක්රැස් කොට පරිගණකගත කර නඩත්තු කරන ලදී.

## 2013 වසර සැලැස්ම

**පර්යේෂණ**

- ශ්‍රී ලංකාවේ කාලගුණික සහ වර්තමාන දේශගුණික වෙනස්වීම් සමීක්ෂණය
- දේශගුණික වෙනස්වීම් සහ විචල්‍යතාවයන්ට උචිත ආකාරයට අනුවර්තනය වීමේ ක්‍රමෝපායන් ලෙස එක් එක් කාලයන්හිදි දේශගුණික අනාවැකි පැවසීම
- බෝග වර්ධන ආකෘතිය තුළින් ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය සඳහා දේශගුණික වෙනස්වීම්හි බලපෑම් පිළිබඳ අධ්‍යයනය
- දේශගුණික ආදර්ශයන් උපයෝගී කොට ශ්‍රී ලංකාවේ අනාගත දේශගුණික ආදර්ශන සැකසීම
- අම්පාර, පොළොන්නරුව, හම්බන්තොට සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි (ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩසටහන අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති) අධි විභේදිත චන්ද්‍රිකා ඡායාරූප පදනම්ව

කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ අස්වැන්න පිළිබඳ අනාවැකි පැවසීම

- තිරසාර භූමි කළමනාකරණය සඳහා භූමි භාවිත ඇගයීම ( ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අරමුදල් ප්‍රතිපාදිත)
- කලාපීය බෝග අස්වනු අනාවැකි සහ දේශගුණික වෙනස්වීම් බලපෑම් ඇගයීම සඳහා උපකරණ කට්ටලයක් වැඩිදියුණු කිරීම ඇගයීම සහ උපයෝගී කරගැනීම (ජාත්‍යන්තර කෘෂිකර්මික පර්යේෂණ පිළිබඳ උපදේශක කණ්ඩායම (CGIAR) සහ දේශගුණික වෙනස්වීම් කෘෂිකර්ම සහ ආහාර සුරක්ෂිත (CCAFS) වැඩසටහන මඟින් අරමුදල් ප්‍රතිපාදිත
- බෝග විවිධාංගීකරණය සහ වාරිමාර්ග ජල කළමනාකරණය තුළින් වියළි කලාපයේ තෝරාගත් කුඩා ටැංකි උපයෝගී කරගනිමින් බෝග වැවීමේ හැකියාව ඉහළදැමීම (දිගු කාලීන පරීක්ෂණයකි)
- ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාශයන්හි උපයෝගී කර ගැනීම උදෙසා බෝග නිර්දේශ ඩිජිටල් සම්පාදනය
- වියළි කලාපයේ වර්ෂා පෝෂිත කඳුකරයේ බහුකාර්ය පාංශු සංරක්ෂණ වේලි පද්ධතියක් වැඩිදියුණු කිරීම
- වවුනියා දිස්ත්‍රික්කයේ නොගැඹුරු භූ ජලයේ ගුණාත්මක බව පිළිබඳ අධ්‍යයනය හා වවුනියා දිස්ත්‍රික්කයේ කුඩා ටැංකි වල ලවණතාවන්හි අවකාශමය ව්‍යාප්තිය අධ්‍යයනය

## තාක්ෂණික සහය

- සංවර්ධන වැඩසටහන් සඳහා පාංශු සංරක්ෂණ සහ පිටාර ජල ප්‍රවාහන කළමනාකරණ සැලසුම් සැකසීම
- විවිධ නියෝජිතයන් උදෙසා පාංශු සහ ජල සංරක්ෂණය පිළිබඳ විධිවිධාන

## වෙනත්

- පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
- කෘෂි - දේශගුණික, භූමි සහ ජල සම්පත් පිළිබඳ දත්ත වගුව නඩත්තුව
- කෘෂි කාළගුණික නිරීක්ෂණ ජාලය නඩත්තුව
- සංවර්ධන වැඩසටහන් සහ පාරිසරික සමීක්ෂණ කමිටු සඳහා පාරිසරික අනුමැතිය ලබාදීමට තාක්ෂණික ඇගයීම් කමිටු වැනි තාක්ෂණික කමිටු නියෝජනය

## කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 07 |
| කෘෂිකර්ම නිලධාරී | 02 |
| විෂය සම්බන්ධ විශේෂඥ | 01 |
| පර්යේෂණ සහකාර | 01 |
| කෘෂිකර්ම උපදේශක | 07 |
| පාංශු මිනුම්දෝරු | 04 |
| වැඩසටහන් සහකාර | 02 |
| උපාධිධාරී සහකාර | 02 |
| පර්යේෂණ උපසහකාර | 02 |
| පරිපාලන නිලධාරී | 01 |
| කළමනාකරණ සහකාර සේවය | 05 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 05 |
| මුරකරු | 02 |
| කම්කරු | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 02 |
| එකතුව | **48** |

# 2.1. බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිරි දැක්ම වන්නේ බීජ කර්මාන්තය සංවර්ධනය කිරීම, බීජවල තත්ත්වය සහතික කිරීම, උසස් තත්ත්වයේ පළිබෝධනාශක පමණක් දිවයිනට ප්‍රවේශ වීම සීමා කිරීම සහ ඒවා ආරක්ෂාකාරීව භාවිතා කිරීම සහතික කිරීම හා ජනකප්ලාස්ම සංරක්ෂණය, පැළෑටි ස්වස්ථතාව සහ පරිසරය රැක ගැනීමයි. මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපැයීම සහතික කිරීම, ජාතියේ සෞභාග්‍යය උදෙසා ආරක්ෂාකාරී සහ ඵලදායී පළිබෝධනාශක භාවිතය ඇතුළු සුදුසු පළිබෝධ කළමනාකරණයක් මගින් කෘෂිකාර්මික විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමයි.

මෙම මධ්‍යස්ථානය බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්ත්ව පාලනය, ජාන සම්පත් සංරක්ෂණය සහ තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා නියාමන විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින් ජාතියේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා කටයුතු කරයි. මෙය බීජ සහතික කිරීමේ සේවය, පැළෑටි සංරක්ෂණ සේවය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය සඳහා ප්‍රධාන කළමනාකරණ ආයතනය වශයෙන් ක්‍රියා කරන අතර තත්ත්වය සහතික කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය පැවතීම සහතික කිරීම පැළෑටි සංරක්ෂණය සහ කෘෂිකාර්මික පළිබෝධනාශක පාලනය වැනි වැදගත් සේවා ගොවීන්ට සැපයීමේ වගකීම දරයි.

බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය පහත සඳහන් පනත්වලට අදාළ නියාමන කාර්යයන්හි ද නියැළේ.

- 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත
- 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත
- 2003 අංක 22 දරන බීජ පනත

මෙම මධ්‍යස්ථානය ජාතික පැළෑටි සංරක්ෂණ සංවිධානය වශයෙන්ද, උද්භිද ස්වස්ථතා තොරතුරු සහ පැළෑටි පළිබෝධ හෝ පැතිරීම පිළිබඳ ජාතික විමසුම් ඒකකය වශයෙන් ද කටයුතු කරයි.

2012 ඔක්තෝබර් මාසයේ සිට මෙහි පරිපාලනමය වෙනසක් සිදු විණි. පෙර බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ සේවයේ පරිපාලනය යටතේ පැවති ජාතික පැළෑටි නිරෝධායන සේවය සහ වරායේ හා ගුවන් තොටුපළෙහි ඇති පැළෑටි නිරෝධායන ඒකක දෙක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු පාලනය යටතට පත් කෙරිණි.

## අයවැය

**වගු අංක 2.1.1 : වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 30,861,629 | 18,284,427 | 59 |
| පුනරාවර්තන | 44,576,000 | 43,165,997 | 97 |
| එකතුව | 75,437,629 | 61,450,424 | 82 |

## ප්‍රගතිය

### ආනයන බලපත්‍ර

පහත දැක්වෙන කාණ්ඩ වෙනුවෙන් 2012 ජනවාරි 01 සිට සැප්තැම්බර් 24 දක්වා ප්‍රවේශ කොන්දේසි සහිත ආනයන බලපත්‍ර නිකුත් කරන ලදී. සැප්තැම්බර් මාසයෙන් පසු ආනයන බලපත්‍ර නිකුත් කරන ලද්දේ ජාතික පැළෑටි නිරෝධායන සේවය විසිනි.

වගු අංක **2.1.2 :** ආනයන බලපත්‍ර නිකුත් කිරීම

| බලපත්‍ර වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| එළවළු බීජ | 695 |
| නැවුම් පලතුරු | 596 |
| පැළෑටි සහ පැළෑටි ද්‍රව්‍ය | 660 |
| පැළෑටි නිෂ්පාදන | 187 |
| බීජ අර්තාපල් | 13 |
| සත්ත්ව ආහාර | 99 |
| ආගමික කටයුතු සඳහා ගන්නා කැපූ මල් | 19 |
| මනුෂ්‍ය පරිභෝජනය සඳහා වන නිපැයුම් | 32 |
| ජෛව කාරක | 02 |
| නියාමනයට යටත් වන වෙනත් භාණ්ඩ | 01 |
| එකතුව | **2304** |

## බීජ අර්තාපල් ආනයන (2012 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා)

වගු අංක **2.1.3 :** බීජ අර්තාපල් ආනයන

| රට | ආනයනය කළ ප්‍රමාණය (මෙ. ටො) | නිදහස් කළ ප්‍රමාණය (මෙ. ටො) | විද්‍යාගාර පරීක්ෂා (තොග සංඛ්‍යාව) | ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය (මෙ. ටො) | ප්‍රතික්ෂේප කිරීමට හේතු |
|---|---|---|---|---|---|
| නෙදර්ලන්තය | 400 | 400 | | - | - |
| අ.එ.ජ | 100 | 100 | | - | - |
| ප්‍රංශය | - | - | | - | - |
| ජර්මනිය | 75 | 75 | | - | - |
| **එකතුව** | **575** | **575** | | **-** | **-** |

## එළවළු හා පලතුරු බීජ ආනයන

අවශ්‍ය වැදගත් තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා එළවළු බීජ ආනයනය පිළිබඳ ජාතික දත්ත මූලයක් සකස් කෙරෙමින් තිබේ. මෙය 2004 වර්ෂයේ සිට නිකුත් කරන ලද බලපත්‍රවලට අදාළ සියලුම තොරතුරු සහ වරායෙහි හා ගුවන් තොටුපළෙහි ඇති පැළෑටි නිරෝධායන ඒකක මගින් සිදුකළ සත්‍ය බීජ ආනයන

පිළිබඳ තොරතුරු ලබාදීම සඳහා උපකාරී වනු ඇත.

2012 වර්ෂයේදී ආනයනය කරන ලද එළවළු හා පලතුරු බීජ ප්‍රමාණයන් පහත වගුවෙන් දැක්වේ.

**වගු අංක 2.1.4 : වරාය සහ ගුවන් තොටුපළ මගින් ආනයනය කරන ලද එළවළු හා පලතුරු බීජ ප්‍රමාණයන් (2012 ජනවාරි - දෙසැම්බර්)**

| භෝගය | වරාය/බීජ (කි.ග්‍රෑ.) | ගුවන් තොටුපළ /බීජ (කි.ග්‍රෑ.) | ආනයනය කරන ලද මුළු බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|
| බැසිල් | 0 | 2 | 2 |
| බෝංචි | 534,108 | 6 | 534,114 |
| බීට් | 22,187 | 1,051 | 23,238 |
| බෙල් පෙපර් | 0 | 9 | 9 |
| කරවිල | 2,229 | 2,123 | 4,352 |
| බොට්ල් ගෝඩ් | 0 | 25 | 25 |
| බ්‍රොකොලි | 3 | 0 | 3 |
| ගෝවා | 5033 | 769 | 5803 |
| මාළු මිරිස් | 0 | 130 | 130 |
| කැරට් | 7,5912 | 100 | 76,012 |
| මල් ගෝවා | 149 | 65. | 214 |
| සෙලරි | 10 | 2 | 12 |
| මිරිස් | 0 | 98 | 98 |
| චීන ගෝවා | 10 | 0 | 10 |
| චනිකීස් කැලේ | 545 | 50 | 595 |
| චීන රාබු | 1770 | 36 | 1806 |
| පිපිඤ්ඤා | 2,456 | 828 | 3,284 |
| වම්බටු | 287 | 270 | 557 |
| හොට් පෙපර් | 459 | 806 | 1,265 |
| කංකුං | 734 | 0 | 734 |
| කෝල්රාබි | 1,253 | 815 | 2067 |
| ලීක්ස් | 11,560 | 252 | 11,813 |
| සලාද කොළ | 211 | 370 | 582 |
| ලිලියම් බල්බ | 11,300 | 0 | 11,300 |

| බෝගය | වරාය/බීජ (කි.ග්‍රෑ.) | ගුවන් තොටුපළ /බීජ (කි.ග්‍රෑ.) | ආනයනය කරන ලද මුළු බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|
| මෑ | 6109 | 350 | 6459 |
| වැටකොළු | 4331 | 1180 | 6312 |
| බඩඉරිඟු | 1,687,108 | 25 | 1,687,133 |
| බණ්ඩක්කා | 649 | 6,493 | 7,142 |
| ලූනු | 23,112 | 0.5 | 23,113 |
| පාර්ස්ලි | 378 | 0 | 378 |
| ගම්මිරිස් | 6,192 | 15 | 6,207 |
| අර්තාපල් | 525,000 | 0 | 525,000 |
| වට්ටක්කා | 9,089 | 187 | 9,277 |
| රාබු | 11271 | 348 | 11,619 |
| රිජ් ගෝඩ් | 0 | 800 | 800 |
| පතෝල | 5 | 0 | 5 |
| ස්කොෂ් | 6,155 | 0.04 | 6,155 |
| විළඳ ඉරිඟු | 500 | 202 | 702 |
| ස්වීම් පෙපර් | 0 | 3 | 3 |
| තක්කාලි | 1,114 | 2,322 | 3,437 |
| කොමඩු | 426,751 | 335 | 427,086 |
| වැක්ස් ගෝඩ් | 0.5 | 0 | 0.5 |
| **එකතුව** | **3,377,983** | **20,068** | **3,398,051** |

## 1998 අංක දරන පැළෑටි සංරක්ෂණ පනතේ නව විධිවිධාන

1924 අංක 10 දරන පැළෑටි සංරක්ෂණ ආඥා පනත යටතේ හඳුන්වා දෙන ලද දැනට පවතින විධිවිධාන (අංක 165/2 සහ 1981 නොවැම්බර් 2 දින දරන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් නිවේදනය) ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දුෂ්කරතා රැසකට මුහුණ දී ඇත. යථෝක්ත විධිවිධාන සංශෝධනය කිරීමේ අරමුණ එම විධිවිධාන මගින් හඳුනා ගෙන නොමැති ගැටලු සඳහා පිළියම් යෙදීමයි. එමනිසා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නව විධිවිධාන කෙටුම්පත් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

### පශ්චාත් ප්‍රවේශ පරීක්ෂාවන්

ආනයන කොන්දේසි සපුරා ලන්නේදැයි නිරීක්ෂණ කිරීම සඳහා පහත සඳහන් පශ්චාත් ප්‍රවේශ පරීක්ෂාවන් සිදු කරන ලදී.

වගු අංක 2.1.5 : පශ්චාත් ප්‍රවේශ පරීක්ෂා

| ස්ථානය | ක්ෂේත්‍ර සංඛ්‍යාව | වර්ගය |
|---|---|---|
| පුත්තලම | 2 | ආනයනය කළ තේක්ක වගාවන් |
| මිනුවන්ගොඩ | 4 | අගය එකතු කිරීම සඳහා ආනයනය කළ කජු |
| නුවරඑළිය | 22 | ආනයනය කළ බීජ අර්තාපල් වගා කළ ක්ෂේත්‍ර |

## අපනයන සහතිකකරණය

අපනයන සහතිකකරණය පහසු කිරීම සඳහා දන්ගස්පිටිය හා පන්නල යන ප්‍රදේශවල, අපනයනය සඳහා කොහු බත් නිපදවන ක්ෂේත්‍ර 2ක් පරීක්ෂා කර බලන ලදී.

## ක්ෂේත්‍ර පරීක්ෂාවන්

නුවරඑළිය ප්‍රදේශයේ පවතින අර්තාපල් වගා ක්ෂේත්‍රවල ඇති නියාමන පළිබෝධ හඳුනා ගැනීම පිණිස ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කෙරිණි. මෙම දත්ත මත පදනම්ව පළිබෝධ නිරීක්ෂණය කිරීමේ වැඩසටහන ඉදිරියේදී ආරම්භ කරනු ඇත. ආනයනය කරන ලද තේක්ක පැළ (ex – vitro plants) පුත්තලම ප්‍රදේශයේ ක්ෂේත්‍රවල රෝපණය කිරීමට පෙර තවාන් නිරීක්ෂණයට ලක් කරන ලදී.

## අපනයන තොග රඳවා ගැනීම

2012 වර්ෂයේදී අපනයන සිදු කළ රටවලින් අනිවාර්ය උද්භිද ස්වස්ථතා අවශ්‍යතා සපුරාලීමට අසමත් වූ තොග 5ක් පමණක් රඳවා ගත් බවට වාර්තා විණි. ඉදිරියේදී තොග අපනයනයේදී නිරෝධායන විධි විධානවලට අනුකූලව කටයුතු කරන ලෙසට අපනයනකරුවන්ට විධිමත් පරිදි දැනුම් දෙන ලදී.

## සම්මන්ත්‍රණ / දැනුවත් කිරීමේ වැඩසටහන් / පුහුණු

නිලධාරීන්, විශ්වවිද්‍යාල සිසුන් සහ කෘෂිකර්ම විද්‍යාල සිසුන් 358දෙනෙකු සඳහා පැළෑටි සංරක්ෂණ පනත පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වා ලදී. 2012 ජූලි 20-25 දක්වා පැවති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් ප්‍රදර්ශනයේදී මහජනතාව සඳහා පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත් වන ලදී. පෝස්ටර් 8ක් සහ අත් පත්‍රිකාවක් පිළියෙල කරන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික්ක අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ බලය ලත් නිලධාරීන් ඇතුළු නිලධාරීන් 130දෙනෙකුගේ සහභාගිත්වයෙන් බීජ පනත පරිච්ජින්න කිරීම සම්බන්ධයෙන් වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙහි මූලික සැලැස්ම සකස් කර නිම කර ඇති අතර එය තවදුරටත් විධිමත් කිරීමේ අරමුණෙන් සංශෝධනයන්ට යටත් කෙරෙනු ඇත.

# 2013 වර්ෂය සඳහා සැලැස්ම

- කෘෂිකර්මය දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය ඉහළ නැංවීම පිණිස බීජ, පැළෑටි, රෝපණ ද්‍රව්‍ය සහ කෘෂි රසායන පිළිබඳ මෙහෙයුම් කටයුතු

ආරක්ෂාකාරීව හා ඵලදායීව සිදු කිරීම පහසු කිරීම පිණිස අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

- උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට සම්බන්ධ යෝග්‍ය සැලසුම් සහ ප්‍රතිපත්තිමය තීරණ සම්පාදනය
  - මෙරට බීජ ව්‍යාපාර සංවර්ධනය
  - මෙරට උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම
  - ජාතික උද්භිද ස්වස්ථතා සහතිකකරණ හැකියාවන් ශක්තිමත් කිරීම
  - නියාමන ක්‍රියාමාර්ගවල ඇති නොගැලපීම නැතිකර විධිමත් කිරීම
  - කෘෂිකර්මාන්තයේදී වඩාත්ම ඵලදායී හා ආරක්ෂිත පළිබෝධ පාලන ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කිරීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 01 |
| කෘෂිකර්ම නිලධාරී | 01 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 03 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| කළමනාකරණ සහකාර | 10 |
| ගබඩා භාරකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| රියදුරු | 03 |
| කම්කරු (අනියම්) | 02 |
| කම්කරු (කොන්ත්‍රාත්) | 03 |
| **එකතුව** | **29** |

# 2.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සේවය ගොවීන්ට ලබා දෙන බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්ත්වය සහතික කිරීමට අදාළ නියාමන කාර්යයන් ඉටුකරයි.

**වගකීම්**

- බීජ පනත ක්‍රියාත්මක කිරීම
- ගුණනය කිරීමට පෙර මූලික බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්ත්වය සහතික කිරීම
- වී, එළවළු, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අර්තාපල්වල වාණිජමය බීජ හා රෝපණ ද්‍රව්‍යයන්හි තත්ත්වය සහතික කිරීම
- පලතුරු පැළ සහතික කිරීම සහ පලතුරු පැළ තවාන් ලියාපදිංචි කිරීම
- දිවයින පුරාම පවතින සුදුසු මව් පැළ තෝරාගෙන ලියාපදිංචි කිරීම
- දේශීය සහ ආනයනය කළ බීජවල ප්‍රරෝහණය, ජීව්‍යතාව, පවිත්‍රතාව සහ තෙතමනය විද්‍යාගාරයේදී පරීක්ෂා කර බැලීම
- ආනයනය කරන ලද සහ දේශීය වශයෙන් නිපදවන ලද බීජවල තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පශ්චාත් පාලන ක්ෂේත්‍ර වගා අත්හදා බැලීම් පැවැත්වීම
- නව බෝග ප්‍රභේද නිදහස් කිරීමට පෙර විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ පරීක්ෂා සිදු කිරීම
- බීජවල ස්වස්ථතාව පරීක්ෂා කර බැලීම
- බීජ පනතට අදාළ උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් බීජ වගාකරුවන්, පැළ තවාන්කරුවන්, බීජකරුවන් සහ නිලධාරීන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම
- ව්‍යවහාරික බීජ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම මගින් උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් පවතින කෂේත්‍ර ගැටලු ජය ගැනීම සඳහා විසඳුම් සොයා ගැනීම
- ආනයනය කළ එළවළු බීජවල තත්ත්වය සහතික කිරීම
- බීජ සංවර්ධනය කිරීමේ සහ තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ කටයුතු
- දත්ත මුල කළමනාකරණය සහ මෙහෙයවීම
- වාර්ෂිකව පලතුරු තවාන්කරුවන්ගේ නාමාවලිය ද කන්නමය වශයෙන් බීජ නිෂ්පාදකයින්ගේ නාමාවලිය ද ප්‍රකාශයට පත් කිරීම

## අයවැය

විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක 2.1.1.1හි දැක්වේ.

වගු අංක **2.1.1.1: වාර්ෂික අයවැය - 2012 (රු. මිලියන)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 24.62 | 21.10 | 86 |
| මූලධන | 18.22 | 8.25 | 45 |
| **ව්‍යාපෘති** | | | |
| බීජ නිෂ්පාදන ගම්මානය | 5.58 | 0.19 | 3 |
| ගොවිපළ සංවර්ධනය | 3.01 | 1.07 | 36 |
| බීජ කර්මාන්තය සංවර්ධනය | 100 | 19.79 | 20 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| බීජ සහතික කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම | 100 | 11.7 | 12 |
| බීජ පනත | 17.00 | 3.75 | 22 |
| **එකතුව** | **268.43** | **65.85** | **25** |

## ප්‍රගතිය

- බීජ නිෂ්පාදනය සඳහා වී වගා ක්ෂේත්‍ර හෙ. 6,116ක් වෙනත් ක්ෂේත්‍ර බෝග වගාබිම් හෙ. 831ක්, එළවළු හා පලතුරු වගා ක්ෂේත්‍ර හෙ. 136ක් සහ අර්තාපල් වගා ක්ෂේත්‍ර හෙ. 83ක් පරීක්ෂා කිරීම.
- බිත්තර වී මෙ.ටො. 11,336ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙ.ටො. 330ක්, එළවළු බීජ මෙ.ටො. 43.5ක් සහ බීජ අර්තාපල් මෙ.ටො. 636ක් ආවරණය කරමින් බීජ නියැදි 14,252ක් පරීක්ෂා කර බැලීම.
- 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ අර්තාපල් සඳහා ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණයන් පිළිවෙළින් 41%කින්, 7%කින් සහ 14%කින් වර්ධනය විය.
- 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ අර්තාපල් නිෂ්පාදනය ද පිළිවෙළින් 51%කින්, 50%කින් සහ 105%කින් වර්ධනය විය. 2011 වර්ෂයේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණයට සාපේක්ෂව වී වගා බිම් ප්‍රමාණය තරමක් අඩු වුව ද නිෂ්පාදනය 41%කින් වැඩිවිය. එය ශ්‍රී ලංකාවේ ජාතික බිත්තර වී අවශ්‍යතාවෙන් 13%කි.
- සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිපදවන උද්‍යාන බෝග පැළ තවාන් 291ක් ලියාපදිංචි කර පරීක්ෂා කරන ලද අතර බද්ධ කළ පලතුරු පැළ 621,861ක් ලේබල් කිරීම මගින් ඒවායෙහි තත්ත්වය සහතික කරන ලදී. 2011 වර්ෂයට සාපේක්ෂව පලතුරු පැළ සහතික කිරීම 139%කින් වර්ධනය විය.
- විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කිරීමේ වැඩසටහන යටතේ වී ප්‍රභේද 11ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 25ක් සහ එළවළු ප්‍රභේද 19ක් ඇගයීම.
- ගන්නොරුව, සීතා එළිය සහ මහ ඉලුප්පල්ලම පිහිටි පසු පාලන ක්ෂේත්‍රවල (PC 1 – PC 4) වූ වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ අර්තාපල්වල පසු පාලන නියැදි 785ක් පරීක්ෂා කර බැලීම.
- 2012 මාර්තු මාසයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළමු බීජ ස්වස්ථතා පරීක්ෂණ විද්‍යාගාරය ස්ථාපිත කිරීම
- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 1926දෙනෙකු ලියාපදිංචිය කරන ලද අතර 554දෙනෙකුගේ ලියාපදිංචිය අලුත් කරන ලදී.
- විවිධ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින් විසින් භාවිතා කරන ලේබල් 46ක් සඳහා බීජ පනත යටතේ අනුමැතිය ලබාදීම.
- බීජ පනතට අදාළ කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ නිලධාරීන්ට, පැළ තවාන්කරුවන්ට සහ බීජ හසුරුවන්නන්ට පුහුණුව ලබාදීම.
- අන්තර්ජාල පහසුකම් ලබාදීම මගින් ප්‍රාදේශීය බීජ සහතික කිරීමේ කාර්යාල සහ බීජ පරීක්ෂණ විද්‍යාගාර 4 ප්‍රධාන කාර්යාලය සමග සම්බන්ධ කරන ලදී.
- බීජ සහතික කිරීමේ සේවය හා බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සහ දකුණු ආසියානු කලාපීය සහ

යෝගිතා සංවිධානය (SAARC) විසින් අරමුදල් ප්‍රතිපාදනය කරන ලද වී සහ එළවළුවල උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය, සැකසුම් කිරීම, පරීක්ෂා කිරීම හා සහතික කිරීම පිළිබඳ සාර්ථක අන්තර්ජාතික පුහුණු වැඩසටහනක් දෙසැ. 03-12 අතර කාලයේදී පැවැත්විණි. සාක් රටවල සාමාජිකයෝ 20දෙනෙක් මේ සඳහා සහභාගි වූහ.

- 'සහතික කළ එළවළු බීජ නිෂ්පාදන ක්‍රමය පුළුල් කිරීම' පිළිබඳ පස් අවුරුදු ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සි ව්‍යාපෘතියක් 2012 මැයි මස ආරම්භ කරන ලදී. බීජ සහතික කිරීමේ සේවා කලාපීය කාර්යාල 4 සහ බීජ පරීක්ෂණ විද්‍යාගාර 3 ඒ සඳහා ප්‍රධාන වශයෙන් දායක වන ආයතන වේ.
- පශ්චාත් පාලන පරීක්ෂණ ප්‍රභේද, විශේෂත්ව, ඒකාත්මිකතා හා ස්ථායිතා අත්හදා බැලීම්, බීජ ප්‍රදර්ශනයක් සහ ශ්‍රී ලංකාවේ බීජ පරීක්ෂණ කටයුතුවල වර්ධනය, පලතුරු පැළ තවාන් ආදර්ශයක් සහ බීජ පනත පිළිබඳ තොරතුරු කුටියක් හා බීජ හසුරුවන්නන් කාණ්ඩ 4 පිළිබඳ වීදි නාට්‍ය ඇතුළත් වූ අර්ථවත් ප්‍රදර්ශන ක්ෂේත්‍රයක් සකස් කිරීම මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඓතිහාසික සියවස් සැමරුම් ප්‍රදර්ශනය සඳහා සුවිශාල දායකත්වයක් ලබාදෙන ලදී.
- අලුතින් පත් කරන ලද කෘෂිකර්ම උපදේශකයෝ 22දෙනෙක් සහ බීජකරුවෝ 29දෙනෙක් 2012 වර්ෂයේදී බීජ සහතික කිරීමේ සේවයට අනුයුක්ත කරන ලදහ.
- බීජ සහතික කිරීමේ සේවය ශක්තිමත් කිරීමේ සහ බීජ කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යටතේ කරදියන් ආරු, කුණ්ඩසාලේ සහ ලබුදූව ප්‍රාදේශීය කාර්යාලවල, බටඅත පසු පාලන ක්ෂේත්‍රයේ, අළුත්තරම බීජ පරීක්ෂණ විද්‍යාගාරයේ ප්‍රරෝහණ කුටියේ සහ ගන්නොරුව නිල නිවාස 2ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.
- බීජ සහතික කිරීමේ සේවයේ සියලුම ඒකකවලට අයත් වාහන හා ගොඩනැගිලිවල අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු නිම කරන ලදී.
- ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පැල්වෙහෙර, පැල්මඩුල්ල, හිඟුරක්ගොඩ සහ ගන්නොරුව පිහිටි මව් ශාක උද්‍යාන සඳහා අවශ්‍ය උපකරණ සියල්ල ලබාදෙන ලදී.
- සහතිකකරණ වැඩසටහන ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම පිණිස දකුණු පළාත සඳහා මාතරද උතුරු පළාත සඳහා මුරුන්කන් හා පරන්තන්හි ද නව ප්‍රාදේශීය කාර්යාල ආරම්භ කරන ලදී.
- වී වගාව සඳහා බීජ නිෂ්පාදන මාර්ගෝපදේශ සකසා නිමකර මුද්‍රණය කෙරිණි.

## බිත්තර වී සහතික කිරීම

2012 වර්ෂයේදී සහතික කළ බිත්තර වී නිෂ්පාදන වැඩසටහන් සඳහා එක් එක් ගොවීන් මෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ, සමූපකාර සමිති, පළාත් සභා, ගොවිජන කේන්ද්‍ර මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, පෞද්ගලික සමාගම්, රාජ්‍ය නොවන සංවිධාන වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන රැසක් ලියාපදිංචි කරන ලදී.

බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද මුළු වගා බිම් ප්‍රමාණය හෙ. 6,116ක් වූ අතර ඒ සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය 69%ක් විය. විවිධ මූලාශ්‍ර සහ බීජ පංති යටතේ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය වගු අංක 2.1.1.2හි දැක්වේ. නියඟය හා ගංවතුර වැනි අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් නිසාවෙන් 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කළ බිම් ප්‍රමාණයේ සුළු අඩුවීමක් නිරීක්ෂණය කිරීමට ලැබිණි.

**වගු අංක 2.1.1.2: 2011 හා 2012 යන වර්ෂවල බිත්තර වී නිෂ්පාදනය යටතේ පැවති වගා බිම් ප්‍රමාණය**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2011 | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් බිම් ප්‍රමාණයේ % |
| පර්යේෂණ ස්ථාන | අභිජනනන | 4.5 | 4.5 | 2.5 | 2.5 | 100 |
| රජයේ ගොවිපළ | අත්තිවාරම් | 65 | 47 | 67 | 62 | 100 |
| | ලියාපදිංචි කළ I | 618 | 369 | 770 | 653 | 99 |
| | සහතික කළ I | 299 | 212 | 145 | 63 | 100 |
| | සහතික කළ II | 53 | 43 | 7 | 6 | 100 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | අත්තිවාරම් | | | 4.6 | 3.5 | 100 |
| | ලියාපදිංචි කළ I | 31 | 25 | 81 | 52 | 90 |
| | සහතික කළ I | 759 | 543 | 736.6 | 548 | 97 |
| | සහතික කළ II | 120 | 75 | 22 | 20 | 91 |
| පෞද්ගලික වගාකරුවන් | ලියාපදිංචි කළ I | 420 | 138 | 137 | 75 | 99 |
| | ලියාපදිංචි කළ II | | | 13 | 8 | 100 |
| | සහතික කළ I | 3,459 | 2,131 | 3,734 | 3,156 | 98 |
| | සහතික කළ II | 540 | 307 | 397 | 297 | 95 |
| **එකතුව** | | **6,368.5** | **3,894.5** | **6,116.7** | **4,946** | |

2012 වර්ෂයේදී බිත්තර වී මෙ.ටො. 11,336ක නියැදි ගන්නා ලද අතර ඒවායින් බිත්තර වී මෙ.ටො. 9038ක තත්ත්වමය ප්‍රමිති විද්‍යාගාර පරීක්ෂා මගින් පිළිගන්නා ලදී (වගු අංක 2.1.1.3). කොන්ත්‍රාත් වගා වැඩසටහන සමග එක්ව කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ බිත්තර වී මෙ.ටො. 3,897ක් (35%) නිපද වූ අතර පෞද්ගලික වගාකරුවෝ මෙ.ටො. 7,433ක් (65%) නිපද වූහ.

**වගු අංක 2.1.1.3: 2011 සහ 2012 යන වර්ෂවලදී පරීක්ෂා කරන බලන ලද බිත්තර වී ප්‍රමාණය සහ පිළිගත් ප්‍රතිශතයන්**

| | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | 4.70 | 87 | 6.2 | 95 |
| රජයේ ගොවිපළ | 2,480 | 90 | 2,792 | 90 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 661 | 85 | 1105 | 87 |
| පෞද්ගලික වගාකරුවන් | 4,858 | 23 | 7,433 | 75 |
| **එකතුව** | **8003.7** | | **11,336.2** | |

## වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ සහතික කිරීම

වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද මුළු වගා බිම් ප්‍රමාණය හෙ. 831ක් වූ අතර එයින් 78%ක් සඳහා කොන්ත්‍රාත් වගාකරුවෝ දායක වූහ. බඩඉරිඟු, මුං, රටකජු, තල, කව්පි, කුරක්කන්, උඳු, සෝයාබෝංචි සහ තෝර පරිප්පු වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදන වැඩසටහනට ඇතුළත් කරන ලදී. විවිධ මූලාශ්‍ර සහ බීජ පංති යටතේ බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද වගා බිම් ප්‍රමාණයන් වගු අංක 2.1.1.4 හි දැක්වේ. 2011 වර්ෂයට සාපේක්ෂව මෙවර වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද වගා බිම් ප්‍රමාණයේ 41%ක වර්ධනයක් පැවතිණි.

**වගු අංක 2.1.1.4: 2011 සහ 2012 යන වර්ෂවල වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ පැවති වගා බිම් ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2011 | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | අභිජනනන | 4.89 | 4.89 | 3.9 | 3.9 | 94 |
| රජයේ ගොවිපළ | අත්තිවාරම් | 12 | 9.3 | 26 | 19 | 97 |
| | ලියාපදිංචි කළ I | 32.5 | 16.3 | 58 | 24 | 96 |
| | ලියාපදිංචි කළ II | | | 3 | 3 | 100 |
| | සහතික කළ I | 35.7 | 13.2 | 12 | 9.5 | 100 |
| | සහතික කළ II | | | 1 | 0.8 | 75 |
| | දෙමුහුම් | 0.75 | 0.75 | 3.03 | 0.2 | 100 |
| කොන්ත්‍රාත් | අත්තිවාරම් | 1.0 | 1.0 | 5.3 | 3.5 | 100 |
| වගාකරුවන් | ලියාපදිංචි කළ I | 75.0 | 56.5 | 97.2 | 74.7 | 97 |
| | ලියාපදිංචි කළ II | | | 6.2 | 6.2 | 100 |
| | සහතික කළ I | 355.9 | 178.8 | 463 | 358 | 100 |
| | සහතික කළ II | 36.9 | 18.0 | 77.6 | 71.4 | 93 |
| පෞද්ගලික | අත්තිවාරම් | 10.5 | 7.8 | 2.1 | 1.2 | 100 |
| වගාකරුවන් | ලියාපදිංචි කළ I | 12.7 | 3.8 | 33.2 | 8.7 | 98 |
| | සහතික කළ I | 8.7 | 4.9 | 38.2 | 24.8 | 100 |
| | සහතික කළ II | 0.4 | 0.4 | 2 | 1.4 | 100 |
| **එකතුව** | | **586.64** | **315.64** | **831.73** | **610.3** | |

2012 වර්ෂයේ සමස්ත වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය මෙ.ටො. 330ක් වූ අතර නිෂ්පාදනයෙන් 94%ක් සහතික කරන ලදී. විවිධ මූලාශ්‍රවලින් පරීක්ෂා කර බලන ලද ප්‍රමාණය සහ පිළිගත් ප්‍රතිශතයන් වගු අංක 2.1.1.5හි දැක්වේ

**වගු අංක 2.1.1.1.5: 2011 සහ 2012 වර්ෂ තුළ පරීක්ෂා කර බලන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණයන්**

| | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | **පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො)** | **පිළිගත් %** | **පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො)** | **පිළිගත් %** |
| පර්යේෂණ ස්ථාන | 1.60 | 91 | 0.2 | 100 |
| රජයේ ගොවිපළ | 27.4 | 88 | 35.5 | 88 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 168.1 | 90 | 289.6 | 95 |
| පෞද්ගලික වගාකරුවන් | 20.8 | 93 | 4.8 | 77 |
| **එකතුව** | **217.9** | | **330.1** | |

## එළවළු බීජ නිෂ්පාදනය සහතික කිරීම

එළවළු බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය හෙ. 136ක් වූ අතර එයින් 65%ක් සඳහා පෞද්ගලික හා කොන්ත්‍රාත් වගාකරුවෝ දායක වූහ. විවිධ මූලාශ්‍ර සහ බීජ පංති යටතේ ලියාපදිංචි කරන ලද වගා බිම් ප්‍රමාණයන් වගු අංක 2.1.1.6හි දැක්වේ. තක්කාලි, බණ්ඩක්කා, මිරිස්, පතෝල, බෝංචි, වම්බටු, කරවිල, රාබු, වැටකොළු, මාළුමිරිස්, මෑ, පිපිඤ්ඤා, වට්ටක්කා, තම්පලා, එළවළු, කව්පි, දඹල, කොමඩු සහ පැපොල් මෙම බීජ නිෂ්පාදන වැඩසටහනට ඇතුළත් විය.

**වගු අංක 2.1.1.6: මූලාශ්‍රය සහ බීජ පංතිය අනුව, 2011 සහ 2012 වර්ෂවල එළවළු බීජ නිෂ්පාදන වගා බිම් ප්‍රමාණය පිළිබඳ සාරාංශය**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2011 | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | | **ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.)** | **පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.)** | **ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.)** | **පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.)** | **පිළිගත් %** |
| පර්යේෂණ ස්ථාන | අභිජනනන | 1.0 | 1.0 | 1.5 | 1.5 | 72 |
| රජයේ ගොවිපළ | මූලික | 6.7 | 5.1 | 17 | 12 | 98 |
| | සම්මත | 26.0 | 23.0 | 26.7 | 20.5 | 96 |
| | දෙමුහුම් | 0.24 | 0.24 | 1.5 | 1.5 | 100 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | මූලික | 0.2 | 0.2 | 3.8 | 2.7 | 70 |
| | සම්මත I | 21.5 | 14.0 | 43.7 | 35.4 | 100 |
| | සම්මත II | | | 1.6 | 0.9 | 100 |
| පෞද්ගලික වගාකරුවන් | සම්මත I | 71.4 | 51.5 | 40.3 | 33.8 | 99 |
| **එකතුව** | | **127.04** | **95.04** | **136.1** | **108.3** | |

වසර තුළ සමස්ත එළවළු නිෂ්පාදනය මෙ.ටො. 43.5ක් වූ අතර එයින් මෙ.ටො. 41ක් සහතික කරන ලදී. විවිධ මූලාශ්‍රවලින් පරීක්ෂා කරන ලද ප්‍රමාණය සහ පිළිගත් ප්‍රතිශතයන් වගු අංක 2.1.1.7හි දැක්වේ.

**වගු අංක 2.1.1.7: 2011 සහ 2012 වර්ෂවල එළවළු බීජ නිෂ්පාදන ප්‍රමාණයන්**

| | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % | පරීක්ෂා කළ ප්‍රමාණය (මෙ.ටො) | පිළිගත් % |
| පර්යේෂණ ස්ථාන | 0.4 | 100 | .02 | 99 |
| රජයේ ගොවිපළ | 5.6 | 95 | 8.4 | 92 |
| කොන්ත්‍රාත් වගාකරුවන් | 7.05 | 91 | 26.4 | 98 |
| පෞද්ගලික වගාකරුවන් | 15.86 | 96 | 8.7 | 84 |
| **එකතුව** | **28.91** | | **43.52** | |

## බීජ අර්තාපල් සහතික කිරීම

විවිධ බීජ අර්තාපල් පංති යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණයන් වගු අංක 2.1.1.8හි දැක්වේ. බීජ අර්තාපල් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 86ක් වූ අතර එක් ප්‍රචලිත අර්තාපල් ප්‍රභේදයක (ග්‍රැනෝලා) බීජ අර්තාපල් මෙ.ටො. 640ක් සහතික කරන ලදී.

**වගු අංක 2.1.1.8: 2011 සහ 2012 වර්ෂවල බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා වගා කළ බිම් ප්‍රමාණයන්**

| මූලාශ්‍රය | බීජ පංතිය | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පරීක්ෂා කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | ලියාපදිංචි කළ වගා බිම් ප්‍රමාණය (හෙ.) | පිළිගත් බිම් ප්‍රමාණයේ % |
| රජයේ ගොවිපළ | පූර්ව මූලික | 0.14 | 0.11 | 0.25 | 0.21 |
| | මූලික | 45.10 | 39.09 | 52.46 | 48.0 |
| | සහතික කළ | 11.22 | 6.16 | 11.51 | 11.42 |
| පෞද්ගලික වගාකරුවන් | සහතික කළ | 19.25 | 18.83 | 22.06 | 22.06 |
| **එකතුව** | | **75.71** | **64.19** | **86.28** | **81.89** |

## බීජ පරීක්ෂාව

තත්ත්වය සහතික කිරීම සඳහා බීජ නියැදි 14,252ක් පේරාදෙණිය, මහඉලුප්පල්ලම, අළුත්තරම සහ බටඅත පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ පරීක්ෂණ විද්‍යාගාරවලදී පරීක්ෂාවට ලක් කෙරිණි.

## බීජ ස්වස්ථතාව පරීක්ෂා කිරීම

බීජ සහතික කිරීමේ සේවයට අයත් ප්‍රථම බීජ ස්වස්ථතා පරීක්ෂණ විද්‍යාගාරය 2012 මාර්තු මස ගන්නෝරුවේ ස්ථාපිත කෙරිණි. විද්‍යාගාරයේදී බීජ ස්වස්ථතාව පරීක්ෂා කර බැලීමේ අරමුණ වන්නේ රෝග පාත්‍ර වීමට ඇති ඉඩකඩ අනුව, බීජවල රෝපණ අගය ඇගයීමයි. වගා කරන බෝගවලට වැළඳෙන වැදගත්ම රෝග රැසක් බීජ මගින් පැතිරෙන රෝගයි. වර්තමානයේ වෙළඳපොළ විසින් ඉල්ලා සිටින තත්ත්වයන් සහ පළිබෝධනාශක භාවිතය අඩු කරන ලෙසට පවතින බලපෑම් අනුව, ගොවීන් රෝගවලින් තොර බීජ ආදිය යොදා ගනිමින් තමා වගා කටයුතු ආරම්භ කිරීම අත්‍යවශ්‍යය. එහෙයින් බීජ නිසි ප්‍රමිතිවලට අනුකූල වන බැව් සහතික කර ගැනීම පිණිස පරීක්ෂා කරවා ගැනීම ද අත්‍යවශ්‍යය. මෙය බීජ මගින් පැතිරෙන රෝග සමහරක් කළමනාකරණය කර ගත හැකි එකම විකල්පය වේ.

බීජ ස්වස්ථතාව පරීක්ෂා කිරීම සඳහා දේශීය වශයෙන් වගා කරන බෝගවලට හානි කරන බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනක පිළිබඳ තොරතුරු ජනනය, බෝග නිෂ්පාදන ක්‍රමවලදී ඒවායෙහි ව්‍යාධිජනකමය වැදගත්කම හා ව්‍යාධිජනක සඳහා හිතකර තත්ත්වයන්, ආසාදිත බීජ තොග සඳහා පිළිගත් ආසාදිත පැවතිය හැකි මට්ටම් සහ බීජ ස්වස්ථතාව හඳුනා ගත හැකි තාක්ෂණයන් නිශ්චය කර ගැනීම වැදගත් වේ.

වී බීජවල තිබී බීජ මගින් පැතිරෙන ප්‍රධාන දිලීර රෝග කිහිපයක් (*Alternaria padwickii, Drechslera oryzae, Pyricularia oryzae* ) හඳුනා ගන්නා ලදී. බඩඉරිඟු වගාවේ බීජ පැළ අංගමාරය ඇති කරන පෙනිසිලියම් ඔක්සලිකම්) (*Penicllium oxalicum*) දේශීය වශයෙන් නිපදවන ලද බීජවලට වැළඳෙන බීජ මගින් පැතිරෙන වැදගත් රෝගයකි. එළවළු හා රනිල බීජවල ඇන්ත්‍රැක්නෝස් රෝගය ද වීවල ඕල්ටර්නේරියා පත්‍ර පුල්ලි රෝගය හා හෙල්මින්තොස්පොරියම් පත්‍ර පුල්ලි රෝගය ද හඳුනා ගැනීම සඳහා බීජ ස්වස්ථතාව සොයා ගැනීමේ තාක්ෂණික ක්‍රම සහ ක්‍රමවේද බිහි කරන ලදී.

වර්තමානයේදී බීජ ආනයනය සැලකිය යුතු අයුරින් වැඩිවී ඇති අතර එමගින් දිවයිනට රෝග පැමිණීමේ අවදානම ද ඉහළ ගොස් ඇත. මෙරට දැනටමත් ස්ථාපිත වී ඇති බීජ මගින් පැතිරෙන රෝග එලෙසින්ම අඛණ්ඩව පැවතී අස්වැන්න අඩුවීමකට මග පාදනු ඇත. නැතිනම් ඒවා විනාශකාරී වසංගතවලට මුල පුරනු ඇත. එමනිසා බීජ මගින් පැතිරෙන ආසාදන හැකි තරම් වළක්වා ගත යුතුය. මෙම අරමුණු ළඟා කර ගැනීමේදී 2013 වර්ෂයේදී, මෙරට වගා කරන බෝගවලට හානි කරන බීජ මගින් පැතිරෙන ව්‍යාධිජනක හඳුනාගැනීම සඳහා විවිධ මූලාශ්‍රවලින් ඇති වූ බීජ නියැදිවල ස්වස්ථතාව පරීක්ෂා කෙරෙනු ඇත.

## රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම

රජයේ සහ පෞද්ගලික පැළ තවාන්වල නිපදවන ලද පලතුරු පැළ 62,186ක් සහතික කර ලේබල් කරන ලද අතර (වගු අංක 2.1.1.9) එය 2011 වර්ෂයට සාපෙක්ෂව 139%ක වර්ධනයකි.

වගු අංක **2.1.1.9 : 2011** හා **2012** වර්ෂවලදී සහතික කරන ලද බද්ධ පලතුරු පැළ සංඛ්‍යාව

| විශේෂය | සහතික කරන ලද පැළ සංඛ්‍යාව | |
|---|---|---|
| | **2011** | **2012** |
| අඹ - බද්ධ කරන ලද | 146,979 | 263,745 |
| රඹුටන් - බද්ධ කරන ලද | 27,116 | 105,640 |
| දොඩම් - බද්ධ කරන ලද | 82,162 | 236,014 |
| අලිපේර | 918 | 7,233 |
| දූරියන් | 282 | 1,716 |
| කොස් | 2,591 | 7,513 |
| එකතුව | **260,048** | **621,861** |

## පැළ තවාන් ලියාපදිංචි කිරීම

2012 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද පැළ තවාන් සංඛ්‍යාව 291කි.

## මව් ශාක සහතික කිරීම

2012 වර්ෂයේදී අඹ, රඹුටන්, පැඟිරි සහ කොස් මව් ශාක 386ක් තෝරාගෙන ලියාපදිංචි කරන ලදී.

වගු අංක **2.1.1.10. 2010** හා **2011** වර්ෂවල ලියාපදිංචි කරන ලද මව් ශාක සංඛ්‍යාව

| විශේෂය | ලියාපදිංචි කරන ලද ශාක සංඛ්‍යාව | |
|---|---|---|
| | 2011 | 2012 |
| අඹ-බද්ධ කරන ලද | 450 | 242 |
| රඹුටන් -බද්ධ කරන ලද | 375 | 43 |
| පැඟිරි | 415 | 75 |
| පෙයාර්ස් | 77 | |
| දූරියන් | 1 | |
| කොස් | 12 | 26 |
| | 1,307 | 386 |

## පසු පාලන පරීක්ෂාව

බීජ නියැදි 785ක් ඇගයීම සඳහා පසු පාලන පරීක්ෂා සිදු කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කරන ලද බීජ නියැදි ද විවිධ බෝග ප්‍රභේදවලට අයත් ආනයනය කළ බීජ ද බීජ අර්තාපල්ද මෙතුළ අන්තර්ගත විය. විවිධ බෝග කාණ්ඩ යටතේ සිදු කරන ලද පසු පාලන පරීක්ෂාවන් සංඛ්‍යාව වගු අංක 2.1.1.11හි දැක්වේ.

වගු අංක **2.1.1.11** පරීක්ෂා කර බලන ලද පසු පාලන නියැදි සංඛ්‍යාව

| **බෝග කාණ්ඩය** | **පරීක්ෂා කරන ලද බීජ නියැදි සංඛ්‍යාව** |
|---|---|
| වී | 128 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 340 |
| එළවළු | 272 |
| අර්තාපල් | 32 |
| පලතුරු | 13 |
| **එකතුව** | **785** |

## විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කිරීම

ගන්නෝරුව සහ පසුපාලන ක්ෂේත්‍රයේදී විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා වී ප්‍රභේද 11ක් (Bg-3R, At-06-631, Bg 465, පොකුරු සම්බා, Ld 1-5-15, CIC 3-1, Bg 5-15-31, Bg 11-139, Bg 5-110, At 4-186) අත්හදා බලන ලද අතර එළවලු ප්‍රභේද 19ක් ද වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 24ක් ද අත්හදා බලන ලදී. වසර තුළ වී ප්‍රභේද 5ක, එළවළු ප්‍රභේද 8ක සහ වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 7ක විශේෂත්ව, ඒකාත්මිකතා සහ ස්ථායිතා පරීක්ෂාව නිම කෙරිණි.

වගු අංක **2.1.1.12:** පවත්වන ලද විශේෂත්ව, ඒකාත්මිකතා සහ ස්ථායිතා පරීක්ෂණ සංඛ්‍යාව

| **බෝග කාණ්ඩය** | **පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව** | **නිම කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව** |
|---|---|---|
| වී | 11 | 5 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 24 | 7 |
| එළවළු | 19 | 8 |
| **එකතුව** | **54** | **20** |

## බීජ පනත ක්‍රියාත්මක කිරීම

මෙරට කෘෂිකර්මාන්තයේ වැදගත් අංශයක් වන බීජ කර්මාන්තයට හානි කර අයථා කටයුතුවලින් ගොවියා මෙන්ම බීජ හසුරුවන්නා ද ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන් 2008 වර්ෂයේ මුල සිට 2003 අංක 22 දරන බීජ පනත ක්‍රියාත්මක කර ඇත. වසර තුළ බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 1,926ක් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචිය අලුත් කිරීම් 554ක් ද සිදු කර ඇත. පැමිණිලි 16ක් සම්බන්ධයෙන් විමර්ශනය කර අවශ්‍ය පියවර ගන්නා ලදී. අහඹු විමර්ශන 30ක්

සිදුකර අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්ත්වය නියාමනය කිරීම පිණිස පියවර ගන්නා ලදී.

### පර්යේෂණ හා සංවර්ධන කටයුතු

පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන සිදු කෙරිණි.

- එළවළු බීජ ඇසුරුම් කිරීම සඳහා කල් ඉකුත්වන දිනය සොයා ගැනීම
- පලතුරු පැළ සහතික කිරීමේ වැඩසටහනෙහි එදිනෙදා පවතින ක්ෂේත්‍ර ගැටලු සඳහා විද්‍යාත්මක විසඳුම් සොයා ගැනීම
- ආනයනය කරන ලද බීජ තොග ආශ්‍රිත අවධානම අධ්‍යයනය කිරීම
- විවිධ ඇසුරුම් ද්‍රව්‍ය තුළින් තෙතමන වාෂ්ප ගමන් කිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම

### පුහුණු වැඩසටහන්

උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් නිලධාරීන් සහ බීජ හසුරුවන්නන්ගේ දැනුම පුළුල් කිරීම සඳහා බීජ සහතික කිරීමේ සේවය මගින් අඛණ්ඩව පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**වගු අංක 2.1.1.12: පුහුණු කරන ලද පුහුණුකරුවන් සංඛ්‍යාව**

| පුහුණු වැඩසටහන් | පුහුණුකරුවන් සංඛ්‍යාව |
|---|---|
| බීජ ගොවීන් / තවාන්කරුවන් | 27 |
| රාජ්‍ය අංශයේ නිලධාරින් | 780 |
| පෞද්ගලික අංශයේ නිලධාරින් | 20 |
| බීජ හසුරුවන්නන් | 1,040 |
| **එකතුව** | **1,867** |

### බීජ සහතික කිරීමේ සේවා තොරතුරු පද්ධතිය

තොරතුරු කළමනාකරණයට අදාළව පහසුවෙන් සහ කාර්යක්ෂමව දත්ත ලබා ගැනීම සහ විශ්ලේෂණ කටයුතු කිරීම සඳහා දිවයින පුරා පිහිටි බීජ සහතික කිරීමේ සේවා ප්‍රාදේශීය කාර්යාල 22, බීජ පරීක්ෂණ විද්‍යාගාර 4 සම්බන්ධ කිරීමෙන් බීජ සහතික කිරීම පිළිබඳ දත්ත මූලය වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කෙරිණි. එමෙන්ම, ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය ඒකක, විද්‍යාගාර සහ පසු පාලන ස්ථානවල සේවය කරන සියලුම කාණ්ඩවලට අයත් කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ පෞද්ගලික දත්ත ඇතුළත් නව දත්ත මූලයක් සැලසුම් කර නිම කරන ලදී.

### විදේශීය පුහුණුව

ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය සමග සහයෝගයෙන් නිලධාරින් 3දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී.

## 2013 වර්ෂය සඳහා සැලැස්ම

- සහතික කළ බීජ සම්බන්ධයෙන් පවතින ජාතික බිත්තර වී අවශ්‍යතාවෙන් 30%ක් සපුරා ලීම සඳහා බීජ සහතික කිරීමේ සේවය බල ගැන්වීම
- විශේෂයෙන්ම බීජ ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ කල් ඉකුත්වීමේ දින පිළිබඳව බීජ හසුරුවන්නන්ට මතුවන පසු අස්වනු ගැටලු සම්බන්ධයෙන් බීජ පර්යේෂණ සිදු කිරීම
- වල් පැළෑටි බීජ දූෂණ කාරක හඳුනා ගැනීම, නව පැළෑටි ආක්‍රමණවල අවදානම තක්සේරු කිරීම සහ විශේෂයෙන්ම ආනයනය කරන බීජ මගින් ආක්‍රමණශීලී වල් පැළෑටි විශේෂ ප්‍රවේශ වීම වැළැක්වීම පිණිස ආක්‍රමණශීලී සහ හානිකර වල් පැළෑටි පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා බීජ පරීක්ෂණ විද්‍යාගාරයේ වල් පැළෑටි හඳුනාගත හැකි ඒකකයක් ආරම්භ කිරීම

- මහජනයා දැනුවත් කිරීම, බීජ සහතික කිරීමේ වැඩසටහන පිළිබඳව තොරතුරු බෙදා හැරීම වැඩිදියුණු කිරීම සහ අපගේ සේවය වෙත කාර්යක්ෂමව හා පහසුවෙන් ප්‍රවිශ්ට වීම සඳහා බීජ සහතික කිරීමේ සේවා තොරතුරු අඩවිය සැලසුම් කිරීම

- බීජ කර්මාන්තයේ පවතින අයථා කටයුතු වළක්වාලන අතරම මෙරට උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බීජ හසුරුවන්නන් අතර බීජ නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා බීජ පනත ක්‍රියාත්මක කිරීම

- සියලුම බීජ හසුරුවන්නන් අතර බෙදා හැරීම සඳහා උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම

- ඒ ඒ වගා කන්නය තුළ බීජ නිෂ්පාදකයින්ගේ නාමාවලියක් සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ නාමාවලියක් සකස් කිරීම

- බීජ හසුරුවන්නන් සඳහා බෝග මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම

- අලුතෙන් සංශෝධනය කරන ලද බීජ පනත සහ විධිවිධාන පළිබඳ කටයුතු අවසන් කර ඒවා ප්‍රසිද්ධ කිරීම

- කුණ්ඩසාලේ, ලබුදූව හා කරදියන් ආරු පිහිටි බීජ සහතික කිරීමේ සේවා ප්‍රාදේශිය කාර්යාල ගොඩනැගිලි සහ බට අත පිහිටි පසු පාලන ක්ෂේත්‍රයේ ඉදිකිරීම් නිම කිරීම

- පරන්තන් පිහිටි නව බීජ පරීක්ෂණ විද්‍යාගාරය සහ කාර්යාල සංකීර්ණය ද මාතර හා යාපනය පිහිටි බීජ සහතික කිරීමේ සේවා ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ද ඉදිකිරීම

- බීජ සහතික කිරීම් සේවා ඒකක සියල්ල කාර්යමණ්ඩලය හා උපකරණ ලබා දීම මඟින් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍යය.

- බීජ පර්යේෂණ හා බීජ ස්වස්ථතා පරීක්ෂණ ඒකකය සඳහා ජෛව තාක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම

- බීජ සහතික කිරීමේ සේවය දිවයින පුරා විසිරී ඇති ප්‍රාදේශීය කාර්යාල 23කින්, බීජ පරීක්ෂණ විද්‍යාගාර 4කින් සහ පසු පාලන ක්ෂේත්‍ර 4කින් සමන්විත සංකීර්ණ පරිපාලන ව්‍යුහයක් වන අතර බීජ සහතික කිරීම, පලතුරු පැළ සහතික කිරීම සහ බීජ පනත වශයෙන් නම් කර ඇති ප්‍රධාන වැඩසටහන් 3ක් දියත් කරයි. මෙම ආයතනය කෘෂිකර්ම ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂකවරයකු / අතිරේක අධ්‍යක්ෂවරයකු විසින් පාලනය කරනු ලැබීම පිණිස ප්‍රති ව්‍යුහගත කිරීම අවශ්‍යය.

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/ සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ නිලධාරි) | 1 |
| පර්යේෂණ නිලධාරි | 3 |
| කෘෂිකර්ම නිලධාරි | 9 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 4 |
| වැඩසටහන් සහකාර | 3 |
| කෘෂිකර්ම උපදේශක | 120 |
| පර්යේෂණ සහකාර | 1 |
| පර්යේෂණ උප සහකාර | 4 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 10 |
| රියදුරු | 16 |
| විදුලි ශිල්පී | 1 |
| මුරකරු | 17 |
| කම්කරු | 50 |
| බීජ කාර්මික | 10 |
| බීජකරු | 30 |
| සනීපාරක්ෂක කම්කරු | 1 |
| **එකතුව** | **280** |

# 2.1.2 පැළෑටි සංරක්ෂණ සේවය

## හැඳින්වීම

පැළෑටි සංරක්ෂණ සේවය හට ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ කෘෂිකාර්මික බෝග සඳහා පාරිසරික වශයෙන් හිතකර ආර්ථික වශයෙන් වාසිදායක සහ ප්‍රායෝගිකව භාවිතා කළ හැකි පලිබෝධ පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත.

දැනට භාවිත පලිබෝධ කළමනාකරණ ක්‍රම වැඩිදියුණු කරමින්, පලිබෝධකයින් සහ රෝග පැතිරීම සහ විශාල වශයෙන් බීජ ගබඩා කර ඇති ස්ථානයන්හි පළිබෝධකයින් ධූමායනය මඟින් පාලනය අතරතුර ක්ෂේත්‍ර මට්ටමේ සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමීක්ෂණය හා ඇගයීම තුළින් මෙම පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක් ෂිතය. මෙයට අමතරව කෘෂිකර්මික භූමි තුළට ජලජ පැලෑටි සහ අනෙකුත් ආක්‍රමණශීලී පැළෑටි ඇතුළුව යෝග්‍ය නොවන්නා වූ වගාවන් අවම කිරීමද පැළෑටි සංරක්ෂණ සේවයේ වැදගත් කාර්යභාරයක් වේ.

“1999 අංක 35 දරන සංරක්ෂණ පනත” මඟින් අවධාරණය කර ඇති පරිදි රටේ පැළෑටි සංරක්ෂණය සම්බන්ධ සියලුම නියාමන කාර්යන් මෙම අරමුණු තුළට ඇතුළත් වේ. මෙයට අමතරව නියමු මට්ටමෙන් ශාක ඇතුළත්ව නව පළිබෝධනාශක ඇගයීම, ශාකවල මනා ස්වස්තතාවය තහවුරු කිරීම, උදෙසා නිර්දේශිත පලිබෝධනාශකයන්හි සඵල කාර්යක්ෂමතාව ඇගයීම පැළෑටි සංරක්ෂණ සේවය සතු අනෙකුත් ප්‍රමුඛ කාර්ය භාරයන් වේ. ගොවි ක්ෂේත්‍රවල නියමු මට්ටමෙන් නව වල්නාශක ඇගයීම තුළින් 1981 පලිබෝධනාශක පනතේ සමහර විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී මෙම කාර්යයන් ආධාර වනු ලැබේ.

## දැක්ම

ආරක්ෂාකාරී සහ ඵලදායි පැළෑටි සංරක්ෂණ ක්‍රමෝපායන් මඟින් කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ විශිෂ්ඨත්වය ලඟාකර ගැනීම

## මෙහෙවර

දේශිය කර්මාන්තයේ ආරක්ෂාව තහවුරු කරමින් පරිසරයට අවම හානියක් වන ආකාරයට ඵලදායී පලිබෝධ නියාමන ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කරමින්. 1999 අංක 35 දරන ශාක සංරක්ෂණ පනතේ විධිවිධාන අනුගමනය කිරීම.

## අයවැය

2.1.2.1 වගුව තුළ 2012 වර්ෂය සඳහා වාර්ෂික අය වැය දක්වා ඇත.

**වගුව 2.1.2.1 : වාර්ෂික අයවැය 2012**

| වැය ශිර්ෂය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම % |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,029,000 | 1,888,196 | 93 |
| ප්‍රාග්ධන | 1,705,000 | 1,578,045 | 93 |
| **එකතුව** | **3,734,000** | **3,466,241** | **93** |

## ප්‍රගතිය

### 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ නියාමන විධිවිධාන ක්‍රියාත්මක කිරීම

බලය ලත් නිලධාරීන් පත් කිරීම පැළෑටි සංරක්ෂණ සේවයට පවරනු ලැබ ඇති ප්‍රධාන වගකීම්වලින් එකකි.මෙසේ මෙම වසර තුළදී පැළෑටි සංරක්ෂණ පනත ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා උතුරු හා නැගෙනහිර පළාත් ආවරණය කිරීමට බලය ලත් නිලධාරීන් 20 දෙනෙකු පත් කරනු ලැබීය.අලුතෙන් පත් කළ නිලධාරීන් සඳහා පහත සඳහන් මාතෘකා යටතේ එක් දින පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණ.

1. 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ නීතිමය පසුබිම
2. ක්ෂේත්‍ර මට්ටමේ දී පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
3. ශ්‍රී ලංකාවේ නිරෝධායන වැදගත්කමකින් යුත් නව පළිබෝධකයන්

මෙයට අමතරව දැනටමත් පත්කර බලය ලත් නිලධාරීන් 36 දෙනෙකු ඉහත වැඩසටහන යටතේ පුහුණු කරන ලදි.

### වී, එළවළු සහ පලා එළවළු සම්බන්ධ සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන

සමෝධානික පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපායන් පිළිබඳ ගොවි ප්‍රජාව සතු දැනුම වැඩි කිරීම සහ අඩු පිරිවැය සහ පාරිසර හිතකර පළිබෝධ කළමනාකරණ පද්ධතීන් අනුගමනය කරන අතරම පළිබෝධනාශක මත යැපීම අවම කිරීම මෙම වැඩසටහනෙහි වඩාත් පුළුල් අභිප්‍රාය වේ. පැළෑටි සංරක්ෂණ සේවය විසින් මෙම සමෝධානික පළිබෝධ කළමනාකරණය වී, එළවළු සහ පලා එළවළු යන වර්ග තුන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

### වී සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය

මෙම වැඩසටහන, කන්නය තුළදී දින 14ක පුහුණුවකින් සමන්විත වන අතර කන්න දිගු පුහුණුව මත පදනම් වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම උපදේශකවරුන් සහ කෘෂිකාර්මික ව්‍යාප්ති ක්‍රියාවලීන් හි නිරත වන්නාවූ වෙනත් අදාල නිලධාරීන් මෙම වැඩසටහනේ ඉලක්කගත කණ්ඩායම් වේ. මෙම වසර තුළදී පැළෑටි සංරක්ෂණ සේවය විසින් පොලොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා වී සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳව කන්නයක් පුරා දිගු පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය. එක් එක් වර්ධන අවස්ථාවේ සිටින පළිබෝධ විශේෂයන් හඳුනාගැනීමටත්, ගොවි ක්ෂෙත්‍ර තත්ත්වයන් යටතේ උපයෝගී කරගනු ලැබිය හැකි විවිධ ප්‍රායෝගික කළමනාකරණ ක්‍රමෝපායන් අනුගමනය කිරීම තුළින් එම පළිබෝධ ගහනයන් පාලන කිරීමත් මෙම වැඩසටහන මඟින් ඉලක්ක කරගනු ලැබේ. මෙයට අමතරව කෘෂි පාරිසරික පද්ධතීන්හි ස්වභාවිකව පළිබෝධක ලෙස ක්‍රියාකරන්නා වූ සත්ත්වයන් ආරක්ෂා කරමින් හානිදායක මට්ටමට වඩා අඩුමට්ටමකට පළිබෝධ ගහනය පවත්වා ගැනීම කළමනාකරණයටද මෙම වැඩසටහන මගින් අවධානය යොමු කෙරිණි.

### එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය

එළවළු සඳහා අඩු පිරිවැයැති සහ පාරිසරික වශයෙන් හිතකර සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම සහ එළවළු පළිබෝධකයින් කළමනාකරණය සඳහා වඩාත් උචිත විකල්ප ක්‍රමෝපායන් ලෙස

ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර ප්‍රවර්ධනය කිරීමටත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම වැඩසටහන ගොවි ක්ෂෙත්‍ර අත්හදා බැලීම් නිරීක්ෂණය, නිලධාරීන් පුහුණුව, ගොවීන් පුහුණුව, ආදර්ශ සමෝධානික පළිබෝධ කළමනාකරණ ගොවිපල පිහිටුවීම, ගොවි ක්ෂෙත්‍ර දින සහ ජනමාධ්‍ය වැඩසටහන් වලින් සමන්විත වේ.

ඉටුකරනු ලැබූ සුවිශේෂී කාර්යභාරයන් පහත පරිදි වේ.

- ගන්නෝරුව සේවා සංස්කරණ පුහුණු ආයතනය, අඟුණකොලපැලැස්ස සේවා සංස්කරණ පුහුණු ආයතනය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී මිනිස් දින 390ක පුහුණු වැඩසටහන් 8ක් පවත්වනු ලැබීය.
- ගොවි ක්ෂේත්‍ර අත්හදා බැලීමේ නිදර්ශන 211ක් පවත්වනු ලැබිණි.
- මිනිස් දින 475ක් වූ ගොවි පුහුණු වැඩසටහන් 12ක් සිරිපුර, විල්ගමුව, අඹන්පොල, ගොකරැල්ල, කොලොංගොඩ සහ වාරියපොළ ප්‍රදේශ වලදී පවත්වනු ලැබීය.
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානයේ සහ ගන්නොරුව කෘෂි තාක්ෂණික උද්‍යානයේ සමෝධානික පළිබෝධ කළමනාකරණ ආදර්ශන ගොවිපල 2ක් පිහිටුවනු ලැබිණි. මෙම වැඩසටහන හා සමගාමීව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන් 40 දෙනෙකු සඳහා එක් කන්නයක කාලපරිච්ඡේදයක් පුරා සමෝධානික පළිබෝධ කළමනාකරණ පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණි.
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, ගොකරැල්ල ගොවි ක්ෂේත්‍ර සහ කොලොංගොඩ ගොවි ක්ෂේත්‍රවල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන්ගේ සහ ගොවීන් පිරිසකගේ සහභාගිත්වය ඇතුළු ගොවි ක්ෂේත්‍ර දින වැඩසටහන් 3ක් පවත්වනු ලැබිණි.
- රූපවාහිනී නාලිකාව ඔස්සේ රූපවාහිනී වැඩසහනක් විකාශනය කෙරිණි.

**පළා එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණ**

බස්නාහිර පළාතේ පළා එළවළු වගාව සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපායන් ප්‍රවර්ධනය අඛණ්ඩව සිදුකෙරිණි. මත්තේගොඩ, මඩපාත, ඇරැව්වල, බටුවන්දර, බටගොඩ, කෙසෙල්හේන සහ කළුතර දිස්ත්‍රික්කයේ බලපිටිය යන ප්‍රදේශවල පළා එළවළු වගාවෙහි නිරත වී සිටින ගොවීන් 70 දෙනෙකු පුහුණු කරනු ලැබිණි. මෙම සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙතට මුකුණුවැන්න (*Alternanthera sessilis)* වල නෙමටෝඩාවන් පාලනය, ගොටුකොළ (*Centella asiatica*) හි වෙයන් පාලනය සහ පාරිසරික හිතකර පළිබෝධ නියාමන ක්‍රමවේද ඇතුළත් වේ.

**පළිබෝධනාශක නියමු මට්ටමේ පරීක්ෂා කිරීම්**

විවිධ ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ පහත දැක්වෙන නව වල්නාශක වල ජෛවීය උපයෝගීතාවය පරීක්ෂා කරනු ලැබීය. යම් විශේෂයකට ඉලක්ක කිරීමත් සාපේක්ෂව අඩු අනුපාතයන්ගෙන් යෙදීමත් හේතුවෙන් නිර්දේශිත වල්නාශකයට වඩා මෙම වල්නාශක වල වැඩි ප්‍රයෝජනයක් ඇත.

**වී සඳහා වල්නාශක**

වී වගාවේ තුන් අකාරයේ සියලුම ඒක වාර්ෂික වල් නියාමනය කිරීම උදෙසා දැනටමත් නිර්දේශ කර ඇති බිස්පයිරිබැක් සෝඩියම් 10% SC පරීක්ෂා කරනු ලැබ නිර්දේශ කෙරිණි.

- වී වගාවේ ඒක වාර්ෂික තුන් ආකාරයේම වල් පැළෑටි පාලනය කිරීමට වල් මතුවීමට පෙර වල්නාශකයක් ලෙස දැනටමත් නිර්දේශිත ප්‍රෙටිලැක්ලොර් (සොෆිට්) වලට විකල්පයක් ලෙස ප්‍රෙටිලැක්ලෝර් 30% EC නව ප්‍රභවය පරීක්ෂා කරනු ලැබ නිර්දේශ කෙරිණි.
- වී වගාවේ ඒක වාර්ෂික තුන් ආකාරයේම වල් පැළෑටි පාලනය කිරීම උදෙසා පුළුල් ක්‍රියාකාරී වල් නාශකයක් ලෙස කලාපීය පර්යේෂණ ස්ථානයන්හි ප්‍රාථමික පරීක්ෂා වලින් පසුව ගොවි ක්ෂේත්‍ර තත්ත්වයක් යටතේ ප්‍රොපයිරිසල්ෆියුරන් 10% SC තවදුරටත් පරීක්ෂා කර නිර්දේශ කෙරිණි.
- කලාපීය පර්යේෂණ ස්ථානයන්හි ප්‍රාථමික පරීක්ෂණ සිදු කිරීමෙන් පසු බලාපොරොත්තු තැබිය හැකි වල්නාශකයක් ලෙස වාර්තා වනු ලැබූ බිස්පියිරිබැක් සෝඩියම් 40 g/l+මොටාමිෆොප් 100 g/l SE ඇගයීම් කරනු ලැබ වී වගාවේ ඒක වාර්ෂික තුන් ආකාරයේම වල් ඵලදායී ලෙස පාලනය කිරීම උදෙසා නිර්දේශ කරනු ලැබිණි.

**ලොකු ලූනු සඳහා වල් නාශක**

ලොකු ලූනු වගාවේ වල් පැල පාලනය කිරීම උදෙසා වල් පැල මතුවීමට පෙර යොදන්නා වූ වල්නාශකයක් ලෙස දැනටමත් නිර්දේ ශිත ඔක්සිෆ්ලුඔරෙන්ෆෙන් සංඝටකයට විකල්පයක් ලෙස ඔක්සි ඔක්සිෆලුඔරෙන්ෆෙන් 24% EC අගයනු ලැබ නිර්දේශ කෙරිණි.

**අන්නාසි සඳහා වල් නාශක**

අන්නාසි වගාවේ වල් පැල මතු වීමට පෙර යොදන්නා වූ වල් නාශකයක් ලෙස දැනටමත් නිර්දේශිත ඩයුරෝන 80% WP ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ අගයනු ලැබ නිර්දේශ කෙරිණි.

අන්නාසි වගාවේ ප්‍රධාන වල් ඵලදායී ලෙස පාලනය කිරීම සඳහා පූර්ව හා පසු වල්නාශකයක් ලෙස ඩයුරෝන් 500 g/l Sc නව සංඝටකය මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදි පරික්ෂා කරනු ලැබ ගොවි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ අගයා නිර්දේශ කරනු ලැබිණි.

**ජලජ පැළෑටි සඳහා ජෛව විද්‍යාත්මක පාලන වැඩසටහන**

පැළෑටි සංරක්ෂණ සේවය විසින් ජෛව පාලන රෝපණ ද්‍රව්‍යය පහත වල් සඳහා නඩත්තු කරන අතර සැල්වීනියා (*Salvinia molesta*) සඳහා *Cyrtobagous salviniae* ද ජපන් ජබර (Eichornia crassipes) සඳහා *Neochetina bruichi* සහ *Neochetina eichhoiniae* සාම්පල හඳුන්වා දීම සහ නිකුත් කිරීම, රජයේ, පෞද්ගලික ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධානවල ඉල්ලීම මත සිදු කරනු ලැබේ. මෙම සෑම අවශ්‍යතාවයක් සඳහාම මෙම ජෛව පාලක සහ ඉලක්කගත වල් පැළෑටිය සමග ඇතිවන ක්‍රියාකාරීත්වය පිළිබඳව අදාළ පාර්ශ්වයන් සඳහා එම ස්ථානයේදී දැනුවත් වීමේ වැඩසටහන් පවත්වනු ලබයි.

ජාතික උද්‍යානවල සහ ජලාශයන්හි වල් පැළෑටි පාලනය කිරීම උදෙසා විශේෂ අවධානයක් යොදමින් වනජීවී දෙපාර්තමේන්තුව සමඟ එකතුව බොහෝ ක්‍රියාමාර්ග ගනු ලැබිය. පහත දැක්වෙන වැව් හා ජලාශයන්හි ආක්‍රමණශීලී වල් විශේෂයන් පාලනය කිරීම උදෙසා වූ කටයුතුවල නියැලේ.

වගුව **2.1.2.2 :** වැව් සහ ජලාශයන්හි නම්

| **වැව/ජලාශයේ නම** | **දිස්ත්‍රික්කය** | **නිදහස්කළ ජෛවීය පාලක ද්‍රව්‍යය** | **වල්පැළෑටි විශේෂ** |
|---|---|---|---|
| වෙහෙරබැද්දාගල වැව් 3 | අනුරාධපුර | *Cytobagous salviniae* | සැල්වීනියා |
| මහමේගස්සේගම වැව | | *Neochetina spp* | ජපන්ජබර |
| කැලේසියඹලා | | *Neochetina spp* | ජපන්ජබර |
| නබාද වැව | | *Neochetina spp* | ජපන්ජබර |
| | | *Cyrtobagous salviniae* | සැල්වීනියා |
| කිරිඅංගුණිකොල වැව | | *Neochetina spp* | ජපන්ජබර |
| ගම්මිරිගස් වැව | | *Cyrtobagous salviniae* | සැල්වීනියා |
| කොනකුම්බුගොල්ලව | | *Cyrtobagous salviniae* | සැල්වීනියා |
| මහවේවැල්කඩ වැව<br>කිරිගල්ල වැව | | *Cyrtobagous salviniae* | සැල්වීනියා |
| කොනකුම්බුගොල්ලාව | | *Neochetina spp* | ජපන්ජබර |
| ලාහුගල ජාතික උද්‍යානය, කඩහෙදගම වැව. යාල්පොත වැව | අම්පාර | *Cyrtobagous salviniae* | සැල්වීනියා |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැව්-මාවිල්ආරු සහ නීලපුර | ත්‍රිකුණාමලය | *Neochetina spp* | ජපන්ජබර |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කුමන රක්ෂිතයේ වැව් | මොණරාගල | *Neochetina spp* | ජපන්ජබර |
| වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වස්ගමුව වන ජීවී උද්‍යානයේ වැව් | මාතලේ | *Neochetina spp* | ජපන්ජබර |

මෙයට අමතරව ඉහත වල් පැළෑටි ජෛවියව පාලනය කිරීම පිළිබඳ පත්‍රිකා 10,000ක් "දැයට කිරුළ ප්‍රදර්ශනයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුම් උත්සවයේ ප්‍රදර්ශනයේදී බෙදාහරිනු ලැබිණි.

**බීජ ධූමායනය**

ගබඩා කර ඇති බීජ නිෂ්පාදනවලට ගබඩා පළිබෝධකයන්ගෙන් සිදුවන හානිය පාලනය කිරීම සහ අවම කිරීම උදෙසා පැල්වෙහෙර, පොළොන්නරුව, කන්තලේ, මුරුක්කන්, කරදියනාරු, කිලිනොච්චි, මහඉලුප්පල්ලම, නිකවැරටිය, අලුත්තරම, රහන්ගල, සීතා එලිය සහ පිදුරුතලාගල යන ප්‍රදේශවලදී

පහත දක්වා ඇති බීජ ප්‍රමාණයන් ධූමායනය කරනු ලැබීය.

| | |
|---|---|
| වී | මෙට්‍රික් ටොන් 2599 |
| වෙනත් ක්ෂේත්‍රබෝග | මෙට්‍රික් ටොන් 409 |
| අර්තාපල් බීජ | මෙට්‍රික් ටොන් 262 |

මෙම ධූමායන ඵලදායිතාවය වැඩි කිරීම උදෙසා මහඉලුප්පල්ලම බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ගොවිපල නිලධාරීන් උදෙසා "ධූමායනය සඳහා බීජ ගබඩා ස්ථාන සූදානම් කිරීම සහ ධූමායන ක්‍රමෝපායන් පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය. ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඉල්ලීමක් මත තිප්පිලි මෙට්‍රික්ටොන් 4ක් ධූමායනය කරනු ලැබිණි. මෙයට අමතරව ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සංරක්ෂණය කිරීමට අවශ්‍ය වනු ලබන වැදගත් ලේඛන දෙපාර්තමේන්තු ඉල්ලීම මත ධූමායනය කරනු ලැබිණි.

බස්නාහිර පලාතේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ ගබඩා පළිබෝධකයින් පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් උදෙසා පැලෑටි සංරක්ෂණ සේවය විසින් සම්පත් දායකයින් සපයනු ලැබිණි.

**වේයන් පාලනය**

පැළෑටි සංරක්ෂණ සේවය විසින් ගොඩනැගිලි සහ ඉදිකිරීම් ස්ථාන කිහිපයක වේයන් පාලනය කිරීම භාරගනු ලැබිණි. හොරණ පළතුරු පර්යේෂණ ආයතනය, පේරාදෙණිය කෘෂිකර්ම පීඨය සහ ගන්නෝරුව පශුවෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් මෙම පාලන ක්‍රියාවලින් සිදු කරනු ලබයි.

බස්නාහිර පලාතේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් 35 දෙනෙකු සඳහා ගොඩනැගිලිවලට වේයන් ආක්‍රමණය පාලනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණි.

**මීයන් පාලනය**

ප්‍රධාන වශයෙන් කෑගල්ල හා මාතලේ දිස්ත්‍රික්කයනහි ගොවීන් සහ ව්‍යාප්ති නිලධාරීන් 280 දෙනෙකු සඳහා වී වගාවේ කන්නයක් පුරා මීයන් පාලනය පිළිබඳ වැඩසටහනක් පවත්වනු ලැබිණි. මෙම වැඩසටහන යටතේ නිදර්ශන තුනක්ද පැවැත්විණි.

මෙයට අමතරව තෙත් කලාපීය වී වගාවේ හානි අවම කිරීම උදෙසා නිවැරදි ක්‍රමෝපායන් පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට කළුතර දිස්ත්‍රික්කයේ "ඉලිම්බ" හිදී සමෝධානික මීයන් කළමනාකරණ වැඩසටහනක් පවත්වනු ලැබිණි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි දිවිනැගුම වැඩසටහන යටතේ බීජ පැකට් ගබඩාවලට මීයන් ආක්‍රමනය කිරීම පාලනය කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ගනු ලැබිණි.

**පැළෑටි පළිබෝධකයින් සඳහා නිරීක්ෂණ වැඩසටහන**

පැළෑටි සංරක්ෂණ සේවය මෙම වැඩසටහන යටතේ, වී වගාවේ ලංකාව පුරා පළිබෝධකයන්ගේ ගහනයන් පිළිබඳව තොරතුරු එක්රැස් කළ අතර ප්‍රස්තාර වශයෙන් එම තොරතුරු සංක්ෂිප්ත ලෙස සකස් කිරීමට එම තොරතුරු උපයෝගී කරගනු ලැබිණි. විද්‍යුත් තැපැල් සහ තැපැල් මගින් මෙම තොරතුරු සියලුම දිස්ත්‍රික්කයන් හට බෙදා හැරිණි. මෙයට අමතරව වර්තමානයේ පළිබෝධකයන් හේතුවෙන් ඇතිවන ගැටළු පිළිබඳව ගොවීන්ට අනතුරු ඇඟවීම උදෙසා කෘෂිකර්මාන්ත වැඩසටහන යටතේ ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාව හරහා නිරතුරුවම වර්තමාන පළිබෝධකයන්ගේ තත්ත්වයන් පිළිබඳව කෙටි පණිවිඩ විකාශනය කෙරිණි. සමහර ප්‍රදේශවල ලොකු ලූනු සහ රතු ලූනු වගාවන් සඳහා

පළිබෝධකයින් ආක්‍රමනය කිරීමේ ඉතාමත් ඉහළ අවධානමක් (විශේෂයෙන් ලූනු බල්බ කුණු වීමේ රෝගය) පවතින හෙයින් පලිබෝධකයින් පිළිබඳ සිදුවීම් වාර්තා කිරීම වඩාත් පුළුල් කරනු ලැබිණි.

## වෙනත් ක්‍රියාවලීන්

### පාර්තේනියම් (*Parthenium hysterophorus*) පාලනය

විදේශිය ආක්‍රමණික වල් විශේෂයක් වන "පාර්තේනියම් පාලනය අඛණ්ඩව සිදු කෙරිණි. වවුනියාව නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල මඟින් සංවිධානය කරනු ලැබූ "පාර්තේනියම් පාලන දිනය" නැමති වැඩසටහන සඳහා පැළෑටි සංරක්ෂණ සේවයේ නිලධරීහු සහභාගී වූහ. හෙක්ටයාර 10ක භූමි ප්‍රදේශයක වල්පැළෑටි පාලනය සඳහා ප්‍රතිකර්ම ආරම්භ කරනු ලැබූ අතර පෝස්ටර් 500ක් සහ පත්‍රිකා 2000ක් බෙදාහරිනු ලැබිණි.

### කහ තිත් පළගැටියා - Spotted locust (*Aularches miliaris*) පාලනය

රඹුක්කන පරපේ කඳු කලාපයට ආසන්න ප්‍රදේශවල සහ මොණරාගල උඩවැඩියා ප්‍රදේශය ඇතුළුව දැඩි ලෙස පළගැටියා ආක්‍රමණය කර ඇති ප්‍රදේශ කිහිපයක් වර්තා වනු ලැබීය.මෙසේ ආක්‍රමණ ප්‍රදේශවල පළිබෝධක ගැටළුවට එරෙහිව ක්‍රියාත්මක වීම උදෙසා ගොවීන් හට හා නිලධාරීන් හට විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.මෙම උවදුර බලපෑ දිස්ත්‍රික්කයන් හට බෙදාහැරීම උදෙසා කහ තිත් පළගැටියා ආක්‍රමණය පාලනය පිළිබඳ පත්‍රිකා සකස් කරනු ලැබිණි. පැළෑටි සංරක්ෂණ සේවය මගින් ක්‍රියාත්මක කරන්නා වු මාර්ගගත පළිබෝධකයින් හඳුනාගැනීමේ වැඩසටහන හරහාද මෙම තොරතුරු බෙදා හැරිණි.

### බෝග සායන

දේවහුව, ගලෙන්බිඳුණු වැව, පදවිය හා රම්බාව යන ප්‍රදේශවල පවත්වනු ලැබූ බෝග සායන උදෙසා පැළෑටි සංරක්ෂණ සේවයේ නිලධාරීහු සහභාගී වූහ. අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම සායන සම්බන්ධීකරණය කරනු ලැබූ අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් 1500 දෙනෙකු සඳහා මෙමගින් සෙත සැලසිණි.

### ගෙවතුවල පළිබෝධකයින් නියාමනය කිරීම උදෙසා ස්වභාවික පළිබෝධනාශක

ගෙවතු සඳහා සවභාවික පළිබෝධනාශක ප්‍රවර්ධනය උදෙසා විශේෂ අවධානයක් යොමු කෙරිණි. මේ වැඩසටහන යටතේ ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීමටත්, ගොවීන් හට ස්වකීය ක්ෂේත්‍ර උදෙසා කෘමිනාශක ගුණය සහිත ශාක නිස්සාරකයන් භාවිත කිරීමටත් විශේෂ අවධානයක් යොමු කෙරිණි.

### රඹුටන්වල රෝග පාලනය

කළුතර දිස්ත්‍රික්කයේ කහව, ඉංගිරිය සහ හඳපාන්ගොඩ යන ප්‍රදේශවල ස්ථාන 8ක රඹුටන්වල රෝග පාලනය කිරීම උදෙසා වූ පාලන පිළිවෙත් පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

### පේරවල මූල ගැටිති නෙමටෝඩාවන් පාලනය

2008 වසරේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාර්තා වූ පේරවල මූල ගැටිති නෙමටෝඩාවන් ආක්‍රමණය කිරීම පිළිබඳ සමීක්ෂණය තවදුරටත් අඛණ්ඩව සිදු කෙරිණි. ඉහත නෙමටෝඩාවන් ආක්‍රමණය පාලනය කිරීමේදී පැළෑටි සංරක්ෂණ සේවයේ මහ ඉලුප්පල්ලම උප ඒකකය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි.

මෙයට අමතරව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පේර වගා කරන ගොවීන් හට නෙමටෝඩාවන්ගේ හානිය පාලනය කිරීම

උදෙසා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

**පූජනීය බෝ ශාඛයේ පළිබෝධකයින් සහ රෝග**

ඓතිහාසික ලෙස වැදගත් පන්සල් කිහිපයකටම අයත් බෝ ශාක කිහිපයක් සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම කිරීමට කටයුතු කෙරිණි.

**ප්‍රදර්ශන**

2012 ඔයාමඩුව දැයට කිරුළ ප්‍රදර්ශනයේදී සහ ගොවිසෙත වැඩසටහන යටතේ පැළෑටි සංරක්ෂණ සේවයේ කාර්යයන් පිළිබිඹු කරන්නට ප්‍රදර්ශන කුටියක් ඉදි කරනු ලැබීය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශතසංවත්සර ප්‍රදර්ශනයට සමගාමීව ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානයේ ස්ථිර ප්‍රදර්ශන කුටියක් ඉදි කෙරිණි.

## නව වැඩසටහන්

විවිධ වර්ගයේ පළිබෝධ ආක්‍රමනයන් සහ ඒ සඳහා වූ ප්‍රතිකර්මයන් කඩිනම්ව හඳුනා ගැනීමට අවශ්‍ය වන්නාවූ ව්‍යාප්ති ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ කටයුතු පහසු කිරීම උදෙසා "මාර්ග ගතව පළිබෝධකයින් හඳුනාගැනීමේ සේවාව"නමින් නව වැඩසටහනක් පැළෑටි සංරක්ෂණ සේවය විසින් දියත් කෙරිණි. මෙම වැඩසටහනේ විද්‍යුත්තැපැල් ලිපිනය වන්නේ "ppsepest@gmail.com"ය මෙම සේවයට නිලධාරීන් 80ක් පමණ ලියාපදිංචි වෙමින් හොඳ ප්‍රතිචාරයක් මෙම වැඩසටහනට ලැබිණි. ලියාපදිංචි නිලධාරීන් විසින් එවනු ලබන පින්තූර හා වීඩියෝ දර්ශන පදනම්ව රෝගයන් හඳුනාගැනීම සහ උචිත ප්‍රතිකර්මයන් ලබාදීමේ අරමුණ ඇතිව 2012 නොවැම්බර් මස මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ පාර්ශ්වයන්ගේ සහභාගීත්වය ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. වෙනත් අදාළ පත්‍රිකා, තොරතුරු ලේඛන සහ අනෙකුත් වැදගත් පණිවිඩ ව්‍යාප්ත කිරීම, උදෙසා ද මෙම වැඩසටහන උපයෝගී කරගනු ලබයි.

# 2013 සැලැසුම

- ශාක සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
- වීවල සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය
- එළවළුවල සමෝධානික පළිබෝධ කළමනාකරණය
- පළා එළවළුවල සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය
- පළිබෝධකයින් පැතිරීම පාලනය
- කුඹුරුවල මීයන් පාලනය
- ආක්‍රමණික ජලජ වල් පැළෑටි පාලනය
- කෘෂිකාර්මික භූමිවල විදේශීය ආක්‍රමණික වල් පැළෑටි පාලනය
- නියමු මට්ටමෙන් වල් නාශක පරීක්ෂා කිරීම
- බීජ ධූමායනය
- විශේෂ ක්‍රියාවලීන්
  - වී පළිබෝධක සිදුවීම පිළිබඳ දත්ත බැංකුවක් පිහිටුවීම
  - වර්ණවත් පින්තූර සමග එළවළු සම්බන්ධ රෝගයන් පිළිබඳ තොරතුරු පත්‍රිකා සැකසීම
  - රජයේ ගොඩනැගිලිවල වේයන් ආක්‍රමණය පාලනය
    වේයන් පාලනය පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණුව
- ස්ථිර බෝග සායන වැඩසටහන්
- පුහුණු ද්‍රව්‍ය නිෂ්පාදනය

## කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරී | 02 |
| කෘෂිකර්ම නිලධාරී | 03 |
| වැඩසටහන සහකාර | 01 |
| කෘෂිකර්ම උපදේශක | 08 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 |
| රියදුරු | 04 |
| කම්කරු | 05 |
| ගබඩා කම්කරු | 01 |
| ලොරි සහායක | 01 |
| **එකතුව** | **30** |

# 2.1.3 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක

ශ්‍රී ලංකාවේ ජාතික පැළෑටි නිරෝධායන සේවයට පැවරී ඇති වගකීම වන්නේ මෙරට කෘෂිකර්මයේ හා ඒ ආශ්‍රිත කර්මාන්තවල සංවර්ධනය සඳහා පළිබෝධවලින් තොර පැළෑටි හා පැළෑටි නිෂ්පාදන ආනයනය සහ අපනයනය සඳහා පහසුකම් සැලසීමයි. මෙම වගකීම ඉටු කිරීම සඳහා පර්යේෂණ මෙන්ම සේවා ද පාදක කරගත් නිරෝධායන කාර්යයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

ජාතික පැළෑටි නිරෝධායන සේවය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වන්නේ උද්භිද ස්වස්ථතාව සහතික කිරීම, ආනයනය කරන පැළෑටි හා පැළෑටි නිෂ්පාදන පරීක්ෂා කිරීම හා ඒවාට අවශ්‍ය ප්‍රතිකර්ම කිරීම, රඳවා ගනු ලැබූ නියැදි පරීක්ෂා කිරීම සහ මේ පිළිබඳ උනන්දුවක් දක්වන කණ්ඩායම්වලට පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පැළෑටි නිරෝධායනයේ සියලුම අංශ පිළිබඳ දැනුම බෙදා දීමයි. නිරෝධායන කටයුතු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් යොදා ධූමකරණය කිරීම විධිමත් කිරීම සඳහා 2012 මාර්තු 01 දින සිට ජාතික ඕසෝන් ඒකකය ජාතික පැළෑටි නිරෝධායන සේවය සමග එක්ව ක්‍රියා කළේය. පැළෑටි නිරෝධානය සහ ඒ ආශ්‍රිත කටයුතු සියල්ල එකම ස්ථානයකින් සිදු කිරීමේ වැදගත්කම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් හඳුනාගෙන ඇත. එමනිසා, 2012 සැප්තැම්බර් 24 දින සිට ජාතික පැළෑටි නිරෝධායන සේවය වෙනම ආයතනයක් වශයෙන් පිළිගන්නා ලද අතර වර්තමානයේ එය සෘජුවම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් යටතේ පාලනය වේ. ඒ අනුව, 2012 සැප්තැම්බර් 25 දින සිට ජාතික පැළෑටි නිරෝධායන සේවය පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කර ඇත. පසුව, මෙම සේවය සඳහා අතිරේක අධ්‍යක්ෂ තනතුරක් ලබා දෙන ලදී.

එමෙන්ම, මෙම ආයතනය තම කටයුතුවලදී නිරතුරුවම ජාතික පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ආයතන සහ මධ්‍යස්ථාන සමග සහයෝගයෙන් ක්‍රියා කරයි. 2012 වර්ෂයේදී අත්කර ගත් මූල්‍ය, තාක්ෂණික සහ සේවාමය වැඩකටයුතුවල ප්‍රගතිය මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ.

## අයවැය

මූලධන, පුනරාවර්තන හා ව්‍යාපෘති වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක 2.1.3.1හි දැක්වේ.

**වගු අංක: 2.1.3.1: මූලධන, පුනරාවර්තන හා ව්‍යාපෘති වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 6,278,000 | 3,130,839 | 49 |
| පුනරාවර්තන | 7,502,000 | 6,846,095 | 91 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතිය | 2,868,700 | 1,591,086 | 55 |
| **එකතුව** | **16,648,700** | **11,568,020** | **69** |

# ප්‍රගතිය

## පැළෑටි නිරෝධායන මෙහෙයුම් කටයුතු

2012 වර්ෂයේදී පැළෑටි නිරෝධායන මෙහෙයුම් අංශය විසින් ඉටු කළ කාර්යයන් වගු අංක 2.1.3.2හි දැක්වේ.

**වගු අංක 2.1.3.2 : 2012 වර්ෂයේදී ඉටු කළ කාර්යයන්**

| කාර්යය | කාර්යඵලය |
|---|---|
| රඳවා ගත් තොග ලියාපදිංචිය | 239 |
| රඳවාගත් තොග සම්බන්ධයෙන් යවන ලද වාර්තා සංඛ්‍යාව | 1,095 |
| පරීක්ෂා කිරීම් ලියාපදිංචිය | 1,123 |
| ප්‍රවේශ ස්ථානවලට යවන ලද පරීක්ෂා කිරීම පිළිබඳ වාර්තා සංඛ්‍යාව | 1,116 |
| පරීක්ෂා කිරීම සඳහා කොහු ආශ්‍රිත නිෂ්පාදන ලියාපදිංචිය | 206 |
| පරීක්ෂා කරන ලද කොහු ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ වාර්තා | 195 |
| පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද නියැදි ලියාපදිංචිය | 53 |
| උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම | 05 |
| විනාශ කරන ලද ගැටලු සහිත තොග සංඛ්‍යාව | 768 |
| නිකුත් කරන ලද ආනයන බලපත්‍ර සංඛ්‍යාව (2012 සැප්. 25 සිට 2012 දෙසැ. 31 දක්වා) | 862 |

පැළෑටි නිරෝධායන මෙහෙයුම්වලට සම්බන්ධ මෙම කටයුතුවලට අමතරව, මෙම අංශය පැළෑටි නිරෝධායන කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ පුළුල් මට්ටමේ පුහුණු වැඩසටහන් 14ක් සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කළේය.

## කීට විද්‍යාව

**අපනයනය හා ආනයනය කරන තොගවල ව්‍යාධිජනක ඇත්දැයි පරීක්ෂා කර බැලීම**

**අපනයන**

- අපනයන විසිතුරු පැළ තවාන් 15කින් එක්රැස් කරගත් අපනයනයට ඇති විසිතුරු පැළ නියැදි 16,924ක් පැළෑටි පරපෝෂිත වට පණුවන් සිටී දැයි පරීක්ෂා කර බලන ලදී. නියැදි 936ක් පැළෑටි පරපෝෂිත වටපණුවන්ගේ ආසාදනයට ලක්ව තිබිණි.
- අපනයනය සඳහා ඇති විසිතුරු පැළෑටි නියැදි 6,284ක් කෘමි පළිබෝධ හා මයිටාවන් සිටී දැයි පරීක්ෂා කර බලන ලදී. මෙම නියැදිවල ආසාදිතවීම් කිසිවක් පිළිබඳව වාර්තා නොවිණි.
- කොහු කර්මාන්ත ශාලා 13කින් එක්රැස් කර ගත් අපනයනය සඳහා වූ කොහු ආශ්‍රිත නිෂ්පාදන 91ක් කෘමි පළිබෝධ, මයිටාවන්, පාංශු ආසාදන කාරක සහ පැළෑටි පරපෝෂිත වටපණුවන් සිටීදැයි පරීක්ෂා කර බලන ලදී. ආසාදන කාරක 6ක් පිළිබඳව වාර්තා විණි.
- අපනයන විසිතුරු පැළ තවාන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් විශේෂ නියැදි 112ක් ඔවුන්ගේ පළිබෝධ නිරීක්ෂණ වැඩසටහනට සහායක්

වශයෙන් පැළෑටි පරපෝෂිත වටපණුවන් හා කෘමි පළිබෝධ ඇත්දැයි පරීක්ෂා කර බලන ලදී.

**ආනයන**

- ආනයනය කරන ලද බීජ අර්තාපල් තොග 56ක් වරායේදී පරීක්ෂා කර බලන ලදී. මෙහිදී නියැදි එක්රැස් කරගෙන කෘමි පළිබෝධ සහ පැළෑටි පරපෝෂිත වටපණුවන් ඇත්දැයි පරීක්ෂා කර බලන ලදී. ආසාදන කිසිවක් වාර්තා නොවිණි.
- ආනයනය කරන ලද දෙමුහුම් බඩඉරිඟු, රටකජු, පුවක්, කජු, ස්පැග්නම් (*Spagnum*) පීට් මොස්, ලිලියම් (*Lilium*) බල්බ, පැසවීමට ලක් කළ කොකෝ ඇට යනාදිය ඇතුළු රෝපණ ද්‍රව්‍ය 340ක් කෘමි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි පරපෝෂිත වටපණුවන් සිටීදැයි පරීක්ෂා කර බලන ලද අතර නියැදි 8ක් සාමාන්‍ය ගබඩා පළිබෝධ හේතුවෙන් ආසාදනය වී තිබූ බව සොයා ගැනිණි. එමෙන්ම, ඉන්දුනීසියාවෙන් ආනයනය කළ පුවක් නියැදියක්ද ක්‍රිප්ටොලෙස්ටස් විශේෂ (*Cryptolestess* spp.) හේතුවෙන් ආසාදනය වී තිබිණි.

## පුහුණු කටයුතු

විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ පාසැල් සිසුන් රැසකට කීට විද්‍යා අංශය යටතේ පුහුණුව ලබා දෙන ලදී. අපනයන විසිතුරු පැළ තවාන් කාර්ය මණ්ඩල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් පැවැත්විණි.

## ව්‍යාධිවේදය

### අපනයන හා ආනයන තොගවල ව්‍යාධිජනක සිටීදැයි පරීක්ෂා කර බැලීම

### අපනයන තොග

**විසිතුරු පැළ**

අපනයන විසිතුරු පැළ නියැදි 5,645ක් පරීක්ෂා කර බලා පහත සඳහන් ව්‍යාධිජනක සොයා ගන්නා ලදී. මියුකර් විශේෂය (*Mucor* sp.), ඇස්පර්ගිලස් විශේෂය (*Aspergillus* sp.), ෆියුසේරියම් විශේෂය (*Fusarium* sp.), මැක්‍රොෆොමිනා විශේෂය (*Macrofhomina* sp.), පෙනිසිලියම් විශේෂය (*Penicillium* sp.), රයිසොපස් විශේෂය (*Rhizopus* sp.), සැන්තොමොනාස් විශේෂ (*Xanthomanas* sp.) සහ අර්විනියා විශේෂය (*Erwinia* sp.)

**කොහු**

කොහු නිෂ්පාදන කම්හල්වලින් එක්රැස් කරගත් අපනයනය සඳහා ඇති කොහු නියැදි 30ක් පැළෑටි ව්‍යාධිජනක ඇත්දැයි පරීක්ෂා කර බලන ලදී. එක්රැස් කර ගත් කොහු නියැදිවල මියුකර් විශේෂය (*Mucor* sp.), ඇස්පර්ගිලස් විශේෂය (*Aspergillus* sp.),පෙනිසිලියම් විශේෂය (*Penicillium* sp.), රයිසොපස් විශේෂය (*Rhizopus* sp.), තැලවියොප්සිස් පැරඩොසා (*Thalaviopsis paradoxa*) තිබී සොයා ගන්නා ලදී.

මෙම ව්‍යාධිජනක අතරින් තැලවියොප්සිස් පැරඩෝසා (*Thalaviopsis paradoxa*) නිරෝධායන වැදගත්කමක් ඇති පළිබෝධයෙකු වශයෙන් සැලකේ.

## පටක රෝපිත පැළෑටි

පරීක්ෂා කිරීම් 115කදී පැළෑටි 1,618, 904ක් පරීක්ෂා කර බලන ලදී. පරීක්ෂා කිරීම්වලදී ආසාදිත නියැදි තිබූ බහාළුම් ප්‍රතික්ෂේප කරන ලද අතර උපදෙස් ලබා දෙන ලදී.

### ආනයන තොග

**බීජ අර්තාපල්**

බීජ අර්තාපල් නියැදි 80ක් පරීක්ෂා කර පහත සඳහන් රෝග හඳුනා ගන්නා ලදී.
රිදී පටල රෝගය, පොදු කබොළු රෝගය, මෘදු කුණුවීම, කළු පටල රෝගය, ජාලාකාර කබොළු සහ වියළි කුණුවීම. මෙහිදී නිරෝධායන ව්‍යාධිජනක කිසිවක් සොයා ගැනීමට නොලැබිණි.

**බීජ හා වෙනත් රෝපණ ද්‍රව්‍ය**

නියැදි 419ක් පරීක්ෂා කර බලන ලද නමුත් නිරෝධායන ව්‍යාධිජනක කිසිවක් සොයා ගැනීමට නොලැබිණි.

## එවන ලද නියැදි පරීක්ෂා කිරීම

නියැදි 65ක් පරීක්ෂා කර බලා ඒ පිළිබඳ අදහස් / සොයා ගැනීම් වගකිය යුතු පාර්ශ්වයන්ට ලබාදෙන ලදී.

## පුහුණු කිරීම්

පුහුණු වැඩසටහන් 3ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් පවත්වන ලදී. උපාධි අපේක්ෂකයෝ සහ ඩිප්ලෝමා සිසුන් 23දෙනෙක් අධීක්ෂණය කරන ලදහ.

## පර්යේෂණ වැඩසටහන්

බීජ අර්තාපල්වල ඇති රැල්ස්ටොනියා සොලනේසියාරුම් [*Ralstonia so lanacearum* (E.F.Smith)] අණුක තාක්ෂණය මගින් හඳුනා ගැනීම, ආසාදිත ඩ්‍රැසීනා සැන්ඩ්‍රියානා (*Draceana Sandreana*) පත්‍රවල කාරක ජීවියා අණුක තාක්ෂණය මගින් හඳුනා ගැනීම සහ සුදුසු පාලන ක්‍රමයක් සොයා ගැනීම පිළිබඳ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

## වල් පැළෑටි විද්‍යාව

**අපනයන සහ ආනයන තොගවල ව්‍යාධිජනක ඇත්දැයි පරීක්ෂා කර බැලීම**

**අපනයන**

අපනයන සඳහා වූ කොහුබත් නිෂ්පාදන 180ක් පරීක්ෂා කර බලන ලද අතර ඉන් 51ක් ජීව්‍ය බීජ හේතුවෙන් අපවිත්‍රව තිබිණි.

**ආනයන**

ආනයන තොග 77ක් පරීක්ෂා කර බලන ලද අතර එයින් තොග 16ක් වල් පැළෑටි බීජ හේතුවෙන් අපවිත්‍රව පැවති බව සොයා ගැනිණි. ඒ අතරින් නිරෝධායන වැදගත්කමක් සහිත වල් පැළෑටි බීජ විශේෂ (*Cerastium glomeratum, Lactuca scariola, Eurphorbia dentate*) ලූනු බීජ තොගවල තිබී සොයා ගැනිණි.

## පුහුණු කිරීම්

විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ පාසැල් සිසුන් විශාල සංඛ්‍යාවකට වල් පැළෑටි විද්‍යා අංශය යටතේ පුහුණුව ලබා දිණි.

## පර්යේෂණ වැඩසටහන්

කොහුබත් නිෂ්පාදනවල ජීව්‍යතාවෙන් යුතු බීජ පවතීදැයි පරීක්ෂා කර බැලීම සඳහා සිදු කරන වගා අත්හදා බැලීම් (The Universal Standard testing procedure) සම්පූර්ණ කිරීම පිණිස මසක පමණ කාලයක් අවශ්‍ය වේ. කොහු බත් නිපැයුම්වල තිබී සොයා ගනු ලැබූ වල් පැළෑටි බීජවල සුප්තතාව නැති කිරීම සඳහා ප්‍රතිකර්ම රසක් අත්හදා බලන ලදී. පර්යේෂණය තවදුරටත් සිදු කෙරෙමින් තිබේ.

## විමර්ශන එකතුව නඩත්තු කිරීම

නව වල් පැළෑටි විශේෂ 05ක් එක්රැස් කර සංරක්ෂණය කිරීමෙන් පසු ප්‍රදර්ශනයට සුදුසු අයුරින් සැකසිණි.

නව වල් පැළෑටි බීජ විශේෂ 16ක් එක්රැස් කර සංරක්ෂණය කෙරිණි.

## ප්‍රතිකර්ම තාක්ෂණය

**වාණිජමය ධූමකරණ**

විවිධ සමාගම් විසින් අපනයනය කිරීමට තිබූ පැළෑටි සහ පැළෑටිමය නිෂ්පාදන තොග 78ක් මීතයිල් බ්‍රෝමයිඩ් යොදා ගනිමින් ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී ධූමකරණය කෙරිණි.

ගුවන් තොටුපළෙහි ඇති පැළෑටි නිරෝධායන ඒකකය විසින් රඳවා ගන්නා

ලද විවිධ මල් තොග 6ක් සහ සඳුන් කැබලි තොගයක් ආනයනකරුට නිදහස් කිරීමට පෙර ධූමකරණය කරන ලදී.

**වගු අංක 2.1.3.3 : 2012 වර්ෂයේදී කටුනායක ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී සිදු කළ වාණිජමය ධූමකරණ**

| ධූමකරණය කළ ද්‍රව්‍යය | ධූමකරණ සංඛ්‍යාව |
|---|---|
| කොහු හා කොහු නිෂ්පාදන | 43 |
| දැව සහ දැව භාණ්ඩ | 19 |
| සර්බෙරා | 07 |
| මල් | 21 |
| වියළි ඖෂධ පැළෑටි | 07 |
| බීජ | 02 |
| කුළුබඩු | 01 |
| වෙනත් | 01 |
| **එකතුව** | **78** |

### නිරෝධායන ප්‍රතිකර්ම අධීක්ෂණය

අපනයනකරුවන්ගේ ඉල්ලීම පරිදි, පෞද්ගලික ධූමකරුවන් විසින් ලී ඇසුරුම් සහ අනෙකුත් පැළෑටි හා පැළෑටි නිෂ්පාදන සඳහා සිදුකළ ධූමකරණ 169ක් සහතිකකරණ කටයුතු උදෙසා ප්‍රතිකර්ම තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් අධීක්ෂණය කරන ලදී.

## 2013 වර්ෂය සඳහා සැලැස්ම

### උසස් තත්ත්වයේ පැළෑටි හා පැළෑටිමය නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධන කිරීම

- අපනයනය සඳහා පැළෑටි වගා කරන තවාන් පරීක්ෂා කිරීම්
- අපනයනය සඳහා පැළෑටි සහ පැළෑටිමය නිෂ්පාදන සකස් කරන කම්හල් පරීක්ෂාව
- කෘෂිකර්මය ආශ්‍රිත වෙනත් අපනයන ද්‍රව්‍ය පරීක්ෂා කිරීම් ( එක් එක් වශයෙන් පටක රෝපණ පැළෑටි පරීක්ෂා කිරීම්)
- නියැදි ගැනීම්
- ලිපි ලේඛන පරීක්ෂාව
- පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- වටපණුවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- වල් පැළෑටි පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- අවසන් පරීක්ෂණ වාර්තා ලබාදීම

### ආනයනය කළ බීජ අර්තාපල්වල තත්ත්වය නිශ්චය කර ගැනීම

- බීජ අර්තාපල් ප්‍රවේශ ස්ථානයේදී පරීක්ෂා කර බැලීම
- නියැදි ගැනීම
- ලිපි ලේඛන පරීක්ෂාව
- පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- වටපණුවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- අවසන් පරීක්ෂණ වාර්තා ලබාදීම

### ආනයනය කරන පැළෑටි සහ පැළෑටි නිෂ්පාදනවල තත්ත්වය පිළිබඳව නිශ්චය කර ගැනීම

- ප්‍රවේශ ස්ථාන පරීක්ෂාවන්
- නියැදි ගැනීම
- ලිපි ලේඛන පරීක්ෂාව
- ප්‍රවේශ ස්ථාන විසින් ජාතික පැළෑටි නිරෝධායන සේවයට ඉදිරිපත් කරන නියැදි ලබා ගැනීම
- පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- වටපණුවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව

- වල් පැළෑටි පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන නිදහස් කිරීම
- ප්‍රතිකර්ම නිර්දේශ කිරීම
- ප්‍රති අපනයනය හෝ විනාශ කිරීම

### ආනයනය කරන බීජ, පලතුරු සහ එළවළුවල තත්ත්වය නිශ්චය කර ගැනීම

- ප්‍රවේශ ස්ථාන පරීක්ෂාවන්
- නියැදි ගැනීම
- ලිපි ලේඛන පරීක්ෂාව
- ප්‍රවේශ ස්ථාන විසින් ජාතික පැළෑටි නිරෝධායන සේවයට ඉදිරිපත් කරන නියැදි බාර ගැනීම
- පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- වටපණුවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- වල් පැළෑටි පිළිබඳ විද්‍යාගාර පරීක්ෂාව
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- බීජ, පලතුරු සහ එළවළු තොග නිදහස් කිරීම
- ප්‍රතිකර්ම නිර්දේශය
- ප්‍රති අපනයනය හෝ විනාශ කිරීම

### උද්භිද ස්වස්ථතා අවශ්‍යතා සපුරාලීමෙන් තොරව සිදු කරන ආනයන වැළැක්වීම

- ලිපි ලේඛන පරීක්ෂාව
- නියැදි ගැනීම
- රඳවා ගත් පැළෑටිවල ව්‍යාධිජනක ඇත්දැයි පරීක්ෂා කර බැලීම
- රඳවා ගත් පැළෑටිවල කෘමි පළිබෝධ සිටීදැයි පරීක්ෂා කර බැලීම
- පැළෑටි පරපෝෂිත වටපණුවන් සිටීදැයි පරීක්ෂා කර බැලීම
- වල් පැළෑටි තිබේදැයි පරීක්ෂා කර බැලීම
- පරීක්ෂණ වාර්තා ලබාදීම
- අවසන් පරීක්ෂණ වාර්තා ලබාදීම
- ප්‍රතිකර්ම නිර්දේශ කිරීම
- ප්‍රතිකර්ම අධීක්ෂණය
- ප්‍රති අපනයනය
- විනාශ කිරීම

### පශ්චාත් ප්‍රවේශ නිරෝධායන කටයුතු

- ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයන්හි පැළෑටි තබා ගැනීම
- වාර්තා/නිර්දේශ
- අවසාන වාර්තා ලබාදීම

### ආනයනය හා අපනයනය කළ පැළෑටි හා පැළෑටි නිෂ්පාදනවල සිට සොයා ගනු ලැබූ පළිබෝධ විනාශ කර දැමීම සඳහා ප්‍රතිකර්ම යෙදීම

- ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී ධූමකරණය කිරීම
- ජාතික පැළෑටි නිරෝධායන සේවයෙන් පරිබාහිරව සිදු කළ ධූමකරණ අධීක්ෂණය
- ධූමකරණ වාර්තා නිකුත් කිරීම

### විමර්ශන එකතුව පවත්වා ගෙන යෑම

- වල් පැළෑටි විශේෂ සහ වල් පැළෑටි බීජ විශේෂ
- කෘමීන්
- රෝග ආසාදිත නියැදි
- සජීවී ජලජ පැළෑටි

## පාර්ශ්වකරුවන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

- පුහුණු කිරීම්
- උපාධි අපේක්ෂකයින්/ ඩිප්ලෝමා සිසුන් අධීක්ෂණය
- දැනුවත් කිරීමේ වැඩසටහන්
- වැඩමුළු
- සම්මන්ත්‍රණ

## නිරෝධායනය ආශ්‍රිත පර්යේෂණ

- පළිබෝධ සමීක්ෂණ
- පළිබෝධ අවදානම් විශ්ලේෂණ
- වල් පැළෑටි පාලනය පිළිබඳ පර්යේෂණ
- ව්‍යාධිවේද පර්යේෂණ
- නිරෝධායන ප්‍රතිකර්ම පිළිබඳ පර්යේෂණ

## පැළ තවාන් ලියාපදිංචි කිරීම

- නියමිත රටවලට පැළෑටි අපනයනය කිරීම
- ක්ෂේත්‍ර පරීක්ෂාව
- විගණනය
- වාර්තා ලබාදීම

## ප්‍රතිකර්ම යොදන්නන් සතු පහසුකම් ඇගයීම

- ප්‍රතිකර්ම යොදන පරිශ්‍ර පරීක්ෂා කර බැලීම
- විගණනය

උද්භිත ස්වස්ථතා සහතික නිකුත් කිරීම ද පැළෑටි හා පැළෑටි නිෂ්පාදන සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම ද මෙම ආයතනය මගින් සිදු කෙරේ.

## කාර්ය මණ්ඩලය

**ජාතික පැළෑටි නිරෝධායන සේවය, කටුනායක**

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 07 |
| පරිපාලන නිලධාරි | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර | 05 |
| පර්යේෂණ සහකාර | 05 |
| වැඩසටහන් නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 12 |
| බීජ කාර්මික | 01 |
| කළමනාකරණ සහකාර | 07 |
| රියදුරු | 04 |
| විදුලි ශිල්පී | 01 |
| කම්කරු | 03 |
| කම්කරු -කොන්ත්‍රාත් | 07 |
| මුරකරු | 02 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| **එකතුව** | **60** |

**පැළෑටි නිරෝධායන සේවය, වරාය**

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර නිලධාරි (පර්යේෂණ නිලධාර) | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී | 03 |
| පර්යේෂණ සහකාර | 06 |

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 12 |
| කළමනාකරණ සහකාර | 02 |
| රියදුරු | 01 |
| කම්කරු (ස්ථිර) | 01 |
| කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 01 |
| **එකතුව** | **28** |

**පැළෑටි නිරෝධායන සේවය, ගුවන් තොටුපළ**

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර නිලධාරි (කෘෂිකර්ම නිලධාරි) | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 13 |
| කළමනාකරණ සහකාර | 01 |
| කම්කරු | 02 |
| **එකතුව** | **14** |

**පැළෑටි නිරෝධායන සේවය, ගන්නොරුව**

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| ස්ථාන භාර නිලධාරී (පර්යේෂණ නිලධාරී) | 01 |
| කම්කරු | 01 |
| **එකතුව** | **02** |

# 2.1.4 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට පැවරී ඇති වගකීම වන්නේ 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතින් ව්‍යවස්ථාපිත විධිවිධාන ක්‍රියාත්මක කිරීමයි. මෙරටට ආනයනය කරන සහ/හෝ මෙරටෙහි නිෂ්පාදනය කරන හෝ සම්මිශ්‍රණය කරන පළිබෝධනාශක සියල්ල 1994 අංක 06 දරන පනතින් සංශෝධනය කරන ලද 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත යටතේ ලියාපදිංචි කෙරේ. පළිබෝධනාශක ආනයනයේ සිට පළිබෝධනාශක ප්‍රතිකර්ම යොදන ලද බෝග අලෙවි කිරීම දක්වා වන මෙරට පළිබෝධනාශක ජීවන චක්‍ර කළමනාකරණයට අදාළ වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ පළිබෝධනාශක ලියාපදිංචියයි. නිපැයුම් මාලාවෙන් කෘෂි පළිබෝධනාශක (කෘමිනාශක, දිලීරනාශක, වල් පැළෑටිනාශක, නෙමටෝඩානාශක ආදිය), ගෘහස්ථ පළිබෝධනාශක, පශු පළිබෝධනාශක, කාර්මික ජෛවනාශක, දැව ආරක්ෂක, මහජන සෞඛ්‍යය හා සම්බන්ධ පළිබෝධනාශක සහ මීනාශක ආවරණය වේ. එහෙත් එම නිපැයුම් ලැයිස්තුව අවශ්‍ය පරිදි පුළුල් නැත. ආරක්ෂිත බව, කාර්යක්ෂමතාව හා දේශීය තත්ත්වයන්ට යෝග්‍යවීම යන කරුණුවලට අදාළව දක්වා ඇති දත්තවල සත්‍යතාව අනුව නිපැයුමෙහි විශ්වසනීයත්වය තහවුරු කර ගැනීම සඳහා අදාළ තාක්ෂණික ලිපි ලේඛන සමග ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍ර ඇගයීමට ලක් කෙරේ. පළිබෝධනාශකවල යෝග්‍යතාව ඒ ඒ නිපැයුමෙහි ක්‍රියාකාරීත්වයට අදාළ තාක්ෂණික ප්‍රතිලාභවලට සාපේක්ෂව අගයන හෙයින් එක් එක් නිපැයුම වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කිරීමත් වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි අංක ලබා දීමත් අනිවාර්ය වේ.

පළිබෝධනාශකවල ආරක්ෂිත බව, කාර්යක්ෂමතාව සහ පාරිසරික තත්ත්වයට ගැලපීම යන කරුණුවලට අදාළව පිළිගත හැකි බව තහවුරු කරමින් වසර තුළ අන්තර්ජාතික මාර්ගෝපදේශ සහ පරීක්ෂණ ක්‍රමවේදවලට අනුකූලව නව ලියාපදිංචි කිරීම් 30ක් ද නැවත ලියාපදිංචි කිරීම් 189ක් ද නිම කෙරිණි. ලියාපදිංචි කිරීමේ සහ නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. මිලියන 2.5ක මුදලක් එක්රැස් කර ගැනිණි. මෙරටට ගෙන්වන පළිබෝධනාශක නිපැයුම් සඳහා ආනයන අනුමති ලබා දෙනුයේ ඒවායෙහි තත්ත්වය සනාථ කරන යම් යම් ක්‍රමවේදවලට අනුවය. පරිපාටිමය පාලන පියවරවලට අමතරව, යථෝක්ත කාල පරිච්ඡේදය තුළ, අලෙවි කිරීමට පෙර ආනයන තොග 284ක් ආවරණය කරමින් සම්මිශ්‍රණ විශ්ලේෂණ 1,096ක් සිදු කර ඇත. ක්ෂේත්‍රය තුළ වඩා හොඳ පළිබෝධනාශක කළමනාකරණයක් තහවුරු කිරීම සඳහා තොරතුරු කළමනාකරණ හා හුවමාරු කර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් පළිබෝධනාශක ලේබල් සහ ප්‍රචාරණ ද්‍රව්‍ය සඳහා අනුමතිය ලබාදීම කාර්යක්ෂමව උපයෝගී කර ගැනිණි. මෙරටෙහි කාර්යක්ෂම හා සුරක්ෂිත පළිබෝධනාශක කළමනාකරණයක් උදෙසා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය වසර තුළ ඵලදායී අයුරින් විශේෂ කාර්යයන් රැසක නිරත විණි.

## අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන හා දරන ලද වියදම වගු අංක2.1.4.1හි දැක්වේ

**වගු අංක 2.1.4.1: වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % | ආදායම |
|---|---|---|---|---|
| මුලධන | 4,794,629 | 4,544,539 | 58 | |
| පුනරාවර්තන | 2,673,000 | 2,521,460 | 94 | |
| ලියාපදිංචි කිරීම් හා නැවත ලියාපදිංචි කිරීම් ගාස්තු | | | | 1,565,000 |
| අලෙවිකරු සහතිකකරණ ගාස්තු | | | | 651,200 |
| පශ්වාත් පාලන සේවා ලියාපදිංචි කිරීම් ගාස්තු | | | | 320,000 |
| පශ්වාත් පාලන සේවා අලුත් කිරීම් ගාස්තු | | | | 10,000 |
| **එකතුව** | **7,467,629** | **7,065,999** | | **2,546,200** |

## ප්‍රගතිය

### පළිබෝධනාශක ලියාපදිංචිය

මෙම ක්‍රියාවලියේදී පළිබෝධනාශක ලියාපදිංචිය අපේක්ෂා කරන්නා විසින් ඉදිරිපත් කරන අදාළ තොරතුරු සහ ලිපි ලේඛන ඇගයීම සිදු කෙරේ. එම ඇගයීම මගින් සතුටුදායක ප්‍රතිඵල ලැබුණහොත් අනුමත ලේබල් සහ බඳුන් සමග ලියාපදිංචිය ප්‍රදානය කෙරේ. ඉන්පසු ලියාපදිංචි අංකයක් වෙන් කිරීම සහ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම සඳහා ලියාපදිංචි ගාස්තුවක් අය කෙරේ. මෙමගින් වසර තුළ එක්රැස් කරගත් ආදායම රු. 1,565,000.00කි. ලියාපදිංචි කිරීම් කටයුතු වඩා විධිමත් කිරීම සහ තීරණ ගැනීමේදී පුළුල් සහභාගිත්වයක් ඇති කිරීම පිණිස පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව (PeTAC) යටතේ ආංශික අනු කමිටු (උදා:- කෘෂි රසායන අනු කමිටුව, ගෘහස්ථ සහ මහජන සෞඛ්‍ය අනු කමිටුව හා කාර්මාන්ත අනු කමිටුව) පත් කිරීම මගින් අදාළ අමාත්‍යාංශ හා ආයතනවල සිටින සෘජුව හෝ වක්‍රව පළිබෝධනාශක සම්බන්ධයෙන් කටයුතු කරන විශේෂඥයින්ගෙන් උපදෙස් ලබා ගැනීම සිදු වේ.

### පළිබෝධනාශක නැවත ලියාපදිංචිය

නිපැයුමක ලියාපදිංචි වලංගු වන්නේ වසර 3ක් සඳහා පමණි. ඉන්පසු නව ප්‍රමිති, සොයා ගැනීම් සහ ආරක්ෂිතබව පිළිබඳ කරුණු මත පදනම්ව, එහි තත්ත්වය නැවත ඇගයීමට ලක් කෙරේ. වසර තුළ මෙම කාණ්ඩය යටතේ අයදුම්පත්‍ර 189ක් සම්බන්ධයෙන් කටයුතු කෙරිණි. මෙම කාණ්ඩය යටතේ එක්රැස් කර ගන්නා ලද ආදායම රු. 945,000.00කි. පළිබෝධනාශක නැවත ලියාපදිංචිය

පිළිබඳ නව තීරණයකට අනුව, 2000 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද සියලුම පළිබෝධනාශක නිපැයුම් සම්බන්ධයෙන් ආරක්ෂිතබව පිළිබඳ නවතම අවශ්‍යතා අනුව ලියාපදිංචියට අදාළ ලිපි ලේඛන අලුතින්ම ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රමය යටතේ, විෂ සහිත බව හා නිපැයුමෙහි තත්ත්වය පිළිබඳව අලුතින්ම හඳුන්වා දෙන පරීක්ෂාවන් මගින් එම නිපැයුම්වල ආරක්ෂිත බව, තත්ත්වය සහ ක්‍රියාකාරීත්වය තක්සේරු කෙරෙනු ඇත.

## පළිබෝධනාශක නිපැයුම් ඇගයීම සහ නව පළිබෝධනාශක ලියාපදිංචිය

දේශීය අත්හදා බැලීම සඳහා නිපැයුම්වල පූර්ව ඇගයීම් කටයුතු කිරීමේදී වඩාත් සුරක්ෂිත සහ පාරිසරික වශයෙන් හිතකර පළිබෝධනාශක හඳුනාගෙන ප්‍රවර්ධනය කරන ලදී. එමගින් වෙළඳ පොළෙහි ඇති අනතුරුදායක නිපැයුම් භාවිතයෙන් ඉවත් කර දැමීම පහසු කෙරේ. පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ ලිපි ලේඛන කාර්යක්ෂමව සහ කඩිනමින් ඇගයීම පිණිස ලිපි ලේඛන ඇගයීම් ක්‍රියාවලියේදී සම්මන්ත්‍රණ ආකාරයේ ප්‍රවේශයක් හඳුන්වා දීමට පියවර ගැනිණි. මෙම ප්‍රවේශය තුළින් ලැබෙන වාසියක් වන්නේ පළිබෝධනාශක ඵලදායීව ඇගයීම සඳහා විවිධ විෂයන්ට අදාළ දැනුම හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් උදාවීමයි. වසර තුළ සම්මිශ්‍රණ 30කට ද අධික සංඛ්‍යාවක් ඇගයීමට ලක් කර පහත සඳහන් බෝග/පළිබෝධ කාණ්ඩ අනුව භාවිතා කිරීම සඳහා නිපැයුම් 5ක් ලියාපදිංචි කරන ලදී.

- ක්ලෝරැන්ට්‍රනිලිප්‍රෝල් 20% SC
  වම්බටු කරටි සහ ගෙඩි විදින්නා, බෝංචි කරල් විදින්නා සහ තක්කාලි ගෙඩි විදින්නා පාලනයට සුදුසු කෘමිනාශකයකි.
- ටොප්‍රමෙසෝන් 33.6% SC
  බඩ ඉරිඟු වගාවේ වාර්ෂික වල් පැළ පාලනයට සුදුසු පසු නිර්ගමන පැළෑටිනාශකයකි.
- පොටෑසියම් බයිකාබනේට් 82% SC
  කෙසෙල් වගාවේ සිගාටොකා පත්‍ර පුල්ලි රෝගය පාලනයට සුදුසු දිලීරනාශකයකි.
- තයමෙතොක්සම් 20% + ක්ලෝරැන්ට්‍රනිලිප්‍රෝල් 20% SC
  වී වගාවේ දුඹුරු පැළ කීඩෑවා පත්‍ර හකුළුවන්නා පාලනයට සුදුසු කෘමිනාශකයකි.
- එසොක්සිස්ට්‍රොබින් 25% SC
  කෙසෙල් වගාවේ සිගාටොකා පත්‍ර පුල්ලි රෝගය සහ පිපිඤ්ඤා වගාවේ යටිපුස් රෝගය පාලනය සඳහා සුදුසු දිලීරනාශකයකි.

## ආනයන අනුමැති ලබාදීම

මෙරටට පළිබෝධනාශක ආනයනය කිරීම 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතෙහි නියාමනයට යටත් වේ. සමාගම්වලින් ලැබෙන ඉල්ලීම් අනුව, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් තොග පදනම මත පළිබෝධනාශක සඳහා ආනයන අනුමැති ලබා දෙයි. එම අනුමැති වලංගු වන්නේ නිකුත් කළ දින සිට මාස 3ක කාල සීමාවක් දක්වා පමණි. එම ඉල්ලීම් ඉටු කිරීම පිණිස සැලකිය යුතු පරිශ්‍රමයක් සහ කාලයක් ගත වේ. මෙම ක්‍රියාදාමය මගින් නිපැයුම් අවශ්‍ය තත්වමය ප්‍රමිතිවලට අනුකූලව නිවැරදි සැපයුම් ප්‍රභවයන්ගෙන් ආනයනය කිරීම සහ අතිරික්ත ප්‍රමාණයන්ගෙන් ආනයනය වැළැක්වීම තහවුරු කෙරේ. මේ සඳහා වසර තුළ, ආනයන අනුමැති ලබාදීමට පෙර ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන ලද තත්ත්ව සහතික 595ක් ඇගයීමට ලක් කෙරිණි.

## ලේබල් සහ ප්‍රචාරණ ද්‍රව්‍යාදිය පරීක්ෂා කර බැලීම

ලේබල් අනුමත කිරීමේ ක්‍රියා පටිපාටිය මගින් නියමිත තොරතුරු පළිබෝධනාශක අවසානයේ භාවිතා කරන්නා වෙත ලබාදීම පහසු කෙරේ. මෙම ක්‍රියාදාමය පහසු කිරීම පිණිස ලේබල්වල අන්තර්ගතයේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සියලුම කෘෂිකාර්මික පළිබෝධනාශක කාණ්ඩවලට අදාළ ලේබල් සැලසුම් සකස් කෙරිණි. වසර තුළ ලේබල් 495කට අධික ප්‍රමාණයක් පරීක්ෂාවට ලක් කර ඇත. ශ්‍රී ලංකාවේ අලෙවි කරන පළිබෝධනාශකවල වෙළඳනාම/ සන්නස් නාම සම්බන්ධයෙන් හඳුන්වා දෙන ලද නව ප්‍රතිපත්ති හේතුවෙන් වසර තුළ, ලේබල් අනුමත කිරීමේදී අනුගමනය කරන නිවැරදි කිරීම් පියවර සැලකිය යුතු අයුරින් ශක්තිමත් කරන ලදී. පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුවෙහි උපදෙස් පරිදි පළිබෝධනාශකවල වෙළඳ නාම/ සන්නස් නාම සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. විශේෂිත නිපැයුම් දැනට හඳුන්වන වෙළඳ නාම/ සන්නම් නාම එම නිපැයුම්වල (සම්මිශ්‍රණය හා ක්‍රියාකාරී සංඝටක) පේටන්ට් බලපත්‍රයේ කාලය ඉකුත් වන තෙක් භාවිතා කිරීමට ඉඩ ලැබෙන බව නව ප්‍රතිපත්තිය මගින් දැක්විණි. වෙළඳ නාම යටතේ අලෙවි කෙරෙන සියලුම පළිබෝධනාශකවල (විශේෂිත තත්ත්වය අහිමි වූ නිපැයුම්) ක්‍රියාකාරී ද්‍රව්‍යවල/පොදු නාමය සමග විස්තරාත්මක වෙළඳ නාමය ද සඳහන් විය යුතුය. තොරතුරු මත පදනම්ව, පළිබෝධනාශක නිවැරදිව හා කාර්යක්ෂමව භාවිතා කිරීමේ තීරණය ගැනීමට හැකිවීම මගින් වෙළඳ නාම/ සන්නම් නාම පිළිබඳ මෙම නව ප්‍රතිපත්තියෙන් ගොවියාට/ පරිහරණය කරන්නාට යහපතක් සිදු වෙතියි අපේක්ෂා කෙරේ.

පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුවේ උපදෙස් පරිදි, පළිබෝධනාශක කර්මාන්තය විසින් සිදු කරන පළිබෝධනාශක ප්‍රචාරණයට අදාළ නව විධිවිධාන සංග්‍රහයක් හඳුන්වා දී ඇත. නව නියෝගවලට අනුව, පළිබෝධනාශක ප්‍රචාරණ ද්‍රව්‍ය සියල්ලෙහිම විස්තරාත්මක වෙළඳ නාම පැහැදිලිව පෙනෙන සේ සඳහන් විය යුතුය. මග දෙපස ඇති කෘෂිකාර්මික ක්ෂේත්‍රවල, ශාක මත, කණුවල හා බස් නැවතුම්වල ප්‍රචාරක දැන්වීම් ආදිය ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම මගින් ප්‍රචාරණය සිදු කරන ආකාරය තව දුරටත් සීමා කර ඇත.

එයට අමතරව, දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල භාවිතා කරන වෙළඳ නාම ශ්‍රී ලංකාව තුළ එවන් නිපැයුම් ලියාපදිංචි කරන විට භාවිතයට අවසර නොදීමේ තීරණයක් ද ගෙන ඇත. මෙම තීරණය ගෙන ඇත්තේ පළිබෝධනාශක ප්‍රචාරණය සම්බන්ධයෙන් පවත්වන දේශීය මාර්ගෝපදේශවලට පටහැනිව චන්ද්‍රිකා රූපවාහිනී/ගුවන් විදුලි නාලිකා මගින් විදේශීය ප්‍රචාරක දැන්වීම් මෙරට තුළ විකාශනය වීම පාලනය කිරීමට නොහැකි හෙයිනි.

## ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම

ක්‍රියාත්මකව පවතින වැඩසටහනක් වශයෙන්, පළිබෝධනාශක අලෙවිකරු සහතිකකරණ ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පළාත්, අන්තර් පළාත් සහ මහවැලි අධිකාරියේ ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීම් කාර්ය මණ්ඩල සම්බන්ධීකරණය කිරීම අඛණ්ඩව සිදු කළේය. විශේෂිත හේතූන් මත අවලංගු නොකළේ නම් පළිබෝධනාශක අලෙවිකරු සහතික වසරක් සඳහා වලංගු වේ. සහතිකයක් නිකුත් කිරීම සඳහා නියාමන අවශ්‍යතාවල අංගයක් වශයෙන් ගාස්තුවක් අය කෙරේ. මෙම කාණ්ඩය යටතේ ලබා ගන්නා ලද ආදායම රු. 651,200.00කි.

## පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

විශේෂයෙන් පළිබෝධනාශක අලෙවි සැල් සඳහා පිරිස් බඳවා ගැනීමේ නව ක්‍රමය ඇතුළු පළිබෝධනාශක ආශ්‍රිත ගැටලු පිළිබඳව කිහිප අවස්ථාවකදීම ගුවන්විදුලි හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් මගින් මහජනතාව දැනුවත් කරන ලදී.

එයට අමතරව, දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල භාවිතා කරන වෙළඳ නාම ශ්‍රී ලංකාව තුළ එවන් නිපැයුම් ලියාපදිංචි කරන විට භාවිතයට අවසර නොදීමේ තීරණයක්ද ගෙන ඇත. මෙම තීරණය ගෙන ඇත්තේ පළිබෝධනාශක ප්‍රචාරණය සම්බන්ධයෙන් පවතින දේශිය මාර්ගෝපදේශවලට පටහැනිව චන්ද්‍රිකා රූපවාහිනී/ ගුවන්විදුලි නාලිකා මගින් විදේශිය ප්‍රචාරක දැන්වීම් මෙරට තුළ විකාශනය පාලනය කිරීමට නොහැකි හෙයිනි.

## විද්‍යාගාර කටයුතු

### පළිබෝධනාශක සම්මිශ්‍රණ විශ්ලේෂණය

පළිබෝධනාශකවල තත්ත්වය, එහි කාර්යක්ෂමතාව සහ පරිසරය හා මනුෂ්‍ය සෞඛ්‍යය කෙරෙහි බලපාන ආකාරය තීරණය කරන ප්‍රධාන සාධකයකි. ලියාපදිංචි කරන ලද සියලුම පළිබෝධනාශක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන මගින් පනවා ඇති භෞත රසායනික ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. ඒ අනුව, දේශිය වශයෙන් සිදු කරන පරීක්ෂාවන්ට අනුකූල වේ නම් ඒ ඒ තොගය අලෙවි කිරීම සඳහා මුදා හැරේ. 2012 වර්ෂයේදී, ආනයනය කළ තොග කාණ්ඩ 284ක් පිළිබඳ සම්මිශ්‍රණ විශ්ලේෂණ 1096ක් පවත්වන ලද අතර අලෙවි කිරීම සඳහා නිදහස් කරන ලද පළිබෝධනාශක ඝන ද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑ. 699,247ක් සහ ද්‍රාව්‍ය පළිබෝධනාශක ප්‍රමාණය ලී. 4,667,110ක් විය.

### පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය

මහනුවර සහ නුවරඑළිය පොදු වෙළඳ පොළෙන් ලබාගත් එළවළු නියැදි කිහිපයක (ගෝවා - නියැදි 06, මුකුණුවැන්න - නියැදි 06, පතෝල - නියැදි 06) ක්ලෝපයිරිෆොස් අවශේෂ ඇත්දැයි විශ්ලේෂණය කර බලන ලදී. අවශේෂ පැවතියේ ඉතාමත් අඩු ප්‍රමාණයන්ගෙන් වන අතර ගෝවා නියැදි 2ක පමණක් අන්තර්ජාතික වශයෙන් පිළිගත් ප්‍රමිති යටතේ (Codex Alimentarius Standarda) දක්වා ඇති උපරිම අවශේෂ මට්ටම ද (කි.ග්‍රෑ. 1කට මි.ග්‍රෑ. 0.05) ඉක්ම වූ මට්ටමක් දක්නට ලැබිණි.

## නීතිමය පියවර ගැනීම්

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත යටතේ කූට පළිබෝධනාශක අලෙවිකරුවන් නිෂ්පාදකයින්/ බෙදා හරින්නන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 3ක් විභාග වෙමින් පවතී. 2012 ජූනි මාසයේදී තත්ත්වයෙන් බාල පළිබෝධනාශකයක් විකිණීම හේතුවෙන් ඇහැලියගොඩ පළිබෝධනාශක අලෙවිකරුවෙකුට දඩ නියම කෙරිණි.

## විශේෂ කාර්යයන්

### කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහකාරවරුන් පුහුණු කිරීමේ වැඩසටහන

'මහින්ද චින්තනයේ' ඉදිරි දැක්ම අනුව, සියලුම පළිබෝධනාශක අලෙවි සැල් සඳහා 'කෘෂි රසායන අලෙවි හා තාක්ෂණික සහකාරවරුන්' වශයෙන් හඳුන්වන තාක්ෂණිකව සුදුසුකම් ලත්

පුද්ගලයින් පත් කිරීම අවශ්‍ය වේ. පළිබෝධනාශකවල ස්වභාවය සහ නිවැරදි භාවිතය පිළිබඳ මනා අවබෝධයක් ඇති කිරීම හරහා යෝජිත ක්‍රමය මගින් කෘෂිකාර්මික ප්‍රජාව සහ අනෙකුත් අංශ අතර පළිබෝධනාශක ප්‍රවේශමෙන් භාවිත කිරීම පිළිබඳ දැනුම වර්ධනය කෙරෙනු ඇත. මෙමගින් නිවැරදි තොරතුරු මත පදනම්ව තීරණ ගැනීම සඳහා තාක්ෂණික පණිවිඩ බෙදා හැරීම හරහා පාරිභෝගිකයින්ට සහ ගොවි ප්‍රජාවට ඇතිවිය හැකි අහිතකර සෞඛ්‍යමය බලපෑම වළක්වා ගැනීමට හැකිවනු ඇත. මෙම ප්‍රයත්නයේ අපේක්ෂාව වගකීමෙන් යුතු පළිබෝධනාශක භාවිතය සහ මිනිස් සෞඛ්‍යය හා පරිසර සුරක්ෂිතතාව අන්‍යෝන්‍ය වශයෙන් ජය ගැනීමයි. එනම්; වගකීමෙන් තොරව පළිබෝධනාශක භාවිතය අවම කර ආචාර ධර්මවලට අනුකූලව පළිබෝධනාශක අලෙවිය වැඩිදියුණු කරන අතරම ආර්ථික ක්‍රියාවලිය වර්ධනය කර රැකියා ජනනය කිරීමයි.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග සහයෝගයෙන් දිවයින පුරා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු. මිලියන 5.3ක මුදලක් ලබා දී ඇත. කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහකාරවරුන් පුහුණු කිරීම සඳහා දිවයිනේ සියලුම ප්‍රදේශ ආවරණය කරමින් ප්‍රධාන පුහුණුකරුවන් වශයෙන් පුද්ගලයින් 80කට ආසන්න සංඛ්‍යාවක් පුහුණු කරන ලදහ. ප්‍රධාන පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා සිංහල මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් 5ක් ද දමිළ මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් 2ක් ද පවත්වන ලදී. මේ වන විට එම වැඩසටහන මොණරාගල, බදුල්ල, මාතලේ, නුවරඑළිය, ගාල්ල, කෑගල්ල, රත්නපුරය, කුරුණෑගල සහ පුත්තලම ආදී දිස්ත්‍රික්ක 10 ක ආරම්භ කර ඇත.

## පළිබෝධනාශකවල ඇති ආසනික් සහ විෂ සහිත බැර ලෝහ වර්ග

පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික සහ උපදේශන කමිටුව සමග පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් පළිබෝධනාශකවල ඇති මහජන සෞඛ්‍යය සහ පරිසරය කෙරෙහි අහිතකර අයුරින් බලපාන බැර ලෝහ දූෂණ කාරක පිළිබඳ පුළුල් සමාලෝචනයක් කිරීම ආරම්භ කර ඇත. මූලික පියවරේදී සියලුම පළිබෝධනාශක ලියාපදිංචිකරුවන් විසින් බැර ලෝහ වර්ග 9කට (රසදිය, ආසනික්, ක්‍රෝමියම්, කැඩ්මියම්, ඊයම්, නිකල්, කෝබෝල්ට්, ටින් සහ තැලියම්) සහ සයනයිඩ්වලට අදාළ විස්තරාත්මක විශ්ලේෂණ පරීක්ෂණ වාර්තා ස්වාධීන එමෙන්ම පිළිගත් රසායනාගාරවලින් ලබාගෙන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. වර්තමානයේදී, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් මෙරටට ආනයනය කරන ඉහළම පරිසර දූෂණ විභවයක් සහිත පළිබෝධනාශක සමාලෝචනයේදී එක් එක් නිපැයුම් සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු ආකාරය විමසා බලමින් සිටී. පළිබෝධනාශකවලින් ඇති විය හැකි අවදානම්වලට අදාළව ආවදානම් තක්සේරු කිරීමේ වැඩසටහනක් සකස් කිරීම සහ එවන් තත්ත්වයන්ට පිළියම් යෙදීම සඳහා පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුව පළිබෝධනාශකවල ඇති බැර ලෝහ දූෂණ කාරක මට්ටම් සමාලෝචනය කිරීමෙහි අඛණ්ඩව නියැළෙනු ඇත. ආසනික්, රසදිය සහ කැඩ්මියම් මිලියනයකට කොටස් 0.1ක් හෝ එයට වඩා අඩු මට්ටමක ද අනෙකුත් බැර ලෝහ සියල්ල සහ සයනයිඩ් මිලියනයකට කොටස් 1.0ක් හෝ එයට වඩා අඩු මට්ටමක ද පවතින බව තහවුරු කර ගැනීම සඳහා විශ්ලේෂණ සිදු කළ යුතු බව සියලුම පළිබෝධනාශක ලියාපදිංචිකරුවන්ට දැනුම් දෙනු ලැබේ.

## පළිබෝධනාශක නිර්දේශ සංශෝධනය කිරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වත්මන් පළිබෝධනාශක නිර්දේශ සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. මෙම දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක නිර්දේශ සහිත කුඩා ග්‍රන්ථයක් 2009 වර්ෂයේදී ප්‍රකාශයට පත්කර ඇත. වත්මන් නිර්දේශ ලැයිස්තුව තුළ තහනම් කළ හෝ භාවිතයේ නොමැති/ දිවයිනට ආනයනය කළ පළිබෝධනාශක ද ඇතුළත් වේ. එහෙයින් ඕනෑම බෝග/ පළිබෝධ කාණ්ඩයකට අදාළව දැනට පවතින පළිබෝධනාශක නිර්දේශ සහිත දීර්ඝ ලැයිස්තුව ගොවියාට පළිබෝධනාශක කාර්යක්ෂමව සහ වගකීමෙන් යුතුව භාවිතා කිරීමට මහත් අපහසුතා මතු කරන්නක් බව පැවසේ. කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි, එක් එක් බෝගය/ පළිබෝධ කාණ්ඩය යටතේ නිර්දේශිත පළිබෝධනාශක සංඛ්‍යාව විද්‍යාත්මක නිර්ණායක යොදා ගනිමින් එක් පළිබෝධ විශේෂයක් කළමනාකරණය කිරීමට අවශ්‍ය සීමිත පළිබෝධනාශක සංඛ්‍යාවක් දක්වා අඩු කිරීම පිණිස පියවර ගනිමින් තිබේ. මේ සඳහා නිර්ණායක සංග්‍රහයක් පිළියෙල කර ඇති අතර ඕනෑම බෝග/ පළිබෝධ සංයෝගයක් සඳහා උපරිමව පළිබෝධනාශක වර්ග 6කට අවසර ලැබෙනු ඇත. නිපැයුමෙහි නොනැසී පැවතීමේ හැකියාව, එය ක්‍රියාකාරී වන විවිධ ක්‍රම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනතුරුදායක කාණ්ඩ වර්ගීකරණය/ සම්මිශ්‍රණයේ විෂ මාත්‍රාව (WHO Hazard class/ $LD_{50}$ of the formulation) සහ පාරිසරික බලපෑම් මට්ටම (Environmental Impact Quotient), අනුව සෞඛ්‍යයට සහ පරිසරයට ඇති අනතුරුදායක බව හා සම්මිශ්‍රණයේ වර්ගය අනෙකුත් නිර්ණායක තුළ ඇතුළත් වේ. කෘමිනාශක, දිලීරනාශක සහ වල් පැළෑටිනාශකවලට අදාළ සංශෝධිත නිර්දේශ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි නුදුරේදීම ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

## ජෛව කාර්යක්ෂමතා පරීක්ෂණ

නිර්දේශිත බෝග/ පළිබෝග සංයෝග සඳහා තෝරාගත් පළිබෝධනාශක නිර්දේශිත මාත්‍රාවන්ගෙන් යෙදීමේදී ඒවායෙහි ජෛව කාර්යක්ෂමතාව සනාථ කර ගැනීමට තීරණය කර ඇත. මෙම කාර්යයේදී වසර 6කට පෙර ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක, ජෛව කාර්යක්ෂමතා අත්හදා බැලීම් මගින් යළි ඇගයීම සඳහා නම් කෙරෙනු ඇති අතර එම අත්හදා බැලීම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය සහ අනෙකුත් අදාළ බෝග පර්යේෂණ ආයතන විසින් සිදු කෙරෙනු ඇත. ගෘහස්ථ පළිබෝධනාශකවලට අදාළව ජෛව කාර්යක්ෂමතා පරීක්ෂණ සිදු කිරීමට බලයලත් ආයතනය වශයෙන් වෛද්‍ය පර්යේෂණ ආයතනය හඳුනාගෙන ඇත. මෙම ජෛව කාර්යක්ෂමතා තොරතුරු පළිබෝධ/රෝග සාර්ථකව කළමනාකරණ කිරීම සඳහා පළිබෝධනාශකවල ලේබල්වල අන්තර්ගත විය යුතු දෑ සඳහන් කිරීමට සහාය වනු ඇති අතර පළිබෝධනාශක කළමනාකරණ වැඩසටහනේදී පමණ ඉක්මවා පළිබෝධනාශක මත රැඳීම හා වග විභාගයකින් තොරව භාවිතා කිරීම අඩුකර ගැනීමට ද අස්වැන්නෙහි පළිබෝධනාශක අවශේෂ එක්රැස් වීම අවම කර ගැනීමට ද උපකාරී වනු ඇත.

## පළිබෝධනාශක විශ්ලේෂණ විද්‍යාගාරය වැඩිදියුණු කිරීම

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විද්‍යාගාරය අධි සංවේදී විශ්ලේෂණ උපකරණ රැසකින් (Gas Chromatographs, Gas Chromatographs with Mass Spectrometry and High

Performance Liquid Chromatographs) සමන්විතය. මෙම විද්‍යාගාරය පවත්වාගෙන යෑමේ ප්‍රධාන අරමුණක් වන්නේ පළිබෝධනාශක සම්මිශ්‍රණවල තත්ත්වය සහතික කිරීමත් ඒවා ප්‍රමිතිවලට අනුකූල දැයි පරීක්ෂා කර බැලීමත්ය. විශ්ලේෂණාත්මක කටයුතුවලට එම උපකරණ ඵලදායීව යොදා ගැනීමට නම් අධි සංවේදී මිනුම් උපකරණ පැවතීම පැහැදිලි අවශ්‍යතාවකි. ඒ හැරුණු විට, විශ්ලේෂණාත්මක කටයුතු සඳහා අතිශයින් පවිත්‍ර (අයනීහරණය කළ) ජලය අවශ්‍ය වේ. අයනීහරණය කළ ජලය සම්මත වශයෙන් භාවිත කරනුයේ විද්‍යාගාරයේ ඇති වීදුරු බඳුන් ආදිය සේදීමට, ස්වාරක්ෂක සකස් කිරීමට හා තනුක කිරීමට, විශ්ලේෂණාත්මක ක්‍රම (High Performance Liquid Chromatographs and Flame Atomic Absorption Spectrophotometer) සඳහා ප්‍රතිකාරක සහ නියැදි පිළියෙළ කිරීමටයි. අධි ක්‍රියාකාරී ද්‍රාවණ වර්ණලේඛය නමැති මෙම උපකරණයට (High Performance Liquid Chromatographs) අතිශයින්ම පවිත්‍ර (අයනීහරණය කළ) ජලයෙන් පිළියෙල කළ විශ්ලේෂණ ප්‍රතිකාරක අවශ්‍ය වේ. 2013 වර්ෂයේදී මෙම විද්‍යාගාරය තුළ පළිබෝධනාශක සම්මිශ්‍රණවල ඇති බැර ලෝහ දූෂණ කාරක පිළිබඳ වැඩිදුර විශ්ලේෂණ කටයුතු කිරීමට සැලසුම් කර ඇති හෙයින් අයනීහරණය කළ ජලය පිළියෙල කරන උපකරණයක් පැවතීම විශාල සහයක් වනු ඇත. ඒ අනුව, 2012 වර්ෂයේදී විද්‍යාගාර මගින් අධි සංවේදී විශ්ලේෂණ තුලාවක් සහ ජලය අයනීහරණය කරන උපකරණයක් මිලදී ගන්නා ලදී.

## ශ්‍රී ලංකාව සඳහා පාරිසරික නිරීක්ෂණ වැඩසටහන් සකස් කිරීම

ජාත්‍යන්තර පරමාණුක ශක්ති අධිකාරියේ මූල්‍යමය සහායෙන්, පර්යේෂණ නිලධාරි ආචාර්ය ජේ. ඒ. සුමිත් මහතාට ලැබුණු සුළු පරිමාණ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රදානයක් උපයෝගී කර ගනිමින් ඉහළ මහවැලි ගංගා ද්‍රෝණියේ උමා ඔය කෘෂි පෝෂක ප්‍රදේශයේ අධ්‍යයනයක් සිදු කර අවසන් කෙරිණි. ව්‍යාපෘතියේ සමමූල්‍යායනය මහචාර්ය කෙලී ආර්. මුන්කිට්‍රික් මහතාට ලැබුණු කැනඩා පර්යේෂණ ප්‍රදාන (Canada Research Chair Grant) යටතේ කැනඩාවේ නිව් බ්‍රන්ස්වික් විශ්වවිද්‍යාලය විසින් සිදු කෙරිණි. මෙම වැඩසටහනෙහි සමස්ත අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රදේශවල ජෛව විද්‍යාත්මක ප්‍රතිචාර, බලපෑම් යාන්ත්‍රණ සහ ඒවායෙහි සිටින මත්ස්‍ය ගහනයන් කෙරෙහි බලපෑම් ඇති කිරීමට හැකි අහිතකර තත්ත්ව කාරක හඳුනා ගන්නා සංවේදී පරිසර නිරීක්ෂණ වැඩසටහනක් සකස් කිරීමයි. එමෙන්ම මෙහි දිගු කාලීන අරමුණු වූයේ අහිතකර කෘෂිකාර්මික තත්ත්ව කාරකවල බලපෑම්වලට ලක් වූ මත්ස්‍යයින්ගේ ජීවන ඉතිහාසය හා විභව පරාමිතියන් (එනම් ප්‍රජනනය) පිළිබඳ වැඩි අවබෝධයක් ඇති කර ගැනීමත් කෘෂිකාර්මික බලපෑම් පිළිබඳව දැන ගැනීම සඳහා පාරිසරික වශයෙන් තිරසාර හා සංවේදී නිරීක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීමට සෙන්ටිනල් මත්ස්‍ය විශේෂ උපයෝගී කර ගත හැක්කේ කෙසේ දැයි නිශ්චය කර ගැනීමත් සහ එමගින් පරිසර ප්‍රජාවන්ට ඇති විය හැකි පාරිසරික බලපෑම් අවම කර ගැනීමත්ය.

ජෛව පද්ධතියක් කෘෂිකාර්මික දූෂණ කාරකවලට ලක්වීම කෙරෙහි දක්වන අනුක්‍රමික ප්‍රතිචාර මාලාවක් මගින් පරිසරයට ඇතිවන බලපෑම් නිශ්චය කරමින් අනුමිතියන්ට එළඹීමට ඉවහල් වන සාක්ෂි මෙම අධ්‍යයනය තුළින් ලැබිණි. එම බලපෑම් හඳුනාගෙන පැහැදිලි කර ගැනීමේ වැදගත්ම ප්‍රයෝජනයක් වූයේ අහිතකර කෘෂිකාර්මික තත්ත්වයන්ට කාරක වන සාධකවල බලපෑම නිශ්චය කර ගැනීම සඳහා එයට පාදක වන යාන්ත්‍රණ පිළිබඳ අවබෝධයක් ලබා

ගැනීමට හැකිවීමත් එමගින් සුදුසු කළමනාකරණ හා නියාමන ක්‍රියාමාර්ග හරහා පාරිසරික සම්පත් රැක ගැනීමට උපකාරී වීමත්ය. මෙම අධ්‍යයනයෙන් නිගමනය කරන ලද්දේ වඩා ඉහළ උන්නතාංශවලදී සුපෝෂණ ක්‍රියාවලින් ඇතිවීමේ ද පහළ උන්නතාංශවලදී රසායනික බලපෑම් ඇතිවීමේ ද ඉඩකඩ පවතින අතර පෝෂක සහ උන්නතාංශය අතර සමීප සබඳතා පවතින බවයි. (අ) නිශ්චිත/ සහසම්බන්ධිත වගා කටයුතු කෙරෙන උප පෝෂක ප්‍රදේශයකින්/ ප්‍රදේශවලින් පළිබෝධනාශක යෙදීමට පෙර හා පසුව නියැදි ගැනීම සහ එම ප්‍රදේශයේ කුඩා කොටසක් පාලිත තත්ත්වයන් යටතට ගෙන සිදු කෙරෙනු ඇති පර්යේෂණ (mesocosm/cage studies) ඇතුළුව පළිබෝධනාශක යෙදීමට පෙර හා පසුව වන විශේෂවලට අයත් මත්ස්‍ය නියැදි ගැනීම මගින් එම පෝෂක ප්‍රදේශ පිළිබඳව සිදු කරන අධ්‍යයනය (ආ) සමාන පෝෂක මට්ටම් යොදා ගනිමින් එකම උන්නතාංශයකදී සහ විවිධ උන්නතාංශවලදී පෝෂක 2හි අනුක්‍රමණය ඔස්සේ සිදු කරන අධ්‍යයන (ඉ) ක්‍රියාකාරීත්වය කෙරෙහි ඇති විය හැකි ජානමය බලපෑම් පිළිබඳ විමර්ශනයන් සහ (ඊ) නිතල මහා පෘෂ්ඨවංශීන් යොදා ගනිමින් සිදු කෙරෙන තහවුරු අධ්‍යයන මීළඟ පියවරවලට ඇතුළත් වනු ඇත. මෙම අධ්‍යයන එලෙස ඇතිවන බලපෑම් සනාථ කර ගැනීම පිණිස පසුව සිදු කළ හැකි අධ්‍යයන හඳුනා ගැනීමට උපකාරී වනු ඇති අතර කෘෂිකාර්මික ප්‍රදේශවල අධික පළිබෝධනාශක භාවිතය තක්සේරු කිරීම සඳහා පුළුල් ප්‍රවේශයක් ද වනු ඇත.

## පළිබෝධනාශක ප්‍රභව වෙනස්කම්වලට අදාළ නව මාර්ගෝපදේශ

වසර ගණනාවක් පුරා සිදු කළ පරිදි සියලුම විශේෂිත නිපැයුම් නව ලියාපදිංචි කිරීම් වශයෙන් සලකා නව ලියාපදිංචි අංකයක් ලබා දෙනු ලැබේ. එමෙන්ම වෙළ නාම යටතේ ඇති නිපැයුම් සියල්ල පළිබෝධනාශක නිෂ්පාදකයා, සහ/ හෝ සම්මිශ්‍රණය කරන්නා විසින් සම්පූර්ණ දත්ත සමුදායක් ඉදිරිපත් කිරීමට යටත්ව ‘නව ලියාපදිංචි කිරීම්’ වශයෙන් හෝ ‘තෙවන පාර්ශ්ව ලියාපදිංචි කිරීම්’ වශයෙන් ලියාපදිංචි කරනු ලැබේ. පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අතරතුර හෝ ඉන්පසු පළිබෝධනාශක ප්‍රභවය සංශෝධන කරන ලෙස යම් යම් අවස්ථාවලදී පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් වේ. පළිබෝධනාශක ලියාපදිංචිකරුවන් පළිබෝධනාශක නියාමක කළමනාකරණයේදී වැදගත් ස්ථානයක් දරන හෙයින් මෙවන් වෙනස්කම්වල විවිධ අංශ සම්බන්ධයෙන් ඔවුන් දැඩි ක්‍රියාපටිපාටි සහ නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය බව මෙම කාර්යාලයේ අදහසයි. නව මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර 2012 ඔක්තෝබර් මාසයේදී පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික සහ උපදේශන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. එම මාර්ගෝපදේශ සංග්‍රහය, ප්‍රභව වෙනස්කම් සිදු කරන විට, තාක්ෂණික ක්‍රියාකාරී ද්‍රව්‍ය ප්‍රභවය පිළිබඳ නියාමන ප්‍රවේශය, අනුමත නිපැයුම්වල භාවිතා කරන සම්මිශ්‍රණය සහ ලියාපදිංචිකරුවන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලිව දක්වයි. සියලුම ලියාපදිංචිකරුවන් පළිබෝධනාශකවලට අදාල තාක්ෂණික අංශ වෙනස්කම් පිළිබඳව නොපමාව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත දැනුම් දිය යුතු අතර පූර්ව වෙනස්කම් සම්බන්ධයෙන් කවර ක්‍රියාමාර්ග ගත යුතු දැයි අපැහැදිලි අවස්ථාවන්හිදී ඒ පිළිබඳව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගෙන් විමසා පැහැදිලි කර ගත යුතුය.

## කල් ඉකුත් වූ පළිබෝධනාශක තොග නිසි ලෙස බැහැර කිරීමේ වැඩපිළිවෙල

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කෘෂිකර්ම ස්ථාන සමහරක එක්රැස්ව ඇති කල් ඉකුත් වූ පළිබෝධනාශක සහ විද්‍යාගාර රසායනික ද්‍රව්‍ය බැහැර කිරීමේ විකල්ප පිළිබඳ ඉල්ලීම් 2012 මාර්තු මාසයේදී පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් විය. එම ඉල්ලීම් අතර කි.ග්‍රෑ 1,083ක ඝන සහ ලී. 508ක ද්‍රව පළිබෝධනාශක / රසායන ද්‍රව්‍ය සම්බන්ධ ඉල්ලීම් විණි.

සිමෙන්ති නිෂ්පාදනයේදී සම - සැකසුම්කරණ තාක්ෂණය මගින් භස්මීකරණය කර විසඳුමක් ලබා ගැනීම පිණිස මෙම කරුණ සම්බන්ධයෙන් හෝල්සිම් ජියෝ- සයික්ල් ව්‍යාපාරය සමග සාකච්ඡා කර ඇත. බේසල් සම්මුතියට (අනතුරුදායක රසායනික ද්‍රව්‍ය වෙනත් රටවලට ප්‍රවාහනය කිරීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය) අනුව, මෙම රසායනික ද්‍රව්‍ය බැහැර කිරීමේ විකල්ප සඳහා පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පරිසර අමාත්‍යාංශය සමග ද සාකච්ඡා කර ඇත. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ එක්රැස් වූ කල් ඉකුත්ව ගිය මීතයිල් බ්‍රෝමයිඩ් තොගයක්ද පරිසර අමාත්‍යාංශය හරහා බැහැර කිරීමේ විසඳුමක් වෙනුවෙන් ඉල්ලීමක් කර ඇත. බැහැර කිරීම සඳහා ඇති මීතයිල් බ්‍රෝමයිඩ් තොගය කි.ග්‍රෑ. 1,915ක් බවට වාර්තා වී ඇත. මීතයිල් බ්‍රෝමයිඩ් යනු බෙහෙවින් අනතුරුදායක රසායන ද්‍රව්‍යයකි. මෙය මොන්ට්‍රියල් සම්මුතිය යටතේ ඕසෝන් ස්තරයට හානි කරන ද්‍රව්‍යයක් වශයෙන් දක්වා ඇති අතර භාවිතයේදී සහ බැහැර කිරීමේදී දැඩි පාලනයක් අවශ්‍ය වන්නකි.

## බෙහෙවින් අනතුරුදායක පළිබෝධනාශක සම්මිශ්‍රණ නිරීක්ෂණය කිරීමේ වැඩපිළිවෙල

පළිබෝධනාශක විෂවීම නිරීක්ෂණය පිළිබඳ පෙර අත්දැකීම් සහ 2011 වර්ෂයේදී සිදු කළ නියමු කාර්යයට අනුව, නොදැනුවත්ව / රැකියාව ආශ්‍රිතව සිදුවන විෂවීම් පිළිබඳව විද්‍යාත්මක ප්‍රජාවේ අවධානය යොමුව ඇත්තේ මඳ වශයෙනි. ශ්‍රී ලංකාවේ නොදැනුවත්ව සහ අහම්බෙන් සිදුවන විෂවීම් පිළිබඳ සායනිකව හඳුනා ගත් සිදුවීම් සම්බන්ධයෙන් පවතින දත්ත ද ප්‍රමාණවත් නොවේ. ප්‍රමාණවත් ආරක්ෂිත ක්‍රියාමාර්ග ගනිමින් සංවර්ධිත රටවල ආරක්ෂාකාරීව භාවිත කළ හැකි නමුත් ශ්‍රී ලංකාවේ පවතින සමාජ ආර්ථික සහ දේශගුණික තත්ත්වයන් යටතේ ආරක්ෂාකාරී අයරින් භාවිත කළ නොහැකි පළිබෝධනාශක සම්මිශ්‍රණ ද තිබේ. බෙහෙවින් අනතුරුදායක පළිබෝධනාශක සහ සම්මිශ්‍රණ තහනම් කිරීම වැනි පූර්ව නියාමන තීරණවල ප්‍රතිඵල පළිබෝධනාශක අවදානම අඩුකර ගැනීම කෙරෙහි බලපෑමක් ද විශාල දායකත්වයක් ද ලබා දී ඇත. කෙසේ වුවද, මෙතෙක් එක්රැස් කරගෙන ඇති තොරතුරු ප්‍රධාන වශයෙන්ම සියදිවි නසා ගැනීම් සහ දැඩි ලෙස විෂ ශරීර ගත වූ රෝගීන් කෙරෙහි ඇති වූ බලපෑම් හා විෂවීම් කළමනාකරණය වටා කේන්ද්‍රගතව ඇත. පළිබෝධනාශක කාර්යාලයෙන් නව වැඩපිළිවෙළ මගින් රැකියා ආශ්‍රිත පළිබෝධනාශක විෂවීම කෙරෙහි අවදානය යොමු කිරීම දක්වා මෙහි විෂය පථය පුළුල් කර ඇත. මෙම කාර්යයේදී, පළිබෝධනාශකවලට ගොදුරු විය හැකි පිරිස් පිළිබඳ සැලකිල්ල යොමු කරන අතර සමීක්ෂණ ක්‍රමවේදයක් මගින් පළිබෝධනාශක සම්මිශ්‍රණවල අනන්‍යතාව, ඒවාට නිරාවරණය වීමේ තත්ත්වය සහ එහි ප්‍රතිඵල පිළිබඳ සිදුවීම් වාර්තා සම්පාදනය කරනු ලැබේ. ජිනීවාහි රොටර්ඩෑම් ප්‍රඥප්ති ලේකම් කාර්යාලය

සහ දකුණු ආසියානු සායනික ධූලක වේද පර්යේෂණ සහයෝගිතාව සමග එක්ව අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන් 05ක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනින් සැලසුම් කර ඇති පරිදි, නොදනුවත්ව සිදුවන විෂවීම් පිළිබඳ විස්තරාත්මක වාර්තා සහ සායනික අධ්‍යයනවලින් සනාථ කළ දත්ත බෙහෙවින් අනතුරුදායක පළිබෝධනාශක සම්මිශ්‍රණ පිළිබඳ තීරණ ගැනීමේදී නියාමන බලධාරියෙකු වශයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාට මඟ පෙන්වනු ඇත.

## පළිබෝධ පාලන සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීම

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතේ 26 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1655/7 හා 2010.05.25 දින දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පළිබෝධනාශක පාලනයෙහි නියාළෙන්නන්ට අදාළ විධිවිධාන ප්‍රකාශයට පත් කරන ලදී. සීමා කළ හා අනෙකුත් පළිබෝධනාශක භාවිත කර සාමාන්‍ය පළිබෝධ පාලනය, ඉදි කිරීම්වලට පෙර හා පසුව සහ ව්‍යුහවල වේයන් පාලනය හා පූර්ව / පශ්චාත් නිරෝධායන ධූමකරණය වැනි විශේෂිත පළිබෝධ පාලන සේවා ඉටු කිරීම පිණිස ආයතනවලට බලපත්‍ර ලබා දීමේ වත්මන් ක්‍රමය පදනම් වන්නේ පූර්ව අත්දැකීම්, පුහුණු සුදුසුකම්, උපකරණ පැවතීම ආදිය අනුව තාක්ෂණික හැකියාව සහ යටිතල පහසුකම් සතුවීම මතය. සුදුකම් ලත් පළිබෝධ පාලන සේවා ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පෙර කමිටුවෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව විධිවිධාන වල දැක්වේ. අයදුම් පත්‍ර හා අදාළ ගාස්තු ලැබීමෙන් පසු එම කාර්යය ඉටු කිරීමට අවශ්‍ය දැනුම පැවතීම හා නීති රීතිවලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි දැන ගැනීම සඳහා පළිබෝධ පාලන සමාගම් 42ක් පරීක්ෂා කර බලන ලදී. 2012 දෙසැම්බර් මස වන විට, විවිධ සේවා කාණ්ඩ යටතේ පළිබෝධ පාලන කටයුතු සිදු කිරීමට සුදුසු බවට පළිබෝධ පාලන සේවා 31කට බලපත්‍ර ලබා දී තිබිණි.

එයට අමතරව, සංශ්ලේෂක පයිරිත්‍රොයිඩ්ස් භාවිතය පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වීම මත දැඩි පාලනයකට යටත් කර ඇත. එවැනි සීමා කළ පළිබෝධනාශක භාවිතා කිරීමට අවසර දී ඇත්තේ දැඩි අධීක්ෂණයකට යටත්ව, සුදුසුකම් ලත් පුද්ගලයින් සිටින ලියාපදිංචි පළිබෝධ පාලන සේවා ආයතනවලට පමණි. සීමා කළ පළිබෝධනාශක සමහරක් (සංශ්ලේෂක පයිරිත්‍රොයිඩ්ස්) දිවයිනේ මදුරු මර්දන වැඩසටහනට ජාතික වශයෙන් අදාළ වේ. එමනිසා, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ ලිඛිත අනුමැතිය යටතේ එවැනි පළිබෝධනාශක මිලදී ගැනීමට අවසර ලබාදීම ද දැඩි පාලනයේම කොටසකි. මැලේරියා මර්දන ව්‍යාපාරය සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඩෙංගු මර්දන ඒකකය සමග සහයෝගයෙන් ප්‍රාදේශීය පාලන අධිකාරි විසින් සීමා කළ පළිබෝධනාශක (විශේෂයෙන්ම සංශ්ලේෂක පයිරිත්‍රොයිඩ්ස්) භාවිතය සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කෙරේ. 2012 වර්ෂයේදී සැකසුම් කරන ලද අයදුම් පත්‍ර සංඛ්‍යාව 400ක් විය.

## පළිබෝධ පාලනය පිළිබඳ පුහුණු පාඨමාලාව

පළිබෝධ පාලනයෙහි නියැළී සිටින පුද්ගලයින් සහ තාක්ෂණ නිලධාරීන් පාරිසරික හා මහජන සෞඛ්‍යය ආරක්ෂා කරන කණ්ඩායමක් වශයෙන් සැලකිය

හැකිය. කෙසේ වුවද, බොහොමයකට තවමත් ඉලක්ක නොකළ විශේෂවල සෞඛ්‍යය කෙරෙහි බලපෑමක් නොකර හෝ පරිසරය කෙරෙහි හානි කිරීමෙන් තොරව අලුතින් ජනනය කරන තාක්ෂණයන් ග්‍රහණය කර ගැනීම පිණිස විෂය ක්ෂේත්‍රය පිළිබඳ අඛණ්ඩව වෘත්තීය කුසලතා වර්ධනය කර ගැනීම අවශ්‍යය. ශ්‍රී ලංකාවේ පළිබෝධ පාලනය සංකීර්ණ එමෙන්ම බෙහෙවින් නියාමනය වූවක් වන බැවින් ජාතියට සේවය කිරීම සඳහා අදාළ දැනුමින්, කුසලතාවලින් සහ ආකල්පවලින් යුතු පිරිස් එයට එක්වීම අවශ්‍ය වේ.

පළිබෝධ පාලන පාඨමාලාවක් සැලසුම් කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂි විද්‍යා අධ්‍යයන ඒකකය සමග සාර්ථක සාකච්ඡා පවත්වා මෙම කර්මාන්තයේ නියැළි වෘත්තිය හා තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා පළිබෝධ පාලනය පිළිබඳව දින 25ක සහතික පාඨමාලාවක් සකස් කරන ලදී. වාණිජමය පරිසරයන්හි ඇති විශේෂිත අභියෝගවලට මුහුණදීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම පුහුණුවන්නන්ට ලබාදීම සඳහා පන්ති කාමරය තුළ ඉගැන්වීම්, විද්‍යාගාර අභ්‍යාස සහ සැබෑ ලොව තත්ත්වයන් තුළ පවත්වන ප්‍රායෝගික අභ්‍යාස / ආදර්ශන පුහුණුවට ඇතුළත් වනු ඇත. මෙම පාඨමාලාව මගින් කාර්මාන්තයේ සිටින රාජ්‍ය හෝ පෞද්ගලික අංශයට අයත් පළිබෝධ පාලනයෙහි නියැළෙන්නන් හා තාක්ෂණික නිලධාරීන් සඳහා වෘත්තීය පළිබෝධ පාලකයින්ට අත්‍යවශ්‍ය දැනුම ලබා දෙනු ලැබේ. පළමු කණ්ඩායම සඳහා පුහුණු පාඨමාලාව 2013 ජනවාරි මාසයේදී ආරම්භ කෙරෙනු ඇත.

## ශ්‍රී ලංකාවේ රසායන ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රියාමාර්ගවලට සහභාගී වීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිසර වැඩසටහනෙහි ගෝලීය පරිසර හවුලෙහි මූල්‍යමය සහාය යටතේ මෙම කාර්යාලය ශ්‍රී ලංකාවේ/ පළිබෝධ කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ කාර්යය වෙනුවෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පරිසර අමාත්‍යාංශයට ක්‍රියාකාරී අයුරින් සහය විය. 2001 සැප්තැම්බර් 5 දින පරිසරයේ නොනැසී පවතින කාබනික දූෂණ කාරක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතියට අත්සන් කරන ලද අතර පරිසර අමාත්‍යාංශය සම්බන්ධීකරණ ආයතනය බවට පත්විය. පරිසරයේ නොනැසී පවතින කාබනික දූෂණ කාරක 12ක් පාලනය කිරීම සඳහා ජාතික ක්‍රියාත්මක කිරීම් සැලැස්ම පිළියෙල කිරීම පිණිස පරිසර අමාත්‍යාංශය ගෝලීය පරිසර හවුලෙන් අරමුදල් ලබාගත්තේය. අලුතින් වර්ගීකරණය කරන ලද පරිසරයේ නොනැසී පවතින කාබනික දූෂණ කාරක 9ක් සහ ඉදිරියේදී හඳුන්වා දෙනු ඇති රසායන ද්‍රව්‍ය පිළිබඳව පුළුල් ඇගයීමක් කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව අනතුරුදායක අපද්‍රව්‍ය වෙනත් රටවලට ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම පාලන කිරීම පිළිබඳ බේසල් සම්මුතියේ පාර්ශවකරුවෙකු වන අතර පරිසරයේ නොනැසී පවතින රසායන ද්‍රව්‍ය අනතුරුදායක අපද්‍රව්‍ය වශයෙන් කළමනාකරණය කිරීම සඳහා පරිසර හිතකාමී විසඳුම් සොයා ගත යුතුය. 2006 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳාමේදී යම් යම් අනතුරුදායක රසායන ද්‍රව්‍ය සහ පළිබෝධනාශක සඳහා කලින් දැනුම් දී අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳ රොටර්ඩෑම් සම්මුතියේ පාර්ශවකරුවකු බවට පත්විය. කෘෂිකර්ම අමාත්‍යාංශය මෙහි සම්බන්ධීකරණ

ආයතනය වශයෙන් ක්‍රියා කරයි. මෙම සම්මුතිය යටතේ, පරිසරයේ නොනැසී පවතින කාබනික දූෂණ කාරක කිහිපයක් ද අනතුරුදායක රසායන ද්‍රව්‍ය හා පළිබෝධනාශක වශයෙන් ඇතුළත් වේ. එමනිසා, ජාතික ක්‍රියාත්මක කිරීම් සැලැස්ම යටතේ හඳුනාගන්නා ලද කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා මෙම සම්මුති තුනම සුදුසු වන අතර බොහාමයක් පරිපූරක වශයෙන් පවතින දැයි.

පළිබෝධනාශක යනු රසායනික ද්‍රව්‍යවල කුඩා උපකුලකයක් වන අතර ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක කළමනාකරණය 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතෙහි සහ 1994 අංක 06 දරන එහි සංශෝධන පනතෙහි විධිවිධාන යටතේ දැඩි ලෙස නියාමනය කෙරෙන විෂයකි. පරිසරය තුළ නොනැසී පවතින කාබනික දූෂණ කාරක පළිබෝධනාශක භාවිතය මුලින්ම 70 දශකයේ මුල් භාගයේදී තහනම් කරන ලද අතර ගොඩනැගිලි ඉදි කිරීමේදී වේයන් පාලනය කිරීමට ශ්‍රී ලංකාවේ භාවිතා කරන ලද පරිසරයේ නොනැසී පවතින අවසන් කාබනික දූෂණ කාරක පළිබෝධනාශකය වූ ක්ලෝඩේන් 1996 වර්ෂයේදී තහනම් කෙරිණි. එමනිසා, එවන් පළිබෝධනාශක මෙරටට නීති විරෝධීව ආනයනය කිරීමේ තර්ජනය ඉතාමත් අවම මට්ටමක පවතී. කෙසේ වුවද, පළිබෝධනාශක වශයෙන් වර්ගීකරණය නොකරන ලද වෙනත් රසායන ද්‍රව්‍ය ලෙස, එවන් දූෂණ කාරක පළිබෝධනාශක වෙනස් ක්‍රමයකට (Under a different custom harmonized system code) නීති විරෝධීව ආනයනය කිරීමේ ඉඩකඩ පවතී. ආධාර ආයතන වලින් සහ මධ්‍යම රජයේ අයවැයෙන් අපේක්ෂිත මූල්‍යමය සහායෙන් පළිබෝධ කළමනාකරණය, භාවිතය, විශ්ලේෂණය සහ බැහැර කිරීම පිළිබඳ ආයතනික අංශ වැඩිදියුණු කිරීමේ යෝජනා ඉදිරිපත් කරන ලදී.

## පළිබෝධනාශක කර්මාන්තයට අලුතින් ප්‍රවේශවන්නන් සඳහා මාර්ගෝපදේශ

සාමාන්‍යයෙන්, ආනයනය, ගබඩාකරණය, බෙදා හැරීම සහ අලෙවිය ඇතුළු පළිබෝධනාශක කර්මාන්තයෙහි නියැළි සෑම නව සමාගමක්ම පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුව විසින් අනුමත කෙරේ. පළිබෝධනාශක විශාල තොග වශයෙන් ගබඩා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා පවතින යටිතල පහසුකම් ධාරිතාව, අලෙවිකරණය පිළිබඳ වෘත්තීය පළපුරුද්ද සහ කාර්ය මණ්ඩල සුදුසුකම් සහ අනෙකුත් කරුණු අනුව, සමාගමේ තත්ත්වය පිළිබඳ සතුටුදායක ඇගයීමක් කිරීමෙන් පසු පළිබෝධනාශක ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර පිළිගනු ලැබේ. පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුවේ නියමිත උපදෙස් පරිදි, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය නව සමාගම් සඳහා මාර්ගෝපදේශ පිළියෙල කළ අතර ලැබෙන අයදුම් පත්‍ර ඒ අනුව අගයනු ලැබේ. 2012 වර්ෂයේදී නව සමාගම් 2ක් මෙරට පළිබෝධනාශක වෙළඳාමෙහි නිරත වීම සඳහා පිළිගන්නා ලදී.

## හිස් පළිබෝධනාශක බඳුන් කළමනාකරණය පිළිබඳ වැඩපිළිවෙල

තැන්පතුව නැවත ලබාදීමේ ක්‍රමය මගින් හිස් පළිබෝධනාශක බඳුන් ආරක්ෂිතව සහ කාර්යක්ෂමව බැහැර කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පරිසර අමාත්‍යාංශයේ සහභාගිත්වය ඇතිව වැඩසටහනක් ආරම්භ කර ඇත. 2012 අගෝස්තු මාසයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ පරිසර අමාත්‍යාංශයට අදාළ කැබිනට් අමාත්‍යවරු ගොවි ක්ෂේත්‍ර

මට්ටමේදී හිස් පළිබෝධනාශක බඳුන් කළමනාකරණයට සුදුසු යාන්ත්‍රණ ඇති කිරීමට මූලික වශයෙන් එකඟ වූහ. පරිසර අමාත්‍යාංශය විසින් ගොවීන්, අලෙවිකරුවන් සහ මහජනයා අතර සිදු කරන ලද මූලික සමීක්ෂණ මගින් මෙම ව්‍යාපෘතිය කෙරෙහි පුළුල් පිළිගැන්මක් ඇති බව අනාවරණය විය. යෝජිත ක්‍රමයේ ප්‍රථම අදියර වීදුරු බඳුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනු ඇති අතර ප්ලාස්ටික් බඳුන් බැහැර කිරීමේ පහසුකම් දෙවනුව ඇති කෙරෙනු ඇත. කෙසේ වුවද, මධ්‍යම පරිසර අධිකාරියේ විධිමත් අනුමැතිය යටතේ සුදුසු ප්‍රතිචක්‍රීකරණ විසඳුමක් තෝරා ගැනීම (එනම් නිපදවීමට ඉඩදිය හැකි ද්‍රව්‍ය) සඳහා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණයෙහි නියැළීමට අපේක්ෂා කරන්නන්ගෙන් 2012 ඔක්තෝබර් මාසයේදී පුවත්පත් නිවේදනයක් මගින් යෝජනා කැඳවන ලදී. මේ පිළිබඳ වැඩිදුර සාකච්ඡා සිදු වෙමින් පවතී.

ප්ලාස්ටික් බඳුන් පළිබෝධනාශක සම්මිශ්‍රණය කරන/ යළි ඇසුරුම් කරන කම්හල්වල විශාල තොග වශයෙන් එක්රැස්ව ඇති අතර එය පරිසරයට බරපතල තර්ජනයක් වේ. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් සිදු කරන කසළ එක්රැස් කිරීමේ ව්‍යාපෘති හරහා එවැනි හිස් ප්ලාස්ටික් බඳුන් බැහැර කිරීම පිණිස විකල්ප ක්‍රමෝපාය අනුගමනය කර ඇත. කර්මාන්ත පරිශ්‍රවලින් එවැනි බඳුන් ඉවත් කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් පූර්ව අනුමැතිය ලබාදීමේ ක්‍රියාපටිපාටියක් අනුගමනය කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ සියලුම බඳුන් ගබඩා කිරීමට පෙර තෙවරක් සේදිය යුතුය. සිදුවිය හැකි අනාරක්ෂිත භාවිතය වළක්වා ගැනීම සහ සෞඛ්‍යමය අවදානම් අඩු කර ගැනීම පිණිස එම බඳුන්වල අවම වශයෙන් සිදුරු 8ක්වත් විදීමෙන් ඒවා භාවිතයට ගත නොහැකි අයුරින් වෙනස් කිරීම අවශ්‍යය. 2012 වර්ෂයේදී පූර්ව අනුමැතිය ලබාදීම මගින් ප්ලාස්ටික් බඳුන් 23,000කට අධික සංඛ්‍යාවක් බලය ලත් පාර්ශ්වයන්ට නිකුත් කරන ලදී. පූර්ව අනුමැතිය ලබාදීමේ ක්‍රියාපටිපාටිය මගින් සියලුම වානේ බඳුන් (සියලුම බඳුන් තෙවරක් සේදීමෙන් පසු පළුදු කළ යුතුය) අමු යකඩ සමග ප්‍රතිචක්‍රීයකරණය කිරීම මගින් බැහැර කිරීමට අවසර දෙනු ලැබේ. 2012 වර්ෂයේදී වානේ බඳුන් 8,000කට අධික සංඛ්‍යාවක් (මෙ.ටො. 108කට සමාන ප්‍රමාණයක්) අනුමත ප්‍රතිචක්‍රීයකරණ කම්හල් මගින් ප්‍රතිචක්‍රීයකරණය කරන ලදී. ලබන වසර සඳහා නව කාර්යයක් වශයෙන් හිස් පළිබෝධනාශක බඳුන් කළමනාකරණයට අදාළ විධිවිධාන ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය බව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අදහසයි.

# 2012 වර්ෂයේ ප්‍රගතිය

| අයතමය | අනු කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | වසර අවසානයට ප්‍රගතිය | ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| 1 | අයදුම් පත්‍ර පරීක්ෂා කර බැලීමෙන් පසු ලියාපදිංචිය සඳහා පිළිගැනීම සහ අයදුම් පත්‍ර සඳහා අංක ලබාදීම | 150 | 149 | 99 |
| 2 | මුල් ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 30 | 30 | 100 |
| 3 | තෙවැනි පාර්ශ්ව ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 140 | 34 | 24 |
| 4 | නැවත ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 140 | 189 | 135 |
| 5 | දේශීය අත්හදා බැලීම් සඳහා දත්ත ඇගයීම | 30 | 94 | 313 |
| 6 | ආනයන අනුමැති ලබාදීම | 1,400 | 874 | 62 |
| 7 | පළිබෝධනාශකවල තත්ත්වය පිළිබඳ සහතික ඇගයීම | 1400 | 595 | 42 |
| 8 | අනුමැතිය ලබාදීමට ලේබල් පරීක්ෂා කර බැලීම | 750 | 497 | 66 |
| 9 | අනුමැතිය ලබාදීමට ප්‍රචාරණ ද්‍රව්‍යාදිය පරීක්ෂා කර බැලීම | 250 | 122 | 49 |
| 10 | කම්හල් පරීක්ෂා කිරීම | 12 | 09 | 7 |
| 11 | අනුමත යළි ඇසුරුම් කම්හල් හා ගබඩා පරීක්ෂා කර බැලීම | 02 | 09 | 450 |
| 12 | ධූමකරණ පරිග්‍ර සහ ගෘහස්ථ පළිබෝධ පාලනය කරන්නන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම | 30 | 27 | 90 |
| 13 | පළිබෝධ පාලන සේවා ලියාපදිංචි කිරීම | 30 | 33 | 110 |
| 14 | නිරෝධායන හා පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම සඳහා වගකිවයුතු පදනමක් මත මීතයිල් බ්‍රෝමයිඩ් ලබා ගැනීමට අනුමැතිය ලබාදීම | 60 | 88 | 147 |
| 15 | අයදුම්පත්‍ර පිළිගැනීම සඳහා යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට නියැදි වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණ ආයතනය වෙත යැවීම | 25 | 38 | 152 |
| 16 | තොග පදනම මත නියැදිවල තත්වමය විශ්ලේෂණය අනුව, ඇසුරුම් කිරීම සඳහා තොග මුදා හැරීම | 800 | 284 | 36 |
| 17 | අලෙවි සැල් පරීක්ෂා කිරීම | 140 | 70 | 50 |

| අයතමය | අනු කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | වසර අවසානයට ප්‍රගතිය | ප්‍රගතිය ප්‍රතිශතය ක් වශයෙන් |
|---|---|---|---|---|
| 18 | පළිබෝධනාශක / ජෛවනාශක ලියාපදිංචියට අදාළ සංශෝධිත මාර්ගෝපදේශ සහ පළිබෝධනාශක ආනයනය කිරීමට අවශ්‍ය පළිබෝධනාශක ක්ෂේත්‍රයට අලුතින් ප්‍රවේශවන්නන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම | 04 | 03 | 75 |
| 19 | මාධ්‍ය වැඩසටහන් (රූපවාහිනී/ ගුවන්විදුලි / මුද්‍රිත මාධ්‍ය) | 12 | 25 | 208 |
| 20 | පුහුණු කටයුතු/ කෘෂි රසායන අලෙවි සහතිකකරණය සහ තාක්ෂණික සහාය | 25 | 0 | 0 |
| 21 | දැනුවත් කිරීම් ප්‍රදර්ශන | 4 | 03 | 75 |
| 22 | අලෙවිකරු පුහුණු පංති | 30 | 0 | 0 |
| 23 | අලෙවිකරු පුහුණු සහතික නිකුත් කිරීම | 1,100 | 129 | 12 |
| 24 | අලෙවිකරු සහතික නිකුත් කිරීම | 2,000 | 1,184 | 59 |
| 25 | ක්ෂේත්‍ර පැමිණිලි | 04 | 12 | 300 |
| 26 | නීතිමය පියවර ගැනීම් | 02 | 02 | 100 |
| 27 | තාක්ෂණික උපදේශන කමිටු රැස්වීම | 06 | 06 | 100 |
| 28 | පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශන කමිටුවේ තීරණ දැනුම් දීම සඳහා | 06 | 05 | 83 |
| 29 | පළිබෝධනාශක කර්මාන්ත නියෝජිතයින් හමුව අනු කමිටු 3කට අයත් පළිබෝධනාශක පිළිබඳ අනු කමිටු රැස්වීම් | 09 | 06 | 67 |
| 30 | සම්මිශ්‍රණ විශ්ලේෂණය | 800 | 1,096 | 137 |
| 31 | පළිබෝධනාශක තුළ අපවිත්‍ර කාරක ඇත්දැයි අහඹු ලෙස පරීක්ෂා කර බැලීම | 12 | 07 | 58 |
| 32 | හිස් බඳුන් බැහැර කිරීම සඳහා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම | 02 | 03 | 150 |
| 33 | දෙපාර්තමේන්තුව තුළ සහ දෙපාර්තමේන්තු අතර ආයතනික රැස්වීම් සඳහා සේවය ලබාදීම හෝ තාක්ෂණික විශේෂඥයින් / සමාජිකයින්/ සම්පත් දායකයින් වශයෙන් සහභාගි වීම | 33 | 29 | 88 |

| අයතමය | අනු කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | වසර අවසානයට ප්‍රගතිය | ප්‍රගතිය ප්‍රතිශතය ක් වශයෙන් |
|---|---|---|---|---|
| 34 | අනෙකුත් ආයතනවලින් ලැබෙන ආරාධනා අනුව සම්පත් දායකයින් වශයෙන් සහභාගි වීම | 10 | 19 | 190 |
| 35 | වැදගත් සංඛ්‍යා ලේඛන (මහ බැංකුව, විශ්වවිද්‍යාල, පර්යේෂකයින්, රජයේ ආයතන ආදිය) එස්රැස් කිරීම, සම්පාදනය හා බෙදා හැරීම | 40 | 06 | 15 |
| 36 | ක්ෂේත්‍ර සමීක්ෂණ වැනි අනෙකුත් කාර්යයන් | 04 | 02 | 50 |

# 2013 වර්ෂය සඳහා සැලැස්ම

තාක්ෂණික කාර්ය සැලැස්ම - 2013
වැඩසටහන : පළිබෝධනාශක ලියාපදිංචිය

| අංකය | අයතමය / කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය | | | | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| | | | 1වන | 2වන | 3වන | 4වන | |
| 1 | අයදුම් පත්‍ර පරීක්ෂා කර බලා අංක වෙන්කර දීමෙන් පසු ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර පිළි ගැනීම | 150 | 40 | 80 | 120 | 150 | දේශීය තත්ත්වයන් යටතේ නිපැයුම්වලින් හානිකර බලපෑම් ඇති නොවේද යන්න පිළිබඳව තීරණයකට එළඹීම සහ කෘෂිකාර්මික යෙදවුම් පිරිවැය අවම කර ගැනීම |
| 2 | මුල් ලියාපදංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම/ ඒ අනුව ලිපි ලේඛන අනු පිළිවෙළ | 30 | 05 | 15 | 25 | 30 | |
| 3 | තෙවන පාර්ශ්ව ලියාපදිංචි කිරීම් අයදුම් පත් ඇගයීම | 140 | 35 | 70 | 105 | 140 | |
| 4 | නැවත ලියාපදිංචි කිරීම් අයදුම් පත්‍ර ඇගයීම | 140 | 35 | 70 | 105 | 140 | |
| 5 | අනුමැතිය සඳහා ලියාපදිංචි කිරීම් සහතික සකස් කිරීම | 280 | 70 | 140 | 210 | 280 | |
| 6 | අනුකම්ටු සඳහා දත්ත ඇගයීම හා සකස් කිරීම | 30 | 5 | 15 | 25 | 30 | මිනිසාට සහ පරිසරයට හිතකර සම්මිශ්‍රණ නිදහස් කිරීම |
| 7 | පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය සඳහා ආනයන බලපත්‍ර සකස් කිරීම | 1,400 | 300 | 550 | 100 | 140 | නිපැයුම් නිවැරදි සැපයුම් ප්‍රභවයෙන් ආනයනය කෙරෙන බවට වගබලා ගැනීම සහ අනවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ආනයනය වැළැක්වීම |
| 8 | ආනයන අනුමැති නිකුත් කිරීම | 1,400 | 300 | 550 | 100 | 140 | |

| අංකය | අයතමය / කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය 1වන | 2වන | 3වන | 4වන | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| 9 | පළිබෝධනාශක පිළිබඳ තත්ත්ව සහතික ඇගයීම | 1,400 | 300 | 550 | 100 | 140 | උසස් තත්වයේ පළිබෝධනාශක ආනයනය කිරීම සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පිරිවිතරවලට නිපැයුම් අනුකූල වන බව සහතික වීම |
| 10 | අනුමැතිය සඳහා ලේබල් පරීක්ෂා කර බැලීම | 750 | 100 | 300 | 500 | 750 | පළිබෝධනාශක ප්‍රවේශමෙන් භාවිත කිරීම සහ ආරක්ෂිතබව පිළිබඳ නිවැරදි පණිවිඩය ගොවීන් සහ වෙනත් අදාළ බලධාරීන්ට ලබාදීම |
| 11 | අනුමැතිය සඳහා ප්‍රචාරක ද්‍රව්‍ය ආදිය පරීක්ෂා කර බැලීම | 250 | 50 | 100 | 200 | 250 | |
| 12 | කම්හල් පරීක්ෂා කිරීම | 12 | 3 | 6 | 9 | 12 | කම්හල් සැබැවින්ම ප්‍රමිතිවලට අනුකූල බවට සහතිකවීම |
| 13 | අනුමත යළි ඇසුරුම්කරණ ස්ථාන සහ ගබඩා පරීක්ෂා කර බැලීම | 12 | 3 | 6 | 9 | 12 | ප්‍රමිතිවලට අනුව ඇසුරුම් කරන කටයුතු වේදැයි පරීක්ෂා කර බැලීම සහ එමගින් නිපැයුම් උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යෑම |
| 14 | ධූමකරණ පරිශ්‍ර සහ ගෘහස්ථ පළිබෝධ පාලනයෙහි යෙදෙන්නන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම | 30 | 5 | 10 | 20 | 30 | ධූමකරණ කාර්යයන් විධිමත් කිරීම සහ එමගින් අපනයන ප්‍රතික්ෂේප වීම වළක්වා ගැනීම |
| 15 | පළිබෝධ පාලන සේවා ලියාපදිංචිය | 30 | 5 | 10 | 20 | 30 | නුපුහුණු පුද්ගලයින් මෙම කර්මාන්තයට පිවිසීම වැළැක්වීම සඳහා පළිබෝධ පාලනයෙහි නියැළෙන්නන් විධිමත් කිරීම |

| අංකය | අයතමය / කාර්යයය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය 1වන | 2වන | 3වන | 4වන | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| 16 | නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම සඳහා වගකිය යුතු පදනමක් මත මීතයිල් බ්‍රෝමයිඩ් ($CH_3Br$) ලබා ගැනීම සඳහා අනුමැතිය | 60 | 15 | 30 | 45 | 60 | |
| 17 | අලෙවිසැල් පරීක්ෂා කිරීම | 140 | 30 | 75 | 110 | 140 | තත්ත්වය බාල කිරීම සහ ව්‍යාජ නිපැයුම් වළක්වා ලීම |
| 18 | අයදුම්පත්‍ර පිළි ගැනීමට ඒවායෙහි යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා නියැදි වෛද්‍ය පරීක්ෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණ ආයතනය වෙත යැවීම | 25 | 7 | 15 | 20 | 25 | වෙළඳපොළෙහි උසස් තත්ත්වයේ නිපැයුම් සුලභ කිරීම |
| 19 | නියැදිවල තත්ව විශ්ලේෂණය අනුව, තොග පදනම මත නිපැයුම් ඇසුරුම් කිරීම සඳහා නිදහස් කිරීම | 800 | 200 | 400 | 650 | 800 | |
| 20 | මාධ්‍ය වැඩසටහන් | | | | | | පුහුණුකරුවන් පුහුණු කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීම වර්ධනය කිරීම |
| | • රූපවාහිනී | 2 | - | 1 | 1 | 2 | |
| | • ගුවන්විදුලි | 6 | 2 | 4 | 5 | 6 | |
| | • මුද්‍රිත මාධ්‍ය | 4 | 2 | 2 | 3 | 4 | |
| 21 | පුහුණුව/ කෘෂි රසායන අලෙවිය සහ තාක්ෂණික සහකාරවරුන් සහතික කිරීම | 25 | 5 | 10 | 20 | 25 | |
| 22 | දැනුවත් කිරීම් ප්‍රදර්ශන | 4 | 1 | 2 | 3 | 4 | |

| අංකය | අයතමය / කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය 1වන | 2වන | 3වන | 4වන | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| 23 | බලය නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 2 | - | 1 | 2 | 2 | පුහුණු පිරිස් සහ සහතික කරන ලද අලෙවිසැල් මගින් පමණක් පළිබෝධනාශක අලෙවි කරන බවට වග බලා ගැනීම |
| 24 | අලෙවිකරු සහතික නිකුත් කිරීම | 2,000 | 500 | 1,000 | 1,500 | 2,000 | |
| 25 | ක්ෂේත්‍ර ගැටලු | 6 | 1 | 2 | 4 | 6 | පනතෙහි ප්‍රතිපාදන සහ විධිවිධාන උල්ලංඝනය කරන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීම |
| 26 | නීතිමය පියවර ගැනීම | 4 | - | 2 | 3 | 4 | |
| 27 | තාක්ෂණික උපදේශන කමිටු රැස්වීම් | 6 | 2 | 3 | 5 | 6 | පළිබෝධනාශක පාලන පනත හා සම්බන්ධ සියලුම කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් දීම |
| 28 | පළිබෝධනාශක පිළිබඳ තාක්ෂණික හා උපදේශක කමිටු තීරණ දැනුම් දීම පිණිස කර්මාන්ත නියෝජිතයින් හමුව | 6 | 2 | 3 | 5 | 6 | කර්මාන්ත ක්ෂේත්‍රයේ පළිබෝධනාශක නිර්දේශ කිරීම සහ භාවිතය හා සම්බන්ධ කරුණු විමසා බැලීම |
| 29 | අනු කමිටු 3ට අදාළ පළිබෝධනාශක අනු කමිටු රැස්වීම් | 18 | 6 | 9 | 12 | 18 | සෞඛ්‍යය, මහජන සෞඛ්‍යය හා ගෘහස්ථ පළිබෝධ පාලනය යන ක්ෂේත්‍ර තුළ පළිබෝධනාශක නිර්දේශ කිරීම සහ භාවිතය හා සම්බන්ධ කරුණු විමසා බැලීම |

| අංකය | අයතමය / කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය | | | | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| | | | 1වන | 2වන | 3වන | 4වන | |
| 30 | සම්මිශ්‍රණ විශ්ලේෂණය | 800 | 150 | 350 | 625 | 800 | පළිබෝධනාශකවල තත්ත්වය සහ ආහාරවල සහ ජලයේ ඇති අවශේෂ විශ්ලේෂණය කිරීම |
| 31 | පළිබෝධනාශකවල ඇති අපවිත්‍ර කාරක අහඹු ලෙස පරීක්ෂා කර බැලීම | 12 | 4 | 8 | 12 | 12 | |
| 32 | බැර ලෝහ ඇතුළු පළිබෝධනාශක අපවිත්‍රකාරක පිළිබඳ අවදානම් තක්සේරුව (1 වන අදියර : අපවිත්‍රකාරක මට්ටම් පිළිබඳ පසුබිම් දත්ත මූලය සකස් කිරීම ; ඇගයිය යුතු වාර්තා සංඛ්‍යාව | 225 | 65 | 105 | 170 | 225 | පළිබෝධනාශකවලට අදාළ බැර ලෝහ අපවිත්‍රකාරක නියාමන වැඩසටහන |
| 33 | පළිබෝධනාශක මගින් ඉලක්ක නොවන පරිසරයේ සිටින ජීවීන් කෙරෙහි ඇතිවන බලපෑම (1වන අදියර : ගොවීන්ගේ පළිබෝධනාශක භාවිත රටා පිළිබඳ සමීක්ෂණය සහ පරිසරය නිර්මිත වන කොටස්වල ඇති අවශේෂ විශ්ලේණය) ප්‍රගතිය %ක් වශයෙන් | 100 | 20 | 40 | 60 | 100 | පරිසර කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන පළිබෝධනාශක නිර්දේශ අතරින් ඉවත් කිරීම |
| 34 | පළිබෝධනාශක සඳහා ප්‍රතිරෝධීතාව ඇතිවීම නිරීක්ෂණය කිරීමේ වැඩසටහන (1වන අදියර : ජෛව කාර්යක්ෂමතාව යළි පරීක්ෂා කිරීමේ වැඩසටහනක් සකස් කිරීම : ඇගයීමට නියමිත නිපැයුම් සංඛ්‍යාව) | 113 | 40 | 60 | 75 | 113 | පළිබෝධනාශක ප්‍රතිරෝධිතා කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම |

| අංකය | අයතමය / කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය 1වන | 2වන | 3වන | 4වන | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| 35 | එළවළු සහ පලතුරුවල පැවතිය හැකි පළිබෝධනාශක අවශේෂ මට්ටම් සම්බන්ධයෙන් නියාමන ක්‍රමයක් ස්ථාපිත කිරීම [(1වන අදියර : ප්‍රමිති පිළිබඳ තොරතුරු ගබඩාවක් (Custom library) සකස් කිරීම ; සකස් කළ යුතු සංයෝග සංඛ්‍යාව)] | 110 | 30 | 60 | 90 | 110 | උපරිම අවශේෂ මට්ටම් නිරීක්ෂණය කිරීමේ වැඩසටහන |
| 36 | ගෘහස්ථ පළිබෝධනාශකවල ක්ෂේත්‍ර ඵලදායකත්වය පිළිබඳව දැන ගැනීම සඳහා ඇගයීම (1 වන අදියර : මදුරු දඟර පිළිබඳ වැඩකටයුතු, ප්‍රගතිය %ක් වශයෙන්) | 100 | 10 | 60 | 80 | 100 | ගෘහස්ථ පළිබෝධනාශකවලට ජෛව කාර්යක්ෂමතාව පරීක්ෂා කර බැලීමට සුදුසු ක්‍රම |
| 37 | හිස් බඳුන් බැහැර කිරීම සඳහා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම | 2 | 1 | 1 | 2 | 2 | පරිසර දූෂණය අවම කර ගැනීම |
| 38 | දෙපාර්තමේන්තුව තුළ හා දෙපාර්තමේන්තු අතර ආයතනික රැස්වීම් සඳහා තාක්ෂණික විශේෂඥයින් / සමාජිකයින් / සම්පත්දායකයින් වශයෙන් සහභාගි වීම | 27 | 5 | 12 | 19 | 27 | පළිබෝධනාශක හා සම්බන්ධ සෞඛ්‍ය හා පාරිසරික බලපෑම් අඩු කර ගැනීම |
| 39 | වෙනත් ආයතනවලින් ලැබෙන ඇරයුම් සඳහා සම්පත්දායකයන් වශයෙන් සහභාගිවීම | 10 | 2 | 5 | 8 | 10 | |

| අංකය | අයතමය / කාර්යය | සමස්ත වාර්ෂික භෞතික ඉලක්කය | කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය 1වන | 2වන | 3වන | 4වන | අපේක්ෂිත ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|
| 40 | වැදගත් සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම, සම්පාදනය සහ බෙදාහැරීම (මහ බැංකුව, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ රජයේ ආයතන ආදිය සඳහා ) | 40 | 10 | 20 | 30 | 40 | |
| 41 | පළිබෝධනාශක / ජෛවනාශක ලියාපදිංචිය සඳහා සංශෝධිත මාර්ගෝපදේශ සහ පළිබෝධනාශක ආනයනය කිරීමට අවශ්‍ය එම කර්මාන්තයට අලුතින් එක්වන්නන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම | 2 | - | 1 | 2 | 2 | |
| 42 | වෙනත් කාර්යයන් (ක්ෂේත්‍ර සමීක්ෂණ වැනි) | 4 | 1 | 2 | 3 | 4 | |

## **කාර්ය මණ්ඩලය**

| **තනතුර** | **නිලධාරී / සේවක සංඛ්‍යාව** |
|---|---|
| පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් | 01 |
| පර්යේෂණ නිලධාරි | 04 |
| කෘෂිකර්ම නිලධාරි | 01 |
| කෘෂිකර්ම උපදේශක | 06 |
| පර්යේෂණ සහකාර | 04 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 02 |
| වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | 02 |
| පර්යේෂණ උප සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 05 |
| රියදුරු | 03 |
| මුරකරු | 01 |
| කොන්ත්‍රාත් කම්කරු | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| කම්කරු | 02 |
| **එකතුව** | **35** |

# 2.1.5 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය ආහාර බෝගවල ජාන සම්පත් සංරක්ෂණය සහ උපයෝජනය ප්‍රවර්ධනය කිරීම පිණිස තමන්ට අයත් කාර්යයන් අඛණ්ඩව සිදු කරයි. මෙම අරමුණ ජය ගැනීම සඳහා, පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය ආහාර බෝගවල හා ඒ ආශ්‍රිත විශේෂවල ජාන විවිධත්වය එක්රැස් කිරීම, හඳුන්වා දීම, සංරක්ෂණය කිරීම, ඇගයීම සහ ලේඛන ගත කිරීම අඛණ්ඩව සිදු කරයි.

මෙම මධ්‍යස්ථානයේ ගවේෂණ කටයුතු තුළින් දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වලින් ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම මගින් වසර තුළ කැපී පෙනෙන ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකි විය.

මෙම මධ්‍යස්ථානයේ බීජ ජාන බැංකුව තුළ සංරක්ෂිත ද්‍රව්‍ය වශයෙන් ජනකප්ලාස්ම එකතුන් 12,980ක් පවතී. ගොවීන් සහ පර්යේෂකයින් මගින් ජනකප්ලාස්ම ප්‍රයෝජනයට ගැනීම වර්ධනය වී ඇත.

'මහේෂි' නමැති දෙමුහුම් තක්කාලි ප්‍රභේදයේ පවිත්‍රතාව සනාථ කිරීම සඳහා මෙහි ජෛව තාක්ෂණ ඒකකය SSR සලකුණු 2ක් හඳුනා ගෙන ඇත.

මෙම වාර්තාවෙන් 2012 වර්ෂයේදී පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් අත්කර ගත් ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කෙරේ.

## අයවැය

2012 වර්ෂයට අදාළ අයවැය වගු අංක 2.1.5.1හි දැක්වේ.

**වගු අංක 2.1.5.1: වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 11,306,000 | 10,838,719 | 96 |
| මූලධන | 2,580,000 | 2,170,521 | 84 |
| ව්‍යාපෘති | | | |
| ඒකාබද්ධ පැළෑටි ජාන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා වැඩපිළිවෙල) | 1,132,000 | 448,446 | 40 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘතිය | 1,725,700 | 1,709,466 | 99 |
| **එකතුව** | **16,743,700** | **15,167,155** | **91** |

## ප්‍රගතිය

### පැළෑටි ජාන සම්පත් ගවේෂණය සහ එක්රැස් කිරීම

1989 වර්ෂයේදී පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීමෙන් වර්ෂ 23කට පසු ලොව ජෛව විවිධත්වයෙන් පොහොසත් එමෙන්ම තර්ජනයට ලක්ව ඇති ජෛව භූගෝලීය ප්‍රදේශ සහිත රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල පැළෑටි ජාන සම්පත් එක්රැස් කිරීම ආරම්භ කිරීමෙන් මෙම මධ්‍යස්ථානයේ ගවේෂණ ඒකකය

කැපී පෙනෙන ජයග්‍රහණ අත් කරගෙන ඇත. ගවේෂණ ඒකකය එම පළාත්වල කෘෂිකාර්මික ආයතන හා කෘෂිකර්ම නිලධාරීන් සමග යළි ශක්තිමත් සබඳතා ගොඩනගා ගැනීමට සමත් විය. ක්ෂේත්‍ර ගවේෂණයට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතනවලින් ද පැළෑටි ජාන සම්පත් එක්රැස් කර ගැනිණි.

2012 වර්ෂයේදී එක්රැස් කරගත් මුළු නියැදි සංඛ්‍යාව 814කි. බීජ නියැදි 784ක් සංරක්ෂණය සඳහා ජාන බැංකුවට යවන ලද අතර වර්ධක ප්‍රචාරණ ද්‍රව්‍ය වූ ඉතිරි නියැදි 30 ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදී.

**ගවේෂණය සහ එක්රැස් කිරීම**

2012 වර්ෂයේදී ගවේෂණ ඒකකය පුත්තලම, මහනුවර, මන්නාරම, අම්පාර, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ජනකප්ලාස්ම ගවේෂණ හා එක්රැස් කිරීම් චාරිකා 6ක නිරත විය. ක්ෂේත්‍ර ගවේෂණ මගින් නියැදි 394ක් එක්රැස් කර ගැනිණි. එක් එක් ගවේෂණ පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**ගවේෂණය 01 - නාවලපිටිය ප්‍රදේශය**

2012 මාර්තු 06 දින නාවලපිටිය ප්‍රදේශයේ සිදු කළ ගවේෂණයට නිලධාරීහු 3දෙනෙක් සහභාගි වූහ. මෙහිදී විවිධ බෝග නියැදි 41ක් එක්රැස් කර ගැනිණි.

**වගු අංක 2.1.5.2 : නාවලපිටිය ප්‍රදේශයෙන් බෝග ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම**

| බෝග කාණ්ඩය | නියැදි සංඛ්‍යාව | චාරිකා කළ ප්‍රදේශය |
|---|---|---|
| එළවළු | 16 | නාවලපිටිය |
| කුළු බඩු | 25 | |
| **එකතුව** | **41** | |

**ගවේෂණය 02 - මන්නාරම දිස්ත්‍රික්කය**

2012 මාර්තු 19 -22 දක්වා කාලයේදී ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සහායෙන් මන්නාරම දිස්ත්‍රික්කයෙන් ජනකප්ලාස්ම එක්රැස් කර ගන්නා ලදී. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීමෙන් පසු මෙය, මෙම ප්‍රදේශයේ සිදු කරන ලද ප්‍රථම ගවේෂණ චාරිකාවයි. මෙහිදී විවිධ බෝග නියැදි 64ක් එක්රැස් කර ගැනිණි.

**වගු අංක 2.1.5.3 : මන්නාරම දිස්ත්‍රික්කයෙන් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම**

| බෝග කාණ්ඩය | නියැදි සංඛ්‍යාව | චාරිකා කළ ප්‍රදේශ |
|---|---|---|
| වී | 01 | නනත්තන්, |
| රළු ධාන්‍ය | 02 | මුරුන්කන්, |
| එළවළු | 39 | පන්ඩිවිරිච්චන්, |
| ධාන්‍ය රනිල | 01 | පේසාලේ, කීරි, |
| තෙල් බෝග | 02 | වන්වියන්කුලම්, |
| කුළුබඩු | 14 | වේලන්කුලම්, |
| මුල් හා ආකන්ද බෝග | 03 | මඩු |
| පලතුරු බෝග | 02 | |
| **එකතුව** | **64** | |

**ගවේෂණය - 03 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

2012 මාර්තු 28 - 30 දක්වා කාලය තුළ 2012 වර්ෂයට අදාළව 2වන ගවේෂණය ද සිදු කෙරිණි. මෙහිදී, විවිධ බෝග නියැදි 102ක් එක්රැස් කර ගැනිණි.

**වගු අංක 2.1.5.4 : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම**

| බෝග කාණ්ඩය | නියැදි සංඛ්‍යාව | චාරිකා කළ ප්‍රදේශ |
|---|---|---|
| වී | 01 | මුල්ලිපොතාන, කන්තලේ, ගෝමරංකඩවල, පදවිය, ශ්‍රී පුර |
| රළු ධාන්‍ය | 09 | |
| එළවළු | 54 | |
| ධාන්‍ය රනිල | 01 | |
| කුළු බඩු | 16 | |
| මුල් හා ආකන්ද බෝග | 12 | |
| පලතුරු බෝග | 04 | |
| ඖෂධ පැළෑටි | 04 | |
| උක් | 04 | |
| **එකතුව** | **102** | |

**ගවේෂණය - 04 ගලහ ප්‍රදේශය**

2012 අගොස්තු 9වන දින නිලධාරීහු 3දෙනෙක් ගලහ ප්‍රදේශයේ ගවේෂණ චාරිකාවක නිරතව විවිධ බෝග නියැදි 34ක් එක්රැස් කර ගත්හ.

**වගු අංක 2.1.5.5 : ගලහ ප්‍රදේශයෙන් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම**

| බෝග කාණ්ඩය | නියැදි සංඛ්‍යාව | චාරිකා කළ ප්‍රදේශ |
|---|---|---|
| එළවළු | 18 | |
| කුළුබඩු | 16 | |
| **එකතුව** | **34** | |

**ගවේෂණය - 05 අම්පාර දිස්ත්‍රික්කය**

2012 සැප්තැම්බර් 24 – 26 දින අතර කාලයේදී අම්පාර දිස්ත්‍රික්කය තුළ වසර 7කට පසු ජනකප්ලාස්ම ගවේෂණයක් සිදු කෙරිණි. මෙහිදී විවිධ බෝග ජනකප්ලාස්ම 120ක් එක්රැස් කර ගැනිණි.

**වගු අංක 2.1.5.6 : අම්පාර දිස්ත්‍රික්කයෙන් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම**

| බෝග කාණ්ඩය | නියැදි සංඛ්‍යාව | චාරිකා කළ ප්‍රදේශ |
|---|---|---|
| රළු ධාන්‍ය | 19 | අම්පාර, දමන, ලාහුගල, පොතුවිල්, තිරුක් කෝවිල්, මහඔය, පදියතලාව |
| එළවළු | 67 | |
| ධාන්‍ය රනිල | 17 | |
| කුළු බඩු | 09 | |
| තෙල් බෝග | 05 | |
| ඖෂධ පැළෑටි | 03 | |
| **එකතුව** | **120** | |

**ගවේෂණය 06 - හඟුරන්කෙත ප්‍රදේශය**

නිලධාරීන් 2දෙනෙකුගෙන් සමන්විත ගවේෂණ කණ්ඩායමක් විවිධ බෝග නියැදි 33ක් එක්රැස් කර ගැනීමට සමත් විය.

**වගු අංක 2.1.5.7 : හඟුරන්කෙත ප්‍රදේශයෙන් බෝග එක්රැස් කිරීම**

| බෝග කාණ්ඩය | නියැදි සංඛ්‍යාව | චාරිකා කළ ප්‍රදේශ |
|---|---|---|
| රළු ධාන්‍ය | 11 | උනන්තැන්න, මාරස්සන |
| එළවළු | 15 | |
| ධාන්‍ය රනිල | 04 | |
| කුළු බඩු | 01 | |
| තෙල් බෝග | 02 | |
| **එකතුව** | **33** | |

## පර්යේෂණ ස්ථානවලින් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය ක්ෂේත්‍රයෙන් මෙන්ම පර්යේෂණ ස්ථානවලින්ද ජනකප්ලාස්ම එක්රැස් කිරීමේ වගකීම දරයි. විවිධ බෝගවල

ජනකප්ලාස්ම විශාල ප්‍රමාණයක් පර්යේෂණ ස්ථානවල නඩත්තු කෙරෙමින් තිබේ. එයට අමතරව, අභිජනන වැඩසටහන මගින් වැඩිදියුණු කර ඉදිරියට ගෙන එන ලද ආර (අභිජනන ආර) සංරක්ෂණය සඳහා එක්රැස් කිරීම අවශ්‍යය. නිර්දේශිත ප්‍රභේද සමහරක් මෙම මධ්‍යස්ථානයට ලැබී නොමැත. සංරක්ෂණය සහ බෝග වැඩිදියුණු කිරීමේදී අනාගතයේදී භාවිතා කිරීම සඳහා විවිධ මූලාශ්‍රවලින් විවිධ බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම අවශ්‍යය.

අභිජනන හා වෙනත් කටයුතු හේතුවෙන් පර්යේෂණ ස්ථානවල විවිධ බෝග ජනකප්ලාස්ම ප්‍රමාණය වර්ධනය වෙමින් පවතී. එමනිසා, වටිනා ජනකප්ලාස්ම අහිමිවී යා නොදී පර්යේෂණ ස්ථානවලින් නිරතුරුව එක්රැස් කර ගැනීම සුදුසුය. පර්යේෂණ ස්ථානවලින් (විශේෂයෙන්ම, උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි පර්යේෂණ ස්ථානවලින්) පසුගිය වසර ගණනාවක් තුළ ජනකප්ලාස්ම එක්රැස් කර ගෙන නොමැත.

**පර්යේෂණ ස්ථානවලින් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම (2012 සැප්.5 -7 )**

2012 සැප්තැම්බර් 5 – 7 අතර කාලයේදී බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ එහි උප මධ්‍යස්ථාන වෙත ගවේෂණ චාරිකාවක් කරමින් වැඩසටහන ආරම්භ කරන ලදී.

මෙහිදී පහත සඳහන් පර්යේෂණ ස්ථාන ආවරණය කරන ලදී.

- වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ
- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,මහ ඉලුප්පල්ලම
- කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, වව්නියාව
- කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය
- කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, තින්නවේලි

**වගු අංක 2.1.5.8 : පර්යේෂණ ස්ථානවලින් එක්රැස් කරගත් ජනකප්ලාස්ම ප්‍රමාණය (2012 සැප්තැම්බර් 5 -7)**

| පර්යේෂණ ස්ථානය | එක්රැස් කරගත් ජනකප්ලාස්ම සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වී | රළු ධාන්‍ය | රනිල | තෙල් බෝග | කුළුබඩු | එළවළු | පලතුරු බෝග | වෙනත් |
| වී පර්. හා සං. ආයතනය, බතලගොඩ | 07 | - | - | - | - | - | - | - |
| ක්ෂේ. බෝ. පර්. හා සං. ආයතනය, මහඉලුප්පල්ලම | | 01 | 46 | 02 | 12 | 01 | 02 | - |
| කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, වව්නියාව | 02 | - | - | - | - | 09 | 01 | 01 |

| පර්යේෂණ ස්ථානය | එක්රැස් කරගත් ජනකප්ලාස්ම සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වී | රඵ ධාන්‍ය | රනිල | තෙල් බෝග | කුළුබඩු | එළවළු | පලතුරු බෝග | වෙනත් |
| ක. කෘ. පර්. හා සං. ම, කිලිනොච්චිය | 03 | 02 | 01 | - | - | 03 | - | - |
| කෘ. පර්. ස්.,තින්නවෙලි | - | - | - | - | 04 | 11 | 11 | - |
| **එකතුව** | **12** | **03** | **47** | **02** | **16** | **24** | **14** | **01** |
| **මුළු එකතුව** | **119** | | | | | | | |

**පර්යේෂණ ස්ථානවලින් බෝග ජනකප්ලාස්ම එක්රැස් කිරීම (2012 ඔක්තෝබර් 10 -12 )**

2012 ඔක්තෝබර් 10 -12 දක්වා කාලය තුළ ගිරාදුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, මදුරුකැටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, අඟුණකොළපැලැස්ස ධාන්‍ය රනිල හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ බෝඹුවල කලාපීය වී පර්යේෂණ මධ්‍යස්ථානය හා අම්බලන්තොට, ලබුදූව සහ බෙන්තොට පිහිටි එහි උප මධ්‍යස්ථාන වෙත ගවේෂණ චාරිකා සිදු කෙරිණි.

**වගු අංක 2.1.5.9 : පර්යේෂණ ස්ථානවලින් එක්රැස් කරගත් ජනකප්ලාස්ම ප්‍රමාණය**

| පර්යේෂණ ස්ථානය | එක්රැස් කරගත් ජනකප්ලාස්ම ප්‍රමාණය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වී | රඵ ධාන්‍ය | රනිල | තෙල් බෝග | කුළුබඩු | එළවළු | පලතුරු බෝග | වෙනත් |
| කෘ. පර්. ස්, ගිරාදුරුකෝට්ටේ | - | 03 | 04 | 13 | - | 10 | - | - |
| කෘ. පර්. ස්, මදුරුකැටිය | 01 | 01 | - | - | 01 | 05 | - | - |
| ධා. ර. හා තෙ. බෝ. පර් හා සං .ම. අඟුණකොළපැලැස්ස | - | - | - | - | - | 42 | - | - |
| පල. බෝ. පර්. හා සං. ම, හොරණ | - | - | - | - | 02 | 06 | - | - |
| වී. පර්. ම. ,බෝඹුවල | 11 | - | - | - | - | - | - | - |
| වී. පර්. ස්. , අම්බලන්තොට | 15 | - | - | - | - | - | - | - |
| වී. පර්. ස්., ලබුදූව | 12 | - | - | - | - | - | - | - |
| වී. පර්. ස්., බෙන්තොට | 02 | - | - | - | - | - | - | - |
| **මුළු එකතුව** | **128** | | | | | | | |

**පර්යේෂණ ස්ථානවලින් ලැබුණු බෝග ජනකප්ලාස්ම**

2012 දොසැම්බර් 3දින බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් බෝංචි නියැදි 173ක් ලැබුණි.

**ක්ෂේත්‍ර දත්ත**

ක්ෂේත්‍ර දත්ත ප්‍රවේශ 200ක් (ජනකප්ලාස්ම නියැදි අංක 012779 සිට අංක 012979 දක්වා) පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ දත්ත කළමනාකරණ ඒකකය වෙත යවන ලදී.

**බීජ සංරක්ෂණය**

2012 වර්ෂයේදී නව ජනකප්ලාස්ම එකතුන් 73ක් සහ ගුණනය කළ නියැදි 171ක් ජාන බැංකුවේ සංරක්ෂණය කරන ලදී. වසර අවසානය වන විට ජාන බැංකුවේ පැවතිජනකප්ලාස්ම එකතුන් සංඛ්‍යාව 12,980කි. ජාන බැංකු සංරක්ෂිත පිළිබඳ විස්තර වගු අංක 2.1.5.10හි දැක්වේ.

වගු අංක **2.1.5.10 :** **ජාන බැංකු සංරක්ෂිත පිළිබඳ විස්තර**

| **බෝග කාණ්ඩය** | **ජනකප්ලාස්ම එකතුන් සංඛ්‍යාව** |
|---|---|
| වී සහ ආශ්‍රිත විශේෂ | 4541 |
| වෙනත් ධාන්‍ය හා ආශ්‍රිත විශේෂ | 1657 |
| ධාන්‍ය රනිල හා ආශ්‍රිත විශේෂ | 2062 |
| එළවළු රනිල | 1302 |
| සොලනේසියේ කුලයේ එළවළු, කුළු බඩු සහ ආශ්‍රිත විශේෂ | 1221 |
| කුකුර්බිට් කුලයේ එළවළු | 785 |
| බ්‍රැසිකේසියේ කුලයේ එළවළු | 31 |
| ලූනු | 20 |
| වෙනත් එළවළු | 371 |
| කොළ එළවළු | 167 |
| මුල් හා ආකන්ද බෝග | 09 |
| අඹ සහ ආශ්‍රිත විශේෂ | 124 |
| තෙල් බෝග | 434 |
| කෙඳි සහිත බෝග | 66 |
| ඖෂධ පැළෑටි | 27 |
| පලතුරු | 163 |
| **එකතුව** | **12,980** |

## ජනකප්ලාස්ම උපයෝජනය

විවිධ බෝග ජනකප්ලාස්ම එකතුන් 1300ක් පමණ පර්යේෂණ කටයුතු සඳහා බෙදා දෙන ලදී. එමෙන්ම ජනකප්ලාස්ම එකතුන් 553ක් ගොවීන් අතර බෙදා හරින ලදී.

## බීජවල ජීව්‍යතාව පිළිබඳ පර්යේෂණ

1989 – 2007 අතර කාලයේදී ජාන බැංකුවට එක්රැස් කරනු ලැබූ දඹල, තල සහ අබ ජනකප්ලාස්මවල ජීව්‍යතාව නිරීක්ෂණ කිරීම පිණිස පර්යේෂණ මාලාවක් පවත්වන ලදී. එකතුන් 1013ක ජීව්‍යතාව පරීක්ෂා කර බලන ලදී. අබ සහ තල එකතුන්හි ජීව්‍යතාව මුල් ප්‍රරෝහණ මට්ටමින්ම පැවති බව ජීවී එකතුව සම්බන්ධයෙන් කළ පරීක්ෂණ ප්‍රතිඵල මගින් අනාවරණය විය. පරීක්ෂා කර බලන ලද දඹල එකතුන් තුළින් අනාවරණය වූයේ 1989 -1991 අතර කාලයේදී සංරක්ෂණය කරන ලද නියැදිවල ජීව්‍යතාව 85%කට ද වඩා පහත වැටී තිබූ බවයි. කෙසේ වුවද, 1991 වර්ෂයට පසුව සංරක්ෂණය කරන ලද එකතුන්හි ජීව්‍යතාව එලෙසින්ම පැවතිණි.

## ජනකප්ලාස්ම ඇගයීම සහ ගුණනය

පහත සඳහන් ජනකප්ලාස්ම ගුණනය කර සංරක්ෂණ සඳහා ජාන බැංකුවට බාරදෙන ලදී. තක්කාලි (එකතුන් 53), වම්බටු (එකතුන් 44), මෑ (එකතුන් 11), වැටකොළු (එකතුන් 5), දඹල (එකතුන් 7), බණ්ඩක්කා (එකතුන් 34), තම්පලා (එකතුන් 22), කුරක්කන් (එකතුන් 8), බජිරි (එකතුන් 6), හීන් මෙනේරි (එකතුන් 2), තණ හාල් (එකතුන් 2), අමු (එකතුන් 3), වී (එකතුන් 4), හාල්මැස්සන් දඹල (එකතුන් 7), කොස් දඹල, (එකතුන් 7), අවර (එකතුන් 15), කොත්තු අවර (එකතුන් 1), අල බෝංචි (එකතුන් 1).

රතුලූනු ජනකප්ලාස්ම එකතුන් 23ක් ගුණනය කරන ලද අතර බලාපොරොත්තු තැබිය හැකි එකතුන් හඳුනාගැනීම සඳහා මෙම එකතුන් වියළි කලාපයේදී අත්හදා බලනු ඇත.

## පූර්ව අභිජනනය

තුඹ කරවිල සහ කරවිල මුහුන් කිරීමෙන් ලද F1 බීජ ජාන බැංකුවට ඉදිරිපත් කරන ලදී. මෙම මුහුන්වල බීජ සුප්ත වන අතර ප්‍රරෝහණය සඳහා මාස 6ක් පමණ ගන්නා බව පෙන්නුම් කළේය. බීජ සමහරක් ප්‍රරෝහණය වූ අතර බීජ පැළ වැඩිදුරටත් අධ්‍යයනය සඳහා රෝපණය කරන ලදී.

## කෙසෙල් ක්ෂේත්‍ර ජාන බැංකුව ස්ථාපිත කිරීම

ගොවි ක්ෂේත්‍රවලින් එක්රැස් කර ගන්නා ලද කෙසෙල් ජනකප්ලාස්ම එකතුන් 110ක් ලක්ෂණීකරණ හා ඇගයීම් කටයුතු සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපිත කර ඇත.

## ජෛව තාක්ෂණය

### දෙමුහුම් එළවලු ප්‍රභේදවල (තක්කාලි සහ වම්බටු) ජානමය පවිත්‍රතාව පරීක්ෂා කර බැලීම

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ අණුක සලකුණු තාක්ෂණය යොදා ගනිමින් වාණිජමය වශයෙන් පවතින දේශීයව බිහිකරණ ලද දෙමුහුම් ප්‍රභේදවල පවිත්‍රතාව පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමයි. මහේෂි නැමැති දෙමුහුන් තක්කාලි ප්‍රභේදයේ පවිත්‍රතාව සනාථ කර ගැනීම සඳහා SSR මූලික 2ක් හඳුනා ගන්නා ලදී. මෙය තව දුරටත් සනාථ කර ගැනීම අවශ්‍යය.

### ජාන බැංකුවේ සංරක්ෂණය කර ඇති බණ්ඩක්කා ජනකප්ලාස්ම එකතුන්වල රූපීය හා අණුක ලක්ෂණීකරණය

සංරක්ෂණය කරන ලද බණ්ඩක්කා එකතුන් 13කට අදාළ රූපීය ලක්ෂණීකරණ දත්ත එක් රැස් කර ගැනිණි.

මෙම දත්ත පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ දත්ත මූලයට ඇතුළත් කෙරෙනු ඇත. RAPD මූලික 6ක් යොදා ගනිමින් අණුක ලක්ෂණීකරණ දත්ත එක් රැස් කර ගැනිණි.

**නලස්ථ සහ පැළෑටි ගෘහ තත්ත්වයන් යටතේ ඩයස්කොරියා, බතල, අර්තාපල් සහ කෙසෙල් විශේෂවල ජනකප්ලාස්ම සංරක්ෂණය**

මෙම අධ්‍යනයේ අරමුණ නලස්ථ සහ පැළෑටි ගෘහ තත්ත්වයන් යටතේ බෝග ජනකප්ලාස්ම සංරක්ෂණය කර නඩත්තු කිරීමයි.

ඩයස්කොරියා විශේෂවල ජනකප්ලාස්ම එකතුන් 70ක් විද්‍යාගාරයේ නලස්ථ තත්ත්ව යටතේ සහ පැළෑටි ගෘහයේ බඳුන්ගතව නඩත්තු කෙරෙමින් පවතී. බතල එකතුන් 109ක් විද්‍යාගාරයේ නලස්ථ තත්ත්වය යටතේ සහ එකතුන් 114ක් පැළෑටි ගෘහයේ බඳුන්ගතව සංරක්ෂණය කෙරේ. අර්තාපල් එකතුන් 15ක් ද නලස්ථ ස්වරූපයෙන් නඩත්තු කෙරේ.

## පැළෑටි ජාන සම්පත් තොරතුරු කළමනාකරණ ක්‍රමය

### පැළෑටි ජාන සම්පත් දත්ත මූලය

දත්ත මූලයට දත්ත එකතු කිරීම අඛණ්ඩව සිදු කෙරිණි. දැනට ජනකප්ලාස්ම එකතුන් 12,979ක් පිළිබඳ ක්ෂේත්‍ර දත්ත මෙම දත්ත මූලයෙහි ඇතුළත්ය. වී, බඩ ඉරිඟු, කුරක්කන්, තණ හාල්, ඉඳල් ඉරිඟු, කව්පි, මුං, උඳු, සෝයා, තෝර පරිප්පු, රටකජු, බෝංචි, දඹල, මෑ, වම්බටු, තක්කාලි, මාළු මිරිස්, බණ්ඩක්කා, වට්ටක්කා, පතෝල, කරවිල, තම්පලා, වැටකොළු, අබ සහ තල ඇතුළු බෝග 25ක ලක්ෂණීකරණ දත්ත මෙම දත්ත මූලයට ඇතුළත් කෙරිණි.

**ගෝලීය ක්‍රියාකාරී සැලැස්මෙහි ජාතික තොරතුරු හුවමාරු යාන්ත්‍රණ දත්ත මූලය**

මෙම දත්ත මූලය වර්තමානයේදී පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ නඩත්තු කෙරෙන අතර පරිශීලකයින්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් වැඩිදියුණු කර යථාවත් කරන ලදී.

### දැනුවත් කිරීමේ වැඩසටහන

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ අනෙකුත් ඒකකවල සහාය ඇතිව ගවේෂණ ඒකකය විසින් පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන් 50ක් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී. පශ්චාත් උපාධි අපේක්ෂක හා උපාධි අපේක්ෂක විශ්වවිද්‍යාල සිසුන් කණ්ඩායම් 10ක් ද මෙම මධ්‍යස්ථානයේ සිවු මාසික විශේෂ ප්‍රායෝගික පුහුණු වැඩසටහනට සහභාගි වූහ. එයට අමතරව ගුරුවරුන් කණ්ඩායම් 6ක්, ගොවි කණ්ඩායම් 8ක් සහ විවිධ ආයතනවලින් පැමිණි තවත් කණ්ඩායම් 21ක් ගවේෂණ ඒකකය මඟින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගි වූහ.

## 2013 වර්ෂය සඳහා සැලැස්ම

- පැළෑටි ජාන සම්පත් ගවේෂණය හා එක්රැස් කිරීම අඛණ්ඩව සිදු කිරීම
- ගවේෂණ හා එක්රැස් කිරීම් ඒකකයෙන් ලද බීජ ආදිය සැකසුම් කිරීම සහ සංරක්ෂණය
- බහු වාර්ෂික බෝගවල ජනකප්ලාස්ම නඩත්තුව
- පැළෑටි ජාන සම්පත් නලස්ථව සංරක්ෂණය කිරීම
- ජනකප්ලාස්ම හුවමාරුව අඛණ්ඩව සිදු කිරීම
- සංරක්ෂිත ජනකප්ලාස්මවල ජීව්‍යතාව පිළිබඳ පරීක්ෂණ අඛණ්ඩව සිදු කිරීම
- පැළෑටි ජාන සම්පත් ලක්ෂණීකරණය, ගුණනය සහ සංරක්ෂිත ජාන සම්පත් ගුණනය

- පැළෑටි ජාන සම්පත් පිළිබඳ දත්ත මූල කළමනාකරණය අඛණ්ඩව සිදු කිරීම
- පූර්ව අභිජනන කටයුතු අඛණ්ඩව සිදු කිරීම
- පැළෑටි ජාන සම්පත්වල අණුක ලක්ෂණීකරණය සහ විවිධ බෝග විශේෂවල ඇති අපේක්ෂිත ලක්ෂණවලට අදාළ ජාන හඳුනා ගැනීම
- පැළෑටි ජාන සම්පත්වල ඩීඑන්ඒ ඇඟිලි සලකුණු කිරීම
- අණුක තාක්ෂණික ක්‍රම භාවිත කර ප්‍රභේදවල ජානමය පවිත්‍රතාව පරීක්ෂා කර බැලීම
- පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 10 |
| පරිපාලන නිලධාරි | 01 |
| වැඩසටහන් සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 03 |
| පර්යේෂණ සහකාර | 04 |
| පර්යේෂණ උප සහකාර | 06 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 08 |
| ගබඩා භාරකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 04 |
| ලොරි සහායක | 01 |
| ට්‍රැක්ටර් රියදුරු | 01 |
| විදුලි ශිල්පී | 03 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| මුරකරු | 04 |
| සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| කම්කරු (II වන ශ්‍රේණිය) | 11 |
| කම්කරු (III වන ශ්‍රේණිය) | 05 |
| කම්කරු (කොන්ත්‍රාත් මූලික) | 22 |
| **එකතුව** | **90** |

## 2.2 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය

අස්වැන්න හා නිමැවුමේ තත්ත්වය වර්ධනය කිරීම සහ ඒකක නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා වඩාත්ම වැදගත් යෙදවුම් වන්නේ උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍යයි. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය බීජ හා රෝපණ ද්‍රව්‍ය දිවයින පුරාම ඵලදායීව හා කාර්යක්ෂමව නිෂ්පාදනය කිරීමේ, බෙදා හැරීමේ සහ අලෙවි කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු, අර්තාපල් යන දේශීය නිර්දේශිත බෝග ප්‍රභේදවල මූලික බීජ සහ පලතුරු හා එළවළුවල උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදා හැරීම සහ අලෙවි කිරීම මෙම මධ්‍යස්ථානය විසින් මුහුණ දෙන ප්‍රධාන අභියෝග වේ. ඉහත දැක්වූ පරිදි මූලික බීජ හා සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය යටතේ බීජ ගොවිපළ 19ක් වේ. කෙසේ වුවද, දිවයින පුරා විසිරී ඇති ප්‍රාදේශීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) ඒකක මගින් තෝරාගත් කොන්ත්‍රාත් වගාකරුවන් හරහා වී හා වෙනත් ක්ෂේත්‍ර බෝගවල සහතික කළ බීජ සහ එළවළු බෝගවල සම්මත බීජ නිෂ්පාදනය කරනු ලැබේ. මෙම මධ්‍යස්ථානය වර්තමානයේ ප්‍රාදේශීය මට්ටමින් යථෝක්ත සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) මගින් අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන), නියෝජ්‍ය අධ්‍යක්ෂ (වී), නියෝජ්‍ය අධ්‍යක්ෂ (එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග), නියෝජ්‍ය අධ්‍යක්ෂ (උද්‍යාන බෝග) සහ ප්‍රධාන කාර්යාලයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂගේ මග පෙන්වීම සහ මෙහෙයවීම යටතේ තම කාර්යයන් ඉටු කරයි. මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවට තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයුමක් සහතික කිරීමයි. එමෙන්ම මෙමගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වන්නේ රජයේ ගොවිපළවල මූලික සහ සහතික කළ/ සම්මත බීජ සහ සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, බීජ නිෂ්පාදකයින්ට මූලික බීජ සැපයීම, කොන්ත්‍රාත් වගාකරුවන් හරහා සහතික කළ බීජ ගුණනය කර වාණිජමය වගාකරුවන්ට සැපයීම, රජයේ ගොවිපළ කළමනාකරණය, බීජ ව්‍යාපාර සංවර්ධනය සහ සම්බන්ධීකරණය, ආරක්ෂිත බීජ තොග පවත්වාගෙන යාම සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයුම සම්බන්ධීකරණය කිරීමයි.

**අරමුණු :**

- මූලික සහ සහතික කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, සැකසුම් කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සහතික කිරීම
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තයක් බිහි කිරීම සඳහා තාක්ෂණික සහාය සහ සහයෝගය ලබාදීම
- පාර්ශ්වකරුවන්ට අවශ්‍ය පුහුණු පහසුකම් සහ බීජ හා රෝපණ ද්‍රව්‍යවල සියලුම අංශ පිළිබඳ තොරතුරු සැපයීම
- මෙරට බීජ හා රෝපණ ද්‍රව්‍ය සුරක්ෂිතතාව ජය ගැනීම

මෙම මධ්‍යස්ථානයේ අරමුණු ජය ගැනීම සඳහා 2011/12 මහ සහ 2012 යල කන්න ඇතුළත් වූ 2012 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු ඉටු කෙරිණි.

# අයවැය

වගු අංක 2.2.1: වාර්ෂික අයවැය - 2012 (රු. මිලියන)

| වැය ශීර්ෂය/ ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 40.9 | 33.7 | 82 |
| පුනරාවර්තන | 51.4 | 44.3 | 86 |
| බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීම | 432.0 | 421.5 | 97 |
| ප්‍රජා මූලික බීජ නිෂ්පාදනය | 6.0 | 4.7 | 78 |
| බඩඉරිඟු දෙමුහුම් බීජ නිෂ්පාදනය | 0.78 | 0.65 | 83 |
| පරන්තන් හා මුරුන්කන්හි රජයේ බීජ ගොවිපළ යළි ක්‍රියාකාරී කිරීම (ජපාන අන්තර්ජාතික සහයෝගිතා එජන්සිය) | 77.21 | 62.5 | 80 |
| කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන | 236.0 | 212.7 | 91 |
| **එකතුව** | **844.29** | **783.1** | **92** |

# ප්‍රගතිය

## බිත්තර වී නිෂ්පාදනය සහ සැපයුම

**රජයේ බීජ ගොවිපළවල මූලික බිත්තර වී සහ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය - 2012**

නිර්දේශිත වී ප්‍රභේද 25ක අත්තිවාරම් බිත්තර වී සහ ලියාපදිංචි බිත්තර වී නිෂ්පාදනය කරන ලදී. බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානය සහ ලබුදූව කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය විසින් සපයන ලද අභිජනන බීජ යොදා ගනිමින් අත්තිවාරම් බීජ නිෂ්පාදනය කරන ලදී. 2012 වර්ෂයේ ලියාපදිංචි කළ බිත්තර වී නිෂ්පාදනය බු. 126,273ක් (මෙ.ටො. 25,88.6) වූ අතර එය 2011 වර්ෂයට සාපේක්ෂව 12%ක වර්ධනයකි. මූලික බිත්තර වී නිෂ්පාදනය සඳහා යොදා නොගත් කුඹුරු උපයෝගී කර ගනිමින් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ බීජ ගොවිපළවල සහතික කළ බිත්තර වී ද නිපදවිණි. මූලික බිත්තර වී නිෂ්පාදන වැඩසටහනේදී තත්ත්වයෙන් බාල බවට වර්ගීකරණය කරන ලද ප්‍රමාණය ද සමග 2012 වර්ෂයේදී ගොවිපළවල නිපදවන ලද සහතික කළ බිත්තර වී ප්‍රමාණය බු. 9,488ක් (මෙ.ටො. 194.5) විය.

වගු අංක 2.2.2: 2012 වර්ෂයේ රජයේ බීජ ගොවිපළවල මූලික බිත්තර වී නිෂ්පාදනය

| ගොවිපළ | 2011/12 මහ | | | 2012 යල | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අත්තිවාරම් බීජ නිෂ්. | ලියාපදිංචි කළ බීජ නිෂ්. | සහතික කළ බීජ නිෂ්. | අත්තිවාරම් බීජ නිෂ්. | ලියාපදිංචි කළ බීජ නිෂ්. | සහතික කළ බීජ නිෂ්. | අත්තිවාරම් බීජ නිෂ්. | ලියාපදිංචි කළ බීජ නිෂ්. | සහතික කළ බීජ නිෂ්. |
| අලුත්තරම | 14.23 | 114.23 | 13.37 | 8.84 | 100.16 | 33.83 | **23.07** | **214.39** | **47.20** |
| මල්වත්ත | 10.48 | 190.61 | 7.18 | 1.89 | 123.88 | 18.86 | **12.37** | **314.49** | **26.04** |
| පොළොන්නරුව | 15.97 | 431.67 | 0.39 | 19.21 | 255.59 | 0 | **35.18** | **687.26** | **0.39** |
| බටඅත | 0 | 22.84 | 5.78 | 4.72 | 49.0 | 6.97 | **4.72** | **71.84** | **12.75** |
| අම්බලන්තොට | 2.07 | 93.40 | 14.27 | 0 | 0 | 0 | **2.07** | **93.40** | **14.27** |
| මහ ඉලුප්පල්ලම | 18.90 | 420.76 | 25.83 | 10.68 | 92.56 | 0 | **29.58** | **513.32** | **25.83** |
| කන්තලේ | 9.14 | 210.0 | 0 | 10.25 | 218.53 | 0.1 | **19.39** | **428.53** | **0.1** |
| මුරුන්කන් | 1.52 | 107.99 | 7.75 | 0 | 0 | 0 | **1.52** | **107.99** | **7.75** |
| පරන්තන් | 5.84 | 98.40 | 8.02 | 3.81 | 41.45 | 0 | **9.65** | **139.85** | **8.02** |
| කරදියන් ආරු | 0 | 0 | 0 | 0 | 17.53 | 52.15 | **0** | **17.53** | **52.15** |
| එකතුව (මෙ.ටො.) | **78.15** | **1689.9** | **82.59** | **59.4** | **898.7** | **111.91** | **137.55** | **2588.6** | **194.5** |
| එකතුව (බු.) | **3812** | **82434** | **4029** | **2898** | **43839** | **5459** | **6710** | **126273** | **9488** |

## කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහන මගින් සහතික කළ බිත්තර වී නිෂ්පාදනය - 2012

සහතික කරන ලද බිත්තර වී නිෂ්පාදනය කරන ලද්දේ කොන්ත්‍රාත් වගාකරුවන් විසිනි. මෙම වැඩසටහන යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට 2012 වර්ෂය තුළ බු. 90,000ක් මිලදී ගැනීමේ ඉලක්කයක් තිබිණි (2011/12 මහ බු. 60,000 සහ 2012 යල බු. 30,000). 2011/12 මහ කන්නයේදී හිතකර කාලගුණික තත්ත්වයක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් සාපේක්ෂ ඉහළ මිල හේතුවෙන් සහතික කළ බිත්තර වී බු. 60,366ක් (මෙ.ටො.1,237.5) මිලදී ගැනීමට හැකි වූ අතර 2012 යල කන්නයේදී දිවයින පුරා නියඟ තත්ත්වයන් හේතුවෙන් සහතික කළ බිත්තර වී බු. 3,917ක් පමණක් මිලදී ගැනීමට හැකිවිය. වගු අංක 2.2.3 (i)හි දක්වා ඇති අන්දමට සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාප මගින් මිලදී ගන්නා ලද මුළු වාර්ෂික සහතික කළ බිත්තර වී ප්‍රමාණය බු. 64,283ක් වූ අතර එය ඉලක්කයෙන් 71%ක් ජය ගැනීමකි.

වගු අංක 2.2.3 (i) : කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ මිලදී ගන්නා ලද සහතික කළ බිත්තර වී ප්‍රමාණය

| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය | මිලදී ගන්නා ලද ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | 2011/12 මහ (මෙ.ටො.) | 2012 යල (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) | එකතුව (බු.) |
| අම්පාර | 168.1 | 0 | 168.1 | 8,200 |
| අලුත්තරම | 129.9 | 27.4 | 157.3 | 7,673 |
| බටඅත | 174.2 | 0 | 174.2 | 8,498 |
| පොළොන්නරුව | 40.8 | 0 | 40.8 | 1,990 |
| කන්තලේ | 92.1 | 0 | 92.1 | 4,493 |
| වවුනියාව | 0 | 4.8 | 4.8 | 234 |
| කිලිනොච්චිය | 33.3 | 27.2 | 60.5 | 2,951 |
| මහ ඉලුප්පල්ලම | 156.2 | 3.4 | 159.6 | 7,785 |
| නිකවැරටිය | 97.7 | 10.4 | 108.1 | 5,273 |
| පැල්වෙහෙර | 345.2 | 7.1 | 352.3 | 17,185 |
| **එකතුව** | **මෙ.ටො.1237.5** | **මෙ.ටො.80.3** | **මෙ.ටො.1317.8** | |
| | **බු. 60,366** | **බු. 3,917** | | **බු. 64,283** |

## හදිසි අවස්ථාවන්හිදී බිත්තර වී සැපයීමේ වැඩසටහන - 2012

2012 යල කන්නයේදී නියඟය හේතුවෙන් හානි ඇති වූ ගොවීන්ට සහනයක් වශයෙන් 2012/13 මහ කන්නය සඳහා බිත්තර වී බු. 289,666ක් සැපයීමේ විශේෂ වැඩසටහන අනුව, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය එම වැඩසටහන වෙනුවෙන් හදිසි අවස්ථා බිත්තර වී බු. 84,416ක්, ලියාපදිංචි බිත්තර වී බු. 42,847ක් සහ සහතික කළ බිත්තර වී බු. 34,497ක් වශයෙන් බිත්තර වී බු. 161,760ක් සපයමින් දායක විය. අවශ්‍යතාවෙන් ඉතිරි ප්‍රමාණය පෞද්ගලික අංශය විසින් සපයන ලදී.

වගු අංක 2.2.3 (ii) : මිලදී ගන්නා ලද හදිසි අවස්ථා බිත්තර වී ප්‍රමාණය - 2012

| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය | මිලදී ගන්නා ලද ප්‍රමාණය | | |
|---|---|---|---|
| | 2012 යල (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) | එකතුව (බු.) |
| අම්පාර | 291.5 | 291.5 | 14,218 |
| අලුත්තරම | 189.1 | 189.1 | 9,224 |
| පොළොන්නරුව | 319.6 | 319.6 | 15,590 |
| කන්තලේ | 558.9 | 558.9 | 27,104 |

| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය | මිලදී ගන්නා ලද ප්‍රමාණය | | |
|---|---|---|---|
| | **2012 යල (මෙ.ටො.)** | **එකතුව (මෙ.ටො.)** | **එකතුව (බු.)** |
| වවුනියාව | 104.8 | 104.8 | 5,114 |
| කිලිනොච්චිය | 42.9 | 42.9 | 2,094 |
| මහ ඉලුප්පල්ලම | 84.9 | 84.9 | 4,142 |
| නිකවැරටිය | 80.3 | 80.3 | 3,917 |
| පැල්වෙහෙර | 61.8 | 61.8 | 3,013 |
| **එකතුව** | **1,733.8** | **1,733.8** | **84,416** |

වාණිජමය වශයෙන් සිදු කරන වගාවන්හිදී උසස් තත්ත්වයේ බිත්තර වී භාවිතය වැඩි කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය පෞද්ගලික අංශයේ ආයතන ඇතුළු ආයතන රැසක සහභාගිත්වයෙන් උසස් තත්ත්වයේ බිත්තර වී නිපදවීමේ සහයෝගීතාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ, අදාළ ආයතනවලට ලියාපදිංචි බිත්තර වී නිකුත් කරන ලදී. එයින් ඇති වූ වගාවන් සහ බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය විසින් සහතික කරන ලදී.

එමෙන්ම, උසස් තත්ත්වයේ බිත්තර වී නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා ද්විතියික බිත්තර වී නිෂ්පාදන වැඩසටහන් යටතේ ගොවීන්ට ලියාපදිංචි කළ බිත්තර වී ද නිකුත් කරන ලදී.

රාජ්‍ය සහ පෞද්ගලික අංශවල විවිධ ආයතන විසින් නිපදවන ලද සහතික කරන ලද බීජ ප්‍රමාණයන් වගු අංක 2.2.4හි දැක්වේ. සමහර සමාගම් තමන්ගේම තත්ත්ව පාලන ක්‍රම යෙදා ගත් හෙයින් නිල බීජ සහතිකකරණ වැඩසටහනට සහභාගි නොවූ අතර පෞද්ගලික අංශය මගින් නිපදවන ලද සත්‍ය බීජ ප්‍රමාණය දක්වන ලද ප්‍රමාණයට වඩා වැඩිවිය. 2012 වර්ෂයේදී නිල සහතිකකරණ වැඩසටහන යටතේ නිපදවන ලද සහතික කරන ලද බිත්තර වී ප්‍රමාණය මෙ.ටො. 14,523ක් (බු. 708,709) වූ අතර එය මෙරට මුළු බිත්තර වී අවශ්‍යතාවෙන් 12%කට සමානය. කෙසේ වුවද, හදිසි අවස්ථා බිත්තර වී සැපයුමත් සමග වාණිජමය වී වගාව සඳහා සපයන ලද මුළු බිත්තර වී ප්‍රමාණය බු. 911,564ක් වූ අතර එය දිවයිනෙහි මුළු අවශ්‍යතාවෙන් 15.43%කි. ජාතික අවශ්‍යතාවෙන් 15% ඉක්මවා සහතික කළ බිත්තර වී සැපයීමට හැකිවීම සතුටුදායක තත්ත්වයක් වශයෙන් සැලකේ.

## 2.2.4: 2012 වර්ෂයේ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය පිළිබඳ සහයෝගිතා වැඩසටහන

| ආයතනය | 2011/12 මහ | | 2012 යල | | 2012 වර්ෂය | | නිෂ්පාදනය | |
|---|---|---|---|---|---|---|---|---|
| | කෘෂි.දෙපා විසින් නිකුත් කළ ලියාපදිංචි බිත්තර වී ප්‍රමාණය (මෙ.ටො.) | සහතික කළ වගා බිම් ප්‍රමාණය (අක්.) | කෘෂි.දෙපා විසින් නිකුත් කළ ලියාපදිංචි බිත්තර වී ප්‍රමාණය (මෙ.ටො. | සහතික කළ වගා බිම් ප්‍රමාණය (අක්.) | කෘෂි.දෙපා. විසින් නිකුත් කළ ලියාපදිංචි බිත්තර වී ප්‍රමාණය (මෙ.ටො | සහතික කළ වගා බිම් ප්‍රමාණය (අක්.) | මෙ.ටො | බුසල් |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 78.5 | 1916 | 13.65 | 333 | 92.2 | 2249 | 1317.8 | 64283 |
| පළාත් සභා | 128.5 | 1512 | 34.4 | 598 | 162.9 | 2110 | 2970 | 144895 |
| අන්තර් පළාත් | 36.5 | 430 | 27.1 | 471 | 63.6 | 901 | 1090 | 53200 |
| ගොවිජන සේවා | 25.6 | 301 | 1.0 | 17 | 26.6 | 318 | 508 | 24798 |
| මහවැලි | 14.0 | 165 | 2.5 | 43 | 16.5 | 208 | 305 | 14919 |
| සමුපකාර සමිති | 7.6 | 89 | 6.9 | 120 | 14.5 | 209 | 244 | 11951 |
| ගොවි සංවිධාන | 106.5 | 1253 | 74.4 | 1293 | 180.9 | 2546 | 3115 | 151980 |
| එක් එක් ගොවීන් | 150.6 | 1765 | 61.6 | 1070 | 212.2 | 2835 | 3772 | 184042 |
| පෞද්ගලික සමාගම් | 26.6 | 313 | 37.1 | 645 | 63.7 | 958 | 1041 | 50828 |
| වෙනත් | 7.62 | 90 | 0.92 | 16 | 8.54 | 106 | 160 | 7813 |
| **එකතුව** | **582.0** | **7834** | **259.5** | **4606** | **841.5** | **12440** | **14523** | **708709** |

## බිත්තර වී නිකුත් කිරීම

2012 වර්ෂයේ බීජ නිෂ්පාදනය සහ වාණිජමය වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේනතුව විසින් නිකුත් කරන ලද මුළු බිත්තර වී ප්‍රමාණය වගු අංක 2.2.5හි දැක්වේ. පසුගිය කන්නයේ අභිජනන බීජවලින් නිපදවන ලද අත්තිවාරම් බීජ රජයේ බීජ ගොවිපළවල ලියාපදිංචි කළ බීජ නිපදවීම පිණිස යොදා ගන්නා ලදී.

සහතික කළ බීජ නිපදවීම සඳහා කොන්ත්‍රාත් වගාකරුවන්ට සහ පෞද්ගලික අංශයේ ආයතන ඇතුළු පෞද්ගලික බීජ වගාකරුවන්ට ලියාපදිංචි බීජ සපයන ලදී. 2012 වර්ෂයේ දී මුළු ලියාපදිංචි බීජ සැපයුම මෙ.ටො. 1,588.94ක් (බු. 77,509) විය. සහතික කළ බිත්තර වී සැපයුම මෙ.ටො. 1001.9ක් (බු. 48,874) විය.

**වගු අංක 2.2.5 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බිත්තර වී ප්‍රමාණයන් (මෙ.ටො.) – 2012**

| කන්නය | වැඩසටහන | අත්තිවාරම් | ලියාපදිංචි කළ | උප එකතුව | සහතික කළ | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | මෙ.ටො. | බු. |
| 2012 යල කන්නය | ගොවිපළ | 33.72 | 3.94 | 37.66 | 0 | 37.66 | 1837 |
| | කොන්ත්‍රාත් වගාව | 2.34 | 13.65 | 15.99 | 3.38 | 19.37 | 945 |
| | පෞද්ගලික | 8.86 | 267.09 | 275.95 | 40.12 | 316.07 | 15418 |
| | ව්‍යාප්ති | 0.18 | 486.42 | 486.60 | 262.54 | 749.14 | 36543 |
| | උප එකතුව (මෙ.ටො) | 45.10 | 771.10 | 816.20 | 306.04 | 1122.24 | |
| | උප එකතුව (බු.) | 2200 | 37615 | 39815 | 14929 | | 54744 |
| 2012/ 13 මහ කන්නය | ගොවිපළ | 39.8 | 6.17 | 45.97 | 106.72 | 152.69 | 7448 |
| | කොන්ත්‍රාත් වගාව | 0 | 28.97 | 28.97 | 0 | 28.97 | 1413 |
| | පෞද්ගලික | 5.8 | 168.3 | 174.10 | 12.22 | 186.32 | 9089 |
| | ව්‍යාප්ති | 1.31 | 1492.76 | 1494.07 | 1390.84 | 2884.91 | 140727 |
| | උප එකතුව (මෙ.ටො) | 46.91 | 1696.2 | 1743.11 | 1509.78 | 3252.89 | |
| | උප එකතුව (බු.) | 2288 | 82741 | 85030 | 73648 | | 158678 |
| 2012 වර්ෂය සඳහා නිකුත් කිරීම | ගොවිපළ | 73.52 | 10.11 | 83.63 | 0 | 83.63 | 4080 |
| | කොන්ත්‍රාත් වගාව | 2.34 | 42.62 | 44.96 | 3.38 | 48.34 | 2358 |
| | පෞද්ගලික | 14.66 | 435.39 | 450.05 | 52.34 | 502.39 | 24507 |
| | ව්‍යාප්ති | 1.49 | 1979.0 | 1980.7 | 1653.4 | 3634.0 | 177273 |
| | උප එකතුව (මෙ.ටො) | 92.01 | 2467.3 | 2559.3 | 1709.12 | 4268.45 | |
| | උප එකතුව (බු.) | 4488 | 120357 | 124845 | 83372 | | 208217 |

## 2012 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය සහ බෙදා හැරීම

2012 වර්ෂයේ විවිධ බීජ පංති 4ක් යටතේ (අත්තිවාරම්, ලියාපදිංචි කළ, සහතික කළ සහ වාණිජමය බීජ) බීජ නිපදවීම සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග 12කට අයත් ප්‍රභේද 33ක් යොදා ගැනිණි.

## 2012 වර්ෂයේ මූලික බීජ (අත්තිවාරම් සහ ලියාපදිංචි) නිෂ්පාදනය

වසර තුළ රජයේ බීජ ගොවිපළවල නිපදවන ලද අත්තිවාරම් බීජ ප්‍රමාණයන් සහ රජයේ ගොවිපළවල සහ කොන්ත්‍රාත් බීජ ගොවිපළවල නිපදවන ලද ලියාපදිංචි කළ බීජ ප්‍රමාණයන් වගු අංක 2.2.6හි දැක්වේ. මේ වසර තුළ මුළු මූලික බීජ (අත්තිවාරම් සහ ලියාපදිංචි) නිෂ්පාදනය කි.ග්‍රෑ. 70,750ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 17.25%ක (කි.ග්‍රෑ. 85,850) අඩුවීමකි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ කොන්ත්‍රාත් ක්‍රමයට වගා කරන ලද බෝග රැසක් වසර පුරාම පැවති අහිතකර කාලගුණික තත්ත්වයන්හි බලපෑමට ලක්වීමයි. සෝයා බෝංචි බීජ ආරක්ෂිත තොග ප්‍රමාණවත් පරිදි පැවතීම (කි.ග්‍රෑ. 25,000) නිසා කොන්ත්‍රාත් වැඩසටහන යටතේ අඩු නිෂ්පාදන ඉලක්ක සැලසුම් කෙරිණි. පළමු වරට මහ ඉලුප්පල්ලම රජයේ බීජ ගොවිපළෙහි ලොකු ලූනු බීජ නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

වගු අංක **2.2.6 :** වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) – **2012**

| බෝගය | අත්තිවාරම් බීජ | | | ලියාපදිංචි කළ බීජ | | | | | | | මුළු මූලික බීජ නිෂ්පාදනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බීජ ගොවිපළ | | | බීජ ගොවිපළ | | | කොන්ත්‍රාත් වැඩසටහන | | | උප එකතුව | |
| | **2011/12** මහ | **2012** යල | එකතුව | **2011/12** මහ | **2012** යල | එකතුව | **2011/12** මහ | **2012** යල | එකතුව | | |
| උඳු | 304 | 692 | **996** | 693 | 843 | **1536** | 3884 | 3083 | **6967** | **8503** | **9499** |
| මිරිස් බීජ | 243 | 720 | **963** | 0 | 0 | **0** | 0 | 0 | **0** | **0** | **963** |
| ලොකු ලූනු | 68 | 0 | **68** | 0 | 0 | **0** | 0 | 0 | **0** | **0** | **68** |
| කව්පි | 2054 | 277 | **2331** | 3614 | 885 | **4499** | 2601 | 1564 | **4165** | **8664** | **10995** |
| තල | 0 | 107 | **107** | 387 | 218 | **605** | 170 | 453 | **623** | **1228** | **1335** |
| මුං | 973 | 1130 | **2103** | 1255 | 621 | **1876** | 2083 | 3062 | **5145** | **7021** | **9124** |
| රටකජු | 400 | 522 | **922** | 1672 | 87 | **1759** | 1653 | 2042 | **3695** | **5454** | **6376** |
| කුරක්කන් | 968 | 213 | **1181** | 2151 | 375 | **2526** | 1806 | 0 | **1806** | **4332** | **5513** |
| බඩඉරිඟු (එළිමහනේ පරාගණය වූ ප්‍රභේද) බීජ | 866 | 2048 | **2914** | 3376 | 1620 | **4996** | 9315 | 8370 | **17685** | **22681** | **25595** |
| සෝයා බෝංචි | 146 | 482 | **628** | 654 | 0 | **654** | 0 | 0 | **0** | **654** | **1282** |
| එකතුව | 6022 | 6191 | **12213** | 13802 | 4649 | **18451** | 21512 | 18574 | **40086** | **58537** | **70750** |

## සහතික කළ බීජ නිෂ්පාදනය

වෙනත් ක්ෂේත්‍ර බෝගවල සහතික කළ බීජ ප්‍රධාන වශයෙන් නිපදවන ලද්දේ කොන්ත්‍රාත් බීජ ගොවිපළ හරහාය. කෙසේ වුවද, සම්පත් නමැති බඩඉරිඟු ප්‍රභේදයේ දෙමුහුම් බීජ ප්‍රධාන වශයෙන්ම නිපදවන ලද්දේ මහ ඉලුප්පල්ලම, අලුත්තරම සහ බටඅත රජයේ බීජ ගොවිපළවලය. 2011 වර්ෂයට සාපේක්ෂව සහතික කළ බීජ නිෂ්පාදනය 38%කින් වර්ධනය වී මෙ.ටො. 443.12ක් බවට පත් විය (වගු අංක 2.2.7). එයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ උඳු, මිරිස්, රටකජු, කව්පි, තල සහ බඩඉරිඟු (එළිමහනේ පරාගණය වූ ප්‍රභේද) යන බෝග පිළිබඳ කොන්ත්‍රාත් වැඩසටහන පුළුල් කිරීමයි. කෙසේ වුවද, ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත තොග පැවතීමේ හේතුවෙන් කොන්ත්‍රාත් නිෂ්පාදනය යටතේ ඉලක්ක කළ සෝයා බෝංචි ප්‍රමාණය මිලදී නොගැනිණි. කොළ පොහොර සඳහා ගන්නා බෝගයක් වශයෙන් රජයේ බීජ ගොවිපළවල සහ පර්යේෂණ ස්ථානවල ප්‍රයෝජනයට ගැනීම සඳහා සන්හෙම්ප් බෝගයේ වාණිජමය බීජ සීමිත ප්‍රමාණයක් ද නිපදවන ලදී.

## 2012 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිකුතුව

2012 වර්ෂයේදී නිකුත්කරන ලද මූලික (අත්තිවාරම් හා ලියාපදිංචි කළ) සහ සහතික කරන ලද බීජ ප්‍රමාණයන් වගු අංක2.2.8හි දැක්වේ. මෙම වසරේදී නිකුත් කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණය මෙ.ටො. 551.64ක් වූ අතර එය පෙර වසරට වඩා දෙගුණයකට ද වැඩි ප්‍රමාණයකි (මෙ.ටො. 268.73). වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ සැපයුම සම්බන්ධයෙන් ලද මෙම කැපී පෙනෙන ජයග්‍රහණය 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග පිළිබඳ ජාතික බෝග වර්ධන වැඩසටහන සඳහා බීජ සැපයුම ඉහළ නැංවීම පහසු කළේය.

**වගු අංක 2.2.7 : 2012 වර්ෂයේ රජයේ බීජ ගොවිපළවල සහ කොන්ත්‍රාත් වගාව යටතේ සහතික කළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)**

| බෝගය | කොන්ත්‍රාත් වැඩසටහන | | | | | | | බීජ ගොවිපළ | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011/12 මහ | | එකතුව | 2012 යල | | එකතුව | උප එකතුව | 2011/12 මහ | | එකතුව | 2012 යල | | එකතුව | උප එකතුව | |
| | සහතික කළ | වාණිජ මය | | සහතික කළ | වාණිජ මය | | | සහතික කළ | වාණිජ මය | | සහතික කළ | වාණිජමය | | | |
| උඳු | 52113 | 168 | 52281 | 12827 | 5471 | 18298 | 70579 | 544 | 0 | 544 | 0 | 0 | 0 | 544 | 71123 |
| මිරිස් බීජ | 0 | 0 | 0 | 942 | 8701 | 9643 | 9643 | 59 | 0 | 59 | 167 | 0 | 167 | 226 | 9869 |
| කව්පි | 10921 | 333 | 11254 | 6378 | 4969 | 11347 | 22601 | 272 | 0 | 272 | 116 | 27 | 143 | 415 | 23016 |
| තල | 512 | 48 | 560 | 3583 | 923 | 4506 | 5066 | 156 | 55 | 211 | 245 | 0 | 245 | 456 | 5522 |
| මුං | 27933 | 1679 | 29612 | 107903 | 2525 | 110428 | 140040 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 140040 |
| රටකජු | 12511 | 14169 | 26680 | 31258 | 61294 | 92552 | 119232 | 0 | 0 | 0 | 1105 | 0 | 1105 | 1105 | 120337 |
| කුරක්කන් | 297 | 0 | 297 | 0 | 0 | 0 | 297 | 323 | 0 | 323 | 0 | 0 | 0 | 323 | 620 |
| බඩ ඉරිඟු බීජ (එළිමහනේ පරාගණය වූ ප්‍රභේද) | 31037 | 8000 | 39037 | 15556 | 0 | 15556 | 54593 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 54593 |
| බඩ ඉරිඟු බීජ (සම්පත්) | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3189 | 0 | 3189 | 502 | 0 | 502 | 3691 | 3691 |
| සෝයා බෝංචි | 0 | 0 | 0 | 7691 | 6214 | 13905 | 13905 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 13905 |
| සන්හෙම්ප් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 230 | 230 | 0 | 125 | 125 | 355 | 355 |
| සෙස්බනියා රොස්ට්‍රාටා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 50 | 50 | 0 | 0 | 0 | 50 | 50 |
| එකතුව | **135324** | **24397** | **159721** | **186138** | **90097** | **276235** | **435956** | **4543** | **335** | **4878** | **2135** | **152** | **2287** | **7165** | **443121** |

වගු අංක **2.2.8 : 2012** වසර තුළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිකුතුව (කි.ග්‍රෑ.)

| බෝගය | 2012 යල (කි.ග්‍රෑ) | | | | | | 2012/13 මහ (කි.ග්‍රෑ.) | | | | | | 2012 වසර (කි.ග්‍රෑ.) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අභිජනන | අත්ති/ මූලික | ලියාප දිංචි | සහතික/ සම්මත | වාණිජ මය | එකතුව | අභි ජන න | අත් ති/මූ ලික | ලියාප දිංචි | සහතික/ සම්මත | වාණිජ මය | එකතුව | අභි ජන න | අත්ති /මූලි ක | ලියාප දිංචි | සහතික/ සම්මත | වාණිජම ය | එකතුව |
| උඳු | 66.8 | 401 | 3291 | 13527 | 2899 | **20185** | 73 | 412 | 6300 | 23222 | 2217 | **32224** | 140 | 813 | 9591 | 36749 | 5116 | **52409** |
| මිරිස් | 11.95 | 79 | 0 | 3523 | 0 | **3614** | 1 | 57 | 0 | 2996 | 0 | **3054** | 13 | 136 | 0 | 6519 | 0 | **6668** |
| කව්පි | 72.1 | 486 | 1651 | 11788 | 878 | **14875** | 12 | 820 | 2767 | 13154 | 643 | **17396** | 84 | 1306 | 4418 | 24992 | 1521 | **32271** |
| තල | 0 | 16 | 1464 | 2109 | 484 | **4013** | 0 | 41 | 379 | 2239 | 698 | **3357** | 0 | 57 | 1843 | 4348 | 1182 | **7430** |
| මුං | 62 | 441 | 4209 | 55773 | 19568 | **80053** | 75 | 160 | 6725 | 96000 | 31344 | **134304** | 137 | 601 | 10934 | 151773 | 50912 | **214357** |
| රටකජු | 159.05 | 857 | 4339 | 24405 | 26337 | **56097** | 226 | 463 | 2843 | 13259 | 46898 | **63689** | 385 | 1320 | 7182 | 37664 | 73235 | **119786** |
| කුරක්කන් | 3.75 | 14 | 68 | 366 | 134 | **586** | 9 | 82 | 2408 | 627 | 862 | **3988** | 13 | 96 | 2476 | 993 | 996 | **4574** |
| බඩඉරිඟු (එළිමහනේ පරාගණය වූ ප්‍රභේද) | 40 | 807 | 3671 | 6117 | 0 | **10635** | 40 | 479 | 15353 | 46612 | 4763 | **67247** | 80 | 1286 | 19024 | 52729 | 4763 | **77882** |
| බඩ ඉරිඟු (දෙමුහුම්) | 0 | 0 | 0 | 318 | 0 | **318** | 0 | 0 | 0 | 623 | 0 | **623** | 0 | 0 | 0 | 941 | 0 | **941** |
| සෝයා බෝංචි | 63 | 75 | 4822 | 22292 | 0 | **27252** | 0 | 158 | 796 | 6053 | 250 | **7257** | 63 | 233 | 5618 | 28345 | 250 | **34509** |
| සන්හෙම්ප් | 0 | 0 | 0 | 0 | 525 | **525** | 0 | 0 | 0 | 0 | 295 | **295** | 0 | 0 | 0 | 0 | 820 | **820** |
| ලොකු ලූනු | 0 | 2 | 0 | 0 | 0 | **2** | 0 | 0 | 0 | 0 | 0 | **0** | 0 | 2 | 0 | 0 | 0 | **2** |
| **එකතුව** | **479** | **3178** | **23515** | **140218** | **50825** | **218215** | **436** | **2672** | **37571** | **204785** | **87970** | **333434** | **915** | **5850** | **61086** | **345003** | **138795** | **551649** |

## එළවළු බීජ නිෂ්පාදනය සහ සැපයුම - 2012

### මූලික බීජ නිෂ්පාදය

මෙරට වගා කරන එළවළු බෝග 18කට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත ප්‍රභේද 55ක් වේ. ප්‍රභේද සමහරක මූලික බීජ නිෂ්පාදනය රජයේ බීජ ගොවිපළ 7කදී සිදු කෙරිණි (වගු අංක 2.2.9). 2012 වර්ෂයේදී නිපදවන ලද මුළු බීජ ප්‍රමාණය 2011 වර්ෂයට අදාළ ප්‍රමාණය මෙන් දෙගුණයකි. (කි.ග්‍රෑ. 3,136.67). මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ බෝංචි, බූෂිටා, තම්පලා සහ දඹල බීජ නිෂ්පාදනය ඉහළ යෑමයි.

**වගු අංක 2.2.9 : රජයේ ගොවිපළවල මූලික එළවළු බීජ නිෂ්පාදනය - 2012**

| බෝගය | නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | |
|---|---|---|---|
| | **2011/12 මහ** | **2012 යල** | **එකතුව** |
| බෝංචි | 3,227.0 | 969.0 | 4,196.0 |
| කරවිල | - | 5.9 | 5.9 |
| වම්බටු | 19.2 | 18.7 | 37.9 |
| බූෂිටා | - | 267.7 | 267.7 |
| මෑ | 197.1 | - | 197.1 |
| බණ්ඩක්කා | 356.7 | - | 356.7 |
| පතෝල | 51.1 | 16.2 | 67.3 |
| දඹල | 172.0 | 126.0 | 298.0 |
| තක්කාලි | 10.0 | 25.0 | 35.0 |
| තම්පලා | 198.9 | 289.4 | 488.3 |
| වැටකොළු | 183.8 | 39.1 | 222.9 |
| පිපිඤ්ඤා | - | 0.8 | 0.8 |
| කොමඩු | - | 28.5 | 28.5 |
| නිවිතිය | - | 11.6 | 11.6 |
| **එකතුව** | **4415.8** | **1,797.90** | **6213.70** |

## සම්මත එළවළු බීජ නිෂ්පාදනය

රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන ද සම්මත බීජ නිෂ්පාදනයේ නියැළිණි. රජයේ බීජ ගොවිපළවල සහ කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් නිපදවන ලද බීජ ප්‍රමාණයන් වගු අංක 2.2.10හි දැක්වේ. 2012 වර්ෂයේ සමස්ත නිෂ්පාදනය පෙර වසරට වඩා (කි.ග්‍රෑ. 16785.5) වැඩිවිය (2.56 ගුණයකින් පමණ). එය මූලික බීජ නිෂ්පාදනයේදී දක්නට ලැබෙන ආකාරයේ ප්‍රවනතාවකි. කොන්ත්‍රාත් වගාවේ ඉහළ නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වැඩසටහන යටතේ වැඩි බෝංචි බීජ ප්‍රමාණයක් මිලදී ගැනීමයි.

වගු අංක **2.2.10 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්මත එළවළු බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) – 2012**

| බෝගය | ගොවිපළ වැඩසටහන | | | කොන්ත්‍රාත් වැඩසටහන | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | **2011/12** මහ | **2012** යල | එකතුව | **2011/12** මහ | **2012** යල | එකතුව | |
| බෝංචි | 24.5 | _ | **24.5** | 21521.5 | _ | **21521.5** | **21546.0** |
| කරවිල | 46.3 | 100.9 | **147.2** | 99.0 | 3364.0 | **3463.0** | **3610.2** |
| වම්බටු | 37.4 | 234.7 | **272.1** | 69.0 | _ | **69.0** | **341.1** |
| බූෂිටා | 3.6 | 94.2 | **97.8** | 1047.5 | 783.0 | **1830.5** | **1928.3** |
| මාළු මිරිස් | 177.9 | 488.0 | **665.9** | _ | 30.4 | **30.4** | **696.3** |
| පිපිඤ්ඤා | 55.1 | _ | **55.1** | 32.2 | 118.1 | **150.3** | **205.4** |
| වැටකොළු | 426.8 | _ | **426.8** | _ | 665.0 | **665.0** | **1091.8** |
| මෑ | 874.2 | 170.0 | **1044.2** | 3082.8 | 861.0 | **3943.8** | **4988.0** |
| බණ්ඩක්කා | 544.7 | 902.9 | **1447.6** | 269.1 | 184.2 | **453.3** | **1900.9** |
| නිවිතිය | 85.3 | 150.0 | **235.3** | 43.6 | _ | **43.6** | **278.9** |
| පතෝල | 133.6 | 393.5 | **527.1** | 160.5 | 861.5 | **1022.0** | **1549.1** |
| තක්කාලි | 245.6 | 120.9 | **366.5** | _ | _ | _ | **366.5** |
| දඹල | 666.3 | _ | **666.3** | 234.4 | 2926.8 | **3161.2** | **3827.5** |
| රාබු | 186.5 | _ | **186.5** | 192.8 | 100.0 | **292.8** | **479.3** |
| **එකතුව** | **3507.8** | **2655.1** | **6162.9** | **26752.4** | **9894.0** | **36646.4** | **42809.3** |

## දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය

වම්බටු ප්‍රභේදයක සහ තක්කාලි ප්‍රභේද 2ක එෆ්1 දෙමුහුම් බීජ ගොවිපළවලදී සාර්ථකව නිපදවන ලදී (වගු අංක 2.2.11). කුණ්ඩසාලේ, අඹේපුස්ස සහ අලුත්තරම යන ගොවිපළවල වම්බටු බීජ ද කුණ්ඩසාලේ ගොවිපළෙහි පමණක් තක්කාලි බීජ ද නිපදවිණි. බෝග 2හිම එෆ් 1 බීජ නිෂ්පාදනය 2011 වසර වඩා වැඩිවිය.

වගු අංක **2.2.11 : රජයේ බීජ ගොවිපළවල දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.) – 2012**

| එකතුව | **2011/12** මහ | **2012** යල | එකතුව |
|---|---|---|---|
| තක්කාලි | 15.615 | 6.8 | 22.415 |
| වම්බටු | 49.150 | 31.5 | 80.650 |
| **එකතුව** | **64.77** | **38.3** | **103.07** |

## එළවළු බීජ බෙදා හැරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තු අලෙවි සැල් සහ ලියාපදිංචි අලෙවිකරු ජාලය හරහා එළවළු බීජ බෙදා හරින ලදී. ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමුපකාර සමිති, ගොවි සංවිධාන, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහ ලියාපදිංචි පෞද්ගලික බීජ වෙළෙන්දෝ මෙම අලෙවිකරුවන් අතර වෙති. දෙපාර්තමේන්තුව විසින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණයන් වගු අංක 2.2.12හි දැක්වේ.

2011 වසරට සාපේක්ෂව 2012 වසරේ සම්මත බීජ සැපයුම වඩා ඉහළ මට්ටමක විය. 2012 වර්ෂයේ මූලික බීජ සැපයුම තරමක් වැඩි විය. 2012 වර්ෂයේ සම්මත එළවළු බීජ සැපයුම වැඩි වූයේ දිවි නැගුම වැඩසටහනෙහි අවශ්‍යතා සපුරා ලීම පිණිසය. එමෙන්ම, 2011 වසරට සාපේක්ෂව සමස්ත සැපයුම කැපී පෙනෙන අයුරින් වැඩි විය.

**වගු අංක 2.2.12 : 2012 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)**

| බෝගය | මූලික බීජ | | | සම්මත බීජ | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 2012 යල | 2012/13 මහ | එකතුව | 2012 යල | 2012/13 මහ | එකතුව | |
| බෝංචි | 448.40 | 1261.00 | **1709.40** | 1027.80 | 3936.00 | **4963.80** | **6673.20** |
| කරවිල | 38.48 | 70.90 | **109.38** | 2780.40 | 289.10 | **3069.50** | **3178.88** |
| වම්බටු | 2.43 | 3.78 | **6.20** | 338.40 | 458.44 | **796.84** | **803.04** |
| බුෂිටා | 208.50 | 224.50 | **433.00** | 2278.25 | 2204.20 | **4482.45** | **4915.45** |
| මාළු මිරිස් | 7.65 | 5.20 | **12.85** | 147.30 | 295.00 | **442.295** | **455.15** |
| පිපිඤ්ඤා | 3.35 | 5.85 | **9.20** | 341.91 | 257.20 | **599.11** | **608.31** |
| වැටකොළු | 13.00 | 58.30 | **71.30** | 950.40 | 431.10 | **1381.50** | **1452.80** |
| මෑ | 72.50 | 101.50 | **174.00** | 1783.60 | 1272.60 | **3056.20** | **3230.20** |
| බණ්ඩක්කා | 140.90 | 167.70 | **308.60** | 2101.85 | 96.65 | **2198.50** | **2507.10** |
| වට්ටක්කා | 4.90 | 0 | **4.90** | 1.00 | 4.50 | **5.50** | **10.40** |
| රාබු | 10.25 | 55.00 | **65.25** | 1571.39 | 270.95 | **1842.34** | **1907.59** |
| පතෝල | 44.65 | 103.80 | **148.45** | 1650.40 | 284.60 | **1935.00** | **2083.45** |
| නිවිතිය | 1.30 | 1.30 | **2.60** | 18.95 | 34.80 | **53.75** | **56.35** |
| කොමඩු | 0.25 | 0.95 | **1.20** | 17.50 | 13.00 | **30.50** | **31.70** |
| තක්කාලි | 4.84 | 4.79 | **9.63** | 314.60 | 62.00 | **376.60** | **386.23** |
| දඹල | 44.80 | 156.30 | **201.10** | 3644.10 | 1036.90 | **4681.00** | **4882.10** |
| තම්පලා | 1.35 | 1.00 | **2.35** | 7.00 | 0 | **7.00** | **9.35** |
| **එකතුව** | **1047.54** | **2221.87** | **3269.40** | **18974.85** | **10947.04** | **29921.89** | **33191.29** |

## දිවි නැගුම වැඩසටහන සඳහා එළවළු බීජ සහිත ගෙවතු වගා පැකට් ලබාදීම

2012 වර්ෂයේදී දිවි නැගුම වැඩසටහන සඳහා බෝග 10ක බීජ සහිත පැකට් මිලියන 1.1කට අධික සංඛ්‍යාවක් ලබා දෙන ලදී.

**වගු අංක 2.2.13 : දිවි නැගුම වැඩසටහන සඳහා එළවළු බීජ සහිත ගෙවතු වගා පැකට් සැපයීම - 2012**

| මාසය | නිකුත් කරන ලද පැකට් සංඛ්‍යාව |
|---|---|
| 2012 අප්‍රේල්<br>2012 ඔක්තෝබර් | 100,000<br>1,002,408 |
| එකතුව | **1,102,408** |

**බීජ අර්තාපල් නිෂ්පාදනය සහ සැපයුම - 2012**

2011/12 මහ කන්නයේ ග්‍රැනෝලා ප්‍රභේදයේ පූර්ව මූලික (Go), මූලික ($G_1$,$G_2$,$G_3$)සහ සහතික කරන ලද බීජ ප්‍රමාණයන් පිළිවෙළින් මෙ.ටො. 1.5ක්, 82.29ක් සහ 13.44ක් විය. ඩිසයිරී ප්‍රභේදයේ මූලික සහ සහතික කළ බීජ නිෂ්පාදනය පිළිවෙළින් මෙ.ටො. 6.48ක් හා මෙ.ටො. 0.8ක් විය (වගු අංක 2.2.14).

2012 යල කන්නයේ ග්‍රැනෝලා ප්‍රභේදයේ පූර්ව මූලික, මූලික සහ සහතික කළ බීජ නිෂ්පාදනය පිළිවෙළින් මෙ.ටො. 6.710ක්, මෙ.ටො. 295.92ක් සහ මෙ.ටො. 127.64ක් විය. 2012 වර්ෂයේදී නිපදවන ලද සමස්ත බීජ ප්‍රමාණය මෙ.ටො. 534ක් විය. (වගු අංක 2.2.14 හා 2.2.15).

2012 යල කන්නයේදී පැවති නියඟය හේතුවෙන් ඉලක්කය සපුරා ගත නොහැකි වූ නමුත් නිෂ්පාදනය 2011 වසරට වඩා 1.5%කින් වැඩිවිය. නියඟය නිසා පාලනය කිරීමට නොහැකි වූ ආකන්ද සලබයා හේතුවෙන් සාපේක්ෂව පරිභෝජනය සඳහා ගන්නා අර්තාපල් වඩා වැඩි ප්‍රතිශතයක් ලැබිණි.

2012 වර්ෂයේදී බීජ නිෂ්පාදකයින්ට නිකුත් කරන ලද බීජ ප්‍රමාණය මෙ.ටො. 443.9ක් විය (වගු අංක 2.2.16).

**වගු අංක 2.2.14 : 2012 වර්ෂයේ පූර්ව මූලික (Go) සහ මූලික ($G_1$,$G_2$ සහ $G_3$) බීජ අර්තාපල් නිෂ්පාදනය (මෙ.ටො.)**

| ප්‍රභේදය | පූර්ව මූලික බීජ | | | මූලික බීජ | | |
|---|---|---|---|---|---|---|
| | **2011/12** මහ | **2012** යල | එකතුව | **2011/12** මහ | **2012** යල | එකතුව |
| ග්‍රැනෝලා | 1.501 | 6.710 | 8.211 | 82.291 | 295.926 | 378.217 |
| ඩිසයිරී | - | - | - | 6.481 | - | 6.481 |
| එකතුව | **1.501** | **6.710** | **8.211** | **88.772** | **295.926** | **384.698** |

**වගු අංක 2.2.15 : 2012 වර්ෂයේ සහතික කළ බීජ අර්තාපල් නිෂ්පාදනය (මෙ.ටො.)**

| ප්‍රභේදය | 2011/12 මහ | 2012 යල | එකතුව |
|---|---|---|---|
| ග්‍රැනෝලා | 12.641 | 127.646 | 140.287 |
| ඩිසයිරි | 0.802 | - | 0.802 |
| **එකතුව** | **13.443** | **127.646** | **141.089** |

**වගු අංක 2.2.16 : 2012 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද බීජ අර්තාපල් ප්‍රමාණය**

| ප්‍රභේදය | 2012 යල | 2012/13 මහ | එකතුව |
|---|---|---|---|
| ග්‍රැනෝලා | 93.9 | 350.0 | 443.9 |

**2012 වර්ෂයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සැපයුම**

ගෙවිපළ අත්තිකාරම් ගිණුම යටතේ රෝපණ ද්‍රව්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසහටන් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළවල ක්‍රියාත්මක කරන ලද අතර එමගින් ජාතික රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාව සැපිරිණි.

**2.2.17 : 2012 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සැපයුම**

| බෝගය | නිෂ්පාදනය | නිකුතුව |
|---|---|---|
| බද්ධ පැළ | | |
| අලිපේර | **14693** | **10556** |
| බෙලි | **1149** | **853** |
| දූරියන් | **13040** | **8258** |
| පේර | **4514** | **26** |
| දිවුල් | **2719** | **1471** |
| වරකා | **12891** | **8410** |
| උගුරැස්ස | **966** | **712** |
| දෙහි | **2427** | **1525** |
| අඹ | **173857** | **43508** |
| ජමනාරං | **2992** | **2769** |
| ජම්බු | **2451** | **1426** |
| දොඩම් | **18692** | **23979** |
| රඹුටන් | **49121** | **44656** |
| අනෝදා | **1868** | **712** |
| සැපදිල්ලා | **2145** | **1383** |
| කාමරංගා | **2563** | **1337** |
| මැංගුස් | **139** | **121** |
| පෙයාර්ස් | **1915** | **1072** |
| ඇපල් | **161** | **154** |
| පීච් | **100** | **62** |
| වෙනත් | **2663** | **2437** |
| උප එකතුව | **311066** | **155427** |

2012 වර්ෂයේදී පැළ 547,019ක් නිපදවා පැළ 230,895ක් බෙදා හරින ලදී. එළවළු වගාකරුවන්ගේ ඉල්ලීම අනුව එළවළු පැළ බඳුන් (Community Pots) නිපදවන ලදී (වගු අංක 2.2.17). බද්ධ කිරීම සඳහා අඹ හා රඹුටන් ග්‍රාහක 250,000ක් පමණ දැනටමත් පිළියෙල කර ඇත.

| | | |
|---|---|---|
| මුල් ඇදුණු කඳ කැබලි | | |
| මිදි | 758 | 99 |
| ජම්බු | 2418 | 1784 |
| දෙළුම් | 1565 | 2024 |
| ලෙමන් | 2252 | 2024 |
| දෙහි | 13 | 05 |
| පේර | 04 | 04 |
| පෙයාර්ස් | 835 | 0 |
| ඩ්‍රැගන් ෆෘට් | 2760 | 0 |
| ග්‍රැනඩිල්ලා | 1817 | 0 |
| වෙනත් | 9432 | 8138 |
| **උප එකතුව** | 21854 | 14078 |
| බීජ පැළ | | |
| ඇඹරැල්ලා | 14600 | 4252 |
| කාමරංගා | 3544 | 916 |
| පැපොල් | 5456 | 3873 |
| දෙළුම් | 30479 | 10869 |
| පේර | 5242 | 1903 |
| කතුරුමුරුංගා | 4456 | 1953 |
| මිටි මුරුංගා | 3846 | 9273 |
| මැංගුස් | 2010 | 606 |
| දෙහි | 23512 | 15017 |
| නෙල්ලි | 2367 | 584 |
| අනෝදා | 4063 | 1478 |
| වැල් දොඩම් | 7794 | 2694 |
| වෙනත් | 106730 | 7972 |
| **උප එකතුව** | 214099 | 61390 |
| **මුළු එකතුව** | 547019 | 230895 |
| එළවළු වගා කරන කණ්ඩායම් | 60483 | 59564 |

**2.2.18: 2012 වර්ෂයේ වෙනත් ද්‍රව්‍ය නිෂ්පාදනය**

| **නිෂ්පාදනය** | **ප්‍රමාණය** |
|---|---|
| පලතුරු (කි.ග්‍රෑ.) | |
| කෙසෙල් | 21384 |
| අඹ | 9311 |
| පැපොල් | 1335 |
| මිදි | 80 |
| අන්නාසි | 4712 |
| පේර | 138 |
| රඹුටන් | 52 |
| දෙළුම් | 28 |
| පෙයාර්ස් | 227 |
| දොඩම් | 14 |
| සත්ත්ව නිෂ්පාදන | |
| කිරි (ලී.) | 22950 |
| මුදවපු කිරි (හට්ටි) | 6098 |
| කොම්පෝස්ට් (මෙ.ටො) | 458 |
| පරිභෝජනය සඳහා ගන්නා වී (කි.ග්‍රෑ.) | 20598 |
| පරිභෝජනය සඳහා ගන්නා අර්තාපල් (කි.ග්‍රෑ.) | 138941 |
| පරිභෝජනය සඳහා ගන්නා එළවළු (කි.ග්‍රෑ.) | 34701 |

| **නිෂ්පාදනය** | **ප්‍රමාණය** |
|---|---|
| පරිභෝජනය සඳහා ගන්නා වෙනත් ක්ෂේත්‍ර බෝග (කි.ග්‍රෑ.) | |
| බඩ ඉරිඟු | 3192 |
| බඩ ඉරිඟු අමු කරල් සංඛ්‍යාව | 2916 |
| වියළි මිරිස් | 381 |
| මුං | 1064 |
| කව්පි | 1815 |
| තල | 479 |

| නිෂ්පාදනය | ප්‍රමාණය |
|---|---|
| සෝයා බෝංචි | **127** |
| කුරක්කන් | **1251** |
| උඳු | **307** |
| රට කජු | **3280** |
| **වෙනත්** | |
| මඤ්ඤොක්කා (කි.ග්‍රෑ.) | **11150** |
| ඇඹරැල්ලා (කි.ග්‍රෑ.) | **84** |
| පොල් (ගෙඩි) | **47529** |
| තැඹිලි (ගෙඩි) | **3317** |
| පුවක් (ගෙඩි) | **13785** |
| කෙසෙල් පැළ | **1225** |

## 2012 වර්ෂයේ අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය

ගොවිපළ අත්තිකාරම් ගිණුම් යොදා ගනිමින් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කෙරිණි. වසර තුළ අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය වගු අංක 2.2.19හි දැක්වේ. කාල පරිච්ඡේදය පුරාම සීමාන්තික කාලගුණික තත්ත්වයන් පැවතිය ද ගොවිපළ 13ක් ලාභ ඉපයීමට සමත් විය.

වගු අංක **2.2.19 :** අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය

| ගොවිපළ | අදායම (රු.) | වියදම (රු.) | ලාභය / අලාභය (රු.) |
|---|---:|---:|---:|
| අලුත්තරම | 34,940,002 | 45,364,818 | -6,201,412 |
| අම්බලන්තොට | 7,490,793 | 9,661,727 | 1,398,739 |
| බටඅත | 9,988,140 | 36,689,309 | -22,298,515 |
| කන්තලේ | 30,077,878 | 21,520,838 | 9,004,137 |
| මහ ඉලුප්පල්ලම | 54,261,726 | 60,029,122 | 5,758,950 |
| මල්වත්ත | 24,825,192 | 28,341,727 | 1,421,550 |
| පොළොන්නරුව | 47,991,732 | 43,811,034 | 11,358,036 |
| අඹේපුස්ස | 9,981,503 | 15,735,208 | 5,035,640 |
| කුණ්ඩසාලේ | 16,728,587 | 19,157,851 | 3,251,500 |
| මිද්දෙනිය | 1,850,873 | 15,413,367 | -10,931,573 |
| පිදුරුතලාගල | 29,516,750 | 19,535,791 | 7,112,178 |
| සීතාඑළිය | 19,324,869 | 25,076,434 | -2,645,657 |
| උඩ රදැල්ල | 25,421,936 | 11,932,435 | 11,713,457 |
| මීපිලිමාන | 12,473,766 | 12,847,431 | 1,596,189 |
| කරදියන්ආරු | 7,170,482 | 9,493,464 | 1,338,286 |
| කඳපොල | 17,868,623 | 12,452,497 | 4,238,065 |
| මුරුන්කන් | 6,885,220 | 3,863,897 | 1,433,647 |
| පරන්තන් | 9,511,017 | 8,550,472 | 2,620,635 |
| **එකතුව** | **360,318,089** | **399,477,422** | **67,281,009** |

## 2013 වර්ෂය සඳහා සැලැස්ම

- බීජ ගොවිපළවල ඉහළ ඵලදායිතාවකට සහ මූලික බීජ නිෂ්පාදනයේ වර්ධනයට මග පාදමින් ගොවිපල සංවර්ධනය යටතේ ඉඩම් සංවර්ධනය, ජල සම්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම, යන්ත්‍රසූත්‍ර හා කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කිරීම
- කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහන ශක්තිමත් කිරීම සහ වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළුවල සහතික කළ බීජ නිෂ්පාදනය
- දිවි නැගුම ජාතික වැඩසටහන - 2013 සඳහා එළවළු බීජ පැකට් හා රෝපණ ද්‍රව්‍යවලින් 40%ක් සැපයීමට දායක වීම
- නව බීජ අලෙවි මධ්‍යස්ථාන විවෘත කිරීම මගින් බීජ බෙදා හැරීම වැඩිදියුණු කිරීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී/ සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 28 |
| ගණකාධිකාරී | 01 |
| කෘෂිකර්ම උපදේශක | 136 |
| ගෙවිපළ යන්ත්‍ර උපදේශක | 01 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි | 03 |
| වැඩසටහන් සහකාර | 02 |
| පරිපාලන නිලධාරි | 02 |
| කළමනාකරණ සහකාර | 83 |
| ගොවිපළ ලිපිකරු | 16 |
| රියදුරු | 36 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 36 |
| විදුලි ශිල්පී | 02 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 08 |
| පෙදරේරු | 01 |
| වඩු කාර්මික | 03 |
| බද්ධකරු | 24 |
| සංචාරක බංගලා භාරකරු | 04 |
| කාර්ය කාර්ය සහායක | 05 |
| ගබඩාකරු | 21 |
| මුරකරු | 59 |
| ලොරි සහායක | 10 |
| විශේෂ ගබඩා කම්කරු | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 04 |
| කම්කරු (III ශ්‍රේණිය) | 351 |
| **එකතුව** | **839** |

# 2.3 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය කෘෂිකාර්මික ප්‍රතිපත්ති, පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම සහ සමාජ ආර්ථික පර්යේෂණ හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කිරීමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහ කෘෂිකර්ම අමාත්‍යාංශයට සහාය වෙමින් ප්‍රධාන උපදේශක ආයතනය වශයෙන් කටයුතු කරයි. කෘෂි සංඛ්‍යා ලේඛන තොරතුරු සම්පාදනය කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය සංඛ්‍යා ලේඛන ඒකකයක් පවත්වා ගෙන යයි. මෙම මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති කාර්යයන්, අවබෝධතා ගිවිසුම් සහ කාර්ය කණ්ඩායම් සම්බන්ධීකරණයෙහි ද නියැළෙයි.

## අයවැය

**වගු අංක 2.3.2 : වාර්ෂික අයවැය - 2012**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 1,584,770 | 1,497,865 | 95 |
| පුනරාවර්තන | 2,960,913 | 3,091,818 | 99 |
| ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්මට අදාළ ව්‍යාපෘතිය | 2,552,990 | 693,117 | 27 |
| දකුණු ආසියාවේ වැඩිදියුණු කළ ප්‍රභේද සොයා ගැනීමේ ව්‍යාපෘතිය | 183,565 | 182,088 | 99 |
| **එකතුව** | **7,282,238** | **5,464,888** | **75** |

## ප්‍රගතිය

### සමාජ ආර්ථික පර්යේෂණ

සමාජ ආර්ථික පර්යේෂණ අධ්‍යයන 14ක් සිදු කරන ලද අතර එයින් අධ්‍යයන7ක් 2013 වසර දක්වා අඛණ්ඩව සිදු කෙරිණි. වගා පිරිවැය අධ්‍යයනවලට අමතරව, (අ) ශ්‍රී ලංකාවේ නිර්දේශිත වී ප්‍රභේද වගාව සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් ගොවියාගේ අදහස සහ තීරණය (ආ) ශ්‍රී ලංකාවේ වී ගොවිතැනෙහි නිෂ්පාදන කාර්යක්ෂමතාව ඇගයීම (ඉ) කෘෂිකාර්මික ඵලදායිතාව පිළිබඳ අධ්‍යයනය සහ (ඊ) ශ්‍රී ලංකාවේ අර්තාපල් වගා අංශයේ තත්ත්වය සමාලෝචනය කිරීම යන සමාජ ආර්ථික පර්යේෂණ අධ්‍යයන 4 ඒවාට අදාළ වාර්තාවල මූලික කෙටුම්පත් අදියර දක්වා නිම කෙරිණි. අනෙකුත් සමාජ ආර්ථික පර්යේෂණ අධ්‍යයන 7 එනම්; (අ) ශ්‍රී ලංකාවේ වී වගාවේ මුළු සාධක ඵලදායිතාව සාධක අනුව වෙන් වෙන් වශයෙන් දැක්වීම (ආ) ශ්‍රී ලංකාවේ වැඩි යෙදවුම් ප්‍රමාණයක් යොදා ඉහළ අස්වැන්නක් ලබා ගැනීම පිණිස වී වගා කිරීම සහ වී වගාවේ විවිධාංගීකරණය (ඉ) ආහාර බෝග නිෂ්පාදනය කෙරෙහි වන ජීවීන් මගින් ඇති කරන බලපෑම තක්සේරු කිරීම (ඊ) වී වගා තාක්ෂණයන්හි සමාජීය ප්‍රාග්ධනය සහ එම තාක්ෂණයන් පිළි ගැනීමට ඇති කැමැත්ත පිළිබඳ තක්සේරුවක් කිරීම සහ (උ) සම්පත්

නමැති දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේදයේ ලක්ෂණ කෙරෙහි ඇති කැමැත්ත ගොවිපළ මට්ටමින් ඇගයීම 2013 වර්ෂය දක්වා අඛණ්ඩව සිදු කෙරේ.

## වගා පිරිවැය අධ්‍යයන

සාමාන්‍ය අස්වැන්න, දළ හා ශුද්ධ ඉපැයුම්, සමස්ත හා ඒකක නිෂ්පාදන පිරිවැය සහ ගොවියාට ලැබෙන මිල වගා පිරිවැය අධ්‍යයන දත්ත තුළ ඇතුළත් වේ. මෙම දත්ත ගොවිපළ මට්ටමින් මෙන්ම ජාතික මට්ටමින් බෝග නිෂ්පාදනය සහ අලෙවිකරණය පිළිබඳ තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වේ. වාහනවල කාර්මික දෝෂ නිසා පැවති ප්‍රවාහන ගැටලුව සහ අරමුදල් හිඟය හේතුවෙන් සිදු කිරීමට පමාවී තිබූ වගා පිරිවැය අධ්‍යයන මාලාව කඩිනම් කිරීමට පියවර ගැනිණි. 2010/11 මහ සහ 2011 යල කන්නවල වගා පිරිවැය අධ්‍යයන පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කරන ලද අතර 2011/12 මහ කන්න අධ්‍යයනය වසර අවසානය වනවිට අවසන් අදියරෙහි නිම වෙමින් පැවතිණි. 2012 යල කන්න අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය ආරම්භ කරන ලද නමුත් ඉන්ධන සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමේ සහ වසරේ අවසන් භාගයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් මත ගමනාගමනය බෙහෙවින් දුෂ්කර වීමේ හේතුවෙන් අධ්‍යයනයේ ප්‍රගතියට බාධා පැමිනිණි. 2011 යල, 2011/12 මහ සහ 2012 යල කන්න සඳහා උප නියැදියක් යොදා ගනිමින් සීමිත සංසරණය උදෙසා ඉංග්‍රීසි සහ සිංහල යන භාෂාවලින් අතුරු වාර්තා සකස් කරන ලදී.

## අහිතකර ජෛව හා අජෛව තත්ත්වයන්ට ලක් විය හැකි පරිසරයන්ට වී බෝගය අනුවර්තනය කර ගැනීමේ හැකියාව

වී අස්වැන්න, ගොවියාගේ ආදායම සහ දරිද්‍රතාව කෙරෙහි අහිතකර ජෛව හා අජෛව තත්ත්වයන්ට ලක්විය හැකි පරිසරයන්ට උචිත ප්‍රභේද හා තාක්ෂණයන් මගින් ඇති කරන බලපෑම් ඇගයීම පිණිස අධ්‍යයනයක් පවත්වන ලදී. සමීක්ෂණය සිදු කළ අහිතකර ජෛව අජෛව තත්ත්වයන්ට ලක් විය හැකි ගම්මානවල මහ සහ යල කන්න තුළ ලබාගත් සාමාන්‍ය වී අස්වැන්න පිළිවෙළින් හෙ. 1කට ටොන්. 2.7ක් සහ 2.5ක් විය. මෙම අගයන් මහ සහ යල කන්නවල පිළිවෙළින් හෙ.1කට ටො. 4.6ක් හා 4.6ක් වූ ජාතික සාමාන්‍ය අගයන්ට වඩා අඩුය. අහිතකර ජෛව සහ අජෛව තත්ත්වයන්ට ඔරොත්තු දෙන ප්‍රභේද එම පරිසරයන් තුළ වී අස්වැන්න වැඩිකර ගැනීමේදී වැදගත් විය හැකි බව මෙමගින් පෙන්නුම් කෙරේ. අස්වනු ප්‍රමාණය වැඩිකර ගන්නා ආකාරය අනුව නව දියුණු තාක්ෂණයන්ට සාමාන්‍ය කුටුම්භ ආදායම රු. 15,900 - 31,750 අතර ප්‍රමාණයකින් වැඩි කළ හැකිය. මෙවැනි ආදායමකින් දරිද්‍රතාව 4-8% අතර ප්‍රමාණයකින් අඩුකර ගත හැකිය. නව දියුණු තාක්ෂණයන්ට දිළිඳු වී ගොවීන් 3,000 – 24,000 අතර සංඛ්‍යාවක් දරිද්‍රතා රේඛාවෙන් මෙපිටට ගැනීමෙ හැකියාව ඇත. දිළිඳු ගොවීන් කෙරෙහි ඇති කරන ඍජු බලපෑම් මෙම ඇස්තමේන්තුවට ඇතුළත් වන අතර අඩු මිල ගණන් මගින් දිළිඳු පාරිභෝගිකයින්ට වාසි වන අන්දමේ අමතර වක්‍ර බලපෑමක් ඇති වනු ඇත. දේශීය වශයෙන් භාවිතා කරන සහ අපේක්ෂිත ධාන්‍යමය තත්ත්වය සහිත බීජ ප්‍රභේද සමහරක් වැඩි වශයෙන් පැවතීම තුළ ග්‍රීන් සුපර් රයිස් ප්‍රභේදවල නව ලක්ෂණ බීජ මාපිය ප්‍රභේදවලට අන්තර්ග්‍රහණය කිරීම පිණිස ගොවියාට පිළිගත හැකි වඩා ඉහළ අස්වනු ලබා දෙන ප්‍රභේද කඩිනමින් බිහි කිරීමේ උපාය මාර්ගයක් පැවතීම අවශ්‍යය. මෙම ප්‍රවේශය ගොවිපළ මට්ටමින් කඩිනම් බලපෑමක් ඇති කිරීමේදී ඵලදායී විය හැකිය.

## ශ්‍රී ලංකාවේ වී ප්‍රභේද භාවිත කරන ආකාරය

වී වගාවේ ඵලදායිතා වර්ධනය තිරසාරව පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වයන්ට වඩාත්ම හොඳින් අනුවර්තනය වන වී ප්‍රභේද වැඩිදියුණු කිරීම වී අභිජනන වැඩසටහන මගින් අඛණ්ඩව කරගෙන යාම වැදගත් වේ. වී පර්යේෂණ සඳහා වර්තමානයේ සිදු කරන ආයෝජන පිළිබඳ විශ්ලේෂණයක් කිරීම සහ විශේෂඥයින්ගේ තක්සේරුව හා සමීක්ෂණ ක්‍රමය යොදා ගනිමින් නව දියුණු ප්‍රභේද යටතේ වගා ප්‍රභේද විශේෂිතව භාවිතා කරන ආකාරය තක්සේරු කිරීම පිණිස අධ්‍යයනයක් සිදු කෙරිණි. පර්යේෂණ සඳහා කැප කළ මුළු විද්‍යාත්මක කාලය (Total Scientific Time) මැනීම මගින් විවිධ පරිසර පද්ධති තුළ සිදු කරන වී වගා පර්යේෂණ සඳහා යොදවන ආයෝජනය විශ්ලේෂණය කිරීම පිණිස පර්යේෂක සමීක්ෂණයක් ද සිදු කෙරිණි. මෙය පූර්ණ කාලීන සේවක පදනම (Full Time Equivalent Basis) අනුව වාර්තා කරන ලදී. සංගතභාවය උදෙසා ශ්‍රී ලංකාවේ වගා ප්‍රභේද විශේෂ කරගෙන වී ප්‍රභේද භාවිතා කිරීම පිළිබඳ සමීක්ෂණයේ සොයා ගැනීම් සමග විශේෂඥ මඬුල්ලේ විමර්ශනයන්හි ප්‍රතිඵල සසඳන ලදී. පර්යේෂණ ආයෝජන බොහොමයක් සිදු කරන ලද්දේ වියළි සහ අතරමැදි පරිසර පද්ධතිවලට වඩා තෙත් කලාපීය වී නිෂ්පාදනය සඳහා බව මෙහි ප්‍රතිඵල මගින් අනාවරණය විය. වියළි සහ අතරමැදි කලාපවල වී වගාව එහි නිෂ්පාදනයේ හා ඵලදායිතාවෙහි උපරිමයට ආසන්න වී ඇත. එමනිසා, තෙත් කලාපීය වී වගාවේ පවතින විභවයෙන් උපරිම ඵල නෙළා ගැනීමේ අවශ්‍යතාවක් මතුව ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රභේද පැතිර ඇති ආකාරය පිළිබඳ විශේෂඥ මඬුළු තක්සේරුව සමග සමීක්ෂණයේ සොයා ගැනීම් සසඳන ලද අතර එහිදී ප්‍රභේද භාවිතා කිරීමේ ඒකාකාරී රටාවක් දක්නට ලැබිණි. ජාතික මට්ටමින් වගා කර ඇති ආකාරය අනුව, බිම් ප්‍රමාණයෙන් 20%ක පැතිරී තිබූ ‘Bg 352’ වඩාත්ම ප්‍රචලිත ප්‍රභේදය වූ බැව් වාර්තා විණි. එමනිසා, කාර්යක්ෂමව සම්පත් වෙන් කිරීමට ඉවහල් වන උපාය මාර්ගික තීරණ ගැනීම සඳහා වී ප්‍රභේද භාවිතය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින්, අභිජනකයින් මෙන්ම ගොවීන් ද කල් වේලා ඇතිව දැනුවත් කිරීමක් කෙරේ.

## නිෂ්පාදන සහ අලෙවිකරණ අධ්‍යයන

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය නිෂ්පාදන සහ අලෙවිකරණ අධ්‍යයන 5ක නිරත වූ අතර එයින් අධ්‍යයන 2ක් වාර්තා කෙටුම්පත් අදියර තෙක් නිම කරන ලදී. ඒවා නම් (අ) ශ්‍රී ලංකාවේ වී කර්මාන්තයේ අලෙවිකරණ ආන්තික විශ්ලේෂණය (ආ) ශ්‍රී ලංකාවේ උඳු වගාවේ ලාභදායිත්වය පිළිබඳ ආර්ථික ඇගයීම යන අධ්‍යයනයි. අධ්‍යයන 3ක් එනම්; (අ) සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ අර්තාපල් බීජ නිෂ්පාදන වැඩසටහන පිළිබඳ ඇගයීම (ආ) ශ්‍රී ලංකාවේ කෘෂි - ආහාර කර්මාන්තවල අපනයන වෙළඳපොළ ක්‍රියාකාරීත්වය සහ (ඉ) බඩඉරිඟු නිෂ්පාදනය සහ අලෙවිකරණය පිළිබඳ අධ්‍යයනය 2013 වර්ෂය දක්වා අඛණ්ඩව සිදු කෙරේ.

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැද කන්නය තුළ සිදු කරන මුං වගාවේ ලාභදායිත්වය පිළිබඳ මූල්‍යමය ඇගයීම

2011 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ජාතික මුං වගා බිම් ප්‍රමාණය හෙ. 9,355ක් ද ජාතික නිෂ්පාදනය ටො. 10,838ක් ද ආනයනය කළ ප්‍රමාණය මෙ.ටො. 11,515ක්ද විය. මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම අනුව, ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මගින් වසර 2015 වන විට වාර්ෂික ජාතික මුං නිෂ්පාදනය මෙ.ටො. 45,170 දක්වා

ඉහළ නංවා ගැනීමට හා වාර්ෂික ආනයන මෙ.ටො. 200 දක්වා අඩු කර ගැනීමට අපේක්ෂිතය. මැද කන්නයේ (තෙවන කන්නයේ) මුං වගා කිරීම වාර්ෂික ජාතික මුං නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමේ ප්‍රධාන ක්‍රමෝපායක් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කය මැද කන්න මුං වගාව සම්බන්ධයෙන් කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්වා ඇති අතර 2011 වර්ෂයේ මුං වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙ. 8,000 ඉක්මවීය. මැද කන්න මුං වගාවේ මූල්‍යමය ශක්‍යතාව තක්සේරු කිරීම, දිස්ත්‍රික්කයේ මැද කන්න මුං වගාව ව්‍යාප්ත කිරීම කෙරෙහි හිතකර සහ අහිතකර අයුරින් බලපාන සාධක හඳුනා ගැනීම සහ ඉදිරි ව්‍යාපෘති සැලසුම් කිරීමට හා පර්යේෂණ කටයුතුවලට අදාළ ප්‍රතිපෝෂණ තොරතුරු ජනනය කිරීම පිණිස මෙම අධ්‍යයනය සිදු කෙරිණි. බීජ ස්ථාපිත කිරීමේ විවිධ ක්‍රම 9ක් ගොවීන් විසින් අනුගමනය කරන ලද අතර එයින් ක්‍රම 3ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත ක්‍රම විය. ප්‍රභේද වගා කරන ලද බිම් ප්‍රමාණයේ ප්‍රතිශයන් MI 5 සඳහා 30% ක් ද MI 6 සඳහා 16%ක් ද ඕස්ට්‍රේලියන් ප්‍රභේදය සඳහා 54%ක් ද විය. බීජ, පිරිවැයෙන් 50%ක් අඩු සහනදායී මිලකට ගොවීන්ට ලබා දුන් නමුත් නිර්දේශිත බීජ සැපයුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඕස්ට්‍රේලියානු ප්‍රභවයක් සහිත යැයි සැලකෙන පරිභෝජනය සඳහා ගන්නා බීජ වගාව සඳහා භාවිතා කිරීමට වැඩි ගොවීන් ප්‍රතිශතයක් යොමු විණි. ගොවීන් විසින් භාවිත කළ බීජ අනුපාත ඕස්ට්‍රේලියන් ප්‍රභේදය සම්බන්ධයෙන් අක්. 1කට කි.ග්‍රෑ. 9ක් ද MI 5 ප්‍රභේදය සම්බන්ධයෙන් අක්. 1කට කි.ග්‍රෑ. 10.4ක් ද MI 6 ප්‍රභේදය සම්බන්ධයෙන් අක්. 1කට කි.ග්‍රෑ. 8.3ක් ද වශයෙන් විය. බීජවල ඒකාත්මිකතාව හේතුවෙන් ඕස්ට්‍රේලියන් ප්‍රභේදය කෙරෙහි ගොවීන්ගේ වැඩි කැමැත්ත පිළිබිඹු කළ ඉහළ ප්‍රතිචාර පැවති අතර රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව මත MI ප්‍රභේද කෙරෙහි ගොවීන්ගේ වැඩි කැමැත්ත හිමි විය. ඕස්ට්‍රේලියන් ප්‍රභේදයට වඩා MI ප්‍රභේදවල සාමාන්‍ය අස්වනු ඉහළ මට්ටම්වල පැවතිණි. කෙසේ වුවද, නිර්දේශිත ප්‍රභේදවලට වඩා ඕස්ට්‍රේලියන් ප්‍රභේදයට ඉහළ මිලක් ලැබිණි.

## කෘෂිකාර්මික ප්‍රතිපත්ති අධ්‍යයන

(අ) ශ්‍රී ලංකාවේ අර්තාපල් කර්මාන්තය කෙරෙහි වෙළඳ ප්‍රතිපත්තිවල ආර්ථික විද්‍යාත්මක බලපෑම (ආ) ශ්‍රී ලංකාවේ ආහාර බෝග ක්ෂේත්‍රයට අදාළව වෙළඳාම නිදහස් කිරීමෙන් ඇතිවන බලපෑම (ඉ) ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු වගාව සම්බන්ධයෙන් සිදු කරන පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල ප්‍රතිලාභ (ඊ) ගොවි ප්‍රජාවේ සංවර්ධනය උදෙසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවසක සේවා දායකත්වය වශයෙන් ප්‍රතිපත්තිමය විශ්ලේෂණ 4ක් ආරම්භ කරන ලදී. පළමු අධ්‍යයන තුන 2013 වසර තෙක් අඛණ්ඩව සිදු කෙරේ. සිවුවන අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු හා පර්යේෂණ ආයතනය සමග සිදුකළ සහයෝගිතා අධ්‍යයනයක් වූ අතර ඒ සම්බන්ධයෙන් සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයට අදාළ කොටස සම්පූර්ණ කර ප්‍රධාන පර්යේෂක වෙත යවන ලදී.

### බෝග පුරෝකථනය

බෝග පුරෝකථනය සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ ප්‍රකාශනයක් වන අතර එමගින් වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු පිළිබඳ මාසික වගා ප්‍රගතිය නිරීක්ෂණය කෙරේ. බෝග වගාව, නිෂ්පාදන පුරෝකථනය, නිෂ්පාදනයේ කලාපීය ව්‍යාප්තිය, අස්වනු නෙළන කාල සීමා, සීමාන්තික කාලගුණික තත්ත්වයන්, පළිබෝධ හා රෝග ආදිය ඇතිවීම පිළිබඳ වත්මන් තත්ත්වයට අදාළ තොරතුරු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ. ජාතික

මට්ටමින් ආහාර සුරක්ෂිතතාව ඇතිකර ගැනීම සම්බන්ධ ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී මෙම වාර්තාව විවිධ පාර්ශ්වකරුවන්ට මඟ පෙන්වනු ඇත. සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය වසර තුළ මාසික බෝග පුරෝකථන වාර්තා 8ක් පිළියෙල කරයි.

2011/12 මහ කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය හෙ. 774,828ක් ලෙස වාර්තා වූ අතර නිෂ්පාදන පුරෝකථනය මෙ.ටො. මිලියන 3ක් විය. එය පසුගිය කාලයේ වාර්තා වූ ඉහළම ප්‍රමාණය විය. 2012 යල කන්නය අවසන් වන විට වී වගා කළ බිම් ප්‍රමාණය හෙ. 395,902ක් බැව් වාර්තා වූ නමුත් විශේෂයෙන්ම කුරුණෑගල, මඩකලපුව සහ මොණරාගල යන දිස්ත්‍රික්ක සහ මහවැලි'එච්' කලාපය යන ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශවල නියඟ තත්ත්වය හේතුවෙන් කුඹුරු ඉඩම් හෙ. 48,000කට පමණ බලපෑම් ඇති විය. නියඟයෙන් වූ හානියට අදාළව සංශෝධනය කරන ලද නිෂ්පාදන පුරෝකථනය මෙ.ටො. 1,213,671ක් විය. 2011/12 මහ කන්නයේ ඉහළ නිෂ්පාදනයත් සමග 2012 වර්ෂයේ අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො. මිලියන 4.2ක් වූ අතර එය පසුගිය වසර 5ක (2007-2011) නිෂ්පාදන සාමාන්‍යයේ 12%ක වර්ධනයකි. 2011/12 මහ කන්නයේ සමස්තයක් ලෙස වෙනත් ක්ෂේත්‍ර බෝගවල වගා ප්‍රගතිය හෙ. 135,724ක් වූ අතර එය පෙර මහ කන්නයට සාපේක්ෂව වගා බිම් ප්‍රමාණයේ 57%ක වර්ධනයකි. 2012 යල කන්නයේ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා බිම් ප්‍රමාණය හෙ. 71,478ක් වූ අතර 2012 යල කන්නයේදී නියඟය හේතුවෙන් හානියට ලක් වූ වෙනත් ක්ෂේත්‍ර බෝග (විශේෂයෙන්ම තල සහ සෝයා බෝංචි) වගා කළ මුළු බිම් ප්‍රමාණය හෙ. 4,987ක් විය. එහෙත් වෙනත් ක්ෂේත්‍ර බෝග සියල්ල පිළිබඳ නිෂ්පාදන පුරෝකථනය කුරක්කන් සහ තලවල හැරුණු විට පෙර යල කන්නයට වඩා ඉහළ මට්ටමක පැවතිණි.

## ව්‍යාපෘති සැලසුම් කිරීම, පිළියෙල කිරීම සහ සම්බන්ධීකරණය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතනවලින්/ මධ්‍යස්ථානවලින්/ ඒකකවලින් ව්‍යාපෘති සැලසුම් 31ක් එක්රැස් කරගෙන ඒවා භාණ්ඩාගාරය සමග විමසා බැලීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී. මෙම මධ්‍යස්ථානය (අ) කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ ව්‍යාපෘතිය (ආ) විෂය ක්ෂේත්‍රවලට අදාළ කාර්ය කණ්ඩායම් (ඉ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කාෂිකාර්මික නිෂ්පාදන සැලැස්ම (ඊ) ගොවිපළ සංවර්ධන සැලැස්ම (උ) අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් සම්බන්ධීකරණය කරන තම නිලධාරීන් මගින් තම සම්බන්ධීකරණ කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී. එමෙන්ම, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘති සඳහා මානව සම්පත් බඳවා ගැනීමේ කාර්යය සම්බන්ධීකරණය කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම මධ්‍යස්ථානය සමත් විය.

## වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරුවලට අදාළ වෙළඳපොළ බලවේග මත තීරණය වන ජාතික ආහාර නිෂ්පාදන සැලැස්ම, 2013-2015

මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම - ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙන් දිවයිනේ ජාතික හා කුටුම්භ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ළඟා කර ගැනීම අවධාරණය කර ඇති අතර කෘෂිකාර්මික අංශයේ 4.5%ක් වන වත්මන් වාර්ෂික වර්ධන අනුපාතය 10% දක්වා ඉහළ නංවා ගැනීමට සැලසුම් කෙරේ. වෙළඳපළ මිල විචලනය, මිල ගණන් පහත වැටි විට

ගොවීන් කෙරෙහි ද මිල ගණන් බෙහෙවින් වැඩි වන විට පාරිභෝගිකයින් කෙරෙහි ද අහිතකර අයුරින් බලපායි. සාමාන්‍යයෙන් අවදානම් දැරීමට අකමැති ගොවීන් ඉහළ මිල ගණන් පවතින අවස්ථාවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට අසමත් වන්නේ ඔවුන්ගේ නිෂ්පාදනය එවැනි අවස්ථාවලදී අඩු හෙයිනි. ඒ අනුව, ඉහළ මිල විචලන තත්ත්වයන් ගොවීන්ගේ හෝ පාරිභෝගිකයින්ගේ හෝ එම කණ්ඩායම් දෙකෙහිම කුටුම්භ ආහාර සුරක්ෂිතතාවට හානි කරයි. එමෙන්ම, ඉහළ මිල විචලනය ආශ්‍රිත අවදානම් ගොවීන් වගා කිරීම අධෛර්යමත් කරමින් විෂම චක්‍රයක් තුළ ක්‍රියාත්මක වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන නිෂ්පාදන හිඟයන් මිල ගණන් ඉහළ යාමට ද අනතුරුව වඩා දිළිඳු කණ්ඩායම් අතර ආහාර හිඟයක් ඇතිවීමට ද මඟ පාදයි. මෙම තත්ත්වය තුළ කෘෂිකර්ම අමාත්‍යාංශය ගොවීන්ට සේම පාරිභෝගිකයින්ට ද සාධාරණ මිල ගණන් සහිත වෙළඳපළ මිල ස්ථාවරත්වයක් අත්කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරුවලට අදාළ වෙළඳපළ බලවේග මත තීරණය වන ජාතික ආහාර නිෂ්පාදන සැලැස්ම කෘෂිකර්මය කෘෂි ව්‍යාපාර බවට ද ගොවීන් ගොවි ව්‍යවසායකයින් බවට ද පත්වීමට මඟ පාදමින් යැපුම් ගොවිතැන වාණිජමය වගාව ලෙසට පරිවර්තනය කිරීම මඟින් ගොවිපළ නිපැයුම් සඳහා මිල ස්ථාවරත්වය ළඟා කර ගැනීම පිණිස දරන ලද ප්‍රයත්නයකි. එය දැඩි මිල උච්චාවචනයන් අවම කර ගැනීම මඟින් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නිර්දේශවලට අනුව, මාසික ආහාර අවශ්‍යතා සපුරාලීම සඳහා වසර පුරාම බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරයි. සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය කෘෂිකර්ම අමාත්‍යාංශය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සමඟ මෙම සැලැස්ම පිළියෙල කිරීමේදී විශාල කාර්යභාරයක් ඉටු කළේය.

## ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයට අරමුදල් ලැබිණි. පර්යේෂණ ව්‍යාපෘති 3ක් අවසන් කරන ලද අතර අනෙක් ව්‍යාපෘති 6, 2013 වර්ෂය සඳහා ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

## සුළු පරිමාණ ව්‍යාපෘති (දකුණු ආසියාවේ නව දියුණු ප්‍රභේද සොයා ගැනීම)

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය දකුණු ආසියාවේ නව දියුණු ප්‍රභේද සොයා ගැනීම පිළිබඳ සුළු පරිමාණ ව්‍යාපෘතිය නිම කරන ලදී. මෙය අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය සමඟ සහයෝගයෙන් සිදුකළ ව්‍යාපෘතියකි.

## කෘෂිකාර්මික දත්ත කළමනාකරණය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය සැලසුම් හා පර්යේෂණ කාර්යයන් පහසු කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහ ඉන් පරිබාහිර සේවාලාභීන් සඳහා දත්ත සැපයීම අඛණ්ඩව සිදු කළේය.

## 'ඇග් ස්ටැට් - 2012' ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම

ආහාර බෝග අංශය පිළිබඳ තොරතුරුවල විශේෂ ලක්ෂණ සහිත කෘෂි සංඛ්‍යා ලේඛන රැගත් කුඩා ග්‍රන්ථයක් වන 'ඇග් ස්ටැට් 2012' (VIII වන වෙළුම) සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලදී. සමාජ ආර්ථික දත්ත, ඉඩම්වල ස්වභාවය, වගා බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය,

ආනයන සහ අපනයන, එක් පුද්ගලයෙකු සඳහා පවතින ප්‍රමාණය, තොග සහ සිල්ලර මිල ගණන් වැනි විවිධ තොරතුරු මෙම කුඩා ග්‍රන්ථයෙහි ඇතුළත් වේ. මෙහි ඇතුළත් සංඛ්‍යා ලේඛන තොරතුරු බොහෝ සෙයින්ම පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, සිසුන්, විද්‍යාර්ථීන්, පරිපාලකයින්, ගොවීන් සහ ව්‍යවසායකයින් විසින් භාවිතා කරනු ලැබේ.

## බෝග ව්‍යාපාර අයවැය (පලතුරු සහ මල් බෝග)

තෝරාගත් පලතුරු බෝගවලට (දොඩම්, දෙහි, කෙසෙල්, වැල් දොඩම්, අන්නාසි, රඹුටන්, පැපොල්, කජු, දෙළුම්, ඩ්‍රැගන් ෆෘට්, පෙයාර්ස්, අඹ සහ දූරියන්) සහ මල් බෝගවලට (ඇන්තූරියම්, අල්ස්ට්‍රොමරියා, ජර්බරා, කානේෂන් සහ මැඩෝනා ලිලී) අදාළ ව්‍යාපාර අයවැය පිළියෙළ කරන ලද අතර වසර අවසානය වන විට එය මුද්‍රණ අදියරෙහි පැවතිණි. නිර්දේශිත තාක්ෂණය යොදා ගනිමින් මෙම බෝග වාණිජමය වශයෙන් වගා කිරීමට අදාළ පිරිවැයට ප්‍රතිලාභ විශ්ලේෂණය මෙම අයවැයෙහි ඇතුළත්ය. යෙදවුම් ප්‍රමාණයන්, පිරිවැය, අදායම්, පිරිවැයට ප්‍රතිලාභ අනුපාතය සහ ශුද්ධ වර්තමාන අගයන් වැනි නවතම ආර්ථික තොරතුරු මෙහි දක්වා ඇත. ගොවිපළ මට්ටමින් සහ ජාතික මට්ටමින් නිෂ්පාදන සහ අලෙවිකරණ තීරණ ගැනීමේදී මෙම දත්ත ව්‍යවසායකයින්, ගොවීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. වගාව සඳහා පිරිවැයට ප්‍රතිලාභ අනුපාතය දොඩම් සම්බන්ධයෙන් 3.59ක් ද දෙහි සම්බන්ධයෙන් 2.25ක් ද කෙසෙල් සම්බන්ධයෙන් 1.26ක් ද වැල් දොඩම් සම්බන්ධයෙන් 1.92ක් ද අන්නාසි සම්බන්ධයෙන් 4.40ක් ද රඹුටන් සම්බන්ධයෙන් 5ක් ද පැපොල් සම්බන්ධයෙන් 1.30ක් ද කජු සම්බන්ධයෙන් 1.9ක් ද දෙළුම් සම්බන්ධයෙන් 6.6ක් ද ඩ්‍රැගන් ෆෘට් සම්බන්ධයෙන් 16.74ක් ද පෙයාර්ස් සම්බන්ධයෙන් 5.98ක් ද අඹ සම්බන්ධයෙන් 1.69ක් ද දූරියන් සම්බන්ධයෙන් 5.3ක් ද විය.

## සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ මානව සම්පත සහ එහි සංවර්ධන කටයුතු

අතිරේක අධ්‍යක්ෂවරයෙක් සහ පරිපාලන නිලධාරියෙන් මෙම මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාවට එක් වූහ. එක් කෘෂි ආර්ථික විද්‍යාඥයෙකු විදේශගතව තම පශ්චාත් උපාධි වැඩසටහනෙහි නියැළෙමින් වසර තුළ අධ්‍යයන නිවාඩු මත සිටින අතර තවත් කෘෂි ආර්ථික විද්‍යාඥයෙක් විදේශ රැකියාවක් හේතුවෙන් නිවාඩු ලබාගෙන සිටියේය. රාජ්‍ය කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 6 දෙනෙක් ඵලදායිතාව ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුවලට සහභාගි වූහ.

## සහභාගි වූ වැඩසටහන්

සී. චන්ද්‍රසිරි මිය, කෘෂි ආර්ථික විද්‍යාඥ, 2012 ජූනි 25 - අගෝ.3 දින දක්වා තායිලන්තයේ බැංකොක්හි පැවති තායිලන්ත අන්තර්ජාතික සංවර්ධන සහයෝගිතා ඒජන්සිය (TICA) විසින් අරමුදල් ප්‍රතිපාදනය කරන ලද 'ප්‍රමාණවත්බව පිළිබඳ ආර්ථික දර්ශනය අනුගමනය කරන ප්‍රජා පාදක ආර්ථික සංවර්ධනය' යන තේමාවෙන් වූ පුහුණු වැඩසටහනකට සහභාගි වූවාය.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ, 2012 .05. 13 – 2012 . 05. 18 අතර තායිලන්තයේදී පවත්වන ලද 'කෘෂිකාර්මික සංගණන සහ සමීක්ෂණ සඳහා නියැදි ගැනීම' පිළිබඳ කලාපීය වැඩමුළුවට සහභාගි විය.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ, 2012. 07. 18 – 2012. 07.20 අතර කාලයේදී තායිලන්තයේදී පවත්වන ලද 'මෙහෙයුම් කණ්ඩායම් කෘෂිකාර්මික සංඛ්‍යා ලේඛන' පිළිබඳ 2 වන රැස්වීම සඳහා සහභාගි විය.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ, 2012.10.05 – 2012. 10.12 අතර කාලයේදී වියට්නාමයේ පැවති 24වැනි ආසියා පැසිෆික් සැසිවාරයට සහභාගි විය.

එන්. පී. ලියනගේ මිය, කෘෂි ආර්ථික විද්‍යාඥ, 2012 ජූලි 15 දින කොළඹ විද්‍යාභිවර්ධන සංගම් මූලස්ථානයේ පැවති 'විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නියැදි ගැනීම පිළිබඳ හඳුන්වා දීම සහ නියැදි තෝරා ගැනීමට අදාළ මූලික මූලධර්ම' පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගි වූවාය.

බී. ආර්. වලිසිංහ මිය, කෘෂි ආර්ථික විද්‍යාඥ, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, පිලිපීනයේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයේ අනුග්‍රහයෙන් 2012 මාර්තු 23-24 දින ඉන්දියාවේ ඔරිස්සා ප්‍රාන්තයේ භුබනේස්වර්හි කාලිංග කර්මාන්ත හා තාක්ෂණික විශ්වවිද්‍යාලයේ පැවති 'දකුණු ආසියාවේ වැඩිදියුණු කළ ප්‍රභේද සොයා ගැනීම' පිළිබඳ ව්‍යාපෘති සැලසුම් වැඩමුළුවට සහභාගි වූවාය.

බී. ආර්. වලිසිංහ මිය, කෘෂි ආර්ථික විද්‍යාඥ, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, එක්සත් ජාතීන්ගේ ආසියා ශාන්තිකර ආර්ථික හා සමාජීය කෙමිසම සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලදුව ශ්‍රී ලංකාවේ කොළඹ ගලධාරී හෝටලයේදී 2012 නොවැම්බර් මස 2 දින පැවති ආසියා ශාන්තිකර ඒකාබද්ධතාව පිළිබඳ නිරීක්ෂණය කරන ලද ගැටලු හා ප්‍රතිපත්තිමය ගැටලු යන තේමාව යටතේ වූ ආසියා - ශාන්තිකර පර්යේෂණ හා පුහුණු ජාලයේ සම්මන්ත්‍රණයට අදාළ වැඩමුළුවකට සහභාගි වූවාය.

එච්. යූ. වර්ණකුලසූරිය මහතා, අතිරේක අධ්‍යක්ෂ, තායිලන්තයේ බැංකොක්හි 2012.07.23 – 2012. 07. 27 දින දක්වා 'ජාතික කුටුම්භ සමීක්ෂණ තුළින් එක්රැස් කර ගත් ආහාර පරිභෝජන දත්ත පිළිබඳ ආහාර සුරක්ෂිතතා විශ්ලේෂණය' යන තේමාව යටතේ පැවති කලාපීය වැඩමුළුවට සහභාගි විය.

## සම්බන්ධීකරණ නිලධාරී / කමිටු සාමාජිකයින් වශයෙන් සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය

ටී. එච්. සී. එස්. පෙරේරා, අධ්‍යක්ෂ, සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - පර්යේෂණ ව්‍යාපෘති 56කින් සමන්විත ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් කටයුතු කළේය.

එච්. යූ. වර්ණකුලසූරිය මහතා , අතිරේක අධ්‍යක්ෂ - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මිල කමිටුවෙහි සභාපති වශයෙන් ක්‍රියා කළේය.

එච්. යූ. වර්ණකුලසූරිය මහතා, අතිරේක අධ්‍යක්ෂ- අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳාම සඳහා පහසුකම් සැලැසීම පිළිබඳ ජාතික උපදේශක කමිටු සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කළේය.

ආර්. එම්. හේරත් මහතා, කෘෂි ආර්ථික විද්‍යඥ - කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය විසින් අරමුදල් ප්‍රතිපාදනය කරන ලද සහ කෘෂිකර්ම දොපර්තමේන්තුව යටතේ ඇති ආයතන හා මධ්‍යස්ථාන විසින් ක්‍රියාවට නංවන ලද කාබනික පොහොර භාවිතය සහ නිෂ්පාදනය ඉහළ නැංවීම පිළිබඳ

ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් කටයුතු කළේය.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍ර කාර්ය කණ්ඩායම් රැස්වීම් පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් කටයුතු කරන ලදී.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ - කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද වී වගා සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සේවය කළේය.

ආචාර්ය ආර්. එම්.හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණය නිදහස් කිරීමේ කමිටුවේ ලේකම් වශයෙන් සේවය කළේය.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ - එක්සත් ජාතීන්ගේ ආසියානු ශාන්තිකර කලාපීය ආර්ථික හා සමාජීය කොමිසම සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ස්ථාපිත කරන ලද කෘෂිකාර්මික සංඛ්‍යා ලේඛන පිළිබඳ මෙහෙයුම් කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් සේවය කළේය.

ආචාර්ය ආර්. එම්. හේරත්, කෘෂි ආර්ථික විද්‍යාඥ - කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල් ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලසුම් ඇගයීමේ කමිටු සාමාජිකයෙකු වශයෙන් සේවය කළේය.

## 2013 වසර සඳහා සැලැස්ම

**වගු අංක 2.3.2 : විවිධ කාණ්ඩ යටතේ ඇති මුළු ව්‍යාපෘති සංඛ්‍යාව**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණය | 3 |
| පාරිසරික අධ්‍යයන | 1 |
| මානව සම්පත් සංවර්ධනය | 2 |
| කෘෂිකාර්මික දත්ත කළමනාකරණය සහ තොරතුරු සැපයුම් කළමනාකරණය | 7 |
| ව්‍යාපෘති නිර්මාණය සහ ඇගයීම | 4 |
| නිෂ්පාදන සහ අලෙවිකරණ පර්යේෂණ | 4 |
| සමාජ ආර්ථික පර්යේෂණ | 10 |
| **එකතුව** | **31** |

## කාර්ය මණ්ඩලය

| **තනතුර** | **නිලධාරී / සේවක සංඛ්‍යාව** |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / අතිරේක අධ්‍යක්ෂ | 01 |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | 12 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී | 01 |
| ආර්ථික විද්‍යාඥ සහකාර | 09 |
| වැඩසටහන් සහකාර | 05 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| කළමනාකරණ සහකාර සේවය | 08 |
| රියදුරු | 04 |
| කම්කරු | 03 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| **එකතුව** | **47** |

# 3.1 ව්‍යාප්ති හා පුහුණු අංශය

ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතබව තහවුරු කිරීම මෙන්ම ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය උදෙසා ආහාර බෝග අංශයේ ඉහළම ඵලදායීතාවයක් ළඟා කර ගැනීම ව්‍යාප්ති හා පුහුණු අංශයේ අරමුණ වේ. මෙම අංශය විසින් සඵල කර ගැනීමට අපේක්ෂිත කරුණු ප්‍රධාන ක්ෂේත්‍ර 4ක් ඔස්සේ අවධානයට යොමු කරනු ලබයි. ව්‍යාප්තිය, පුහුණුව, කෘෂිකාර්මික අධ්‍යාපනය සහ විභාග යන්න එම ප්‍රධාන ක්ෂේත්‍ර වේ. මෙම අංශයේ අරමුණු සපුරා ගැනීම උදෙසා අදාළ ඒකක මගින් පහත සඳහන් ක්‍රියාවලීන් ඉටු කරනු ලබයි.

- අන්තර් පළාත් 6 මගින් සිදු කරනු ලබන ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ සෘජු ව්‍යාප්ති වැඩසටහන්

- පළාත් සහ මහවැලි ප්‍රදේශ සමඟ සාමූහික ව්‍යාප්ති වැඩසටහන්

- ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, ගොවීන්, ව්‍යවසාය සහ වෙනත් පුද්ගලයින් සඳහා සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථාන 3, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 4 සහ ගොවිපල යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය යන ස්ථානවලදී පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච යන ප්‍රදේශයන්හි පිහිටි කෘෂිකර්ම විද්‍යාලයන්හි අවුරුදු දෙකේ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.

- තරුණ ගොවි සමිති කාර්යයන් ඉටු කිරීම.

- බිඳුණුවැව සහ මාවතගම පිහිටි මී මැසි සංවර්ධන ඒකක දෙකෙහිදී මී මැසි පාලන සංවර්ධන කටයුතු පැවැත්වීම.

- පැළෑටි පොහොර සහ කාබනික කෘෂිකර්ම ඒකක මගින් රටේ පාරිසරික හිතකර කෘෂිකර්මාන්තය ප්‍රචලිත කිරීම.

- කෘෂිකාර්මික ව්‍යවසාය සංවර්ධන, වෙනත් ක්ෂේත්‍ර බෝග සංවර්ධන වැඩසටහන්, ක්ෂුද්‍ර වාරිමාර්ග සහ ආරක්ෂිත කෘෂිකර්මය, කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන්

- බිබිල උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේදී උද්‍යාන බෝග සංවර්ධන සහ පුහුණු ක්‍රියාවලිය

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදනය සහකාරවරුන් සඳහා විශේෂ පුහුණු මධ්‍යස්ථානයන්හිදී පුහුණු වැඩසටහන් පැවැත්වීම.

## අයවැය

**වගුව 3.1.1 :** වාර්ෂික අයවැය **- 2012** (රු. මිලියන)

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 48.54 | 45.8855 | 95 |
| පුනරාවර්තන | 120.422 | 110.382 | 92 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන | වියදම | වියදම් % |
|---|---|---|---|
| **විශේෂ ප්‍රාග්ධන ව්‍යාපෘති** | | | |
| **කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අරමුදල** | | | |
| පුහුණු හා හැකියා වර්ධනය | 10 | 8.844 | 88 |
| කෘෂිකාර්මික පුහුණු ගොවිපල | 20 | 15.3631 | 77 |
| **අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අරමුදල්** | | | |
| ගොවිපල සංවර්ධන වැඩසටහන | 17.2 | 13.7 | 80 |
| ක්ෂුද්‍ර වාරි තාක්ෂණය මගින් මධ්‍යම මට්ටමේ එළවළු ගොවිපළ පිහිටුවීම | 2.8 | 2.8 | 100 |
| ප්‍රජා මූලික බීජ සංවර්ධන වැඩසටහන | 3.75 | 3.75 | 100 |
| තිරසාර කාබනික ගොවි තාක්ෂණය පිළිබඳ ආසියානු ජාලය | 0.05 | 0.05 | 100 |
| **එකතුව** | **222.76** | **200.77** | **90** |

# ප්‍රගතිය

## විශේෂ ව්‍යාපෘති

### 1. පුහුණු සහ හැකියා වර්ධනය

එක් වසරක පුහුණු වැඩසටහන් පවත්වනු ලබන කෘෂිකර්ම විද්‍යාල, සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථාන, ගොවිපල යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය, දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන සහ කෘෂිකාර්මික පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් උදෙසා අනෙකුත් විශේෂ පුහුණු මධ්‍යස්ථාන යන ආයතනයන් ලබාදෙන පුහුණු වැඩසටහන්හි හැකියා සහ ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව මෙම විශේෂ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබිණි.

ඉහත මධ්‍යස්ථාන මඟින් ලබා දෙන්නා වූ පුහුණුවෙහි ගුණාත්මක බව සහ හැකියාව වර්ධනය කිරීම උදෙසා එම මධ්‍යස්ථානයට හට අවශ්‍ය වන්නා වූ පර්යේෂණාගාර උපකරණ සහ රසායනික ද්‍රව්‍ය, උද්‍යාන බෝග උපකරණ, සත්ත්ව ගොවිපළ උපකරණ, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ, පුහුණු ආධාරක, කියවීම සඳහා වූ අතිරේක පොත් සහ වෙනත් පහසුකම් සපයනු ලැබීය.

මෙයට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දේශීය පුහුණුවද ලබාදුන් අතර දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා විදේශීය පුහුණු පැවැත්වීමටද මෙම වැඩසටහන මහඟු පිටුවහලක් විය.

ඉහත කාර්යයන් සපුරා ගැනීම උදෙසා මිලියන 8.844ක් වියදම් කරනු ලැබීය.

**2. කෘෂිකාර්මික පුහුණු ගොවිපළ භූමි සංවර්ධනය**

මෙම ව්‍යාපෘතිය යටතේ එක් අවුරුදු පුහුණු වැඩසටහන් පවත්වනු ලබන කෘෂිකර්ම විද්‍යාල, සේවා සංස්කරණ මධ්‍යස්ථාන, ගොවිපල යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය, පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් උදෙසා වූ විශේෂ පුහුණු මධ්‍යස්ථානයන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ගොවි භූමි රුපියල් මිලියන 15.36ක් වැයකර සංවර්ධනය කරනු ලැබිණි.

**3. ගොවිපල සංවර්ධන වැඩසටහන**

ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ උප ආයතන 7ක්, හංසයාපාලම සහ අඟුණකොලපැලැස්ස සේවා සංස්කරණ පුහුණු ආයතන, කුණ්ඩසාලය, අඟුණකොලපැලැස්ස, පැල්වෙහෙර සහ වවුනියා කෘෂිකර්ම විද්‍යාල සහ බිබිල උද්‍යාන බෝග සංවර්ධන යන පුහුණු ආයතනයන්හි හඳුනාගත් ගොවිපල වැඩිදියුණු කරනු ලැබූ අතර විශේෂයෙන් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන කටයුතු උදෙසා බෝග වගා කරනු ලැබීය.

මෙම ගොවිපල සංවර්ධනයේදී පාංශු සංරක්ෂණ සහ විධිමත් ජලාපවහන ක්‍රමෝපායන්, ජල සම්පාදන ප්‍රවර්ධන, බෝග නිෂ්පාදන ව්‍යුහ ස්ථාපිත කිරීම, වෙනත් ආකාරයේ භූමි සංවර්ධනය වැනි කටයුතු සිදු කරනු ලැබිණි. මෙම කටයුතු උදෙසා මිලියන 13.7ක මුදලක් වැය කෙරිණි.

**4. ක්ෂුද්‍ර වාරි ක්‍රමය තුළින් මධ්‍ය මට්ටමේ එළවළු ගොවිපල ස්ථාපිත කිරීම**

තෝරා ගත් ගොවීන් හට 50% ගොවි දායකත්වය යටතේ විසිරුම් ජලසම්පාදන පද්ධති 40ක් සපයා දෙනු ලැබීය. මෙයට අමතරව ක්ෂුද්‍ර වාරිමාර්ග තාක්ෂණය පිළිබඳව ගොවීන් හට පුහුණු වැඩසටහන් 15ක් පවත්වනු ලැබිණි.

5. **ප්‍රජා මූලික බීජ නිෂ්පාදන ගම්මාන**

තිරසාර බීජ සැපයුමක් තහවුරු කිරීම උදෙසා ගම්මානවල තෝරාගත් ගොවීන්ගේ බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය උදෙසා මූල්‍ය වෙන්කිරීම මිලියන 3.75ක් වූ අතර මෙම සම්පූර්ණ මුදල් ප්‍රමාණයම වියදම් විය. 2012 වර්ෂයේ මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පහත ලෙස සංක්ෂිප්ත කළ හැක.

තෝරා ගත් ගම්මාන 158ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර ව්‍යාපෘතිය මඟින් 324 දෙනෙකු සඳහා ප්‍රතිලාභ අත්විය. බීජ නිෂ්පාදන තාක්ෂණයන් පිළිබඳව ගොවීන් පුහුණු කරනු ලැබිණි. මෙයට අමතරව පසු අස්වනු කාර්යයන් මෙහෙය වීම උදෙසා ගොවි කණ්ඩායම් හට මූලික බීජ රෝපණ ද්‍රව්‍ය සහ උපකරණ සපයනු ලැබිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ මධ්‍යස්ථානයෙහි ගොවීන් 125 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

**6. තිරසාර කාබනික ගොවි තාක්ෂණය පිළිබඳ ආසියානු ජාලය (ANSOFT ව්‍යාපෘතිය)**

මෙම ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් කාබනික ගම්මානයන්හිදී වැඩමුළු 10ක් පවත්වනු ලැබිණි. නිලධාරීහු 104ක් සහ ගොවීහු 284ක් සහභාගී වූහ. ගොවීන් අතර වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ පැකට් 200ක් සහ දේශීය රෝපණ ද්‍රව්‍ය බෙදා හරිනු ලැබිණ. පෞද්ගලික සමාගම් කිහිපයකින් කාබනික නිෂ්පාදන මිලදී ගැනීම උදෙසා ඉල්ලුමක් පවතී.

### 7. සහල් අපනයන කලාප ව්‍යාපෘතිය

පොළොන්නරුව, හම්බන්තොට, මන්නාරම සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි අපනයන තත්ත්වයේ උසස් ගුණාත්මක බවකින් යුත් වී නිෂ්පාදනය කිරීමේ අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබිණි. තෝරා ගත් සහල් මෝල් හිමියන්, කෘෂිකර්ම උපදේශකවරුන් සහ කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ වරුන් උදෙසා පසු අස්වනු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරුවරුන් විසින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සහල් සැකසීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබිණි. ගුණාත්මකබවින් ඉහළ සහල් සැකසීම උදෙසා සහල් මෝල් හිමිකරුවන් 22ක් හඳුනා ගනු ලැබිණි.

ගොවීහු 3304 දෙනෙක් කුඹුරු හෙක්ටයාර 2214ක වී මෙට්‍රික් ටොන් 8523ක ප්‍රමාණයක් නිෂ්පාදනය කළහ. කෙසේ වුවද, අනෙකුත් සහල් නිෂ්පාදන රටවල් වලට සාපේක්ෂව නිෂ්පාදන පිරිවැය අධික වන අතර මේ හේතුවෙන් ලෝක වෙළඳපෙලහි වෙනත් රටවල් වලට සාපේක්ෂව තරඟ කිරීමට අපහසුය. තාක්ෂණික සහයෝගය ලබාදීමට සහ ගොවීන් සහ සහල් මෝල හිමියන් සංවිධානය කිරීම උදෙසා දරන ලද පිරිවැය රුපියල් 273,220.50කි.

### 8. කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය සහ තාක්ෂණික සහකාරවරුන් පුහුණු කිරීම (ASTA)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය හා එක්ව මෙම වැඩසටහන පවත්වනු ලැබූ අතර මොඩියුල 12කින් සමන්විත වන, ජාතික ආධුනිකත්ව සහතික පත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය පිළිබඳ සංක්ෂිප්ත සටහන් සහ අභ්‍යාසලාභී පුහුණුවන්නන් සඳහා අත්පොතක් සකස් කරනු ලැබිණි. මෙයට අමතරව ජාතික ආධුනිකත්ව පුහුණු අධිකාරියේ නිලධාරීන් 47 දෙනෙක් සහ කෘෂිකර්ම උපදේශකවරුන් 78 දෙනෙක් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබිණි. මෙම වසර අවසානයේදී දිස්ත්‍රික්ක 7ක් සඳහා කෘෂි රසායන අලෙවිකරුවන් සහ තාක්ෂණික සහකාර වරුන් පුහුණු කිරීම ආරම්භ කරනු ලැබිණි.

## අන්තර් පළාත් ප්‍රදේශ වල ව්‍යාප්ති කටයුතු

ප්‍රධාන වාරි ක්‍රම පවතින ප්‍රධාන වගා භූමි ප්‍රදේශයන්හි මෙම අන්තර් පළාත් ප්‍රදේශ 6 පිහිටා ඇති අතර මෙම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ වූ ව්‍යාප්ති හා පුහුණු ඒකකය යටතේ පරිපාලනය වේ. අම්පාර, අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල, පොළොන්නරුව සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි කොටස් අන්තර් පළාත් ප්‍රදේශ ලෙස මායිම් ලකුණු කර ඇත.

වගුව **3.1.2 : 2012** හා **2011** **වර්ෂවලදී අන්තර් පළාත් ප්‍රදේශවල වී වගා සම්පූර්ණ භූමි ප්‍රමාණය සංසන්දනය**

| වගා කන්නය | වගා කළ භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | වගා කන්නය | වගා කළ භූමි ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|---|
| 2011 යල | 141,886 | 2012 යල | 124,645 |
| 2010/2011 මහ | 194,612 | 2011/2012 මහ | 184,206 |

ඉහත වගුව මඟින් 2012 යල සහ 2011/2012 මහ කන්නයේ වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය පෙන්නුම් කරන අතර 2011/2012 මහ කන්නයේ වගා කළ භූමි ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කරයි. 2011/2012 මහ වගා කන්නයේ ජලය සංරක්ෂණය කිරීමේ එක් ක්‍රමවේදයක් ලෙස 2012 යල කන්නයේදී ඉලක්කකෙරුණු භූමි ප්‍රමාණය වගා කිරීම උදෙසා ජලාශ වල ජලය හිඟවීමෙන් අවසර ලබා නොදුණි. එසේ වුවද වී අස්වැන්නේ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් නොකෙරිණි.

ලොකු ලූනු, රතු ලූනු, බඩඉරිඟු, මුං ඇට, රටකජු, ඉරිඟු, කව්පි, සෝයා බෝංචි, මිරිස්, කුරක්කන් සහ උඳු මෙම අන්තර් පළාත් ප්‍රදේශ 6හි වගා කළ වෙනත් ක්ෂේත්‍ර බෝග වේ. වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කළ භූමි ප්‍රමාණය 2011/2012 මහ කන්නයේ හෙක්ටයාර 72 98.945ක් 2012 යල කන්නයේ හෙක්ටයාර 13135.95ක්ද විය. මෙම එක් එක් අන්තර් පළාත් ප්‍රදේශයන්හි විශේෂිත තොරතුරු සහ කාර්ය සාධනයන් පහත දැක්වේ.

## අන්තර් පළාත් ප්‍රදේශය - හම්බන්තොට

### 1. හැඳින්වීම

හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශයන් හට ප්‍රධාන වාරික්‍රම යටතේ හෙක්ටයාර 15,000ක්ද කුඩා වාරික්‍රම යටතේ හෙක්ටයාර 1400ක්ද වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ හෙක්ටයාර 50ක්ද ආවරණය වේ. පහතරට එළවළු සහ පළතුරු වන ලබු, කෙසෙල්, පැපොල් වගා කරනු ලබන අතර වගාකළ උඩරට භූමි ප්‍රමාණය හෙක්ටයාර 39546කි. ලුණුගම්වෙහෙර, ලියනගස්තොට (රිදියාගම ජලාශය) සහ සමනලවැව බෝග වගාවන් සඳහා ජලය සම්පාදනය කරනු ලබන ප්‍රධාන වාරික්‍රම වේ. ඉහතින් සඳහන් කළ ප්‍රධාන වාරි ක්‍රම 3 යටතේ යල සහ මහ ප්‍රධාන වගා කන්න 2කද යල කන්නයේ වගාවට පසු 3වන වගා කන්නයකද වගා කරනු ලබයි.

### 2. කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු

හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශය, වලව සහ කිරින්දිඔය යන නමින් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්ක දෙක ආවරණය කරමින් මෙම අංශ දෙකෙහි ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් මෙම කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු සිදු කරනු ලබයි. මෙම කෘෂිකාර්මික අංශ දෙක අම්බලන්තොට, හම්බන්තොට, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, සූරියවැව සහ බලංගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ආවරණය කෙරේ. අම්බලන්තොට ලුනාව, බඳගිරිය, වීරවිල, යෝධකණ්ඩිය, බෙරලිගෙල සහ කල්තොට යන ගොවිජන සේවා මධ්‍යස්ථාන යටතේ ප්රදේශ 6ක මෙම ව්‍යාප්ති කටයුතු සිදු කරනු ලැබේ. 25 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් වලින් සමන්විත වන්නා වූ කිරිදිඔය කෘෂිකාර්මික අංශයෙහි දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානය පිහිටුවා ඇත.

කෘෂිකාර්මික දැනුම, හැකියා ප්‍රවර්ධනය සහ ආහාර සුරක්ෂිත බව තහවුරු කිරීම උදෙසා ජාතික ආහාර නිෂ්පාදනය වැඩිකිරීමේ ආකල්පමය වර්ධනය සහ ආදායම සහ ලාභය වැඩි කිරීම තුළින් ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව ගොවීන්හට පැකේජයක් ලෙස කෘෂිකාර්මික සේවාවන් ලබා දේ.

පසුගිය වසරේ හෙක්ටයාරයකට මෙට්‍රික්ටොං 7.1ක සාමාන්‍ය අස්වැන්නක් ලබාදෙමින් වී වගාව, හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශයේ ප්‍රධාන වගාව විය. මුදල් බෝගයක් ලෙස විශේෂයෙන් කෙසෙල් වගාකිරීමේ වැඩි ප්‍රවනතාවයක්

ඇති බව සංඛ්‍යාන මඟින් පෙන්නුම් කෙරිණි.

## 2012 වර්ෂයේ සුවිශේෂී ජයග්‍රහණයන්

3.1 තුන්වැනි කන්නයේ මුං ඇට වගාව

3.2 අවාරයට රතු ලූනු හා ලොකු ලූනු වගාව ප්‍රවර්ධනය

3.3 මිරිස් සහ කුරක්කන් වගාව ප්‍රවර්ධනය

3.4 කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රචලිත කිරීම

3.5 ප්‍රජා මට්ටමෙන් බීජ නිෂ්පාදනය

3.6 ප්‍රජා සහ ජීවනෝපාය සංවර්ධනය නමින් වූ ව්‍යාපෘතිය හට තාක්ෂණික සහයෝගය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ලබා ගැනීම

## අන්තර් පළාත් ප්‍රදේශය - මහනුවර

මහනුවර, මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි මිනිපේ, විල්ගමුව, කන්දකැටිය, රිදීමාලියද්ද, මහියංගනය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මහනුවර අන්තර් පළාත් ප්‍රදේශහට ඇතුලත් වේ. ගොවි පවුල් 32385කට අයත් පහත් බිම් ප්‍රදේශ හෙක්ටයාර 12474ක් සහ උඩරට හෙක්ටයාර 7403ක් අයත් වේ. සොරබොර, මාපාකන්ද වැව, දඹර වැව, නාගදීප, බත් මෙඩිල්ල, බදුලු ඔය (බදුල්ල දිස්ත්‍රික්කය), යෝධ ඇල වාරි මාර්ග යෝජනා ක්‍රමයට අයත් මිනිපේ I හා මිනිපේ II, රතා ඇල්ල (මහනුවර දිස්ත්‍රික්කය) ,මිනිපේ III හා මිනිපේ IV (මාතලේ දිස්ත්‍රික්කය), යන වාරිමාර්ග යෝජනා ක්‍රම 6 යටතේ බෝග වගාව සිදු කෙරේ. යල හා මහ කන්න දෙකේම පහත් බිම් වල වී වගාව විශාල පරිමාණයෙන් සිදු කෙරේ. මෙම කුඹුරු බිම් වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් යල වගා කන්නයේදී (වියලි කාලයේදී) වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සඳහා යොදා ගනු ලැබේ. බඩඉරිඟු, රටකජු, මුං ඇට සහ මිරිස් යන බෝග වෙනත් ක්ෂේත්‍ර බෝග යටතේ වගා කෙරේ.

### ව්‍යාප්ති කටයුතු

මෙම ව්‍යාප්ති කටයුතු දිස්ත්‍රික්ක 3ක් නියෝජනය කෙරෙමින් කොටස් 3ක් යටතේ සිදු කළද කාර්යමණ්ඩල හිඟයට පිළියමක් ලෙස වර්තමානයේදී අංශ 2ක් ඒකාබද්ධ කොට ව්‍යාප්ති කටයුතු සිදු කෙරේ. මහනුවර දිස්ත්‍රික්කයේ 2ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ 2ක්ද, බදුල්ල දිස්ත්‍රික්කයේ 3ක්ද ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන 7ක් දක්නට ලැබේ. කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රදේශ 14කට ප්‍රධාන ගොවිජන සේවා මධ්‍යස්ථාන පාලන ප්‍රදේශ බෙදනු ලැබ ඇත.

## 2012 වසරේ සුවිශේෂී ජයග්‍රහණයන්

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දෙනු ලැබූ නිදර්ශන

වී වැපරීමේ විසුරුම් ක්‍රමවේදය දියුණු තාක්ෂණික ක්‍රමවේදයකි. බීජ අනුපාතය, වගා පිරිවැය, අඩු කරමින් ඵලදායීතාවය වැඩි කිරීමේ අරමුණ ඇතිව අක්කර ½ ක භූමි ප්‍රමාණයකට නිදර්ශන 80ක් සිදු කරනු ලැබීය.

ගොවි ප්‍රජාවහට සාමාන්‍ය වී වැපරීමේ ක්‍රමවේදයට සාපේක්ෂව විසුරුම් ක්‍රමවේදයේ පවතින වාසිදායක බව තහවුරු කිරීම උදෙසා මෙම නිදර්ශන උපයෝගී කරගනු ලැබීය.

**වගු 3.1.3 : වී වැපිරීමේ සාමාන්‍ය ක්‍රමවේදයට සාපේක්ෂව බීජ පැල විසුරුම් ක්‍රමවේදයෙහිදී අස්වැන්න සැසඳීම.**

| | **විසුරුම් ක්‍රමයේ වී වැපිරිම** | **සාමාන්‍ය ක්‍රමයේ වී වැපිරිම** |
|---|---|---|
| සාමාන්‍ය අස්වැන්න (අක්කරයකට බුසල්) | 136 | 105 |
| නිෂ්පාදන පිරිවැය (කිලොග්‍රෑමයකට රුපියල්) | 13.34 | 18.60 |
| ලාභය (අක්කරයකට රුපියල්) | 40,854 | 20,160 |

සාමාන්‍ය වී වැපිරීමේ ක්‍රමවේදයට වඩා පැරණුට් ක්‍රමයේදී නිෂ්පාදන පිරිවැය අඩු වී ලාභය දෙගුණ වන බව වාර්තා විය.

(ආ) වී වගා කරන ගොවි ප්‍රජාව අතර බිත්තර වී නිෂ්පාදනයෙහි පැහැදිලි වැඩිවීමක් නිරීක්ෂණය වනු ලැබිණි.

**වගුව 3.1.4 : ස්වයං බිත්තර වී නිෂ්පාදන සැසඳීම**

| කන්නය | **2011 යල** | **2012 යල** |
|---|---|---|
| ගොවීන් සංඛ්‍යාව | 622 | 1013 |
| ප්‍රමාණය (හෙක්ටයාර) | 49 | 100 |

(ඉ) අලුත් ප්‍රදේශයන්හි අවාරයට වෙනත් ක්ෂෙත්‍ර බෝග වගාව

2012 යල කන්නයේදී නාගදීපය සහ බද්මෙදිල්ල - බදුලුඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වී වගා කරන ප්‍රදේශයන්හිදී නිදර්ශන කිහිපයක්ම සිදු කරනු ලැබිණි.

**වගුව 3.1.5 : නව ප්‍රදේශයන්හි අවාරයට වෙනත් ක්ෂේත්‍ර බෝග වගාකිරීමේ ප්‍රතිඵල**

| **බෝගය** | **නිදර්ශන සංඛ්‍යාව** | **ප්‍රමාණය (අක්කර)** | **සාමාන්‍ය අස්වැන්න (අක්කරයකට කිලොග්‍රෑම්)** |
|---|---|---|---|
| රතු ලූනු | 40 | 01 | 8000 |
| ලොකු ලූනු | 36 | 4 | 4000 |
| ලොකු ලූනු (බීජ නිෂ්පාදනය) | 23 | ¼ | 107 |

## අන්තර් පළාත් ප්‍රදේශ - අම්පාර

### හැදින්වීම

කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ අන්තර් පළාත් ප්‍රදේශය උහන, දමන, අඩලච්චේන, සමන්තුරේ යන කෘෂිකාර්මික පරිපාලන අංශ 4කින් සමන්විත වේ. මෙම අංශ 4 ට, ගොවිජන සේවා මධ්‍යස්ථාන 25ක්, කෘෂිකාර්මික උපදේශක කලාප 85ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 16ක් සහ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 430කින් සමන්විත වේ. මෙම ප්‍රදේශයේ වගාකරන ප්‍රධාන බෝගය වී වන අතර බඩඉරිඟු, මුං ඇට, කව්පි, රටකජු සහ මිරිස් ප්‍රධාන ක්ෂේත්‍ර බෝග ලෙස වගාකරනු ලැබේ. මෙම අන්තර් පළාත් ප්‍රදේශවල වගාකරනු ලබන ප්‍රධාන එළවළු

වර්ග වන්නේ රාබු, බණ්ඩක්කා, කරවිල, පතෝල, මෑ කරල්, බටු සහ තක්කාලි වේ. මෙයට අමතරව කෙසෙල්, පැපොල්, අන්නාසි සහ අඹ යන ප්‍රධාන පළතුරු බෝග වගාකරනු ලැබේ.

**වගුව 3.1.6 : 2012 වසරේදී වගා කන්න 2හිදී එළවළු වගාව**

| එළවළු | බෝග කන්නය (හෙක්ටයාර) | |
|---|---|---|
| | යල | මහ |
| රාබු | 6 | 105 |
| බණ්ඩක්කා | 140.2 | 194 |
| කරවිල | 57.2 | 153 |
| පතෝල | 92 | 135 |
| වැටකොළු | 64.5 | 167 |
| මෑ කරල් | 90.15 | 178 |
| බටු | 108.7 | 299 |
| තක්කාලි | 540 | 12.8 |

## 2012 යල කන්නයේදී ජයග්‍රහණය

අම්පාර අන්තර්පළාත් ප්‍රදේශයේ මහ කන්නයේදී ප්‍රධාන වශයෙන් මිරිස් වගා කෙරේ. 2012 වර්ෂයේ කන්න 2කේදී මිරිස් වගාකිරීම ප්‍රවර්ධනය කිරිම උදෙසා වැඩපිළිවෙලක් දියත් කරනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2012 මහ කන්නයේදී හෙක්ටයාර 510ක්ද 2012 යල කන්නයේදී හෙක්ටයාර 182ක්ද වගා කරනු ලැබිණි.

ගොවි ප්‍රජාව විසින් කාබනික පොහොර නිෂ්පාදනය අත් කරගත් තවත් වැදගත් ජයග්‍රහණයකි. 2012 වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය යන කටයුතු වල ගොවි පවුල් 10,000ක් නිරත වනු ලැබිණි. කාබනික පොහොර මෙට්‍රික් ටොන් 20,000ක් නිෂ්පාදනය කරනු ලැබිණි.

## අන්තර් පළාත් ප්‍රදේශය මොණරාගල

මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශයහට සියඹලාන්ඩුව, ඔක්කම්පිටිය, ඇතිමලේ තෙලුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයන් ඇතුළත් වේ. මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශයෙහි ඇතිමලේ, කොටියාගල, මුතුකණ්ඩිය, හඳපානාගල ප්‍රධාන වාරිමාර්ග වැව් වන අතර වී වගා කරන්නා වූ සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර 2984කි. වගා කරන්නාවූ ප්‍රධාන බෝගය වී වන අතර දෙවන ප්‍රධාන බෝගය බඩඉරිඟු වේ. 2012 වර්ෂය තුළදී එදිනෙදා තාක්ෂණ වැඩසටහන් වලට අමතරව ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන් පහත පරිදිය.

## වී වැපිරීමේ බීජ පැල විසුරුම් ක්‍රමය

මුතුකණ්ඩිය කෘෂිකාර්මික උපදේශක කලාපය තුළ බීජ පැල විසුරුම් ක්‍රමය යටතේ කුඹුරු ඉඩම් අක්කර 35ක් වගා කරනු ලැබීය. සාමන්‍ය වී වැපිරීමේ ක්‍රමයට

සාපේක්ෂව මෙම ක්‍රමය යටතේ 20%කින් අස්වැන්න වැඩිවිය.

## ව්‍යාපාරයක් ලෙස කෘෂිකර්මාන්තය

ගොවි ව්‍යාපාර පාසල් වැඩසටහන යටතේ ගොවීන් 40ක් පුහුණු කරනු ලැබ කෘෂිකර්මාන්තය ව්‍යාපාරයක් බවට පත්කරමින් ඔවුන්ගේ අනාගත භාවිතය උදෙසා ව්‍යාපාරික සැලසුම් සකස් කරනු ලැබිණි. මෙයට අමතරව මූලික කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව කෘෂි සේවා පියස කළමනාකරුවන් (කෘෂි අලෙවි මධ්‍යස්ථාන) පුහුණු කරනු ලැබිණි. (දින 5ක පුහුණු වැඩසටහන)

## වෙනත් ක්ෂේත්‍ර බෝග වැඩසටහන්

වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව ශක්තිමත් කිරීම උදෙසා වැඩසටහනක් හෙක්ටයාර 512ක භූමි ප්‍රමාණයක ක්‍රියාත්මක කෙරිණි. මේ යටතේ මුං ඇට, උඳු, කුරක්කන්, තල, මිරිස් ලොකු ලූනු (අවාරයට) 2012 යල කන්නයේදී ප්‍රවර්ධනය කරනු ලැබිණි. වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීමට යොමු කිරීම උදෙසා තෝරාගත් ගොවීන් අතර පහත ද්‍රව්‍ය බෙදා දුණි.

බීජ වල තත්ත්වය ප්‍රවර්ධනය කිරීම උදෙසා ටාර්පෝලින් ෂීට් බෙදා හරිනු ලැබිණි. මෙයට අමතරව නිෂ්පාදනයන්හට වැඩි අගයක් ලබාදීම උදෙසා ඇඹරුම් යන්ත්‍ර, විසුරුම් වාරික්‍රම පද්ධති, කාෂිරසායන සහ බීජ (ලොකු ලූනු, බඩ ඉරිඟු සහ මිරිස් පමණක්) ද බෙදා දුණි.

මිරිස් (කොළ හකුළුවන දළඹු සංකීර්ණයේ පාලනය කිරීම, කෘමි විකර්ෂක සහ මලු වගා රෝපණය හඳුන්වාදීම) සහ ඉරිඟු බීජ (පැල අතර ඉඩ පවත්වා ගනිමින් පේළියට වගාකිරීම හඳුන්වාදීම උදෙසා වැටි භාවිතය) උපයෝගී කොට ගෙන නිදර්ශන පැවැත්වීය. එම බෝගයන් මුදල් බෝග වුවද ගොවි ප්‍රජාව විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත තාක්ෂණයන් භාවිතා කර නොමැත.

## අන්තර් පළාත් ප්‍රදේශය - අනුරාධපුර

## හඳුන්වාදීම

අනුරාධපුර, කුරුණෑගල, මාතලේ සහ පුත්තලම දිස්ත්‍රික්ක යන්හි ප්‍රධාන වාරි ක්‍රම 12ක් අනුරාධපුර අන්තර් පළාත් ප්‍රදේශය මඟින් ආවරණය කෙරේ. එම ප්‍රදේශයට කෘෂිකර්ම උපදේශක අංශ 35ක් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 175ක් ඇතුළත් වේ. 2012 වර්ෂය තුළදී එදිනෙදා ක්‍රියාත්මක වන තාක්ෂණික වැඩසටහන් වලට අමතරව ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන් පහත පරිදි වේ.

## 2012 වර්ෂයේ සුවිශේෂ ජයග්‍රහණයන්

### තුන්වන කන්නය තුළදී මුං ඇට වගාව

2011/ 2012 මහ කන්නයේ වී වගාවේ අස්වැන්න නෙලාගත් වහාම එම කුඹුරු ඉඩම් වල වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රාජාංගනය යෝජනා ක්‍රමය හා එක්ව මුං ඇට වගා කෙරිණි. ගොවීන් 250 දෙනෙකු තෝරා ගනු ලැබූ අතර 50% ගොවි දායකත්වය සමඟ රජය මඟින් බීජ ලබාදෙනු ලැබිණි. බීජ පෙලට සිටුවීම බීජ විසුරුවීම වැනි විවිධ බීජ රෝපණ ක්‍රම උපයෝගි කර ගැණිනි. බෝග කළමනාකරණය අවම මට්ටමට පැවතිණි. බීජ මිලදී ගැනීමේ සිට අස්වැන්න ලබාගැනීම තෙක් වැය වූ පිරිවැය අක්කරයකට රු 5000කි. වාර්තා වූ ආදායම අක්කරයකට රු.40,000ක් විය.

## ලොකු ලූනු බීජ නිෂ්පාදන වැඩසටහන සහ ලොකු ලූනු වගාව

රහත්ගලදී 2012 වර්ෂයේ මව් බල්බ 45000 Kg ක් වසන්තීකරණයට භාජනය කළ අතර ලොකු ලූනු බීජ නිෂ්පාදනය කිරීම උදෙසා ගොවීන් දිරිමත් කිරීමට එම බීජ ගොවීන් 1200 දෙනෙකු අතර බෙදා දුණි. ගොවීන්ගේ එම උත්සහයට ආධාර කිරීම උදෙසා පොලිතීන්, දැල් සහ ප්ලාස්ටික් පෙට්ටි සපයන ලදී. හොඳ තත්ත්වයේ බීජ 4500 Kg කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරිණි. මෙමඟින් 2012 යල කන්නයේදී ලොකු ලූනු හෙක්ටයාර 300කට වඩා වැඩි ප්‍රමාණයක් වගා කිරිමට හැකි විය. සත්‍ය බීජ අස්වැන්න කිලෝග්‍රෑමයක් රු 10000 කට වැඩි මිලකට ගොවීන් විසින් අලෙවි කරනු ලැබීය. මෙම ලූනු බීජ නිෂ්පාදනය ලාභදායී බව ගොවීහු හඳුනා ගත්තෝය.

## PEACE (Pro – poor Economic Advancement & Community Enhancement Project) ව්‍යාපෘතිය

අඹ හෙක්ටයාර 16ක් සහ දොඩම් හෙක්ටයාර 5ක් වාණිජ පළතුරු බෝග වගා වැඩසටහන යටතේ ස්ථාපිත කෙරිණි. දැනට පවතින අඹ වතු නැවත සකස් කිරීම උදෙසා කප්පාදු කිරීමේ උපකරණ 50ක් බෙදා දුණි. රෝපණ ද්‍රව්‍ය රජයේ 50%ක දායකත්වය යටතේ කර්තකොලොම්බන් වලට අමතරව අපනයන වෙළඳපොල සඳහා උසස් ගුණාත්මක තත්ත්වයෙන් TOM ETC අඹ ප්‍රභේදය ගොවීන් හට හඳුන්වා දෙනු ලැබීය. රාජාංගනය වම් හා දකුණු ඉවුරු වන නාච්චදූව සහ නුවරවැව හි තෝරාගත් ගොවීන් උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි.

## දැයට කිරුළ 2012

අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2012 දැයට කිරුළ ප්‍රදර්ශනය හා සමගාමීව ආදර්ශ ගම්මාන 10ක් පිහිටවනු ලැබිණි. ආදර්ශ ගෙවතු පිහිටුවීම, ගෙඋයන් සංවර්ධනය, දැනට පවතින පලතුරු වතු කප්පාදු කිරීම, ජලජ වල් පැළෑටි පාලනය, මී මැසි පාලනය, වී වැපිරීමේදී විසුරුම් ක්‍රමවේදය ප්‍රවර්ධනය, යන ක්‍රියාවලීන් මෙම ආදර්ශ ගම්මානයන්හිදී සිදු කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියෙන් ගොවීන් 1000කට වැඩි ප්‍රමාණයකට ප්‍රතිලාභ අත්විණි.

## වී වැපිරීමේ බීජ පැල විසුරුම් ක්‍රමය

2008 වර්ෂයේ නිදර්ශන මට්ටමෙන් මෙම තාක්ෂණය වගා පිරිවැය අවම කිරීමත්, වැඩි අස්වැන්නක් ලබා ගැනීමත් උදෙසා හඳුන්වාදෙනු ලැබිණි. මෙම ක්‍රමය උපයෝගී කොට 2012 යල කන්නයේදී හෙක්ටයාර 2000ක කුඹුරු ප්‍රමාණයක් වගා කරනු ලැබිණි.

## පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශ

### හැඳින්වීම

මෙම පොළොන්නරුව අන්තර්පළාත් ප්‍රදේශය හට සහකාර කෘෂිකාර්මික අධ්‍යක්ෂ කලාප 3ක්ද, ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් සහ කෘෂිකාර්මික උපදේශක කොට්ඨාශ 30ක්ද අයත් වේ. පළමු කෘෂිකාර්මික පරිපාලන අංශයට මැදිරිගිරිය හා හිඟුරක්ගොඩ කෘෂි ගොවිජන සේවා මධ්‍යස්ථාන 2කද, දෙවන කෘෂිකාර්මික පරිපාලන අංශයට ඇලහැර සහ ගිරිතලේ කෘෂි ගොවිජන සේවා මධ්‍යස්ථානද තුන්වන කෘෂිකාර්මික පරිපාලන අංශයට සේවාගම පුලස්තිගම සහ ගලමුණ යන කෘෂි ගොවි ජන සේවා මධ්‍යස්ථානද ඇතුළත් වේ. මෙම අන්තර් පළාත් ප්‍රදේශ වල පිහිටි ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම වන්නේ පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, කවුඩුල්ල සහ මින්නේරියයි. මෙම අන්තර් පළාත් ප්‍රදේශ හට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 5ක් සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 190ක් අයත් වේ. පොළොන්නරුව අන්තර් පළාත් සම්පූර්ණ

භූමි ප්‍රමාණය හෙක්ටයාර 96000 වන අතර අයත් ගොවි පවුල් සංඛ්‍යාව 46092 කි. වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 34739 කි. ප්‍රධාන බෝගය වන වී වලට අමතරව වෙනත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පළතුරු බෝග වගා කෙරේ.

## 2012 වර්ෂයේ සුවිශේෂී ජයග්‍රහණයන්

### තරුණ සහභාගිත්වය

මධ්‍යම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි තරුණ ගොවි සමාජ ප්‍රධාන කාර්යාලය මඟින් පවත්වනු ලැබූ ජාතික ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ අභියෝග්‍යතා කුසලානය පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශය නියෝජනය කළ තරුණ ගොවි සමාජ සමාජිකයෝ ජයග්‍රහණ අත් කර ගත්හ. පුලස්තිගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දෙබරුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ “දිවුලගිරිය” තරුණ ගොවි සමාජයේ සාමාජිකයෝ සාමුහික ගොවිපලක් ක්‍රියාත්මක කර වී, බඩඉරිඟු, මිරිස් සහ පැණි කොමඩු නිෂ්පාදනය කළහ. පැයකට වී බුසල් 75ක වී සුද්ද කිරීමේ හැකියාවක් සහිත විදුලියෙන් ක්‍රියාත්මක කළ හැකි වී පිරිසිදුකරණය විදුලියෙන් ක්‍රියාත්මක වන තනි පේළි පොලිසැක් මලු මුද්‍රා තබන යන්ත්‍රය සහ බීජ ගබඩා කිරීම උදෙසා පොලිසැක් මලු ලබා ගැනීමට පළාත් සංවර්ධන අරමුදල මඟින් 50% ක මූල්‍ය දායකත්වයක් ලබා දෙමින් උතුරු මැද පළාත මෙම සමාජය කෘෂිකර්මාන්තයට සිදුකළ විශිෂ්ඨ වූ දායකත්වය වෙනුවෙන් තිළිණ ප්‍රදානය කෙරිණි. උතුරු මැද පළාත මඟින් මෙම කර්තව්‍යය උදෙසා සිදු කළ දායකත්වය රු. 65,000කි. (ප්‍රදානය කළ සියලුම උපකරණ වල සම්පූර්ණ වටිනාකමින් 50% කි.)

### ආදර්ශ ගම්මාන වැඩසටහන

කෘෂිකාර්මික පරිපාලන අංශ 3හි සුවිශේෂ වූ කෘෂිකාර්මික හැකියාවන් උපරිමව අත්පත් කර ගැනීම උදෙසා ආදර්ශන ගම්මාන 44ක් වැඩිදියුණු කරනු ලැබිණි. පොළොන්නරුවේ අන්තර් පළාත් ප්‍රදේශ කෘෂිකාර්මික ප්‍රජාව අතර කෘෂිකාර්මික තාක්ෂණයන් ව්‍යාප්ති කෙරිණි. මී මැසි පාලන ගම්මාන 5ක් පළතුරු වගා ගම්මාන 10ක්, විසුරුම් ක්‍රමය මගින් වී වපුරන්නා වූ අක්කර ¼ වන කුඹුරු ඉඩම් 370ක් සහ ගෙවතු 560ක් මෙම ආදර්ශ ගම්මාන 44ට ඇතුළත් වේ. 2012 වර්ෂය තුළදී එක් එක් කෘෂිකාර්මික පරිපාලන අංශයෙහි හොඳම ආදර්ශ ග්‍රාමය තෝරනු ලැබීය. තෝරා ගත් ආදර්ශ ගම්මානවල කෘෂිකාර්මික උපදේශකවරුන් හට පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල (කෘෂිකාර්ම ව්‍යාප්ති) විසින් ඔවුන්ගේ කැපවීම සහ දර්ශනය වෙනුවෙන් තවදුරටත් අවශ්‍ය වන පහසුකම් යනාදිය සපයනු ලැබීය.

## සහල් අංශයේ සංවර්ධන වැඩසටහනේ සුවිශේෂී ජයග්‍රහණයන් 2012

වාර්ෂික වී වගා කරන්නාවූ භූමි ප්‍රමාණයෙන් 30% ප්‍රමාණයක් සහ ජාතික වී නිෂ්පාදනයෙන් 40%කට දායක වෙමින් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයන්ගෙන් පෝෂණය වන සහල් නිෂ්පාදනය සඳහා ඉහළ හැකියාවක් පවතින ප්‍රදේශ අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, මොණරාගල සහ හම්බන්තොට යන අන්තර් පළාත් ප්‍රදේශ මගින් මෙය ආවරණය වේ.

අන්තර් පළාත් ප්‍රදේශවල 2011/2012 මහ සහ 2012 යල කන්න වල සහල් වගා භූමි ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 184206 සහ හෙක්ටයාර 124645 විය. 2012 යල කන්නයේ ආරම්භයේදී පැවතුණු නියඟය හේතුවෙන් ඉලක්ක ගත සහල් වගා කුඹුරු

ප්‍රමාණය වගා කිරීමට නොහැකි විය. පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශයේ හෙක්ටයාර 7614 ක් ද මොණරාගල අන්තර් පළාත් ප්‍රදේශයේ හෙක්ටයාර 241ක්ද ඇතුළත් සම්පූර්ණ හෙක්ටයාර 7855ක අන්තර් පළාත් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් නියඟය අඛණ්ඩව පැවතීම හේතුවෙන් විනාශ විය. කෙසේ වුවද අන්තර් පළාත් ප්‍රදේශ 2011 / 2012 මහ කන්නයේදී සහල් මෙට්‍රික් ටොන් මිලියන 1.01ක් ද 2012 යල කන්නයේදී මෙට්‍රික් ටොන් මිලියන 0.66ක් ද නිෂ්පාදනය කෙරිණි.

සාමාන්‍ය සහල් අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 5කට වැඩි ප්‍රමාණයක්ද, සහල් සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයට රුපියල් 13 දක්වා අඩු කිරීමද පාරිසරික උපද්‍රව්‍ය අවම කිරීමද මෙම අන්තර් පළාත් ව්‍යාප්ති වැඩසටහනෙහි අරමුණු වේ. බෝග ස්ථාපිත කිරීමේදී බීජ විසුරුම් ක්‍රමය (පැරශූට් ක්‍රමය), පසෙහි සාරවත් බව ප්‍රවර්ධන කිරීම උදෙසා සමෝධානික පැළෑටි පෝෂක කළමනාකරණ පිළිවෙත් සහ පළිබෝධහානිය අවම කිරීම සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම ඉහත අරමුණු ලඟා කර ගැනීම උදෙසා අනුගමනය කළ ක්‍රමෝපායන් විය. උසස් තත්ත්වයේ බීජ සහල් ලබා ගත හැකි බව ඉහළ දැමීම උදෙසා ද්විතිය බීජ ගොවිපල ස්ථාපිත කිරීමත් ස්වයං බිත්තර වි බීජ නිෂ්පාදන වැඩසටහන් ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරනු ලැබිණි. මෙයට අමතරව අන්තර් පළාත් ප්‍රදේශවල වල් වී වැවීම පාලනය කිරීම උදෙසා විශේෂ දැනුවත් වීමේ වැඩසටහන් පවත්වනු ලැබිණි.

## සේවා සංස්කරණ පුහුණු ආයතනය

## ගන්නෝරුව

ජාතික මට්ටමේ ප්‍රධාන කෘෂිකාර්මික පුහුණු ආයතනය, ගන්නෝරුව සේවා සංස්කරණ පුහුණු ආයතනය වන අතර කෘෂිකර්ම නිලධාරීන්, ව්‍යවසායකයින් ගොවීන් සහ කෘෂිකර්මාන්තය සම්බන්ධ උනන්දුවක් දක්වන්වන්නා වූ අනෙකුත් පුද්ගලයන්ගේ හැකියාව සහ ආකල්ප වර්ධනය මෙම ආයතනය සතු වගකීම වේ.

2012 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 127ක් පවත්වනු ලැබූ අතර (මිනිස් දින 14,025) මෙයින් 82ක් කෘෂිකර්ම නිලධාරීන් (මිනිස් දින 12603) සඳහාද 11ක් ගොවීන් සඳහා (මිනිස් දින 529) සහ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 34ක් ද (මිනිස් දින 893) ද පවත්වනු ලැබිණි. මෙයට අමතරව වැඩමුළු/සමුළු/රැස්වීම්/ සම්මුඛ සාකච්ජා 109ක් (මිනිස් දින 10594) පවත්වනු ලැබිණි.

## සේවා සංස්කරණ පුහුණු ආයතනය අඟුණකොලපැලැස්ස

මෙය දකුණු පළාතේ පිහිටුවා ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතන වලින් එකකි. නිලධාරීන්ගේ ව්‍යවසායකයින්ගේ, ගොවීන්ගේ සහ කෘෂිකර්මය පිළිබඳ උනන්දුක් දක්වන අනෙකුත් පුද්ගලයින්ගේ දැනුම හැකියාව සහ ආකල්ප වර්ධනය මෙම ආයතනයේ වගකීම වේ. ගාල්ල, මාතර, හම්බන්තොට පළාත් දිස්ත්‍රික්ක සහ හම්බන්තොට අන්තර් පළාත් ප්‍රදේශයන්හි ඉහත කණ්ඩායම් සඳහා ආයතනය පුහුණු අවස්ථා ලබා දේ. වසර තුළදී පුහුණු වැඩසටහන් 74ක් පවත්වනු ලැබූ අතර (මිනිස් දින 3012) මෙයට නිලධාරීන් සඳහා වැඩසටහන් 55ක් (මිනිස් දින 1914) සහ ගොවීන් සඳහා වැඩසටහන් 11ක් ද (මිනිස් දින 660) ද, ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 08ක්ද (මිනිස් දින 438), වැඩමුළු/ සමුළු/ රැස්වීම්/ සාකච්ජා 7ක්ද (මිනිස් දින 287ක්) පවත්වනු ලැබිණි.

## සේවා සංස්කරණ පුහුණු ආයතනය හංසයාපාලම - අරලගන්විල

අරලගන්විල සේවා සංස්කරණ පුහුණු ආයතනය මහවැලි "බී" කලාපයේ පිහිටා ඇති අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ව්‍යාප්ති නිලධාරින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්, වෙනත් රජයේ නිලධාරීන්,රාජ්‍ය නොවන නිලධාරීන්, ගොවීන් සහ මහවැලි "බී", "සී", "ඩී", "ජී" කලාපයේ ව්‍යවසායකයින් සහ අම්පාර සහ පොළොන්නරුව අන්තර් පළාත් ප්‍රදේශ සඳහා පුහුණු වැඩසටහන් පවත්වයි.

ආදර්ශ ගොවිපළ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, තාක්ෂණික ප්‍රකාශන සහ සයිබර් තාක්ෂණය මෙම පුහුණු වැඩසටහන් සඳහා මෙවලම් ලෙස උපයෝගී කරගනු ලබමින් සිටී. මෙම වර්ෂය තුළදී තරුණ ගොවීන් උදෙසා ලාභදායී සහ ස්වයං චිරස්ථායී වාණිජ ආදර්ශ ගොවිපළ පිහිටුවීමට අපේක්ෂිතය. 2012 වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් 64ක් (මිනිස් දින 2053 ක්) පවත්වනු ලැබූ අතර මේ අතරින් නිලධාරීන් උදෙසා වැඩසටහන් 19ක්ද (මිනිස් දින 685), ගොවීන් සඳහා වැඩසටහන් 12ක්ද (මිනිස් දින 244) ක්ෂේත්‍ර පුහුණු වැඩසහන් 33ක්ද (මිනිස් දින 1125) පවත්වනු ලැබිණ. මෙයට අමතරව ගොවි සංවර්ධන වැඩසටහන් සහ ඉඩම් සංවර්ධන වැඩසටහන් යටතේ ගොවිපල දියුණු කිරීම තුළින් මධ්‍යස්ථානය තවදුරටත් ශක්තිමත් කෙරිණ.

## ගොවි යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය

ගොවි යාන්ත්‍රීකරණ හා පුහුණු මධ්‍යස්ථානය අනුරාධපුරයේ පිහිටා ඇති අතර එය ගොවි යාන්ත්‍රීකරණ පිළිබඳව හුදෙක් ජාතික මට්ටමේ පුහුණු ආයතනයකි.

ප්‍රධාන වශයෙන් පහත ක්ෂේත්‍ර පිළිබඳව පුහුණු කිරීම ගොවි යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථාන සතුව වගකීම පැවරේ.

- රෝද 4 ට්‍රැක්ටර් ක්‍රියාකරවීම සහ නඩත්තුව - දින 10
- රෝද 2 ට්‍රැක්ටර් ක්‍රියාකරවීම සහ නඩත්තුව - දින 5
- ජල පොම්ප ක්‍රියාකරවීම සහ නඩත්තුව - දින 2
- ඉසිනයන් ක්‍රියාකරවීම සහ නඩත්තුව - දින 2
- ඒකාබද්ධ අස්වනු නෙලනය ක්‍රියාකරවීම සහ නඩත්තුව - දින 2
- ක්ෂුද්‍ර වාරික්‍රමය හැඳින්වීමේ පාඨමාලාව - දින 2
- ක්ෂුද්‍ර වාරික්‍රමය සැලසුම් පාඨමාලාව - දින 5
- කෘෂිකාර්මික අත් මෙවලම්
- ගෙවතු වගාව

2012 වර්ෂය තුළදී ගොවි යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය පුහුණු වැඩසටහන් 68 ක් (මිනිස් දින 6097) පවත්වනු ලැබූ අතර මෙම වැඩසටහන් අතරට නිලධාරීන් උදෙසා වැඩසටහන් 21ක්ද (මිනිස් දින 858), ගොවීන් සඳහා වැඩසටහන් 12ක්ද (මිනිස් දින 508), විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන්, කාර්මික විද්‍යාල සහ කෘෂිකර්ම විද්‍යාල සඳහා පුහුණු වැඩසටහන් 35ක්ද (මිනිස් දින 4731) ඇතුළත් වේ.

මෙයට අමතරව ගොවි යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය, ගොවි යාන්ත්‍රීකරණ හා සම්බන්ධ ව්‍යාප්ති කටයුතු ඉටුකිරීමේදී ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් හට අවශ්‍ය සහයෝගය ලබා දෙන අතර අවශ්‍ය ආයතනයන් උදෙසා ගොවි යාන්ත්‍රීකරණ පිළිබඳ උපදේශ ද ලබා දෙයි.

මෙයට අමතරව ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය ජ්‍යෙෂ්ඨ ස්වේච්ඡා නිලධාරියෙකු හරහා ජපානයේ යන්මාර් පෞද්ගලික සමාගම මඟින්

රුපියල් 1469421.00 (FoB මිල) වටිනාකමකින් යුත් වී උදුරා පැල සිටුවීමේ යන්ත්‍ර 3ක්, අස්වනු නෙලීමේ යන්ත්‍ර 2ක්, වල්පැල උදුරනයක් සහ පැල තවාන් තැටි 400ක් පරිත්‍යාග කරනු ලැබීය. ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනයේ ශ්‍රී ලංකා කාර්යාලීය මගින් රුපියල් 2881635.00 වටිනා රෝද දෙකේ ට්‍රැක්ටර් 3ක්,මෙවලම් කට්ටලයක් සහ අමතර කොටස් කට්ටලයක් පරිත්‍යාග කරනු ලැබිණි.

## උද්‍යාන බෝග පුහුණු සහ සංවර්ධන ආයතනය - බිබිල

බිබිල කෘෂිකර්ම විද්‍යාලය සහ බිබිල උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ ගොවිපල යන ආයතන 2ක ඒකාබද්ධ කිරීම මගින් 2003 අප්‍රේල් 01 වන දින උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය පිහිටවනු ලැබිණි. මෙම ආයතනය මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිලේ පිහිටා ඇත. (කෘෂි පාරිසරික කලාප I $L_2$ )

මෙම ආයතනයේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- උද්‍යාන බෝග පිළිබඳ නව තාක්ෂණයන් හඳුන්වාදීම සහ ලාභදායී ලෙස වෙළඳ ගොවිපල නඩත්තු කිරීම.
- නව තාක්ෂණයන් උපයෝගී කොට විවිධ පළතුරු පැල නිෂ්පාදනය
- පළතුරු බෝග ක්ලෝන සංරක්ෂණය
- රජයේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්, ගොවීන් සහ පාසල් හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සඳහා නව තාක්ෂණයන් සමඟ පුහුණු වැඩසටහන් අඛණ්ඩව පැවැත් වීම.
- පුහුණු පදනම් නිදර්ශන ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම සහ නඩත්තුව
- නව නිර්දේශයන් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ

ආයතනය මගින් ලබාදෙන්නා වූ සේවාවන්හි ගුණාත්මක තත්ත්වය ප්‍රවර්ධනය උදෙසා ගොවිපල කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ කාර්යාල උපකරණ සපයාදීම, ගොවිපල අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය සහ ගොවිපල වටා වැටවල් ඉදිකිරීම වැනි කටයුතු ක්‍රියාත්මක කිරීම මඟින් ආයතනය තවදුරටත් ශක්තිමත් කරනු ලැබිණි.

2012 වර්ෂයේ ආයතනය මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

- කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදක සහකාරවරුන් සඳහා එක් වසරක පුහුණු වැඩසටහන් යටතේ නිලධාරීන් 62 (කණ්ඩායම් 2ක් යටතේ) පුහුණු කරනු ලැබිණි.
- ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරීන් 20 දෙනෙක් සඳහා දින 5ක පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණි.
- පැල තවාන්කරුවන් 40 දෙනෙක් සඳහා දින 2 පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබිණි.
- පළතුරු වගා ක්‍රමෝපායන් පිළිබඳ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 150 දෙනෙකු පුහුණු කරනු ලැබිණි.

මෙයට අමතරව බීජ පැළ 12,000ක් සහ බද්ධ පැල 28000ක් සකස් කරනු ලැබිණි.

2012 වර්ෂයේ ක්‍රියාත්මක කළ ගොවි සංවර්ධන වැඩසටහන යටතේ විවිධ බෝග හෙක්ටයාර 16.3ක ගොවි ඉඩම් ප්‍රමාණයක වගා කරනු ලැබිණි. වී හෙක්ටයාර 7.6කද, මිරිස් හෙක්ටයාර 0.8 කද, රටකජු හෙක්ටයාර 1කද, කෙසෙල් හෙක්ටයාර 1කද, රඹුටන් හෙක්ටයාර 0.6ද, වැල් දොඩම් හෙක්ටයාර 0.6කද, අන්නාසි හෙක්ටයාර 1කද, දොඩම් හෙක්ටයාර 2කද, අඹ හෙක්ටයාර 0.5කද, සෝයා බෝංචි හෙක්ටයාර 1.2කද වගා කරනු ලැබිණි. මෙයට අමතරව දිස්ත්‍රික්ක කෘෂිකර්ම අධ්‍යක්ෂ හරහා ලැබූ අරමුදල්

යටතේ අන්නාසි හෙක්ටයාර 1.6ක්ද, දොඩම් හෙක්ටයාර 0.8ක්ද වගා කෙරිණි.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - වීරවිල

මෙම දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය පහතරට වියලි කලාපයේ පිහිටා වනු ඇත. (DL 5 –DL 16). ලුණුගම්වෙහෙර ජනපද පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ 1986 දී මෙම මධ්‍යස්ථානය පිහිටුවනු ලැබීය. ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ මාර්ගෝපදේශය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය ගොවි ප්‍රජාව, පාසල් සිසුන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනත් රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි නිලධාරීන්ගේ පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන්නේය.

2012 වර්ෂය තුළදී කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර වරුන් 42 දෙනෙකු සඳහා එක් අවුරුදු පුහුණු වැඩසටහනක්ද, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් 13ක්ද (මිනිස් දින 288) සහ වැඩමුළු 05ක්ද (මිනිස් දින 196) පවත්වනු ලැබිණි.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - අම්පාර

2012 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් 53ක් බාරගනු ලැබු අතර (මිනිස් දින 2070) මෙයට නිලධාරීන් පුහුණු වැඩසටහන් 13ක්ද (මිනිස් දින 714), ගොවි පුහුණු 17ක්ද (මිනිස් දින 430) සහ ක්ෂේත්‍ර පුහුණු 07ක්ද (මිනිස් දින 653), ක්ෂේත්‍ර නැරඹුම් ගොවීන් හට පුහුණු 11ක්ද (මිනිස් දින 143) සහ ගොවීන් සඳහා බාහිර පුහුණු 5ක්ද (මිනිස් දින 130) ඇතුළත් විය. මෙයට අමතරව වෙනත් විවිධ හේතුන් මත තවත් වැඩමුළු 18ක් (මිනිස් දින 529ක්) පවත්වනු ලැබිණි.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව

පොළොන්රුව දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය දිස්ත්‍රික්කයේ ගොවීන් සහ නිලධාරීන්ගේ කෘෂිකර්ම තාක්ෂණික පුහුණු අවශ්‍යතා සපුරාලයි. මධ්‍යස්ථානයේ ගොවිපල අක්කර 45ක භූමි ප්‍රමාණයක් පුරා පැතිරෙන අතර විවිධ බෝග ප්‍රභේදයන් සහ විවිධ තාක්ෂණික ක්‍රමවේදයන්ට අවධානය යොමු කරමින් වී,එළවළු, පළතුරු සහ වෙනත් ක්ෂේත්‍ර බෝග ගොවිපල තුළ ආදර්ශ වශයෙන් වගා කර තිබේ.

## දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - පලමුණේ

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අධ්‍යයන ආධාර පහසුකම් යටතේ 2007 සැප්තැම්බර් 23 වන දින කාෂිකර්ම දෙපාර්තමේන්තුවට මෙම දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය බාර දෙනු ලැබිණි. ගොවීන්, අදාළ කෘෂිකර්ම නිලධාරීන්, ගුරුවරුන්, පාසල් සිසුන් සමෘර්ධිලාභීන් සහ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් හට කෘෂිකාර්මික කටයුතු වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය කෘෂිකාර්මික තාක්ෂණයන් පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු දෙමළ මාධ්‍යයෙන් ලබාදීම මෙම මධ්‍යස්ථානයේ අරමුණයි.

මධ්‍යස්ථානය සතු අක්කර 1ක භූමි ප්‍රමාණයෙන් අක්කර 0.75 ක ප්‍රමාණයක් නිදර්ශන ක්ෂේත්‍ර ලෙස වෙන් කර ඇත. 2012 වර්ෂය තුළදී සම්පූර්ණ පුහුණු වැඩසටහන් 33ක් (මිනිස් දින 1193) බාරගනු ලැබු අතර මෙයට නිලධාරී පුහුණු 10ක්ද (මිනිස් දින 316), ගොවි පුහුණු 12ක්ද (මිනිස් දින 401), ක්ෂේත්‍ර පුහුණු 07ක්ද (මිනිස් දින 228), කෘෂි රසායන අලෙවියේ නියුතු පුද්ගලයින් සඳහා පුහුණු 2ක්ද (මිනිස් දින 191) සහ පාසල් සිසුන්

සඳහා පුහුණු 2ක්ද (මිනිස් දින 57) පවත්වනු ලැබිණි.

## කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන

ජීවන තත්ත්වය සහ පවුල් ඒකකය තුළ පෝෂක මට්ටම ප්‍රවර්ධනය තුළින් කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා කාන්තා දායකත්වය ඉහළ දැමීම කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහනෙහි මෙහෙවර වේ. කාන්තාව ඉලක්ක කර ගනිමින් නිවස තුළ ආදායම් උත්පාදනය ආරම්භ කිරීමත් නිවස තුළ වඩාත් උචිත පරිසරයක් ගොඩනැංවීමත් මෙම වැඩසටහනෙහි අරමුණු වේ. එක් එක් කෘෂිකාර්මික පරිපාලන දිස්ත්‍රික්කය තුළ වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාලයට අනුයුක්තව සිටිනු ලබන කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති නිලධාරීන් මගින් මෙම වැඩසටහන මූලික මට්ටමේදී ක්‍රියාත්මක කරනු ලබයි.

## 2012 වර්ෂයේ ව්‍යාප්ති ක්‍රියාවලීන්

2012 වර්ෂය තුළදී කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන පිළිබඳව දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරීන් 948 දෙනෙකු පුහුණු කරනු ලැබීය. ආහාර හා පෝෂණය, ව්‍යවසායික සංවර්ධනය පිළිබඳව ගොවි කාන්තාවන් 5104 දෙනෙකු පුහුණු කරනු ලැබිණි. මෙයට අමතරව කාන්තා සංවිධාන 140ක් පිහිටවනු ලැබිණි. ගෙවතු වගාව සහ මුළුතැන්ගෙය ප්‍රවර්ධනය තුළින් පවුල් ඒකක 1653ක් වැඩිදියුණු කෙරිණි. කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන පිළිබඳව ප්‍රකාශන 3ක්, රූපවාහිනී වැඩසටහන් 03ක්, අධ්‍යයන චාරිකා 16ක්, වෙනත් ව්‍යාප්ති වැඩසටහන යටතේ පවත්වනු ලැබිණි. ප්‍රදර්ශන 4කදී වෙළඳ කුටිද පවත්වාගෙන යනු ලැබිණි.

මෙම ඒකකය මගින් ඉටු කළ වෙනත් විශේෂ කාර්යයන්

- 2012 අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවත්වනු ලැබූ "දැයට කිරුළ" ප්‍රදර්ශනයේදී කාන්තා කෘෂිකාර්මික ව්‍යවසායකයින්ගේ සහභාගිත්වය ඇතුව දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන යටතේ අලෙවි ස්ථාන 5ක් සංවිධානය කරනු ලැබිණි.
- ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තු සියවස් සැමරුම් ප්‍රදර්ශනයේදී මහනුවර දිස්ත්‍රික්කයේ කාන්තා කෘෂිකාර්මික ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් නව ප්‍රවේශයක් තුළින් නැවුම් පළතුරු, එළවළු සහ පළා එළවළු පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව අලෙවි ස්ථාන 2ක් සංවිධානය කරනු ලැබිණි.
- ව්‍යවසායකයින් 29 දෙනෙකු සාර්ථකව පුහුණු කරනු ලැබ ගන්නෝරුව " A" උද්‍යානයේ පිහිටි හෙළ බොජුන් අලෙවි පියසේදී ස්වකීය දේශීය ආහාර නිෂ්පාදන අලෙවි කිරීම උදෙසා අවස්ථාවක් උදා කළේය.
- යාපනය, වවුනියා, මුලතිව්, කිලිනොච්චි සහ මන්නාරම යන උතුරු පළාතේ පිහිටි සියලුම දිස්ත්‍රික්කයන් 5හි ලෝක ආහාර වැඩසටහන යටතේ "පසු අස්වනු සහයෝගීතා ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කරනු ලැබිණි.

කාන්තා ගොවි කණ්ඩායම් හට පසු අස්වනු තාක්ෂණය, ආදායම් උත්පාදනය සහ පවුල් පෝෂණය පිළිබඳ දැනුම ලබාදීම උදෙසා සහයෝගය දැක්වීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණයි.

- මෙම ව්‍යාපෘතිය යටතේ පසු අස්වනු හැසිරවීම සහ සහල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ නිලධාරීන් 30 දෙනෙකු පුහුණු කරනු ලැබිණි.

- පසු අස්වනු තාක්ෂණය විශේෂයෙන් සහල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ නිලධාරීන් 30 දෙනෙකු පුහුණු කරනු ලැබිණි.
- ජංගම ආහාර නිරීක්ෂණ ඒකකයක් ලෙස රථ කිහිපයක් වෙනස් කරනු ලැබීම.
- විවිධ ආහාර වට්ටෝරු ඇතුළත්ව සහල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන පිළිබඳ පුහුණු අත්පොතක් සකස් කෙරිණි.

## කෘෂි ව්‍යවසායික සංවර්ධන සහ තොරතුරු සේවාව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි කාර්යභාර රාමුව තුළ අදාළ තාක්ෂණික ආධාර ලබාදෙමින් කෘෂි ආශ්‍රිත ව්‍යවසායක් ප්‍රවර්ධනය උදෙසා අවශ්‍ය සහයෝගය ලබාදීම කෘෂි ව්‍යවසායික සංවර්ධන සහ තොරුතුරු සේවාව සතු වගකීම වේ. වර්තමානයේ ආයතනය පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් ස්වකීය දායකත්වය ලබාදෙයි.

- හැකියාව සහිත ව්‍යවසායකයින් උදෙසා කෘෂි ව්‍යවසායකත්වයට අදාළ කෙටි කාලීන දැනුවත් කිරීමේ සහ හැකියා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විශේෂඥ කණ්ඩායමක් මඟින් කෘෂිකාර්මික දේපල හිමිකරුවන් සහ ආයෝජකයින් උදෙසා ගොවි ක්ෂේත්‍ර තුළදීම උපදේශක සේවාවන් ලබාදීම.
- ව්‍යවසායකයින් සහ අදාළ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත අවශ්‍ය පරිදි තාක්ෂණික තොරතුරු සහ දත්ත ලබාදීම.
- ගොවීන්හට වඩාත් විශ්වාසිදායි යෙදවුම් සහ සේවාවන් ලබාදීම උදෙසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව තාක්ෂණික සහයෝගය ලබා ගන්නා වූ “කෘෂි සේවා පියස” නම් කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.
- FOR TCP 3302 නියමු ව්‍යාපෘතියෙහි තාක්ෂණික සහ මූලික ආධාරය සමඟ “ගොවි ව්‍යාපාර පාසල්” ප්‍රවේශය හඳුන්වා දෙමින් අදාළ පුහුණු පවත්වමින් ගොවීන්ගේ ව්‍යවසායික හැකියාවන් ප්‍රවර්ධනය උදෙසා දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් හට අවශ්‍ය සහයෝගය ලබාදීම.

2012 වර්ෂය තුළදී ඒකකය පහත ජයග්‍රහණ අත්කර ගත්තේය.

- අභ්‍යාසලාභීන් 176 දෙනෙකු උදෙසා කෘෂි ව්‍යවසායික හා සම්බන්ධ පුහුණු වැඩසටහන් 10ක් පවත්වනු ලැබීය.
- ඔගස්ටා වත්ත, දොඩම්ගොල්ල සහ දංකොටුව දේපල හිමිකරුවන් දෙදෙනෙකු වෙත අක්කර 17ක් වූ ස්වකීය කෘෂිකාර්මික ඉඩම් සංවර්ධන උදෙසා ක්ෂේත්‍ර තාක්ෂණික උපදේශක සේවාවන් ලබාදුණි. මෙයට අමතරව ගොවීන් 35 දෙනෙකුගේ සහභාගීත්වය ඇතුව කෝදයන, සියඹලාණ්ඩුව යන ප්‍රදේශ වලදී ප්‍රායෝගික නිරීක්ෂණ පවත්වනු ලැබිණි.
- කුලියාපිටිය, බුත්තල, අයගම, හල්මිල්ලෙවැව, බලංගොඩ සහ වවුනියාව යන ප්‍රදේශවල නව “කෘෂි සේවා පියස” මධ්‍යස්ථාන 6ක් පිහිටවනු ලැබිණි. මූලික කෘෂිව්‍යාපාර කළමනාකරණය පිළිබඳව කළමනාකරුවන් 22 දෙනෙකු සඳහා දින 5ක විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.
- “කෘෂි ව්‍යාපාර පාසල්” වල ප්‍රධාන පුහුණුකරුවන් ලෙස දිස්ත්‍රික්ක 10ක ව්‍යාප්ති නිලධාරීන් 108 දෙනෙක් පුහුණු කරනු ලැබීය. මෙම පුහුණුව ලැබූ නිලධාරීන් ස්වකීය දිස්ත්‍රික්කයන්හි 2012 යල කන්නයේ සිට තෝරා ගත් ගොවි කණ්ඩායම් උදෙසා කෘෂි ව්‍යාපාර පාසල් පැවැත්වීමේ ක්‍රියාවලියෙහි නිරතවෙමින් සිටියි.

## මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව - බණ්ඩාරවෙල

ගොවීන් අතර මී මැසි සංවර්ධනය සහ මී මැසි පාලනය ව්‍යාප්ති කිරීමේ වගකීම මෙම මී මැසි පාලන සංවර්ධන ඒකකය සතුවේ. මෙම ඒකකය නවීන මී මැසි පාලන තාක්ෂණය ව්‍යාප්ත කිරීම උදෙසා පහත පහසුකම් සපයයි.

- ගොවීන්, නිලධාරීන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ මේ පිළිබඳව උනන්දුවක් දක්වන්නාවූ වෙනත් පුද්ගලයින් පුහුණු කිරීම.
- මී මැසි පාලන උපකරණ නිෂ්පාදනය.
- මී මැසි පාලන උපකරණ නිෂ්පාදකවරුන් පුහුණුව, ලියාපදිංචි සහ සහතිකකරණය.
- මී මැසි පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම උදෙසා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන හට අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම.
- පර්යේෂණ කටයුතු

2012 වර්ෂය තුළදී නිලධාරීන්, ගොවීන් සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් උදෙසා මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 23ක් පවත්වනු ලැබිණි. මෙයට අමතරව මී මැසි පාලන උපකරණ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 2ක්ද පවත්වනු ලැබිණි.

මෙයට අමතරව මෙම ඒකකය මී පැණි කිලෝග්‍රෑම් 450, මී මැසි කොලනි 240, මී මැසි පෙට්ටි 486, දුම් විසුරවන 280, පිලාරාමු 352, පැණි රාමු 265ක්, රුජිණ ගේට්ටු 2991ක් නිෂ්පාදනය කළේය. "දිවි නැගුම" වැඩසටහන යටතේ ඒකකයෙන් පිටත පුහුණු වැඩසටහන් 6ක් පවත්වනු ලැබු අතර මී මැසි පාලන උපකරණ 7000ක් සහතික කරනු ලැබිණි. මෙයට අමතරව "දැයට කිරුළ", "ගොවි සතිය" සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් ප්‍රදර්ශනය යන ප්‍රදර්ශන 3 හට දායකත්වය සැපයුවේය.

මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 20ක් පවත්වන ලදී. "දිවි නැගුම" වැඩසටහන යටතේ මධ්‍යස්ථානයෙන් පිටත වැඩසටහන් 6ක් පවත්වනු ලැබිණි.

මෙම ඒකකය විසින් සිදුකළ වෙනත් කාර්යයන් පහත පරිදි වේ.

- මී මැසි පාලනය පිළිබඳ ආදර්ශ ගම්මාන 9ක් නඩත්තු කිරීම.
- මී මැසි පාලන උපකරණ 7000ක් සහතික කිරීම.
- "දැයට කිරුළ", "ගොවි සතිය", "සියවස් සැමරුම" යන ප්‍රදර්ශනයන් සඳහා ප්‍රදර්ශන කුටි 3ක් ඉදිකිරීම.

### තරුණ ගොවි සමාජ

තරුණ ගොවි සමාජ ගමන් මගෙහි තරුණ ගොවි සමාජ යනු ග්‍රාමීය මට්ටමේ ආයතන වේ. තරුණ ගොවි සමාජ ව්‍යාපාරයට අයත් අනෙකුත් ඒකක වන්නේ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රාථමික උපදේශක කමිටු, පළාත් උපදේශක කමිටු සහ ජාතික මට්ටමේ සමිතිය. සාමාජිකයන්ගේ සහභාගීත්වය ඇතුව විවිධ මට්ටම්හිදී මෙම කමිටු මඟින් අදාළ කටයුතු සැලසුම්කර ක්‍රියාත්මක කරනු ලබයි.

තරුණ ගොවි සමාජ දහසකට ආසන්න ප්‍රමාණයක් පිහිටවනු ලැබ ඇති අතර මෙයින් තුනෙන් එකක් පමණම ප්‍රධාන කාර්යාලයෙහි ලියාපදිංචි වී ඇත.

2012 වර්ෂය තුළදී කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා තරුණ ගොවි පරම්පරාවක සහභාගීත්වය ඇතිකිරීම උදෙසා ලංකාව පුරාම විවිධ වැඩසටහන් පවත්වනු ලැබිණි.

නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 15ක්ද තරුණ ගොවි සමාජ සමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 82ක්ද පවත්වනු ලැබිණි. තරුණ ගොවි සමාජ මඟින් සංස්කෘතික වැඩසටහන් 105ක්ද ආගමික වැඩසටහන් 95ක්ද, අධ්‍යාපනික

වැඩසටහන් 35ක්ද සමාජ වැඩසටහන් 32ක්ද පවත්වනු ලැබිණි. මෙයට අමතරව ප්‍රධාන වශයෙන් තරුණ ගොවීන් උදෙසා පවත්වනු ලැබූ ගුවන්විදුලි ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන් 25ක් සඳහා පහසුකම් සපයනු ලැබිණි.

## ජල කළමනාකරණ සහ ආරක්ෂිත කෘෂිකාර්මික ඒකකය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලය සමග ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව හට තාක්ෂණය උත්පාදනය සහ ව්‍යාප්තිය පිළිබඳව පහත විෂයන් සම්බන්ධව ජල කළමනාකරණ සහ සංරක්ෂිත කෘෂිකාර්මික ඒකකය කටයුතු කරයි.

- වාරිමාර්ග සහ වාරිමාර්ග කළමනාකරණය.
- ක්ෂුද්‍ර වාරිමාර්ග කළමනාකරණය සහ පොහොර මිශ්‍රිත ජල සම්පාදනය
- පාලිත පාරිසරික කෘෂිකර්මාන්තය (ආරක්ෂිත කෘෂිකර්මය ආරක්ෂිත ගෘහ, වැසි ආවරණ ගෘහ)
- වාර්ෂික සහ බහුවාර්ෂික බෝග සඳහා වාණිජ්‍ය ගොවිතැන (වාණිජ්‍ය ගොවිපළ වඩාත් උසස් තත්ත්වයෙන් සැලසුම් කිරීම.)
- උසස් තත්ත්වයේ පැළ තවාන් කළමනාකරණ.

කුඩා සහ විශාල පරිමාණයේ ගොවිපල ස්ථාපිත කිරීම උදෙසා අවශ්‍ය තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම මෙම ඒකකයේ ප්‍රධාන කර්තව්‍යයකි. මෙයට අමතරව වාර්මාර්ග කළමනාකරණය පිළිබඳ තාක්ෂණික දැනුම සහ ගොවි සංවර්ධන වැඩසටහන සඳහා ආරක්ෂිත කෘෂිකර්ම ක්‍රමවේදයන්ද සපයනු ලබයි. දැල්ගෘහ මෙම වර්ෂය තුළදී සැලසුම් කරනු ලැබිණි. 2006 – 2011 කාලසීමාව තුළදී මෙම ඒකකය මගින් සිදු කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සොයා බැලීම උදෙසා සමීක්ෂණයන් ආරම්භ කරනු ලැබිණි.

2012 වර්ෂය තුළදී ලබාගත් ජයග්‍රහණයන් පහත පරිදි වේ.

- නිලධාරීන් සහ ගොවීන් උදෙසා ක්ෂුද්‍ර වාරිමාර්ග තාක්ෂණ සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ පුහුණු පවත්වනු ලැබිණි.
- විශේෂ ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 2.8ක මුල්‍ය වෙන්කිරීම 2012 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් 100%ක්ම වියදම් කරනු ලැබිණි. ප්‍රධාන වශයෙන් තෝරාගත් ගොවීන් වෙත විසුරුම් වාරිමාර්ග ක්‍රම ව්‍යාප්ත කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි.
- "දිවි නැගුම" වැඩසටහන යටතේ (සැලසුම් හා කෘෂිකාර්මික පිළිවෙත්) යටතේ වැසි ආවරණය වගාව සඳහා අදාළ තාක්ෂණික ආධාරයන් ලබාදුණි.)
- සියලුම දිස්ත්‍රික්කයන් හී තෝරාගත් ගොවීන් සහ නිලධාරීන් උදෙසා වැසි ආවරණ වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

## සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

ව්‍යාප්ති හා පුහුණු අංශය මගින් ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට මූල්‍ය වන තාක්ෂණික ක්‍රියාවලින් සමීක්ෂණ සහ ඇගයීම සහ පවත්වනු ලබන විශේෂ ව්‍යාපෘති පිළිබඳව සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය අවධානය යොමු කෙරේ.

වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන සඳහා ඉලක්ක සැකසීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, මහ බැංකු සහ අයවැය කථාව සඳහා අවශ්‍ය තොරතුරු සැකසීම සහ අදාල නියෝජිතායතන වලට

තොරතුරු ලබාදීම වැනි කාර්යයන්ද මෙම ඒකකය මගින් සිදු කෙරේ.

### කෘෂිකාර්මික අධ්‍යාපනය

කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොලපැලැස්ස, වවුනියාව සහ කරපිංච යන ප්‍රදේශ වල පිහිටි කෘෂිකර්ම විද්‍යාලයන් 5හි ද්විවාර්ෂික කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වනු ලබයි. ලබුදූව, වාරියපොල සහ අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාල විශේෂ පුහුණු මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වන අතර කෘෂිකර්මය පිළිබඳ කෙටිකාලීන පාඨමාලා ලබා දෙයි. 2012 වර්ෂය තුළදී කෘෂිකර්ම විද්‍යාල වලින් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 202දෙනෙක් විසිර ගියහ.

2012 වර්ෂය තුළදී විවිධ කෘෂිකර්ම විද්‍යාලයන්හි සිසුන් සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

වගුව **3.1.7 :** **කෘෂිකර්ම විද්‍යාලයන්හි සිසුන් සංඛ්‍යාව**

| කෘෂිකර්ම විද්‍යාලය | වසර | මාධ්‍ය | | | | | | එකතුය | සම්පූර්ණ එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | | දෙමළ | | ඉංග්‍රීසි | | | |
| | | ශිෂ්‍යයින් | ශිෂ්‍යාවන් | ශිෂ්‍යයින් | ශිෂ්‍යාවන් | ශිෂ්‍යයින් | ශිෂ්‍යාවන් | | |
| කුණ්ඩසාලේ | පළමු වසර | 31 | 33 | 9 | 10 | 09 | 17 | 109 | 215 |
| | දෙවන වසර | 45 | 20 | 6 | 10 | 13 | 12 | 106 | |
| අඟුණකොලපැලැස්ස | පළමු වසර | 31 | 21 | | | | | 52 | 89 |
| | දෙවන වසර | 26 | 11 | | | | | 37 | |
| පැල්වෙහෙර | පළමු වසර | 39 | 15 | | | | | 54 | 97 |
| | දෙවන වසර | 34 | 09 | | | | | 43 | |
| වවුනියාව | පළමු වසර | | | 15 | 15 | | | 30 | 60 |
| | දෙවන වසර | | | 23 | 07 | | | 30 | |
| කරපිංච | පළමු වසර | 24 | | | | | | 24 | 24 |
| | දෙවන වසර | | | | | | | | |
| එකතුව | | **230** | **109** | **53** | **42** | **22** | **29** | **485** | **485** |

## කෘෂිකාර්මික පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් වාර්ෂික ප්‍රායෝගික කෘෂිකර්ම පුහුණු පාඨමාලාව

මෙම පාඨමාලාවේ ඉලක්කගත කණ්ඩායම වන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන්නා වූ කෘෂිකාර්මික පර්යේෂණ සහ නිෂ්පාදක සහකාරවරුන් වේ. මෙම පාඨමාලාව 2005 වර්ෂයේ පුහුණු මධ්‍යස්ථාන 8කදී ආරම්භ වූ අතර සියලුම නිලධාරීන් පුහුණු පාඨමාලාව අවසන් කරන තෙක් පාඨමාලාව අඛණ්ඩව පැවැත්වේ. 2006 වසරේදී 676ක් වූ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදක සහකාර කණ්ඩායමද 2008 වසරේදී 246ක් වූ දෙවන කණ්ඩායමද 2011 දී 278ක් වූ තුන්වන කණ්ඩායමද ස්වකීය පුහුණුව අවසන් කරන ලදී. 2011/2012 වසරේදී පුහුණු වන කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදක සහකාර කණ්ඩායම පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව **3.1.8 : 2011/2012** පැවැත් වූ පුහුණු පාඨමාලාවල ප්‍රගතිය

| පුහුණු මධ්‍යස්ථානය | පුහුණු කළ පර්යේෂණ නිෂ්පාදක හා සහකාර සංඛ්‍යාව | | පුහුණු කළ සම්පූර්ණ පර්යේෂණ හා නිෂ්පාදක සහකාර සංඛ්‍යාව |
|---|---|---|---|
| | **2011/I කණ්ඩායම** | **2012/ II කණ්ඩායම** | |
| කෘෂිකර්ම විද්‍යාලය අනුරාධපුර | 18 | - | 18 |
| කෘෂිකර්ම විද්‍යාලය වාරියපොල | 25 | - | 25 |
| කෘෂිකර්ම විද්‍යාලය ලබුදූව | 13 | 24 | 37 |
| දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වීරවිල | 22 | 20 | 42 |
| උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය බිබිල | 39 | 24 | 54 |
| **එකතුව** | **117** | **68** | **185** |

## විභාග ඒකකය

2012 වර්ෂයේදී ව්‍යාප්ති හා පුහුණු අංශයෙහි විභාග ඒකකය මඟින් සිදුකළ කාර්යයන් පහත දැක්වේ.

- කෘෂිකර්ම විද්‍යාලයේ දෙවසරක ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයන්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 60 දෙනෙක්ද තෝරා ගැනීම උදෙසා තරඟ විභාග පවත්වන ලදී. ඉහත විභාග සඳහා පාසල් අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 1744ක් මුහුණ දුන්හ.
- මෙයට අමතරව කෘෂිකර්ම විද්‍යාලයන්හි දෙවසර ඩිප්ලෝමා පාඨමාලාවේ විභාග පවත්වනු ලැබිණි. පළමු වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන් 281 ක්ද දෙවන වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන් 204 ක්ද ඉහත විභාග සඳහා ඉදිරිපත් විය.
- කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර සඳහා වූ ඒක වාර්ෂික පුහුණු පාඨමාලාවේ අවසන් විභාගය පවත්වනු

ලැබිණි. මෙම විභාගය සඳහා 138ක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් විය.

– මෙයට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 1055ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලැබිණි.

## කාබනික කෘෂිකර්මාන්තය සහ ශාක පෝෂක ඒකකය

ශ්‍රී ලංකාව තුළ පාරිසරික හිතකර කෘෂිකර්මාන්තය ජනප්‍රිය කරලීම මෙම ඒකකයෙහි අරමුණ වේ. මෙම ඒකකය මගින් 2013 වර්ෂයේදී පහත ව්‍යාපෘති 3 ක්‍රියාත්මක කෙරිණි.

1) තිරසාර කාබනික ගොවි තාක්ෂණය උදෙසා ආසියානු ජාලය
2) ප්‍රජා මූලික බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය
3) සහල් අපනයන කලාප ව්‍යාපෘතිය

මෙයට අමතරව සේවා සංස්කරණ පුහුණු ආයතනය සහ වෙනත් ආයතන මගින් ගොවින් උදෙසා පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලෙස ඒකකයේ නිලධාරීන් සහභාගී විය. මෙයට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුම් ප්‍රදර්ශනය උදෙසා කාබනික ගොවිතැන හා සම්බන්ධ තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රදර්ශන කුටියක් ඉදි කරනු ලැබීය.

# 2013 සැලසුම

### ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන්

2013 වර්ෂයේ ව්‍යාප්ති හා පුහුණු අංශය මගින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- අන්තර් පළාත් ප්‍රදේශ 6හි කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන්

  ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා අන්තර් පළාත් ප්‍රදේශවල ප්‍රධාන බෝගය ලෙස වී ගොවිතැනෙහි ඵලදායීතාවය වැඩි කිරීම පිණිස 2013 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරේ. බෝග වගා කන්නයන්හිදී ප්‍රධාන වාර්මාර්ග ක්‍රම, සුළු වාරිමාර්ග සහ වර්ෂා පෝෂිත තත්ත්වයන් යටතේ, මෙම ඉලක්කය සුපරාගැනීම උදෙසා තාක්ෂණික ක්‍රියාපරිපාටීන් සහ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජාව තුළින්ම ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ නිෂ්පාදනය කිරීමටද අපේක්ෂිතය.

  අවාරයේ දී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරමින් ආනයනයන් අවම කරමින් විදේශ විනිමය ඉතිරි කර ගැනීම උදෙසා එයට පිළියමක් ලෙස 3වන වගා කන්නයක් පිළිබඳව අවධානය යොමු කර ඇත. වගා භූමි ප්‍රමාණය වැඩිකිරීම නිෂ්පාදනය, ඵලදායීතාවය සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ නිෂ්පාදනයට මෙම ව්‍යාප්ති ක්‍රියාපරිපාටීන් ක්‍රියාත්මක කරනු ලබයි.

  ප්‍රතිසංස්කරණ වැඩසටහන් සහ කෘෂි පාරිසරික යෝග්‍ය පළතුරු ප්‍රභේද හඳුන්වාදීම තුළින් පළතුරු නිෂ්පාදනය ඉහළ දමන අතර එක් එක් අන්තර් පළාත් ප්‍රදේශයන්හී උචිත පරිදි එළවළු නිෂ්පාදනයද තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

  එක් එක් අන්තර් පළාත් ප්‍රදේශවල පරිශ්‍රමයක් දැරීම තුළින් සම්පූර්ණ බෝග නිෂ්පාදන වැඩසටහන (දේශීය හා විදේශීය) අපනයන සමඟ සම්බන්ධ කරනු ලබයි. ප්‍රධාන ගොවිජන සේවා ප්‍රදේශ වල කෘෂිකර්ම දෙපාර්තමේන්තු තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම උදෙසා තාක්ෂණ අනුගත කලාප පිහිටුවීම සෑම කෘෂිකර්ම උපදේශකවරයෙක්ම ස්වකීය අධිකාරී බල සීමාව තුළ අදාළ පර්යේෂකයන්ගේ සහයෝගය ඇතිව තාක්ෂණික අනුගත කලාප පිහිටවනු ලබයි. වගා කන්න දෙක සඳහා තාක්ෂණික අනුගත කලාප පිහිටුවීම

මෙහි ඉලක්කය වන නමුත් තාක්ෂණයන් සමඟ කාලපරාසය වෙනස් වේ. උදා :- පාංශු සංරක්ෂණ ක්‍රම, පළතුරු පැල කප්පාදුව. මෙය කෘෂිකාර්මික පර්යේෂක වරුන්හට පමණක් නොව සමාජ - ආර්ථික පර්යේෂණ සහ කෘෂිකාර්මික ව්‍යාප්ති නිලධාරීන් හට අඩිතාලමක් වේ. මෙම තාක්ෂණික අනුගත කලාප සොයාගැනීමේ ඉතාමත් කැපී පෙනෙන ලක්ෂණවන්නේ සමාජ පිළිගැනීම හා ලාභය ඉපයීම පදනම් කොට ප්‍රතිසමායෝජන තාක්ෂණයට භාවිතා කළ හැකි වීමයි.

- කෘෂිකර්ම විද්‍යාලයන්හි කෘෂිකාර්මික අධ්‍යාපනික වැඩසටහන

කුණ්ඩසාලය, පැල්වෙහෙර, වවුනියාව, අඟුණකොළපැලැස්ස සහ කරපිංච යන කෘෂිකර්ම විද්‍යාල 5හි ද්විවාර්ෂික කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.

ඩිප්ලෝමාධාරීහු 250 දෙනෙක් සහතික ලබා පාඨමාලාව අවසන් කළහ. අලුත් කණ්ඩායමක් 2013 වසර සඳහා බඳවා ගනු ලබයි.

- කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් උදෙසා ලබුදූව, වාරියපොල, බිබිල, වීරවිල සහ අනුරාධපුර විශේෂ පුහුණු මධ්‍යස්ථාන වලදී පවත්වනු ලැබූ එක් වසරක පුහුණු පාඨමාලාවේ අවසන් වසර විභාගය සඳහා පුහුණු වන නිලධාරීන් 75 දෙනෙකු 2013 වර්ෂය තුළදී මුහුණදීමට නියමිතය.

කෘෂිකර්මාන්තයට තාක්ෂණිකත්වයෙන් පිරිපුන් තරුණයින් පුහුණු කිරීමේ අපේක්ෂාවෙන් දෙවසරක කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අවශ්‍ය ශිෂ්‍යයින් තෝරා ගැනීම උදෙසා ජාතික වෘත්තීය සුදුසුකම් තුන්වන සහ හතරවන මට්ටම් සඳහා එක් වසරක කෘෂිකර්ම සහතික පත්‍ර පාඨමාලාවන් ලබුදූව, වාරියපොළ, බිබිල, වීරවිල, අනුරාධපුර යන විශේෂ පුහුණු මධ්‍යස්ථානයන්හිදී ආරම්භ කරන ලදී.

- සේවා සංස්කරණ මධ්‍යස්ථාන තුනේදී දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන හතරේ ගොවි යාන්ත්‍රිකරණ පුහුණු මධ්‍යස්ථානයේ හා මී මැසි පාලන සංවර්ධන ඒකකයන්හිදී නිලධාරීන් සහ ගොවීන් උදෙසා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- 2013 වර්ෂයේ විභාග දින දර්ශනයට අනුව පහත විභාග පැවැත්වීම.
  - ද්විවාර්ෂික ඩිප්ලෝමා වැඩසටහනේ විභාග
  - කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරත්වය සඳහා එක් වසරක පුහුණු වැඩසටහනේ විභාග.
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු විභාග.
  - කෘෂිකර්ම විද්‍යාලයන් හට අභ්‍යාසලාභීන් බඳවා ගැනීම උදෙසා තරඟ විභාග.
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩයිම් විභාග.
  - කෘෂිකර්ම විද්‍යාලයන් සඳහා තෝරා ගනු බලන රජයේ නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම උදෙසා වූ විභාග.
- තරුණ ගොවි සමාජ සඳහා ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහන් සහ වෙනත් පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන.
  - ගන්නෝරුව තාක්ෂණික උද්‍යානයේ අලෙවි මධ්‍යස්ථානය සඳහා ව්‍යවසායකින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණුව.

- ජංගම ආහාර නිරීක්ෂණ ඒකකය මඟින් ක්ෂේත්‍රයේ දේශීය ආහාර නිරීක්ෂණ.
- පොත් පිංච, සටහන් පොත් වැනි පුහුණු ආධාරක සැපයීම.
- ආදායම් උත්පාදනය සහ සංවර්ධන ව්‍යවසායකත්වය පිළිබඳ ආහාර පර්යේෂණ ඒකකය සමඟ සාමූහික ව්‍යාපෘති.
- ගුවන් විදුලි වැඩසටහන්, රූපවාහිනි වැඩසටහන් සහ ප්‍රදර්ශන තුළින් තාක්ෂණයේ ව්‍යාප්තිය.

- කෘෂි ව්‍යවසායික සංවර්ධන වැඩසටහන.
  - හැකියාව සහිත ව්‍යවසායකින් 200 උදෙසා කෘෂි ව්‍යවසායකත්වයට අදාළ දැනුවත් වීමේ සහ හැකියා සංවර්ධන කෙටිකාලීන පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම.
  - නව "කෘෂි සේවා පියස" මධ්‍යස්ථාන 10ක් පිහිටුවීම.
  - ආහාර හා කෘෂිකාර්ම සංවිධාන අරමුදල් සපයන විශේෂ ව්‍යාපෘති යටතේ දිස්ත්‍රික් 10කදී ගොවි ව්‍යාපාර පාසල් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාප්ති නිලධාරීන් හට අවශ්‍ය කාර්ය සංවිධාන ආධාර හා මාර්ගෝපදේශ ලබා දීම.
  - ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ව්‍යාපෘතිය යටතේ බෝග සැපයුම් කරුවන් හා ගැනුම්කරුවන් හට ස්වකීය අලෙවි සම්බන්ධතාවන් ශක්තිමත් කිරීමට ඉතාමත් ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස ගොවි දත්ත වගුවක් ආරම්භ කිරීම සහ නඩත්තු කිරීම.
- ක්ෂුද්‍ර වාරිමාර්ග සහ සංරක්ෂිත කෘෂිකර්මාන්තය වැසි ආවරණ සංරක්ෂිත කෘෂිකර්මාන්තය සහ ක්ෂුද්‍ර වාරිමාර්ග ක්‍රියාවලින් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. ක්ෂුද්‍ර වාරිමාර්ග සහ සංරක්ෂිත කෘෂිකර්මාන්තය පිළිබඳ ජාතික කමිටුවේ කටයුතු.
- ශ්‍රී ලංකාව තුළ පාරිසරික හිතකර කෘෂිකර්මාන්තය ජනප්‍රිය කරලීම උදෙසා කෘෂිකර්මික ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම.

**2013 වසර සඳහා සැලසුම් කළ විශේෂ ව්‍යාපෘති**

1. කෘෂිකර්ම විද්‍යාල, සේවා සංස්කරණ පුහුණු ආයතන, ගොවි යාන්ත්‍රිකරණ මධ්‍යස්ථාන සහ මීමැසි පාලන සංවර්ධන ඒකකයන්හි ඉඩම් සංවර්ධන කාර්යයන්.
2. ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයෙහි පුහුණු සහ හැකියා වර්ධනය.
3. පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයේ නව නේවාසිකාගාරයක් ඉදිකිරීම.
4. ගන්නෝරුව සේවා සංස්කරණ පුහුණු ආයතනයේ නව වැසිකිළි සංකීර්ණයක් ඉදිකිරීම.
5. හැකියාවන්ගෙන් පරිපූර්ණ වෘත්තිකයන් ඇති කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම විද්‍යාලයන්හි තත්ත්වය වැඩිදියුණු කිරීම.

## කාර්ය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 1 |
| අතිරේක අධ්‍යක්ෂ | 2 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 8 |
| සහකාර අධ්‍යක්ෂ | 39 |
| කෘෂිකර්ම නිලධාරි | 7 |
| කතිකාචාර්ය | 44 |
| විෂයානුබද්ධ විශේෂඥ | 1 |
| කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී | 14 |
| වැඩසටහන් සහකාර | 26 |

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| උපාධිධාරී අභ්‍යාසලාභී | 5 |
| කෘෂිකර්ම උපදේශක | 233 |
| පර්යේෂණ සහකාර | 2 |
| ගොවිපල යාන්ත්‍රික උපදේශක | 1 |
| තාක්ෂණික නිලධාරී | 1 |
| යාන්ත්‍රික නිලධාරී | 1 |
| මී මැසි පාලක | 5 |
| බඳ්ධකරු | 4 |
| වඩුකරු | 4 |
| යන්ත්‍ර පරිවාරක | 2 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 3 |
| පරිපාලන නිලධාරී | 2 |
| කළමනාකරණ සහකාර සේවය | 94 |
| භාෂා පරිවර්තක (ඉංග්‍රීසි) | 1 |
| ගබඩාකරු | 9 |
| ගොවිපල් ලිපිකරු | 3 |
| කාර්යාල කාර්ය සහායක | 11 |
| ආහාර සම්පාදක | 3 |
| අරක්කැමි | 18 |
| මුරකරු | 73 |
| සනීපාරක්ෂක කම්කරු | 8 |
| රියදුරු | 35 |
| පස් කපන යන්ත්‍ර ක්‍රියාකරු | 11 |
| ලොරි සහායක | 1 |
| ජල පොම්ප ක්‍රියාකරු | 1 |
| කම්කරු | 187 |
| බංගලා භාරකරු | 2 |
| අකුරු අමුනන්නා | 1 |
| කොන්ත්‍රාත් කම්කරු | 189 |
| **එකතුව** | **1052** |

# 3.2 තොරතුරු සහ සංනිවේදන මධ්‍යස්ථානය - පේරාදෙණිය

තොරතුරු සහ සංනිවේදන මධ්‍යස්ථානයේ ඉදිරි දැක්ම වන්නේ ජාතියේ සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික තොරතුරු සහ සංනිවේදන තාක්ෂණයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමයි.

මෙහි මෙහෙවර වන්නේ ආහාර බෝග අංශය වඩා කාර්යක්ෂම හා ඵලදායී කිරීම පිණිස කෘෂිකර්මය සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය යොදා ගැනීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තු සේවා ලබා ගැනීමේ මාර්ග වැඩිදියුණු කිරීම සහ වැඩි වශයෙන් පුරවැසියා කේන්ද්‍ර කරගත් පාලනයක් ඇති කිරීමයි.

මෙම නව මධ්‍යස්ථානය 2012 මාර්තු 01 දින වෙනම අංශයක් වශයෙන් ස්ථාපිත කරන ලදී. තම අභිමතාර්ථ හා අරමුණු ජය ගැනීමේදී මෙම මධ්‍යස්ථානය විසින් ඉටු කරන කාර්යයන් වන්නේ මෙහි පරිපාලනය යටතේ පවතින ගුවන් විදුලි ගොවි සේවාව, ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, කෘෂි ප්‍රකාශන ඒකකය, ගන්නොරුව කෘෂි තාක්ෂණ උද්‍යානය හා බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානය යන ඒකක 5 මගින් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආධාර කරගෙන තොරතුරු එක්රැස් කිරීම, කළමනාකරණය කිරීම හා ප්‍රචාරණය කිරීමයි.

මහින්ද චින්තනයේ ඉදිරි දැක්මෙහි දක්වා ඇති පරිදි කෘෂිකාර්මික තොරතුරු හුවමාරු කර ගැනීම පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව ගන්නොරුවේ ජාතික කෘෂිකාර්මික තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා මුල්ගල තැබිණි.

මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම තෙවාර්ෂික ව්‍යාපෘතියක් වන අතර මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 325කි. ගොවිජන සේවා මධ්‍යස්ථාන 550ක් අතර කෘෂිකාර්මික තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වනවිටත් ලැබී ඇත.

ගොවීන් මුහුණ දෙන අලෙවිකරණ ගැටලුවලට විසඳුමක් වශයෙන් විධිමත් ගොවි නිෂ්පාදන දත්ත මූලයක් පවත්වා ගෙන යනු ඇති අතර එම යාන්ත්‍රණය මගින් පහත සඳහන් දෑ සම්පාදනය කරනු ඇත.

- ගොවීන් සහ තොග ගැනුම්කරුවන් (දේශීය මෙන්ම විදේශීය) සම්බන්ධ කෙරෙන යාන්ත්‍රණයක්
- අමුද්‍රව්‍ය අවශ්‍යතාව සම්බන්ධයෙන් සැපයුම්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය තොරතුරු
- මෙරට බෝග පවතින ප්‍රමාණය සහ අවශ්‍යතාව නිශ්චය කිරීම සඳහා තීරණ ගන්නන් වෙනුවෙන් බෝග පුරෝකථන තොරතුරු

## අයවැය

**වගු අංක 3.2.1 : විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදනය සහ දරන ලද වියදම**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 6,920,372 | 6,013,831 | 87 |
| පුනරාවර්තන | 19,403,000 | 18,539,000 | 96 |

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| **ව්‍යාපෘති** | | | |
| මාධ්‍ය වැඩසටහන | 24,285,266 | 24,263,600 | 99 |
| කෘෂි තාක්ෂණ උද්‍යාන | 4,500,000 | 3,867,294 | 85 |
| දැයට කිරුළ ප්‍රදර්ශනය - 2012 | 15,000,000 | 15,000,000 | 100 |
| බෝග පුරෝකථනය | 1,760,000 | 1,735,850 | 98 |
| දිවි නැගුම | 20,755,000 | 20,721,752 | 99 |
| ආසියානු ආහාර හා කෘෂිකාර්මික සහයෝගිතා වැඩසටහන | 2,500,000 | 2,210,621 | 88 |
| **එකතුව** | **95,123,638** | **92,351,948** | **97** |

## ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය යටතේ පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තොරතුරු සහ සංනිවේදන ඒකකයයි. මෙම මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සංනිවේදන අවශ්‍යතා සපුරාලීමයි. එනිසා මෙය, උපදෙස් රැගත් පුළුල් පරාසයක මාධ්‍යමය වශයෙන් භාවිතා කරන දෑ නිපදවීමෙහි සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි නියැළී සිටී. මෙමගින් පහත සඳහන් කටයුතු සිදු කරනු ලැබේ.

- රූපවාහිනී වාර්තා වැඩසටහන් 2ක් නිපදවීම - සතිපතා ගොවිබිමට අරුණලු, ඉරිදා ප.ව. 6.30, ජාතික රූපවාහිනිය සහ මිහිකත දිනුවෝ, සිකුරාදා ප.ව. 6.15, ජාතික රූපවාහිනිය
- කෘෂිකාර්මික ප්‍රකාශන, පත්‍රිකා, පෝස්ටර්, විශාල දැන්වීම් පුවරු, බැනර් ආදිය සැලසුම් කර නිෂ්පාදනය කිරීම
- ගන්නොරුව සහ බට අත කෘෂි තාක්ෂණ උද්‍යාන කළමනාකරණය
- ප්‍රාදේශීය සහ ජාතික මට්ටමින් කෘෂිකර්ම ප්‍රදර්ශන සංවිධානය කිරීම
- කෘෂිකාර්මික උපදේශක සේවය ‘ගොවි සහන සරණ සේවය’ (දුරකථන කේත අංකය 1920) පවත්වා ගෙන යාම
- කෘෂිකර්මාන්තය තුළ තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - තොරතුරු අඩවි : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (www.agridept.gov.lk), විකිගොවියා (www.goviya.lk), ශ්‍රී ලංකාවේ වී වගාව පිළිබඳ තොරතුරු ඇතුළත් තොරතුරු අඩවිය (Rice Knowledge Bank in Sri Lanka)
  - විවිධ බෝග සහ විෂයයන් පිළිබඳ සංයුක්ත තැටි (Interactive Multimedia CDs) නිෂ්පාදය
  - සයිබර් ව්‍යාප්ති කටයුතු පිළිබඳ ව්‍යාපෘතිය සහ කෘෂි තොරතුරු

කළමනාකරණ පද්ධතියේ ගොවීන් පිළිබඳ දත්ත මූලය

- ඉගැන්වීම් කටයුතු සඳහා භාවිතා කරන ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක සහ ඉදිරිපත් කිරීම් පිළිබඳ තාක්ෂණය සම්බන්ධයෙන් පුහුණුව ලබාදීම
- ජාතික කෘෂිකාර්මික තොරතුරු ජාලය සහ කෘෂිකාර්මික තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම

## ප්‍රගතිය

### පුහුණුව

ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක පිළියෙල කිරීම, සයිබර් ව්‍යාප්තිය සහ තොරතුරු අඩවි සැලසුම් කිරීම පිළිබඳව මිනිස් දින 425ක පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලදී.

### ග්‍රැෆික් සංනිවේදන කටයුතු

**තාක්ෂණික ප්‍රකාශන**

2012 - සියවස් දිනපොත සහ ආහාරයට ගතහැකි බෝග යොදා ගනිමින් උද්‍යාන අලංකරණය කිරීම, එළවළු බෝගවලට අදාළ සමෝධානික පළිබෝධ කළමනාකරණය, ඌන උපයෝජිත පලතුරු බෝග, වෙනත් ක්ෂේත්‍ර බෝගවල සිටින කෘමීන් සහ මයිටාවන් යන සියවස් ප්‍රකාශන 5 ඇතුළු නව තාක්ෂණික ප්‍රකාශන 10ක් සැලසුම් කරන ලදී.

| | |
|---|---|
| පත්‍රිකා / බ්‍රෝෂර්ස් | 34 |
| ස්ථානීය දැන්වීම් පුවරු / ප්‍රදර්ශන පුවරු | 11 |
| ප්‍රදර්ශන / පර්යේෂණ තොරතුරු සාරාංශ | 984 |
| පුවත්පත් අතිරේක / ඕෆ්සෙට් මුද්‍රණය සඳහා පෝස්ටර් | 30 |
| ඩෙස්ක්ටොප් ඉදිරිපත් කිරීම් | 15 |
| වර්ණ පිටු / ආරාධනා පත්‍ර/ සුභ පැතුම් පත්‍ර | 155 |
| ලේබල් / ස්ටිකර් / නාම පුවරු | 4023 |
| බැනර් | 66 |

**වීඩියෝ කිරීම / ඡායාරූපකරණය**

දිවි නැගුම වැඩසටහන් ඇතුළු රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය, සංස්කරණය සහ රූපවාහිනියේ විකාශය කිරීම

| | |
|---|---|
| මිහිකත දිනුවෝ | 48 |
| ගොවිබිමට අරුණලු | 53 |
| වෙනත් වාර්තා වැඩසටහන් | 07 |
| කෙටි රූපවාහිනී ප්‍රචාරක දැන්වීම් | 20 |
| වීඩියෝ වැඩසටහන් පිටපත් කිරීම | 17 |
| ඩිජිටල් ඡායාරූපකරණය | 19,135 |

**තොරතුරු තාක්ෂණය**

තොරතුරු අඩවි පිටු පහත සඳහන් පරිදි යථාවත් කරන ලදී.

| | |
|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු තොරතුරු අඩවිය | පැය 555/ අයතම 163 |
| වී වගාව පිළිබඳ දැනුම බැංකු තොරතුරු අඩවිය | අයතම 02 |
| විකිපීඩියා තොරතුරු අඩවිය | පැය 18 / අයතම 74 |
| දත්ත මූල සහ මෘදුකාංග වැඩිදියුණු කිරීම | පැය 1140 |

**ගොවි සහන සරණ උපදේශක සේවය**

පහත සඳහන් අයුරින් ගැටලුවලට පිළිතුරු ලබා දෙන ලදී.

| | |
|---|---|
| විමසුම් සංඛ්‍යාව | 50,000 |
| ස්කයිප් (වීඩියෝ ඇමතුම්) | 60 |
| ලිපි | 400 |

**තොරතුරු ජාල පරිපාලනය සහ මෙහෙයවීම**

පැය 1172ක සහ අයතම 61ක මෙහෙයුම් කටයුතු කිරීම සහ පැය 2057ක සහ අයතම 602ක දෘඩාංග නඩත්තු කිරීම

#### ප්‍රදර්ශන

ගන්නොරුවෙහි පැවති සියවස් සැමරුම සහ ඔයාමඩුවෙහි පැවති දැයට කිරුළ සඳහා ප්‍රදර්ශන ක්ෂේත්‍ර 3ක් සැලසුම් කරන ලදී. පසුගිය වසර 7 පුරාම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටිය / ක්ෂේත්‍රය පළමු ස්ථානය හිමිකර ගත්තේය.

#### සියවස් සැමරුම

2012 අගෝස්තු මස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුම් ප්‍රදර්ශනය ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය විසින් සැලසුම් කර, සම්බන්ධීකරණය කර එහි මෙහෙයුම් කටයුතු ද සිදු කෙරිණි.

#### කෘෂි තාක්ෂණ උද්‍යානය - ගන්නොරුව

සියවස් සැමරුම් ප්‍රදර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් යටිතල පහසුකම් (නව වැසිකිළි පද්ධතියක්, ආහාර අලෙවි සැලක්, බිම කොන්ක්‍රීට් ගල් ඇල්ලීම, පොකුණු, ගිමන් හල් ආදිය) තව දුරටත් වැඩිදියුණු කරන ලදී.

පහත සඳහන් අයුරින් මහජනයා හා පාසැල් සිසුන් වෙත කෘෂි තාක්ෂණය ප්‍රචාරණය කර උපදෙස් ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| නරඹන්නන් - සංඛ්‍යාව | පාසැල් සිසුන් | 65,107 |
| | වැඩිහිටියන් | 77,539 |
| ආදායම | | රු. 951,765/= |

#### අලෙවි සැල (One Stop Shop)

එක් ස්ථානයකින් බොහෝ දෑ සැපයීමේ සංකල්පයෙන් (One Stop Shop) අපේක්ෂා කරන ලද්දේ ආහාර අලෙවි සැලෙහි සාම්ප්‍රදායික ආහාර සහ ලියාපදිංචි පෞද්ගලික තවාන්වල පැළ අලෙවිය හා ප්‍රවර්ධනයට අමතරව කෘෂි තාක්ෂණ උද්‍යානය ශක්තිමත් කිරීමයි.

## කෘෂි ප්‍රකාශන ඒකකය

මෙම ඒකකයේ පුළුල් අරමුණු යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණයන් සහ අදාළ අනෙකුත් තොරතුරු ගොවීන් ඇතුළු අවසානයේ භාවිතා කරන්නන් අතර මුද්‍රිත මාධ්‍ය යොදා ගනිමින් ප්‍රචාරණය කිරීමයි. මෙම පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ක්ෂේත්‍ර ව්‍යාප්ති කටයුතුවලට සහායවීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුද්‍රිත ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කිරීමේ හා බෙදා හැරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. කෘෂිකර්ම මුද්‍රණාලය හා තොරතුරු මධ්‍යස්ථානය මෙම ඒකකයේ පරිපාලනය යටතේ පවතී. මෙය 2012 ජූනි 29 දින යළි ස්ථාපිත කෙරිණි. මේ යටතේ ඇති කෘෂිකර්ම මුද්‍රණාලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමස්ත මුද්‍රණ අවශ්‍යතාව සපුරාලීමට කටයුතු කරන අතර එයට තාක්ෂණික මෙන්ම තාක්ෂණික නොවන ප්‍රකාශන ද ඇතුළත් වේ.

එයට අමතරව, මෙය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මුද්‍රණ අවශ්‍යතා ද ඉටු කරයි. තොරතුරු මධ්‍යස්ථානය අලෙවිය සහ නොමිලයේ ලබාදීම සඳහා මුද්‍රිත ද්‍රව්‍ය බෙදා හැරීමේ වගකීමද දරයි. 2012 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන් සහ අත්කර ගන්නා ලද ප්‍රගතිය පහත දැක්වේ.

#### ආදායම

වසර තුළ විවිධ කටයුතුවලින් උපයා ගන්නා ලද ආදායම රු. මිලියන 3කි. ප්‍රකාශන හා සංයුක්ත තැටි (IMMCDs) අලෙවියෙන් මෙම ඒකකය ලබාගත් ආදායම රු. මිලියන 2.5ක් පමණ විය. දැයට කිරුළ ජාතික ප්‍රදර්ශන භූමියේ ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කරන ලද අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශන සහ සංයුක්ත තැටි අලෙවියෙන් රු. 367,963.00ක් උපයා ගන්නා ලදී. 2012 වර්ෂයේදී ඉවත ලන කඩදාසි, භාවිත කළ ප්ලේට්ස්, භාවිත කළ අනෙකුත් ද්‍රව්‍ය අලෙවියෙන් සහ ටෙන්ඩර් ලිපි ලේඛන නිකුත් කිරීම ආදිය මගින් රු. 187,795.00 ක් උපයා ගන්නා ලදී.

වගු අංක 3.2.2 : ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම (රු.)

| මාසය | අලෙවි මධ්‍යස්ථානය අංක 1 (ගලහ හන්දිය) | අලෙවි මධ්‍යස්ථානය අංක 2 (ගන්නොරුව) |
|---|---|---|
| ජනවාරි | 23,788 | 84,882 |
| පෙබරවාරි | 49,129 | 52,169 |
| මාර්තු | 67,732 | 102,838 |
| අප්‍රේල් | 33,535 | 73,437 |
| මැයි | 54,901 | 75,428 |
| ජූනි | 77,792 | 70,819 |
| ජූලි | 23,489 | 580,398 |
| අගෝස්තු | 32,409 | 103,232 |
| සැප්තැම්බර් | 66,155 | 51,107 |
| ඔක්තෝබර් | 117,930 | 121,680 |
| නොවැම්බර් | 36,735 | 92,320 |
| දෙසැම්බර් | 64,789 | 86,896 |
| **එකතුව** | **648,384** | **1,495,206** |

## ප්‍රගතිය

විමසුමට ලක් කරන ලද වර්ෂය තුළ පහත සඳහන් නව ග්‍රන්ථ මෙම ඒකකය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. අඹ (සිංහල හා දමිළ), අන්නාසි (සිංහල හා දමිළ), එළවළු වගාවේ සමෝධානික පළිබෝධ කළමනාකරණය (සිංහල හා දමිළ), ආහාර සඳහා ගත හැකි බෝග වර්ග යොදා ගනිමින් උද්‍යාන අලංකරණය කිරීම (සිංහල හා දමිළ), බඩඉරිඟු, පෙයාර්ස් වගාව, 2013 - දින පොත, ගොවිකම් සඟරාව සහ කමතෝලිල් විලක්කම්. එයට අමතරව, ප්‍රකාශන 6ක් මුද්‍රණය කර අනෙකුත් අංශ සඳහා බෙදා හරින ලදී. මුද්‍රිත ප්‍රකාශන පිළිබඳ විස්තර වගු අංක 3.2.3, 3.2.4 හා 3.2.5හි දැක්වේ.

වගු අංක 3.2.3 : 2012 වර්ෂයේදී ප්‍රකාශනයට පත් කරන ලද නව ග්‍රන්ථ

| ග්‍රන්ථයේ නම | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| අඹ (සිංහල) | 2,500 |
| අඹ (දමිළ) | 1,000 |
| අන්නාසි (සිංහල) | 2,500 |
| අන්නාසි (දමිළ) | 1,000 |
| සමෝධානික පළිබෝධ කළමනාකරණය (සිංහල) | 2,500 |
| සමෝධානික පළිබෝධ කළමනාකරණය (දමිළ) | 1,000 |

| ග්‍රන්ථයේ නම | පිටපත් සංඛ්‍යාව |
|---|---|
| ආහාරයට ගත හැකි බෝග භාවිතා කර උද්‍යාන අලංකරණය කිරීම (සිංහල) | 2,500 |
| ආහාරයට ගත හැකි බෝග භාවිතා කර උද්‍යාන අලංකරණය කිරීම (දමිළ) | 1,000 |
| බඩඉරිඟු (සිංහල) | 2,500 |
| පෙයාර්ස් වගාව (සිංහල) | 2,000 |
| දිනපොත (ඉංග්‍රීසි) | 5,000 |
| ගොවිකම් සඟරාව | 10,000 |
| කමතෝලිල් විලක්කම් | 650 |

**වගු අංක 3.2.4 : වෙනත් අංශවල ප්‍රකාශන**

| ප්‍රකාශනයේ නම | සංඛ්‍යාව | අංශය |
|---|---|---|
| වගා පිරිවැය | 200 | සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය |
| ඇග් ස්ටැට් - 2012 | 350 | සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය |
| ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට් | 750 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| නව බෝග ප්‍රභේද | 1250 | පර්යේෂණ |
| කෘමීන්, පළිබෝධ හා රෝග පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව | 1250 | ජාතික පැළෑටි නිරෝධායන සේවය |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සමුළු ජර්නලය | 1050 | කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සමුළු ලේකම් කාර්යාලය |
| ස්වයං බිත්තර වී නිෂ්පාදනය | 500 | බීජ සහතික කිරීමේ සේවය |

**වගු අංක 3.2.5 : නැවත මුද්‍රණය කළ ප්‍රකාශන පිළිබඳ විස්තර**

| ප්‍රකාශනයේ නම | ප්‍රකාශයට පත්කළ සංඛ්‍යාව |
|---|---|
| දෙළුම් (සිංහල) | 2,500 |
| කොමඩු (සිංහල) | 2,500 |
| කොළ එළවළු (සිංහල) | 5,000 |
| බිම්මල් (සිංහල) | 5,000 |
| කෙසෙල් වගාවේ රෝග | 2,500 |

| ප්‍රකාශනයේ නම | ප්‍රකාශයට පත්කළ සංඛ්‍යාව |
|---|---|
| එළවළු වගාව (සිංහල) | 10,000 |
| වම්බටු (සිංහල) | 2,500 |
| ස්වයං බිත්තර වී නිෂ්පාදනය (සිංහල) | 3,000 |
| කුරු ඇඹරුල්ලා (සිංහල) | 2,000 |
| මී මැසි පාලනය (සිංහල) | 2,500 |
| ගෙවතු වගාව (සිංහල) | 20,000 |
| පෝෂණය (සිංහල) | 2,500 |
| දේශීය ආහාර සකස් කිරිම | 10,000 |
| වී වගාවෙන් ඉහළ අස්වනු ලබා ගැනීම (සිංහල) | 2,500 |
| ගෙවතු වගාව (දමිළ) | 5,000 |
| වී වගාවෙන් ඉහළ අස්වනු ලබා ගැනීම (දමිළ) | 2,500 |
| දොඩම් (සිංහල) | 2,500 |
| කෘෂි පාරිසරික කලාප | 1,500 |
| වී වගාවේ ක්ෂේත්‍ර ගැටලු (සිංහල) | 2,500 |
| බිත්තර වී ගබඩා කිරීම (දමිළ) | 1,200 |
| ස්වයං බීජ නිෂ්පාදනය | 1,100 |
| පැපොල් (දමිළ) | 500 |
| ජල රෝපණ වගාව (සිංහල) | 2,500 |
| දෙළුම් (දමිළ) | 2,500 |

## කෘෂිකර්ම මුද්‍රණාලය

යථෝක්ත කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනවලට අමතරව, කෘෂිකර්ම මුද්‍රණාලය පත්‍රිකා, පෝස්ටර් සහ ඇරයුම් පත්‍ර ආදිය ඇතුළු විවිධ දෑ මුද්‍රණය කළේය. බීජ සහතික කිරීමේ සේවයේ බීජ සහතිකකරණ ලේබල් සියල්ල සහ බීජ සහතික කිරීමේ සේවයේ ආකෘති පත්‍ර මෙමගින් මුද්‍රණය කරනු ලැබේ. කෘෂිකර්ම මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලද ප්‍රකාශනවල පිටපත් සංඛ්‍යාව පිළිබඳ සාරාංශයක් වගු අංක 3.2.6හි දැක්වේ.

**වගු අංක 3.2.6 : මුද්‍රිත දෑ පිළිබඳ සාරාංශය**

| ප්‍රකාශන වර්ගය | මුද්‍රණය කළ පිටපත් සංඛ්‍යාව |
|---|---|
| පෝස්ටර් | 191,300 |
| පොත් සහ කුඩා පොත් | 23,406 |

| ප්‍රකාශන වර්ගය | මුද්‍රණය කළ පිටපත් සංඛ්‍යාව |
|---|---|
| ආරාධනා පත්‍ර | 12,365 |
| සහතික | 33,962 |
| පුවත් ලිපි | 33,650 |
| ලිපි | 43,450 |
| ආකෘති පත්‍ර | 153,010 |
| ෆයිල් කවර | 1,992 |
| ලිපි ශීර්ෂ | 3,650 |
| වෙනත් | 11,135 |
| බීජ සහතික කිරීමේ සේවා ලේබල් | 300,000 |
| බෝග පුරෝකථන වැඩසටහන සඳහා ආකෘති පත්‍ර | 172,102 |
| බෝග පුරෝකථන වැඩසටහන සඳහා පොත් | 25,000 |
| පත්‍රිකා | 1,055,120 |

**ප්‍රකාශන නොමිලේ නිකුත් කිරීම**

වසර තුළ පහත සඳහන් ප්‍රකාශන සංඛ්‍යාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවෙන් නිකුත් කරන ලදී.

**ගොවිකම් සඟරාව**

42 වන වෙළුම, අංක 4 - 3,820
43 වන වෙළුම, අංක 1 - 3,570
43 වන වෙළුම, අංක 2 - 3,570

**කමතෝලිල් විලක්කම්**

49වන වෙළුම, අංක 2-4 - 408

ඇග්ටෙක්

13වන වෙළුම, අංක 3 හා 4 (සිංහල) - 3,820
14වන වෙළුම, අංක 1 හා 2 (සිංහල) - 3,570
14වන වෙළුම, අංක 1 හා 2 (දමිළ) - 284
14වන වෙළුම, අංක 3 හා 4 (සිංහල) - 3,570
14වන වෙළුම, අංක 1 හා 2 (දමිළ) - 284

නිර්දේශිත බෝග ප්‍රභේද - 408

### චිත්‍ර තරඟය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියවස් සැමරුම වෙනුවෙන් පාසැල් සිසුන් අතර චිත්‍ර තරඟයක් පවත්වන ලදී. සිංහල සහ දමිළ බස කථා කරන සිසුන් 26,000ක් පමණ මෙම තරඟයට සහභාගි වූ අතර එකී සියලුම සිසුන් වෙනුවෙන් සහතික පත්‍ර යැවීමට පියවර ගෙන ඇත.

### ගුවන්විදුලි ගොවි සේවාව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගුවන්විදුලි ගොවි සේවාව ගොවි ප්‍රජාවේ දැනුම වැඩිදියුණු කිරීම සහ අපේක්ෂිත පරිදි ආකල්ප වෙනස් කිරීම සඳහා ඔවුන් වෙත කාලීන සහ අදාළ කෘෂිකාර්මික තොරතුරු ප්‍රචාරණය කිරීම පිණිස කෘෂිකාර්මික ගුවන්විදුලි වැඩසටහන් නිපදවා විකාශනය කරයි. කොළඹ ස්ථානගතව ඇති ගුවන්විදුලි ගොවි සේවාව ප්‍රධාන ශාඛාව වන අතර අදාළ වැඩසටහන් විකාශනය කර ගැනීම පිණිස ජාතික ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා සමග සමීපව කටයුතු කරයි. එයට අමතරව, අනුරාධපුර, මාතර සහ මහනුවර ප්‍රාදේශීය ගුවන්විදුලි ගොවි සේවා ඒකක 3ක් පවතින අතර එමගින් නිපදවන ගුවන්විදුලි වැඩසටහන් පිළිවෙළින් ‘රජරට’, ‘රුහුණු’ සහ ‘කඳුරට’ ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකා මගින් විකාශනය කෙරේ. ගුවන්විදුලි ගොවි සේවාවේ කෘෂිකාර්මික ගුවන්විදුලි වැඩසටහන් වාර්තාමය, විවිධ, සඟරාමය, නාට්‍ය සහ සජීවි වැඩසටහන් හා කෙටි පණිවිඩ වැනි විවිධ ආකෘතිවලින් නිෂ්පාදනය කෙරේ. වැඩසටහන් බොහොමයක් පදනම් වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළපුරුදු පර්යේෂණ හා ව්‍යාප්ති නිලධාරින් සහ කිසියම් කෘෂිකාර්මික කටයුත්තක් සම්බන්ධ අත්දැකීම් සහිත ගොවීන් සමග පවත්වන සාකච්ඡා හෝ ගොවීන් මුහුණ දෙන ගැටළු මතය. දුරකථනය මගින් අසන්නන්ට අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව සලසා දෙන සජීවි වැඩසටහන් බෙහෙවින් ප්‍රචලිත වන අතර එම වැඩසටහන් ඔවුන්ගේ කෘෂිකාර්මික ගැටළුවලට කඩිනමින් විසඳුම් ලබාගැනීමට ඉඩකඩ සලසා දෙයි.

- ගොවීන් වඩා ඵලදායී කෘෂිකාර්මික පිළිවෙත් සම්බන්ධයෙන් දැනුවත් කිරීම
- ගොවිතැනේදී මුහුණදෙන ගැටළු සහ එම ගැටළුවලට ඵලදායී විය හැකි විසඳුම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම
- ලාභදායී අදායම් උත්පාදන මාර්ගයක් ලෙස කෘෂිකර්මය පිළිබඳ උනන්දුවක් ඇති කිරීම
- ගොවීන් අතර කෘෂිකර්මය සම්බන්ධයෙන් ධනාත්මක ආකල්ප ඇති කිරීම
- විවිධ කෘෂිකාර්මික පිළිවෙත් හා සම්බන්ධ පාරිසරික හා වෙනත් අනතුරුදායක ප්‍රතිවිපාක පිළිබඳව ගොවි ප්‍රජාව දැනුවත් කිරීම
- අදාළ බලධාරින් විසින් හඳුන්වා දෙනු ලබන කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සම්බන්ධයෙන් ගොවීන්ට තම මතයන් හා අදහස් ප්‍රකාශ කිරීමට වේදිකාවක් සපයා දීම
- ආහාර සුරක්ෂිතතාව, පෝෂණ සහ රසායනවලින් තොර ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට අවකාශ සැලසීම තහවුරු කිරීම සඳහා සෑම නිවසකම ගෙවතු වගා කටයුතු ප්‍රවර්ධනය කිරීම
- කෘෂිකර්මාන්තය මෙරට තරුණ තරුණියන් අතර ආකර්ෂණීය වෘත්තියක් බවට පත් කිරීම

## ප්‍රගතිය

මෙම සේවය විවිධ ගුවන්විදුලි නාලිකා හරහා දිවයින පුරාම ප්‍රධාන වශයෙන්ම සිංහල සහ දමිළ භාෂාවලින් කෘෂිකර්මය පිළිබඳ ගුවන්විදුලි වැඩසටහන් ප්‍රචාරය කරයි.

**2012 වර්ෂයේ දී ප්‍රචාරය කරන ලද ගුවන්විදුලි වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.**

**වගු අංක 3. 2 .7 : 2012 වර්ෂයේදී ප්‍රචාරය කළ ගුවන්විදුලි වැඩසටහන්**

| වැඩසටහන | සජීවී/පටිගත කළ | නාලිකාව | වේලාව | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කොළඹ ඒකකය - සිංහල වැඩසටහන් | | | | |
| ගොවිතැනට පැයක් | සජීවී | සිංහල ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | සඳුදා පෙ.ව.9.00 - පෙ.ව.10.00 | 51 |
| ගොවි ගෙදර | පටිගත කළ | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | සඳුදා ප .ව. 6.45 - ප.ව.7.00 | 51 |
| සාර භූමි | පටිගත කළ | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | ඉරිදා ප.ව.6.45 - ප.ව.7.00 | 47 |
| තරුණ ගොවි සමාජ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන | පටිගත කළ | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | සෙනසුරාදා ප.ව.7.00 - ප.ව.7.30 | 42 |
| සෙයිලම | පටිගත කළ | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | සෙනසුරාදා ප.ව.6.30 - ප.ව.6.37 | 51 |
| මහ ගෙදරින් ගොවි ගෙදරට | සජීවී | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | බ්‍රහස්පතින්දා ප.ව.6.30 - ප.ව.7.30 | 40 |
| ගොවි කාන්තා ව්‍යාපෘති වැඩසටහන | පටිගත කළ | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9 | සඳුදා, බ්‍රහස්පතින්දා, සිකුරදා, පෙ.ව. 10.00 - පෙ.ව. 11.00 | 53 |

| වැඩසටහන | සජීවී/පටිගත කළ | නාලිකාව | වේලාව | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අඩහැරය | පටිගත කළ | ස්වදේශීය සේවය එෆ්එම් 91.7/ එෆ්එම් 91.9<br>වෙළඳ සේවය එෆ්එම් 94.3/ එෆ්එම් 94.5<br>සිටි එෆ්එම් 89.6/ එෆ්එම් 89.8 | දිනපතා පෙ.ව 6.20 හා ප.ව. 6.20 | 360 |
| දමිළ වැඩසටහන් | | | | |
| විතතෝට්ටම් | පටිගත කළ | දමිළ ස්වදේශීය සේවය එෆ්එම් 107.8 | සිකුරාදා පෙ.ව.7.00 - පෙ.ව.8.00 | 49 |
| වන්නමරුදම් | පටිගත කළ | දමිළ ස්වදේශීය සේවය එෆ්එම් 107.8 | සෙනසුරාදා ප.ව.7.00 - ප.ව.7.30 | 45 |
| රජරට ඒකකය -සිංහල වැඩසටහන් | | | | |
| සරුකෙත | පටිගත කළ | රජරට එෆ්එම් 107.3 | බදාදා ප.ව. 7.07 - ප.ව.7.15 | 42 |
| බොරදිය මංකඩ | පටිගත කළ | වයඹ හඬ එෆ්එම් 90.1 | සඳුදා ප .ව. 6.45 - ප.ව.7.00 | 12 |
| අත්තම | පටිගත කළ | වයඹ හඬ එෆ්එම් 90.1 | දිනපතා ප.ව 7.20 | 100 |
| වයඹ ගෙවත්ත | සජීවී | වයඹ හඬ එෆ්එම් 90.1 | බ්‍රහස්පතින්දා ප.ව.3.00 - ප.ව.3.30 | 8 |
| අත්වැල | පටිගත කළ | රන්ගිරි ශ්‍රී ලංකා එෆ්එම් 104.4/105.4 | දිනපතා ප.ව 7.20 | 100 |
| මහේෂිකා වාසභවන | පටිගත කළ | රන්ගිරි ශ්‍රී ලංකා එෆ්එම් 104.4/105.4 | දිනපතා ප.ව. 2.00 - ප.ව. 4.00 | 120 |

| වැඩසටහන | සජීවී/පටිගත කළ | නාලිකාව | වේලාව | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කඳුරට ඒකකය -සිංහල වැඩසටහන් | | | | |
| කලවිට | පටිගත කළ | කඳුරට සේවය එෆ්එම් 107.3/107.5 | දිනපතා පෙ.ව.7.00 - පෙ.ව.7.30 සහ ප.ව 4.00 – ප.ව.4.30 | 390 |
| අස්වැන්න | සජීවී | කඳුරට සේවය එෆ්එම් 107.3/107.5 | සිකුරාදා පෙ.ව.8.00 - පෙ.ව.9.00 | 54 |
| ගොවි බිම | පටිගත කළ | කඳුරට සේවය එෆ්එම් 107.3/107.5 | සෙනසුරාදා පෙ.ව.8.00 - පෙ.ව.8.15 | 47 |
| කඳුරට ඒකකය -දමිළ වැඩසටහන් | | | | |
| කුරිංචිමලර්හල් | පටිගත කළ | කඳුරට සේවය එෆ්එම් 107.3/107.5 | බදාදා ප.ව. 7.00 - ප.ව.7.30 | 48 |
| මුහුදුහල් | පටිගත කළ | කඳුරට සේවය එෆ්එම් 107.3/107.5 | සිකුරාදා ප.ව.7.00 - ප.ව.7.15 | 46 |
| කෙටි පණිවිඩ | පටිගත කළ | කඳුරට සේවය එෆ්එම් 107.3/107.5 | දිනපතා ප.ව. 6.30 ප.ව. 7.30 දිනකට තෙවරක් | 48 |
| රුහුණු ඒකකය - සිංහල වැඩසටහන් | | | | |
| රුහුණු බිමයි ගොවි දෑතයි | පටිගත කළ | රුහුණු සේවය එෆ්එම් 107.3/107.5 | බදදා ප.ව. 5.45 - ප.ව. 6.00 | 47 |
| දිවිමඟට අත්වැලක් | පටිගත කළ | රුහුණු සේවය එෆ්එම් 107.3/107.5 | සෙනසුරාදා ප.ව.3.45 - ප.ව.4.00 | 47 |
| ගොවි දෑතට අපේ සවිය | පටිගත කළ | රුහුණු සේවය එෆ්එම් 107.3/107.5 | දිනපතා ප.ව. 2.00 - ප.ව. 4.00 | 460 |
| හත් අඩිය | පටිගත කළ | රුහුණු සේවය එෆ්එම් 107.3/107.5 | සඳුදා ප.ව. 7.00 | 44 |
| සළු පාලිය | පටිගත කළ | රුහුණු සේවය එෆ්එම් 107.3/107.5 | බදදා ප.ව. 6.30 - ප.ව. 7.30 | 44 |
| කඳ මල්ල | පටිගත කළ | රුහුණු සේවය එෆ්එම් 107.3/107.5 | සෙනසුරාදා ප.ව.6.45 - ප.ව.7.00 | 39 |

## ප්‍රදර්ශන සඳහා ගුවන් විදුලි ගොවි සේවා වැඩසටහන්

මාධ්‍ය ප්‍රකාශන, කෘෂිකාර්මික ප්‍රදර්ශන පිළිබඳ මාධ්‍ය ආවරණය, ක්ෂේත්‍ර දින සහ ජාතික උත්සව ආදිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වගු අංක 3. 2. 8 : ප්‍රදර්ශන / ක්ෂේත්‍ර දින / ජාතික උත්සව**

| ප්‍රදර්ශන / ක්ෂේත්‍ර දින / ජාතික උත්සව | දින ගනණ |
|---|---|
| දැයට කිරුළ | 09 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු සියවස් සැමරුම | 05 |
| ජපන් ආධාර යටතේ ලද කෘෂි උපකරණ බෙදා දීම | 01 |
| දක්ෂිණ කෘෂිකර්ම නවෝදය - ලබුදූව | 05 |
| ඉසුරු දිවිය උත්සවය සහ කෘෂිකර්ම ප්‍රදර්ශනය | 01 |
| ක්ෂේත්‍ර දිනය - බෝඹුවල වී පර්යේෂණ ආයතනය | 02 |
| ඩිප්ලෝමා සහතික ප්‍රධානය කිරීමේ උත්සවය | |

## ගුවන්විදුලි ගොවි සේවාව මඟින් පවත්වන ලද පුහුණු වැඩසටහන්

අසන්නන්ගේ සමාජ සඳහා පහත දැක්වෙන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**වගු අංක 3.2.9 : පුහුණු වැඩසටහන්**

| තේමාව | පුහුණුකරුවන් සංඛ්‍යාව | ඒකකය |
|---|---|---|
| මී මැසි පාලනය | 38 | කොළඹ |
| ආහාර තාක්ෂණය | 33 | කොළඹ |
| බද්ධ කිරීම | 21 | කොළඹ |
| ගෙවතු අලංකරණය | 48 | කොළඹ |
| පලතුරු බෝග කප්පාදු කිරීම | 47 | කොළඹ |
| නාගරික කෘෂිකර්මය | 27 | කොළඹ |
| බෝග සායන | 48 | කොළඹ |
| පලතුරු බෝග කප්පාදුව | 25 | කඳුරට |
| ගෙවතු වගාව | 28 | කඳුරට |
| පලතුරු බෝග බඳුන්ගත කිරීම | 32 | කඳුරට |
| කොස් වඩේ පිළියෙල කිරීම | 30 | රුහුණ |
| කප්පාදු කිරීම | 30 | රුහුණ |

## කෘෂි තාක්ෂණ උද්‍යානය - බටඅත

මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිටින විවිධාකාර පාර්ශ්වකරුවන්, ගොවීන්, විශ්වවිද්‍යාල සිසුන් සහ ව්‍යවසායකයින් ආදී පිරිස්වල හැකියාවන් වර්ධන කිරීමයි. පාසැල් සිසුන් මෙම උද්‍යානය මඟින් ඉලක්ක කරන ප්‍රධාන ප්‍රතිලාභීන් වන අතර මෙමගින් ඔවුන්ට කෘෂි විද්‍යාව ඉගෙනීමේ සේම මනා ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීමේ අවස්ථාවන් සලසා දෙයි.

මෙම උද්‍යානය ගොවීන්ට, පාසැල් සිසුන්ට සහ මහජනයාට කෘෂිකර්මය හැදෑරීමට හැකි පාරාදීසයක් වනවා පමණක් නොව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්නක් ද වේ. එමෙන්ම මෙය ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම දිරිගන්වන සුවිශේෂී ස්ථානයකි. ඓතිහාසික ස්ථාන, වනජීවීන්, වෙරළ සහ මුහුද හැරුණු විට මෙම ස්ථානය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන නවතම සංකල්පයක් බවට පත්ව ඇත.

එමනිසා, බටඅත උද්‍යානය කෘෂිකර්මය කෙරෙහි උනන්දුවක් දක්වන්නන්ට පාරාදීසයකි. ස්වභාවිකත්වය සහ දර්ශනවල සෞන්දර්යය වින්දනය කිරීම සඳහා වැව්වලට මුහුණ ලා පිහිටි ඩෙක් සහිත ගිමන්හල්, කුඹුරු, පලතුරු උයන් මෙම උද්‍යානයේ සුලභය.

බටඅත උද්‍යානයේ බෝග යොදා ගනිමින් සෞන්දර්යාත්මකව භූමි අලංකරණය කළ පරිසරය තුළ වී උද්‍යානය, කොළ එළවළු උද්‍යානය, පලතුරු උද්‍යාන, ඌන භාවිත පලතුරු උද්‍යාන, ඖෂධ උද්‍යානය, හේන, කුළුබඩු උද්‍යානය, කෙසෙල් උද්‍යානය ආදී විවිධ ආදර්ශන ක්ෂේත්‍ර ඇත. උද්‍යානයට ප්‍රවේශ වන්නට ඇත්තේ ශ්‍රම සහයෝගිතාව සංකේතවත් කරන දෑත් ආරුක්කුවක් තුළිනි.

බෝග යොදා ගනිමින් සිදු කරන භූමි අලංකරණය වශයෙන් මෙකල හඳුන්වන සෞන්දර්යාත්මකව සකස් කළ පරිසරයක් තුළ ස්ථාපිත කළ විවිධ එළවළු පැළ රාශියකින්, සජීවී කෘෂි ජෛව විවිධත්වයකින් සහ සජීවී කෘෂි බෝග කෞතුකාගාරයකින් මෙම උද්‍යානය පිරී ඇත. මාර්ගය දෙපස වියළි කලාපීය තත්ත්වයන්ට වඩාත් සුදුසු කැක්ටස් කුලයට අයත් ඩ්‍රැගන්ෆෘට් පඳුරු වලින් සැරසී ඇත. නරඹන්නන්ට ඉහළ වටිනාකමක් සහිත බෝගයක් පිළිබඳව පණිවිඩයක් ලබාදෙන මෙම පලතුරු ආහාරයට ගත හැකි අතර ලංකාව තුළ ඉහළ මිලක් සහිතය.

මෙම උද්‍යානයේ තවත් වැදගත් අංගයක් වන්නේ කෘෂිකාර්මික අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීමයි. නරඹන්නන්ට මඟ පෙන්වීම හා විස්තර ලබා දීම සඳහා ක්ෂේත්‍රයේ පහසුකම් සපයන්නෝ 15ක් සිටිති. ලෝකයේ පිහිටි අනෙකුත් සාමාන්‍ය උද්‍යානවල මෙන් නොව මෙම තාක්ෂණ උද්‍යානය තුළ ගොවීන්, පාසැල් සිසුන් සහ මහජනයා දැනුවත් කිරීම සඳහා එහි එක් එක් කොටස ආවරණය කිරීමට පහසුකම් සපයන්නන්ගේ සේවය (කෘෂිකර්ම ඩිප්ලෝමාව සහිත කෘෂි විද්‍යාඥයින් ) ලබා දෙනු ලැබේ.

මෙහි ඇති තවත් පහසුකමක් වන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා 3න්ම උපදෙස් සහ තාක්ෂණික කරුණු සහිත පුවරු පැවතීමයි.

## ප්‍රගතිය

**වගු අංක 3.2.10 : කෘෂි තාක්ෂණික උද්‍යාන මඟින් උපයා ගන්නා ලද ආදායම**

| විස්තරය | ආදායම (රු.) |
|---|---|
| පාසැල් සිසුන් | 52 ,575 .00 |
| වෙනත් සිසුන් | 21,220.00 |
| වැඩිහිටියන් | 282,620.00 |

| විස්තරය | ආදායම (රු.) |
|---|---|
| විදේශීය සංචාරකයින් - ළමුන් | 1,000.00 |
| වැඩිහිටියන් | 21 ,00.00 |
| රථ ගාල් ගාස්තු | 28,620.00 |
| ශ්‍රවණාගාරය | 1,500.00 |
| ගොවිපළ නිපැයුම් | 150,295.00 |
| බිත්තර වී නිෂ්පාදනය | 237,766.62 |
| **එකතුව** | **796,236.62** |

## 2013 වර්ෂය සඳහා සැලැස්ම

**ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය**

- පැල්වෙහෙර ගොවිපළෙහි "එක් ස්ථානයකින් බොහෝ දෑ මිලදී ගත හැකි අලෙවි සැලක් (One Stop Shop) ස්ථාපිත කිරීම
- සීතා එළියේ කෘෂි උද්‍යානයක් ස්ථාපිත කිරීම
- රූපවාහිනී වාර්තා වැඩසටහන් දෙක නිපදවීම සහ මුද්‍රිත මාධ්‍ය ලිපි ලේඛන සැලසුම් කිරීම අඛණ්ඩව සිදු කිරීම
- ජාතික කෘෂිකාර්මික තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානයේ ඉදි කිරීම් කටයුතු අඛණ්ඩව කරගෙන යාම
- දැයට කිරුළ සහ ගොවි සතිය යන ප්‍රදර්ශන සංවිධානය කිරීම
- තොරතුරු හා සංනිවේදන තාක්ෂණික කටයුතු (වටිනාකම් දාමය පිළිබඳ නව දත්ත මූලය ) අඛණ්ඩව සිදු කිරීම
- ගන්නොරුව කෘෂි තාක්ෂණ උද්‍යානය සඳහා ඒකාබද්ධ කෘෂි ක්ෂේත්‍රයක් එක් කිරීම

**කෘෂි ප්‍රකාශන**

- සංශෝධිත ප්‍රකාශන 10 ප්‍රකාශයට පත් කිරීම
- ගොවිකම් සඟරාව සහ කමතෝලිල් විලක්කම් සඟරා සඳහා නව ඉදිරිපත් කිරීම් ශෛලියක් සහ අන්තර්ගතයන් හඳුන්වා දීමට පියවර ගෙන ඇත.
- ආසියානු ආහාර හා තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ නව ප්‍රකාශන 6ක් ප්‍රකාශයට පත් කිරීම
- විවිධ මාතෘකා සම්බන්ධයෙන් පත්‍රිකා 200, 000ක් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

**ගුවන්විදුලි ගොවි සේවය**

- සතියේ දිනවල ප.ව.6.30 -ප.ව.7.30 අතර නව ගුවන්විදුලි කාල වේලාවක්
- නව ගුවන්විදුලි නාලිකාවක් සඳහා සංඛ්‍යාතයක් ලබා ගැනීම ඒ සඳහා පවතින බාධාවකි.

**කෘෂි තාක්ෂණ උද්‍යානය බටඅත**

- පැළ තවාන් කළමනාකරණය, පලතුරු හා එළවළු බෝග, මී මැසි පාලනය, ධාන්‍ය සහ වෙනත් ක්ෂේත්‍ර බෝග කළමනාකරණය පිළිබඳ ගොවි පුහුණු වැඩසටහන් පැවැත්වීම
- අවන්හල සහ ළමා උද්‍යානය විවෘත කිරීම

## කාර්ය මණ්ඩලය

| තනතුර | සේවක / නිලධාරී සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | 02 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 04 |
| විෂයානුගත විශේෂඥ | 01 |
| කෘෂිකර්ම නිලධාරි | 05 |
| කාර්‍යකාචාර්ය | 02 |
| කෘෂිකර්ම උපදේශක | 50 |
| වැඩසටහන් සහකාර | 04 |
| මාධ්‍ය සහකාර | 03 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 |
| කළමනාකරණ සහකාර | 13 |
| චිත්‍ර ශිල්පී | 02 |
| ෆෝමන් (වැඩ බලන) | 01 |
| ඡායාරූප ශිල්පී | 01 |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 |
| පොත් බඳින්නා | 01 |
| යන්ත්‍ර පරිචාරක | 03 |
| ගොවිපළ ලිපිකරු | 01 |
| අකුරු අමුණන්නා | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 |
| රියදුරු | 14 |
| ට්‍රැක්ටර් රියදුරු | 01 |
| සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| ගබඩාකරු | 01 |
| මුරකරු | 07 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| ලොරි සහායක | 01 |
| වඩු කාර්මික | 01 |
| පැස්සුම්කරු | 01 |
| විදුලි ශිල්පී | 01 |
| පින්තාරුකරු | 01 |
| කම්කරු (ස්ථිර) | 22 |
| කම්කරු (කොන්ත්‍රාත් / පරිගණක ක්‍රියාකරු | 166 |
| **එකතුව** | **321** |

# 4.1 පාලන අංශය

පාලන අංශයේ කාර්යභාරය සේවකයන් තනතුරුවලට පත් කිරීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා වන කාලයට අදාළ විවිධාකාර ආයතනික කටයුතු ඉටු කිරීම වශයෙන් දැක්විය හැකිය. අධ්‍යයන නිවාඩු ලබා දීම හා සේවකයන්ගේ විනයානුකූල හැසිරීම පිළිබඳ කරුණු ද මෙම අංශයේ වැඩ කටයුතු තුළ අන්තර්ගත වේ. මෙයට විවිධ අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂම, නීතිපති දෙපාර්තමේන්තුව, උපදේශක කමිටු, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් කාර්යාලය වැනි ආයතන මෙන්ම වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමග ද කටයුතු කිරීමට සිදුවේ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ මග පෙන්වීම සහ උපදෙස් පරිදි මෙම සමස්ත ක්‍රියාදාමය සම්බන්ධීකරණය කිරීමේ වගකීම පාලන අංශයට පැවරී ඇත.

## අයවැය

2012 වර්ෂයේදී ලද ප්‍රතිපාදනය හා දරන ලද වියදම වගු අංක: 4.1.1 හි දැක්වේ.

**වාර්ෂික අයවැය - 2012 (රු.)**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| මූලධන | 14,419,414 | 14,414,946 | 99 |
| පුනරාවර්තන | 7,533,255 | 7,399,165 | 97 |
| **එකතුව** | **21,952,699** | **21,814,111** | **98** |

## ප්‍රගතිය

### පත් කිරීම්

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කරන ලද පත් කිරීම්

| තනතුර | පත් කිරීම් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 01 |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 03 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 02 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 01 |
| රාජ්‍ය කළමනාකාර සහකාර (අධි ශ්‍රේණිය) | 15 |
| කෘෂිකර්ම උපදේශක | 156 |
| පර්යේෂණ සහකාර | 84 |
| අකුරු අමුණන්නා | 01 |
| ගබඩාකරු | 47 |
| පර්යේෂණ උප සහකාර | 12 |
| බීජකරු | 29 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 49 |
| බද්ධකරු | 53 |
| සංචාරක බංගලා භාරකරු | 11 |

## උසස්වීම්

වසර තුළ පහත දැක්වෙන උසස්වීම් ලබා දෙන ලදී.

| තනතුර | උසස්වීම් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය, ii/i ශ්‍රේණිය | 12 |
| විදුලි ශිල්පී, ii/i ශ්‍රේණිය | 04 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු, ii/i ශ්‍රේණිය | 17 |

## ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීම

| | |
|---|---|
| පර්යේෂණ සහකාර - විශේෂ ශ්‍රේණිය | 03 |
| කෘෂිකර්ම උපදේශක- 1 පංතිය | 63 |
| කෘෂිකර්ම උපදේශක- ii පංතිය | 42 |
| කම්කරු | 510 |

## සේවයෙන් විශ්‍රාම ගැනීම්

| තනතුර | විශ්‍රාම ගත් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 14 |
| මාධ්‍ය සහකාර | 01 |
| පර්යේෂණ සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 33 |
| වැඩ පරීක්ෂක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර-අධි ශ්‍රේණිය | 02 |
| ගොවිපළ ලිපිකරු | 26 |
| රියදුරු | 16 |
| යන්ත්‍රාගාර උපස්ථායක | 01 |
| වෑද්දුම්කරු | 01 |
| ජල පොම්ප ක්‍රියාකරු | 01 |
| යන්ත්‍ර ශිල්පී | 01 |
| වඩු කාර්මික | 01 |
| බීජ කාර්මික | 01 |
| මුරකරු | 16 |
| පර්යේෂණ උප සහකාර | 02 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| අරක්කැමි | 01 |
| කාර්යාල කාර්ය සහායක | 06 |
| කම්කරු | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |

## සේවයේ යෙදී සිටියදී මියයාම්

| තනතුර | මිය ගිය සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 02 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| රාජ්‍ය කළමනාකාර සහකාර | 01 |
| රියදුරු | 03 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 01 |
| සංචාරක බංගලා භාරකරු | 01 |
| පෙදරේරු | 01 |

## වෙනත් තනතුර සඳහා නිදහස් කිරීම

| | |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 01 |

## තනතුරු හැරයාම

| | |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | 03 |

කෘෂිකර්ම උපදේශක 01

යන්ත්‍ර ශිල්පී 01

**තනතුරෙන් ඉල්ලා අස්වීම**

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය 01

කෘෂිකර්ම උපදේශක 41

පර්යේෂණ සහකාර 06

ගොවිපළ යන්ත්‍ර උපදේශක 01

**සේවය අවසන් කිරීම**

කෘෂිකර්ම උපදේශක 01

**පළාත් සභාවලට නිදහස් කිරීම්**

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය 01

කෘෂිකර්ම උපදේශක 07

පර්යේෂණ සහකාර 01

**නැවත සේවයේ පිහිටුවීම**

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය 02

**විනය පරීක්ෂණ**

| විස්තරය | **2012** වසර ආරම්භයේදී නිම කිරීමට පැවති පරීක්ෂණ සංඛ්‍යාව | **2012** වසර තුළ ආරම්භ කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | **2012** වසර තුළ නිම කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | **2012.12.31** දිනට නිම කිරීමට පැවති පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මූලික විමර්ශන සහ පෙත්සම් පිළිබඳ පරීක්ෂණ | 87 | 69 | 46 | 100 |

**මුදල් රෙගුලාසි 104 යටතේ සිදු කරන පරීක්ෂණ**

| **2012** වසර ආරම්භයේදී නිම කිරීමට පැවති පරීක්ෂණ සංඛ්‍යාව | **2012** වසර තුළ ආරම්භ කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | **2012** වසර තුළ නිම කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | **2012.12.31** දිනට නිම කිරීමට පැවති පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 540 | 91 | 145 | 486 |

**වැටුප් අත්තිකාරම් සහ ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය**

**ආපදා ණය** | ගෙවන ලද මුදල

අනුමත කළ වවුචර් සංඛ්‍යාව - 774 | රු.92,815,029.00

| | |
|---|---|
| **බයිසිකල් ණය** | **ගෙවන ලද මුදල** |
| අනුමත කළ වවුචර් සංඛ්‍යාව-35 | රු.210,000.00 |
| **දේපල ණය** | **ගෙවන ලද මුදල** |
| නිර්දේශ කළ ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව-57 | රු.61,603,000.00 |
| **යතුරු පැදි සංඛ්‍යාව** | **ගෙවන ලද මුදල** |
| නිර්දේශ කළ ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව-09 | රු.1,350,000.00 |

## අග්‍රහාර රක්ෂණ ක්‍රමය

- රෝහල් ගාස්තු සහ ඇස් කණ්නාඩි වියදම ප්‍රති පූර්ණය කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් වටිනාකම - රු. 8,073,161.84
  අයදුම්පත් සංඛ්‍යාව 932
- ඉදිරිපත් කරන ලද මරණ සඳහා හිමිකම් පෑම් සංඛ්‍යාව - 06
- ස්වභාවික මරණ සඳහා ප්‍රතිලාභ- රු. 600,000.00
- ඉදිරිපත් කරනලද ස්වභාවික මරණ සඳහා හිමිකම් පෑම් සංඛ්‍යාව -12
- ප්‍රතිපූර්ණය සහ හිමිකම් පෑම් සඳහා අයදුම් කරන ලද මුළු මුදල - රු.8,673,161.84

## ඇප තැන්පතු

- විශ්‍රාම ගැනීමෙන් පසු ඇප තැන්පතු - 73

නිදහස් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව

නිදහස් කරන ලද මුදල- රු. 1,085,690.53

- රජයේ ගිණුමට බැරකරන ලද මුදල -රු. 8,677,582.08
- ඇප තැන්පතු සඳහා අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද ඇප බැඳුම්කර සංඛ්‍යාව-586

## විශ්‍රාම වැටුප් ගෙවීම්

පහත දැක්වෙන පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම්වලට අදාළ ලිපිගොනු ලැබිණි.

- විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 280
- මරණ පාරිතෝෂික සඳහා 01
- පාරිතෝෂික ගෙවීම් සඳහා 01
- විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීම් සඳහා 195
- බාල වයස්කාර ළදුපත් මුදා හැරීම 08

## අධ්‍යයන නිවාඩු

පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවූ නිලධාරීන් සංඛ්‍යාව

**ආචාර්ය උපාධිය**

| | |
|---|---|
| පර්යේෂණ සහකාර | 01 |

**විද්‍යාපති උපාධිය**

| | |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 03 |
| වැඩසටහන් සහකාර | 01 |

**පශ්චාත් උපාධි අධ්‍යන කටයුතු නිම කර ආපසු පැමිණි නිලධාරීන් සංඛ්‍යාව**

**විද්‍යාපති උපාධිය**

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරි | 01 |
| පුද්ගල චාරිකා | 01 |

**ආචාර්ය උපාධිය**

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරි | 02 |

## මෙරටදී විද්‍යාවේදී හා විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු සඳහා නිදහස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව

**ආචාර්ය උපාධිය**

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරි | 01 |

**විද්‍යාපති උපාධිය**

| | |
|---|---|
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| පර්යේෂණ නිලධාරි | 01 |

## මෙරටටදී විද්‍යාවේදී හා විද්‍යාපති උපාධි සම්පූර්ණ කරන ලද නිලධාරීන් සංඛ්‍යාව

**විද්‍යාවේදී උපාධිය**

| | |
|---|---|
| කෘෂිකර්ම උපදේශක | 01 |

**විද්‍යාපති උපාධිය**

| | |
|---|---|
| කෘෂිකර්ම නිලධාරි | 02 |
| කථිකාචාර්ය | 03 |
| පර්යේෂණ නිලධාරි | 01 |

## පුහුණු, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා විදේශ ගතවීම්

| තනතුර | විදේශ චාරිකා සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | 03 |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | 03 |
| අධ්‍යක්ෂ | 17 |
| ප්‍රධාන ඉංජිනේරු | 01 |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 03 |
| පළිබෝධනාශක අධ්‍යක්ෂ | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 12 |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 13 |
| ඉංජිනේරු | 04 |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | 05 |
| කථිකාචාර්ය | 12 |
| පර්යේෂණ නිලධාරි | 43 |
| කෘෂිකර්ම නිලධාරි | 05 |
| විෂයානුගත විශේෂඥ | 01 |
| කෘෂිකර්ම උපදේශක | 10 |
| වැඩසටහන් සහකාර | 04 |
| මාධ්‍ය සහකාර | 01 |
| තාක්ෂණික නිලධාරි | 01 |
| ගොවිපළ යන්ත්‍ර උපදේශක | 01 |

## මෙරට පුහුණු

| වසර තුළ සංවිධානය කරන ලද පුහුණු | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සඳහා “විනයානුකූල පියවර ගැනීම” පිළිබඳ පුහුණුව | 77 |
| රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සඳහා “පුද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම” පිළිබඳ පුහුණුව | 97 |
| රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සහ ද්විතීක මට්ටමේ වෙනත් නිලධාරීන් සඳහා ඵලදායිතා වර්ධනය පිළිබඳ වැඩමුළු | |
| වැඩමුළුව - 1:1වන පියවර | 43 |
| වැඩමුළුව - 2:1වන පියවර | 47 |

| | |
|---|---|
| වැඩමුළුව - 3:1වන පියවර | 78 |
| රියදුරන් සඳහා තාක්ෂණික දැනුම පිළිබඳ වැඩමුළුව | 15 |

| බාහිර ආයතන විසින් පවත්වන ලද පුහුණු සඳහා නිලධාරීන් යොමු කිරීම | යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් "ලිපි ලේඛන කළමනාකරණය" සම්බන්ධයෙන් පවත්වන ලද පුහුණු පාඨමාලාව | 01 |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද පුහුණු | 02 |
| විවිධ ආයතන විසින් මෙරටදී පවත්වන ලද තාක්ෂණික පුහුණු | 30 |
| විවිධ ආයතන විසින් මෙරටදී පවත්වන ලද තාක්ෂණික නොවන පුහුණු | 30 |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද පුහුණු | 01 |
| රාජ්‍ය සේවා පුහුණු ආයතනය විසින් පවත්වන ලද පුහුණු | 32 |

- ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලවලින් පැමිණි අභ්‍යාසලාභීන් 27දෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණු පහසුකම් ලබා දෙන ලදී.

## අයකර ගැනීම්

ගිවිසුම් උල්ලංඝනය කළ නිලධාරීන්ගෙන් රජයට අය කර ගත් මුදල රු. 4,182 ,187.56කි.

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරි / සේවක සංඛ්‍යාව |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) | 01 |
| අධ්‍යක්ෂ (පාලන) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 01 |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 01 |
| පරිපාලන නිලධාරි | 06 |
| භාෂා පරිවර්තක (ඉංග්‍රීසි) | 02 |
| භාෂා පරිවර්තක (දමිළ) | 01 |
| වැඩසටහන් නිලධාරි | 11 |
| නීති සහකාර | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 93 |
| රියදුරු | 06 |
| කාර්යාල කාර්ය සහායක | 21 |
| මුරකරු | 06 |
| කම්කරු | 27 |
| **එකතුව** | **178** |

# 4.2. ඉංජිනේරු අංශය - පේරාදෙණිය

ඉංජිනේරු අංශයේ ප්‍රධාන අරමුණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය උසස් තත්ත්වයේ යටිතල පහසුකම් කඩිනමින් සැපයීමයි.

මෙම අංශය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන අයුරින් වර්ගීකරණය කළ හැකිය.

- මූලධන වත්කම් ප්‍රසම්පාදනය
  - සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම්
  - යන්ත්‍ර සූත්‍ර, වාහන සහ කාර්යාලයීය උපකරණ ප්‍රසම්පාදනය
- යටිතල පහසුකම් නඩත්තු කිරීම
  - ගොඩනැගිලි හා ව්‍යුහ
  - වාහන සහ යන්ත්‍ර සූත්‍ර
  - කාර්යාලයීය උපකරණ
- වෙනත් සේවා
  - කුණ්ඩසාලේ පිහිටි පානීය ජල සැපයුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම අංශ සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම

ඉංජිනේරු අංශය විසින් ඉටු කරන සේවා වැඩිදියුණු කර ව්‍යාප්ත කිරීම පිණිස ස්ථාන 4ක (කුණ්ඩසාලේ, සීතාඑළිය, පොළොන්නරුව සහ අඟුණකොළපැලැස්ස) ප්‍රාදේශීය යාන්ත්‍රික වැඩපොළ පිහිටුවන ලදී. මෙම වැඩපොළ මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වන්නේ වාහන අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීමයි. එයට අමතරව ප්‍රදේශයේ සිවිල් ඉංජිනේරුමය අවශ්‍යතාවන් සම්බන්ධයෙන් කාර්යක්ෂමව කටයුතු කිරීම පිණිස වැඩ පරීක්ෂකවරු ප්‍රාදේශීය කාර්යාල 3ක ස්ථානගත කරන ලදහ.

## අයවැය

2012 වර්ෂයේ විවිධ වැය ශීර්ෂ යටතේ ලද අයවැය ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක 4.2.1හි දැක්වේ.

**වගු අංක 4.2.1 : වාර්ෂික අයවැය - 2012 (රු.)**

| **වැය ශීර්ෂය** | **ප්‍රතිපාදනය** | **වියදම** | **වියදම් %** |
|---|---:|---:|---:|
| මූලධන | 2,892,245 | 2,124,748 | 73 |
| පුනරාවර්තන | 8,835,945 | 7,893,912 | 89 |
| **එකතුව** | **11,728,190** | **10,018,660** | **85** |

## ප්‍රගතිය

### සිවිල් ඉංජිනේරු කාර්යයන්හි ප්‍රගතිය

ඉටු කරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

- මෙම අංශය විසින් සිදු කළ නව ඉදි කිරීම් සහ අලුත්වැඩියා කටයුතු ඇස්තමේන්තු පිළියෙල කිරීම, ටෙන්ඩර් කළමනාකරණය හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම, වැඩකටයුතු අධීක්ෂණය

සහ ගෙවීම් අනුමත කිරීම මෙයට ඇතුළත් වේ.

- වෙනත් අංශ මගින් ඉටු කරන වැඩ කටයුතුවලට අදාළ ඇස්තමේන්තු පිළියෙල කිරීම
විශේෂයෙන්ම තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය ඇතුළු මානව සම්පත් සම්බන්ධයෙන් පවතින සීමාවන් හේතුවෙන් අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම මත පමණක් මෙම අංශය විසින් ඇස්තමේන්තු සකස් කරන ලදී.

## 2012 වර්ෂයේදී සිවිල් ඉංජිනේරු අංශය විසින් ඉටු කරන ලද සිවිල් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ සාරාංශය

**ලැබුණු ඉල්ලීම්**

- නව ඉදිකිරීම් - 149
- අලුත්වැඩියා - 549

**ඉටු කරන ලද සමස්ත වැඩ ප්‍රමාණය**

- යවන ලද ඇස්තමේන්තු සංඛ්‍යාව - 454
- ටෙන්ඩර් කැඳවීම් - 167
- නඩත්තු කටයුතු පිළිබඳ සුළු අලුත්වැඩියා - 80
- ඇස්තමේන්තු පිළියෙල කිරීම් - 621

**වගු අංක 4.2.2 : වසර තුළ ඉටු කරන ලද සිවිල් ඉංජිනේරු කාර්යයන්හි වටිනාකම (අංශ අනුව සාරාංශය)**

| අංශය/ විස්තරය | ලබාදුන් මුදල (රු.) |
|---|---:|
| පාලන අංශය | 9,590,282.26 |
| මුදල් අංශය | 2,310,084.56 |
| වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | - |
| බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ සේවය | 5,891,648.72 |
| ව්‍යාප්ති සහ පුහුණු | 42,850,107.65 |
| සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය | 852,440.00 |
| උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 12,998,382.36 |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 26,130,686.23 |
| ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය | 568,399.41 |
| ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 4,561,365.20 |
| ඉංජිනේරු අංශය | 1,055,398.59 |
| **එකතුව** | **93,810,413.12** |

## යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු කාර්යයන්

2012 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කරන ලදී.

- කාර්ය ප්‍රසම්පාදනය
  – ගරාජ සහ සේවා සැපයුම් ස්ථාන ලියාපදිංචි කිරීම
  – සැපයුම්කරුවන් ලියාපදිංචිය

• 2012 වර්ෂයේදි සිදු කරන ලද වාහන අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු

**වගු අංක 4.2.3 : වාහන අලුත්වැඩියා සහ නිර්දේශ ලබාදීම්**

| ස්ථානය | විශාල අලුත්වැඩියා | සුළු අලුත්වැඩියා | නිර්දේශ කිරීම් | එකතුව |
|---|---|---|---|---|
| කුණ්ඩසාලේ | 10 | 96 | 6 | 127 |
| ප්‍රධාන කාර්යාලය | | | 125 | 125 |
| පොළොන්නරුව | 3 | 17 | 45 | 73 |
| අඟුණකොළපැලැස්ස | 40 | 95 | 200 | 346 |
| සීතාඑළිය | 9 | 92 | 96 | 208 |
| **එකතුව** | **62** | **300** | **472** | **879** |

• යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ප්‍රසම්පාදනය

**වගු අංක 4.2.4 : 2012 වර්ෂයේදී ඉංජිනේරු අංශය විසින් ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩවල වටිනාකම**

| අංශය | මුළු වටිනාකම (රු.) |
|---|---|
| ඉංජිනේරු අංශය | 633,535.80 |
| පාලන අංශය | 843,848.28 |
| මුදල් අංශය | 1,845,817.00 |
| ව්‍යාප්ති හා පුහුණු අංශය | 23,833,741.40 |
| සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය | 346,447.60 |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 10,725,554.68 |
| ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය | 731,579.80 |
| උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 3,448,077.54 |
| බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය | 22,662,918.43 |
| ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 6,608,048.00 |
| වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 2,878,078.50 |
| ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය | 170,672.40 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 55,000.00 |
| **එකතුව** | **74,783,319.43** |

## කුණ්ඩසාලේ පානීය ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය මහවැලි නදියේ ජලය ගැලුම් 200,000ක් පමණ පොම්ප කරයි. ජල පොම්පාගාර දිනකට පැය 18ක් ක්‍රියාත්මක වන අතර එහි බලශක්ති පරිභෝජනය කි. වො. 60ක් පමණ වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති විවිධ ආයතනවල සේම එය යටතේ නොපවතින ආයතන පරිශ්‍රවලටද මෙමගින් ජලය සැපයෙයි. වසර පුරාම පානීය හා ගෘහස්ථ අවශ්‍යතා සඳහා ක්ලෝරීන් එක් කරන ලද ජලය සැපයෙන අතර නියඟ සමයේදී අවශ්‍යතාව අනුව කෘෂිකාර්මික ගොවිපළෙහි ඇති වැවට ද ක්ලෝරීන් රහිත ජලය සපයනු ලැබේ.

## වෙනත් සේවා

ඉංජිනේරු අංශය ගොඩනැගිලි ඉදිකිරීම සහ අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, වැඩකටයුතු අධීක්ෂණය හා වාහන, උපකරණ සහ යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු පරීක්ෂා කර බලා නිර්දේශ කිරීම මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන, මධ්‍යස්ථාන හා ඒකක ගණනාවකට සහාය ලබාදිණි. මෙමගින් අබලි වාහන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පරීක්ෂා කිරීම හා තක්සේරු කිරීමද සිදු කෙරේ. එමෙන්ම තාක්ෂණික ඇගයීම් කටයුතුවල ක්‍රියාකාරී අයුරින් නිරතව ටෙන්ඩර් මණ්ඩලවලට උපදේශක සේවා සැපයීමද කරයි.

## ඉංජිනේරු අංශයේ කාර්ය මණ්ඩලය

මෙම අංශයේ පවතින පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් වැඩ කිරීමේ ධාරිතාව, කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය කෙරෙහි දැඩි බලපෑම් ඇති විය. තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු රැසක් පවතී. මෙම ගැටලුව හේතුවෙන්, සිවිල් ඉංජිනේරු වැඩ කටයුතු මෙන්ම කුණ්ඩසාලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වැනි නිතිපතා කෙරෙන කටයුතු ඉටු කිරීමේදී ද විවිධාකාර දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුව ඇත. වර්තමානයේ, සිවිල් ඉංජිනේරු අංශයේ වැඩ කොටස මෙහෙය වීම සඳහා ප්‍රමාණවත් වැඩ පරීක්ෂකවරුවන්, ගොඩනැගිලි ඕවර්සයර්වරුන් සහ සැලසුම් ශිල්පීන් සංඛ්‍යාවක් නොමැත.

# 2013 වසර සඳහා සැලැස්ම

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය (රු.) | අපේක්ෂිත කාලය |
|---|---|---|
| 2001 - කාර්ය මණ්ඩල නිල නිවාස අලුත්වැඩියා කිරීම | 1,500,000.00 | 2013 ඔක්තෝබර් |
| 2102 - කාර්යාලයීය ලී බඩු සහ උපකරණ | 450,000.00 | 2013 අගෝස්තු |
| 2103 - යන්ත්‍ර සූත්‍ර | 300,000.00 | 2013 ජූනි |
| 2105 - ඉඩම් සංවර්ධනය | 500,000.00 | 2013 නොවැම්බර් |
| 2401 - පුහුණු ධාරිතාව ඉහළ නැංවීම | 300,000.00 | 2013 නොවැම්බර් |

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු | 02 |
| සිවිල් ඉංජිනේරු | 02 |
| විදුලි ඉංජිනේරු | 01 |
| ඉංජිනේරු සහකාර | 02 |
| වැඩ පරීක්ෂක | 06 |
| ඉංජිනේරු ෆෝමන් | 01 |
| ගොවිපළ යාන්ත්‍රික උපදේශක | 03 |
| පරිපාලන නිලධාරි | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 14 |
| රියදුරු | 06 |
| යාන්ත්‍රික ශිල්පී | 12 |
| වඩු කාර්මික | 02 |
| පෙදරේරු | 01 |
| වෑද්දුම්කරු | 01 |
| බෙලෙක්කරු | 01 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| ගබඩාකරු | 02 |
| කම්කරු (විශේෂ - ගබඩා) | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 02 |
| කම්කරු | 10 |
| එකතුව | 77 |

# 4.2.1 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය, මහ ඉලුප්පල්ලම

ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය අනුරාධපුරයේ සිට කි.මී. 35ක් පමණ දුරින් මහඉලුප්පල්ලම කෘෂිකර්ම සංකීර්ණය තුළ පිහිටා ඇත. මෙම ආයතනය පිහිටුවා ඇත්තේ නිෂ්පාදන පිරිවැයඅඩුකරගැනීම, කෘෂි නිෂ්පාදනවල තත්ත්වය, ඵලදායිතාව සහ පරිමාව වර්ධනය කර ගැනීම පිණිස ගොවිපළ යාන්ත්‍රීකරණ තාක්ෂණය හඳුන්වාදීමෙන් ශ්‍රී ලංකාවට යෝග්‍ය ගොවිපළ යාන්ත්‍රීකරණයක් ප්‍රවර්ධනය කිරීම පිණිසය. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පවතින සමාජ ආර්ථික හා ක්ෂේත්‍ර තත්ත්වයන්ට ගැලපෙන ඵලදායී කෘෂිකාර්මික යාන්ත්‍රීකරණ තාක්ෂණයන් හඳුන්වා දීම මෙම ආයතනයේ ප්‍රධාන අරමුණු වේ. මෙමගින් ඉටුකරන කාර්යන් පහත දැක්වේ.

- ප්‍රමුඛතා සහ සීමා කාරක අනුව, විවිධ වගා ක්‍රමවල යාන්ත්‍රීකරණ අවශ්‍යතා හඳුනා ගැනීම
- සාර්ථක වෙතැයි අපේක්ෂා කරන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, ඒවායේ නිර්මාණය කිරීම්, කාර්යයන්, ආරක්ෂිත බව හා ආර්ථික සහ සමාජ විද්‍යාත්මක සාධක පදනම් කර ගනිමින් තෝරා ගැනීම සහ පරීක්ෂා කර බැලීම
- දේශීය තත්ත්වයන්ට ගැලපෙන ආකාරයෙන් කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිර්මාණය කිරීම, නවීකරණය සහ අනුවර්තනය
- දේශීය තත්ත්වයන්ට සුදුසු කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා තාක්ෂණික සැලසුම්, පරීක්ෂණ වාර්තා සහ උපදෙස් අත්පොත් සකස් කිරීම
- තාක්ෂණය දේශීය නිෂ්පාදකයින්ට ලබාදීම සහ යෝග්‍ය කාෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් ඉහළ නැංවීම
- ගොවීන් සහ අනෙකුත් උපයෝජකයන් අතර කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය සහ තාක්ෂණයන් ප්‍රචලිත කිරීම පිණිස කෘෂිකර්ම ව්‍යාප්ති ආයතනවලට හා අනෙකුත් ආයතනවලට සහාය වීම

මෙම මධ්‍යස්ථානය සතු අංශ 5කි. එනම්;

1. පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පරීක්ෂණ හා ඇගයීම් අංශය
3. කෘෂිකාර්මික හා කර්මාන්ත ව්‍යාප්ති අංශය
4. ගොවිපළ යන්ත්‍රසූත්‍ර නඩත්තු හා අලුත්වැඩියා අංශය
5. පරිපාලන අංශය

## අයවැය

2012 වර්ෂය සඳහා විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 4.2.1.1හි දැක්වේ.

**වගු අංක 4.2.1.1 : වාර්ෂික අයවැය-2012**

| වැය ශීර්ෂය | ප්‍රතිපාදනය | වියදම | වියදම් % |
|---|---|---|---|
| පුනරාවර්තන | 6,054,710 | 5,830,488 | 96 |
| මූලධන | 2,355,196 | 2,173,717 | 92 |
| **එකතුව** | **8,409,906.17** | **8,004,205** | **95** |

# ප්‍රගතිය

## පර්යේෂණ හා සංවර්ධන අංශය

### වී පිරිසිදු කරන යන්ත්‍රය

අධි ධාරිතාවක් සහිත වී පිරිසිදු කරන යන්ත්‍රය සඳහා ස්වයංක්‍රීයව බීජ ඇතුල් කළ හැකි ක්‍රමයක් එක් කෙරේ.අදාළ කොටස් නිර්මාණය කෙරෙමින් පවතී. දැනට ඇති වී පිරිසුදු කරන යන්ත්‍රය හා ධාන්‍ය පිරිසිදු කරන යන්ත්‍රය යොදා ගනිමින් මූලික ක්ෂේත්‍ර පරීක්ෂාව නිම කෙරිණි.

### අන්වක්ෂ ප්‍රවාහ ජල පොම්පය

රෝද හතරක බලයෙන් ක්‍රියා කරවන අන්වක්ෂප්‍රවාහ ජල පොම්පයක් සැලසුම් කර නිර්මාණය කිරීමෙන් පසු සාර්ථකව අත්හදා බලන ලදී.

### මඩබිම් බලවේග පැළ නෙළනය

දැනට ඇති යන්ත්‍රයේ අඩුපාඩු හඳුනා ගන්නා ලද අතර නව බලවේග වල් පැළ නෙළනයක මූලාදර්ශයක් සැලසුම් කර නිර්මාණය කෙරිණි.

### රෝද හතර ටැක්ටරයට ආඳන ලද පැළ සිටුවන යන්ත්‍රය (Injector Planter)

රෝද හතර ටැක්ටරයට ආඳන ලද පැළ සිටුවන යන්ත්‍රය සඳහා පොහොර යොදන උපාංගයක් එක් කිරීම පිණිස නිර්මාණ කටයුතු සිදුවෙමින් පවතී.

### පැද යන ආකාරයේ බීජ වප්කරය

මෙහි මූලාදර්ශ නිර්මාණය සාර්ථකව සම්පූර්ණ කරන ලදී.ක්ෂේත්‍රයේ ක්‍රියා කරවා අත්හදා බැලීමද නිම කෙරිණි.වාණිජ පරිමාණයෙන් නිෂ්පාදනය කිරීමට මෙම යන්ත්‍රය පිළිබඳ වැඩ කටයුතු අවසන් කිරීම පිණිස නවීකරණ සිදු කෙරෙමින් පවතී.

### දැනට ඇති රටකජු පොතු ඉවත් කරන යන්ත්‍රය සඳහා නවීකරණයන් කිරීම

දැනට ඇති යන්ත්‍රයෙහි මූලික නවීකරණ කටයුතු නිම කෙරිණි.

### දැනට ඇති මාෂ බෝග සැකසුම් යන්ත්‍රය සඳහා නවීකරණයන් කිරීම

මාෂ බෝග බීජ පිරිසිදු කරන හා වර්ග කරන උපාංග නිර්මාණය කර ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කෙරිණි.

## කෘෂිකාර්මික සහ කර්මාන්ත ව්‍යාප්ති අංශය

උපාධි අපේක්ෂකයින්, ගොවීන්, ගුරුවරුන්, පාසැල් සිසුන්, කාර්මික විද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩල ඇතුළු විශාල පිරිසක් ගොවිපළ යන්ත්‍රසූත්‍ර පිළිබඳ දැනුම ලබාගැනීමට සහ අධ්‍යයන කිරීමටමෙම මධ්‍යස්ථානය වෙත පැමිණියහ. වී සහ බඩඉරිඟු පිළිබඳ යාන්ත්‍රීකරණ පිළිවෙත්, පිටාර ජල සම්පාදන ක්‍රම ආදිය පිළිබඳව ගොවීන්ට සහ ව්‍යාප්ති නිලධාරීන්ට ප්‍රායෝගික දැනුමක් ලබාදීම පිණිස ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල ක්ෂේත්‍ර ආදර්ශන පවත්වන ලදී. ඔයාමඩුවෙහි පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනය සහ ගන්නොරුවෙහි පවත්වන ලද ගොවි සතිය ප්‍රදර්ශනය ගොවීන්ට ගොවිපළ යන්ත්‍රසූත්‍ර පිළිබඳව වැඩිදුර තොරතුරු ලබාදීමට හැකි වූ අගනා අවස්ථා විය.

වගු අංක **4.2.1.2 : 2012** වර්ෂයේදී ක්‍රියාත්මක කළ ව්‍යාප්ති වැඩසටහන

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| ක්ෂේත්‍ර ආදර්ශන | 25 |
| ගුවන්විදුලි වැඩසටහන් | 03 |
| ප්‍රදර්ශන | 02 |
| නරඹන්නන් | 1,697 |

## පරීක්ෂා කිරීම් සහ ඇගයීම් අංශය

ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මෙරට නිපදවන ලද හෝ ආනයනය කරන ලද කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කිරීම හා ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින එකම රාජ්‍ය ආයතනයයි.

2012 වර්ෂයේදී පහත දැක්වෙන යන්ත්‍රසූත්‍ර පරීක්ෂා කර බලන ලදී.

වගු අංක **4.2.1.3 :** පරීක්ෂා කර බලන ලද යන්ත්‍රසූත්‍ර

| යන්ත්‍ර වර්ගය | ලැබුණු යන්ත්‍ර සංඛ්‍යාව | සමත් වූ යන්ත්‍ර සංඛ්‍යාව | අසමත් වූ යන්ත්‍ර සංඛ්‍යාව | පරීක්ෂා කෙරෙමින් පවතින යන්ත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රෝද 4 ට්‍රැක්ටර් | 4 | 1 | 2 | 4 |
| රෝද 2 ට්‍රැක්ටර් | 1 | 2 | 2 | 7 |
| අතින් ක්‍රියා කරවන ඉසින යන්ත්‍ර | 3 | 3 | 4 | 1 |
| බලවේග ඉසින යන්ත්‍ර | 2 | 2 | 1 | 6 |
| අතුරුයත් ගෑමේ යන්ත්‍ර | - | - | - | 2 |
| සංයුක්ත අස්වනු නෙළන | 1 | - | - | 1 |
| ට්‍රැක්ටරයට ආඳන උපකරණ | - | - | 2 | 8 |
| ජල පොම්ප | 5 | 3 | - | 11 |
| බහු කාර්ය කැබලිකරණ | 1 | 1 | - | 1 |
| අත් උපකරණ | 7 | 7 | 8 | 4 |
| **එකතුව** | **24** | **19** | **19** | **45** |

## ගොවිපළ යන්ත්‍ර නඩත්තු හා අලුත්වැඩියා අංශය

මෙම අංශය ස්ථාපිත කරන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළ යන්ත්‍රසූත්‍ර හා වාහනවලට අදාළ අලුත්වැඩියා කිරීම්, පරීක්ෂා කිරීම්, ඇස්තමේන්තු සකස් කිරීම්, අලුත්වැඩියා පිළිබඳ නිර්දේශ කිරීම් සහ සියලුම යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබාදීම පිණිසය. 2012 වර්ෂයේදී අලුත්වැඩියා සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ ලබාදෙන ලදී.

වගු අංක **4.2.1.4 :** අලුත්වැඩියා කටයුතු සහ නිර්දේශ

| විස්තරය | සැහැල්ලු වාහන(වෙනත් ආයතන) | සැහැල්ලු වාහන (ගො. යා. ප.ම) | යතුරු පැදි (වෙනත් ආයතන) | යතුරු පැදි (ගො. යා. ප.ම) | බර වාහන (වෙනත් ආයතන) | බර වාහන (ගො. යා.ප.ම) | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| නිර්දේශ සංඛ්‍යාව | 98 | 00 | 13 | 00 | 47 | 00 | **158** |
| අලුත්වැඩියා කිරීම් සංඛ්‍යාව | 51 | 14 | 07 | 04 | 23 | 10 | **109** |

එමෙන්ම, 2012 වර්ෂය තුළ සේවා සැපයීම් 13ක් ද සිදු කෙරිණි.

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරි / සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | - |
| යාන්ත්‍රික ඉංජිනේරු | 04 |
| ඉංජිනේරු සැලසුම් ශිල්පී | 01 |
| ඉංජිනේරු ෆෝමන් | 01 |
| කළමනාකරණ සහකාර | 03 |
| පර්යේෂණ සහකාර | 01 |
| ගොවිපළ යන්ත්‍රසූත්‍ර උපදේශක | 02 |
| කෘෂිකර්ම උපදේශක | 02 |
| රියදුරු | 02 |
| ගබඩාකරු | 01 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 02 |
| යන්ත්‍රාගාර උපස්ථායක | 02 |
| යාන්ත්‍රික ශිල්පී | 03 |
| යන්ත්‍ර ශිල්පී | 02 |
| වැද්දුම්කරු | 01 |
| පැස්සුම්කරු | 02 |
| බෙලෙක්කරු | 01 |
| කම්මල්කරු | 01 |
| වඩු කාර්මික | 01 |
| මුරකරු | 01 |
| නුපුහුණු කම්කරු | 09 |
| කොන්ත්‍රාත් කම්කරු | 29 |
| **එකතුව** | **71** |

# 4.3 මුදල් අංශය - පේරාදෙණිය

## මුදල් අංශයේ ප්‍රධාන අරමුණු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් අරමුණු ළඟා කර ගැනීම සඳහා පරිපූර්ණ මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාවට නැංවීම:

1. වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම
2. බැංකු ගිණුම් පවත්වාගෙන යාම
3. දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන් කර දීම
4. දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කිරීම හා ගිණුම් ගත කිරීම
5. පුද්ගලික පඩිනඩි ඇතුළු සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් පිළිබඳ කටයුතු කිරීම
6. අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම
7. මූල්‍ය ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ සහ ඇගයීම
8. දේශීය සහ විදේශීය හා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග මූල්‍යමය කටයුතු සම්බන්ධීකරණය කිරීම
9. විදේශ ගෙවීම්
10. ගොවිපළ අත්තිකාරම් ගිණුමේ කටයුතු ක්‍රියාත්මක කිරීම
11. විසර්ජන හා ආදායම් ගිණුම් ඇතුළු අවසාන ගිණුම් සැකසීම
12. වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පිළිබඳ කටයුතු කිරීම
13. සේවකයන් සඳහා ණය මුදල් ලබා දීම
14. පරිගණක භාවිතය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පිරිස් පුහුණු කිරීම

වගු අංක **4.3.1 :** මූලධන වියදම **- 2012 (**රු. **' 000)**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව | වියදම | ප්‍රගතිය % ක් ලෙස |
|---|---|---|---|---|
| 285 -1-1 | පරිපාලන හා ආයතනික සේවා | 25,753 | 21,891 | 85 |
| 285 -2-2 | කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන | 403,859 | 290,949 | 72 |
| 285 -2-3 | කෘෂිකර්ම ව්‍යාප්ති හා පුහුණු | 125, 385 | 115,148 | 91 |
| 285 -2 -4 | බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ | 817,283 | 727,359 | 89 |
| එකතුව | | **1,372,280** | **1,155,348** | **84** |

2012 වර්ෂයේ ප්‍රමාණවත් පදිරි අක් මුදල් නොතිබීම නිසා මූලධන ව්‍යාපෘතිවල අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය ලබා ගත නොහැකි විය. මේ නිසා, එක් එක් ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 122ක මුදලක් තැන්පත් ගිණුමට මාරු කර වියදම් දැරීමට ඉල්ලුම් කර ඇත. එක් එක් ව්‍යාපෘතිය යටතේ දරන ලද මූලධන වියදම් අදාළ බැරකම් සමග පහත දක්වා ඇත.

වගු අංක **4.3.2 :** බැරකම් සමග මූලධන වියදම **-2012 (රු. ' 000)**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | බැරකම් සමඟ වියදම | ප්‍රගතිය % ක් ලෙස |
|---|---|---|---|---|
| 285 -1-1 | පරිපාලන හා ආයතනික සේවා | 25,753 | 22,465 | 87 |
| 285 -2-2 | කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන | 403,859 | 365,805 | 90 |
| 285 -2-3 | කෘෂිකර්ම ව්‍යාප්ති හා පුහුණු | 125, 385 | 119,627 | 95 |
| 285 -2 -4 | බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ | 817,283 | 770,139 | 94 |
| | එකතුව | **1,372,280** | **1,278,037** | **93** |

වගු අංක **4.3.3 :** පුනරාවර්තන වියදම **- 2012 (රු. ' 000)**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | වියදම | ප්‍රගතිය % ක් ලෙස |
|---|---|---|---|---|
| 285 -1-1 | පරිපාලන හා ආයතනික සේවා | 202,235 | 221, 690 | 99 |
| 285 -2-2 | කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන | 773,956 | 769,386 | 99 |
| 285 -2-3 | කෘෂිකර්ම ව්‍යාප්ති හා පුහුණු | 586,915 | 581,822 | 99 |
| 285 -2 -4 | බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ | 410,994 | 409,957 | 99 |
| | එකතුව | **1,994,498** | **1,982,855** | **99** |

වගු අංක **4.3.4 :** අත්තිකාරම් ගිණුම් කටයුතු **-2012 (රු. ' 000)**

| විස්තරය | සංශෝධිත අනුමත වියදම් සීමාව | සත්‍ය ලැබීම් |
|---|---|---|
| **1.ගොවිපළ අත්තිකාරම් ගිණුම** | | |
| උපරිම වියදම් සීමාව | 358,000 | 382,826 |
| අවම ලැබීම් සීමාව | 375,000 | 404,861 |
| **2.රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | |
| උපරිම වියදම් සීමාව | 180,000 | 165,925 |
| අවම ලැබීම් සීමාව | 110,000 | 164,017 |

## ගොවිපළ අත්තිකාරම් ගිණුමේ ලාභ සහ අලාභ

**වගු අංක 4.3.5 : ගොවිපළ අත්තිකාරම් ගිණුමේ ලාභ සහ අලාභ : 2002 – 2012 (රු. මිලියන)**

| වර්ෂය | ශුද්ධ ලාභය / අලාභය (සහනාධාර ගැලපීමට පෙර) රු. මිලියන | සහනාධාර මුදල් රු.මිලියන | ශුද්ධ ලාභය / අලාභය (සහනාධාර ගැලපීමට පෙර) - රු. මිලියන |
|---|---|---|---|
| 2002 | (21.6) | - | (21.6) |
| 2003 | (28.5) | - | (28.5) |
| 2004 | (44.3) | - | (44.3) |
| 2005 | (24.6) | 39.0 | (14.4) |
| 2006 | (50.6) | 51.0 | 00.4 |
| 2007 | (14.0) | 50.0 | 64.0 |
| 2008 | (94.0) | 50.0 | (44.0) |
| 2009 | 01.3 | 50.0 | 51.3 |
| 2010 | 02.2 | 50.0 | 52.2 |
| 2011 | (60.7) | - | (60.7) |
| 2012 | 67.3 | - | 67.3 |

මෙතෙක් මෙම ගිණුම සකස්කර තිබූ ආකෘතිය මුදල් රෙගුලාසිවලට හා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වන පරිදි සංශෝධනය කොට 2012 වසරේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එමගින් මුදල් රෙගුලාසිවලට අනුකූල මෙන්ම කළමනාකාරීත්වයට වඩාත් ගැලපෙන තොරතුරු දක්වනු ලැබේ. 2012 වසරේ ගිණුම් මගින් පහත සඳහන් කරුණු පෙන්නුම් කරයි.

**වගු අංක 4.3.6 : ගිණුමේ තත්ත්වය**

| විස්තරය | මුදල (රු.) |
|---|---|
| කාරක ලාභය | 182,728,532.80 |
| ශුද්ධ ලාභය (කල්පිත ගාස්තු ගැලපීමට පෙර) | 67,327,805.02 |
| ශුද්ධ ලාභය (කල්පිත ගාස්තු ගැලපීමෙන් පසු) | 51,333,145.87 |

2012 වසරේ මුල් භාගයේ දරුණු නියඟයක් පැවති අතර (නියඟයෙන් විපතට පත්වූවන්ට නොමිලේ බිත්තර වී ලබා දීම රජය විසින් සිදු කිරීමෙන් මෙය තහවුරු වේ.) එමෙන්ම, වසර අග භාගයේ ගංවතුර තත්ත්වයක් ඇති විය (2013 පෙබරවාරි මස 04 වෙනි දිනට යෙදී තිබූ දැයට කිරුළ ප්‍රදර්ශයට අදාළ ඉදිකිරීම් කර ගැනීමට නොහැකි වූ පරිදි ගංවතුර පැවතීම නිසා ප්‍රදර්ශනය 2013.03.23 දිනට කල් දැමීමෙන් එය සනාථ වේ.). මෙවන් තත්ත්වයක් යටතේ වුවද ළඟා කර ගත් ඉලක්කය සම්බන්ධයෙන් සෑහීමකට පත් විය හැකිය.

අත්තිකාරම් ගිණුම් ඉතිහාසයේ ලබා ගත් හොඳම ප්‍රගතිය 2012 වසරේදී අත්කර ගැනිණි.

වගු අංක **4.3.7 :** දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ විශේෂ ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන **(රු. ' 000)**

| අනු අංකය | වැය සම්මතය | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදනය | වියදම | ප්‍රගතිය % ක් ලෙස |
|---|---|---|---|---|---|
| 1 | 285 -2-2 –2- 2502 | යටිතල පහසුකම් සංවර්ධනය - වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 67,505 | 65,408 | 96 |
| 2 | 285 -2 -2-3-2502 | දෙමුහුන් වී, බඩ ඉරිඟු, පලතුරු හා එළවළු වැඩිදියුණු කිරීම | 9,000 | 8,176 | 90 |
| 3 | 285 -2 -2-4 2502 | සුළු පරිමාණ කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘතිය | 15,000 | 14,999 | 100 |
| 4 | 285 -2 -3 -2- 2105 | කෘෂිකර්ම විද්‍යාල ගොවිපළ | 20,000 | 18,418 | 92 |
| 5 | 285 -2 -3-4-2502 | මාධ්‍ය වැඩසටහන | 26,200 | 26,199 | 100 |
| 6 | 285 -2 -3-6-2401 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සම්මේලනය | 3,000 | 2,879 | 95 |
| 7 | 285 -2 -4-1-2502 | බීජ නිෂ්පාදන හා මිලදී ගැනීමේ වැඩසටහන | 432,162 | 431,661 | 99 |
| 8 | 285 -2 -4-1-2502 | බීජ පනත ක්‍රියාත්මක කිරීම | 17,000 | 13,969 | 82 |
| 9 | 285 -2 -3-7-2502 | කෘෂි තාක්ෂණ උද්‍යාන | 4,500 | 3,458 | 76 |
| 10 | 285 -2 -4-5-2502 | කඩිනම් ගොවිපළ සංවර්ධන වැඩසටහන | 236,460 | 216,443 | 91 |
| 11 | 285 -2 -4-7-2502 | බීජ සහතික කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම | 53,120 | 11 ,324 | 21 |

වගු අංක **4.3.8 : 2012** වර්ෂයේ ආදායම් එකතු කිරීම් **- 2012 (රු. ' 000)**

| ආදායම් ශීර්ෂය | විස්තරය | සත්‍ය ලැබීම් |
|---|---|---|
| 20-02-02-99 | ණය පොලිය | 14,901 |
| 20-03-02-99 | අනෙකුත් වත්කම් අලෙවිය | 812 |
| 20-03-99-00 | අනිකුත් ලැබීම් | 181,809 |
| 20-02-01-01 | බදු කුලී සහ වෙනත් | 18,331 |
| 20-03-02-1 | දෙපාර්තමේන්තුවේ විකුණුම් හා අනෙකුත් ගාස්තු | 140,236 |
| 20-04-01-00 | සමාජ සංරක්ෂණ දායක මුදල් | 67,582 |
| **එකතුව** | | **423,671** |

## කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී / සේවක සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 06 |
| සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 02 |
| අයවැය සහකාර | 02 |
| භාෂා පරිවර්තක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 83 |
| කාර්යාල කාර්ය සහායක | 07 |
| රියදුරු | 04 |
| නුපුහුණු කම්කරු | 14 |
| **එකතුව** | **120** |

# 4.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන සහ මධ්‍යස්ථාන මඟින් සිදුකරනු ලබන සියලුම ක්‍රියාවලීන් සහ වැඩසටහන් සමීක්ෂණය සහ ඇගයීම ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය සතු වගකීම වේ. මෙයට අමතරව වාර්ෂික සැලසුම වාර්ෂික කාර්යසාධන වාර්තාව, මාසික ප්‍රගති වාර්තාව සහ කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතන සඳහා අදාල අනෙකුත් වාර්තා සකස් කිරීමේ වගකීම ද මෙම ඒකකය සතු වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා වූ ප්‍රගති සමාලෝචන රැස්වීම්ද ප්‍රගති මෙහෙයුම් හා ඇගයුම් ඒකකය මඟින් කැඳවනු ලැබේ.

## අයවැය

වගුව **4.4.1:** වාර්ෂික අය වැය **2012** (රුපියල්)

| **වැය ශිර්ෂය** | **ප්‍රතිපාදන** | **වියදම** | **වියදම %** |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 1,006,168 | 696,942 | 70 |
| පුනරාවර්තන | 1,844,700 | 1,467,639 | 80 |
| **එකතුව** | **2,850,868** | **2,164,581** | **76** |

## ප්‍රගතිය

### ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය

පහත දැක්වෙන කොටස් යටතේ 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම සකස් කරනු ලැබිණි.

- ප්‍රාග්ධන වියදම්
- පුනරාවර්තන වියදම්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා අරමුදල් සපයන විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අරමුදල් සපයන විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික වැඩසටහන්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලසුම්

### ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්වල ප්‍රගති මෙහෙයුම

2012 වර්ෂය තුළදී ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල භෞතික සහ මූල්‍යමය ප්‍රගතිය සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදි. ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා මාසික ප්‍රගති වාර්තා සකස්කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

වගුව **4.4.2 : 2012** වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගතියෙහි සංක්ෂිප්තය

| වැය ශිර්ෂය | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වියදම (රුපියල් මිලියන) | වියදම් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 324 | 209 | 64 |
| පුනරාවර්තන | 1994 | 1982 | 99 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශිර්ෂ යටතේ ව්‍යාපෘති | 1048 | 946 | 90 |
| අමාත්‍යංශ වැය ශිර්ෂ යටතේ ව්‍යාපෘති | 141 | 103 | 73 |
| **එකතුව** | **3507** | **3240** | **92** |

**විශේෂ ව්‍යාපෘති හි ප්‍රගති මෙහෙයුම්**

කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ විශේෂ ව්‍යාපෘති 14 හි ප්‍රගතිය සමීක්ෂණය කරනු ලැබ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුලත්ව මාසික වාර්තා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කරනු ලැබිය.

4.4.3 වගුවෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ විශේෂ ව්‍යාපෘති හි මූල්‍යමය ප්‍රගතිය පෙන්වනු ලබයි.

**වගුව 4.4.3 : 2012 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ විශේෂ ව්‍යාපෘති ප්‍රගතිය**

| | ව්‍යාපෘතිය | ආයතනය | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වියදම (රුපියල් මිලියන) | වියදම් % |
|---|---|---|---|---|---|
| 1 | භූමි හා භූමි ප්‍රවර්ධනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 64.2 | 60.38 | 94 |
| 2 | පුහුණු හා හැකියා වර්ධනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 14.78 | 12.32 | 83 |
| 3 | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 67.5 | 65.4 | 96.9 |
| 4 | දෙමුහුම් බීජ වැඩිදියුණු කිරීම | ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සංවර්ධන ආයතනය<br>උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය<br>වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 9 | 8.17 | 90 |

| | ව්‍යාපෘතිය | ආයතනය | ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වියදම (රුපියල් මිලියන) | වියදම් % |
|---|---|---|---|---|---|
| 5 | කුඩා පරිමාණයේ ව්‍යාපෘති | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය<br>උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 15 | 15 | 100 |
| 6 | ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 80 | 53.58 | 67 |
| 7 | පටක රෝපණ තාක්ෂණය | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 25.3 | 25.28 | 99.9 |
| 8 | මාධ්‍ය වැඩසටහන | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 26.2 | 26.2 | 100 |
| 9 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සමුළුව | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 3 | 2.88 | 96 |
| 10 | කෘෂි තාක්ෂණික උද්‍යානය | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 4.5 | 3.46 | 77 |
| 11 | බීජ නිෂ්පාදන හා මිලදී ගැනීමේ වැඩසටහන | බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 432 | 431.7 | 99.9 |
| 12 | බීජ පනත ක්‍රියාත්මක කිරීම | බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය | 17 | 13.97 | 82 |
| 13 | කඩිනම් බීජ ගොවිපල සංවර්ධන වැඩසටහන | බිජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය | 236.46 | 216.44 | 91.5 |
| 14 | බීජ සහතික කිරීමේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම | බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය | 53.12 | 11.32 | 21 |
| **එකතුව** | | | **1048** | **946** | **90** |

**කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ විශේෂ ව්‍යාපෘති**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ වූ විශේෂ ව්‍යාපෘති 18 හි ප්‍රගතිය සමීක්ෂණය කර භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුලත්ව අමාත්‍යාංශය වෙත මාසික වාර්තා ඉදිරිපත් කරනු ලැබීය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ විශේෂ ව්‍යාපෘතිහි ප්‍රගතිය 4.4.4 වගුවෙහි පෙන්වා දෙනු ලබයි.

වගුව **4.4.4 :** අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ විශේෂ ව්‍යාපෘති ප්‍රගතිය

| ව්‍යාපෘතිය | | ආයතනය | ප්‍රතිපාදන (රු මිලියන) | වියදම් (රු මිලියන) | වියදම % |
|---|---|---|---|---|---|
| 1 | භූමි සංවර්ධනය | රනිල බෝග හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 0.5 | 0.5 | 100 |
| 2 | ජෛව විවිධත්ව ගෙවතු | පළතුරු බෝග හා සංවර්ධන මධ්‍යස්ථානය | 6.4 | 5.9 | 92 |
| 3 | ගොවිපල සංවර්ධනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 75.95 | 63.85 | 84 |
| 4 | මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය | පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 25 | 14.45 | 58 |
| 5 | ප්‍රජා මූලික බීජ නිෂ්පාදන ග්‍රාමයන් | බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවරධන මධ්‍යස්ථානය | 6 | 5.26 | 88 |
| 6 | පළතුරු නිෂ්පාදනය | පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 10 | 8.43 | 84 |
| 7 | පහතරට තෙත් කළාපයේ කුඹුරුවල නිෂ්පාදනය වැඩි කිරීම | වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 5 | 2.1 | 42 |
| 8 | කාබන්ඩයොක්සයිඩ් වායුවෙන් පිරුණු පරිසරයක පර්යේෂණ | උද්‍යානබෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 2.325 | 1.773 | 76 |
| 9 | පලිබෝධනාශක භාවිතය අවම කිරීම | පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය | 5.3 | 1.75 | 33 |
| 10 | අඹ හා දූරියන් ඵලදායීතාවය ඉහල දැමීම | පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 1.116 | 0.53 | 47 |
| 11 | කෘෂිකර්ම ගුවන්විදුලි නාලිකාව | ගොවි ගුවන්විදුලි සේවාව | 5 | 0.655 | 13 |
| 12 | කාබනික පොහොර නිෂ්පාදනය | කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර | 9.87 | 8.798 | 89 |
| 13 | පාංශු සංරක්ෂණ පනත | ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය | 2.5 | 1.74 | 69 |

| | ව්‍යාපෘතිය | ආයතනය | ප්‍රතිපාදන (රු මිලියන) | වියදම් (රු මිලියන) | වියදම % |
|---|---|---|---|---|---|
| 14 | ක්ෂුද්‍ර වාරිමාර්ග | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 2.8 | 2.799 | 100 |
| 15 | ජාතික ගොවි දිනය | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 5 | 4.429 | 88.5 |
| 16 | දැයට කිරුළ | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 10.5 | 10.499 | 100 |
| | | ක්ෂෙත්‍රබෝග පර්යේෂණ සංවර්ධන ආයතනය | 0.5 | 0.4 | 80.6 |
| | | උද්‍යානබෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 0.1 | 0.096 | 96 |
| | | තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය | 19.898 | 8.595 | 43 |
| 17 | සහල් අපනයන වැඩසටහන | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 7.858 | 0.345 | 4.4 |
| 18 | අවාරයට රතුලූණු නිෂ්පාදනය | ක්ෂෙත්‍රබෝග පර්යේෂණ සංවර්ධන ආයතනය | 0.555 | 0.471 | 84 |
| **එකතුව** | | | **202** | **143** | **71** |

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජයග්‍රහණයන්**

2012 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජයග්‍රහණයන් සම්පාදනය කරනු ලැබ කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීය.

**වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

2011වසර සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස්කරනු ලැබ පාර්ලිමේන්තුව, සියලුම අදාල අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල, පුස්තකාල සහ අනෙකුත් අදාල ආයතන වෙත බෙදා හරිනු ලැබීය.

**අනෙකුත් වාර්තා**

"මහින්ද චින්තනය" යටතේ වූ කාර්යයන්හි ප්‍රගති වාර්තා සහ සම්පූර්ණ ඇස්තමේන්තුව මිලියන 50 ඉක්මවන්නාවූ ව්‍යාපෘති වාර්තා සකස් කරනු ලැබ කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීය.

## 2013 වසරේ සැලැස්ම

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

- ප්‍රාග්ධන සහ පුනරාවර්තන කාර්යන් සහ විශේෂ ව්‍යාපෘතිහි ප්‍රගතිය සමීක්ෂණය
- මාසික භෞතික හා මූල්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා සම්පාදනය
- මහ බැංකු වාර්තා සහ අය වැය කතාවට අවශ්‍ය තොරතුරු ලබා දීම
- මිලියන 50 ඉක්මවන්නාවූ ව්‍යාපෘති සඳහා ප්‍රගති වාර්තා සම්පාදනය

## කාර්ය මණ්ඩලය

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| භාෂා පරිවර්තක | 02 |
| වැඩසටහන් සහකාර | 02 |
| කෘෂිකර්ම උපදේශක | 01 |
| කළමනාකරණ සහකාර සේවය | 02 |
| රියදුරු | 03 |
| කාර්යාල කාර්ය සහකාර | 01 |
| කම්කරු | 03 |
| මුරකරු | 01 |
| **එකතුව** | **16** |

# 5. කාලගුණ වාර්තාව

ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාප නියෝජනය කරන කෘෂි කාලගුණික මධ්‍යස්ථාන14කින් 2011/2012 මහ (සැප්තැම්බර් - පෙබරවාරි) සහ 2012 යල (මාර්තු - අගෝස්තු) කන්න වලදී එක් රැස් කර ගන්නා ලද කාලගුණික දත්ත සාරාංශ ගත කර තිබෙන මෙම වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ දේශගුණික විද්‍යා අංශයෙන් පිළියෙළ කරන ලදි.

කන්න දෙකේදී ලද සමුච්චිත වර්ෂාපතනය වගු අංක 5.1 හිද මධ්‍යස්ථාන 14ක මාසික වාර්ෂාපතනය සහ වසර 10ක සාමාන්‍යය පිළිවෙළින් වගු අංක 5.2හි සහ 5.3හි දැක්වේ. අනෙකුත් වැදගත් කෘෂි කාලගුණික පරාමිතීන් වන විභව වාෂ්පීකරණ උත්ස්වේදනය, (විවෘත තැටි වාෂ්පීකරණය මගින් අගයන ලද), උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාව, දීප්තිමත් හිරු එළිය පැවති පැය ගණන සහ සුළඟේ ප්‍රවේගය යනාදියෙහි මාසික මධ්‍යන්‍ය අගයන් පිළිවෙළින් වගු අංක 5.4, 5.5, 5.6, 5.7 සහ 5.8හි දැක්වේ.

පොදුවේ ගත් කළ 2011/2012 මහ කන්නයේදී දිවයිනේ සියළුම පළාත් ලද වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතුණි. ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාස වලදී පැවති දුර්වල අන්තර් මෝසම් කාලගුණික තත්ත්වයන්ද කන්නයේදී බෙංගාල බොක්කේ කාලගුණික පද්ධති ක්‍රියාත්මක නොවීමද මෙයට ප්‍රධාන හේතුව විය.

2012 වසරේ මාර්තු සහ අප්‍රේල් මාස වලදී පැවති දුර්වල අන්තර් මෝසම් කාලගුණික තත්ත්වයන්ද අනතුරුව පැවති ශ්‍රී ලංකාව ආශ්‍රිත නිරිත දිග මෝසම් සංසරණයේ දුර්වලතාවයද හේතුවෙන් එම වසරේ යල කන්නය සාර්ථක කෘෂිකාර්මික නිෂ්පාදනයක් සඳහා හිතකර නොවීය. කාලගුණික වාර්තා පරික්ෂා කිරීමේදී යල කන්නයේ වර්ෂාපතනය පිළිවෙළින් දෙවන කන්නයේදී සුපුරුදු රටාවට සිදු නොවූ බව අනාවරණය වේ. දිවයිනේ වඩාත්ම වැසි ලැබෙන කාලය ලෙස විශ්වාසයෙන්ම සලකනු ලබන නිරිතදිග මෝසමේදීද පිට පිට කන්න දෙකකදී නිරිතදිග මෝසම් වැසි නොලැබීමෙන් එකී සමයෙහිද කාලගුණික විපර්යාසයක් සිදු වෙමින් පවතින බව අනාවරණය වේ.

## පහතරට තෙත් කලාපය

### රත්නපුරය ($WL_{1a}$)

තෙත් කලාපයේ මෙම ප්‍රදේශය 2011/2012 මහ කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,651ක්වූ එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 30%කින් අඩු වී ඇත. මෙම ඍණාත්මක විෂමතාවයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ දෙවන අන්තර් මෝසම් කාලයේදී (ඔක්තෝම්බර් සහ නොවැම්බර්) සහ දෙසැම්බර් මාසයේදී ලද වර්ෂාපතනය සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු වීමයි. සාමාන්‍යයෙන් වසරේ මෙම කාලයේදී අන්තර් නිවර්තන අභිසාරි කලාපයේ (ITCZ) බලපෑම යටතේ බෙංගාල බොක්කේ විවිධ කාලගුණික පද්ධති ඇති වීමෙන් වැසි ලැබෙන මුත් වත්මන් කන්නයේදී එවැනි කාලගුණික පද්ධති ක්‍රියාත්මක වීම සැලකිය යුතු අන්දමින් දුර්වලවීම හේතුවෙන් දිවයිනේ අධික වර්ෂාව පවතින කාල වකවානුව ලෙස සැලකෙන ඔක්තෝම්බර් මාසයේ සිට දෙසැම්බර් දක්වා වර්ෂාව සාමාන්‍ය වර්ෂාපතනයට අඩු වර්ෂාපතනයක් විය.

මේ අතර, 2012 යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 2,148ක් වූ එහි දිගු කාලීන සාමාන්‍ය හා

සංසන්දනාත්මකව 15%කින් අඩු වූවකි. මැයි මාසයේ සිට ජූලි මාසය දක්වා මෙම ප්‍රදේශයට බලපෑ නිරිතදිග මෝසම් ක්‍රියාකාරීත්වයේ දුර්වලවීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව විය. කෙසේ වුවද, ඒ ඒ මාස වලදී පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ අගයන් සමුච්චිත වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවති බැවින් මෙම කලාපයේ වගා කරන උඩරට බෝග කෙරෙහි පාංශු තෙතමනයේ අහිතකර තත්ත්වයන් බලපෑමට පැවති ඉඩකඩ අල්ප විය.

## බෝඹුවෙල ($WL_{1b}$)

2011/2012 මහ කන්නයේදී මෙම කලාපය ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,542ක් වූ එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 27%කින් අඩු වූවකි. මහ කන්නයේදී $WL_{1a}$ කලාපයේ පැවති සෘණාත්මක විෂමතාවයට හේතු වූ කරුණුම මෙම කලාපයටද වලංගුවේ.

2012 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතන විෂමතාවය 10%ක් පමණක් වූ නමුත් කන්නය පුරා වර්ෂාපතන ව්‍යාප්තිය ඉතාමත් අවිධිමත් විය. මෙම කලාපයේ පැවති දුර්වල සංවහන ක්‍රියාකාරීත්වය හේතුවෙන් අප්‍රේල් සහ මැයි මාස වලදී ලද වර්ෂාපනය බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතුණි. කෙසේවුවද, අගෝස්තු මාසයේදී අසාමාන්‍ය අයුරින් පැවති වර්ෂාව සහිත කාලගුණික තත්ත්වය මාසික සමුච්චිත වර්ෂාපතනය 80% ඉක්මවූ වර්ෂාපතනයක් බැව් වාර්තා විය. කෙසේ වුවද, ඒ ඒ මාස වලදී පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් සමුච්චිත වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවති බැවින් මෙම කලාපයේ වගා කරන ලද උඩරට බෝග කෙරෙහි පාංශු තෙතමනයේ අහිතකර තත්ත්වයන් බලපෑමට පැවති ඉඩකඩ අල්ප විය.

## මැද රට තෙත් කලාපය

## පේරාදෙණිය ($WM_{2b}$)

2011/2012 මහ කන්නයේදී මෙම කලාපය ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 567ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 47%ක අඩු වීමකි. පහත රට තෙත් කලාපයට බලපෑ කරුණු මෙම කලාපයටද අදාළ වෙමින් සැප්තැම්බර් මාසය හැරුණු විට කන්නයේ සෑම මාසයකදීම සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබීම මෙම සෘණාත්මක විෂමතාවයට හේතු විය. කෙසේ වුවද, අපේක්ෂිත පරිදි ජනවාරි මාසයේ මැද භාගයේ සිට පෙබරවාරි මාසයේ අග දක්වා වියළි කාලගුණික තත්ත්වයන් පැවතුණි. ස්ථිර වශයෙන්ම මෙම තත්ත්වය ශාක - පලතුරු බෝග වල මල් හට ගැනීම සඳහා හිතකර පරිසරයක් වන්නට ඇත.

2012 යල කන්නයේදී මෙම ප්‍රදේශයේ පැතිර පැවති දුර්වල අන්තර්මෝසම් තත්ත්වය සහ දුර්වල නිරිතදිග මෝසම් සුළං හේතුවෙන් ලද වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයෙන් 66%ක් පමණක් වූ අතර දිවයිනේ මෙම ප්‍රදේශයට ඉතාමත් කලාතුරකින් ඇති වන කාලගුණික තත්ත්වයක් ලෙස සැලකිය හැකි අන්දමින් මැයි මාසයේ සෑම දිනයක්ම වියළි කාලගුණික දිනයක් විය. ජූනි මාසයේදී ලද වර්ෂාවද වාෂ්පීකරණ ඉල්ලුමට ප්‍රමාණවත් නොවූ අතර මෙම කලාපයට අපේක්ෂිත පරිදි වැසි ලැබුණේ අගෝස්තු මාසයේදී පමණි. පූර්ව වර්ෂ වල කාලගුණික වාර්තා පිරික්සීමේදී 2011 වසරේ යල කන්නයේ ජූනි සහ ජූලි මාස වලදී මේ හා සමාන කාලගුණික තත්ත්වයන් පැවති බැව් අනාවරණය විය.කෙසේ වුවද, වියළි කාලගුණික තත්ත්වයන් පැතිර පැවති මුත් අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතීන් වන උෂ්ණත්වය ඉහළ අගයන් කරා නොගොස්

මෙම ප්‍රදේශයේ වගා කෙරෙන බෝග කෙරෙහි හිතකර අයුරින් පැවතුණි.

## උඩරට තෙත් කලාපය

### සීතා එළිය (WU$_3$)

මෙම කලාපයේ 2011/2012 මහ කන්නයේදී ලද සමුච්චිත කන්නමය වර්ෂාපතනය මි.මී. 1, 125ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 15% ක අඩුවීමකි. සැප්තැම්බර් මාසයේදී සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබීම මෙයට ප්‍රධාන හේතුව විය. තෙත් කලාපයේ අනෙකුත් කලාප වල මෙන් නොව WU$_3$ කලාපයේ මහ කන්නයේදී ලද වර්ෂාපතනයේ සෘණාත්මක විෂමතාවයෙහි එතරම් විශේෂත්වයක් නොපැවති අතර මෙම තත්ත්වය මෙම කලාපයේ සාම්ප්‍රදායික එළවළු වගාවට හිතකරව පවතින්නට ඇත.

මෙම කලාපයේ 2012 යල කන්නයේදී ලද සමුච්චිත කන්නමය වර්ෂාපතනය මි.මී. 449ක් පමණ වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 45%ක අඩුවීමකි. ඉන්දියානු උප මහද්වීපයේ පැවැති දුර්වල නිරිතදිග මෝසම් තත්ත්වයන් හේතුවෙන් මැයි සහ ජූනි මාස වලදී ලද සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු වූ වර්ෂාපතනයක් ලැබීම මෙයට ප්‍රධාන හේතුව විය. මැයි සහ ජූනි මාස වලදී පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය එම කාලය තුළදී ලද මුළු වර්ෂාපතනය ඉක්ම වූ අතර ජූනි මාසයේදී පමණක් අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි විය. පොදුවේ ගත් කළ මෙම තත්ත්වයන් මෙම කලාපයේ කලාතුරකින් සිදුවන කෘෂි කාලගුණික සංසිද්ධියක් වන නමුත් 2011 වසරේ යල කන්නයේදී ඇති වූ තත්ත්වය නැවත සිදුවීමක් ලෙස කාලගුණික වාර්තා මගින් අනාවරණය වේ.

## පහතරට අතරමැදි කලාපය

### බතලගොඩ (IL$_{1a}$)

2011/2012 මහ කන්නයේදී මෙම කලාපය ලද මි.මී. 648ක් වූ සමුච්චිත කන්නමය වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 40%ක අඩු වීමකි. මහ කන්නයේදී ඇති වූ මෙම සැලකිය යුතු නිශේධනාත්මක විෂමතාවය දුර්වල අන්තර් මෝසම් තත්ත්වය සහ බෙංගාල බොක්කේ කාලගුණික ක්‍රමයන් සිදු නොවීම හේතු විය. මෙම කලාපයේ බෝග වගා කරන කාලයේදී එක මාසයකදී හෝ අපේක්ෂිත වැසි ප්‍රමාණය නොලැබුණු බැවින් කලාපයේ වාරි ජලය සපයන සුළු ජලාශ වල ජල මට්ටම් ඉතාමත් අඩු මට්ටමක පැවතුණි. මෙම කන්නය කලාපයේ ප්‍රධානතම සහ විශ්වාසනීය වැසි සහිත කන්නය වුවද වර්ෂාපෝෂිත කෘෂිකර්මයට හානිදායක තත්ත්වයක් උදාවන්නට ඇත.

යල කන්නයේදී මෙම කලාපය ලද වර්ෂාව අඩු වූ නමුත් තෙත් කලාපයේ තත්ත්වයන් තරම් උග්‍ර තත්ත්වයක් නොවීය. කෙසේ වුවද, වාර්තා වූ මි.මී. 600ක් වූ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසඳනාත්මකව 20%ක පමණ පහත වැටීමකි. මෙම සෘණාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව වූයේ දිවයිනේ අනෙකුත් ප්‍රදේශ වල මෙන් මැයි මාසයේදී ලද වර්ෂාපතනය සැලකිය යුතු අන්දමින් අඩු වීමයි. එහෙත්, කන්නයේ සෙසු සෑම මාසයකදීම අපේක්ෂිත පරිදි වැසි ලැබුණු අතර මැයි මාසයේදී හැරුණු විට යල කන්නයේ සියළුම මාසවලදී විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ඉක්මවූ සමුච්චිත වර්ෂාපතනයක් මෙම කලාපයට ලැබුණි.

## මොණරාගල ($IL_{1c}$)

දිවයිනේ සෙසු ප්‍රදේශ මෙන් නොව 2011/2012 වසරේ මහ කන්නයේදී මෙම කලාපය ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම හේතුවෙන් එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව සමුච්චිත කන්නමය වර්ෂාපතනය 15%ක් ඉක්ම වූවකි. කන්නයේ සෑම මාසයකම විභව වාෂ්පීකරණ උත්ස්වේදනය වර්ෂාපෝෂිත උඩරට බෝග සඳහා හිතකර පාංශු තෙතමන තත්ත්වයන් සහතික කරමින් වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවති අතර අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතීන්ද කන්නය පුරා සාර්ථක බෝග වගාවක් සඳහා හිතකරව පැවතුණි.

පහත රට අතරමැදි සහ වියළි කලාපයන්හි අනෙකුත් ප්‍රදේශ හා සංසන්දනාත්මකව ගත් කළ මෙම කලාපයේ යල කන්නයේ රාත්‍රී කාලයේදී පැවති අවම උෂ්ණත්ව මට්ටම එම ප්‍රදේශයන්හි රාත්‍රී කාලයේදී පැවති උෂ්ණත්වයට වඩා පහළ මට්ටමක පැවති අතර එම තත්ත්වය පැහිරි, උක් සහ අනෙකුත් පලතුරු බෝග සඳහා හිතකරව පැවතුණි.

මෙම කලාපයේ යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 482ක් වන අතර දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 20%කින් පමණ අඩු වූවකි. මෙයට ප්‍රධාන හේතුව වූයේ අප්‍රේල් මාසයේදී හැරුණු විට යල කන්නයේ සෑම මාසයකදීම ලද වර්ෂාපතනය සාමාන්‍ය වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතීමයි. එමෙන්ම, කන්නයේ සෑම මාසයකම පැවති සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ලද වර්ෂාවට වඩා ඉහළ මට්ටමක පැවති බැවින් අතිරේක ජල සම්පාදනයකින් තොරව උඩරට බෝග වගා කිරීමේ හැකියාවක් නොපවතින්නට ඇත. කෙසේ වුවද, මෙම තත්ත්වය මෙම කලාපයට නුපුරුදු කාලගුණික තත්ත්වයක් ලෙස සැලකිය නොහැක්කේ යල කන්නයේදී මෙම කලාපයට මනාව ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ලැබෙනුයේ කලාතුරකින් බැවිනි.

## මාහෝ ($IL_3$)

මෙම කලාපය 2011/2012 මහ කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී 768ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 20%ක අඩු වීමකි. මෙම සෘණාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව වූයේ නොවැම්බර් මාසයේදී ලද වර්ෂාපතනය 40%කින් අඩු වූ බැවින් වන අතර ජනවාරි මාසයේදීද එම මාසය පුරාවටම මි.මී. 3ක් පමණක් වූ වර්ෂාපතනයක් ලබමින් අසාමාන්‍ය ලෙස වියළි කාලගුණික තත්ත්වයකින් පැවතුණි. එහෙත්, මෙම කලාපයේ මි.මී. 25ක් වූ දිගු කාලීන සාමාන්‍ය හා ගත් කළ මි.මී. 153ක සමුච්චිත වර්ෂාපතනයක් ලබමින් පෙබරවාරි මාසයේදී අසාමන්‍ය අන්දමින් වැසි සහිත කාලගුණික තත්ත්වයක් පැවතුණි.

මෙම කලාපයේ 2012 යල කන්නය ලද සමුච්චිත කන්නමය වර්ෂාපතනය එහි දිගු කාලීන සාමන්‍ය වූ මි.මී. 647 හා සංසදනාත්මකව ගත් කළ 30%කින් අඩු වූවකි. මැයි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලය තුළදී සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩුවෙන් වැසි ලැබීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව විය. මැයි මාසයේ එක දිනයකදී හෝ මැන දැක්වීමට හැකි තරමේ වර්ෂාවක් නොලැබුණු අතර අනෙකුත් මාස තුන තුළදී ලද වාර්ෂාපතනය වායු ගෝලීය වාෂ්පීකරණ උත්ස්වේදන ඉල්ලුමට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතුණි.

## මැද රට අතරමැදි කලාපය

### කුණ්ඩසාලේ ($IM_{3a}$)

2011/2012 මහ කන්නයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය වන මි.මී. 881 හා සංසඳනාත්මකව ගත් කළ 23%කින් පමණ අඩු වූවක් වන අතර මෙම ඍණාත්මක විෂමතාවයට ප්‍රධාන වශයෙන්ම නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනයට අඩු වර්ෂාපතනයක් ලැබීම හේතු විය. කෙසේ වුවද, නිසි කළමනාකරණ පිළිවෙත් අනුගමනය කර තිබුණේ නම් මෙම කලාපයේ වගා කරන බෝග පාංශු තෙතමනයේ අහිතකර බලපෑමට ලක් විය හැකි අවස්ථා නොතිබිය හැකි බැව් විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන්ගේ වාර්තා වලින් අනාවරණය වේ.

එහෙත් 2012 යල කන්නයේදී මාර්තු මාසයේ සිට ජූනි මාසය දක්වා මනා වර්ෂාපතනයක් නොලැබීම හේතුවෙන් වර්ෂාපෝෂිතව වගා කෙරෙන කිසිදු බෝගයකට හිතකර තත්ත්වයක් නොපැවතුණි. මි.මී. 358ක් ලෙස වාර්තා වූ සමුච්චිත කන්නමය වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව ගත් කළ 40% කින් අඩු වූවකි. කන්නයේ අප්‍රේල් මාසයේදී පමණක් වාෂ්පීකරණ උත්ස්වේදනය ඉක්ම වූ වැසි ලැබුණු අතර මෙවැනි තත්ත්වයක් යටතේ අතිරේක ජල සම්පාදනයකින් තොරව මෙම කලාපයේ වර්ෂාපෝෂිත උඩරට බෝග වගාව සාර්ථක කර ගැනීමට නොහැකි වන්නට ඇත.

## උඩරට අතරමැදි කලාපය

### බණ්ඩාරවෙල ($IU_{3c}$)

අනෙකුත් මධ්‍යම කඳුකර ප්‍රදේශ වල මෙන් නොව 2011/2012 මහ කන්නයේදී මෙම ප්‍රදේශය සාමාන්‍ය වර්ෂාපතනයට කිට්ටු මි.මී. 1,037ක වර්ෂාපතනයක් ලද අතර පෙබරවාරි මාසයේ ලද සුළු වර්ෂාපතනය හැරුණු විට මෙහි කන්නමය වර්ෂාපතන ව්‍යාප්තිය කලාපයේ සිදු කෙරෙන සාම්ප්‍රදායික කෘෂිකාර්මික වගා ක්‍රම කෙරෙහි හිතකරව පැවතුණි. කන්නය තුළ සෑම මසකදීම විභව වාෂ්පීකරණ උත්ස්වේදනය වර්ෂාවට වඩා අඩු මට්ටමක පැවති අතර කන්නයේ උපරිම උෂ්ණත්වය සෙල්සියස් $19^0$ - $29^0$ දක්වාත් අවම උෂ්ණත්වය සෙල්සියස් $8^0$ - $19^0$ දක්වාත් පැවතුණි.

2012 යල කන්නයේ සමුච්චිත කන්නමය වර්ෂාපතනය එහි දිගු කාලීන සාමන්‍ය වූ මි.මී. 656ක් වූ වර්ෂාපතනයට වඩා 40%කින් අඩු වූවකි. අප්‍රේල් සහ ජූලි මාස වලදී ප්‍රදේශයේ සංවහන ක්‍රියාවලිය හේතුවෙන් තරමක් යහපත් වැසි ලැබුණ මුත් මැයි සහ ජූනි මාස වලදී අපේක්ෂිත මට්ටමේ වැසි නොලැබුණු අතර කන්නයේ දෙවන භාගය පුරාවටම ලද වර්ෂාවට වඩා විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් ඉතාමත් පහළ මට්ටමක පැවතුණි. මෙම තත්ත්වය හේතුවෙන් අතිරේක ජල සම්පාදනයක් සිදු නොකළේ නම් අහිතකර පාංශු තෙතමන තත්ත්වයන් උදා වීමේ හැකියාව පැවති අතර කන්නයේ උපරිම උෂ්ණත්වය සෙල්සියස් $25^0$ - $30^0$ දක්වාත් අවම උෂ්ණත්ව සෙල්සියස් $8^0$ - $19^0$ දක්වාත් අතර පරාසයක විය.

## වියළි කලාපය

### මහ ඉලුප්පල්ලම ($DL_{1b}$)

$DL_{1b}$ කෘෂි කාලගුණික කලාපයේ උතුරු මැද ප්‍රදේශය මහ කන්නයේදී මි.මී. 911ක සමුච්චිත වර්ෂාපතනයක් ලද අතර එය අපේක්ෂිත ප්‍රමාණයට වඩා 9%කින් අඩු වූවකි. දෙසැම්බර් සහ ජනවරි මාසවලදී ලද වර්ෂාපතනයේ සුළුවෙන් පැවති ඍණාත්මක විෂමතාවය මෙම සුළු පහත වැටීමට හේතු විය. සැප්තැම්බර් මාසයේදී හැරුණු විට සෙසු සියළුම මාස වලදී ලද වර්ෂාපතනයට වඩා විභව

වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් පහළ මට්ටමක පැවතුණි. නොවැම්බර් මාසයේදී වායු ගෝලයේ සාමාන්‍ය ආර්ද්‍ර තත්ත්වය ඉක්මවා පැවති අතර අහස වළාකුළු වලින් බරව පැවතුණි.

2012 යල කන්නයේදී මෙම ප්‍රදේශය ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 418ක් වූ එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසදනාත්මකව 37%ක අඩු වර්ෂාපතනයකි. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන්ම, හේතු වූයේ අන්තර් මෝසම් කාලගුණික තත්ත්වයන් මගින් කන්න වර්ෂාපතනයෙන් 60%ක්ම වැසි ලැබෙන අප්‍රේල් සහ මැයි මාසයේ මුල් භාගයේදී ලද වර්ෂාපතනය සාමාන්‍ය වාර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතීමයි. එහෙත් මෙම කන්නයේදී ඇති වූ මෙම අඩු වීම 35%ක් පමණ වූ ප්‍රමාණයක් වන අතර විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ඉක්මවා වැසි ලද එකම මාසය වූයේ සුපුරුදු ලෙස අප්‍රේල් මාසය පමණි.

## අඟුණකොළපැලැස්ස ($DL_{1b}$)

